2022 අගෝස්තු 24
2022 ஆகஸ்ட் 24
24 August 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

# 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකොළොස් වන කාණ්ඩය - 01
பதினோராவது தொகுதி - 01
Eleventh Volume - 01

## දෙපාර්තමේන්තු
## திணைக்களங்கள்
## Departments

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



| ශීර්ෂය | ආයතනය | පිටුව |
|---|---|---|
| | පෙරවදන | 1 |
| 4 | උපරිමාධිකරණ විනිශ්චයකාරවරු | 2-3 |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්මේන්තු කොමාසාරිස් කාර්යාලය | 3 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 4-5 |
| 202 | මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුව | 6-8 |
| 203 | ක්‍රිස්ත්‍රියානි කටයුතු දෙපාර්තමේන්තුව | 8-9 |
| 204 | හින්දු ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 9-11 |
| 205 | මහා භාරකාර දෙපාර්තමේන්තුව | 11-23 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 24-25 |
| 207 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 25-31 |
| 208 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 31-33 |
| 209 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 34-37 |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 38-39 |
| 211 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 40-45 |
| 212 | විභාග දෙපාර්තමේන්තුව | 46-48 |
| 213 | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 48-50 |
| 215 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 50-51 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 51-52 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 52-53 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 54-62 |
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 63-70 |
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව | 70-87 |
| 222 | ශ්‍රී ලංකා යුධ හමුදාව | 88-99 |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 99-103 |
| 224 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 104-108 |
| 225 | ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව | 108-112 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 113-116 |
| 227 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 117-122 |
| 228 | අධිකරණ පරිපාලනය | 123-127 |
| 229 | නීතිපති දෙපාර්තමේන්තුව | 127-129 |

| | | |
|---|---|---|
| 230 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | 130-131 |
| 231 | ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව | 131-133 |
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 134-137 |
| 233 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 138-139 |
| 234 | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ටාර් | 140-141 |
| 235 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 142-143 |
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 143-144 |
| 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 145-157 |
| 247 | ශ්‍රී ලංකා රේගුව | 157-191 |
| 248 | සුරාබදු දෙපාර්තමේන්තුව | 192-201 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 201-219 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 219-225 |
| 281 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 226-235 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 236-244 |
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 245-252 |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 253-260 |
| 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 260-266 |
| 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 266-272 |
| 287 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | 273-276 |
| 288 | ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 277-279 |
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 280-282 |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 283-287 |
| 291 | වෙලළ සංරක්ෂණ හා වෙරළ සම්පත් දෙපාර්තමේන්තුව | 287-292 |
| 292 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 292-298 |
| 293 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 299-302 |
| 294 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 302-304 |
| 295 | වාණිජ දෙපාර්තමේන්තුව | 305 |
| 296 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 305-311 |
| 297 | සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව | 311-313 |
| 298 | මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | 313 |
| 299 | ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | 314-316 |

| | | |
|---|---|---|
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 316-319 |
| 301 | සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 320 |
| 303 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 320-321 |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 322-324 |
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 324-349 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 350-369 |
| 308 | තැපැල් දෙපාර්තමේන්තුව | 370-372 |
| 309 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 373 |
| 310 | රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව | 374-376 |
| 311 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 377-380 |
| 320 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 381-387 |
| 322 | ජාතික උද්භිත උද්‍යාන දෙපාර්තමේන්තුව | 388-391 |
| 325 | ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | 391-393 |
| 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | 393-394 |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 394-395 |
| 328 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 396-400 |
| 331 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 401-414 |
| 332 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 415-417 |
| 334 | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව | 418 |

## පෙර වදන

ශ්‍රී ලංකාවේ දැනට පවතින රජයේ දෙපාර්තමේන්තු අසූහතක් පදනම් කරගෙන මෙම වාර්තාව පිළියෙල කර ඇත. වෙන් වෙන් වශයෙන් එම ආයතන වෙනුවෙන් අදාලව 2018, 2019 හා 2020 වර්ෂවලට අදාලව හඳුනාගත් වාර්ථාවේ දිනට විසදී නොමැති වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් කර තිබේ. තවද මෙහි සඳහන් එක් එක් ශීර්ෂයට (රජයේ දෙපාර්තමේන්තුවට) අදාලව 2018, 2019 හා 2020 වර්ෂවල විසර්ජන පනත්වලින් ලැබුණු මුල් ප්‍රතිපාදනය, වසර අග ශුද්ධ ප්‍රතිපාදනය, ඒ ඒ වසරේ සත්‍ය වියදම හා වසර අග ඉතිරිවීම් පුනරාවර්තන හා මූලධන වියදම් වශයෙන් වෙන වෙනමද, ඒවායේ එකතුවද, ඉහත වර්ෂ වලදී ඒ ඒ ආයතනය වෙනුවෙන් ලබාදී තිබෙන විගණන මතයන්ද මේ සමඟ ඉදිරිපත් කර තිබෙන උපලේඛන 1 හි ඇතුලත් කර තිබේ. ප්‍රමාණාත්මක ලෙස ආදායම් රැස්කරණ දෙපාර්තමේන්තුවල ඒ ඒ වර්ෂවලදී ඇස්තමේන්තුගත ආදායම් හා රැස්කල සත්‍ය ආදායම උපලේඛණ 02 හි දැක්වා ඇත.

විශේෂයෙන් මෙම රජයේ දෙපාර්තමේන්තු වෙනුවෙන් වෙන් කර තිබෙන පුනරාවර්තන ප්‍රතිපාදන මූලධන ප්‍රතිපාදනවලට වඩා විශාල අගයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. තවද වාර්ෂිකව ඉදිරි වැඩ සැලසුම් සකස් කිරීම ඊට අනුකූලව කටයුතු මෙහෙයවීම හා වසර අවසානයේදී ඊට අදාල ප්‍රගතිය සමාලෝචනය කර වාර්තා ඉදිරිපත් කිරීම අතින් රජයේ දෙපාර්තමේන්තු ඉතාම දුර්වල මට්ටමක පැවති අතර සමහර දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම් විනිවිදභාවයෙන් සිදු කර නොමැති බවත් විගණන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු විශ්ලේෂණය කිරීමට අවශ්‍ය දත්ත රැස්කිරීමට නොහැකි මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය. රජයේ දෙපාර්තමේන්තු 87 ට අදාලව 2018, 2019 හා 2020 වර්ෂවලදී පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය පිළිවෙලින් රු. 857,767,566,463 ක්, රු. 957,731,330,800 ක් හා රු.1,024,550,986,520 ක් වූ අතර එම වර්ෂවල මුළු සත්‍ය වියදම පිළිවෙලින් රු. 803,755,301,012 ක්, රු.888,050,615,056 ක් හා රු. 962,335,498,443 ක් විය. කලට වේලාවට මුදල් නොලැබීම හෝ දෙපාර්තමේන්තු කාලීනව කටයුතු නොකිරීම නිසා 2018, 2019 හා 2020 වර්ෂ අගදී මුළු ප්‍රතිපාදන වලින් ඉතිරිවීම් පිළිවෙලින් රු. 54,012,265,441 , රු. 69,680,705,766 ක් හා රු.62,215,488,079 ක් වූ අතර එම අගයන් සමස්ථ අයවැය සැලැස්මේ විචලනයන් සඳහා ඒ ඒ වර්ෂවලදී බලපෑම් කර තිබුණි.

තවද තම අධීක්ෂණ කටයුතු සිදුකරන අමාත්‍යාංශ මගින් චක්‍රලේඛ විධිවිධාන උල්ලංගනය කිරීම හේතුවෙන් සමහර දෙපාර්තමේන්තු මගින්ද ඒවා උල්ලංගනය කිරීමට පෙළඹී තිබූ අවස්ථා අනාවරණය විය. තවද සියලුම රජයේ ආයතනවලට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන ගිණුම් පිළියෙල කළයුතු බව අවධාරණය කර ඇතත් ඒ සඳහා අනුගත වීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. නීත්‍යානුකූල හිමකමක් නොමැතිව දෙපාර්තමේන්තු විසින් පරිහරණය කරන ඉඩම් හා වාහනවල නෛතික අයිතිය පවරා ගැනීමටත් ඒවා තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් දක්වන දායකත්වය ඉතාම දුර්වල මට්ටමක පැවතුණි.

**ශීර්ෂය 4 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු**

| | විගණන නිරීක්ෂණය ------------------------ | විගණකාධිපතිගේ නිර්දේශය --------------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ------------------ | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය ------------------------------ |
|---|---|---|---|---|
| | **2020** | | | |
| 01. | 2102 සහ 2103 වැය විෂයයන් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් පිළිවෙලින් රු. 9,570,000 ක් සහ රු. 11,754,000 ක් ද, මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මඟින් පිළිවෙලින් රු. 3,200,000 ක් සහ රු. 2,297,000 ක් ද ලෙස පිළිවෙලින් රු. 12,770,000 ක සහ රු. 14,051,000 ක අමතර ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, වර්ෂය අවසානයට එම වැය විෂයන්වල පිළිවෙලින් රු. 12,545,288 ක් එනම් සියයට 98 ක් සහ රු. 7,879,482 ක් එනම් සියයට 56 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබීම නිසා සැලසුමකින් තොරව අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | අවශ්‍යතාවයට අනුව නිසි සැලසුම් සකස් කර අමතර ප්‍රතිපාදන ලබාගත යුතුය. | ඉදිරියේදී මේ පිළිබඳව අවධානය යොමු කරන බවට එකඟ වී ඇත | මේ පිළිබඳව අවධානය යොමු කරන බව සඳහන් කර ඇත. අයහපත් මූල්‍ය කළමනාකරණ තත්ත්වයකි. |
| 02. | 2020 මාර්තු 24 දිනැති වටිනාකම රු.46,600 ක් වූ අංක 751867 දරන චෙක්පත අවලංගු කර ඒ වෙනුවට අංක 752077 දරන චෙක්පත නිකුත් කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 392(අ)i, 392 (ආ) iii, 393 (i) හා 393 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 අනුව 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම අවසන් අදියරේ පවතින අතර එය හැකි ඉක්මණින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මේ දක්වා ඉදිරිපත් කර නැත. |
| 04. | 2013 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ලබාදී තිබූ වාහනයක අයිතිය පවරා ගැනීමට 2021 පෙබරවාරි 03 වන විටත් කටයුතු කර නොතිබුණි. | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 2(i) ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | අයිතිය පවරා ගැනීමට අදාල ලේඛන අධිකරණ අමාත්‍යාංශය වෙත යවා ඇත. | පවරා ගැනීම අවසන් වී නොමැත. |

ශීර්ෂය 22 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

| **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| **-----------------------** | **-----------------** | **-------------------------** | **-------------------------** |
| පෙත්සම් කටයුතු කළමනාකරණය සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීමට රු.500,000 ක් හා කාර්යාලය පරිගණක ජාල ගත කිරීම සඳහා රු.150,000 ක් 2018 හා 2019 වර්ෂවල ඇස්තමේන්තු ගත කර තිබූ නමුත් උක්ත කාර්යයන් අවසන් කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතුවේ. | මෘදුකාංග පද්ධතිය සකස් කිරීමේ කටයුතු ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මඟින් සිදුකර ගැනීමට පියවර ගෙන ඇති අතර, පරිසනක ජාලගත කිරීම, ලැබෙන ප්‍රතිපාදන අනුව හා ප්‍රමුඛතාවය අනුව සිදුකිරීමට අපේක්ෂා කරන බව | මේ දක්වා එම කටයුතු අවසන් කර නැත. |

ශීර්ෂ 201 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධව වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම<br>(අ) රු. මිලියන 74.96 ක් වැය කර කැලණිය ඊරියවැටියේ ඉදිකරන ලද දසසිල් මාතා මූලස්ථානය හා පුහුණු ආයතනයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර දෙපාර්තමේන්තුව වෙත භාරදී වර්ෂ 6 කට වැඩි කාලයක් ගතවී තිබුණද එහි පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | අදාල අරමුණ ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | 2020 වර්ෂය දක්වා ගොඩනැගිල්ලේ බාහිර කොටස් වරින්වර සකස් කරන ලද අතර 2020 වර්ෂයේ සිට පුහුණු වැඩසටහන් කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. | මේ දක්වා පුහුණුවීම් කටයුතු ආරම්භ කර නැත. |
| | (ආ)ඉහත ඡේදයේ සඳහන් ආයතනය ඉදිකරන ලද ඉඩම 2012 වර්ෂයේදි දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රාදේශිය ලේකම්වරයා වෙත දැනුම් දී වර්ෂ 08 කට වැඩි කාලයක් ගත වී තිබුණද මෙතෙක් එම අත්පත් කර ගැනිමේ කටයුතු අවසන් කර නීතිමය අයිතිය තහවුරු කරගෙන නොතිබුණි. | ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | මෙම ඉඩම අත්පත් කර ගැනිමට අදාලව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශ 2021 අගෝස්තු 10 වන දින ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | පවරා ගැනීමේ කටයුතු මෙතෙක් අවසන් කර නැත. |
| 2. | භික්ෂූන් වහන්සේලාගේ හා දසසිල් මාතාවන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීම, දහම් පාසල් සඳහා ආධාර ලබාදීම හා බෞද්ධ දරු දැරියන්ට සහන | භාරයන් පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් භාර අරමුදල් ඵලදායිව උපයෝජනය කළ යුතු වීම. | භාර අරමුණු වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික අයවැයෙන් | වාර්ෂික ඇස්තමේන්තු සැකසීම ඵලදායි ලෙස සිදුකල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සැලසීම ආදි අරමුණු ඉටු කිරීම සඳහා ස්ථාපිත බුද්ධශාසන භාරයෙහි හා දසසිල් මාතා භාරයෙහි 2018 වර්ෂයෙහි සිට 2019 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා ලද ආයෝජන පොළී ආදායම පිළිවෙලින් රු.716,740 ක් හා රු.367,782 ක් ඉහත අරමුණු ඉටු කිරීම සඳහා යෙදවීමේ හැකියාව පැවතියද ඒ සඳහා කටයුතු කර නොතිබුණි | | ලැබෙන මුදල් ප්‍රමාණවත් බැවින් භාරයේ පොලි මුදලින් මෙම කටයුතු සිදු කර නොමැත. | |
| 3. | සේවය හැර ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිමට තිබුණු වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා වූ කාල පාරාසයකට අයත් එකතුව රු.262,686 ක් වූ ණය ශේෂ අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | නිලධාරීන් දැනුවත් කිරිමට, ඇපකරුවන් හඳුනා ගැනීමට හා නීතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. | මේ දක්වා ණය මුදල් අයකරගෙන නැත. |
| 4. | දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 852 ක් වන අතර 2020 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 88 ක් විය. ඒ අතුරින් බෞද්ධ කටයුතු සමායෝජක තනතුරු 41 ක සහ සංවර්ධන සහකාර තනතුරු 16 ක පුරප්පාඩු වර්ෂ කිහිපයක සිට පැවතුණු අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | සමායෝජක තනතුරු පුරප්පාඩු සංවර්ධන නිලධාරි තනතුරු වලින් සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම. | අවශ්‍ය කාර්යමණ්ඩල විධිමත් කර ගැනීමට කටයුතු කර නැත. |

ශීර්ෂ 202 - මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධ වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | (අ) 1982 අංක 33 දරන වකුෆ් පනතේ 45 වගන්තිය මගින් මුස්ලිම් ජාතිකයින්ගේ හා ඉස්ලාම් ආගමෙහි අභිවෘද්ධිය සඳහා ඉටුකළ හැකි කාර්යයන් 5 ක් දක්වා ඇති අතර 2017,2018 හා 2019 වර්ෂවලදී පුන්‍යාධාර අරමුදල වෙත එකතුව රු.12,365,590 ක් ලැබී තිබුණි. එහෙත් එම කාර්යයන් ඉටුකිරීම සඳහා කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අරමුදල් ප්‍රශස්ත අයුරින් උපයෝජනය කර පනතෙහි සඳහන් කාර්යයන් ඉටුකළ යුතු වීම. | පනතේ සඳහන් කාර්යයන් සඳහා වියදම් දැරීමට වකුෆ් මණ්ඩලය අනුමත කර නොතිබූ බැවින් එම වර්ෂවල වියදම් දැරීමට නොහැකි විය. විධිමත් සැලැස්මක් අනුව 2021 වර්ෂයේ සිට පනතේ සඳහන් කාරණා සඳහා මුදල් යෙදවීමට කටයුතු කිරීමට වකුෆ් මණ්ඩලය එකඟ විය. | මේ දක්වාම පනතේ සඳහන් පරිදි කටයුතු කර නැත. |
| | (ආ) වකුෆ් පනතෙහි 43(8) වගන්තිය ප්‍රකාරව අරමුදල සඳහා ගිණුම් පවත්වා ගත යුතු අතර එම ගිණුම් විගණකවරයෙකු මගින් විගණනය කරගත යුතු වුවත් 2016 වසරේ සිට 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබුණි. | පනතෙහි සඳහන් විධිවිධාන පරිදි කටයුතු කල යුතු වීම. | පුණ්‍යාධාර අරමුදලට අදාලව 2019 දක්වා ගිණුම් සකස් කර ඇති අතර, 2016 සිට 2019 දක්වා ගිණුම් පුද්ගලික විගණන සමාගමක් මගින් විගණනය කර ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | මේ දක්වා 2016 සිට 2019 මූල්‍ය ප්‍රකාශන සකසා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 2. | 1982 අංක 33 දරන වකුෆ් පනතේ 4 වන පරිච්ඡේදයේ 43 (2) වගන්තිය ලියාපදිංචි මුස්ලිම් පල්ලියක, පුණ්‍ය භාරයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 6 ක ප්‍රමාණයක් ද, මුස්ලිම් සිද්ධස්ථානයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 10 ක ප්‍රමාණයක් ද, මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට ලබා දිය යුතු බව සඳහන් වුවද අදාල පල්ලි සහ සිද්ධස්ථාන වෙතින් ලැබිය යුතු නියම මුදල මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට ලැබෙන බවට පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුනා ගෙන නොතිබුණි. | විධිමත් ක්‍රමවේදයක් හඳුනාගත යුතු බව. | ලියාපදිංචි මුස්ලිම් පල්ලි 2497 ක් හා සාන්තුවරුන්ගේ සොහොන් (Sharyn) 49 ක වාර්ෂික ආදායමෙන් පිළිවෙලින් 6% ක් හා 10% ක් අරමුදලට බැර කිරීම සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වේ. | පසුවිපරම් කටයුතු විධිමත්ව සිදු නොවේ. |
| 3. | මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 1995 වර්ෂයේදී ලද කැබිනට් අනුමැතියක් මත, දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පර්චස් 80ක වූ ඉඩමක දෙපාර්තමේන්තුව විසින් 2003 වර්ෂයේදි දෙමහල් ගොඩනැඟිල්ලක් ද 20017 වර්ෂයේදි මහල් 10 කින් යුත් ගොඩනැඟිල්ලක් ද ඉදි කර තිබූ අතර කැබිනට් අනුමැතිය ලැබී වර්ෂ 26 ක් ගත වී තිබුණද මෙතෙක් නීත්‍යානුකූලව අදාල ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, මහල් 10 කින් යුත් වර්ග අඩි 67250 ක | වත්කම් උපරිමයෙන් භාවිතයට ගත යුතු බව. | ඉඩම පවරා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණද මේ දක්වා එම පැවරීම සිදු වී නොමැත. මහල් 10 කින් යුත් ගොඩනැගිල්ලේ මහල් 4 ක් පමණක් සම්පූර්ණ කර ඇති අතර ඉතිරි මහල් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන ලැබී නොමැත. තවද ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීමෙන් තොරව අනුකූලතා සහතික ලබා ගැනීම සිදු කළ නොහැක. | ඉඩම් පවරාගැනීම හා ගොඩනැගිලි උපයෝජනය මේ දක්වාම විධිමත් වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගොඩනැඟිල්ලේ මහල් 04 ක් එනම් වර්ග අඩි 33,699 ක් පමණක් 2017 වර්ෂයේ සිට භාවිතයට ගෙන තිබුණද ඉතිරි වර්ග අඩි 33,547 ක ප්‍රමාණය විගණන දිනය වූ 2021 ජූලි 05 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණු අතර ගොඩනැඟිල්ල සඳහා අනුකූලතා සහතිකයක් ද ලබා ගෙන නොතිබුණි. | | | |

ශීර්ෂ 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 1. | <u>මානව සම්පත් කළමනාකරණය</u><br>(අ) දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 66 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 50 ක් වුයෙන් නිලධාරින් 16 දෙනෙකු ගේ පුරප්පාඩු පැවතුණි. | අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කර ඇත. | මේ දක්වාම පුරප්පාඩු එලෙසම පවතී. |
| | (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 ඡේදය පරිදි, වැඩ බැලීමේ පත්වීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් සිදු කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුරට පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්වීම නොපමාව කළ යුතු විය. එසේ | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිත්‍ය පත්වීමක් සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වන තනතුරක් වන බැවින්ද අධ්‍යක්ෂ තනතුරෙහි පුරප්පාඩුව පිරවීම දෙපාර්තමේන්තු වපසරියෙන් බැහැර කරුණක් වන බවද කාරුණිකව දන්වා සිටිමි. | මේ දක්වාම පුරප්පාඩුව විධිමත් වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වුවද, පුරප්පාඩු වූ අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කර තිබූ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරිය 2018 අගෝස්තු 01 දින සිට 2020 ජනවාරි 08 දින දක්වා රාජකාරි ඉටුකිරීමේ පදනම මත ද 2020 ජනවාරි 09 දින සිට 2021 අප්‍රේල් දක්වා වැඩ බැලීමේ පදනම මතද අඛණ්ඩව රාජකාරි කරනු ලබන අතර ඒ සඳහා නිත්‍ය පත්වීමක් කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| | (ඇ) දෙපාර්තමේන්තුව සඳහා අනුමත රියැදුරු තනතුරු 02 ක් පැවතියද එක් තනතුරක් 2020 ජනවාරි 28 දින සිට පුරප්පාඩු වී පැවතුණි. ඒ හේතුවෙන් දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන දෙකෙන් එකක් එදින සිට නිශ්කාර්යව පැවතුණි. | රියැදුරු තනතුරට අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2017අනුව සෑම කාර්තුවකම කාර්ය මණ්ඩල වාර්තාවෙහි ඉහත සඳහන් රියදුරු තනතුර පුරප්පාඩු බව කළනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | මේ දක්වාම පුරප්පාඩුව සම්පූර්ණ කර නොමැත. |

ශීර්ෂ 204 - හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශ | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධ වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශ පරිදි පිරිවිතර සහ එකඟ වී ඇති වෙනත් නියම සහ කොන්දේසිවලට අනුකූලව වැඩ ඉටුකර ඇති බවටත් සහතික කර ඇති ගෙවීම්, කොන්ත්‍රාත්තුවේ | වැඩ නිම කිරීමේ සහතික ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | වැඩ නිම කිරීමේ සහතිකය අදාල ලේඛනය සමඟ ඉදිරිපත් කරන ලෙස සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ලිඛිතව දැනුම් දී ඇත. | කෝවිල් 08 කින් මේ දක්වා එම සහතික ලබාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්දේසිවලට අනුකූලවන බවටත් තහවුරු කරමින් සහතිකයක් ලබා ගත යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් කෝවිල් 26 ක සංවර්ධන කටයුතු වෙනුවෙන් ලබාදුන් එකතුව රු.7,800,000 ක් සම්බන්ධයෙන් වැඩ නිම කිරීමේ සහතික ලබා ගෙන නොතිබුණි. | | | |
| 2 | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05 ක් එකම සේවා ස්ථානයෙහි සේවා කර ඇති සෑම නිළධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, වර්ෂ 05 සිට වර්ෂ 31ක් දක්වා කාල පරාසයක් තුළ එකම ස්ථානයක සේවය කරනු ලබන නිළධාරීන් 85 ක් සඳහා එවැනි ස්ථාන මාරුවීම් ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම සම්බන්ධයෙන් අදාල පරිපාටිය අනුව වාර්ෂික ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර ඇත. | වාර්ෂිකව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර ඇතත් ස්ථාන මාරුවීම් සිදුකර නොමැත. |
| 3. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.7. ඡේදය පරිදි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර එම වාර්තා පසුව එළඹෙන වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා සහ 2017 හා 2018 වර්ෂවලට අදාලව පුස්තකාල පොත් සඳහා භාණ්ඩ සමීක්ෂණ | සියලුම භාණ්ඩ සඳහා වාර්ෂික සමීක්ෂණය සිදු කළ යුතු වීම. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් අදියරෙහි පවතී. | මේ දක්වාම එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වාර්තා 2020 අගෝස්තු 10 දින වන විටත් ලබා දී නොතිබුණි. | | | |
| 4. | <u>දේපළ පිරියත හා උපකරණ</u> දෙපාර්තමේන්තුවට අයත් විවිධ ප්‍රදේශවල පවතින ඉඩම් හා ගොඩනැගිලි 4 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියලුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කල යුතු වීම. | ගොඩනැගිලි 02 ක වටිනාකම ගණනය කර 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇත. ඉතිරි ගොඩනැගිලි 02 හි වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. | වත්කම් ගිණුම්ගත කිරීම මේ දක්වා අවසන් කර නොමැත. |
| 5. | <u>මානව සම්පත් කළමනාකරණය</u> දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 185 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 150 ක් විය. ඒ අනුව, කාර්ය මණ්ඩල පුරප්පාඩු 35 ක් පැවති අතර පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වූ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. | දැනට පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් වන අතර එම පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇතත් එම කටයුතු ඉටුකර නොමැත. |

ශීර්ෂ 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශ | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධ වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2018 වර්ෂයේ දී වතු 5 කින් රු.4,410,567 ක අලාභයක් ලබා තිබුණු අතර වතු පැවරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු කිරීමේ දී එම තත්ත්වය අහිතකර ලෙස බලපා තිබුණි. | වතු පරිපාලන කටයුතු විධිමත් කළ යුතු අතර කළමනාකාරීත්වය විසින් අධීක්ෂණය කළ යුතු වේ. | දෙපාර්තමේන්තුව සඳහා පලපුරුදු වතු අධිකාරීවරුන් බඳවා ගැනීමට සහ ක්ෂේත්‍රයේ නිපුණතා ඇති උපදේශක මහතකුගේ සේවාව ලබා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව මනා කාර්යක්ෂම | ක්ෂේත්‍රයේ පළපුරුදු උපදේශක මහතුන්ගේ සේවය ලබාගෙන ඇතත් මේ දක්වාම ලාභදායි තත්ත්වයකට පත්වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කළමනාකරණයක් තුළින් අලාභ ලැබූ වතු ලාභ තත්ත්වයට පත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර ඉදිරියේදී ලාභ වැඩි කරගැනීමට අපේක්ෂිතවේ. | |
| 2. | 2007 ජනවාරි 27 දින වාහනයක් අනතුරට පත්වීමෙන් රු.254,038 ක අලාභයක් සිදු වී තිබුණු අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 යටතේ කරන ලද පරීක්ෂාවෙන් පසුව උක්ත අලාභය රියදුරුගෙන් අයකර ගැනීම සඳහා 2007 මැයි 07 දින අත්තනගල්ල දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් සිදු නොකිරීම හේතුවෙන් කාලාවරෝධය මත නඩුව නිෂ්ප්‍රභා වී තිබුණි. | පාඩු හා හානි වගකිව යුතු අයගෙන් අයකර ගැනීම හෝ පොත් වලින් කපා හැරීම සිදු කළ යුතු වේ. | අධිකරණ අමාත්‍යාංශයෙන් හා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන ඉදිරියේදී පොත් වලින් කපා හැරීමට කටයුතු කරන බව දන්වමි. | පොත්පත්වලින් කපාහැරීම මේ දක්වාම සිදුවී නොමැත. |
| 3. | <u>කළමනාකරණ දුර්වලතා</u><br>(අ) විදේශ රැකියාවක නියුක්තව සිටියදී විවිධ හේතූන් නිසා මියයන පුද්ගලයින් වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ලැබෙන වන්දි මුදල්, වැටුප් හා වේතන ආදිය ඔවුන්ගේ නීත්‍යානුකූල හිමිකරුවන්ට ගෙවීමේ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. 2017 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.මිලියන 175.29 ක් වූ | වන්දි හිමිකරුවන් පිළිබඳ තොරතුරු සම්බන්ධිත රාජ්‍ය ආයතන මඟින් සොයා ගැනීමට (විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ග්‍රාම නිළධාරී ආදි) උත්සාහ කළ යුතු අතර විදේශ වන්දි නිදහස් කිරීම කාර්යක්ෂම කළ | වන්දි මුදල් අයදුම්පත් නිදහස් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයක් නොවන බවත්, හිමිකරුවන් පිළිබඳ තොරතුරු නොමැතිකම, හිමිකරුවන් දැනුවත් කලද වන්දි ලබා ගැනීමට නොපැමිණීම, විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් | කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට ක්‍රමවේදයක් සකස් කර ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | විදේශ වන්දි 335 ක් ගෙවිය යුතුව පැවති අතර 2018 වර්ෂයේ දී රු.මිලියන 417.86 ක් වූ විදේශ වන්දි අයදුම්පත් 170 ක් ලැබී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ දී නිදහස්කළ අයදුම්පත් සංඛ්‍යාව 113 ක් පමණක් වූ අතර එහි වටිනාකම රු.මිලියන 275.92 ක් විය. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත ලැබෙන වන්දි මුදල් අයදුම්පත් නිදහස් කිරීමේ ප්‍රමාදයක්, විගණනයේ දී නිරීක්ෂණය විය. | යුතු වේ. | තොරතුරු නොලැබීම, හිමිකරුවන් සොයා ගැනීමට නඩු පවරා තිබීම හා ඇතැම් හිමිකරුවන් විදේශ ගත වීම වැනි කරුණු මේ සඳහා හේතු වී තිබුණි. | |
| | (ආ) (i) අක්කර 16 රූඩ් 2 පර්චස් 17 කින් සමන්විත "මත්තේබොඩ කුඹුරු ඉඩම, මොරටුව" නමැති ඉඩමෙන් අක්කර 11 පර්චස් 20.1 ක් කොළඹ දිසා අධිකරණය විසින් මහා භාරකාරවරයාට දුන් අවසරය මත අඳ ගොවියන්ට විකුණා තිබුණු අතර අක්කර 3 රූඩ් 1 පර්. 30 ක් 1999 ජූනි 21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රජයට පවරා ගෙන තිබුණි. ඒ අනුව තවදුරටත් අක්කර 2 පර්චස් 7 ක ප්‍රමාණයක් මහා භාරකාරවරයා සතුව ඉතිරි වී තිබිය යුතු වුවත්, ඒ සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | බූදලයට අයත් ඉඩම්වල භෞතික හිමිකාරීත්වය මහා භාරකාරවරයා විසින් තහවුරු කර ගත යුතුය. | මෙම ඉඩම් හඳුනා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | මේ දක්වාම එම තත්ත්වය නිරවුල් වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) ඉහත ඉඩමෙන් රජයට පවරාගත් අක්කර 3 රූඩ් 1 පර්චස් 30 ක ඉඩම කැබලි 5කට කොටස් කර තිබූ අතර, 2012 නොවැම්බර් 19 දින රු.885,000 ක වන්දියක් කැබලි අංක 1,2 සහ 5 ට හිමිවී තිබුණි. එහෙත් වන්දි මුදලට අමතරව 2018 අගෝස්තු 31 දිනට හිමිවිය යුතු සියයට 7 ක පොළිය වූ රු.841,827 ක මුදල අයකර ගෙන නොතිබුණි. තවද, 2018 අගෝස්තු 31 දින වන විටත් කැබලි අංක 3 සහ 4 සඳහා මහා භාරකාරතැනගේ අයිතිය සනාථ කරගෙන ඊට අදාළ වන්දි මුදල් ලබාගෙන නොතිබුණි. | රජයට පවරා ගත් බූදල් ඉඩම් වලට අදාළ වන්දි මුදල් හා පොළී මුදල් බූදලය වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අංක 3,4 කොටස් වලට අදාල වන්දි මුදල් මේ දක්වා ලැබී නොමැත. වන්දි හා පොලී මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පියවර ගන්නා බව දන්වා සිටිමි. | මේ දක්වාම වන්දි මුදල් අයකර ගෙන නොමැත. |
| | (ඇ) අක්කර 41 රූඩ් 2 පර්චස් 9 ක් වූ “මහරගම කටුවාවල අඹගහපුර” නමැති ඉඩමෙන් අක්කර 1 ක් 2006 දෙසැම්බර් 06 දින රජයට පවරා ගෙන තිබුණු අතර, 2014 ජනවාරි 16 දිනට එම ඉඩමේ තක්සේරු වටිනාකම රු.මිලියන 29 ක් විය. වන්දි මුදල් සඳහා හිමිකම් කියන පාර්ශවයන්ගේ විරෝධතා හේතුවෙන් හා මෙම ඉඩම සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පැවතීම හේතුවෙන් වන්දි හා පොළි | රජයට පවරා ගත් බූදල් ඉඩම් වලට අදාළ වන්දි මුදල් හා පොළී මුදල් බූදලය වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | නඩු කටයුතු අවසන් වූ වහාම වන්දි මුදල අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නඩු කටයුතු මේ වන තෙක් අවසන් වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද, මෙම ඉඩමේ පර්චස් 31 ක් වූ කොටස විකුණා එම මුදල් ඩී.එස්.ඩබ්ලිව් සමරකෝන් භාරයට ලබා ගැනීමට 2019 පෙබරවාරි 28 වන විටත් කටයුතු කර නොතිබුණි. | | | |
| | (ඈ)(i) අක්කර 141 රූඩ් 2 පර්චස් 9.62 කින් සමන්විත "රෙජිඩේල් වත්ත" නමැති ඉඩමෙන් අක්කර 134 රූඩ් 1 පර්චස් 25.92ක් අවස්ථා කිහිපයකදී රජයට පවරාගෙන හා විකුණා තිබුණි. ඉතිරි බිම් ප්‍රමාණය වන අක්කර 7 රූඩ් 01 පර්චස් 23.70 සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | බූදලයට අයත් ඉඩම්වල භෞතික හිමිකාරීත්වය මහා භාරකාරවරයා විසින් තහවුරු කර ගත යුතු අතර බූදල්කරුගේ අභිප්‍රායන් ඉටු කළ යුතු වීම. | රූඩ් 1 පර්චස් 2.62 ක ඉඩම 2018 අගෝස්තු 10 දිනැති අධිකරණ නියෝගය පරිදී බදු ගිවිසුමක් යටතේ මාසිකව රු.25,000 කට බදු දී ඇත. ඉතිරි බිම් කොටස් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. | මේ දක්වාම ක්‍රියාමාර්ග ගෙන නිරවුල් කිරීම් සිදුකර නැත. |
| | (ii) රෙජිඩේල් වත්ත ඉඩම සඳහා ඉදිරිපත් කළ ගොනු අනුව රජයට පවරාගත් හා විකුණූ අක්කර 56 රූඩ් 2 පර්චස් 22.5 ක් සඳහා රු.මිලියන 3.83 ක් ලැබුණු බව සඳහන් වුවද, එම මුදල් සත්‍ය වශයෙන් ලැබුණු බවට සනාථ කරගැනීමට තොරතුරු ඉදිරිපත් නොවීය. තවද, අක්කර 1 රූඩ් 2 පර්චස් 18.46 ක් වූ ඉඩම් කොටසක් 2009 ජුනි 02 | බූදල් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු තබා ගැනීම මහා භාරකාරවරයා විසින් තබා ගත යුතු වීම හා මහා භාරකාරවරයාගේ වගකීම කඩිනමින් ඉටු කර බූදල්කරුගේ අභිප්‍රායන් ඉටු කළ යුතු වීම. | මෙම මුදල් ලැබු බවට සනාථ කිරීමට අදාල තොරතුරු දැනට පවතින ගොනු තුළින් සොයා ගැනීමට නොහැකි වි ඇත. අවසතු කර ඇති ඉඩමේ පිඹුර අනුමත වි ඇත්තේ 2017 මාර්තු 29 දිනය. මෙම ප්‍රමාදය නිසා ඉඩම විකිණීමේ කටයුතු ප්‍රමාද වී ඇත. | මෙම මුදල් ලැබූ බවට සනාථ කිරීමට අදාල තොරුතු දැනට පවතින ගොනු තුළින් සොයා ගැනීමට නොහැකි වී ඇත. අක්කර 1 රූඩ් 2 පර්චස් 18.46 ක් වූ ඉඩම් කොටස මේ දක්වාම විකුණා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දින අවසතු කර 2011 මාර්තු 23 දින මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත නැවත භාර දී තිබුණද, එදින සිට විගණිත දින වන විට වර්ෂ 9 ක් ගතවුවද ඉඩම විකුණා එම මුදල් ඩී.එස්.ඩබ්ලිව්. සමරකෝන් බූදලය නමට තැන්පත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | | | |
| | (ඉ) 1968 අගෝස්තු 11 දින සිංගප්පූරුවේදී මියගිය ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මියගේ ශ්‍රී ලංකාවේ පැවති නිශ්චල හා චංචල දේපළ විකුණා ලැබෙන මුදල් උරුමකරුවන්ට/ අර්ථලාභීන්ට ලබාදීම සඳහා ඇටර්නි බලකරු ලෙස 1975 වර්ෂයේදී ශ්‍රී ලංකා මහා භාරකාරවරයා පත්කර තිබුණි. කොළඹ 05, හැව්ලොක් පාර, අංක 19 දරන ස්ථානයෙහි පිහිටි රූඩ් 01 පර්චස් 3.13 ක වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම හා ගොඩනැගිල්ල විකුණා ලද මුදලින් රු.64,645,776ක් උරුමකරුවන්/ අර්ථලාභීන් අතර බෙදාහැරීමට නියමිතව පැවති අතර ඉන් රු.35,880,064 ක මුදලක් උරුමකරුවන්/ අර්ථලාභීන් 30 දෙනෙකුට ලබාදී තිබුණි. තවදුරටත් අර්ථලාභීන් 16 දෙනෙකු වෙත රු.28,765,712 ක් ගෙවිය | අර්ථලාභීන්ට මුදල් ගෙවීමට කටයුතු කල යුතු වීම හා මුදල් ගෙවන තෙක් අරමුදල් ඵලදායී අයුරින් ආයෝජනය කළ යුතු වීම. | මෙම මුදල් ලබා දීමේදී අර්ථලාභීන්ගේ ඉල්ලීම පරිදි සිදුකර ඇත. අර්ථලාභීන් වෙත බෙදාහැරීම සඳහා ඇති මුදල් 2019 වර්ෂයේදී ආයෝජනය කර ඇත. | දේපල විකිණීමෙන් ලද මුදල 2019 වර්ෂයේ දී ආයෝජනය කර ඇත. අර්ථලාභීන්ගේ ඉල්ලීම් නොමැති බැවින් බෙදා හැරීම් අවසන් වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | යුතුව තිබුණු නමුත් දේපළ විකුණා වර්ෂ 8කට අධික කාලයක් ගත වී තිබුණද ඒ සඳහා කටයුතුකර නොතිබුණි. තවද, දේපළ විකිණීමෙන් ලැබෙන මුදල සහ ඊට එකතුවන පොළිය මියගිය අයගේ උරුමකරුවන්ට බෙදා හැරිය යුතු බව අධිකරණයෙන් දන්වා තිබුණද, රු.24,531,570 ක් අර්ථලාභීන් 16 ක් අතර 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී බෙදාහැරීමේදී, එම මුදල් නිදහස් කරන තෙක් ඵලදායී ආයෝජන මාර්ගවල නොයෙදීම හේතුවෙන් අර්ථලාභීන්ට හිමි විය යුතුව තිබූ පොළී මුදල් අහිමිවී තිබුණි. | | | |
| | (ඊ) වීරසිංහ අබේනායක බූදලයට අයත් මාතර ගබඩා වීදියේ පර්චස් 32 ක් විශාල ඉඩම හා ගොඩනැගිල්ල 2013 වර්ෂය දක්වා ඵලදායී අයුරින් කළමනාකරණය කර නොතිබුණු අතර 2013 පෙබරවාරි 05 දින රු.8000ක මාසික කුළියකට බදු දී තිබුණි. උක්ත බදු ගිවිසුම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. මෙම දේපළ විකිණීම සඳහා නඩු අංක 97/16 යටතේ 2016 සැප්තැම්බර් 29 දින කොළඹ දිසා අධිකරණයේ දිසා විනිසුරුවරයාගේ අවසරය | විකිණීම සඳහා අධිකරණ අවසරය ලද ඉඩම් හා ගොඩනැගිලි විකුණා බූදලයේ අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම | අදහස් දක්වා නොමැත. | රුපියල් 10,000 මාසික බදු මුදලක් ගෙවමින් භුක්ති විඳි පුද්ගලයින් බලහත්කාරයෙන් ඉවත් කරමින් පුද්ගලයෙක් දේපළ භුක්ති විඳින අතර දෙපාර්තමේන්තුව විසින් බලහත්කාරයෙන් පදිංචි වී සිටින අය නෙරපීමට අදාළව නීතිමය පියවර ගෙන ඇත. දේපළ විකුණා අරමුදලට බැර කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගෙන තිබුණද දේපළ විකුණා අරමුදලට බැර කිරීම වෙනුවට විධිමත් බදු ගිවිසුමකට එළඹීමෙන් තොරව ඉහත බදුකරුටම මාසිකව රු10,000 ක මුදලකට බදු දී තිබුණි. | | | |
| | (උ) ඩී. ජේ. ඩී. ජේ. අබේසේකර බුදලයට අයත් ගාල්ල ඇල්පිටිය ප්‍රදේශයෙහි පිහිටි කඩකාමරයක් හා ඉඩමක් වසර 20කට වැඩි කාලයක සිට ගිවිසුම්වලින් තොරව බදු දී තිබුණි. 2013 හා 2015 වර්ෂවලදී රු.1,100,000 ක් හා රු.2,300,000 ක් ලෙස තක්සේරු කරන ලද මෙම කඩ කාමරය හා ඉඩම දැනට බුක්ති විඳිනු ලබන බඳුකරුවන් විසින් තක්සේරු වටිනාකමට මිලදී ගැනීමට එකඟ වූ බව සඳහන් කළද, ඒ සඳහා ලිඛිත එකඟතාවයක් නොවීය. තවද, කඩකාමරය වෙනුවෙන් 2018 මැයි දක්වා රු.227,380 ක්ද, ඉඩම සඳහා 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.143,400 ක්ද වශයෙන් බදු කුලී අයවිය යුතු බව ගණනය කර තිබුණද, එම මුදල් ද ඇතුළුව 2019 වර්ෂය දක්වා අයවිය යුතු බදු කුලී අයකර ගෙන නොතිබුණි. | බාහිර පාර්ශවයන්ට බුදල් දේපළ බදු පදනමින් ලබාදීමේදී දේපළවල ආරක්ෂාවත්, ඉන් සාධාරණ ආදායමක් ලැබීමත් තහවුරු කිරීම සඳහා විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතු වීම හා බදු පැහැර හැර ඇති දේපළ නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. | බදු අයකරගෙන නොමැත. එක් දේපලක් මේ දක්වා විකුණා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | (උ) පුද්ගල භාර අංශය මගින් කළමනාකරණය කරනු ලබන භාර 20කට අදාලව 2019 හා 2018 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව මුලු වත්කම් පිළිවෙලින් රු.17,402,203ක් හා රු.16,655,856 ක්ද, ආයෝජන ආදායම් රු.938,729 ක් හා රු.1,096,900 ක්ද ලෙස දක්නට ලැබුණද එම භාරවලින් අරමුණු ඉටු කිරීමකින් තොරව අක්‍රීය මට්ටමෙහි පැවතුණි. | අරමුණු ඉටුකිරීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩල ලිඛිතව දැනුවත් කළ යුතු වීම. | භාරකාර මණ්ඩල අක්‍රීය වීම, භාරකාර මණ්ඩල ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම, අර්ථලාභීන් සොයාගැනීමේ අපහසුව ආදී කරුණු හේතුවෙන් අරමුණු ඉටු කළ නොහැකි විය. | විධිමත් පරිපාලන ක්‍රමවේදයක් නොමැති බැවින් අරමුණු ඉටු කරගෙන නොමැත. |
| | (එ) විවෘත නොකරන ලද අන්තිම කැමති පත්‍ර 254 ක් විවෘත කිරීම සම්බන්ධයෙන් වූ නීති කටයුතු වෙනුවෙන් රු.2,629,250 ක් වැය කර තිබුණු අතර එම වියදම ඩී. එස්. ඩබ්. සමරකෝන් බූදලයේ අරමුදල් භාවිත කර ගෙවා තිබුණි. එම බූදලයට අදාලව ඉටුකළ යුතු කාර්යයන් බූදල්කරු විසින් සිය අන්තිම කැමති පත්‍රයෙහි නිශ්චිතව සඳහන්කර තිබූ බැවින් මෙම වියදම් දැරීම අරමුණුවලට පටහැනි බව නිරීක්ෂණය කෙරේ. | බූදල්කරුවන් විසින් අන්තිම කැමති පත්‍රවල නිශ්චිතව සඳහන් කර ඇති අරමුණු ඉටුකිරීම සඳහා පමණක් බූදල් දේපළ උපයෝජනය කළ යුතු වීම. | අධිකරණ කාර්යයන් අවසානයේදී එම අන්තිම කැමති පත්‍රවල ඇති දේපළවලින් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත මහාභාරකාර තැනගේ අභිමතය පරිදි මෙම බූදලයෙන් ගෙවන ලදී. | වියදම් ප්‍රතිපූර්ණය කර නොතිබූ අතර අරමුණු ඉටු කිරීමක් ද සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ඒ) 1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම් (විශේෂ විධිවිධාන) පනත මගින් ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමේ දී රජය වෙනුවෙන් කොටස් දැරීම සඳහා මහාභාරකාරවරයා නම් කර තිබුණි. ඒ අනුව රජය වෙනුවෙන් මහාභාරකාරතැන වෙත සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සාමාන්‍ය කොටස් 3,050,379 ක් එනම් සියයට 87.5 ක හිමිකාරිත්වය ලබාගෙන තිබුණද, ඒ සම්බන්ධව හා ඒ මත උපයන ලාභාංශ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ භාර/බූදල් ගිණුම්වල කිසිඳු හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. | සියලුම ආයෝජන හා ඒ මත ලැබෙන ලාභාංශ සියල්ලම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයෙහි දැක්විය යුතු වීම | වාර්ෂිකව ලැබෙන ලාභාංශ එම ලාභාංශ ලැබෙන මාසයේදීම ගිණුම් සාරාංශ මඟින් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ භාර / බූදල් ගිණුම්වල අදාල හෙළිදරව් කිරීම් කල යුතුය. |
| | (ඔ) විවිධ අනපනත් හරහා දෙපාර්තමේන්තුවට සුවිශේෂී කාර්යභාරයක් පැවරි ඇති අතර ඒ අනුව දෙපාර්තමේන්තුවෙන් විවිධ පාර්ශවයන්ට විවිධ සේවාවන් සපයනු ලබයි. එහෙත් දෙපාර්තමේන්තුවෙන් ඉටුකරන කාර්යයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. දෙපාර්තමේන්තුව නමින් වෙබ් පිටුවක් සකස් කර | වෙබ් පිටුව භාෂා ත්‍රිත්වයෙන්ම යාවත්කාලීනව පවත්වාගෙන යාම, අන්තිම කැමති පත්‍රයක් ලිවීම සම්බන්ධ උපදෙස් හා ආකෘති, ශීෂ්‍යාධාර හා වෛද්‍යාධාර ආදි ආධාර ඉල්ලුම් පත්‍ර ආදිය වෙබ් පිටුව හරහා බාගත කිරීමේ පහසුකම් සැලසීම හා ජනතාවගේ අදහස්, යෝජනා හා | අදහස් දක්වා නොමැත. | මේ දක්වාම වෙබ් පිටුව යාවත්කාලීන කිරීමට හා දෙමළ භාෂාවෙන් අදාල තොරතුරු පරිශීලනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණද, එය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පරිශීලනය කිරීම සඳහා පහසුකම් සලසා නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුවේ පසුබිම, මහා භාරකාරතැනගේ කාර්යභාරය හා එක් එක් අංශවල කාර්යභාරය පමණක් එහි ඇතුළත් කර තිබුණු අතර, මහජනතාවට විස්තරාත්මක තොරතුරු ලබාගත හැකි වන පරිදි සහ සිය දේපළවල භාරකරු ලෙස මහා භාරකාරතැන පත්කිරීම සඳහා උනන්දුවක් ඇතිවන පරිදි තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | පැමිණිලි භාර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම. | | |
| 4. | <u>වත්කම් කළමනාකරණය</u><br>(අ) විවිධ බුද්ගලයන් යටතේ පවරා දෙන ලද වතු දේපළ 10 ක් මහා භාරකාරතැන විසින් කළමනාකරණය කරනු ලබන අතර එම දේපළ විධිමත්ව කළමනාකරණය කර ඒවායේ ආදායමින් ස්ථාපකගේ අරමුණු ඉටුකිරීම අපේක්ෂා කෙරේ. පසුගිය වසර හතරකදී වතුවලින් ලද ආදායම පිළිබඳ පරීක්ෂාවේදී 2016, 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් රු.3,744,310 ක, රු.9,336,629 ක හා රු.3,984,175 ක ලාභයක්ද, 2019 වර්ෂයේදී රු.6,222,482 ක අලාභයක්ද ලබා තිබුණි. මෙම වතුවල ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කිරීම තුළින් අදාල | නැවත වගාකිරීමේ සැලසුම් සකස් කිරීම, බෝග විවිධාංගීකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම, නැවත වගා කිරීම් සඳහා සහනාධාර ලබා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම හා වතු සම්බන්ධ අධීක්ෂණ කටයුතු විධිමත් කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත | වතු වල ලාභදායීත්වය වැඩි කර ගැනීමට විධිමත් ලෙස අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් හිමිකරුවන්ගේ අරමුණු ඉටුකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. (154 (6) – 3.1 (අ) - 2019) | | | |
| | (ආ) සී. ඊ. වනිගසූරිය මුදලයට අයත් දේපළ විකුණා මුදල්කරුගේ නමින් භාරයක් පිහිටුවීම සඳහා මහා භාරකාරතැන වෙත 2005 නොවැම්බර් 10 දින අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණි. එහෙත් 2019 දෙසැම්බර් වන විට වර්ෂ 14 ක කාලයක් ගත වී තිබුණද, අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව ප්‍රදේශ 7ක පිහිටා තිබූ ඉඩම් හා ගොඩනැඟිලි හඳුනාගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරු වන පරිදි ආරක්ෂා කිරීමටත් එම දේපළ විකුණා මුදල්කරුගේ අරමුණු ඉටුකිරීමටත් කටයුතු කර නොතිබුණි. | අදාල ඉඩම් හා ගොඩනැඟිලි හඳුනාගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරුකර මුදල්කරුගේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. | 2022 ජනවාරි වන විටත් මෙහි කටයුතු අවසන් කර නොමැත. |
| | (ඇ) අධිකරණ අමාත්‍යාංශය මඟින් 2019 වර්ෂයේදී ලබා දී තිබූ වාහන 03 ක හිමිකම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර තිබුණද එම වාහනවල වටිනාකම් මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු වාහනවල වටිනාකම් ගිණුම් මගින් හෙළිදරව් කළ යුතු වීම. | අධිකරණ අමාත්‍යාංශය මඟින් නිකුත් කිරීමේ සහතික ලබා නොදීම මත ඒවායේ වටිනාකම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් මඟින් හෙළිදරව් කිරීමට නොහැකි වූ අතර අදාල පරිදි හෙළිදරව් කිරීමට අවශ්‍ය කටයුතු කෙරේ. | මේ දක්වා ගිණුම්වල හෙළිදරව් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | <u>මානව සම්පත් කළමනාකරණය</u><br>දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 87 ක් වුවද 2020 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 69 ක් වේ. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 01 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 01 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 15 ක් හා ප්‍රාථමික මට්ටමේ එක් පුරප්පාඩුවක් ලෙස නිලධාරින් 18 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.<br>(154 (6) – 5 (ඌ) -2020) | කඩිනමින් පුරප්පාඩු පිරවිය යුතු වීම. | පුරප්පාඩු 18 පිලිබඳව මාර්ගගත ක්‍රමය මගින් මාසිකව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ ත්‍රෛයි මාසිකව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරනු ලැබේ. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ ද නැවත බඳවා ගන්නා තෙක් සේවකයින් ලබා දිය නොහැකි බව පවසන ලදී. අභ්‍යාසලාභී උපාධිධාරීන් සහ ප්‍රාථමික ගණයේ සේවකයින් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. පරිපාලන නිලධාරී පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම බඳවා ගත් අයගේ නිල කාලය අවසන් වි ඇති අතර සේවා දිගුව අනුමත නොවුණි. | දැනට දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිළිබඳ මාර්ගගත ක්‍රමයට මෙන්ම ලිපි මාර්ගයෙන්ද ඉල්ලීම් යොමු කර ඇත. එහෙත් අදාල පුරප්පාඩු සම්පූර්ණ කර නොමැත. |

ශීර්ෂ 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>------------------------ | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>------------------------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්වය<br>----------- |
|---|---|---|---|---|
| 1. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනාරාල්ගේ 2018 නොවැම්බර් 21 දිනැති අංක. 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව ගොඩනැගිලි 05 ක්, පිරිවැය රු. 53,400,000 ක්වූ වාහන 14 ක් වටිනාකම සඳහන් නොවූ වාහන 11 ක් හා හෙක්ටයාර 3.7371 ක්වූ ඉඩම් 05 ක් පිරිවැයට හෝ තක්සේරු කළ අගයට ගිණුම්ගත කර නොතිබුණි. | අදාල චක්‍රලේඛයේ 802 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේනතුවට අයත් සියලු මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත ගිණුම්ගත කළ යුතු වේ. | දෙපාර්තමේන්තුව සතුව ඇති මෙම ඉඩම් 05 අතුරින් වලිසිංහ හරිස්චන්ද්‍ර සංස්කෘතික මධ්‍යස්ථානයේ ඔප්පුව පමණක් දෙපාර්තමේන්තුව සතුව ඇති අතර. අනෙකුත් ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. සිංහල ශබ්දකෝෂ කාර්යාලය වර්ෂ 1864 පෙර සිට පැවත එන බැවින් ඒ පිළිබඳ තොරතුරු පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හරහා සිදු කරමින් පවතී.<br>ගොඩනැගිලි 05 ද ඉහත ඉඩම් තුළ පිහිටි බැවින් ගැටලු නිරාකරණයෙන් පසු තක්සේරු කිරීමට පියවර ගනිමි. වාහන 25ම මේ වන විට තක්සේරු කර ඇති අතර ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. | මේ දක්වා කිසිදු වත්කමක් ගිණුම්ගත කර නැත. |
| 2. | 2004 වර්ෂයට පෙර සිට පැවත එන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර රු. 444,761/- ක වෙනසක් වූ අතර එය හඳුනාගෙන ගිණුම් වල ගැලපීමට කටයුතු කර නොතිබුණි | අත්තිකාරම් පාලන ගිණුම හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව ශේෂයේ වෙනසක් තිබේ නම් එම වෙනස හඳුනාගෙන ගිණුම් වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතු වේ. | වෙනස අනාවරණය කර ගැනීම සඳහා මේ වන විට 2001 වර්ෂයේ සිට සීසී 10 ලේඛන ඇතුළු අනෙකුත් ලේඛන පරික්ෂා කරමින් සටහන් කිරීම් දෝෂ ඇතුළු දෝෂයන් අනාවරණය කර ගනිමින් පවතී. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නිලධාරීන් කිහිප දෙනෙකු රෝගයට ගොදුරු වීම සහ නිරෝධායනයට ලක් වීම මත එම කටයුතු ප්‍රමාද විය. ඉදිරි | වරද නිවැරදි කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වර්ෂය තුළ මෙම වෙනස හඳුනාගෙන ගිණුම් ගැලපීමට කටයුතු කෙරේ. | |

ශීර්ෂ 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>-------------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>----------------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>--------------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>---------------- |
|---|---|---|---|---|
| 1. | රු.මිලියන 911.5 ක් වන ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සහ රු.මිලියන 138 ක් වන ගොඩනැගිල්ලෙහි අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කරන ලෙස පසුගිය විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේදීද මේ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. | දේපළ වල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | නෛතික අයිතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පැවරීමෙන් අනතුරුව මෙම වටිනාකම් ගිණුම්ගත කළ හැක. | මේ දක්වාම පවරාගෙන ගිණුම්ගත කිරිම් සිදුවී නොමැත. |
| | | | | |
| 2. | (අ)රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.96,377,512 ක් වුවද, පාලන ගිණුමේ ශේෂය රු.96,989,808 ක් වූයෙන් රු.612,296 ක් වූ වෙනස වර්ෂ 05 කට වැඩි කාලයක සිට සැසඳුම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුර ප්‍රකාරව මෙම වෙනස පරීක්ෂා කර නිරවුල් කළ යුතුවීම. | 2020 දෙසැම්බර් 31 දිනට වෙනස රු.612,265.85 කි. මෙම වෙනස පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කරමි. | මෙම වටිනාකමින් රු.42,292 ක් නිරවුල් කර තිබුණි. තවදුරටත් නිරවුල් කල යුතු රු. 570,000 ක ශේෂයක් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | (ආ) දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නොමැති මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය සහ වැඩ තහනම් කළ සේවකයින්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිඟ ණය ශේෂ එකතුව රු.5,289,100 ක් විය. එම වටිනාකමින් එකතුව රු.1,620,953 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂයන් වන අතර, එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. | මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම හිඟ ණය ශේෂ අයකර ගෙන නොමැත. |
| 3. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය<br>---------------------------------- | | | |
| | (අ) 2018 වර්ෂයේ සිටම නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් අනුමැතිය ගෙන අනුමත කරන ලද ඇස්තමේන්තු අනුව ව්‍යාපෘති කටයුතු ඉටුකර වියදම් වවුචර් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ඉදිරිපත් කර මුදල් ප්‍රතිපූරණය කරගෙන තිබුණි. එසේ වුවද 2019 සහ 2020 වර්ෂ වලදී වැය කර තිබුණු එකතුව රු.38,064,351 ක් මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ඉල්ලීම් කර තිබුණද, එම මුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති මඟින් සැලසුම් කළ කාර්යය අඛණ්ඩව කරගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන රැස් කරගත යුතු වීම. | 2019 දෙසැම්බර් 04 දින සිට 2020 දෙසැම්බර් 17 දක්වා ඉල්ලා සිටි මුදල් මේ වන තෙක් ලැබී නොමැත. එහි වටිනාකම රු.38,664,351 කි. මධ්‍යම සංස්කෘතික අරමුදලට ලැබෙන ආදායම් අහිමි වීම මත බිල්පත් පියවීම සඳහා මුදල් නිදහස් කිරීම ප්‍රමාද වී ඇත. | මෙම බිල්පත් නිරවුල් කර ගැනීම මේ දක්වා සිදුවී නොමැත. |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | (ආ) පාහියංගල ලෙන ව්‍යාපෘතිය සඳහා 2017 මැයි 02 දින එකතුව රු.5,002,431 ක මුදලක් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් වෙන් කරගෙන තිබුණි. එම මුදල් වෙන් කළ කාර්යය සඳහා භාවිතා නොකර, 2020 ඔක්තෝබර් 09 දින ජර්නල් සටහනක් මගින් මධ්‍යම සංස්කෘතික අරමුදල් දායකත්වය යටතේ අරඹන ලද වෙනත් ව්‍යාපෘතිවල ද්‍රව්‍ය සැපයුම්කරුවන්ට ගෙවීම සඳහා භාවිතා කර තිබුණි. | මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් වෙන් කළ මුදල් එම වෙන් කළ කාර්යය සඳහා භාවිතා කළ යුතු වීම | මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ලැබෙන මුදල් සංරක්ෂණ, කැණීම්, නඩත්තු කටයුතු වලට යොදවා ගැනීමට හැකියාව ඇති බැවින් එම කටයුතු සිදු කරන ලදී. | වෙන්කර ගත් මුදල් අදාල කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. |
| | (ඇ) ඇමරිකානු අරමුදල් දායකත්වය යටතේ 2017 සිට 2022 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කළ හැකි සේ රජගලතැන්න පුරාවිද්‍යා සංරක්ෂණ කාර්යයන් ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේදී රු.මිලියන 5.257 ක මූල්‍ය දායකත්වයක් ලැබී තිබුණත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අතර සිදු කිරීමට තිබූ ගිවිසුම්ගත ක්‍රියාවලියේ පැවති ගැටළු සහගත තත්ත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අදාළ ව්‍යාපෘති කාර්යයන් ඉටු කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් කළ යුතුව පැවති මෙම ව්‍යාපෘති කටයුතු සැලසුම් කළ පරිදි ඉටු කළ යුතු වීම. | කොරෝනා වසංගතය හේතුවෙන් හා රට වසා තැබීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ව්‍යාපෘති නිම කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතියට අදාල කාර්යසාධනය පහල මට්ටමක පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ඈ) කැළණිය රජමහ විහාරයේ බිතුසිතුවම් සහ මූර්ති සංරක්ෂණය සඳහා 2015 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවක් මඟින් රු.1,500,000 ක මුදලක් ලබාදී තිබුණි. 2020 වර්ෂය වන විට වර්ෂ ගණනාවක් ගතවී තිබුණද, කාර්යයන් ඉටු කිරීමකින් තොරව තැන්පතු ගිණුමේ ඉදිරියට ගෙනවිත් තිබූ එකතුව රු.1,494,434 ක ශේෂය 2020 දෙසැම්බර් 11 දින රජයේ ආදායමට බැර කර තිබුණි. | බාහිර ආයතන මඟින් ලැබූ මුදල්, අදාළ මුදල ලබා දුන් කාර්යය සඳහාම භාවිතා කළ යුතු වීම. | රසායනාගාර අංශය මඟින් පිළිතුරු කැඳවා ඇතත්, ලැබී නොමැති අතර, කැළණිය රජමහා විහාරයේ බිතුසිතුවම් හා මූර්ති සංරක්ෂණ කටයුතු වල යම් ප්‍රමාදයක් ඇති බව දැනුම් දෙමි. | වෙන්කරගත් මුදල් අදාල කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. |
| 4. | (අ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ ව්‍යාපෘති 92 ක කටයුතු වෙනුවෙන් ලැබුණු ප්‍රතිපාදන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ප්‍රතිපාදන එකතුව රු. 27,260,458 ක් නිරවුල් කර නොතිබුණි. | තොරතුරු ලබාගෙන ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂකවරුන්ගෙන් තොරතුරු ඉල්ලා ඇති අතර, තවදුරටත් ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. | වසර 02 ට වඩා පැරණි තැන්පතු සහකාර අධ්‍යක්ෂකවරු න්ගෙන් විමසා රු.12,828,105 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට රජයේ ආදායමට බැර කර ඇත. ඉතිරි මුදල් නිරවුල් කර නොතිබුණි. |
| | (ආ) පුරාවිද්‍යා ස්ථාන කැණීම්, සංරක්ෂණය, අළුත්වැඩියා ව්‍යාපෘති 14 ක් වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, | - එම - | තොරතුරු ඉල්ලා ඇති අතර, ලැබුණු පසු මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කරමි. | නිරවුල් කිරීමේ කටයුතු මේ දක්වා අවසන් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පෞද්ගලික ආයතන, විදේශීය ආයතන වලින් ප්‍රධාන වශයෙන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයේදී ලැබුණු අරමුදල් වලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කර ඉතිරි මුදල් ශේෂ එකතුව රු.14,463,670 ක් නිරවුල් කර නොමැතිව තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | | | |
| | (ඇ) පුරාවිද්‍යාත්මක ස්ථාන වල ඉදිකිරීම් හා නඩත්තු කොන්ත්‍රාත් 17 ක ගෙවීම් වලින් 2020දෙසැම්බර් 31 දිනට රඳවාගත් මුදල් රු. 2,194,747 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | - එම - | තොරතුරු ඉල්ලා ඇති අතර, ලැබුණු පසු මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කරමි. | නිරවුල් කිරීමේ කටයුතු මේ දක්වාම අවසන් කර නොමැත. |
| 5. | 1940 අංක 09 දරන පුරාවිද්‍යා ආඥා පනතේ 6 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පුරාවිද්‍යා කැනීම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා පිළිවෙත් හා ක්‍රමවේද හඳුන්වා දී නොතිබුණු අතර ආඥා පනතේ 10 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නිකුත් කළ බලපත්‍ර 121 ක් වෙනුවෙන් රු.363,000 ක් වූ බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. තවද පනතේ 3 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව ලබාදුන් බලපත්‍ර මගින් කළ කැනීම් | පනතේ විධිවිධාන ප්‍රකාරව පිළිවෙත් හා ක්‍රමවේදයන් සැලසුම්කර විධිමත් පරිදි කැනීම් බලපත්‍ර නිකුත් කිරීමට හා කැනීම් වලින් සොයාගත් පුරාවස්තු පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. | මේ දක්වාම අදාල කටයුතු සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වලින් සොයා ගත් පුරාවස්තු පිළිබඳව හඳුනාගැනීමට හා ඒවා දෙපාර්තමේන්තුවට අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| 6. | යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා එම ජලාශයට යටවන භූමිය තුළ තිබූ පුරාවස්තු කැණීම් කර ඉවත් කර තිබූ අතර, ඒ පිළිබඳව සකස් කළ හානි ඇගයුම් වාර්තාවට අනුව එම පුරාවස්තු ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා කෞතුකාගාරයක් ඉදිකිරීමට යෝජනා කර ඒ සඳහා වන මූලික සැලසුම් හා ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී තිබුණි. මෙම කෞතුකාගාරය ඉදිකිරීමට අදාළ මූලික සැලසුම් හා ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා එම පුරාවස්තු අනාරක්ෂිත ලෙස පදවිය පුරාවිද්‍යා කලාප කාර්යාලය තුළ ගබඩා කර තිබුණි. | මෙම කෞතුකාගාරය ඉදිකිරීමේ අවශ්‍යතාවය හා හැකියාව සොයා බලා ඒ අනුව ක්‍රියා කළ යුතු වේ. | 2012 ඉදිරිපත් කළ සමීක්ෂණ වාර්තාවක යාන් ඔය ව්‍යාපෘතියෙන් හමුවන පුරාවස්තු කෞතුකාගාරයක තැන්පත් කළ යුතු බව සඳහන් කර ඇත. කැණීම් කර හමුවූ පුරාවස්තු අනුරාධපුර විශ්ලේෂණ ශාඛාවේ සහ පදවිය පුරාවිද්‍යා ස්ථානයේ ඇත. කෞතුකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් සකස් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට භාරදුන් අතර, එම ගොඩනැගිල්ල ඉදිකළ පසුව පුරාවස්තු එහි ස්ථාපිත කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. | මේ දක්වාම කෞතුකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමට පියවර ගෙන නොමැත. |
| 7. | 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තනතුරු 84 කට අදාළව අනුමත කාර්ය මණ්ඩලය 4356 ක්ද, තත්‍ය කාර්ය මණ්ඩලය 1879 ක්ද විය. මේ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 2477 ක් විය. මෙම පුරප්පාඩු අතරින් විධායක මට්ටමේ පුරප්පාඩු 39 ක් පැවති අතර, ඒ සඳහා වැඩ ආවරණ මට්ටමින් පත්කර තිබුණි. මෙම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට විවිධ බාධාවන් ඇති වී තිබූ අතර, | බඳවා ගැනීම් පරිපාටිය හා පවත්නා නීති රීති අනුව මෙම සේවක පුරප්පාඩු අවශ්‍යතාව මත පදනම්ව කඩිනමින් සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතුය. | නව තනතුරු 1940 ක් අනුමත වීම තනතුරුවල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් ඇතිවීමට හේතු වී ඇත. මෙම තනතුරු පිරවීමට විවිධ බාධාවන් ඇති වී ඇති අතර, මෙම පුරප්පාඩු පිරවීමට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මේ දක්වාම පුරප්පාඩු සම්පූර්ණ කරගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සේවක පුරප්පාඩු පැවතීම නිසා අපේක්ෂිත කාර්ය භාරය ඉටු කර ගැනීමේ බාධාවක් විය හැකි බව නිරීක්ෂණය විය. | | | |

ශීර්ෂ 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2013 වර්ෂයේ සිදුකල තක්සේරු වාර්තාවක් පදනම් කරගෙන ඉඩම් හා ගොඩනැගිලි පිළිවෙලින් රු.10,000,000,000 ක් සහ රු.800,000,000 ක් ලෙස පිරිවැය හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. මෙම දේපලවල පිරිවැය තක්සේරු කර වසර 07 කට වැඩි කාලයක් ගතවී තිබුණද, එම වත්කම් ප්‍රත්‍යාගනනය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | දේපළ තක්සේරු වටිනාකම් පැරණි බැවින් යාවත්කාලීන කළයුතු වීම. | ඉදිරියේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් විමසා තක්සේරු කිරීමට කටයුතු කරමි. | දේපල පවරා ගැනීම් හා තක්සේරු කර ගිණුම් ගත කිරීම් සිදුකර නැත. |
| 2. | දෙපාර්තමේන්තුව විසින් 2011 අගෝස්තු 10 දින සිට 2021 ජූලි 31 දින දක්වා වර්ෂ 10 ක කාල සීමාවකට බදු පදනම මත ගොඩනැගිල්ලක් හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත ලබාදී තිබුණි. එහි නවීකරණ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ එකඟතාවයකින් තොරව, එම බදු කාල සීමාව වර්ෂ 35 ක් දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගැනීමටද මණ්ඩලය කටයුතු කර තිබුණි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් | ගොඩනැගිල්ලට අදාළ අයවිය යුතු කුළී අයකර ගැනීමටත්, ගොඩනැගිල්ල ආරක්ෂා කර විධිමත් ඵලදායී කාර්යයක යෙදවීමටත් ක්‍රියා කළ යුතුවීම. | ආයතනය දීර්ඝව කරුණු පැහැදිලි කර ඇත. මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන බව සඳහන්ව ඇත. | එළඹී තිබූ බදු ගිවිසුම 2021 ජූලි 31 දිනෙන් අවසන් වූ අතර, බදු කාලසීමාව වසර 35 ක් දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාගෙන තිබීමත්, ඔවුන් පරිශ්‍රයෙන් ඉවත්ව නොමැති වීමත් නිසා තක්සේරුගත කුළී වටිනාකමක් මත නව බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කරමින් පවතින |

| | | | | |
|---|---|---|---|---|
| | වූ වරිපනම් ගාස්තු, ජල ගාස්තු වැනි වියදම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබූ අතර, 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවට අය විය යුතු මුළු හිඟ බදු කුළී එකතු වටිනාකම රු.66,194,051 ක් විය. මෙම හිඟ ආදායම් අය කර ගැනීමටත්, වත්කම් කළමනාකරණය කර ආරක්ෂා කර ගැනීමටත් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | | | බව දන්වා ඇත. |
| 3. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල ජල ටැංකිය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බදු රහිත ඇස්තමේන්තුගත වටිනාකම රු.18,676,148 ක් විය.මෙම ව්‍යාපෘතිය සඳහා 2016 සැප්තැම්බර් 26 දින ගිවිසුමට එළඹී තිබු අතර, 2016 දෙසැම්බර් 26 දින වැඩ නිමකළ යුතුව තිබුණි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබූ මෙම ඉදිකිරීම්වල ප්‍රගතිය 2020 වර්ෂය අවසානය වන විටත් සියයට 40 ක් විය. | ප්‍රමාද වූ ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතුවීම. | පිළිගනිමි. | ඉදිකිරීම් කටයුතු මේ දක්වා අවසන් කර නොමැත. |
| 4. | කොළඹ ජාතික කෞතුකාගාරය පිහිටුවා ඇති හෙක්ටයාර් 4.6317 ක ඉඩම සහ අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාර 07 ක් පිහිටුවා තිබූ ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට විවිධ රාජ්‍ය ආයතන සමඟ ලිපි හුවමාරු කරගෙන තිබුණද, 2021 මාර්තු වන විටත් එම ඉඩම් පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | දෙපාර්තමේන්තුව සතු ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු දී නැත. | ඉඩම් පවරා ගැනීම් කටයුතු සිදුවී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | 2012 මාර්තු 17 දින සිදු වූ කෞතුක භාණ්ඩ නැතිවීම සම්බන්ධව සකස් කරන ලද ඇස්තමේන්තුවක් අනුව එම භාණ්ඩ වල වටිනාකම රුපියල් ලක්ෂ 48 ක් පමණ විය. නඩු කටයුතු අවසන් නොවීම නිසා මෙම කෞතුක භාණ්ඩ දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට නොහැකි වී තිබූ අතර, ඒ අනුව අස්ථානගත වූ භාණ්ඩ සහ සොයාගත් භාණ්ඩ අතර, භාණ්ඩ ඌනතාවය සහ එහි වටිනාකම් හඳුනා ගැනීමට සහ අවශ්‍ය ගැළපීම් සිදු කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක්ද සිදු කර නොතිබුණි. | මෙම කෞතුක භාණ්ඩ ආරක්ෂා කිරීම, ඒවා නැවත ලබා ගැනීම සහ අඩුවී ඇති භාණ්ඩ පිළිබඳව මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවීම. | පිළිතුරු දී නැත. | 2022.02.10 දින කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේදී නැතිවී නැවත හමුවූ භාණ්ඩ දෙපාර්තමේන්තු වෙත භාර දී ඇත. හමු නොවූ භාණ්ඩ පිළිබඳව මුදල් රෙගුලාසි අනුව කටයුතු ආරම්භ කර නොමැත. |
| 6. | 2020 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණය මුදල රු.1,131,500 ක් විය. 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 1 (ඉ) ඡේදය ප්‍රකාරව කල් ඉකුත් වූ ණය අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අයකර ගැනීමට ක්‍රියා කළ යුතුවීම. | කල් ඉකුත් වූ ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මේ දක්වාම අදාල හිග ණය මුදල් අය කරගෙන නොමැත. |
| 7. | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු වර්ග 47 කට අදාළව පුරප්පාඩු 137 ක් වූ අතර, ඒ අනුව අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව අතර සියයට 29 ක සේවක ඌනතාවයක් පැවතුණි. මෙම සේවක ඌනතාවය සම්පූර්ණ කිරීමට | සේවක ඌනතාවයන් සම්පූර්ණ කර ආයතනයේ අරමුණු කරා මෙහෙයවීමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ලබාදී නැත. | නව බඳවා ගැනීම් නතර කර ඇති බැවින් සංවර්ධන නිලධාරීන් සුදුසු පරිදි අනුයුක්ත කිරීමට කටයුතු කරමින් පවතී. පුරප්පාඩු සම්පූර්ණ |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | | | කර නොමැත. |

ශීර්ෂ 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>----------------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>------------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>----------- |
|---|---|---|---|---|
| 1. | ඉකුත් වර්ෂයේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම<br>-----------------------------<br>ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් පොත්පත්, ලේඛන, පෞරාණික ගිවිසුම් හා රහස්‍ය ලේඛන ආදී මිලකල නොහැකි ප්‍රවේණිගත වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් කර නොමැති බවත්, එම ප්‍රවේණිගත වත්කම් වසර ගණනාවකින් විධිමත් සමීක්ෂණයකට ලක් කර නොමැති බවත් නිරීක්ෂණය විය. | මෙම වත්කම් සමීක්ෂණයක් කිරීමට සහ ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක් කළ යුතුවීම. | දෙපාර්තමේන්තුව සතුව පවත්නා ජාතික වටිනාකමක් සහිත ලේඛනවල නාමික අගය මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොමැත. එවැනි ලේඛන කාණ්ඩ 700 ක් පමණ පවතින අතර, ඒවායේ පරීක්ෂණ ලැයිස්තු වසර 02 කට වරක් ලබාගනී. | මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෝ හෙළිදරව් කර නොතිබුණි. විධිමත් පරිදි සමීක්ෂණ කටයුතු වාර්ෂිකව සිදුකර නොතිබුණි. |
| 2. | (අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ණය ශේෂ එකතුව රු.17,672,837 ක් වූ අතර, එදිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව එම ශේෂ එකතුව රු.18,114,012 ක් වූයෙන් රු.441,175 ක වෙනසක් විය. | අදාළ ගැළපීම් සිදු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | අතපසුවීමකින් ගැළපීම් කර මූල්‍ය වාර්තාවේ දක්වා නොමැත. | මේ දක්වා නිවැරදි කිරීම් සිදුකර නොමැත. |
| | (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයෙහි මාර්ගෝපදේශ අංක 01 (ඉ) වගන්තිය ප්‍රකාරව සේවය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පැරණි ණය ශේෂ නිරවුල් කළ යුතු වීම. | මෙම ඉතා පැරණි ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මේ දක්වාම අයකර ගැනීම් හෝ කපාහැරීම් කටයුතු සිදු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | හැරගිය නිලධාරීන් 04 දෙනෙකුට අදාළව වර්ෂ 05 කට වඩා පැරණි රු. 264,875 ක හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| 3. | (අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි නව සහ පැරණි ගොඩනැගිලි, මහනුවර පිහිටි ගොඩනැගිල්ල, පැරණි ආපනශාලා ගොඩනැගිල්ල සහ එහි ස්ථාපනය කර ඇති මධ්‍යම වායුසමීකරණ පද්ධතිය ඇතුළු සියළු මූල්‍ය නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ යටතේ තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | දේපළ පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවීම. | ඉඩමේ අයිතිය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කර ඇත. දේපළ පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට අපේක්ෂා කරමි. | වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමේ කටයුතු අවසන් කර නැත. |
| | (ආ) දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පිහිටුවා ඇති තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කුරුඳුවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මු.පි.කො. 9582 කැබලි අංක 01 දරන ඉඩම් කොටස පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවල තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් පවරාගෙන ගිණුම්ගත කළ යුතුවීම. | ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ඉඩම් කොටස පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | මේ දක්වාම වත්කම් පවරාගෙන ගිණුම්ගත කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 4. | සිතියම් අංකිතකරණ යන්ත්‍රය මඟින් 2016 වර්ෂය අවසාන වන විට සිතියම් 1,700 ක් පමණ අංකිත කිරීමට සැලසුම් කර තිබුණද, 2019 අප්‍රේල් 30 දින වන විට අංකිතකරණය සම්පූර්ණ වූ සිතියම් සංඛ්‍යාව 232 ක් විය. එනම් සියයට 13.6 ක් විය. | සිතියම් අංකිතකරණ කටයුතු කඩිනමින් නිම කිරීම සඳහා සැලැස්මක් පිළියෙළ කළ යුතු වීම. | සියයට 34 පමණ සිතියම් අංකිතකරණය කර ඇත. තත්ත්ව පරීක්ෂාව සිදුකර අවසන් සිතියම් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස සියයට 13.6 වේ. | සැලසුම්වලට අනුකූලව කාර්යසාධන කටයුතු සිදු කර නොතිබුණි. |
| 5. | 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයන් සඳහා මුළු අයවැයගත වියදම් එකතුව රු.236,823,000 ක් වූ අතර, වර්ෂය තුළ ප්‍රසම්පාදන කාර්යයන් සඳහා දරන ලද තත්‍ය වියදම රු.26,630,000 ක් විය. ඒ අනුව වර්ෂය තුළ සැලසුම් ප්‍රකාරව ඉටු නොකළ ප්‍රසම්පාදන කාර්යයන් වල මූල්‍ය වටිනාකම රු.210,193,000 ක් විය. | වර්ෂය තුළ ලඟා විය හැකි මට්ටම සලකා බලා සැලසුම් සකස් කිරීමට හා සැලසුම් අවශ්‍යතාවය අනුව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත ඉලක්කයට ලඟා විමට නොහැකි වීම. | පාලනය කළ නොහැකි කරුණු මත, අපේක්ෂිත ඉලක්කවලට ලඟා විමට නොහැකි වූ බව දන්වා ඇත. |
| 6. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව, ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 992 ක වටිනාකමකට අංක අමප./17/ 2988/742/050 දරන සහ 2018 ජනවාරි 17 දිනැති අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු නිර්දේශයන්ට අනුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ලබාදී තිබුණි. මෙම ගොඩනැගිල්ල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම පිළිබඳව පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | | |

| | | | | |
|---|---|---|---|---|
| | (අ) ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට නියමිත දිනය 2020 ජූලි 07 දින වුවත්, 2021 මැයි 18 දින දක්වා ගිවිසුම් කාලය දීර්ඝ කර තිබුණි. 2021 අප්‍රේල් 01 දිනට ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතුවල වර්තමාන භෞතික ප්‍රගතිය සියයට 46 ක් වූ අතර එහි, මූල්‍ය ප්‍රගතිය සියයට 30 ක් විය. | කාලය දීර්ඝ කළ පසුව එළඹෙන දිනට කාර්යය නිම කිරීමේ ගැටළු ඇති වී තිබෙන බැවින් කඩිනමින් කාර්යය නිම කළ යුතු වීම. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඇති වූ ප්‍රමාදය සහ ලේඛන විධිමත් පරිදි නව ස්ථාන වලට මාරු කිරීමේ ප්‍රමාදයන් වීම කාලය දීර්ඝ කිරීමට හේතු විය. | කොන්ත්‍රාත් කාලය දිර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගැනිමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍යාංශය වෙත යවා ඇත. ඉදිකිරීම් කටයුතු අවසන් වී නොමැත. |
| | (ආ) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හා සී/ස මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම යන ආයතන විසින් දෙපාර්තමේන්තුවට ලබා දෙන බිල්පත් සුදුසු තාක්ෂණික නිලධාරියකු හෝ ප්‍රමාණ සමීක්ෂණ නිලධාරියකුගේ පරීක්ෂාවට ලක් කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. | බිල්පත් ගෙවීමට පෙර සුදුසුකම් සහිත නිලධාරියෙකු පරීක්ෂා කළ යුතුවීම. | මේ වන විට බිල්පත් ගෙවීමට පෙර පරීක්ෂා කරනු ලැබේ. | පෙර ගෙවීම් කර තිබුණේ සුදුසුකම් සහිත නිලධාරියෙකුගේ සහතිකය මත නොවේ. |
| 7. | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 287 ක් වූ අතර, අනුමත තනතුරු වලට අදාළව සේවකයින් 153 දෙනෙකු එනම්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වලින් සියයට 50 ක්ද, තෘතීය මට්ටමේ තනතුරු වලින් සියයට 70 ක සේවක ඌනතාවයක් පැවතුණි. මෙම සේවක ඌනතාවය සම්පූර්ණ කිරීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට ක්‍රියා කළ යුතු විම. | මෙම බඳවා ගැනීම් සඳහා ක්‍රියා කරමින් පවතී. | වර්තමානයේදී ද ආයතනයේ සේවක ඌනතා පැවතුණි. |

ශීර්ෂ 210 - ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | අංක 3/2015 හා 2015 ජූලි 14 දිනැති අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගන්නා නිලධාරීන් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ අග්‍රිම පියවිය යුතු වුවත් එසේ කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | දින 10ක් තුළ අග්‍රිම පියවීම සඳහා නිලධාරින් දැනුවත් කරන ලදී. | මෙතෙක් නිවැරදි කර නැත. |
| 2. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව එකතුව රු.7,488,595 ක් වූ කල් ඉකුත් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට හෝ කොන්ත්‍රාත් තැන්පතු සම්බන්ධයෙන් වූ විට කොන්ත්‍රාත්තු වලින් වූ අලාභ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළව කොන්ත්‍රාත්කරුගෙන් අලාභ අයකිරීම සඳහා කටයුතු කරමින් පවතී. | තවමත් අලාභ ආපසු අයකර නොමැත. මු.රෙ. අනුව කටයුතු කර නැත. |
| 3. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය අනුව දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | රප්‍ර/පරිනි/04/01/-1 හා 2021/9/03 දිනැති සහ රප්‍ර/පරිනි/04/01/-1 හා 2021/10/05 දිනැති ලිපි මඟින් දෙවරක් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත පුරප්පාඩුව සම්පූර්ණ කිරිම සඳහා දැනුම් දී ඇත. | මේ දක්වා පත්කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 4. | ජනමාධ්‍ය අමාත්‍යාංශයේ භාවිතයට යොදා තිබුණු ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත් රථයක් රියදුරු බලපත්‍රයක් නොමැතිව පුද්ගලයෙකු ධාවනය කර 2016 දෙසැම්බර් 26 දින අනතුරකට ලක්වීම නිසා එහි අලුත්වැඩියා කිරීමට රු.453,000 ක් 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වැයකර තිබුණි. රක්ෂණයෙන් කිසිදු වන්දි මුදලක් ලැබී නොතිබූ අතර අදාළ මුදල රථය ධාවනය කළ පුද්ගලයාගෙන් අයකර ගෙන නොතිබුණි. | රාජ්‍ය සම්පත් විධිමත් පරිදි භාවිතා කිරීම සඳහා ඒවාට සිදුවන හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර මූල්‍ය ප්‍රකාශන තුලින් හෙලිදරව් කළ යුතුය | රථය අනතුරට ලක්වීමෙන් පසුව දීර්ඝ කාලයක් දෙපාර්තමේන්තු රථගාලේ තිබුණු අතර තවදුරටත් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වීම වලක්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ වියදමෙන් මිලගණන් කැඳවා අළුත්වැඩියාව සිදු කරන ලදි. මෙම අනතුර සම්බන්ධයෙන් මු.රෙ. 104 පරීක්ෂණ අවසන් කර වගකිවයුත්තන්ට එරෙහිව නීතිමය කටයුතු ආරම්භ කිරීමට ක්‍රියාකර ඇත. | අදාළ මුදල රථය ධාවනය කළ පුද්ගලයාගෙන් අයකරගෙන නොමැත. යාවත්කාලීනව කටයුතු නොකිරීමෙන් දෙපාර්තමේන්තුවට මූල්‍යමය අලාභයක් සිදුවී ඇත. |

ශීර්ෂ 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය ------------------------ | විගණකාධිපතිගේ නිර්දේශය --------------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග -------------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය ---------------------- |
|---|---|---|---|---|
| 1. | 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 41 වන වගන්තිය ප්‍රකාරව හදිසි අවස්ථාවකදී ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ආයතනය තුළ ස්ථාපිත කර නොතිබුණි. හදිසි අවස්ථාවකදී ආරක්ෂාව සඳහා ගමන් කළ යුතු මාර්ග පැහැදිලිව සංඥා මඟින් දක්වා නොතිබුණි. | වහා ගිනි ඇවිලෙන ද්‍රව්‍යයක් වන කඩදාසි විශාල වශයෙන් භාවිතා කරනු ලබන ස්ථානයක් වන බැවින් ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ආයතනය තුළ ස්ථාපිත කිරීම සහ හදිසි අවස්ථාවකදී ආරක්ෂාව සඳහා ගමන් කළ යුතු මාර්ග පැහැදිලිව සංඥා මඟින් දැක්වීම. | කොළඹ මහ නගර සභාවේ ගිනිනිවීමේ සේවා දෙපාර්තමේන්තුවේ අදහස අනුව ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ආයතනය තුල ස්ථාපිත කිරිම ප්‍රායෝගික නොවන බැවින් එවැනි පද්ධතියක් ස්ථාපිත නොකිරිමට දෙපාර්තමේන්තුව තිරිණය කර ඇත. | පනතේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර නැත. |
| 2. | (අ) 2018 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙනුවෙන් විෂයයන් 04 කින් පාසල් පොත් පිටපත් 1,277,000 ක් මුද්‍රණය කර තිබූ අතර ඒ වෙනුවෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ලද ආදායම රු. මිලියන 110 ක් විය. එකඟ වූ දිනයට වඩා ප්‍රමාද වී පොත් මුද්‍රණය කර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට භාර දීම නිසා එයින් සියයට 19 ක් වූ රු. මිලියන 21 ක් එම දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතු මුදලින් අඩුකර තිබුණි. | පාසල් පොත් එකඟ වූ වේලාවට මුද්‍රණය කිරීමට වැඩ පිළිවෙලක් සැලසුම් කිරීම. | විශේෂිත ක්‍රියාමාර්ගයක් ගෙන නැත. | පාසල් පෙළ පොත් මුද්‍රණ කටයුතු සඳහා ලැබීම සැලකිය යුතු ප්‍රමාණයක් වර්තමානයෙදී අඩුවී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | (ආ) මෙලෙස පොත් ප්‍රමාද වී මුද්‍රණය කර තිබූ නමුදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 1112 කට එකතුව රු. 4,762,800 ක් පාසල් පොත් මුද්‍රණ දීමනාව ලෙස සමාලෝචිත වර්ෂයේදී වැටුපට අතිරේකව ගෙවා තිබුණි. | පාසල් පොත් මුද්‍රණ දීමනාව වැටුපට අමතරව දෙනු ලබන දීමනාවකි. එබැවින් කාර්යක්ෂමව මුද්‍රණ කටයුතු සිදු කරවා ගැනීමට කළමණාකරණයට හැකියාවක් තිබිය යුතුවීම. | විශේෂිත ක්‍රියාමාර්ගයක් ගෙන නැත. | කාර්ය සාධනය පහත මට්ටමක පවතී. |
| 3. | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි රජයේ මුද්‍රණාලයීය සමුපකාර සමිතිය ආපනශාලාවේ දෙපාර්තමේන්තු සේවකයින් 26 දෙනෙකු පූර්ණ කාලීනවද තිදෙනෙකු අර්ධකාලීනවද සේවයේ යොදවා ගෙන තිබුණි. 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් එම කාර්යය මණ්ඩලය වෙනුවෙන් රු.10,953,637 ක් කැලි පදනම මත දීමනා, අතිකාල දීමනා හා විශේෂ දීමනා ලෙස ගෙවා තිබුණි. | භෝජනාගාරය තරඟකාරී ටෙන්ඩර් පටිපාටිය මඟින් සුදුසු පාර්ශවයකට ලබාදීම හා මුද්‍රණ කාර්ය මණ්ඩලය එයින් ඉවත් කිරීම කළ යුතුවීම. | මේ සම්බන්දයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. | වර්තමානයේදී ද මෙම ගෙවීම් සිදුකරනු ලැබේ. |
| 4. | මුද්‍රණ කාර්යයේදී ඉතිරි වන කඩදාසි විකිණීමට අදාල ලංසු ප්‍රදාන ලිපියේ 2.2 වගන්තිය ප්‍රකාරව අලෙවි වන සෑම කඩදාසි තොගයක්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට ප්‍රථම රු. 200,000ක් තැන්පත් කර, බර ප්‍රමාණයට අදාල ඉතිරි මුදල් පියවන තුරු තොග ඉවත් කර ගත නොහැකි වුවද, 2019 වර්ෂයේදී අවස්ථා 21 කදී බාහිර පාර්ශවයන් මිලදී ගත් පිරිවැය රු. මිලියන 3.5 ක් වූ | ගැනුම්කරු සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව සියලු මුදල් නොපමාව අයකර ගැනීම සහ එම අස්කොන් කඩදාසි තොග ආරක්ෂිතව ගබඩා කළ යුතු වීම. | අදාල හිඟ මුදල් අය කර ගැනිමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවට ගණන්දිමේ නිලධාරි දැනුම් දී ඇත. | අස්කොන් කඩදාසි ආරක්ෂිතව ගබඩා කිරිමට හැකි වැඩ පිළිවලක් වර්තමානය වනවිටත් සකස් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කිලෝග්‍රෑම් 86,289 ක් සඳහා දින 30 සිට දින 160 ක කාල ප්‍රමාදයකින් පසු ගෙවීම් කර තිබුණි. තවද මුද්‍රණ කාර්යයන්හිදී එකතු වන අස්කොන් කඩදාසි ආරක්ෂිතව ගබඩා කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් යොදා නොතිබීම හේතුවෙන් එම කඩදාසි වර්ෂාවට නිරාවරණය වී තිබුණු අතර ඒ තුළින් එම කඩදාසි සඳහා සාපේක්ෂව වැඩි මිලක් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | | | |
| 5. | 2019 වර්ෂයේ ඡන්ද පත්‍රිකා පොත් හා ද්විත්ව ඡන්ද පත්‍රිකා මුද්‍රණයේදී කිසිදු පිළිගත හැකි හේතුවක් නොමැතිව ඉන්වොයිස් වටිනාකම වැඩි කර ඒ මත මාණ්ඩලික නිලධාරීන් 24 දෙනෙකුට 2019 වර්ෂයේ වාණිජ මුද්‍රණ දීමනාව ලෙස රු.965,684 ක් වැඩිපුර ගෙවා තිබුණි.<br>මේ සඳහා කැලි පදනම මත දීමනා සහ විශේෂ දීමනා ලෙස රු.128,200,493 ක් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නොවන නිලධාරීන්ට මැතිවරණ කොමිෂමෙන් ගෙවා තිබුණු අතර, නියැදි පරීක්ෂාවේදී එම කාර්යය සඳහා කැලි පදනම මත දීමනා ලෙස රු.1,172,469 ක් දෙපාර්තමේන්තු ප්‍රතිපාදනවලින්ද ගෙවා තිබුණු බව අනාවරණය විය. | මැතිවරණ කොමිෂන් සභාව සිය වියදම් මූල්‍යකරණය කරනුයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් බැවින් පිළිගත හැකි හේතු නොමැතිව පිරිවැය වැඩි නොකළ යුතු වීම.<br>එකම කාර්යය සඳහා මූලාශ්‍ර දෙකකින් ගෙවීම් කිරීමත් නොකළ යුතුවීම | විශේෂිත ක්‍රියාමාර්ගයක් ගෙන නැත. | මෙලෙස වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අය කර ගැනිමට කටයුතු කර නොතිබුණු අතර 2020 වර්ෂයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී ද ඉන්වොයිසි වටිනාකම් වැඩිකර දීමනා ලබාගෙන තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 6. | 2020 පාසල් අධ්‍යයන වර්ෂය සඳහා පාසල් පෙළ පොත් වර්ග 22 ක් මුද්‍රණය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලංසු ඉදිරිපත් කර තිබූ නමුත් එයින් පොත් වර්ග 6 ක් පමණක් ලංසුවේදී ජයග්‍රහණය කිරීමට හැකි වී තිබුණි. වෙනත් මුද්‍රණ ආයතන ඉදිරිපත් කරන මිල ගණන් වලට වඩා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සියයට 4 සිට සියයට 31 දක්වා පරාසයකින් වැඩිවීම ඊට හේතුවී තිබුණි. | මුද්‍රණ කටයුතු හි දෙපාර්තමේන්තු මිල ගණන් ඉහල අගයක් ගැනීමට බලපා ඇති හේතු පිළිබඳව නැවත සලකා බලා මිල ගණන් තීරණය කලයුතු වීම. | මුද්‍රණ පිරිවැය වැඩිවීම පාලනය සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොමැත | පාසල් පෙළ පොත් මුද්‍රණ ඇණවුම් සැලකිය යුතු ප්‍රමාණයක් මුද්‍රණ දෙපාර්තමේන්තුට වර්තමානයෙදී නොලැබේ |
| | | | | |
| 7. | දෙපාර්තමේන්තුවේ කියවීම් අංශයේ සහ පරිගණක අංශයේ වර්ග අඩි 6500 ක ඇතිරීම සඳහා බිම් ගඩොල් (Floor Tiles ) 1700 ක් රු.1,219,563 කට මිලදී ගෙන ගඩොල් 1000 ක් පමණක් අතුරා තිබූ අතර රු.502,173 ක් වටිනා ඉතිරි බිම් ගඩොල් 700 ක ප්‍රමාණය ආපසු ගබඩාවට භාරදී නොතිබූ අතර ඒ පිළිබඳව පැහැදිලි කිරීමට අදාල නිලධාරීන් අපොහොසත් විය. පසුව එම කාර්යය නිම කිරීමට වටිනාකම රු.578,263 ක් වටිනා බිම් ගඩොල් 700 ක් වෙනත් තැනකින් මිලදී ගෙන තිබුණි. | බිම් ගඩොල් ඇතිරීම පිළිබඳ පරීක්ෂණයක් පවත්වා අදාල ඌනතාවයට වගකිව යුතු නිලධාරීන් පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීම. | මේ සම්බන්දයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. | මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. |
| 8. | 2009 වර්ෂය සහ ඊට පෙර වර්ෂ සඳහා හිඟ ආදායම් ශේෂය 2020 ජනවාරි 01 දිනට රු.166,058,339 ක් වූ අතර එයින් කිසිදු මුදලක් 2020 වර්ෂයේ දී අය කරගෙන නොතිබුණි. 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා | මෙම අහිතකර තත්ත්වය පෙර වර්ෂ ගණනාවක් තිස්සේ පැවත එන බැවින් අදාළ ආයතන සමඟ සාකච්ඡා කර හිඟ මුදල් අයකර ගැනීමට | මෙම හිඟ මුදල් අය කර ගැනිමට විශේෂිත වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව හඳුන්වා දී නොතිබුණි. | මෙම හිඟ මුදල් අයවීමේ ප්‍රගතිය වර්තමානයේදී ද දුර්වල තත්ත්වයක පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | මුළු හිඟ ආදායම් ශේෂය රු.377,353,282 ක් වූ අතර එයින් සියයට 34 පමණක් 2020 වර්ෂයේදී අයකර ගෙන තිබුණි. | කඩිනමින් සුදුසු වැඩපිළිවෙලක් සකස් කල යුතු වීම. | | |
| 9. | දෙපාර්තුමේන්තුවේ හදිසි මුද්‍රණ කාර්යයන් කඩිනමින් නිමකිරීම වෙනුවෙන් ඇතැම් වැඩ කොටස් වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා 1981 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණි. එසේම 2009 සැප්තැම්බර් 11 දිනැති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් මෙම සේවක දිරි දීමනා ගෙවීම් සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලෙසට දක්වා තිබූ නමුත් 2021 අගෝස්තු වන විටත් එම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ වුවද කැලි පදනම මත දීමනා ගෙවන කාලය තුළ දෛනිකව පැය 2ක් දක්වා අතිකාල දීමනා සහ නිවාඩු දීමනා ලෙස 2020 වර්ෂයේ දී අතිකාල හා නිවාඩු දීමනා ලෙස රු.150,804,766 ක් ගෙවා තිබුණි. | 2009 වර්ෂයේ දි රාජ්‍ය ගිණුම් පිළිබද කාරක සභාවේ නියෝග ප්‍රකාරව කටයුතු කල යුතුවීම හා සුදුසු දීමනා ක්‍රමයක් කඩිනමින් හදුන්වාදිය යුතු වීම. | දිරි දීමනා ගෙවීම් සඳහා ක්‍රමවේදයක් සකස් කර නැත. | වර්තමානය වන විටත් දිරි දීමනා ගෙවීම් සදහා ක්‍රමවේදයක් සකස් කර නැත |
| 10. | 2018 ජූලි 02 දිනැති ආයතන අධ්‍යක්ෂ ජෙනරාල් ගේ අංක EST/7/ALLOW/03/0120 දරණ ලිපිය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා අවසන් වරට දීමනා අනුමත කරන ලද 2017 ඔක්තෝබර් 04 දිනැති ලිපියෙන් අනුමත දීමනා 2018 දෙසැම්බර් 31 දින දක්වා පමණක් ගෙවීමට අනුමත කර තිබුණද 2019 හා 2020 වර්ෂයන් සඳහා ගෙවන ලද එකතුව රු. 1,261,119,517 ක් | වියදම් දැරීමට පෙර අදාළ අනුමැතීන් ලබා ගත යුතුවීම. | කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | අදාල අනුමැතීන් ලබා ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා කිසිදු අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | | | |
| 11. | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ ලේකම් ගේ 2019 මාර්තු 28 දිනැති අංක EST/ALLOW/ 03/0720 දරණ ලිපිය අනුව ආධුනික නිලධාරින්ට පුහුණු කාලය තුළ දෛනික දීමනාව ලෙස රු.700 ක් ගෙවිය යුතුය. එහෙත් ඊට අමතරව එම ආධුනිකයන්ට දෙපාර්තමේන්තුවේ නිත්‍ය සේවකයන්ට හිමි අතිකාල හා කැලි පදනම මත දීමනා ලෙස 2018, 2019 හා 2020 වර්ෂයන්හිදි එකතුව රු. 46,380,278 ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධි විධාන වලට අනුකුලව ගෙවීම් කල යුතුවීම. | මෙම නිතියට පටහැනි ගෙවීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ආධුනිකයන්ගේ පුහුණු කාලය අවසන් වී ඇති බැවින් වර්තමානයෙදී මෙම ගෙවිම සිදු නොවේ. |
| 12. | නිත්‍ය පදනමට සහකාර රජයේ මුද්‍රණාලාධිපතිවරයෙකු පත් කර ඇති අංශ හතරක් සඳහා විශේෂ හේතුන් කිසිවක් නොදක්වා වැඩ මුලිකවරුන් හතර දෙනෙකු වැඩ බලන සහකාර රජයේ මුද්‍රණාලාධිපතිවරුන් ලෙස 2020 වර්ෂයේදී පත් කර තිබුණි. එසේම සහකාර රජයේ මුද්‍රණාලාධිපති වරයෙකු වැඩ බැලීමට පත් කර ඇති අංශ හයක් සඳහා විශේෂ හේතුන් කිසිවක් නොදක්වා එම අංශ වල වැඩ මූලිකවරු වැඩ ආවරණය කරන සහකාර රජයේ මුද්‍රණාලාධිපතිවරු ලෙස පත් කර තිබුණි. | මෙලෙස අවිධිමත් පත්වීම් ලබා දිය යුතු නොවීම. | මේ සම්බන්ධයේන් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. | වර්තමානයෙදී ද මෙම තත්ත්වය එලෙසම පවතී. |

ශීර්ෂ 212 - විභාග දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණ<br>--------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>------------ | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>------------------------ | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>---------------------- |
|---|---|---|---|---|
| 1. | 2017 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර 2019 පෙබරවාරි අවසන් කිරීමට නියමිත කොන්ත්‍රාත් වටිනාකම රු.564,320,835 ක් වූ සයමහල් බහු කාර්යය ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේදී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යංශයට රු.28,905,398 ක් හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු.280,625,748 ක් ගෙවා තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට වැඩ අවසන් කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. | විවිධ හේතූන් මත ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇති බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටද වැඩ අවසන් කර නැත. |
| 2. | විභාග අපේක්ෂකයින්ගේ විශ්වාසනීයත්වය නංවාලීම හා රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් 2018 වර්ෂයේදී රු.546,264,452 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණ ද මිලදීගැනීමට පෙර එහි යෝග්‍යතාවය නඩත්තුකිරීමේ හැකියාව පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. වගකීම් කාලය අවුරුද්දකින් අවසාන වන ලෙස මිලදීගෙන තිබුණු මෙම යන්ත්‍රයෙන් 2019 වර්ෂයේදී අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රශ්න පත්‍රවලින් සියයට 8 ක් ද 2020 වර්ෂයේදී අ.පො.ස උසස් පෙළ ප්‍රශ්න පත්‍රවලින් සියයට 5 ක් ද මුද්‍රණය කර තිබුණි. එසේම ප්‍රශ්න පත්‍ර වල රහස්‍යභාවය | මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීමේ අරමුණු ඉටු කරගත යුතු අතර කඩිනමින් වත්කම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු බව. | ප්‍රශ්නපත්‍ර ස්වභාවය අනුව පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීමට අපහසු වූ බව. | තාක්ෂණික ගැටළු හේතුවෙන් මුද්‍රණ කටයුතු සිදුකිරීමට යන්ත්‍රය භාවිතා නොකරයි. Wrapping Solution කොටස මෙතෙක් භාවිතයට ගෙන නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| | ආරක්ෂා කිරීම සඳහා 2018 වර්ෂයේ දී මිලදීගෙන තිබුණු රු.8,428,637ක් වටිනා Wrapping Solution කොටස මිලදී ගත් දින සිට නිශ්කාර්යව තිබුණි. | | | |
| 3. | මුද්‍රණ යන්ත්‍රයේ හදිසි විදුලි බිඳ වැටීමකදී මුද්‍රණ පද්ධතිය ක්‍රියා විරහිත (shutdown) වන තුරු විදුලි සැපයුම පවත්වාගෙන යාම සඳහා පිරිවැය රු.7,096,000 ක් වූ කි.වො. 160 ක "අඛණ්ඩ බලසැපයුම් ඒකකයක්" මිලදී ගෙන වසර 02 කට ආසන්න කාලයක් ගතවීමෙන් පසු ඒ සඳහා UPS කොටස මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව මිලදී ගැනීමේ පිරිවිතරවල මෙම අවශ්‍යතාවය සැලකිල්ලට නොගැනීම නිසා රු.මිලියන 7කට වැඩි මුදලක් අමතර වැය කිරීමට සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු බව. | එකඟ වී ඇත. | මුද්‍රණ කටයුතු සිදුකිරීම අවම වීම හේතුවෙන් UPS කොටසෙහි භාවිතා කිරීම ද අවම මට්ටමක පවතී. |
| 4. | දෙපාර්තමේන්තුව පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.630,000,000 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණ ද එම ඉඩම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතු බව. | මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරුණු දන්වා ඇත. | මේ දක්වා පවරා ගෙන නොමැත. |
| 5. | 2018 වර්ෂයේදී රු. 28,500,000 ක් වැය කර ස්ථාපනය කර තිබුණු සූර්යබල ශක්ති පද්ධතියේ නිෂ්පාදන ධාරිතාවය හා පරිභෝජනය පිළිබඳ අපහැදිලිභාවය නිසා පත්කල දෙපාර්තමේන්තු කමිටුවේ 2018 ඔක්තෝබර් 08 දිනැති තීරණය අනුව, සම්පූර්ණ විදුලි නිෂ්පාදනය | කමිටු තීරණය අනුව කටයුතු කළ යුතු බව. | අධ්‍යයනයක් කෙරෙමින් පවතින බව. | දෛනික විදුලි නිෂ්පාදනය සහ මූල්‍ය වටිනාකම හඳුනාගත හැකි Net Plus ක්‍රමවේදය වෙත මාරුවීම සඳහා කමිටු නිර්දේශය ලැබී තිබුණ ද එය |

| | | | | |
|---|---|---|---|---|
| | විදුලි බල මණ්ඩලයට අලෙවි කල යුතු වුවද 2020 වර්ෂය අවසන් වන විටද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | | සිදු වී නැත. |
| 6. | 1992 වර්ෂයේ සිට පැවති විභාගවල ප්‍රතිඵල සහතික පරිගණක පද්ධතිය හරහා නිකුත් කරන නමුත් 1992 වර්ෂයට පෙර පැවති විභාගවල ප්‍රතිඵල එසේ නිකුත් කිරීමට කටයුතු ආරම්භකර තිබුණ ද 2021 ජුනි දක්වා ප්‍රතිඵල නිකුත් කිරීමට හා සනාථ කිරීමට නොහැකි වී තිබුණි. | 1992 වර්ෂයට පෙර පැවති විභාගවල ප්‍රථිඵල මාර්ගගත ක්‍රමයට නිකුත් කිරීමට පියවර ගත යුතුය. | මාර්ගගත ක්‍රමයට ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා කඩිනමින් පියවර ගන්නා බව. | 1992 පෙර පැවති විභාගවල ප්‍රථිඵල මාර්ගගත ක්‍රමයට නිකුත් කිරීමට මෙතෙක් පියවර ගෙන නැත. |
| 7. | ආයතනික විභාග පැවැත්වීම සඳහා රාජ්‍ය ආයතනවලින් මුදල් අයකර ගන්නා ආකාරය පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් තීරණය කරගෙන නොතිබුණි. | ආයතනික විභාග සඳහා මුදල් ප්‍රතිපාදනය කර ගන්නා ආකාරය පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයක් තීරණය කරගත යුතුය. | එකඟ වන බවත් අදාළ නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බවත් | මේ වන විටත් මුදල් අයකරගැනීමට අවශ්‍ය විධිමත් පියවර ගැනීමට අපොහොසත් වී ඇත. |

ශීර්ෂ 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණ<br>--------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>---------------------- | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>------------------------ | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>---------------------- |
|---|---|---|---|---|
| 1. | වර්ෂයට අදාල පෙළපොත්, අතිරේක පොත් සහ ගුරු අත්පොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගැනීමකින් තොරව මුද්‍රණය කිරීම හේතුවෙන් 2018, 2019 සහ 2020 වර්ෂවල පිළිවෙලින් රු. 564,588,984 ක්, රු.1,919,761,678 ක් සහ රු.1,628,198,129 ක් වටිනා තොග ශේෂයන් ගබඩාවල සහ වෙළඳසැල්වල ඉතිරි වී තිබුණි. | වර්ෂයට අදාළ පොත් අවශ්‍යතාවය සහ අතිරේක පොත් අළෙවිය නිවැරදිව හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීම. | තත්ත්ව වාර්තා අනුව පෙළපොත් මුද්‍රණය ප්‍රමාණාත්මකව අඩුකරන බව. | පෙළපොත් අතිරේක පොත් සහ ගුරුමාර්ගෝපදේශ ගබඩාවල සහ ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ වෙළඳසැල්වල ඉතිරිව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 2. | මුද්‍රණය කරන ලද පෙළපොත් අතිරේක පොත් සහ ගුරු අත්පොත් භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් පැවතීම නිසා 2018, 2019 සහ 2020 වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට අපහරණය කළ යුතු පොත්වල වටිනාකම පිළිවෙළින් රු. 83,680,906 ක් ද, රු. 6,696,680 ක් සහ රු. 8,484,244 ක් වී තිබුණි. | පොත් අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීම. | පොත් අපහරණය කිරීමට කටයුතු කරන බව. | මේ වන විටත් පොත් අපහරණ කටයුතු අවසන් කර නැත. |
| 3. | 2020 වර්ෂය සහ ඊට පෙර වර්ෂයන්හි රු. 22,551,350 ක් වටිනා පෙළ පොත් ගුරු මාර්ගෝපදේශ සහ අතිරේක පොත් 2021 පෙබරවාරි 28 දින වන විටත් මුද්‍රණකරුවන් මුද්‍රණය කර භාරදී නොතිබුණි. | නියමිත දිනයේදී මුද්‍රිත පොත් ලබාගැනීමට කටයුතු කළ යුතු ය. | එකඟ වන බව. | මුද්‍රණ කාර්යය නිසි පරිදි නියාමනය නොකිරීම නිසා 2021 සහ ඊට පෙර වර්ෂවල මුද්‍රණ ඇනවුම් ලබාදුන් 198,695,293 ක් වටිනා පොත් මේ වන විටත් මුද්‍රණය කර භාරදී නොතිබුණි. |
| 4. | 2018 වර්ෂය වෙනුවෙන් මුද්‍රණය කරන ලද පෙළපොත් වර්ග 106 ක සහ 2019 වර්ෂය වෙනුවෙන් මුද්‍රණය කරන ලද පෙළපොත් පිටපත් 2,678,000 ක ගුණාත්මක භාවය අඩුවීම හේතුවෙන් පිළිවෙළින් රු. 6,130,000 ක් සහ රු. 1,099,282 ක් දඩ මුදල් වශයෙන් අයකර තිබුණි. | මුද්‍රණ කරුවන්ගේ පොත් වල ගුණාත්මක තත්වය සළකා බැලිය යුතුය. | කඩදාසි ආනයනයේදී ලබාගන්නා SGS සහතිකය පිළිබඳව සළකා බලන බව. | 2020 වර්ෂයේදීද මේ සඳහා දඩ අයකර තිබුණි. |
| 5. | 2020 සහ 2019 වර්ෂයන්ට අදාළව පෙළපොත් සඳහා ගෙවීම් කිරීමේදී පිටු අඩුවීම් වෙනුවෙන් පිළිවෙළින් රු. 1,475,479 ක් සහ රු.17,039,257 ක මුදලක් වැඩියෙන්ද පිටු වැඩිවීම වෙනුවෙන් | ගුණාත්මක පොත් ලබාදීමේ පසුගිය කාර්යය සාධනය සළකා බැලීම. | තාක්ෂණික කරුණු අනුව මේ තත්වය ඇතිවී තිබෙන බව. | 2021 වර්ෂයේ ද මෙම තත්වය පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිවෙළින් රු. 1,375,890 ක් සහ රු. 16,636,231 ක් අඩුවෙන්ද මුද්‍රණ කරුවන් වෙත ගෙවා තිබුණි. | | | |

ශීර්ෂ 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඉවත් කරන ලද වත්කම් වර්ග 2784 ක පිරිවැය වටිනාකම් හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමටත් අපහරණය හා විකිණීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ වර්ග 8985 ක් අපහරණය කිරීමටත් පිරිවැය වටිනාකම් හඳුනා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | අපහරණය හා විකුණන ලද වත්කම් වල පිරිවැය වටිනාකම් හඳුනා ගෙන ගිණුම් වලින් ඉවත් කිරීමටත් භාණ්ඩ සමීක්ෂණයේදී ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් ක්‍රියාකල යුතු වීම. | වත්කම් තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. කමිටුවේ නිර්දේශ මත වත්කම් වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරිමට කටයුතු කරන බව. | 2021 දෙසැම්බර් 31 දක්වාම වත්කම්වල පිරිවැය හඳුනාගෙන නොතිබුණි. |
| 2. | කාර්මික / තාක්ෂණ විද්‍යාල 25 ක් සතු ඉඩම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි. | සියලුම ඉඩම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | කඩිනමින් අදාල තක්සේරු වාර්තා ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බව. | තක්සේරු වාර්තා ලබාගැනීම හා ගිණුම් ගත කිරීම සිදුවී නොමැත. |
| 3. | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 16 දෙනෙකුගෙන් හා සේවය අවසන් කිරීම, සේවය අතහැර යාම, විශ්‍රාම යාම හේතුවෙන් නිලධාරීන් 66 දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 3,433,197 ක් වූ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අය කර ගැනීමට නොපමාව කටයුතු කල යුතු වීම. | ණය ශේෂ අය කර ගැනීම් සඳහා සිහි කැඳවීම් කර දැනුවත් කිරීම් සිදු කර ඇති බව හා විශ්‍රාම ගිය අයගෙන් විශ්‍රාම පාරිතෝශිතය ලද වහාම කටයුතු කරන බව. | 2021 දෙසැම්බර් 31 දක්වාම ණය ශේෂ අය වී නොතිබුණි. |
| 4. | නිසි පරිදි ඔයිල් හා ජලය යොදා ධාවනය නොකිරීම නිසා වාහනයක එන්ජිම අකර්මන්‍ය වීම හේතුවෙන් රු. 1,737,568 ක් වූ තක්සේරු | මු. රෙ 104 (4) වාර්ථාව අනුව අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. | වගකිව යුතු සියළු නිලධාරීන්ගෙන් අලාභ අය කර ගැනීමට ඉදිරියේදී | 2021 දෙසැම්බර් 31 දක්වාම අලාභ අයකර ගෙන |

| | | | | |
|---|---|---|---|---|
| | කරන ලද අලාභයෙන් සියයට 40 ක් රියදුරු ගෙන් අය කර ගැනීමට තීරණය කර තිබුණද 2021 පෙබරවාරි 19 වන විගණන දිනය දක්වාම එකී අලාභ අයකර ගෙන නොතිබුණි. | | පියවර ගනු ලබන බව. | නොතිබුණි. |

ශීර්ෂ 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිරිදේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| | -------------------------- | ---------------------- | ---------------------- | ------------------ |
| 1. | මුදල් රෙගුලාසි 94 විධිවිධාන වලට පටහැනිව 2018 වර්ෂයේදී වැය විෂයන් 07ක ප්‍රතිපාදන ඉක්මවා රු.1,187,076 ක් ද, 2019 වර්ෂයේදී වැය විෂයන් 05ක ප්‍රතිපාදන ඉක්මවා රු. 2,458,392 ක් ද බැරකම් වලට එළඹී තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | ප්‍රතිපාදන ඉක්මවා දිගින් දිගටම බැඳීම් වලට එළඹී තිබුණු අතර ප්‍රතිපාදන නොඉක්මවන පරිදි කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේදී මෙම තත්ත්වය නිරාකරණය කිරීමට පියවර ගත් බවට තහවුරු නොවීය. |
| 2. | වර්ග ප්‍රමාණය අක්කර 50.93 ක් වූ ඉඩම් කැබලි 11ක් දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු අතර ඉන් අක්කර 24.27ක් වූ ඉඩම් කැබලි 08ක අයිතිය විධිමත් ලෙස පවරාගෙන නොතිබුණි. | පරිත්‍යාග වශයෙන් ලැබුණු ඉඩම්වල නිරවුල් අයිතිය කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | අයිතිය පවරා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කෙරෙමින් පැවතිණි. | ඉඩම් පවරා ගැනීම් කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. |
| 3. | මුදල් රෙගුලාසි 757 (2) ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතී. | ඌනතා අතිරික්තතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රමාදයන් පැවති අතර මෙතෙක් සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 4. | ජොෂ්ඨ, තෘතියික හා ද්විතික මට්ටමේ තනතුරු වල 2018 වර්ෂයේදී 104 ක්, 2019 වර්ෂයේදී 110 ක් හා 2020 වර්ෂයේදී 77 ක් වශයෙන් පුරප්පාඩු පැවතිණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම අත්හිටුවා ඇත. | සියලුම සේවක සනයන්ට අදාල පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකරනු වෙනුවට ද්විතීක මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකර එම තනතුරු වල සේවක මණ්ඩල අතිරික්තය 153 ක් වී තිබුණි. |

ශීර්ෂ 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිරිදේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | ඒ සම්බන්ධෙයන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | දෙපාර්තමේන්තුව 1956 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය වන විට වර්ෂ 64 ක් ගත වී තිබුණ ද ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාළ නීති සම්පාදනය කිරීම කර නොතිබුණි. විකල්ප රැකවරණ ප්‍රතිපත්තියක් සඳහා 2019 මාර්තු 06 වන දින කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණ ද, එම ප්‍රතිපත්තිය විගණිත දිනය වූ 2021 මාර්තු 25 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙහෙවරට අනුකූලව ක්‍රියාකිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු වීම. | විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සඳහා 2019.03.06 දින කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර එම ප්‍රතිපත්තිය පාදක කරගෙන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ ළමා නිවාස ළමුන් පිළිබඳ සංගණනයක් පවත්වන ලදී. සංගණනයේදී අනාවරණය වන තොරතුරු පදනම් කරගෙන “ක්‍රියාකාරී සැලැස්මක්” සකස් | 2021 දෙසැම්බර් 31 දක්වාම ජාතික ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කොට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කොට ඇත. | |
| 2. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයක් වන 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත සංශෝධනය කිරීම හා ළමා නිවාස ආඥා පනත සංශෝධනය කිරීම සමාලෝචිත වර්ෂය දක්වාම නිම කර නොතිබුණි. | කඩිනමින් සංශෝධන කටයුතු නිම කළ යුතු වීම. | ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත සංශෝධනය කිරීම අවසන් අදියරයේ පවතී. | 2021 දෙසැම්බර් 31 දක්වාම සංශෝධන කටයුතු නිම කර නොතිබුණි. |
| 3. | විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව වෙත වාර්තා වූ ළමා අපයෝජන 61,238 කින් පැමිණිලි 17,732 ක් සඳහා කෙටිකාලීන විසඳුම් ලබා දී තිබූ අතර පැමිණිලි 10,577 ක් විසඳීම සඳහා වෙනත් ආයතන වෙත යොමු කර තිබුණි. පැමිණිලි සඳහා ලබා දුන් විසඳුම්වල ප්‍රගතිය විමසීම හා පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබූ අතර වැඩි අවධානය යොමු කළයුතු දිස්ත්‍රික්ක, අවධානය යොමු කළයුතු ක්ෂේත්‍ර හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් පැමිණිලි විසඳීම පිළිබඳ පසුවිපරම් කළ යුතු වීම. | පසු විපරම් කටයුතු දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ. විශේෂ අවස්ථාවලදී අවශ්‍යතාවය අනුව ප්‍රධාන කාර්යාලය විසින් පසුවිපරම් සිදු කරන බව. | 2021 දෙසැම්බර් 31 දක්වාම පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ ප්‍රගතිය පහල මට්ටමක පැවතුණි. |

ශීර්ෂ 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 1. | අවුරුදු 13-14 වයස් කාණ්ඩවල පසුවන ක්‍රීඩා කෞශල්‍යාන්ගෙන් හෙබි දරුවන් විද්‍යාත්මක පදනමකින් හඳුනා ගනිමින් 2024 සහ 2028 වර්ෂවලදී පැවැත්වෙන ඔලිම්පික් තරඟාවලියට යොමු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා එකතුව රු. මිලියන 474 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර 2018 වර්ෂය අවසන් වන විට එයට රු. මිලියන 132.1 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී නවතා තිබුණු අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය හා නවතා දැමීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සැලැසුම් කළ කාර්යභාරය ඉටු කිරීමට අවශ්‍ය අනෙකුත් සැලසුම් හා කාල රාමුව නිවැරදිව සැලැසුම් කළ යුතු වීම. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ යම් යම් ගැටළුකාරි තත්ත්වයන් මත ව්‍යාපෘති තාවකාලිකව නවතා දමන ලද අතර නැවත එම ව්‍යාපෘතිය නව වැඩපිළිවෙලක් යටතේ ආරම්භ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමග සාකච්ඡා කරමින් පවතින බව විගණනය වෙත දන්වා ඇත. | ව්‍යාපෘති නවතා දැමීම නිසා රු. මිලියන 132.1 ක වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. |
| 2. | 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හි 35 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයෙන් ප්‍රදාන ලබා ගැනීම අපේක්ෂා කරනු ලබන යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසින් සකස් කරනු ලබන වාර්ෂික අයවැය ලේඛනය තුළ අදාළ ප්‍රදානයන් හා ඊට අදාළ උපයෝජනයන් අන්තර්ගතකර තිබිය යුතු වුවද එය විශ්ලේෂණාත්මක ඇගයීමකට ලක්කිරීමකින් තොරව 2018 | 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හි 35 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී මෙසේ මුදල් ලබා දීමේදී වඩාත් විධිමත් විශ්ලේෂණයක් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | ක්‍රීඩා සංගම් නියෝග යටතේ 35 වගන්තියට අනුව විශ්ලේෂනාත්මක ඇගයීම් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේදී රු. 118,528,187 ක් ක්‍රීඩා සංගම් වෙත ප්‍රදානය කර තිබුණි. | | | |
| 3. | 2017 වර්ෂයේ ක්‍රීඩා සංගම් 13 ක් විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණ අතර, එම සංගම් වෙත රු.13,322,649 ක ප්‍රදානයන් ලබාදී තිබුණි. එසේ ලබා දුන් ප්‍රදාන විධිමත් පරිදි භාවිතා කර තිබේද යන්න තහවුරු කර ගැනීමට දෙපාර්තමේන්තුව පසු විපරම් කර නොතිබුණි. | ජාතික ක්‍රීඩා සංගම් නියෝගයන්හි 35 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී ඉදිරිපත් නොකරන ලද සියලු ක්‍රීඩා සංගම් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් හෝ අනුග්‍රාහයක් නොදැක්වීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | ජාතික ක්‍රීඩා සංගම් නියෝගවලට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇත. |
| 4. | 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (x) අනුව ක්‍රීඩා සංගම් සමග අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට කටයුතු කිරීමකින් තොරව ගුවන් ටිකට්පත් හා උපකරණ මිලදී ගැනීම ඇතුළු වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.204,001,938 ක් ක්‍රීඩා සංගම් 35 ක් වෙත ප්‍රදානය කර තිබුණි. | ජාතික ක්‍රීඩා සංගම් නියෝග ප්‍රකාරව ජාතික ක්‍රීඩාසංගම් සඳහා මූල්‍ය උපකාර ලබාදීමේදී අවබෝධතා ගිවිසුම්වලට එලඹීමට කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ ජනරාල් විසින් මේවන විටත් අධ්‍යක්ෂ (ක්‍රීඩා) වෙත උපදෙස් ලබාදී ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී සියළු ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන දැනුවත් කර මෙම අඩුපාඩු නිවැරදි කර ගන්නා බවත් දන්වා ඇත. | අවබෝධතා ගිවිසුම් අත්සන් කර ගෙවීම් කටයුතු සිදුකර නොතිබුණි. |
| 5. | 2017 වර්ෂය සඳහා ජාතික සංගම් 37 ක්, 2018 වර්ෂය සඳහා සංගම් 25 ක් හා 2019 වර්ෂය සඳහා සංගම් 35 ක් ජාතික තේරීම් කමිටු පත්කර නොතිබුණද ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ වලට සහභාගී වීම සඳහා ගුවන් ටිකට් පත් මිලදී ගැනීම හා තරඟ පැවැත්වීමේ වියදම් වෙනුවෙන් 2017, 2018 හා 2019 වර්ෂවල පිළිවෙලින් රු.33,028,040 ක් | දේශිය හා විදේශීය තරඟ සඳහා ක්‍රීඩකයින් තෝරා ගැනීම සඳහා ජාතික තේරීම් කමිටු පත් කිරීම, එහි කටයුතු අධීක්ෂණය, මෙහෙයවීම හා නියාමනය කිරීම තුලින් දෙපාර්තමේන්තුවේ අරමුදල් සුදුසුකම්ලත් | සියලුම කරුණු සලකා බලා මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු මඟහරවා ගනිමින් කටයුතු සිදු කරන බවද කාරුණිකව දන්වා ඇත. | මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු මඟහරවා ගනිමින් කටයුතු කිරීමට යොදා ඇති කටයුතු විගණනයට ඉදිරිපත් නොවුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.1,023,330 ක් හා රු.17,700,623 ක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එම ජාතික ක්‍රීඩා සංගම් වෙනුවෙන් වැය කර තිබුණි. | ක්‍රීඩකයින් වෙනුවෙන් යොදන බවට තහවුරු කරගත යුතුවීම. | | |
| 6. | 2019 වර්ෂයේ එක් වැය විෂයක් යටතේ සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 600,000,000 ක් වූ අතර වර්ෂය අවසාන වන විට එයින් රු. 578,719,272 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 21,280,727 ක් ඉතිරි වී තිබුණ ද ඉතිරිය ඉක්මවා රු. 49,936,273 ක බැරකම්වලට එළඹ තිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (ඇ) ඡේදයට අනුකූලව බැදීම්වලට හා බැරකම් වලට එළඹිය යුතු වීම. | නේපාලයේ පැවති 13වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල සඳහා ඇතිකරගත් බැදීම් හේතුවෙන් රු. 49,936,273ක ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවූ බැරකමක් පවතින බව දන්වා ඇත. | අදාල නීති රීති උල්ලංගනය කරමින් කටයුතු කර තිබුණි. |
| 7. | 2016 දෙසැම්බර් 23 දින ගබඩාවට භාර ගෙන තිබූ රු.12,995,000 ක් වටිනා බර ඉසිලීමේ ඉලෙක්ට්‍රොනික් විනිශ්චය සංඥා පද්ධති උපකරණය ඇනවුම් කිරීමේදී සිදුවූ දෝෂයක් මත සැපයුම් ආයතනය අත්‍යාවශ්‍ය අයිතම සපයා නොමැති වීම හේතුවෙන් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. එම උපකරණ දින 04 ක් සඳහා රු.220,000 මුදලකට කුලී පදනම මත ලබාගෙන එක් තරඟාවලියක විනිශ්චය සඳහා පමණක් යොදා ගෙන තිබුණි. | රජය සතු වත්කම් කාර්යක්ෂමතාවයකින් හා ඵලදායි ලෙස භාවිතා කළ යුතු වීම. | මෙම උපකරණ මිලට ගැනීමේදී ඒ සඳහා අවශ්‍ය වන **Digital Screen** මිලට ගෙන නොමැති බැවින් ඒවා කුලී පදනම මත සපයාගෙන භාවිතා කර ඇති බව විගණනයට දන්වා ඇත. | අවශ්‍යතා විශ්ලේෂණය කිරීමකින් තොරව සිදුකර තිබෙන ප්‍රසම්පාදන කටයුත්තකි. |
| 8. | දෙපාර්තමේන්තුවට අයත් නේවාසිකාගාර 02 සඳහා එක් යන්ත්‍රයක් රු.5,290,000 ක් වූ විදුලි ජනක යන්ත්‍ර 02 ක් මිලදී ගැනීමේ පිරිවැය රු.මිලියන 10 ට අඩු ලෙස සලකා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය සංශෝධිත 2018 ජුලි 09 දින | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය සංශෝධිත 2018 ජුලි 09 දින අංක 34 ඇමුණුම පරිදි කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී එවැනි ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමේදී ජාතික තරඟකාරි ලංසු කැඳවීමේ ක්‍රමය අනුගමනය කරන බවට දන්වා ඇත. | ඉදිරියේදී නිවැරදි ක්‍රමවේදය අනුගමනය කරන බව දන්වා ඇත. මෙය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ |

| | | | | |
|---|---|---|---|---|
| | අංක 34 ඇමුණුම පරිදි වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි. නමුත් මුළු පිරිවැය රු.මිලියන 10 ඉක්මවන මෙම මිලදී ගැනීම සඳහා විවෘත මිලගණන් කැඳවීම සිදුනොකර දුරකථන නාමාවලිය භාවිතා කර සැපයුම්කරුවන් 05 දෙනෙකු පමණක් තෝරා ගෙන මිල ගණන් කැඳවා තිබුණි. | | | සංග්‍රහය උල්ලංඝනය කිරීමකි. |
| 9. | මායාකඩවර දුන්වත්ත මහජන ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා මුළු ඇස්තමේන්තුව රු. 6,000,000 ක් වූ අතර ඉදිකිරීම් කටයුතු සඳහා රු. 6,843,755 ක් වැය කර තිබුණි. මෙහි ඉදිකිරීම් කටයුතු සඳහා රු. 6,333,081 ක් වූ අගයකට කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් ගතව 2017 පෙබරවාරි 19 දින වැඩ අවසන් කළ යුතු වුවත් වසර 01 ක ප්‍රමාදයකින් පසු එනම් 2018 මාර්තු 31 දින එහි වැඩ අවසන් කර තිබුණි. නමුත් 2020 දෙසැම්බර් 15 වන දින වන විට ඉදිකිරීම් සිදුකර වසර 02 කුත් මාස 05 ක් ගත වී ඇතත් ප්‍රේක්ෂකාගාරය කිසිදු පාර්ශවයක් වෙත නිත්‍යානුකූලව භාර දී නොතිබුණි. ප්‍රේක්ෂකාගාරයේ සිට ක්‍රීඩා පිටිය නැරඹිය හැකි වන ලෙස ප්‍රේක්ෂකාගාර ගොඩනැගිල්ල ක්‍රීඩාංගණය දෙසට මුහුණ ලා ඉදි කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම සහ විධිමත් පරිදි ඉදිකිරීම් සැලසුම් කර නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති මගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන ලෙස ව්‍යාපෘති ඉදිකිරීම් සැලසුම් කළ යුතු වීම. | දැනට මෙම ක්‍රීඩාපිටිය සම්බන්ධව අදාළ පාර්ශවයන් සමග සාකච්ජා කර නෛතිකව පසුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශිය සභාව වෙත භාරදීමට කටයුතු යොදා ඇති බවත්, එසේම ජලය හා විදුලිය ලබා ගැනීමට අදාළ කටයුතු කර ඇති බවත් දන්වා ඇත. | මේ වන විටත් ප්‍රේක්ෂකාගාරය භාවිතයට ගත හැකි පරිදි වැඩ අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 10. | කටුපොත පොල්පිටිය මහජන ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා රු. 6,832,450 ක අගයකට කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් ගතව තිබුණි. ප්‍රේක්ෂකාගාරයේ වැඩ කටයුතු 2017 මාර්තු 31 දින වන විට අවසන් කර තිබුණද, ඉදිකිරීම් කටයුතුවල විශාල ප්‍රමාණයක පැවති අඩුපාඩු නිම කර මාස 21 කට පසුව එනම් 2019 දෙසැම්බර් 17 දින ප්‍රේක්ෂකාගාරය කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත භාරදී තිබුණි. ප්‍රේක්ෂගාරයේ හදුනාගත් අඩුපාඩු නැවත සකස් කළ බවට හා තාක්ෂණ නිලධාරි සහතිකයක් 2020 දෙසැම්බර් 09 දිනට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අපේක්ෂිත කාලවකවානු තුළ ව්‍යාපෘති නිමකිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර නියමිත කාල රාමුව ඇතුළත නියමිත ප්‍රමිතියට අනුව ඉදිකිරීම් කටයුතු නිමකිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති කළමනාකරණය හා නියාමනය කළ යුතු වීම. | අඩුපාඩු සකස් කර මේවන විට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට භාරදී ඇති බව දන්වා ඇත. | අඩුපාඩු නැවත සකස් කල බවට තාක්ෂණ නිලධාරී සහතිකයක් මේ වනතෙක් ඉදිරිපත් කර නොතිබුණි. |
| 11. | කුලියාපිටිය සුභාරතී විද්‍යාලයේ ක්‍රීඩාපිටිය ඉදිකිරීමට අදාළ මුළු ඇස්තමේන්තු මුදල රු. 6,535,000 ක් වූ අතර, කොන්ත්‍රාත්කරු සමඟ රු. 5,545,525 ක් වූ අගයකට ගිවිසුම් ගතවී කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම ක්‍රීඩාපිටිය අසලින් ගලාබසින ඔයේ ගංවතුර තත්ත්වයක් ඇති වීම හේතුවෙන් ක්‍රීඩාපිටිය වටා ඉදිකර තිබූ බැම්ම සම්පූර්ණයෙන්ම ගැලවී බිම වැටී තිබුණු අතර ක්‍රීඩාපිටියේ පාරට අදාල කොටසෙහි වැට සම්පූර්ණයෙන්ම ගැලවී බිම වැටී තිබුණි. යොදා තිබූ දැල් සහ G.I බට කිසියම් පිරිසක් විසින් කපා රැගෙන ගොස් තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ඉදිකිරීම් කටයුතුවල මූලික සැලසුම් සිදුකිරීමේදි හා ස්ථානය | ව්‍යාපෘති නියමිත ප්‍රමිතීන්ට අනුව ඉදිකළ යුතුවන අතර, ඉදිකිරීම් කටයුතු කළමනාකරණය සහ නියාමනය සිදුකළ යුතු වීම. | අවුරුදු 25-50 ක පමණ කාලයකට පසුව බලාපොරොත්තු නොවූ අයුරින් ඇති වූ ගංවතුර ගැලීම වැනි ආපදා තත්වයක් නිසා එවැනි තත්වයක් උද්ගතවී ඇති බවත්, මෙම වැට නැවත සකස් කිරීම ආරම්භ කරන ලද අතර එම අවස්ථාවේදී, යාබද ඉඩමක් මිලදී ගැනීමට කටයුතු යොදා ඇති බැවින් සංවර්ධන කටයුතු නවත්වන මෙන් විදුලහල්පති විසින් දැනුම් දී ඇති බවත් දන්වා ඇත. | විදුහල්පතිතුමා විසින් ලබා දීමට යොජිතව ඇති යාබඳ ඉඩම් කොටස මේ දක්වා ලබාදී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තෝරා ගැනීමේදී ඇති විය හැකි ස්වාභාවික ආපදා තත්ත්වයන් පිළිබඳ සැලකිල්ලක් දක්වා නොතිබීම හේතුවෙන් සහ විධිමත් පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම හේතුවෙන් මේ සඳහා වැයකළ රු.3,872,225 ක් වූ අගය නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය. | | | |
| 12. | නාරම්මල මයුරපාද විද්‍යාලයේ බහු ක්‍රීඩා ඒකකයක් ලෙස ක්‍රීඩා පිටිය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු. 9,800,000 ක් විය. කොන්ත්‍රාත්කරු සමග 2016 ජනවාරි 06 දින ගිවිසුම් ගතවී රු. 8,057,370 ක් වූ අගයකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. අවසාන බිල්පත අනුව කල වැඩ වටිනාකම රු. 8,894,936 ක් වූයෙන් ගිවිසුම්ගත මුදල ඉක්ම වූ රු. 837,566 ක ගෙවීම් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. බහු ක්‍රීඩා ඒකකයක් ලෙස නෙට්බෝල් සහ බාස්කට්බෝල් ක්‍රීඩා පිටියක් පමණක් ඉදිකර තිබුණු අතර වොලිබෝල් ක්‍රීඩා කිරීම සඳහා මෙම ක්‍රීඩා පිටිය භාවිතා කළ නොහැකි බව නිරීක්ෂණය විය. ඇස්තමේන්තුවේ සඳහන් රු. 2,722,768 ක් වටිනා වැඩ විෂයන් 19 ක් ඉටුකර නොතිබුණු අතර අවශ්‍යතා හඳුනාගෙන මනා සැලසුමකින් ව්‍යාපෘති සැලසුම් නොකිරීම සහ විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | අවශ්‍යතා හඳුනාගෙන ව්‍යාපෘති නියමිත පරිදි සැලසුම් කිරීම හා නියාමනය සිදුකළ යුතුවීම සහ කොන්ත්‍රාත් පරිපාලනය විධිමත් පරිදි සිදුකළ යුතුය. | බහු ක්‍රීඩා ඒකකය සිදුකරනු ලබන කාර්යයන් නිසා පාසලේ ඉතිරි වැඩ කොටස් කරගෙන යාමට පසුව වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වෙන් කළ යුතු බව එවකට සිටි විදුහල්පති විසින් දැන් වූ නිසා එම වැඩ කොටස් ඉටු නොකරන ලද බවත්, එසේ වුයේ පාසල සඳහා විධිමත් මූලික සැලැස්මක් නොතිබූ නිසා බවත් විගණනයට දන්වා ඇත. | සැලසුම් සහගත ලෙස ඉදිකිරීම් කටයුතු සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| 13. | කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලයේ ප්‍රේක්ෂකාගාරය ඉදි කිරීම සඳහා පුද්ගලික ඉදිකිරීම් සමාගමක් සමග රු. 14,296,005 ක් වූ අගයකට ගිවිසුම්ගතවී තිබුණි. නමුත් එම ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ මිල රු. 12,010,655 ක් විය. ඉදිරිපස ඇති ආසන සහ ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත හැකිවන ආකාරයට ප්‍රේක්ෂකාගාරයේ වහලය ඉදිරියට පිහිටන ලෙස සකස් කර නොතිබුණි. මේ අනුව ඉදිරිපස ආසන සියල්ල වර්ෂාවට හා අව්රශ්මියට ආවරණය නොවන පරිදි ඉදිකිරීම සිදු කර තිබුණි. ඒ අනුව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකිවන ආකාරයට ප්‍රේක්ෂකාගාරයේ සැලැස්ම පිළියෙළ කර නොතිබුණු අතර, ව්‍යාපෘතිය සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොමැති බවද නිරීක්ෂණය විය. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි හා අවශ්‍ය හා හඳුනාගෙන සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | මේ සඳහා රු.මිලියන 25 ක් වෙන්කර තිබූ නමුත් සුදුසුකම්ලත් ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කර තිබූ ලංසු මුදල රු.මි. 12 ක් වුවත් කල යුතු වැඩ කොටස් ඇතුලත්ව රු.මි.14.2 ක මුදලකට ප්‍රදානය කර ගිවිසුම අත්සන් කරන ලද බවත්,<br>පාසලේ ඇති ආවේනික තත්වය සලකා බලා මෙම ගොඩනැගිලි ඉදිකර ඇති බවත් ඉදිරිපස අසුන් වෘත්ත **(open tires)** ආසන ලෙස දැක්විය හැකි බවත්, එය සාමාන්‍ය ක්‍රීඩාගාරයක ඇති දෙයක් බවත් විගණනයට දන්වා ඇත. | සාමාන්‍ය ප්‍රේක්ෂකාගාරයක් ඉදිකිරීම පරිදි සිදු කර ඇති බව සඳහන් කර ඇත. |
| 14. | ක්‍රීඩා කෞශල්‍යා පුහුණු ව්‍යාපෘතිය සඳහා රු.9,266,400 ක් වූ ලයිට් මිසයිල ක්‍රීඩා උපකරණ ඒකක 1872 ක් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව පුද්ගලික ක්‍රීඩා භාණ්ඩ සැපයුම් ආයතනයක් වෙතින් ඇනවුම් කර 2017 ජූලි 05 දින ගබඩාවට ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණු අතර වර්ෂ 2 ½ ක් පමණ කාලයක් ගබඩාවේ රඳවා ගෙන ඇති අතර 2020 දෙසැම්බර් 30 දින වන විටත් භාවිතයට ගෙන | මෙම ප්‍රසම්පාදනයේ සිදුවූ වැරදි හා අඩුපාඩු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා විධිමත් පරිදි පරීක්ෂණ කටයුතු සිදුකිරීම හා ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ යුතු වීම. | තරුණ හා ක්‍රීඩා අමත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු විසින් කරන ලද විමර්ශණයක් මත පදනම්ව අදාල ලයිට් මිසයිල තොගය සැපයුම්කාර ආයතනය වෙත ආපසු යැවීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමැතිය ලබා දී ඇති බව විගණනයට වාර්තා කර ඇත. | අදාල කටයුතු නිම වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. මෙම තොගය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් විසින් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | | | |
| 15. | මූල්‍ය ප්‍රකාශනවල රු.214,180,540 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයට රු.32,791,686 ක් වූ එකතු කළ අගයමත බදු ඇතුළත් කර තිබුණු අතර ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.32,791,686 කින් වැඩියෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව කුලී හා වැඩ අත්තිකාරම් නිවැරදිව ගිණුම්ගත කල යුතු වීම. | 2016.08.03 දිනැති අංක 2016/250(i) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් මත ඉහත ක්‍රමවේදය අනුගමනය කළ බව දන්වා ඇත. | කාලීන උපදෙස් සැලකිල්ලට ගෙන ගිණුම් සකස් කර නොතිබුණි. |
| 16. | දෙපාර්තමේන්තුවට අයත් ස්ථාන 09 ක ක්‍රීඩාංගන සහ නේවාසිකාගාර ස්ථාපිත කර ඇති අතර මෙම වත්කම් 2020 වර්ෂයේදි ගිණුම් ගතකර නොතිබුණි. | මෙම වත්කම් අදාළ වත්කම් ලේඛනයන්හි ගිණුම් ගත කිරීමට ක්‍රියාකල යුතු වීම | පහත පරිදි පිළිතරු දන්වා ඇත.<br>01. සඳහන් කර ඇති ස්ථාන 9 න් 119/94, කුවින් එලිසබෙත් ක්‍රීඩා පිටිය, නුවරඑළිය ඉඩම හා සංචාරක බංගලාව හා බෙලිඅත්ත ක්‍රීඩාංගනය හා ගොඩනැගිලි යන ස්ථාන 2 තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් වේ.<br>02. වරිපනම් අංක 281/50 බෞද්ධාලෝක මාවතේ පිහිටි ඉඩම හඳුනාගත නොහැකි වීම හේතුවෙන් වරිපනම් ගෙවීම | තක්සේරු කිරීම් හා පවරා ගැනීම් සිදුකර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නතර කර ඇත. ඒ අනුව ඉතිරි ඉඩම් හා ගොඩනැගිලි 06 පවරාගැනීමට අදාළ තක්සේරු කටයුතු අවසන්ව නොමැත. | |
| 19. | ගලේවෙල දිස්ත්‍රික් මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම<br>මෙම ක්‍රීඩාංගනයේ සංවර්ධනය කිරීමේ කටයුතු රු.11,008,947 (බදු රහිත) අගයකට ඉඩම් හා ගොඩ කිරීම් හා සංවර්ධනය කිරීමේ සමාගම වෙත 2014 වර්ෂයේ ප්‍රදානය කර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.2,464,884 ක් ගෙවා තිබුණි. එම ආයතනය විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර අත්තිකාරම් මුදල් මාස 18-23 අතර කාලයක් අත රඳවාගෙන නැවත පියවීමට කටයුතු කර තිබුණි. | ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු කලමනාකරණය සහ නියාමනය සිදු කළ යුතුය. | ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම මගින් සිදු කරනු ලැබූ ව්‍යාපෘතියක් වන අතර මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සංවර්ධන ව්‍යාපෘතියේ බිල්පත් මගින් මෙම මුදල් පියවීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | උපදෙස් ලබාදී ඇතත් කොන්ත්‍රාත් පරිපාලන කටයුතු විධිමත් පරිදි සිදුකිරීමට පියවර ගෙන නොතිබුණි |
| 20. | ඉංජිනේරුමය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) මගින් ව්‍යාපෘති සඳහා රු.16,039,750 ක් වූ ඇස්තමේන්තුවක් පිළියෙල කර 2016 වර්ෂයේදී තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරනු වෙනුවට වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය අනුගමනය කර රු.14,831,000 අගයකට පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.2,966,200 ක් 2016 වර්ෂයේදී ගෙවා තිබුණි. | රාජ්‍ය මුදල් කාර්යක්ෂමව කළමනාකරණයට කටයුතු කළ යුතු වීම. | ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බවත් වර්තමානයේදී ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කරනු ලබන බවත් දන්වා ඇත. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදුකර නොතිබුණි. |

ශීර්ෂ 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 77 වන වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද වෛද්‍ය කර්මයේ හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ කාර්යයන් සඳහා යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කිරීම, විකිණීම, සැපයීම, බෙදා හැරීම හෝ පිළියෙල කිරීම තහනම් කිරීමට, විධිමත් කිරීමට හෝ පාලනය කිරීමට අවශ්‍ය නියෝග පැනවීම සඳහා නීති සංග්‍රහයක් පිළියෙල කළ යුතුය. 2012 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පනවන ලද නියෝගයක් මත නීති සංග්‍රහය පිළියෙල කිරීම ආරම්භ කර 2017, 2018 වර්ෂයන්හිදී ඒ සඳහා රු.564,580 ක් වැය කර තිබුණද එම නීති සංග්‍රහය පිළියෙල කර නීතිගත කිරීමට අපොහොසත්වී තිබුණි. | 1961 අංක 31 දරන ආයුර්වේද ආයුර්වේද පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අංක 226/2012 දරන ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වන මූලික අයිතිවාසිකම් නඩුවේ නියෝගය ප්‍රකාරව 2013 වර්ෂයේ පත්කළ කමිටුව විසින් නීති සංග්‍රහය කෙටුම්පත් කර දෙපාර්තමේන්තුව වෙත භාරදී නොමැති බව හා 2018 වර්ෂයේදී මේ සඳහා පත්කළ නව කමිටුව කෙටුම්පත් කළ නීති සංග්‍රහය විශේෂඥ කමිටුවක් මඟින් සමාලෝචනය කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් නීති සංග්‍රහය පිළියෙල කර නීතිගත කිරීමට අපොහොසත්වී තිබුණි. |
| 2. | ක්ෂේත්‍ර 6 ක් යටතේ පුහුණු වැඩසටහන් සැලසුම්කර මධ්‍යම රජයේ, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල දීප ව්‍යාප්තව සේවයේ නියුක්ත ආයුර්වේද ක්ෂේත්‍රයේ නිලධාරීන්ට පුහුණුවීම් ලබාදීමේ අරමුණින් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය ස්ථාපිත කර තිබුණද දීපව්‍යාප්තව ආයුර්වේද ක්ෂේත්‍රයේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් පරිගණක දත්ත පද්ධතියක් ස්ථාපිත කර පවත්වා නොතිබීම හේතුවෙන් විධිමත් සැලැස්මකට අනුව නිලධාරීන්ව | පුහුණුවීම් ලබාදීමට නියමිත නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් පරිගණක දත්ත පද්ධතියක් ස්ථාපිත කර විධිමත් සැලසුමකට අනුව පුහුණුවීම් පවත්වා රෝගී සත්කාරක සේවාවන්හි ගුණාත්මකභාවය වර්ධනය කළ යුතුය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2022 ජනවාරි 31 දින වන විටත් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ කටයුතු විධිමත් කිරීම සඳහා පරිගණක පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පුහුණුවීම්වලට කැඳවීම වෙනුවට ආයතන ප්‍රධානීන්ගේ අභිමතය පරිදි නිලධාරීන්ගේ නම් පුහුණුවීම් සඳහා යොමුකර තිබුණි. | | | |
| 3. | ආනයනික ඖෂධ වර්ග 886 ක් සඳහා ආනයන බලපත්‍රද, දේශීය ඖෂධ වර්ග 892 ක් මෙරට නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍රද, 2018 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණි. මෙහිදී බලපත්‍ර නිකුත්කර තිබුණු ඖෂධ වර්ග ඖෂධ නාමය සහිතව ලේඛනගත කර නොතිබුණු අතර, සූත්‍ර කමිටු අනුමැතියකින් තොරව ඖෂධ ආනයනික බලපත්‍ර නිකුත් කර තිබුණු අවස්ථා විය. ආනයනික හා දේශීය ඖෂධ වර්ග සඳහා බලපත්‍ර නිකුත් කිරීමට පෙර සිදුකළ යුතු තාක්ෂණික පරීක්ෂාවන් දෙපාර්තමේන්තුව විසින් සෘජුවම කාර්මික තාක්ෂණ ආයතනය (ITI) වෙතින් සිදුකර නොතිබුණු අතර බලපත්‍ර අයදුම්කරු විසින් කාර්මික තාක්ෂණ ආයතනය (ITI) වෙතින් එම පරීක්ෂාවන් සිදුකර ගෙන ඉදිරිපත් කරන සහතික මත බලපත්‍ර නිකුත් කර තිබුණි. | ඖෂධ වර්ග ඖෂධ භාණ්ඩය යටතේ ලියාපදිංචි කිරීමටත්, සූත්‍ර කමිටු අනුමැතියකින් තොරව ඖෂධ ආනයන බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පරීක්ෂණ පවත්වා අදාළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2022 ජනවාරි 31 දින වන විටත් නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| 4. | රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී මනා පුහුණුවක් ලද ආයුර්වේද වෛද්‍යවරයාට ආයුර්වේද ප්‍රතිකාර පද්ධතිය තුළ බොහෝ කාර්යභාරයක් පැවරෙන බැවින් එම කාර්යභාරය වෙනත් අයෙකුට පැවරිය නොහැකි නමුත් ආයුර්වේද ප්‍රතිකාර පද්ධතියේ බොහෝ කොටස් ආයුර්වේද වෛද්‍යවරුන් විසින් කනිෂ්ඨ කාර්යය මණ්ඩලය වෙත පවරා තිබුණි. එම තත්ත්වය | ආයුර්වේද වෛද්‍යවරයා, හෙද නිලධාරී,සම්බාහනකරු, උපස්ථායක යනාදී වූ කාර්ය මණ්ඩලය වෙත පැවරෙන කාර්යභාරය සමාලෝචනය කර ආයුර්වේද වෛද්‍යවරුන් හා අනෙකුත් කාර්යය මණ්ඩලය අතර | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2022 ජනවාරි 31 දින වන විටත් තත්ත්වය වෙනස් වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හේතුවෙන් ආයුර්වේද ප්‍රතිකාර පද්ධතිය බටහිර වෛද්‍ය ප්‍රතිකාර ස්වරූපයක් ගෙන තිබුණු අතර රෝහල්වලට අනුයුක්ත පාරම්පරික විශේෂ වෛද්‍යවරුන් විසින්ම ආයුර්වේද ප්‍රතිකාර පද්ධතියේ සියළුම කොටස් ඉටු කරන බැවින් රෝගීන් ඒ කෙරෙහි ආකර්ශනයවීමේ ප්‍රවණතාවයක් පැවතුණි. | කාර්යයභාරයන් පැවරිය යුතුය. | | |
| 5. | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය අනුව ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ ශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් පවත්වා ගෙන යාමට ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි. කෙසේ වෙතත්, දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නියෝගයක් පදනම් කරගෙන ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන 15 ක් හා හෝටල් තුළ ස්ථාපිත පංචකර්ම ආයතන 26 ක් ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි. | පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ඇතිකිරීම සඳහා කටයුතු කළ යුතුය. | දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නියෝගය මත සංචාරක මණ්ඩලයේ අනුමැතියලත් හෝටල් සහ අනිකුත් සංචාරක ආකර්ශන ආයතන සඳහා පමණක් ලියාපදිංචිය ලබාදීම අනුමත කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ආයුර්වේද පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 6. | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පෞද්ගලික අංශයේ ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, පංචකර්ම ආයතන, ආයුර්වේද රෝහල්, නිෂ්පාදනාගාර හා වෙළඳසැල් සම්බන්ධයෙන්ද, ආනයනික හා දේශීය ඖෂධ සඳහා නව ලියාපදිංචි කිරීම් හා ඒවා අළුත් | ශිල්පීය අංශයේ ලියාපදිංචි කිරීම්, බලපත්‍ර නිකුත් කිරීම් යනාදී කාර්යයන්ට අදාළ සියළු තොරතුරු ඇතුළත් වන පරිදි මනා අභ්‍යන්තර පාලනයකින් යුක්ත පරිගණක | ශිල්පීය අංශයට පරිගණක දත්ත පද්ධතියක් සකස් කළ යුතු වුවද, දැනට පවතින මානව හා භෞතික සම්පත් ප්‍රමාණය ඒ සඳහා ප්‍රමාණවත් නොවන | 2022 ජනවාරි 31 දින වන විටත් ඊට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම් සම්බන්ධයෙන්ද, පරිගණක දත්ත පද්ධතියක් ස්ථාපිත කර පවත්වා ගැනීමට 2020 සැප්තැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණු අතර මාර්ගගත ක්‍රමයට (Online) ලියාපදිංචි අයදුම්පත් ලබා ගැනීම වැනි ක්‍රමවේදයන් හඳුන්වා දීමටද කටයුතු කර නොතිබුණි. | පද්ධතියක් ස්ථාපිත කර පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. | බව හා ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | |
| 7. | 1962 වර්ෂයේදී නාවින්න ආයුර්වේද පර්යේෂණ රෝහල ස්ථාපිත කිරීමෙන් පසුව 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී තවත් ආයුර්වේද පර්යේෂණ රෝහල් 04 ක් ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද, එම රෝහල්වලින් රෝග පිළිබඳව පර්යේෂණ සිදු කරන බවට හෝ සිදුකරන ලද පර්යේෂණවලින් ලද නව සොයා ගැනීම් පිළිබඳව හා ඒ පිළිබඳ මහජනයා දැනුවත් කිරීම්වලට අදාළ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. තවද පර්යේෂණයක් සිදු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය හා ඒ පිළිබඳ නිශ්චිත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ ක්‍රමවේදය හා ඒ පිළිබඳ නිශ්චිත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. පර්යේෂණ පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. නව සොයාගැනීම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් පිළියෙල කළ යුතුය. | තොරතුරු ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අදාළ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර පර්යේෂණයක් සිදු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය හා ඒ පිළිබඳ නිශ්චිත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 8. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2021 ඔක්තෝබර් 15 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍යා | සියළුම යන්ත්‍ර ඵලදායි ලෙස උපයෝජනය කිරීමට හෝ ආයුර්වේද රෝහල්වල හෝ ආයුර්වේද සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා ලබාදීමට කටයුතු කළ යුතු අතර මෙම අක්‍රමිකතාවයට දායක වූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍යා | නාවින්න පර්යේෂණායතනයේ පවතින යන්ත්‍ර හා උපකරණ පිළිබඳව විශේෂඥ කමිටුවක් මඟින් පරීක්ෂණයක් සිදුකර මේ සම්බන්ධයෙන් ඉදිරිකටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බැවින් ඒ අනුව | මේ සම්බන්ධයෙන් පත්කර තිබුණු කමිටුව විසින් මැෂින් 2 ක් කෛයිතඩි රෝහලට පැවරීමටත්, 6 ක් අලුත්වැඩියා කිරීමටත්, 4 ක් වෙනත් ආයතනයකට |

| | | | | |
|---|---|---|---|---|
| | නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු.28,342,712 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය. | පියවර ගත යුතුය. | ඉදිරි කටයුතු කරන බව. | ලබා දීමටත් හා 2 ක් ස්ථාපිත කිරීමටත් නිර්දේශ කර තිබුණි. 2022 ජනවාරි 31 දින වන විටත් අදාළ කමිටු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 9. | බොරැල්ල ආයුර්වේද රෝහලේ ඇඳන් 434 ක් ස්ථාපිත කළ හැකි මහල් 07 කින් යුක්ත නව ගොඩනැගිල්ල රු.මිලියන 1,164.13 ක් වැය කරමින් ඉදිකර 2018 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි. නමුත් ඉදිකිරීමේ සැලසුම්වලට හා ඉංජිනේරු ඇස්තමේන්තුවට ප්‍රධාන ජල ටැංකියක් (Water Sump) හා පල්දෝරු පද්ධතියක් ඇතුළත් කර නොතිබුණි. මුළු පිරිවැය රු.මිලියන 7.37 ක් වූ රූපවාහිනි යන්ත්‍ර 200ක්, වතුර රත් කරන ගීසර් (Water Geezers) 108 ක් හා වායු සමීකරණ යන්ත්‍ර 166 ක් සවිකර තිබුණු නමුත් ඒවායේ වගකීම් කාලය ඉකුත්වන තෙක්ම ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකිව තිබුණි. | අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන සැලැසුම් නිර්මාණය කළ යුතුය. එසේ නොකර, කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසු අවශ්‍යතා හඳුනා ගැනීම තුළ රජයට දැරීමට සිදුවන අධික වියදම සඳහා වූ වගකීම් අදාළ නිලධාරීන් වෙත පැවරිය යුතුය. | ප්‍රධාන ජල ටැංකියක් (Water Sump) හා පල්දෝරු පද්ධතියක් ඉදිකිරීම සඳහා කැබිනට් අනුමැතියක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අදාළ ගොඩනැගිල්ල රෝහලේ භාවිතය සඳහා යොදා ගෙන නොතිබුණි. |
| 10. | දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළුම අංශවල, උප ආයතනවල සහ රෝහල් හා ඖසු උයන්වලට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක | අදාළ ක්‍රියාකාරකම් සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය. | කාර්ය සාධන දර්ශක පිහිටුවීම සඳහා මේ වන විට පත් කර ඇති කමිටුවේ වාර්තාව හැකි ඉක්මණින් | 2022 ජනවාරි 31 දින වන විටත් කාර්ය සාධන දර්ශක පිහිටුවා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පිහිටුවා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කර නොතිබුණි. | | ලබාගෙන ඉදිරි කටයුතු කරන බව. | |
| 11. | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය මත ව්‍යාපෘති ඇගයීමක් සිදු කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වුවද, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.මිලියන 608 ක් වැය කර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු රු.මිලියන 142.71 ක ප්‍රතිපාදනවලින් නිලධාරීන් 225 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 133.72 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 4.14 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 138 ක් වැයකර තිබුණි. | අමාත්‍යය මණ්ඩල පත්රිකාව ප්‍රකාරව අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අමාත්‍යය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 12. | 2019 මාර්තු 28 දිනැති අංක PS/PCMD/C/13/2019 දරන ජනාධිපති චක්‍රලේඛය අනුව බොරැල්ල ආයුර්වේද රෝහලේ ජලය හා විදුලිය පරිහරණය කරන අලෙවි සැල් 4 කට හා 2017 ජුනි 02 දින සිට පවත්වාගෙන යනු ලබන කොළඹ විශ්වවිද්‍යාලයය යටතේ පවතින දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට වෙන් වෙන්ව ජල හා විදුලි මීටර් සවිකර | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2022 ජනවාරි 31 දින වන විටත් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණු අතර පාරිභෝජනය කරන ජලය හා විදුලිය වෙනුවෙන් රු. 13,013,556 ක මුදලක් අයකර නොතිබුණි. චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, විදුලිය සංරක්ෂණය සඳහා මෙන්ම ජලය හා විදුලිය භාවිතය කාර්යක්ෂම කිරීම සඳහා කමිටුවක් පත්කර නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම චක්‍රලේඛ විධිවිධාන පිළිබඳව පසුවිපරම් කිරීමටද කටයුතු කර නොතිබුණි. | | | |
| 13. | මැදවච්චිය වකුගඩු රෝහල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු මුදල රු. 85,372,218 ක් 2014 වර්ෂයේදී රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත යවා තිබුණි. ඉදිකිරීම් අවසාන කිරීමෙන් පසු අතිරික්ත මිලදී ගැනීම් හේතුවෙන් ඉතිරි වූ රු.1,683,644 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය 2019 දෙසැම්බර් මාසයේදී දෙපාර්තමේන්තුව විසින් භාරගෙන තිබුණු අතර ඉතිරිව තිබුණු වානේ කම්බි, වටිනා ලී වර්ග ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය රැසක් අනාරක්ෂිතව, අක්‍රමවත්ව හා නිෂ්කාර්යව වර්ෂයකට අධික කාලයක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගොඩගසා තිබුණි. | තාක්ෂණික දැනුම සහිත පුද්ගලයින් මගින් පිළියෙල කරන විධිමත් පිරිවැය ඇස්තමේන්තුවලට අනුකූලව අවශ්‍යතාවය අනුව පමණක් ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගත යුතුය . රජයට සිදුවන අලාභය අවම වන ආකාරයට සහ විනිවිද පෙනෙන ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුව නිෂ්කාර්ය වත්කම් බැහැර කිරීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව ප්‍රධාන ගණකාධිකාරී විසින් කිහිප අවස්ථාවකම මෙම ගොඩනැගිලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීමට උත්සාහයක් ගෙන තිබුණද අමාත්‍යාංශ ලේකම්ගේ මැදිහත්වීම මත එම වෙන්දේසිය නවතා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අදාළ ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්කාර්යව විනාශ වෙමින් පැවතුණි. |
| 14. | 2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) ඡේදය ප්‍රකාරව වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේදී ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකළ නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා නොකළ බැවින් | 2022 ජනවාරි 31 දින වන විටත් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් |

| | | | | |
|---|---|---|---|---|
| | යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් 2020 වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණු මුළු මුදල හා අදාළ බැරකම්වල එකතුව රු.56,045,639 ක් විය. | | දෙපාර්තමේන්තුව තුළද ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කිරීම අවශ්‍ය නොවන බව අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බව. | පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සිදුකරමින් පැවතුණි. |

ශීර්ෂ 221 - කම්කරු දෙපාර්තමේන්තුව

| **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| 1. 2011අප්‍රේල් 29 දිනැති අංක 06/2011 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයේ ලැබී තිබූ මහජන පැමිණිලි 24,972 කින් විභාග නොකළ පැමිණිලි ගණන, 10,064 ක් හෙවත් මුළු පැමිණිලිවලින් සියයට 40 ක් විය. | මහජනතාවගේ දුක්ගැනවිලි හා පැමිණිලි විසඳීම සඳහා ඵලදායී හා කාර්යක්ෂම ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව අනුගමනය කල යුතුවීම. | නිලධාරී හිඟය හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති බැවින් එම තත්ත්වය අවම කර ගැනීමට නිලධාරීන් 176 ක් බඳවා ගෙන ඇත. අනෙක් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. | යාවත්කාලීනව පැමිණිලි විසඳීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ගොඩනගා නොතිබුණි. |
| 2. සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ සහ නව සාමාජික අංක ලබාදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.11,000,000 ක් වෙන්කරවාගෙන තිබුණද වර්ෂය තුළ කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණු අතර ප්‍රතිපාදිත සම්පූර්ණ මුදලම වෙනත් වැය | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ගේ ඇඟිලි සලකුණු හා ඡායාරූප ලබා ගැනීමේ ව්‍යාපෘතිය බාහිර ආයතනයක් ලවා සිදු කරවා ගැනීමට අපේක්ෂා කළද ඉදිරිපත් වූ ආයතන සීමා සහිත වීම හා මිල ගණන් දෙපාර්තමේන්තු ඇස්තමේන්තු සමග | සැලසුම් කර තිබූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| විෂයන්ට මාරු කරගෙන තිබුණි. | | නොගැලපීම නිසා ප්‍රසම්පාදන කටයුතු සංකීර්ණ වීම හේතුවෙන් සේවා සැපයීම සඳහා බාහිර ආයතනයක් ලබා ගැනීමට නොහැකි වූ බැවින් මෙම ව්‍යාපෘතිය දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය යොදා ගෙන ආරම්භ කිරීමට තීරණය කරන ලදී.<br>එහෙත් මෙම කාර්යය දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය වෙත පවරන ලද අමතර රාජකාරියක් වන බැවින් බලාපොරොත්තු වූ ආකාරයෙන් ව්‍යාපෘතියේ කටයුතු සිදු කර ගැනීමට හැකියාවක් නොලැබුනි.<br>බාහිර ආයතනයක් වෙනුවට දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය යොදවා ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවූ බැවින් ඒ සඳහා වෙන් කරන ලද රු.11,000,000ක මුදල ඉතිරි වී ඇත. | |

| | | | |
|---|---|---|---|
| 3. පෞද්ගලික ආයතන විසින් සේවක වන්දි ගෙවීම් සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් නමට තැන්පත් කරන ලද එහෙත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නොගෙවා පැවති වන්දි මුදල් ශේෂය රු. 69,466,119 ක් විය. එයින් වර්ෂ එකකට වඩා වැඩි කාලයක සිට ගෙවිය යුතු වන්දි ශේෂය රු. 53,284,103 ක් විය. | අදාල වන්දි ප්‍රතිලාභියාට කාර්යක්ෂමව හා කාලීනව ලැබෙන ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාත්මක කළ යුතු වීම | කාබුල් ලංකා ආයතනයේ සේවකයින්ට ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය රු.32,804,684.97 ක් වන අතර, එය ගෙවිය හැකි වන්නේ කාබුල් ලංකා නිවාසවල පදිංචි වී සිටින අදාල සේවකයින් ඔවුන් පදිංචි නිවාසවල යතුරු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත භාර දී ඒ බව කම්කරු කොමසාරිස් ජනරාල් වෙත ලිඛිතව දැනුම් දීමෙන් පසුවය. රු.36,085,784 ක් වන අනෙකුත් වන්දි මුදල් හිමි සමහර සේවකයින්ගේ පදිංචි ලිපිනයන් වෙනස් වී තිබීම, රික්විසිෂන් පත්‍රවල සහ ඒවා හිමි පුද්ගලයින් ඉදිරිපත් කරන තොරතුරු අතර නොගැලපීම් නිසා ඇති වන අඩුපාඩු හා වන්දි හිමි සේවකයින් විදේශගත වීම යන හේතු නිසා ගෙවීමට නොහැකි වී ඇත. | එම ගැටළු නිරාකරණය කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබූ බැවින් 2022 ජනවාරි වන විටත් ඒවා නිරවුල් කර නොතිබුණි. |
| 4. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ නියුතුව සිටි සේවකයින් වෙත සේවක අර්ථසාධක පාරිතෝෂික ආදිය නොගෙවීම නිසා | සේවක අර්ථසාධක හා පාරිතෝෂික මුදල් අදාල ප්‍රතිලාභියාට කාර්යක්ෂමව හා කාලීනව ලැබෙන ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාත්මක කළ යුතු | 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පවතින රු.61,417,009 ක් වන ශේෂය ගෙවීම සඳහා රික්විෂන් පත්‍ර ඉදිරිපත් නොවන අතර එම මුදල ශ්‍රී ලංගමය වෙත | මේ දක්වාම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමඟ සාකච්ඡා කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| මණ්ඩලයෙන් අයකර ගෙන තිබූ නමුත් නොගෙවා 2018 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබූ ශේෂය රු.66,762,658 ක් විය. මෙම මුදලින් රු.62,021,189 ක් අයකරගෙන වර්ෂ 05 කට වැඩි කාලයක් ගතවී තිබුණද, 2018 වර්ෂය තුළදී කිසිදු මුදලක් සේවකයන් වෙත ගෙවා නොතිබුණි. | වීම. | යැවිය හැකි වන්නේ සියලුම පාරිතෝෂික හිමියන් වෙත අදාල පාරිතෝෂික ගෙවා ඉතිරියක් ඇත්නම් පමණි. තව දුරටත් පාරිතෝෂික ගෙවිය යුතු නිලධාරින්ගේ නාම ලේඛන දිස්ත්‍රික් කාර්යාල වෙතින් ලබා ගෙන ශ්‍රී ලංගමයේ එකගතාවය ලබාගැනීමට කාර්මික සබඳතා අංශය අදාල කාර්යයන් සිදු කරමින් පවතී. | |
| 5. නඩු 181 කට අදාලව සේවායන් විසින් අධිකරණයේ තැන්පත් කරන ලද රු.93,092,779 ක් අදාල සේවකයන් වෙත ගෙවීම සඳහා කම්කරු කාර්යාලය විසින් සකස් කරන ලද "සී" වාර්තාවල හා රික්වේෂන් පත්‍රවල පවතින විවිධ දුර්වලතා නිසා ගෙවීම් කිරීමට නොහැකිවී තිබුණි. | අධිකරණය මගින් අයකරගත් මුදල් කඩිනමින් අදාල ප්‍රතිලාභීන්ට ලබාදීමට කටයුතු කළ යුතු වීම. | "සී" වාර්තාවල පවතින විවිධ අඩුපාඩු හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල් කේවල ගිණුම්ගත කිරීමට නොහැකිව පවතින අතර, බොහෝමයක් "සී" වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුවට යොමු කිරීමෙන් පසු විවිධ අඩුපාඩු හේතුවෙන් ආපසු එවනු ලැබූ ඒවා වන අතර, අදාල දිස්ත්‍රික් කාර්යාල වලට යොමු කර ඒවායේ පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබයි. රික්විසිෂන්හි දුර්වලතා මත ගෙවීම් කිරීමට නොහැකි වූ අවස්ථා වාර්තා වී නැත. | කොටසක් නිරවුල් කර ඇතත් කාර්යක්ෂම සේවයක් සඳහා වැඩ පිළිවෙලක් ගොඩ නගා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| 6. උසාවි තීරණයන් අනුව ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැර කල යුතු නමුත් 'සී' වාර්තාවල අඩුපාඩු නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එසේ බැර කිරීමට නොහැකිව දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල රඳවාගෙන තිබූ මුදල රු.43,691,239 ක් විය. | අධිකරණය මගින් අයකරගත් මුදල් කඩිනමින් අදාල ප්‍රතිලාභීන්ට ලබදීමට කටයුතු කළ යුතු වීම. | උසාවි තීරණයන් ලබා අධිකරණය මගින් මුදල් අය වීමෙන් පසු සී වාර්තා සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීම දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා සේ.අ.අ. අංශය මගින් සිදු කරනු ලබයි. එසේ යොමු කරන සී වාර්තාවලද විවිධ අඩුපාඩු මත ආපසු හරවා එවන අතර බොහෝ ආයතන වැසී ගොස් ඇති බැවින් සී වාර්තා සකස් කර ගැනීමේ ප්‍රායෝගික ගැටලු ඇති වේ. මෙසේ සී වාර්තා සකස් කළ නොහැකි වීමෙන් විශාල මුදල් ප්‍රමාණයක් කම්කරු කොමසාරිස් ගිණුමේ පවතින අතර වර්තමානයේ දී ක්‍රියාත්මක වන සමානුපාතික ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදය නිසා අලුතින් එකතු වන නඩුවල මෙවැනි තත්ත්වයක් උද්ගත වීම සාපේක්ෂව අඩු මට්ටමක පවතී. | පවතින ක්‍රමවේදය අනුව සී වාර්තාවල අඩුපාඩු නිසා හා ආයතන වසා දැමීමෙන් තොරතුරු රැස්කිරීමේ අපහසුතා නිසා ගෙවීම් කටයුතු යාවත්කාලීනව සිදු නොවන බව. |
| 7. 2018 වර්ෂය තුල තීරණයන් ලද උසාවි නඩු 4,207 කට අදාලව රු.425,532,833 ක් එම | උසාවි තීරණ මත ලබාදෙන ප්‍රතිලාභ අදාල පුද්ගලයින්ට වහාම ලබාදීමට | නඩුවලින් අය කර ගන්නා දායක මුදල්වලට අදාල සී වාර්තාවල අඩුපාඩු | යම් නඩුවකට අදාලව අධිකරණ නියෝගය (තීරණය) ලැබීම මත පමණක් එකී නඩුවට අදාල සම්පූර්ණ මුදල අය වී නඩු |

| | | | |
|---|---|---|---|
| ප්‍රතිලාභ ලැබිය යුතු පුද්ගලයන්ට වර්ෂය අවසන් වන විටත් ලබාදී නොතිබුණි. | කටයුතු කළ යුතු වීම. | මත මෙවැනි තත්ත්වයක් ඇති වේ. කළමනාකරණ සහකාර නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. | කටයුත්ත අවසන් වූවා සේ සැලකිය නොහැකි අතර නඩුගත මුදලෙහි විශාලත්වය අනුව එකී මුළු මුදලම අය කර ගැනීම සඳහා අධිකරණය විසින් ලබා දෙන වාරික ප්‍රමාණය තීරණය විය හැකිය. වර්තමානයේ ක්‍රියාත්මක වන "දායක මුදල් සමානුපාතිකව ගිණුම්ගත කිරීමේ ක්‍රමය" යටතේ අධිකරණයෙන් අය කර ගනු ලබන පළමු වාරිකයේ සිටම දායක මුදල් සාමාජික ගිණුම් වෙත සමානුපාතිකව බැර කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීම සිදු කරනු ලබන බැවින් ප්‍රමාදයකින් තොරව අදාල මුදල් ගිණුම් ගත වීම සිදු වේ. එහෙත් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ සාමාජිකයන් වෙත නිදහස් කිරීම සේ.අ.අ. පනතෙහි සඳහන් කොන්දේසි අනුව සහ සාමාජිකයා විසින් අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පමණක් සිදු කල හැකිය. |
| 8. 2018 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රිය නඩු සංඛ්‍යාව 4,921 ක් වූ අතර එම නඩු මත අයකර ගතයුතු වටිනාකම රු. 1,547,622,904 ක් විය. ඉන් වර්ෂ 05 ට වැඩි නඩු ගොනු 3,186 ක් වූ අතර එය සමස්ථ සංඛ්‍යාවෙන් සියයට 65 ක් විය. තවද විවෘත වරෙන්තු නිකුත් කරන ලද නඩු ගොනු 2,994 | දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන් නිසා සිදුවන නීතිමය ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | එම නඩු සම්බන්ධයෙන් දිවයිනේ කම්කරු කාර්යාලවල දැනට අක්‍රීය හා විවෘත වරෙන්තුව ඇති නඩු සක්‍රීය කර සේවකයින්හට අය විය යුතු ව්‍යවස්ථාපිත මුදල් අය කර දීම සඳහා පහත ක්‍රියා මාර්ග නීති ක්‍රියා අංශය මගින් ආරම්භ කර ඇත. | අක්‍රිය හා විවෘත වරෙන්තු නඩු සම්බන්ධයෙන් පහත වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>01. ඉදිරි පියවර ගැනීම සඳහා උපදෙස් ලබාදෙමින් 2019.06.14 දිනට සියළුම කලාප කාර්යාල භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස් වරුන්වෙත ලිපියක් මගින් දැනුවත් කර ඇත.<br>02. විවෘත වරෙන්තු ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා |

| | | | |
|---|---|---|---|
| ක් වූ අතර එහි වටිනාකම රු.933,751,835 ක් විය. එයින් වර්ෂ 05 ට වැඩි නඩු ගොනු 2,047 ක් වූ අතර එය සමස්ථ සංඛ්‍යාවෙන් සියයට 68 ක් විය. | | I. කලාප කම්කරු කාර්යාලවලට අනුයුක්ත කර ඇති නීති නිලධාරීන් මගින් එම කලාපයේ පිහිටි සියළුම දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල දැනට අක්‍රීය තත්ත්වයේ හා විවෘත වරෙන්තු වී ඇති නඩු ගොනු පරීක්ෂා කරවා සක්‍රීය කිරීමට අදාල නිර්දේශ ලබා දී අදාල නිර්දේශ සහකාර කම්කරු කොමසාරිස්ට, ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීට ලබා දී සක්‍රීය කිරීමට පියවර ගෙන ඒ පිළිබඳව පසු විපරම් කිරීම.<br>II. දිවයිනේ පිහිටි කම්කරු කාර්යාල මගින් සියළු අවශ්‍ය පියවර ගෙන කෙසේවත් සක්‍රීය කිරීමට නොහැකි වූ බවට නිර්දේශ කර නීති ක්‍රියා අංශයට යොමු කරන ලද නඩු නැවත සක්‍රීය කිරීමට ගත හැකි යම් පියවරක් තිබේද යන්න | අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් දන්වමින් 2021.07.12 හා 2022.01.21 දිනැතිව සියළුම කලාප භාර කම්කරු කොමසාරිස් වරුන් වෙත උපදෙස් ලබාදී ඇත.<br>03. විදේශගත සේවා යෝජකයින් සම්බන්ඳයෙන් විවෘත වරෙන්තු නිකුත් කර ඇති විට ගුවන් තොටුපොල පොලීසිය දැනුවත් කිරීම හා ලිපින ඇති අවස්තා වලදී විදේශයට සිතාසි යොමු කිරීමට කටයුතු කිරීම.<br>04. විවෘත වරෙන්තු නියෝජ්‍ය පොලිස්පති හරහා ක්‍රියාත්මක කරවා ගැනීමට කටයුතු කරමින් පවතී<br>05. තවද දැනට කම්කරු කාර්යාල වල එකම ආකෘතියක් යටතේ සියළුම නඩු ගොනු ඇතුලත් කිරීමටත් ඒවා යාවත්කාලීන කිරීමේ වැඩපිළිවෙල තුලින් නිවැරදි දත්තයන් ලබා ගැනීමටත් හැකිවන ලෙස නව ආකෘතියක් හඳුන්වා දෙමින් සියළුම නඩු කටයුතු සිදු කරනු ලබන කළමනාකාර නිලධාරීන් වෙත පුහුණුවක් ලබා දීමට සැලසුම් කර ඇත.<br>06. නිවැරදි දත්ත හා තොරතුරු කඩිනමින් ලබාගැනීමට හැකි වන පරිදි මෘදු කාංගයන් හඳුන්වා දීමටද අදහස් කර ඇත.<br>07. 2022.02.25 දින වන විට 2021.01.01 දින සිට 2021.12.31 දක්වා ලැබී ඇති විවෘත වරෙන්තු හා අක්‍රිය නඩු |

<table>
<tr>
<td></td>
<td></td>
<td>පරීක්ෂා කිරීම.<br>III. මෙසේ පරීක්ෂා කරන ලද නඩුවලින් සක්‍රීය කිරීමට හදුනාගත් නඩු සක්‍රීය කිරීමට අවශ්‍ය මූලික උපදෙස් ලබා දීම.<br>IV. කිසිම ආකාරයකින් සක්‍රීය කිරීමට නොහැකි නඩු හදුනා ගෙන එම නඩු පිළිබඳව වාර්තාවක් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත ලබා දී, එම නඩු දෙපාර්තමේන්තු ලේඛනවලින් ඉවත් කිරීම සදහා අවශ්‍ය උපදෙස් කම්කරු කොමසාරිස් ජනරාල් මගින් ලබා ගැනීම.</td>
<td>පිළිබඳ තොරතුරු.
<table>
<tr><th colspan="2">අක්‍රිය නඩු</th><th colspan="2">විවෘත වරෙන්තු</th></tr>
<tr><th>අක්‍රිය නඩු සංඛ්‍යාව</th><th>වටිනාකම රු.</th><th>විවෘත වරෙන්තු සංඛ්‍යාව</th><th>වටිනාකම රු.</th></tr>
<tr><td>979</td><td>642866806</td><td>1209</td><td>461975206</td></tr>
</table>
</td>
</tr>
<tr>
<td>9. පොදු තැන්පත් ගිණුමේ පවත්නා කේවල දායක ගිණුම්වලට බැරකල යුතු සේවක අර්ථසාධක අරමුදල් ශේෂයෙන් 2019 ජුනි 30 දින වන විට රු.මිලියන 600 ක් නිරවුල් කිරීමට සැලසුම් කර තිබුණද රු.මිලියන 189 ක් පමණක් නිරවුල් කර තිබුණි. මේ නිසා පොදු තැන්පත් ගිණුමේ වර්ෂය තුල නිරවුල්</td>
<td>පොදු තැන්පතු ගිණුමේ පවත්නා ශේෂ හදුනාගෙන පුද්ගලික ගිණුම්වලට අප්‍රමාදව බැර කිරීමට කටයුතු කල යුතු වීම.</td>
<td>අදහස දක්වා නොමැත.</td>
<td>“පොදු තැන්පත්” ගිණුමේ ශේෂය 2022.01.31 දිනට රු.278,927,841 ක් වන අතර එයින් 2019.12.31 වන විට වසර පහකට වැඩිව තිබූ ශේෂයෙන් දැනට ඉතිරිව ඇති ශේෂය රු.7,689,806 ක් පමණක් වේ.</td>
</tr>
</table>

| | | | |
|---|---|---|---|
| කිරීමේ ප්‍රගතිය සියයට 31 ක් පමණක් විය. 2019 දෙසැම්බර් 31 දින වන විට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 793 ක් වූ අතර ඉන් වර්ෂ 05 ට වැඩි ශේෂවල එකතු වටිනාකම රු.මිලියන 128 ක් විය. | | | |
| 10. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද විස්තර අනුව 2019 දෙසැම්බර් 31 දිනට කම්කරු කොමසාරිස් ජනරාල් නමට ලියාපදිංචි කර තිබූ වාහන 22 ක් දැනට දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි. එම වාහනවල පැවැත්ම හා භාවිතය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුනි. | දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර ඇති වාහන පිළිබඳ වගකීම දෙපාර්තමේන්තුව සතු වන නිසා මේ පිළිබඳ සොයාබලා අවශ්‍ය කටයුතු කල යුතු වීම. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | මෙම වාහන සියල්ලම 1986.02.03 දිනට පෙර ලියාපදිංචිවී ඇත. කම්කරු දෙපාර්තමේන්තුවේ මිනිස්බල අංශය අහෝසිකර 1995 වර්ෂයේදී වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කර ඇති අතර එම වාහන වෘත්තීය පුහුණු අධිකාරිය සතුව ඇති බවට නිරීක්ෂණය විය.<br>ඉන් වාහන 12 ක් වෘත්තීය පුහුණු අධිකාරිය භාරයේ පවතින බවට තොරතුරු සොයාගෙන ඇති අතර එම වාහන එම අධිකාරිය වෙත විධිමත් පරිදි භාරදීමට කටයුතු කරමින් පවතී. ඉතිරි වාහන 09 හි තොරතුරුද වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ලබා දී ඇති අතර මෙතෙක් තොරතුරු සොයා ගැනීමට නොහැකි වී ඇත. |
| 11. නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ඉදිකිරීම සඳහා 2017 අප්‍රේල් 07 දින මුල්ගල තබා තිබුණි. නමුත් ඉඩම පවරාගැනීමේ ගැටලු | ඉඩම් අයිතිය විධිමත්ව පවරා ගැනීමෙන් පසු ඉදිකිරීම් කලයුතු වීම. | ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | මේ දක්වා ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කර තිබූ අතර 2020 ජුනි 15 වන විටත් එහි කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි. | | | |
| 12. ඇස්තමේන්තුගත පිරිවැය රු.268,170,000 ක් වූ බදුල්ල දිස්ත්‍රික් නව කම්කරු කාර්යාලය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩමක ඉදිකිරීම ආරම්භ කර ඇති නමුත් අදාල ඉඩම විධිමත් පරිදි දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.54,791,204 ක මුදලක් 2018 දෙසැම්බර් 31 දින වන විට ලබාදී තිබූ අතර 2019 පෙබරවාරි 06 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්කරුට ඉදිකිරීම් කටයුතු පවරාදී තිබුණි. | ඉඩමේ අයිතිය නිරවුල්ව පවරා ගන්නා තෙක් ඉදිකිරීම් කටයුතු සිදුකිරීම ගැටලුකාරී තත්වයක් ඇති විය හැකි බැවින් ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ඉඩම් අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කලයුතු වීම. | පවරා ගැනීමේ කටයුතු කෙරෙමින් පවතී. | 2022 ජනවාරි වන විටත් ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොමැත. |
| 13. අධිකරණ මාර්ගයෙන් හා කම්කරු කාර්යාල මාර්ගයෙන් අයකරගත් 2019 දෙසැම්බර් 31 දිනට සේවකයන් වෙත නිරවුල් නොකර පැවති සේවක අර්ථසාධක | සේවකයන් වෙනුවෙන් අයකරගත් මුදල් ඔවුන්ගේ ගිණුම් වෙත අප්‍රමාදව බැරකල යුතු වේ. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | සේවක අර්ථසාධක අරමුදල් ශේෂය නිරවුල් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින නමුත් 2021 වර්ෂය තුළ කෝවිඩ් 19 වසංගතයේ ශීඝ්‍ර ව්‍යාප්තිය හේතුවෙන් එම කටයුතු මන්දගාමී වූ අතරම |

| | | | |
|---|---|---|---|
| අරමුදල් ශේෂය රු.398,465,065 ක් විය. ඉන් 2020 ජුනි 24 දින වන විටත් නිරවුල් නොකර පැවති ශේෂය රු.332,429,832.35 ක් විය. | | | නිරන්තරයෙන් සේවා යෝජකයින් වෙතින් අය කරගන්නා මුදල් ගිණුමට එකතු වීම හේතුවෙන් එහි ශේෂය ඉහල අගයක් ගෙන ඇත.<br>**<u>ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින "කම්කරු කොමසාරිස්" ගිණුම නිරවුල් කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් ද පහත සඳහන් කරමි.</u>**<br>අප විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ "සී" වාර්තා මේ වන තෙක් නිරවුල් නොකර පැවතීම ද "කම්කරු කොමසාරිස්" ගිණුමේ ඇති ශේෂය විශාල වීමට බලපාන බැවින් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවත්වන ලද සාකච්ඡා වලදී පහත සඳහන් ප්‍රතිපත්තිමය තීරණ සඳහා එකඟතාවයකට එළඹීමට හැකි විය.<br>"සී" වාර්තාවන්ගේ පවතින නාමාංක දෝශ ප්‍රතිශතය 10% ට වඩා වැඩි වුව ද එම "සී" වාර්තාවන්හි සඳහන් නිවැරදි නාමාංක සහිත ගිණුම් වලට සාමාජික මුදල් බැර කිරීමටත් නාමාංක දෝශ පවතින සාමාජිකයන් වෙනුවෙන් තාවකාලික ගිණුම් වලට බැර කිරීමටත් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන් ඉදිරියේ දී කම්කරු කොමසාරිස් ගිණුමෙහි දීර්ඝ කාලයක් පුරා රඳවාගෙන සිටි මුදල් කේවලවල ගිණුම් වෙත බැර කිරීමට අවස්ථාව සැලසෙනු ඇත.<br>තව ද නිරවුල් කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාල වල රඳවාගෙන ඇති සියළුම මුදල් පිළිබඳව විස්තර |

| | | | |
|---|---|---|---|
| | | | වාර්තාවක් ලබා දෙන ලෙසට සියළුම දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර, ඉන් නිරවුල් කළ හැකි මුදල් 2022.06.30 ට පෙර නිරවුල් කරන ලෙසත් නිරවුල් කළ නොහැකි මුදල් පවතී නම් ඊට අදාළ හේතුව ද සමග දැනුම් දීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් උපදෙස් ලබා දී ඇත.<br>ඒ අනුව ඉදිරිපත් වන කරුණු අනුව සළකා බලා ඉදිරියේ දී නිරවුල් කල නොහැකි සම්පූර්ණ මුදල් අය නොවූ අවස්ථා සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව කමිටුවක් මගින් තීරණ ගැනීමට සැළසුම් කරමින් පවතියි. |
| 14. කම්කරු පරීක්ෂණ අවස්ථාවේදී සී වාර්තා, දිස්ත්‍රික් 66 වාර්තා, වැටුප් ලේඛන හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දායක මුදල් ගිණුම්ගත කල බවට ආයතනය වෙත දන්වන වාර්තා යනාදී ලියවිලි කම්කරු නිලධාරී විසින් ලබාගත යුතුය. එම තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකු දත්ත පද්ධතියේ තොරතුරු හා නොගැලපීම, ගණනය කල හිඟ මුදල් ආයතනයෙන් ලබාගත් සී වාර්තා හා වැටුප් ලේඛන සමඟ නොසැසඳීම, අධිකරණයෙන් එවූ බැර වාර්තා හිඟ ගණනයන් සමඟ නොගැලපීම, | මහ බැංකුවේ පවත්නා තොරතුරු පද්ධතිය හා සමගාමී වන තොරතුරු පද්ධතියක් නොමැති වීම නිසා මෙම ප්‍රමාදයන් හා පරස්පරතාවයන් සිදුවන බව නිරීක්ෂණය වේ. දෙපාර්තමේන්තුව විසින්ද එවැනි තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමුකල යුතු වීම. | පරීක්ෂණ කළ යුතු ආකාරය පිළිබඳව නිලධාරීන්ට උපදෙස් ලබාදීම. | ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින තොරතුරු පද්ධතිය හා සමගාමී වන තොරතුරු පද්ධතියක් කම්කරු දෙපාර්තමේන්තුවෙහි ද පවත්වාගෙන යන නමුත් “දිස්ත්‍රික් 66” වාර්තා සඳහා සේවකයින් විසින් ලබා දෙන තොරතුරු අසම්පූර්ණ වීම සහ සේවායෝජකයින් විසින් “සී” වාර්තා සඳහා ඇතුළත් කරන සාමාජික තොරතුරු අසම්පූර්ණ වීමහේතුවෙන් දායක මුදල් ගිණුම් ගත කිරීමේ ගැටළු පැන නැගී ඇත.<br>ඉහත ගැටළුවට විසඳුමක් වශයෙන්<br>(i) සේවායෝජකයින් සහ සේවකයින් විසින් තොරතුරු ඉදිරිපත් කිරීමේ දී අදාළ තොරතුරු නිවැරදි හා සම්පූර්ණ ලෙස ඉදිරිපත් කරන්නේද යන්න |

| | | | |
|---|---|---|---|
| කම්කරු කාර්යාලය නිකුත් කරන ආවරණ ලිපිය හා හිඟ දායක මුදල් පරස්පර අගයන් ගැනීම ආදී හේතු නිසා මෙලෙස අයකර ගත් මුදල් සේවකයාගේ දායක ගිණුම් වෙත බැර කිරීමට නොහැකිව පැවති අවස්ථා 19 ක් නිරීක්ෂණය විය. එම අවස්ථා වලදී හිඟ මුදල් ගිණුම්ගත නොවී පැවති කාල පරාසය වර්ෂ 1 ත් 19 ත් අතර විය. | | | සුපරීක්ෂාකාරී වන ලෙසට සියළුම දිස්ත්‍රික් කාර්යාල වල කම්කරු නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.<br>(ii) තව ද ජාතික හැඳුනුම්පත් අංකය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් හඳුනා ගැනීමේ ප්‍රමුඛ දත්තය බවට පත් කිරීමේ ක්‍රියාවලියට අදාළව රෙගුලාසි සංශෝධනය කර ප්‍රකාශයට පත් කර ඇති අතර 2022 ජුනි මස සිට ඒ අනුව කටයුතු කිරීම ආරම්භ කිරීමට නියමිතය. |
| 15. ශ්‍රී ලංකාව තුළ පිහිටි සියලුම රාජ්‍ය නොවන ආයතන/ වතු පරීක්ෂා කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව යටතේ කලාප කාර්යාල 11 ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක්, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් ස්ථාපිත කර තිබුණි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට අනුමත කර තිබෙන කම්කරු නිලධාරී තනතුරු සංඛ්‍යාව 597 ක් හා අධිශ්‍රේණි තනතුරු 56 ක් විය. මේ අතරින් අධිශ්‍රේණි තනතුරු 56 අනුමත වී තිබුණද, ප්‍රතිව්‍යුහකරණ කටයුතු | දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්යභාරයෙන් වඩාත් සුමට හා කාර්යක්ෂම ලෙස ක්‍රියාවේ යෙදවිය හැකි ලෙස මානව සම්පත ප්‍රශස්ථ හා කාර්යක්ෂමව පවත්වාගෙන යෑමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | කම්කරු නිලධාරි අධි ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය සඳහා සංශෝධනයන්ට යටත්ව අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂන් ලේකම්ගේ අංක PSC/EST/07-01-33/5/2021 හා 2021.12.01 දිනැතිව ලබා දී ඇත. එම අනුමැතිය අනුව බඳවා ගැනීමේ පටිපාටිය කෙටුම්පත් 6කින් යුක්තව සකස් කර අත්සන සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. එම බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලැබුණු පසු කම්කරු නිලධාරී (විශේෂ ශ්‍රේණිය) තනතුරු 56 බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.<br>කම්කරු නිලධාරී II ශ්‍රේණියට බඳවා ගැනීමට අදාලව පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා 2018 වර්ෂයේ සිට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. පුරප්පාඩු 27 ක් පිරවීමට කම්කරු |

| | | | |
|---|---|---|---|
| හේතුවෙන් 2019 වර්ෂය අවසානය වන විටත් එම තනතුරු පුරප්පාඩුව පැවති අතර කම්කරු නිලධාරී තනතුරු 97 ක් ද දිගු කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | | | හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ඉල්ලා ඇත.<br>කම්කරු අමාත්‍යාංශ ලේකම්ගේ අංක ML/ES/ 05/01/5-V හා 2021.08.24 හා 2021.11.23 දිනැති ලිපි මඟින්, මෙම තනතුරට විවෘත පදනමින් තනතුරු 59ක් ද, සීමිත පදනමින් තනතුරු 60ක් ද ලෙස බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. කම්කරු නිලධාරී තනතුරෙහි 2021.12.31 දිනට පවතින පුරප්පාඩු ප්‍රමාණය වන 119ක් සීමිත හා විවෘත ධාරා යටතේ විභාගය පැවැත්වීමට 2021.11.26 හා 2021.12.10 දිනැතිව ගැසට් නිවේදනය පලකර ඇති අතර, එම විභාග මාර්තු/ අප්‍රියෙල් මාස වලදී පැවැත්වීමට නියමිතය. එම විභාග පැවැත්වීමෙන් පසු අදාල තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. |
| 16. දෙපාර්තමේන්තුවේ විශේෂඥ කර්මාන්තශාලා ඉංජිනේරු තනතුරු 03 ම පුරප්පාඩුව පැවති අතර දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක තනතුරු 10 න් 4 ක් ද, කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තනතුරු 14 න් 2 ක් ද පුරප්පාඩු වී තිබෙන නමුත් 2019 දෙසැම්බර් 31 වන විටද මෙම තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්යභාරයෙන් වඩාත් සුමට හා කාර්යක්ෂම ලෙස ක්‍රියාවේ යෙදවිය හැකි ලෙස මානව සම්පත ප්‍රශස්ථ හා කාර්යක්ෂමව පවත්වාගෙන යෑමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | බඳවා ගැනීම් කටයුතු සිදුකරමින් පවතී. | විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තනතුරු 1 ශ්‍රේණියේ තනතුරු 4 හිම නිලධාරීන් පත් කර ඇත. විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තනතුරු 03ක් ප්‍රතිව්‍යුහගතකරණය යටතේ නව තනතුරු ඇති කිරීම සඳහා යටපත් කිරීමට යෝජිතව ඇත.<br>මෙම දෙපාර්තමේන්තුවේ පවතින ඉංජිනේරු සේවයේ පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වරින් වර දැනුවත් කරන අතර, 2021 වර්ෂයේදී නවක බඳවා ගැනීම් වලින් නිලධාරීන් 07 |

| | | | |
|---|---|---|---|
| | | | දෙනෙකු මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර තිබුනද මෙම දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කරන ලද්දේ නිලධාරීන් දෙදෙනෙකු පමණි. |
| 17. 2020 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී සැසඳුම් ප්‍රකාශයේ සඳහන් අක්‍රීය ණය ශේෂවල වටිනාකම රු.1,296,825 ක් වූ අතර එම ණය ශේෂ වසර 04 කට අධික කාලයක සිට අයකිරීම් සිදුකර නොතිබුණි. | අප්‍රමාදව හිඟ ශේෂ අයකර ගැනීමටත් නිවැරදිව ණය ලේඛණ පවත්වාගෙන යාමටත් කටයුතු කල යුතු වීම. | ණය ශේෂ අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | 2019.12.31 දිනට තිබූ රු.5,127,856.00 ක අක්‍රිය ණය ශේෂ වල වටිනාකමින් මේ වන විට රු.2,768,674.97 ක් අය කර අවසන්ව ඇති අතර තවදුරටත් අයවීමට ඇත්තේ රු.2,359,181.53 ක ණය ශේෂයක් පමණි.<br>පළාත් සභා වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන්තව දුරටත් අයවීමට ඇති ණය ශේෂය වන 10,990.00 සහ වැඩ තහනම් කර ඇති, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අත්තිකාරම් බී ගිණුමට අයවීමට ඇති ණය ශේෂවල එකතුව රු.196,494 ක් රාජ්‍ය මුදල් චක්‍රල්ඛ අංක 01/2020 (මු.රෙ. 113(6) ප්‍රකාරව කපා හැරීම සඳහා කම්කරු අමාත්‍යංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත.<br>තවද, මෙම ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා නීත්‍යානුකූලව කටයුතු කිරීමටද ක්‍රියාමාර්ග ගෙන ඇති වුවද, එහිදී නීතිපති දෙපාර්තමේන්තුව මගින් නිලධාරියාට නඩු පැවරීම සඳහා ණය ශේෂය ප්‍රමාණවත් නොවන බවත්, ඒ සඳහා රජයට දැරීමට සිදුවන වියදම, අයකර ගැනීමට ඇති මුදල අභිබවා යාමට ඉඩ ඇති බවත් දන්වා ඇත. |
| 18.සේවය අතහැර ගොස් තිබූ, සේවයෙන් පහකල හා සේවය අවසන් කල නිලධාරීන්ගෙන් වර්ෂ 2 ත් 5 ත් කාලයක සිට අයවීමට තිබූ රු.2,114,219 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානයටත් අයකරගෙන නොතිබුණි. | අප්‍රමාදව හිඟ ශේෂ අයකර ගැනීමටත් නිවැරදිව ණය ලේඛණ පවත්වාගෙන යාමටත් කටයුතු කල යුතු වීම. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | |

| | | | |
|---|---|---|---|
| 19. 2020 දෙසැම්බර් 31 දිනට ගිණුම් ප්‍රකාශ අනුව පොදු තැන්පත් ගිණුම් 02 හි ශේෂය රු.862,823,135 ක් වූ අතර එයින් අවු: 2 ට වැඩි රු.405,374,480 ක ශේෂයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පොදු තැන්පතු ගිණුමේ පවත්නා ශේෂ හඳුනාගෙන පුද්ගලික ගිණුම්වලට අප්‍රමාදව බැරකිරීමට කටයුතු කලයුතු වීම. | වසර දෙක ඉක්මවූ තැන්පතු පිළිබඳව මු. රෙ. 571 අනුව කටයුතු කිරිමට හැකි සෑම විටම උත්සහ කරනු ලබයි. | වර්තමානයේදි සියළුම අංශ හා ප්‍රාදේශිය කාර්යාල වෙතින් විමසා ගෙවීම් ප්‍රමාද වන තැන්පතු රජයේ ආදායමට බැර කිරිමට කටයුතු කරනු ලැබේ. |
| 20. 2020 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් 31 දක්වා ඉදිකිරීම් කාර්යයන් 08 ක් වෙනුවෙන් කාර්යයන් ආරම්භයේදීම මුළු ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.120,239,994 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. | ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ICTAD කොන්දේසි හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කිරීම කළමණාකාරීත්වයේ වගකීම වේ. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් අදාල කාර්යයන් සඳහා මුදල් ඉල්ලීම් කරනු ලබන අතර ඉංජිනේරු (සිවිල්) විසින් එහි ප්‍රමුඛතාව කම්කරු කොමසාරිස් ජනරාල්/ අතිරේක කම්කරු කොමසාරිස් වෙත ඉදිරිපත් කරයි. ඒ අනුව මුදල් නිදහස් කිරීම සිදු කරයි. ඉදිරියේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන පමණක් නිදහස් කිරීමට කටයුතු කර ඇත. | ඉදිරියේදී මුලු ඇස්තමේන්තු ගත පිරිවැය මුදල් මඟින් නිදහස් නොකිරීමටත්, ඒ වෙනුවෙන් ප්‍රතිපාදන නිදහස් කිරීම සිදු කිරීමටත් කටයුතු කර ඇත. |
| 21. වර්ෂ 2013 සිට 2020 කාලපරිච්ඡේදය තුලදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත කම්කරු දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් හා වැඩිදියුනු | අදාල ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව ගෙවීමටත් ඒ සම්බන්ධයෙන් නිසි වාර්තා, පොත්පත්, | අදාල ඉතිරි ප්‍රතිපාදන හා මුදල් නැවත පවරා දෙන මෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදී. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දුන් ඇතැම් කාර්යය වල ඉතිරි මුදල් ප්‍රතිපාදන ඉංජිනේරු (සිවිල්) හා ප්‍රසම්පාදන අංශය දැනුවත් කිරීම් මඟින් සිදු කෙරෙමින් පවත්නා හා අළුතින් ආරම්භ කරනු ලබන කාර්යය |

| | | | |
|---|---|---|---|
| කිරීමේ කාර්යයන් 25 ක් සඳහා රු.320,106,499 ක් ගෙවීම් කර තිබූ අතර 2021 මාර්තු 31 දින වන විට එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 90 ත් සියයට 100 ත් අතර විය. ලබාදී තිබූ මුදල්වලින් රු.41,519,249 ක් එනම් සියයට 13 ක් ඉතිරිව පැවතුණි. එම ඉතිරි මුදල් නැවත ලබාගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි | පවත්වාගෙන යාමත්, ප්‍රගතිය සමාලෝචනය කිරීමත් අදාල නිලධාරියාගේ වගකීම වේ. | | සඳහා මාරු කිරීම සිදු කර ඇත. එසේම ඇතැම් අවසන් වූ කාර්යයවල ඉතිරි මුදල් රජයේ ආදායමට මාරු කල බවට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. |
| 22. මෙහෙවෙර පියෙස ගොඩනැගිල්ලේ 12 වන මහලේ සිට 16 වන මහල දක්වා බෙදුම් ඇඳි සවිකිරීම සඳහා වූ රු.135,300,000 ක් වූ පිරිවැය ඇස්තමේන්තුව අමාත්‍යංශ ලේකම්වරයා විසින් අනුමත කර නොතිබූ අතර තාක්ෂණික කමිටු නිර්දේශ ලබාගැනීමකින් තොරව ප්‍රසම්පාදන කමිටුව විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මෙම කාර්යය ඉටු කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි.<br><br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(i) ජේදයට | ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ICTAD කොන්දේසි හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කිරීම කළමණාකාරීත්වයේ වගකීම වේ. | විශාල කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කිරීමේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉල්ලීම් අනුව හා ඉංජිනේරු (සිවිල්)ගේ නිර්දේශය හා ප්‍රසම්පාදන කමිටු තීරණයේ සඳහන් පරිදි මුදල් නිදහස් කිරීම සිදුකරනු ලබයි. | කොන්ත්‍රාත් කටයුතු අවසන් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| පටහැනිව මුළු ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.135,300,000 සම්පූර්ණයෙන්ම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කර තිබූ අතර 2021 මාර්තු මාසය වන විටත් කොන්ත්‍රාත්තුව යටතේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | | | |
| 23. කම්කරු දෙපාර්තමේන්තුව සතු කම්කරු කාර්යාල පැවති ගොඩනැගිලි 03 ක් එම කාර්යාල නව ගොඩනැගිලිවලට ගෙනයාම නිසා වසර 01 සිට වසර 09 දක්වා කාල පරාසයක සිට නිශ්කාර්යව පැවතුණි. කම්කරු දෙපාර්තමේන්තුව සතු දිස්ත්‍රික් කාර්යාල 4 ක හා කුරුණෑගල දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂණ ඉංජිනේරු කාර්යාලයේ ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි. | රජයේ ගොඩනැගිලි උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව භාවිතා කිරීමට කටයුතු කල යුතුය. තක්සේරු නොකල ගොඩනැගිලි පිලිගත් තක්සේරුකරුවන් ලවා තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වීම. | ගොඩනැගිලි භාවිතයට ගැනීමට කටයුතු කිරීම හා තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව | නිෂ්කාර්ය වත්කම් භාවිතයට ගැනීම හා වතකම් ගිණුම්ගත කිරීම මේ දක්වාම අවසන් කර නොමැත. |

ශීර්ෂ 222 - ශ්‍රී ලංකා යුධ හමුදාව

| අනු අංක ---- | විගණන නිරීක්ෂණය ------------------------------ | විගණකාධිපතිගේ නිර්දේශය ----------------- | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග --------------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්ථමාන තත්ත්වය --------------------- |
|---|---|---|---|---|
| | **2018 වර්ෂය** | | | |
| | | | | |
| 1. | අඹේපුස්ස පිහිටි ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කඳවුරු භූමිය තුළ පිහිටි කළු ගලක් උපයෝගි කරගෙන 2014 වර්ෂයේ සිට 2018 මාර්තු දක්වා කළුගල් නිෂ්පාදන ව්‍යාපෘතියක් පවත්වා ගෙන ගොස් තිබුණු අතර එහි ආදායම රු.මිලියන 7.14 ක් වූ කළුගල් කියුබ් නිෂ්පාදන 2,213 ක් යුද්ධ හමුදාව වෙතටම අළෙවි කර තිබුණි. විකුණුම් ආදායම යුද්ධ හමුදා නිලධාරීන්ගේ සුභ සාධනය කටයුතු සඳහා රෙජිමේන්තු ආයතන සභාපතිගේ ගිණුමට පමණක් බැරකර කර තිබුණි. 2018 මාර්තු මස මෙම ව්‍යාපෘතිය නතර කර තිබුණු හෙයින් සභාපතිගේ ගිණුමෙන් රු.මිලියන 2.03 ක් වැය කර ලබා ගත් ගල් ඇඹරීමේ යන්ත්‍රය හා වැඩපල අත්හැර දමා තිබුණි. | ඉපයූ ආදායමෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය. | සිංහ රෙජිමේන්තුවේ සියළුම නිලයන්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු වලට පමණක් ගල් කොරිය පවත්වාගෙන ගොස් ඇති බැවින් ඒකාබද්ධ අරමුදල වෙත මුදල් බැරකිරීමට කටයුතුකර නොමැති අතර, 2018 මාර්තු මස සිට එහි වැඩ කටයුතු නවතා දමා ඇත. | වර්ථමාන තත්ත්වයද එසේම වන අතර, ඒකාබද්ධ අරමුදල වෙත මුදල් බැර කර නොතිබුණි. |
| | **2019 වර්ෂය** | | | |
| 2. | රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අංක mod/dev/rvsa/61/2012 දරන සහ 2012 ජූලි 19 දිනැති ලිපියේ පොදු කොන්දේසි 07 ට අනුව 2017, 2018 වර්ෂයන් සඳහා මුළු දීමනා ලාභීන්ගෙන් හා 2019 මුල් අර්ධ වර්ෂයේ | ගෙවීම් කිරීමට ප්‍රථම ජීව දත්ත වාර්තා ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. | රණවිරු මාපිය රැකවරණ දීමනාව හිමිගන්වනු ලබන දෙමව්පියන් අතුරින් මේ දක්වා ජීව දත්ත වාර්තා ඉදිරිපත් නොකරන ලද ප්‍රතිලාභීන්ගේ එම දීමනාව බැරවන බැංකු | 2017, 2018 හා 2019 මුදල් අර්ධ වර්ෂයේ දෙමාපියන්ගේ ජීව දත්ත නොමැතිව සිදු කළ මෙම ගෙවීම ජීවදත්ත ලබා ගෙන නිවැරදි කිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | දීමනා ලාභීන් 122,699 ක ගෙන් ජීව දත්ත වාර්තා ලබා නොගෙන රණවිරු මාපිය රැකවරණ දීමනාව ලෙස රු.මිලියන 3,297.03 ක් ගෙවා තිබුණි. | | ගිණුම් වෙතින් මුදල් නිකුත්කිරීම තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලෙස අදාළ බැංකු වෙත ලිඛිතව දැනුවත්කර ඇත. අදාළ ජීව දත්ත වාර්තා බැංකු ශාඛාව වෙත ඉදිරිපත්කළ පසු මුදල් ලබාගැනීමට හැකිවන පරිදි නැවත සක්‍රිය කිරීමට බැංකු මඟින් කටයුතු කරන බැව් දන්වා ඇත. | කටයුතු කර නොතිබුණි. |
| 3. | 2020 පෙබරවාරි 19 දිනට යාන්ත්‍රික ප්‍රවාහන I ගබඩාවේ 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුල ලැබී තිබුණු එකතු වටිනාකම රු.මිලියන 4.25 ක් වූ අයිතම 188 ක ඒකක 2,489 ක් නිකුත් කර නොතිබුණි. | වාර්ෂික අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගෙන මිලදී ගැනීමට කටයුතු කල යුතුය. | අදාළ යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස් අයෝග්‍ය බවට තහවුරු කර ගැනීමෙන් පසු ඇවර කර අලෙවි කිරීම සඳහා භාණ්ඩ ආපසු භාරගැනීමේ ගබඩා අංශය වෙත භාරදී ඇත. දීර්ඝකාලීනව නිකුත් නොවන භාණ්ඩ මෙම වසරේ අයෝග්‍ය කිරීම් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | වාර්ෂික අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා නොගෙන අතිරික්තව මිලදී ගෙන තිබුණු මෙම දීර්ඝ කාලීනව නිකුත් නොවන තොග සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් මේ වන තෙක් ගෙන නොතිබුණි. |
| 4. | 2020 පෙබරවාරි 19 දිනට යාන්ත්‍රික ප්‍රවාහන II ගබඩාව තුල රු. මිලියන 0.63 ක එකතු වටිනාකමක් සහිත බැටරි 74 ක් පැවති අතර ඉන් 2013 හා 2014 වර්ෂවලදී මිලදී ගෙන ගබඩාවට ලැබී තිබුණු එකතු වටිනාකම රු.මිලියන 0.41 ක් වූ බැටරි 56 ක ජීව කාලය අවසන්ව ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. | වාර්ෂික අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගෙන මිලදී ගැනීමට කටයුතු කල යුතුය. | බැටරි 74 ක ප්‍රමාණය අයෝග්‍ය කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත. ඒ අනුව අදාළ බැටරි අයෝග්‍ය කිරීම සඳහා භාණ්ඩ ආපසු භාරගැනීමේ ගබඩා අංශය භාරදී ඇත. | වාර්ෂික අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා නොගෙන මිලදී ගැනීම නිසා කල් ඉකුත් වී ඇති මෙම බැටරි තොගය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් මේ වන තෙක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල යාන්ත්‍රික ප්‍රවාහන ගබඩාවට ලැබී තිබුණු රු.මිලියන 3.20 ක් වටිනා ටයර්, ටියුබ් සහ ඒ හා අදාල භාණ්ඩ වර්ග 22 ක ඒකක 329 ක් ගබඩාවේ ඉතිරිව පැවතුණි. | වාර්ෂික අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගෙන මිලදී ගැනීමට කටයුතු කල යුතුය. | ටයර් ටියුබ් හා ඒ හා අදාළ භාණ්ඩ වර්ග 22 ක ඒකක 329 ක් ප්‍රමාණයක් ආයෝග්‍ය කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත. ඒ අනුව අදාළ ටයර්, ටියුබ් සහ ඒ හා අදාළ භාණ්ඩ අයෝග්‍ය කිරීම සඳහා භාණ්ඩ ආපසු භාරගැනීමේ ගබඩා අංශය වෙත භාරදී ඇත. | වාර්ෂික අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා නොගෙන මිලදී ගෙන තිබූ ටයර් සහ ටියුබ් තොග සම්බන්ධයෙන් අයෝග්‍ය කිරීමට උපදෙස් ලබා දීම හැර වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| 2020 වර්ෂය | | | | |
| 6. | යුද්ධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන පිරිවැය රු.බිලියන 92.52 ක් වූ ගොඩනැගිලි, වාහන, ප්‍රවාහන උපකරණ, නොනිමිවැඩ, ප්‍රාග්ධන භාණ්ඩ හා බිම් කැබලි 619 කට අයත් අක්කර 22,640 ක ඉඩම් වටිනාකම 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් ලෙස ඇතුලත් කර නොතිබුණි. | යුද්ධ හමුදාවට අයිති ඉඩම් ප්‍රමාණය තක්සේරු කර ගිණුම් ගත කළයුතු අතර, දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින ඉඩම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස හෝ අනාවරණය කළයුතු වීම හා අනෙකුත් වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කිරීම. | 2022 පෙබරවාරි 09 දිනට යුද්ධ හමුදාව වෙත අත්පත් කරගෙන අවසන්කර ඇති ඉඩම් කැබලි ප්‍රමාණය 515 ක් වන අතර, තවදුරටත් අත්පත්කර ගනිමින් පවතින ඉඩම් කැබලි ප්‍රමාණය 360 ක් වේ. මේ වනවිට අත්පත්කර ගැනීමේ කටයුතු අවසන් ඉඩම් කැබලි 515 න් දැනට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩම් කැබලි 280 ක ප්‍රමාණයක් තක්සේරුකර ඇති අතර, එම ඉඩම්වල තක්සේරු වටිනාකම රු.බිලියන 29.10 ක් වේ. 2021 වර්ෂය සඳහා සකස් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන තුළ තක්සේරු කර නොමැති ඉඩම් කැබලි සහ අත්පත්කර ගනිමින් පවතින ඉඩම් | බිම් කැබලි 280 ක ප්‍රමාණයක් තක්සේරු කර ඇති බව වාර්තා කලද ගිණුම්ගත කර නොතිබුණු අතර, අනෙකුත් වත්කම් සම්බන්ධයෙන්ද නිවැරදි කිරීම් සිදු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කැබලි පිළිබඳ විස්තර සටහන් මගින් අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| 7. | ආරක්ෂක උපකරණ, ගෘහභාණ්ඩ, පරිගණක උපකරණ හා මෘදුකාංග, ගිනි නිවීමේ උපකරණ, මුළුතැන්ගෙයි උපකරණ, පොදු භාණ්ඩ, ක්‍රීඩා උපකරණ, බෝට්ටු හා වෙනත් වත්කම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) ගිණුම්ගත වී ඇති වටිනාකම රු.බිලියන 16.05 ක් වූ අතර, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එම වත්කම්වල වටිනාකම රු.බිලියන 23.05 ක් වූයෙන්, රු.බිලියන 7 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාල වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බලා අදාල විස්තර ලබාගත යුතු අතර, එම විස්තරවලට අනුව ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුවීම. | දැනට පවතින ක්‍රමවේදය අනුව යුද්ධ හමුදාව වෙත වත්කම් මිලදීගැනීමෙන් පසු අවසාන පරිශීලක වෙත එම වත්කම් ලැබුණු විට අදාළ ස්වයං ගිණුම් තබන ස්ථාන විසින් එම වත්කම් ස්ථාවර වත්කම් කළමනාකරණ පද්ධතිය වෙත ඇතුළත්කරනු ලැබේ. යුධෝපකරණ ගබඩාව තුළ පවතින වත්කම් අවසාන පරිශීලක වෙත ලැබෙන තෙක් පරිගණක පද්ධතිය වෙත ගිණුම්ගත කිරීමට කටයුතුකර නොමැති අතර, එසේ කිරීමට හේතු වී ඇත්තේ එකම වත්කම පද්ධතිය තුළට දෙවරක් ඇතුළුවීම වළක්වාලීමේ අරමුණින් වේ. කෙසේ වෙතත් ජාතික විගණන කාර්යාලයේ නිර්දේශයන් අනුව යුද්ධ හමුදාවේ වත්කම් නිසි පරිදි මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කළයුතු බැවින් අදාළ තොරතුරු යාවත්කාලීන වන පරිදි පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම වෙනස්කම් වලට හේතු අනාවරණය කර ඇතත්, ගිණුම් වලින් ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කර නොමැති අතර, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් මිලදි ගත් වත්කම් වල නිවැරදි අගයන් අනාවරණය කරන බවට වාර්ථා කරද නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 8. | පසුගිය වර්ෂ 30 ක කාලපරිච්ඡේදය තුළ සේවය හැරගොස් ඇති හමුදා නිලධාරින් 3,995 දෙනෙකුගෙන් සහ සිවිල් නිලධාරින් 462 දෙනෙකුගෙන් රු.මිලියන 46.06 ක ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ වලින් රු.මිලියන 5 ක් වර්ෂ 10 ත් 30 ත් අතර පැරණි ණය ශේෂ වන අතර, විශ්‍රාම ගිය හමුදා නිලධාරින් 25 දෙනෙකුගේ සහ සිවිල් නිලධාරින් 71 දෙනෙකුගෙන් වර්ෂය ඉක්මවූ වර්ෂ 15 දක්වා කාල පරාසයක් තුළදී අය නොවූ ණය ශේෂ වල එකතුව රු.මිලියන 5.35 ක් හා මියගිය හමුදා සහ සිවිල් නිලධාරින් 36 දෙනෙකුගේ අයවිය යුතු ණය ශේෂ රු.මිලියන 1.42 ක් මෙන්ම වැඩ තහනම් කර ඇති සිවිල් නිලධාරින් 7 දෙනෙකුගේ වර්ෂ 2 සිට 7 දක්වා කාල පරාසයක් තුළ අයවීමට ඇති ණය ශේෂ රු.173,436 ක් වශයෙන් එකතුව රු.මිලියන 53.03 ක ණය සහ අත්තිකාරම් ශේෂ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ විධිවිධාන පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වීම. | තවදුරටත් නිරවුල්කිරීමට ඇති ණය ශේෂ නිරවුල් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය මාසිකව අධීක්ෂණය කරනු ලැබේ. එමෙන්ම දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී හිඟහිටි ණය ශේෂ නිරවුල්කිරීමේ ප්‍රගතිය සාකච්ඡා කරනු ලබන අතර, එහිදී එම ණය ශේෂ කඩිනමින් අයකරගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙනු ලැබේ. | මෙම ණයශේෂ හෝ ණයශේෂ වලින් කොටසක් මේ වන තෙක් අයකර නොතිබුණි. |
| 9. | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සිදු වී තිබුණු රිය අනතුරු 128 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා හා රිය අනතුරු 197 | අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රු.250,000 කට වඩා අඩු රිය අනතුරු අලාභහානි වටිනාකම් වලට අදාළව මෙතෙක් ක්‍රියාකරනු ලැබූ පිළිවෙත අනුව මු.රෙ. | සිදුවීම් 16 ක පරිපූර්ණ වාර්තා සකස්කර අවසන්ව ඇති බවට වාර්තා කර ඇතත්, එම |

| | | | | |
|---|---|---|---|---|
| | ක් සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාද මුදල් රෙගුලාසි 104 (3) හා (4) ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. | | 104 (3) වාර්තා නැගීමකින් තොරව අලාභහානි අයකරගැනීම්/කපාහැරීම් සඳහා මූලික පරීක්ෂණ උසාවි සිදුකර ඇත. එහෙත් ජාතික විගණන කාර්යාලයේ උපදෙස් පරිදි 2020 වර්ෂයේ සිට සියලුම අලාභහානි සඳහා මු.රෙ. 104 (3) නැගීමට කටයුතුකර ඇත. අලාභහානි සිදුවීම් 16 ක පරිපූර්ණ වාර්තා සකස්කර අවසන්ව ඇති අතර, මූලික පරීක්ෂණ උසාවි කටයුතු අවසන් වීමෙන් අනතුරුව සිදුවීම් 58 කට අදාළව මු.රෙ. 104(4) යටතේ අවසන් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වාර්තා හෝ මෙතෙක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැත. |
| 10. | සාමසාධක රාජකාරී සඳහා මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට නියමිත 685 ක හට පිරිසක් සඳහා අවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ 2016 හා 2017 වර්ෂ තුලදී මිලදී ගෙන තිබුණු අතර, මෙම මිලදී ගත් ප්‍රවාහන හා අනෙකුත් උපකරණ අතරින් රු. බිලියන 1.38 ක් වටිනා ප්‍රවාහන හා උපකරණ තොග විවිධ ප්‍රදේශවල ප්‍රධාන ගබඩා කිහිපයක ගබඩා කර තිබුණි. මෙම තොග වලින් 2016 වර්ෂයේ මිලදී ගන්නා ලදුව, 2021 මැයි සහ අගෝස්තු මාස අතර කාලයේදී, කල් | අවශ්‍යතාවය පරිදි භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කළයුතු අතර, මේ වන විටත් මිලදීගෙන ඇති මෙම ප්‍රවාහන හා උපකරණ තොග රජයට උපරිම වාසි සැලසෙන පරිදි උපයෝජනය කළයුතු විම. | මිලදීගත් අතිරේක වාහනයක් දැනට තාවකාලිකව සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ස්ථානගතකර ඇති අතර, Container Lifter – 3 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත අලෙවි කිරීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. ඉතිරි වූ භාණ්ඩ අතරින් කල් ඉකුත් නොවන භාණ්ඩ ඉදිරි සාම සාධක රාජකාරි සඳහා ප්‍රයෝජනයට ගැනීමට ඉහත ගබඩාවල සුරක්ෂිතව ගබඩාකර ඇති අතර, අනෙකුත් | යුද්ධ හමුදා විසින් වාර්තා කළ පරිදි Container Lifter – 3 ක් වරාය අධිකාරියට අලෙවි කිරීමට කටයුතු සිදු කරමින් පැවතීම හැර අදාල වාහන හා උපකරණ තොග වෙනත් ගබඩා වෙත මාරු කිරීමට අමතරව වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. තවද, 2021 මැයි සහ අගෝස්තු මාස අතර කාලයේදී කල් ඉකුත්වන වාහන |

| | | | | |
|---|---|---|---|---|
| | ඉකුත්වන, වාහන පින්තාරු කිරීමට යොදා ගන්නා රු.මිලියන 1.07 ක් වටිනා තීන්ත ලීටර් 924 ක් පරිහරණය කිරීමට නුසුදුසු තත්ත්වයක පැවතුණි. දිවයිනේ තවත් ස්ථාන කිහිපයක සාම සාධක රාජකාරී සඳහා මිලදී ගන්නා ලද වටිනාකම් අනාවරණය නොකෙරුණු වාහන හා උපකරණ තොග නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | | භාණ්ඩ වඩාත් ඵලදායි ලෙස අවශ්‍යතාවය පරිදි නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී වෙනුවෙන් මාලි රාජ්‍ය වෙත රැගෙන යාමට නියමිත කන්ටේනර් බහාලුම් පිංතාරු කිරීම වෙනුවෙන් මිලදීගන්නා ලද ප්‍රයිමර් විත් අක්ටිවේටර් ලීටර් 04 ඇසුරුම් 152 ක් හා පේන්ට් ග්‍රේ ලීටර් 04 ඇසුරුම් 79 ක තීන්ත ප්‍රමාණය කාර්මික අවශ්‍යතා වෙනුවෙන් ඵලදායී ලෙස භාවිතයට ගැනීම සඳහා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලඇණි සහ වැඩපලයන් වෙත නිකුත්කර ඇත. | පින්තාරු කිරීමට යොදා ගන්නා රු. මිලියන 1.07 ක් වටිනා තීන්ත තොගයද මේ වන විට කල් ඉකුත් වී ඇති අතර, කල් ඉකුත් වීමට ආසන්නව තිබියදී ඒ බව විගණනයෙන් පෙන්වා දී තිබුණද, එම තොග ඵලදායී ආර්ථික කටයුත්තකට යොදවාගෙන නොතිබුණි. |
| 11. | යුද්ධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන වාහන 7,127 කට අදාලව සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව ඉන්ධන දහනයවීම් පරීක්ෂාවන් සිදු කර නොතිබුණු අතර, ප්‍රවාහන අංශය විසින් තීරණය කරණු ලබන ඉන්ධන දහනයවීම් ප්‍රමාණයන් අනුව ධාවන සටහන්/ප්‍රවාහන ගමන් බලපත්‍රවල ඉන්ධන තුළනය කිරීම් සිදු කර තිබුණි. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | යුද්ධ හමුදාව සතු වාහන සඳහා, 2022 වර්ෂයේ සිට එළඹෙන සෑම වර්ෂයකම මාර්තු මාසයට ප්‍රථම ඉන්ධන කාර්යක්ෂමතාවය පරීක්ෂාව සිදුකළ යුතු බවට යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලිඛිතව අදාළ යුද්ධ හමුදා සියළු ස්ථාන දැනුවත්කර ඇත. | 2022 වර්ෂය සිට යුද්ධ හමුදාවේ විවිධ අංශ දැනුවත් කිරීමට කටයුතු කර තිබුණද අදාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනයවීම් පරික්ෂා කර එම ප්‍රමාණයන් අනුව ධාවන සටහන්/ප්‍රවාහන ගමන් බලපත්‍රවල ඉන්ධන තුළනය කිරීම් සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 12. | යුධ සමයේ ත්‍රස්තවාදීන්ගෙන් අත්පත් කර ගත් වාහන 539 ක නීත්‍යානුකූල අයිතිය යුද්ධ හමුදාව වෙත පවරා ගෙන නොතිබුණු අතර, යුද්ධ හමුදාවට අයිති වාහන 5,534 ක් සඳහා රක්ෂණාවරණ ලබා ගෙන නොතිබුණි. | අත්පත් කරගත් වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනිම හා රක්ෂණාවරණ ලබාගැනීමටත් කටයුතු යුතු වීම. | යුධ සමයේ ත්‍රස්තවාදීන් විසින් අතහැර දමා ගොස් තිබියදී අත්පත්කර ගත් වාහන යුද්ධ හමුදා රාජකාරියෙහි යෙදවීම සඳහා FD/14/28 හා 2006 මැයි 31 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ ලිපිය මඟින් අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව ධාවනයට සුදුසු තත්වයේ පවතින වාහන මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. යුහ වාහන 5534 ක් අතරින් වාහන 2522 ක් මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකර නොමැත. | විගණනයෙන් පෙන්වා දී ඇති නිරීක්ෂණ දෙකම මේ වන විටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 13. | සාලාව යුධ හමුදා කඳවුරේ ගාල් කර තිබියදි, පිපිරීමක් නිසා විනාශ වූ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා දුන් වාහන 62 කට අදාල රු.මිලියන 746.34 ක අලාභහානි තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබද ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | යුද්ධ හමුදාවට අයිති දේපලවලට සිදුවන හානි පමණක් පාඩු හෝ අත්හැරීම් ලෙස හඳුනාගත යුතු වීම. | සාලාව යුද්ධ හමුදා කඳවුරේ ගාල්කර තිබියදී පිපිරීමක් නිසා විනාශවූ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබාදුන් වාහන 62 ක ප්‍රමාණය යුද්ධ හමුදා වත්කම් වලට අදාළ නොවන බැවින් අදාළ ලිපිගොනුව 2021 ජූලි 14 දින අවලංගුකර ඇත. | මෙතෙක් මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 14. | 2017, 2018, 2019 වර්ෂ වල යුද්ධ හමුදාවේ වාහන 222 කට සිදුවුනු අනතුරු වලින් තවදුරටත් අයකර ගැනීමට, කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබදව පාඩු හා අත්හැරීම් පිළිබද ප්‍රකාශය | වාහන වලට සිදු වී ඇති අලාභහානී මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ආකෘතිපත්‍ර වලින් හෙළිදරව් කළයුතු වීම හා මෙතෙක් | 2017, 2018 සහ 2019 වර්ෂවල යුහ වාහන 222 කට සිදුවූ රිය අනතුරු අලාභහානි මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව්කර නොමැති | මෙතෙක් මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මඟින් හෝ පොත් වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශය මඟින් හෝ අනාවරණය කර නොතිබුණි. මෙම වාහන 222 න් වාහන 155 ක් සඳහා තක්සේරු කළ අලාභය රු.මිලියන 110.4 ක් වූ අතර, වාහන 67 කට අදාලව අලාභය තක්සේරු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රිය අනතුරු 63 කින් සිදු වූ අලාභහානි වලින් මෙතෙක් හානි ලෙස හඳුනා ගත් අලාභහානි සහ 1990 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වාහන අනතුරු 465 ක රිය අනතුරුවලින් සිදු වූ හානි පිළිබඳ තොරතුරු ද, මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර නොතිබුණි. | තක්සේරුකර නොමැති වාහන අලාභහානි කඩිනකමින් තක්සේරු කළයුතු වීම. | අතර, 2021 වර්ෂයේ අලාභහානි වාර්තා අදාළව නඩත්තු කිරීමට කටයුතු කර යුද්ධ හමුදා මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදීමට කටයුතුකර ඇත. අලාභහානි ලෙස දක්වා තිබුණු වාහන 63 න් 51 ක් සඳහා මේ වනවිට ඇස්තමේන්තු වාර්තා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ගෙන්වාගෙන ලේඛනගත කර ඇති අතර, ඉතිරි අලාභහානි 12 සඳහා ඇස්තමේන්තු වාර්තා ඉදිරිපත්කරන ලෙස විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ඉල්ලුම්කර ඇති බැවින් එම වාර්තාද ලේඛනගත කිරීමට කරනු ලැබේ. 2020 වර්ෂයේ හානි හා පාඩු ලේඛනය මු.රෙ. 110 ප්‍රකාරව නවතමයෙන් සකස් කරන ලද අතර 2021 වර්ෂයේ හානි හා පාඩු ලේඛනයද මු.රෙ.110 ප්‍රකාරව නඩත්තු කිරීමටත්, රිය අනතුරු ක්‍රියා පිළිවෙත යාවත්කාලීන කිරීම සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතුකර ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| 15. | 1987 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා යුද්ධ හමුදාවේ ගබඩා ගිනි ගැනීම්, මාලි රාජ්‍යයේ ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් සිදු වූ අලාභහානි, ගබඩා භාණ්ඩ හා උපකරණ අස්ථානගත වීම, විවිධ ත්‍රස්ත්‍ර ප්‍රහාර හේතුවෙන් ආයුධ, උපකරණ හා වාහනවලට සිදුවූ විවිධ අලාභහානි හා යුද්ධ හමුදා වාහනවලට සිදු වූ අලාභහානි ඇතුළු විවිධ වත්කම් වලට සිදුවූ අලාභහානි 35 කට අදාලව එකතුව රු.මිලියන 85.48 ක අලාභහානි සඳහා ක්‍රියාමාර්ග ගැනීමට මූලික පරීක්ෂණ උසාවි වෙත ඉදිරිපත් කර තිබුණු අතර, එම අලාභහානි සම්බන්ධවද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල අලාභහානි සම්බන්ධයෙන් නඩු විභාග කඩිනම් කර ක්‍රියාමාර්ග ගැනීම වේගවත් කළයුතු විම. | අලාභහානි සිදුවීම් 35 අතරින් 2022 පෙබරවාරි 09 දිනට සිදුවීම් 18 ක් වෙනුවෙන් යුද්ධ හමුදාධිපති නිගමනය ලබාගෙන මු.රෙ. 109 යටතේ පොත්පත්වලින් කපාහැර ගිණුම් කටයුතු නිරවුල් කර ඇති බවත්, මු.රෙ. අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට අවශ්‍ය නොවන එක් ගොණුවක් වසා දමා ඇති අතර ඉතිරි සිදුවීම් 16 සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | රු.මිලියන 14.39 ක අලාභහානි 16 කට අදාලව ක්‍රියාමාර්ග මෙතෙක් ගෙන නොතිබුණි. |
| 16. | වේරහැර ප්‍රදේශයේ යුද්ධ හමුදා ඖෂධ ගබඩාවක් ස්ථාපිත කර තිබුණු අතර, මෙම ගොඩනැගිල්ල ඖෂධ ගබඩා කිරීම සඳහා තිබිය යුතු ප්‍රමිතීන් අනුව සකස් කර නොතිබුණි. ආරක්ෂිත කැමරා පද්ධතියක්ද සවිකර නොතිබුණි. covid – 19 රෝගය වලක්වා ගැනීමට අවශ්‍ය රු.මිලියන 45.6 ක් වටිනා විවිධ වෛද්‍ය අයිතමයන්, එතනෝල් හා සනීපාරක්ෂක ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මෙම ගොඩනැගිල්ලේ තරප්පුපෙලෙහි සහ ඉහළ මහලයේ කොරිඩෝවේ | සැලසුම් කළ ඖෂධ ගබඩා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කිරීමට පියවර ගතයුතු වීම සහ අදාල ඖෂධ හා වෛද්‍ය සැපයීම් ද්‍රව්‍ය වලට හානි නොවන ලෙස ගබඩා පවත්වා ගැනීමට කටයුතු කළයුතු විම. | වාර්ෂික ඇස්තමේන්තුවලට අනුව මිලදීගනු ලබන ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය වලට අමතරව කොවිඩ් 19 වෛරසය වළක්වා ගැනීමේ අයිතමයන්ද මූලික බෙහෙත් ගබඩාවේ ගබඩා කිරීම හේතුවෙන් බෙහෙත් ගබඩාවක් සඳහා අවැසි සම්මත තත්වය අනුව බෙහෙත් ගබඩාව පවත්වාගෙන යාමට නොහැකි නමුත් පවතින ඉඩ පහසුකම් අනුව හැකි උපරිම තත්වයෙන් අමතර අයිතමයන්ද හානි නොවන පරිදි ගොඩනැගිල්ලේ | ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය වල ආරක්ෂාව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, යෝජිත ගබඩා ගොඩනැගිල්ලේ ඉදිකිරිම් කටයුතු 2021 වර්ෂයේ මුල් භාගයේ ආරම්භකර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අවිධිමත්ව ගබඩා කර තිබුණි. වැසි දිනවලදී මෙම ගබඩා ද්‍රව්‍යයන් තුළට වැසි ජලය ගලා ඒමේ අවධානමක් පැවතුණි. ඖෂධ ගබඩා කිරීම සඳහා වර්ග අඩි 14,450 ක ගබඩාවක් මෙම පරිශ්‍රයේම ඉදිකිරීමට සැලසුම් කර තිබුණද එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | | ඉහල මහලේ ගබඩාකර ඇත. මූලික බෙහෙත් ගබඩාවේ ආරක්ෂව සඳහා නව ආරක්ෂක කැමරා පද්ධතියක් ඉල්ලුම්කර ඇති අතර සවිකිරීම සඳහා අවැසි උපාංග වෙනුවෙන් මූලික ඇස්තමේන්තුව 11 ශ්‍රී ලංකා සංඥා බලකාය - මූලික වැඩපල වෙතින් ලබාගෙන ඇත. රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා වෛද්‍ය බලකායට අයත් භූමියේ ඉදිකිරීම සඳහා සැලසුම්කර ඇති මූලික බෙහෙත් ගබඩාවේ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ඉංජිනේරු සේවා රෙජිමේන්තුව විසින් ආරම්භකර ඇති අතර මේ වන විට එහි පාදම කොටස ඉදිකරමින් පවතී. | |
| 17. | යුද්ධ හමුදාවේ සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක් හා තෘතියක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 83 ක් ඇතුළු සමස්ථ පුරප්පාඩු 1,469 ක් පැවතුණි. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වීම. | යුද්ධ හමුදාවේ සිවිල් කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය මගින් රාජ්‍ය සේවා පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත. ඒ අනුව සංවර්ධන නිලධාරි සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාවෙන් මේ වන විට පවතින්නේ පුරප්පාඩු 09 ක පමණි. එසේම කළමනාකරණ සේවා නිලධාරී සේවයේ | සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් හා තෘතියක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 14 ක් ඇතුළු සමස්ථ පුරප්පාඩු 1,399 ක් මෙතෙක් පිරවීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පවතින පුරපුපාඩු සම්පූර්ණකර දෙන ලෙස කර ඇති ඉල්ලීමට අනුව නව බඳවා ගැනීමේදී එම පුරපුපාඩු සම්පූර්ණකරන බව දන්වා ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින සහකාර අධ්‍යක්ෂ පුරප්පාඩුව සඳහා නිලධාරියෙකු අනුයුක්තකර ඇත. | |

ශීර්ෂ 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන්වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2018 වර්ෂය<br>1995 සහ 1996 වර්ෂ වල මිලදී ගත් එහෙත් පාවිච්චි කළ නොහැකි තත්ත්වයට පත් වී තිබුණු රු.මිලියන 239 ක් වටිනා මැෂින් තුවක්කු 101 ක් නිෂ්කාර්ය ලෙස ගබඩා කර තිබුණි. | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353 දරන, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන හා 2003 ජනවාරි 03 දිනැති 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවීම. | පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තොගයෙන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කරනු ඇත. | මේ දක්වාම එම උපකරණ ඉවත් කර නොමැත. |
| | 2019 වර්ෂය | | | |
| 2. | විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 04 ක්, එක් දෙපාර්තමේන්තුවක් හා කාර්යාල 02 ක් විසින් එකතුව රු.මිලියන 259.37 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය | වෙනත් කාර්යභාරයන් ඉටු කිරීමේදී සැලසුම්කරණය මෙන්ම අවශ්‍ය ප්‍රතිපාදන පමණක් ලබා ගැනීමක් සිදු කළ යුතු වීම සහ නිසි පසුවිපරම් ආදිය සිදුකර වාර්ෂික | ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය සඳහා අභ්‍යන්තර සැලසුම් සකස් කර ඇත. | ප්‍රතිපාදන මනා සැලසුම්කරණයකින් යුතුව වාර්ෂික ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරිමට සැලසුම් කර ඇති බවට සාක්ෂි අනාවරණය නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| | අවසාන වන විට ඉන් රු.මිලියන 35.95 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ප්‍රතිපාදනවලින් සියයට 86 ක් උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට වගබලා ගත යුතු වීම. | | |
| 3. | වර්ෂ 2016 සිට 2018 දක්වා ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් ලබාදුන් මුදල රු.135,220,167 ක් වූ අතර උතුරු නාවික විධානය විසින් එම ව්‍යාපෘති සඳහා ලබාදුන් වියදම් විස්තරයට අනුව වියදම රු.74,728,091 ක් විය. ඒ අනුව අග්‍රිම ඉතිරිය රු.60,492,076 ක් විය යුතු වුවත්, තැන්පත් ගිණුමේ ශේෂය රු.30,228,488 ක් වූයෙන් රු.30,263,588 කින් තැන්පත් ගිණුමේ ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්වල නිවැරදිතාවය පිළිබඳව සැලකිලිමත් විය යුතුවීම. | මූල්‍ය අංශය දැනුවත් කිරීමට කටයුතු කර ඒ සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කර ගැනීමට කටයුතු කර ඇත. | ගිණුම් කටයුතු සම්බන්ධයෙන් මූල්‍ය අංශය තොරතුරු යාවත්කාලීන කරන තෙක් තොරතුරු ලබාගත නොහැක. |
| 4. | වර්ෂ 2017 හා 2018 දක්වා උතුරු නාවික විධානය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් චෙක්පත් ලැබීම් පිළිබඳ විස්තරය අනුව මුදල් ලැබීම් රු.102,560,101 ක් වුවත්, යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් ව්‍යාපෘති වෙනුවෙන් ලබාදුන් චෙක්පත් විස්තරය අනුව | මුදල් සම්බන්ධව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුවීම. | මුදල් පරිහරණය කරනු ලබන සෑම අංශයක්ම දැනුවත් කිරීමට කටයුතු කර ඒ සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කර ගැනීමට කටයුතු කර ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | එය රු.135,220,167 ක් විය. ඒ අනුව රු.32,660,066 ක වෙනසක් තිබුණි. | | | |
| 5. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂය (2019 ජනවාරි 01 වන දිනට) හා පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ අවසාන ශේෂය (2018 දෙසැම්බර් 31 දිනට) අතර රු.මිලියන 15,895 ක වෙනසක් පැවතුණි. | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වීම. | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කිරීම සඳහා අදාළ පාර්ශව දැනුවත් කර ඇත. | වත්කම් නිසියාකාරව හඳුනා ගැනීමකට ලක් කිරීමෙන් පසු නැවත ගිණුම්ගත කරන තුරු තොරතුරු ලබාගත නොහැක. |
| | 2020 වර්ෂය | | | |
| 6. | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව නියම වශයෙන් මුදල් ගෙවීමට සිදුවන කාලය වන විට අවශ්‍ය අධිකාර බලය නොහොත් අතිරේක මුදල් ප්‍රතිපාදන ලැබේදැයි අපේක්ෂාවෙන් වියදම් හෝ බැරකම් නොදැරිය යුතු අතරම මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව මුදල් තිබෙන බවටත් නිතිපතා බිල් ලැබෙන බවටත්, එම බිල් අප්‍රමාදව බේරුම් කරන බවටත් සහතික වීම පිණිස බලය දෙන නිලධාරීන් මෙන්ම සහතික කරන නිලධාරීන් ද විසින් බැරකම් පිළිබඳ ලේඛන නිතිපතා පරීක්ෂා | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කළ යුතු වීම. | මහාභාණ්ඩාගාරය සමඟ සම්බන්ධීකරණය වී අදාල කටයුතු සිදු කිරීම සඳහා වගකිවයුතු පාර්ශවයන් දැනුවත් කර ඇත. | මහා භාණ්ඩාගාරය වෙතින් මුදල් ලද වහාම එම බිල්පත් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | කර බැලිය යුතු අතරම මුදල් වර්ෂයේ පශ්චාත් අවධියකදි එකවර විශාල මුදලක් ගෙවා බේරුම් කිරීම සඳහා බිල් එකතු කොට තබා නොගත යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන තිබූ බැරකම් වටිනාකම රු.1,122,379,832 ක් වී තිබූ අතර එම වටිනාකම තුළ සමාලෝචිත වර්ෂයට අදාල නොවන බැරකම් අයිතම 1,520 ක් වූ අතර එහි වටිනාකම රු.227,525,925 ක් වී තිබුණි. | | | |
| 7. | ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පරිහරණය කරනු ලබන වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතු ඉඩම්වල ප්‍රමාණය හෙක්ටයාර් 437.2877 ක් වූ අතර එම ඉඩම් පරිහරණය කිරීම සඳහා විධිමත් අනුමැතීන් ලබාගෙන නොතිබුණි. සමහර ඉඩම් පරිහරණය කර තිබූ කාලය වසර 08, 14 හා 22 ද ඉක්මවා තිබුණි. | විධිමත් අනුමැතීන් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතුවීම. | අදාල ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. | මේ දක්වා එම අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාමාර්ග අවසන් කර නැත. |
| 8. | සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට අළුත්වැඩියා කටයුතු අවසන් කර ආපසු ලබාදිය යුතු බටහිර | ගිවිසුම/ඇණවුම අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ගයන් ගත යුතුවීම. | අළුත්වැඩියාවන් කඩිනමින් අවසන් කිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් | මේ දක්වාම අළුත්වැඩියා කටයුතු අවසන් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නාවික විධානය සතු වාහන 18 ක් නියමිත අළුත්වැඩියා කටයුතු අවසන් කර ආපසු ලබාදී නොතිබුණි. | | ශක්තිමත් කිරීමට කටයුතු කර ඇත. | |
| 9. | (අ) සිවිල් කාර්යය මණ්ඩලය තුල ප්‍රාථමික, ද්විතියික හා තෘතියික මට්ටමේ තනතුරු 428 ක්, එනම් සියයට 28 ක් පුරප්පාඩු වී තිබුණි. | පුරප්පාඩු වී ඇති තනතුරු කඩිනමින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුවීම. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ බඳවා ගැනීම් සඳහා පළාත් පාලන අමාත්‍යාංශය සහ රාජ්‍ය සේවා පළාත් සභා දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | සිවිල් කාර්ය මණ්ඩලය තුළ ඇති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට මේ දක්වාම නොහැකි වී තිබුණි. |
| | (ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය හා ස්වේච්ඡා නිලධාරී කාර්යය මණ්ඩලය තුල තනතුරු 9075 ක්, එනම් සියයට 07 ක් පුරප්පාඩු වී තිබු අතර නිත්‍ය හා ස්වේච්ඡා නාවිකයින් 1221 ක්, එනම් සියයට 20 ක් පුරප්පාඩු වී තිබුණි. | -එම- | අදාල කටයුතු සිදුකර ඇත. | බඳවාගැනීමේ කටයුතු අවසන් කර නැත. |

ශීර්ෂ 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ගය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පවත්වාගෙන යනු ලබන රත්මලාන ගුවන් හමුදා කඳවුරේ කෞතුකාගාරය මගින් 2018 අප්‍රේල්, මැයි, ජූනි යන මාස තුල ආදායම් මාර්ග 13 කින් උපයා තිබූ ආදායම රු.1,719,826 ක් වී තිබුණි. මෙම මුළු ආදායමෙන් සියයට 10 සිට 20 දක්වා ප්‍රමාණයක් පමණක් රාජ්‍ය ආදායමට බැර වී තිබුණි. එසේම මෙම ආදායම රඳවා ගැනීමේ අරමුණ කෞතුකාගාරයේ වියදම දැරීම වුවද 2018 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුල රු.808,267 ක මුදලක් කෞතුකාගාරයේ වියදම් සඳහා ඒකාබද්ධ අරමුදලින් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | රඳවාගත් ආදායම් වලින් කෞතුකාගාරය සම්බන්ධ පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීම මගින් මේ පිළිබඳ මූල්‍ය පාලන ක්‍රමවේද ශක්තිමත් කිරීමට කටයුතු කල යුතු වීම. | ආදායමින් කොටසක් ඒකාබද්ධ අරමුදලට ලබාදෙන අතර අනෙකුත් ආදායම් අරමුදල් වෙත බැර කර හමුදා සාමාජිකයන්ගේ සුභසාධනය සඳහා යොදා ගනු ලබන බව | වර්තමානයේදී කෞතුකාගාරයේ වැඩිහිටි ටිකට් පතක ආදායමින් 33% ක්ද ළමා ටිකට් පතක ආදායමින් 23% ක්ද කෞතුකාගාර වියදම් වෙනුවෙන් රඳවා ගනු ලැබේ. |
| 2. | නිවාඩු නිකේතන සහ ගොවිපොළවල් ඇතුළු ආදායම් උපදවන ව්‍යාපෘති මගින් සමාලෝචිත වර්ෂය තුල උපයාගත් ආදායම් ගිණුම්ගතකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කිරීම හා අරමුදල් භාවිතය පිළිබඳ ගිණුම් කටයුතු කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මානව හා භෞතික සම්පත් යොදාගනිමින් වාණිජමය පදනමක් සහිත මෙම ව්‍යාපෘති වල මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ | මේවා මගින් ලබන ආදායම් සුභසාධන කටයුතු සඳහා යොදා ගනු ලබන බැවින් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොමැති බව දන්වා ඇත. | වර්තමානයේදී මෙම තත්ත්වයම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කල යුතුය. | | |
| 3. | මුදල් රෙගුලාසි 136,137 හා 138 අනුව කටයුතු කිරීමකින් තොරව, ගුවන් හමුදා සුහසාධක අරමුදලට ගෙවීම් වවුචර් 5 ක් මගින් රු.මිලියන 2.93 ක් ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි 138 (3) අනුව වියදම් සහතික කරන නිලධාරියා විසින් වියදම සහතික කිරීමට පෙර අධීක්ෂණය කිරීම කල යුතුය. තවද භාණ්ඩාගාරය විසින් වාර්ෂික ප්‍රතිපාදන මගින් ගුවන් හමුදාවට 224 දරණ වැය ශීර්ෂයට වෙන්කරන මුදලින් මෙසේ සුභාසාධන අරමුදල් සඳහා ගෙවීම් කිරීමට අනුමැතියක් ලබා නොදිය යුතුය | ශ්‍රී ලංකා ගුවන් හමුදා විධායක සුහසාධක අරමුදල මගින් ගුවන් හමුදාවේ හදිසි වියදම් අවශ්‍යතා සපුරා ගැනීමට මෙසේ කලද රජයේ නියමිත ටෙන්ඩර් පටිපාටියට අනුකූලව ප්‍රතිපූර්ණය කරනු ලැබේ. නියමිත පරිදි ටෙන්ඩර් ලිපිගොනු සකසා අදාල බිල්පත් සමග අනුමැතිය සඳහා ඉදිරිපත් කර මුදල් අධ්‍යක්ෂක මගින් මුදල් ප්‍රතිපූර්ණය කරනු ලබන බව දන්වා ඇත. | වර්තමානයේද මෙම තත්ත්වයම පවතී. |
| 4. | කටුනායක මූලික කඳවුරේ වාහන අළුත්වැඩියා අංගනය පරීක්ෂා කිරීමේදී 2019 නොවැම්බර් 05 දිනට ඩිෆෙන්ඩර් රථ 31 පැවති අතර ඉන් වාහන 16 ක් වසර 2 ත් වසර 08 ත් අතර කාලයක සිට පැවතිණි. තවද අනෙකුත් වාහන 145 ක් පැවති අතර ඉන් වාහන 25 ක් වසර 04 කට වඩා වැඩි කාලයක සිට පැවති අතර භාවිතයට ගත නොහැකි වාහන 84 ක් අපහරණය සඳහා නිර්දේශ කර ඇතත් වසරකට වැඩි කාලයක සිට | දිරා පත් වීමට පෙර මෙම වාහන කඩිනමින් අළුත්වැඩියා කිරීම් කල යුතු අතර අලුත්වැඩියා කළ නොහැකි වාහන කඩිනමින් අපහරණ කළ යුතුය. | අවශ්‍ය අමතර කොටස් ගෙන්වා අළුත්වැඩියා කිරීමට පියවර ගන්නා අතර භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2021 /12/10 දින වන විට ඩිෆෙන්ඩර් 36 ක් අළුත්වැඩියාව අවසන් නොකර පැවතුණු අතර ඉන් ඩිෆෙන්ඩර් 18 ක් වර්ෂ 01-09 ක් වූ කාලයක් තිස්සේ අලුත්වැඩියාවට බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි. වාහන 102 ක් වර්ෂ 1-10 ක් අතර කාලය තුල අළුත් වැඩියා අවසන් නොකර පැවතුණි.වසර 06 කට පෙර අපහරණය කල යුතු යැයි නිර්දේශිත |

| | | | | |
|---|---|---|---|---|
| | අපහරණය කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. | | | වාහන 31 ක් අපහරණය කර නොතිබුණි. වාහන 23 ක් ලියකියවිලි ප්‍රමාදය හේතුවෙන් අපහරණයට සූදානම් කර නොතිබුණි. |
| 5. | 2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් මෙහෙයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි. මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් නොවී පැවති බවද තවදුරටත් නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි සහ 2016 ජූනි 24 දින පැවැත්වූ රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේ නියෝග ප්‍රකාරව ලාභ උපයන ව්‍යාපෘති වල මෙහෙයුම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණ කටයුතු විධිමත් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ. | මෙම අරමුදල් ගුවන් හමුදා නියෝග අංක 852 අනුව පිහිටුවා ඇති අතර එම අරමුදල් ගුවන් හමුදා විධායක විගණන අංශය විසින් විගණනය කරනු ලබන බව දන්වා ඇත. | වර්තමානයේද මෙම තත්ත්වයම පවතී. |
| 6. | 2020 මාර්තු සිට ජූලි මාසය දක්වා ගුවන් හමුදා සුභ සාධක අරමුදල වෙත රු.4,075,530 ප්‍රතිපූර්ණය කර තිබුණු අතර එයට අදාල සැපයුම්කරුගේ ඉන්වොයිස් පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි . | විගණනයේ විෂය පථය සීමා නොවන ලෙස අවශ්‍ය මූලික ලිපිලේඛන විගණන අංශවලට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. | මෙවැනි විගණන නිරීක්ෂණ අනාගතයේදී ඇති නොවන පරිදි අදාල බිල්පත් ගෙවීම් වවුචර් සමග ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අංශ | මෙවැනි ගෙවීම් වර්තමානයේදීද පවතී. ඉන්වොයිස් මේ දක්වා ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලද බව දන්වා ඇත. | |
| 7. | මුදල් 128 (2) (ඉ) ප්‍රකාරව ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වේ. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රාජ්‍ය ආයතන 10 ක් හා පෞද්ගලික ආයතන 02 කින් වර්ෂ 02 සිට වර්ෂ 17 ක කාල පරාසයක සිට අය විය යුතු එකතුව රු. 12,674,073 ක් හිඟ ගුවන්යානා කුලී ආදායම් පැවතුනි. | ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාත් තාත්වික සහ නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කල යුතු වීම හා එම හිග ආදායම් අයකර ගැනීමට කාලීන හා කාර්යක්ෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කලයුතු වීම. | නැවත මෙලෙස හිගහිටීම් ඇති නොවන ආකාරයකට අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කොට ක්‍රියාත්මක කර ඇත | 2021/12//31 දිනට රු. 12,674,073 ක් වූ හිඟ ආදායමක් පැවතුණු අතර එය වර්ෂ 03 සිට 18ක කාල පරාසයක සිට හිඟ හිටව පැවතුණි. |
| 8. | වර්ෂ 2004 ත් 2014 අතර කාලය තුලඅළුත්වැඩියාව සඳහා ගුවන් යානා කොටස් 72 ක් විදේශයන් වෙත යවා තිබූ අතර එම ගුවන් යානා කොටස් වර්ෂ 06 ත් වර්ෂ 16 ත් කාල පරාසය තුල නැවත ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි. | විදේශයන් වෙත යවන ලද වත්කම් වල අධීක්ෂණය නිසි පරිදි පවත්වාගැනීම හා එම වත්කම් යථා පරිදි නැවත ලබා ගැනීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ක්‍රියාත්මක කල යුතු වීම. | 2004 – 2019 දක්වා කාලයට අදාල විදේශවලට යවන ලද ගුවන් යානා අමතර කොටස් සඳහා පරීක්ෂණ අධිකරණයක් පත්කර පරීක්ෂණ විභාග වෙමින් පැවතීම. ගුවන් හමුදා මූලස්ථාන අධීක්ෂණය යටතේ පැවතීම හා 2016 – 2019 දක්වා ගුවන් යානා කොටස් වර්තමානයේ විදේශයන් වල නඩත්තු කටයුතු සිදු කරමින් පැවතීම යනාදී හේතූන් ඉදිරිපත් කර ඇත. | විදේශයන් වෙත යවා තිබූ නව මිලදී ගැනීම් මිල/ අළුත්වැඩියා මිල සුන්බුන් අගය පිළිවෙලින්<br>USD 563,200<br>USD 149,525<br>USD 456,218<br>එකුතුව ලෙස USD 751,047 ක් වූ ගුවන් යානා අමතර කොටස් 64 ක් හා වටිනාකම සඳහන් නොවූ ගුවන යානා අමතර කොටස් 7 ක් වර්ෂ 7-17 ප්‍රමාදයකින් යුතුව ගුවන් හමුදාවට නැවත ලැබී නොතිබුණි. |

<table>
<tr><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>9.</td><td>සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරීලත් නිලධාරීන් අනුමත සංඛ්‍යාව 2545 ක් වූ අතර ඉන් පුරප්පාඩු 488 ක් පැවතුණි. අධිකාරි නොලත් (සෙසු නිලයන්) නිලධාරීන් අනුමත සංඛ්‍යාව 34,344 ක්වූ අතර ඉන් පුරප්පාඩු 2953 ක් විය. සෙසු නිලයන්ගේ වැඩිම පුරප්පාඩු සංඛ්‍යාවක් එනම් පුරප්පාඩු 1956 ක් නායක ගුවන්භට හා ගුවන්භට තනතුරු සඳහා විය.</td><td>අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට උපකාරී වන ප්‍රශස්ථ සේවක මණ්ඩලය පවත්වා ගැනීම උදෙසා පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර පවත්වා ගත යුතු වීම.</td><td>මුලු පුරප්පාඩු වලින් පුරප්පාඩු 478 ක් සම්පූර්ණ කර ඇත.</td><td>2021/12/31 දිනට පැවති පුරප්පාඩු පහත පරිදිය.<table><tr><td></td><td>අනුමත</td><td>පුරප්පාඩු</td></tr><tr><td>අධිකාරි ලත්</td><td>2557</td><td>316</td></tr><tr><td>අධිකාරි නොලත්</td><td>34391</td><td>3807</td></tr></table></td></tr>
</table>

ශීර්ෂ 225 - පොලිස් දෙපාර්තමේන්තුව

| | විගණනයේ නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම අනුව 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.885,556,999 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.805,583,741 ක් විය. ඒ අනුව රු.79,973,258 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂයන්ගේ වෙනස්කම් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම වෙනස 2011 වර්ෂයට පෙර සිට පැවත එන වෙනසක් වන අතර 2015 දෙසැම්බර් 31 වන දිනට රු. 79,973,258 ක් දක්වා අඩු වී ඇත. | දෝෂ හඳුනාගෙන නිවැරදි කිරීම් වාර්ෂිකව සිදු කෙරෙමින් පැවතීම මත 2015 වර්ෂයෙන් පසු රු. 6,347,336 කින් වෙනස අඩුකරගෙන ඇතත්, රු. 79,973,258 ක වෙනසක් තවදුරටත් පවතී. |
| 2. | 2013 වර්ෂයේදී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු. | අදාල අරමුණු සඳහා ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. | ස්ථාපිත කර ඇති දත්ත පද්ධතියේ අඩුපාඩු නිවැරදි කිරීමට, සෙසු රටවල් වල දායකත්වයද ලබා | අදාල කාර්යය සඳහා මෙම මුදල උපයෝජනය කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 11,503,192 ක මුදලක් අදාල කාර්යය සඳහා උපයෝජනය නොකර වසර 07 කට වැඩි කාලයක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | | ගෙන මෙම මුදල් වැය කිරීමට අපේක්ෂා කෙරේ. | |
| 3. | 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතේ V කොටසේ ඇතුලත් 'මුදල්' සම්බන්ධ කටයුතුවලට අදාල "ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුදල" පිහිටුවීම හා පනතේ ඊට අදාල 22 සිට 28 දක්වා වූ කාර්යයන් හා කර්තව්‍යයන් සිදුව නොතිබුණි. | "අරමුදල" පිහිටුවා පනත ප්‍රකාර කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුය. | අරමුදල පිහිටුවීමට අදාල ප්‍රතිපාදන වෙන්කර ගැනීමට ඉල්ලීම් සිදු කර ඇත. | මෙම ආයතනයේ මූල්‍ය කටයුතු පවත්වාගෙන යාම සඳහා පිහිටුවිය යුතු අරමුදල මෙතෙක් පිහිටුවා නැති අතර උප ගිණුම් ඒකකයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. |
| 4. | පොලිස් ත්‍යාග අරමුදල හැර ශ්‍රී ලංකා පොලිසිය යටතේ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 61 ක් පැවති අතර 2020 දෙසැම්බර් 31 දිනට එම අරමුදල් වල මුදල් ශේෂ එකතුව රු.මිලියන 103.37 ක් ද ස්ථාරව තැන්පතුවල ආයෝජන වටිනාකම රු.මිලයන 331.93 ක් ද විය. මෙම අරමුදල් සම්බන්ධයෙන් වූ අරමුදල් කළමනාකරණය, අයවැය, ගිණුම් තැබීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරිම සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 876 හා 877 ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 876 අනුව ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව දැනට අධ්‍යයනය කරමින් පවතී. | මෙම අරමුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 876 හා 877 ප්‍රකාරව කටයුතු සිදු නොවේ. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හා සංශෝධන සිදුකල යුතු ක්ෂේත්‍ර 16 ක් ද 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබූ අතර 2021 ජූනි මාසය වන විටත් පනත සංශෝධනය වී නොතිබුණි. | හඳුනාගත් ක්ෂේත්‍රයන්ට අදාලව පනත සංශෝධනය කළ යුතුය. | පනත සංශෝධනයට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී. | මහජන අදහස් හා යෝජනා විමසීමක් සිදු කර ඇත. මේ දක්වා අදාල කටයුතු අවසන් කර නැත. |
| 6. | ශ්‍රී ලංකා පොලීසියේ තත්කාලීනව පවත්නා අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන නිසි පරිදි යාවත්කාලීන කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමටත් අනාගතයේ යහපත් සහ කාර්යක්ෂම පොලිස් සේවාවක් රටතුළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීමේ අරමුණින් පිහිටුවා තිබූ කමිටුවේ වාර්තාව "පොලිස් ප්‍රතිසංවිධාන ක්‍රියාකාරී සැලැස්ම" ලෙස 2017 මැයි 31 දින එළිදක්වා තිබුණද 2021 ජූනි දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | හඳුනාගෙන ඇති ප්‍රතිසංවිධාන කටයුතු සිදු කළ යුතුය. | පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශය මඟින් අධ්‍යයන සිදු කිරීම, නිර්දේශ ඉදිරිපත් කිරීම, විෂය පථය හඳුනාගෙන සංඛ්‍යා දත්ත රැස් කිරීම වැනි පියවරයන් ක්‍රියාත්මක කරමින් සිටී. | පොලිස් ප්‍රතිසංවිධාන ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. |
| 7. | 2019 අංක 10 දරණ මෝටර් වාහන (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර | රථ වාහන නීති කඩකරන වැරදිකරුවන් එම වරද සිදු කරන වාර | ICTA විසින් සකස් කර ඇති දඩ පත්‍රිකා විද්‍යුත් ගෙවීම් ක්‍රමවේදය අනුව ක්‍රියාත්මක | මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව නිවැරදි දඩ මුදල් අයවීම, අදාල සංශෝධන සිදුකර |

| | | | | |
|---|---|---|---|---|
| | ගණන අනුව දඩ මුදල් අයකිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරිම 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදුකරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි දත්ත පරිගණක ගත කිරීමේ ක්‍රමයක් ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදුකරන වරදකරුවන් ගෙන් නිවැරදි දඩ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ගණන හඳුනාගත හැකි පරිගණක පද්ධතියක් ස්ථාපිත කර ඒ අනුව නියමිත දඩ මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. | කිරීමට ඉදිරියේදී සැලසුම් කර ඇත. | වසර 03 කට ආසන්න කාලයක් ගතවී ඇතත් තවදුරටත් සිදු නොවේ. |
| 8. | පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලධාරීන් සඳහා හිස්වැසුම් 75,000 ක් රු.93,455,119 කට මිලදී ගැනීමට 2011 වර්ෂයේ ආරම්භ කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදුව තිබූ අවිධිමත් කරුණු නිසා බේරුම්කරණයේදී 2017 ජනවාරි 21 දින ලබා දී තිබූ තීන්දුව වූ හිස්වැසුම් 75,000 සඳහා වූ මුදල සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ගෙවීම ශ්‍රී ලංකා පොලීසිය විසින් ප්‍රතික්ෂේප කරමින් අඛණ්ඩව අධිකරණ ක්‍රියාමාර්ගයක යෙදී තිබුණි. 2020 අගෝස්තු මාසය වන විට මෙම හිස්වැසුම් මිලදී ගැනීම සඳහා රු.191,768,632 ක් ද අනෙකුත් ගාස්තු ලෙස රු.45,316.880 ක් ද ගෙවීමට නියමිතව තිබුණි. 2021 ජූනි මාසය වන විටත් අධිකරණ | මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය මත රජයට දැරීමට සිදුවන අමතර වියදම් සම්බන්ධයෙන් වගකිවයුත්තන් හඳුනාගෙන නීති ප්‍රකාර කටයුතු කළ යුතුය. | පැමිණිලිකාර සමාගමට ගෙවිය යුතු ගෙවීම් සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සඳහා රු. මිලියන 150 ක් ලබා ගැනීම සඳහා 2021.04.06 දින ඉල්ලීම් කර ඇත. | 2021.07.22 දිනද අමතර ප්‍රතිපාදන ඉල්ලීම් සිදු කර ඇතත් ලැබී නැති අතර, මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු සම්බන්ධයෙන් වගකිවයුත්තන් හඳුනාගෙන නීති ප්‍රකාර කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු අවසන්ව නොතිබුණු අතර සැපයුම් කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වැඩිවීමේ අවාසියද ශ්‍රී ලංකා පොලීසිය දැරිය යුතුබවට සැපයුම්කරු ඉල්ලා තිබුණි. | | | |
| 9. | පොලිස් අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරිමට මල්වාන පිහිටි අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක් වූ ඉඩම ශ්‍රී ලංකා පොලීසියට පවරා දීම සඳහා 2017 ජුනි මස 20 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද 2021 ජුනි මස වන විටත් පවරාගෙන නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි මෙම ඉඩමෙහි පවරා ගැනීම පිළිබඳ කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. | තක්සේරු වාර්තාවක් ලබාගැනීම හා මැණුම් කටයුතු සිදුකිරීම සඳහා අදාල ආයතන වලට දැනුම් දී ඇත. | ඉඩම පවරාගැනීමට අදාල මූලික කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් පවරාගැනීම සිදුව නැත. |
| 10. | සහායක සේවා කාර්ය මණ්ඩලයේ තනතුරු 14 ක් සඳහා තවදුරටත් පවතින පුරප්පාඩු වෙනුවෙන් නිලධාරීන් 3,923 ක් බඳවාගෙන නොතිබුණි. මෙම තත්ත්වය ශ්‍රී ලංකා පොලීසියේ වෛද්‍ය කොට්ඨාශය, ගොඩනැගිලි කොට්ඨාශය, තොරතුරු තාක්ෂණ කොට්ඨාශය වැනි අංශයන්ගේ රාජකාරී උපරිම කාර්යක්ෂමතාවයකින් සිදුකර ගෙන යාමට බාධාවක් වී තිබුණි. | සහයක සේවයේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. | වෘත්තීන් 34 කට අදාල මෙම බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය අනුමතකර ඇති අතර පුරප්පාඩු පිරවීම ආධුනිකයාන් බඳවා ගන්නා කොට්ඨාශය මඟින් සිදු කරයි. | සහායක සේවයේ පුරප්පාඩු තවදුරටත් පවතී. |

ශීර්ෂ 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| | 2018 | | | |
| 1. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 5.3.13 හා 5.4.10 (ආ) වගන්ති ප්‍රකාරව මෝටර් රථයක් ලබා ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී ලංසුකරුවන් විසින් රු.200,000 වටිනා ලංසු සුරක්ෂණයන් හා රු.195,600ක් වටිනා වලංගු වන කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවීම. | කාර්ය සාධන සුරක්ෂණ, ලංසු සුරක්ෂණ ලබා ගැනීම සිදු කරයි. | නියැදි පරීක්ෂාව අනුව 2021 ප්‍රසම්පාදන සඳහා එම සුරක්ෂණ ලබා ගෙන ඇත. ඉහත නිරීක්ෂණ නිවැරදි කර නැත. |
| 2. | 2018 දෙසැම්බර් 31 දින වන විට මැද පෙරදිග රටවල් සඳහා වෙනම ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමේ කටයුතු අවසන් කර තිබුණි. එසේ වුවද මැදපෙරදිග රටවල් සඳහා නිකුත් කරන රු.2,580,000ක් වටිනාකමැති හිස් විදේශ ගමන් බලපත්‍ර 4,000 ක තොගයක් ගබඩාවේ පැවතුණි. | රජයට පාඩුව අවම වන ලෙස කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී සරණාගතයින් සඳහා පමණක් හෝ දඹදිව වන්දනා චාරිකා සඳහා පමණක් හෝ නිකුත් කිරීමට තීරණය කර ඇත. | 2019 ජනවාරි 01 දින සිට රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත සියළුම රටවල් සඳහා එක් ගමන් බලපත්‍රයක් නිකුත් කරයි. 2021 දෙසැම්බර් 31 දිනට ද මෙම බලපත්‍ර 4,000ක් ගබඩාවේ පැවතුණි. |
| 3. | 2018 වර්ෂයේ නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍රවලින් විවිධ දෝෂයන් හේතුවෙන් රු.2,957,970ක් වටිනා ගමන් බලපත්‍ර 4,586ක් අවලංගු කර තිබුණි. | දෝෂයන් අවම කිරීමට කටයුතු කළ යුතුවීම. | මුද්‍රණ දෝෂ පද්ධති හා වෙනත් දෝෂ නිසා ගමන්බලපත්‍ර අවලංගු කිරීමට සිදුවී ඇත. | වර්ෂයේදී නිකුත් කරනලද විදේශ ගමන් බලපත්‍ර 286,012කින් විවිධ දෝෂයන් හේතුවෙන් ගමන් බලපත්‍ර 2,861ක් අවලංගු කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | **2019** | | | |
| 4. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 8.9.1.(ආ) වගන්තිය ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කල යුතු වුවත් රු.4,829,278ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ සහ CCTV කැමරා මිලදී ගැනීම සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල යුතු වීම. | ගිවිසුම් අත්සන් නොකර මිලදී ගැනීම් සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුගත නොවූ අවස්ථා පැවතුණි. |
| 5. | නියමිත කාලයේදී භාවිතා නොකිරීම නිසා ගබඩාවේ පැවති රු.6,472,571ක් වටිනා හිස් විදේශ ගමන් බලපත්‍ර වර්ග 07ක් අපහරණය කර තිබූ අතර රු.3,889,685ක් වටිනා හිස් විදේශ ගමන් බලපත්‍ර වර්ග 04ක් වර්ෂ 15ක පමණ කාලයක සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි. | රජයේ මුදල් නාස්ති නොවන ආකාරයට භාවිතා කල යුතු වීම. | ඉන්දියාවේ සරණාගත කඳවුරුවල වෙසෙන පුද්ගලයින්ට එක්වතාවක් පමණක් ලංකාවට පැමිණීම සඳහා මෙම බලපත්‍ර තොගය භාවිතා කිරීමට තබා ගෙන ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට මෙම වර්ගයේ බලපත්‍ර 3,000ක් තොගයේ ඇත. |
| 6. | දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය එනම් මෘදුකාංග හා ආශ්‍රිත දත්ත සහ ප්‍රත්‍යාන්ත පාලන පද්ධතිය, වීසා සැකසීම, ගමන් බලපත්‍ර පද්ධතිය, පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පද්ධතිය යනාදී පද්ධති සඳහා Informatic International (Pvt) Ltd ආයතනය සමඟ 2003 ජුනි 16 දින පටන් ගිවිසුමට එළඹ තිබුණි. එදින සිට 2019 වර්ෂය දක්වා රු.135,154,160ක් එම ආයතනයට ගෙවා තිබුණු අතර එම පරිගණක පද්ධතිය තුලින් ගමන් බලපත්‍ර ලේඛණගත කිරීම, ගමන් බලපත්‍ර නිකුත් කිරීම් හා පරිගණකගත කිරීම් අතර | පරිගණක පද්ධතිය ඇසුරින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට කටයුතු සැලසිය යුතු වීම. | 2021 වර්ෂයේදී මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආයතන 6කට රු.මිලියන 145.7ක් ගෙවීම් කර තිබුණි. | ඉල්ලා ඇති තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය ප්‍රවේශයන් මේ දක්වා සැකසී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙනස්කම් හඳුනා ගැනීම සඳහා වාර්තා ලබා දිය නොහැකි මට්ටමක පැවතුණි. | | | |
| 7. | දෙපාර්තමේන්තුවේ විදේශදූත මණ්ඩල අංශයෙන් සමාලෝචිත වර්ෂයේ ගමන්බලපත්‍ර නිකුත්කිරීමේදී ලැබුණු ආදායම වෙනම හඳුනාගත නොහැකිවූ බැවින් එම ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අදාල ආදායම සත්‍ය වශයෙන්ම ලැබුණේද යන්න තහවුරු කරගත නොහැකිවුණි. වාර්ෂිකව රු.මිලියන 8.4ක් වැයකර නඩත්තු කරන පරිගණක පද්ධතිය තුලින්ද මෙය තහවුරු කරගත නොහැකිවිය. | විදේශදූත මණ්ඩල අංශයෙන් නිකුත් කරන ගමන් බලපත්‍ර ආදායම වෙනම හඳුනාගත හැකි ක්‍රමයක් හඳුන්වා දිය යුතු වීම. | තොරතුරු තාක්ෂණ අංශයෙන් ලිඛිත වාර්තාවක් ලෙස අදාල තොරතුරු ලබා ගැනීමට පහසුකම් ඇත. | විගණන අංශයට අවශ්‍ය මෙම තොරතුරු පරිගණක පද්ධතිය තුලින් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ලබා දී නොමැත. |
| | **2020** | | | |
| 8. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂය අවසානයේ ලැබිය යුතු ශේෂය රු.162,416,726ක් වුව ද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු ශේෂය රු.161,935,932ක් වූ බැවින් ලැබිය යුතු ශේෂය රු.480,794ක වෙනසක් නිරීක්ෂණය විය. 2019 වර්ෂයේදී ද මෙම වෙනස පිළිබඳ විගණකාධිපති විසින් වාර්තා කලද මේ දක්වා නිවැරදි කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමේ කටයුතු කඩිනම් කිරීම. | පැරණි දත්ත හා ලේඛන පරීක්ෂා කිරීමට කටයුතු කරයි. | 2021 වර්ෂය අවසානය වන විටත් මෙම ශේෂය නිරවුල් වී නොතිබුණි. |
| 9. | 2013 වර්ෂයේ සිට ජංගම ගිණුමේ ඩොලර් 700ක නිෂ්කාෂණය නොවූ ලැබීම් පැවතුණු අතර වර්ෂ අවසානයේ පියවීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි ගිණුම්කරණ දත්ත පවත්වා ගැනීම හා විගණනය වෙත නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම. | ගුවන්තොටුපලේ සරප් වෙත ඩොලර් ගනුදෙනු සඳහා ලබා දී ඇති අතුරු අග්‍රිමයක් බව තොරතුරු දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව එම අග්‍රිමය පියවීමක් සිදු නොවන අතර ඒ සම්බන්ධ අවශ්‍ය ලේඛන ද නඩත්තු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 10. | විදේශ දූත මණ්ඩල අංශය විසින් ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය පිළිබඳව මෙහෙයුම් අත්පොතක් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබූ අතර එහි 8 හා 9 වගන්ති අනුව උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත්, ගමන් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයේ අමුණා තිබිය යුතුය. එසේ වුවද 2020 වර්ෂයේදී නිකුත් කළ ගමන් බලපත්‍ර 50ක නියැදියකින් 12කම ගමන් බලපත්‍ර ඉල්ලුම්පත සමඟ අදාල ඡායා පිටපත් ඇතුළත් කර නොතිබුණි. තවද මුදල් ගෙවීමට අදාල ලදුපතේ ඡායා පිටපත් ද අදාල ඉල්ලුම් පත්‍රයේ අමුණා නොතිබුණු අතර පරිලෝකනය කල දත්තයන්හි ද එම තොරතුරු ඇතුළත් වී නොතිබුණි. | අදාල අභ්‍යන්තර පාලන රෙගුලාසි විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීම. | පෙර ගමන් බලපත්‍රයේ ඡායා පිටපත් හා පරිලෝකනය කරන ලද තොරතුරු පදනම් කරගෙන බලපත්‍ර නිකුත් කරනු ඇත. | කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් වෙනුවෙන් මෙහෙයුම් අත්පොතේ අවශ්‍ය සංශෝධනයන් මේ දක්වා සිදුකර නැත. |
| 11. | 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය 1292ක්ද තත්‍ය කාර්යමණ්ඩලය 1040ක්ද වූ අතර පුරප්පාඩු හා අතිරික්ත කාර්යමණ්ඩලය පිළිවෙලින් 253ක් හා 01ක් විය. | කාර්යමණ්ඩල පරිපාලනය විධිමත් කිරීම. | පුරප්පාඩු පිරවීමට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් යොමු කර ඇත. තරඟ විභාග පැවැත්වීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් වෙත තොරතුරු යොමු කර ඇත. | 2021 ඔක්තෝම්බර් 01 දිනට පුරප්පාඩු 270ක් ඇත. අදාල විභාග පැවැත්වීම මේ දක්වා සිදුකර නැත. |

ශීර්ෂ 227 - පුද්ගලයන්ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>-------------------------- | ආයතනය විසින් ගනුලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග<br>------------------------ | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>---------------- |
|---|---|---|---|---|
| | **2018** | | | |
| 1. | ද්විත්ව අයදුම්පත් ඉදිරිපත් කිරීම, එකම අංකයට වෙනත් පුද්ගලයින්ගේ ඡායාරූප පැවතීම, සංශෝධිත අයදුම්පත් සමඟ විකෘති කරන ලද හැඳුනුම්පත් හා වෙනත් පුද්ගලයන්ට හිමි හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම, ව්‍යාජ උප්පැන්න සහතික ඉදිරිපත් කිරීම වැනි හේතු මත දෙපාර්තමේන්තුවේ නිති අංශයට ගැටලු සහිත අයදුම්පත් 8609 ක් ලැබී තිබුණු අතර ඉන් අයදුම්පත් 3,096 ක් හෙවත් සියයට 36 ක වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | පැන නැගි ඇති ගැටළු කඩිනමින් විසදා වයස සම්පූර්ණ වූ සෑම පුද්ගලයෙකුටම හැඳුනුම්පතක් නිකුත් කිරීම කළ යුතු වීම. | නීති අංශය මගින් අදාල ඉල්ලුම්පත් සම්බන්ධ සාවද්‍යතාවයන් පිළිබඳව ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබුවද නියමිත තොරතුරු ඉදිරිපත් නොකර පද්ධතිය තුල දීර්ඝ කාලයක් පවතින ඉල්ලුම්පත් තාවකාලිකව පද්ධතියෙන් අවලංගු කිරීමට කටයුතු කිරීම. (2014-2019 දක්වා ඉල්ලුම්පත් තාවකාලිකව පද්ධතියෙන් අවලංගු කර ඇත.) | 2021.12.31ට නීති අංශයට ලැබුණු ගැටළු සහිත අයදුම්පත්‍ර 2,067ක් තිබුණි. |
| 2. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර 2018 වර්ෂයේ සැප්තැම්බර් මස නිම කිරීමට අපේක්ෂා කලද උතුරුමැද, ඌව සහ සබරගමුව පළාත් කාර්යාල ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් සොයාගත නොහැකි වීම මත එම ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකිරීමට කඩිනම්ව කටයුතු කිරීම. | පළාත් සඳහා සුදුසු ස්ථාන පරීක්ෂා කරමින් අදාල ආයතන වලින් ඉල්ලීම් කර ඇත. | මෙම ව්‍යාපෘතිය තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යාපෘතියක් වන අතර අදාල ව්‍යාපෘතිය සඳහා කාර්යාල ස්ථාපිත කිරීම මේ දක්වා සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 3. | 2018 වර්ෂයේ සැප්තැම්බර් මස නිම කිරීමට අපේක්ෂා කල පුරවැසියන්ගේ ජීවමිතික දත්ත රැස්කිරීම සඳහා අදාල උපකරණ සැපයීම හා සවිකිරීම, සන්නිවේදන උපකරණ ස්ථාපිත කිරීම සහ පුද්ගල දත්ත රැස්කිරීම සම්බන්ධයෙන් අදහස් ලබාගැනීම, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් ලබාගැනීම යනාදිය සඳහා රු.මිලියන 545 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුවීම. | ඊ-ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා 2020.11.16 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | 2022.12.31 දක්වා ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කර ඇත. 2021 වර්ෂය සඳහා සංශෝදිත අයවැය වටිනාකම රු. මිලියන 618කි. |
| 4. | ස්වයංක්‍රීය ඇඟිලි සලකුණු හඳුනාගැනීමේ මෘදුකාංග ප්‍රසම්පාදනය හා දත්ත මධ්‍යස්ථානය සඳහා දෘඩාංග මිලදීගැනීමට, පුරවැසි දත්ත රැස් කිරීමේ කාර්යයට අදාලව නිලධාරීන් පුහුණු කිරීම දත්ත විද්‍යුත්කරණය කිරීම සහ ජාතික පුද්ගල නාම ලේඛනය ස්ථාපිත කිරීම, පුද්ගලාරෝපන පද්ධතිය වැඩි දියුණු කිරීම, විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීම විද්‍යුත් හැඳුනුම්පත් කාඩ්පත් ප්‍රසම්පාදනය සහ විද්‍යුත් හැඳුනුම්පත නිකුත්කිරීම විමධ්‍යගතකරණය හා දත්ත තහවුරු කිරීමේ ක්‍රියාවලිය හා පරිශීලක අවශ්‍යතා හඳුනාගැනීම් අදාල ක්‍රියාවලිය සඳහා රු. මිලියන 5,082.50 ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් වර්ෂය අවසාන වනවිටත් එම කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුවීම. | මෘදුකාංග ප්‍රසම්පාදනය හා දෘඩාංග ප්‍රසම්පාදන කටයුතු ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) විසින් කරනු ලැබේ. | තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. විධිමත් සැලැස්මක් නොමැති බැවින් ප්‍රගතිය මැනිය හැකි තත්ත්වයක් නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 වෙත 2015 වර්ෂයේදී පුද්ගල දත්ත නාමාවලින් සකස් කිරීම සඳහා ලබා දුන් අයදුම්පත්‍ර, අත්පත්‍රිකා, උපදෙස් පත්‍රිකා, ඇඟිලි සලකුණු පරිලෝකන පත්‍රිකා ආදිය භාවිතා නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රවල අනාරක්ෂිත ස්ථානවල ගබඩා කර තිබූ අතර මේවායේ වටිනාකම රු. මිලියන 396.35 ක් පමණ විය. | වසර 4 ක කාලයක් භාවිතයකින් තොරව විනාශවෙමින් පවතින නිසා ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම. | භාණ්ඩ හා ලිපිද්‍රව්‍ය වලින් e-NIC අයදුම්පත් සහ ක්ෂණික ප්‍රතිචාර කේත (QR Stickers) පමණක් නැවත භාවිත කල හැකි තත්ත්වයේ පවතී. | භාවිතයට ගත නොහැකි ද්‍රව්‍ය අපහරණය කිරීමට හෝ වෙනත් විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. |
| | **2019** | | | |
| 6. | හම්බන්තොට සූරියවැව තාක්ෂණික උද්‍යානයේ ආපදා ප්‍රතිසාධන දත්ත මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධයෙන් රු.මිලියන 68.5 ඇස්තමේන්තුවට අදාලව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත රු.11,776,333 ක් ගෙවා තිබුණි. එහෙත් එම මධ්‍යස්ථානයේ ඉදිකිරීම වෙනත් ස්ථානයකට ගෙනයාම හේතුවෙන් අවස්ථා තුනකදී රු.9,901,137 ක් කාර්යංශය විසින් ආපසු ගෙවා තිබුණද, ඉතිරි මුදල වූ රු.1,875,196 ක් විගණිත දිනය දක්වා ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි වටිනාකම එම ආයතනයෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම ගණනය කිරීම තුල එකතු කල අගය මත බද්ද ද ඇතුලත් වී ඇති බැවින් අයවිය යුතු වටිනාකම නිරවුල් කර ගනිමින් බවතී. | 2021 වර්ෂය අවසානය දක්වා ඉතිරි මුදල අයකර ගෙන නොතිබුණි. |
| 7. | තාවකාලික (Interim) ජාතික හැඳුනුම්පත හඳුන්වා දී ඇත්තේ විද්‍යුත් ජාතික හැඳුනුම්පත හඳුන්වා දෙන තෙක් පමණක් වන අතර, විද්‍යුත් ජාතික හැඳුනුම්පත හඳුන්වා දීම ප්‍රමාද | ජාතික හැඳුනුම්පත හඳුන්වාදීම කඩිනමින් සිදුකල යුතුව පවතින අතර දෛනික ජාතික හැඳුනුම්පත ඉල්ලුම්කරුවන් වෙත | ප්‍රාදේශීය වශයෙන් අවශ්‍ය පුහුණු කිරීමේ හා අන්තර්ජාල පහසුකම් ලබා දීමේ කටයුතු ආරම්භ කර ඇත. ඡායාරූපගාර | දත්ත රැස් කිරීමේ කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වීම නිසා මෙම තාවකාලික ජාතික හැඳුනුම්පත් කාඩ්පත වෙනුවෙන් මෙතෙක් රු.360,140,662 ක මුදලක් වැය කර තිබුණි. විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය වනතෙක් අවසන් වී නොමැති අතර, 2019 වර්ෂයේ අවස්ථා 03 කදී අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් කාලය දීර්ඝ කර තිබුණි.<br>එසේම 2011 වර්ෂයේ සිට 2020 සැප්තැම්බර් දක්වා ව්‍යාපෘතිය වෙනුවෙන් මුළු වියදම රු. 2,250,680,000 ක් දරා තිබුණද විගණිත දිනය දක්වාම විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | ලබා දෙන සේවාවේ ගුණාත්මකභාවය හා අඩුකාලයක් තුළ ලබා දීමට හැකිවන පරිදි පිළිවෙතක් සැකසිය යුතු වීම | 2500 ට අධික සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇත. | |
| | **2020** | | | |
| 8. | 2018 අගෝස්තු 21 දිනැති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2018 හි 04 ඡේදය ප්‍රකාරව ග්‍රාම නිලධාරීන් විසින් හැඳුනුම්පත් සඳහා එකතු කරනු ලැබූ මුදල දින 7ක් හෝ නොවැඩි කාලයකදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දී පොදු 172 කුවිතාන්සියක් ලබා ගත යුතු වුවද ඒ සඳහා දින 09 සිට මාස 4 දක්වා කාල පරාසයක් ගත වූ අවස්ථා 141ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5ක නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරිම | මෙම අඩුපාඩු නිවරදි කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් සහ සංවර්ධන නිලධාරීන් දැනුවත් කර ඇත. මේ තත්ත්වය නිවැරදි කර ගැනීමට චක්‍රලේඛ නිකුත් කර ඇත. | කාර්යාල 16ක නියැදි පරීක්ෂාවට අනුව 2021 වර්ෂයේදී ද රු.135,500ක් වටිනා ලදුපත් 464ක් භාරදීම දින 30ක් ඉක්මවී තිබූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| 9. | 2019 ඔක්තෝබර් සිට 2020 මාර්තු දක්වා සිදුකල පෙර මුද්‍රිත කාඩ්පත් මිලියනයක් නැවත ඇනවුම් කර මිලදී ගැනීමේ ගනුදෙනුව නිවැරදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල වී නොතිබුණු බැවින් 2020 සැප්තැම්බර් 10 දිනැති අංක 02/IS/2020 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුව රු.මිලියන 94 ක් විය. තවද මෙම කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 56.49ක් බැරකම් ලෙස රඳවා ගෙන තිබුණද එම ගනුදෙනුව නිරවුල් කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව, කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීම. | හිඟ මුදල ගෙවීම් කිරීම සඳහා තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්ගෙන් අනුමැතිය ඉල්ලා ඇත. | ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. මේ දක්වා අනුමැතිය ලැබී නැත. |
| 10 | දෙපාර්තමේන්තුව විසින් 2020 ජනවාරි, පෙබරවාරි, ජූලි, අගෝස්තු හා සැප්තැම්බර් යන මාස වල මුද්‍රණය කරන ලද හැඳුනුම්පත් 92,780 ක් අතරින් හැඳුනුම්පත් 5,095 ක් එනම් සියයට 5ක් දෝෂ සහිතව පැවතුණි. | හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ථ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම. | Nic Print Preview Step එක දැනට කියාත්මක වේ. | 2021 වර්ෂයේදී හැඳුනුම්පත් 442,341 ක් මුද්‍රණය කර තිබුණු අතර අදාල වර්ෂයේ දී දෝෂ සහිත හැඳුනුම්පත් ප්‍රමාණය 26,489 ක් විය. 2018 හා 2019 වර්ෂයන්හිදී ද දෝෂ සහිත කාඩ්පත් වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 6.05 ක් හා රු.මිලියන 9.89 ක් වියදම් කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 11. | සාමාන්‍ය සේවය යටතේ හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලියේ මූලික අදියරයන් වන ග්‍රාම නිලධාරී විසින් අයදුම්පත්‍රය භාර ගැනීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත භාර දීම හා අදාල අනුමැතීන් සහිතව ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම යනාදිය වෙනුවෙන් මාස 01 සිට වර්ෂ 01 දක්වා කාලයක් ගතකිරීම තුලින් මහජනතාවට කාර්යක්ෂම සේවයක් ලබා දීමට නොහැකි වී තිබුණු අවස්ථා 166 ක් දිස්ත්‍රික් කාර්යාල 5ක නියැදි විගණනයේදී නිරීක්ෂණය විය. | හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ථ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම. | කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා චක්‍රලේඛ මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් දැනුවත් කර ඇත. | 2021 වර්ෂයේදී ද අඩුපාඩු සහිත අයදුම්පත් වර්ෂයකට වැඩි කාලයක සිට පරිගණක පද්ධතිය තුල පැවති අවස්ථා නිරීක්ෂණය විය. |
| 12 | 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1384ක් ද තත්‍ය කාර්ය මණ්ඩලය 1271ක් ද සහ පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිවෙලින් 123 ක් හා 10 ක් ද විය. | කාර්යමණ්ඩල පරිපාලනය විධිමත් කිරීම. | මෙම පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අවශ්‍ය ලිපි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ව යවා ඇත. | වර්තමානයේ අනුමත කාර්ය මණ්ඩලය 1475 ක් ද, තත්‍ය කාර්ය මණ්ඩලය 1290 ක් ද, පුරප්පාඩු 188 ක් ද වේ. |

ශීර්ෂ 228 - අධිකරණ පරිපාලනය

| | විගණන නිරීක්ෂණය<br><br>-------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br><br>---------------------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br><br>---------------------- | ඒ සම්බන්ධ යෙන් වූ වර්තමාන තත්ත්වය<br><br>------------- |
|---|---|---|---|---|
| | **2020** | | | |
| 01 | 2020 වර්ෂය අවසානයට කේවල ණය ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව සහ පාලන ගිණුමේ ශේෂය අතර රු.12,536,427ක වෙනසක් පැවතුණි. | 2017 ජුලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර වෙනසක් ඇති විට එම වෙනසට හේතු වූ කරුණු පැහැදිලිව සටහන් කළයුතු වේ. | මෙම දෝෂයන් නිවැරදි කිරීමට අදාල කටයුතු සිදු කරන ලෙස කලාප ගණකාධිකාරීන් දැනුවත් කර ඇත. | වෙනස නිවැරදි කර නොමැත. |
| 02 | 2020 සැසඳුම් ප්‍රකාශ අනුව එකතුව රු.28,746,312 ක් වූ හිඟ ණය ශේෂයෙන් වසර 05 කට වැඩි කාලයක් ගත වූ ණය ශේෂවල වටිනාකම රු.7,633,491 ක් වූ අතර එය මුළු හිඟ ණය ශේෂයන්ගෙන් සියයට 26 ක් විය. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. | බොහෝ හිග ණය ශේෂ 1990 දශකයේ සිට අය නොවී පවතින ණය ශේෂ වේ. මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා නිසි තොරතුරු අධිකරණ සතුව නොමැති බැවින් කපා හැරීමටද අසීරු වී ඇත. කෙසේ නමුත් රා.මු. චක්‍රලේඛ 01/2020 අනුව රු.25000 අඩු ණය ශේෂයන් කපාහැරීමට කටයුතු කරන ලදී. | වසර 05 ට වැඩි රු.25,000 ට අඩු අය කර ගත නොහැකි රු.289,369. 11 ක් කපා හැර ඇත. අනෙකුත් ණය සඳහා පියවරක් ගෙන නොමැත. |
| 03 | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය සහ මහාධිකරණ කළාප 23 කට අයත් බැංකු ගිණුම් 48 ක බැංකුවට ඉදිරිපත් නොකළ | මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධව මු.රෙ.396 (ඇ) ප්‍රකාරව කටයුතු | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | මාස 06 ඉක්මවූ රු.2,813,441 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | කරන ලෙස කලාප මහාධිකරණ වෙත දන්වා යැවීමට කටයුතු කරමි. | කිරීම මේ දක්වා සිදුවී නොමැත. |
| 04 | බදු ගිවිසුම් ප්‍රකාරව පූගොඩ දිසා / මහේස්ත්‍රාත් අධිකරණය පවත්වාගෙන යාම සඳහා මාසික කුලිය රු.400,000 කට ලබාගත් තාවකාලික ගොඩනැඟිල්ල අදාළ කාර්යයට භාවිතා නොකර 2019 මාර්තු සිට 2020 ජුනි දක්වා මාස 13 ක කාලයකට රු.6,400,000 ක් බදු කුලී ලෙස ගෙවා තිබුණි. නව අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම නියමිත කාලය තුළ සිදු නොකිරීම නිසා මෙහි බදු කාලය 2021 ජනවාරි 31 සිට 2022 ජූලි 20 දින දක්වා දීර්ඝ කර තිබුණි. | සකසුරුවම් භාවයෙන් වියදම් කළමනාකරණය කළ යුතුවේ. | ගොඩනැගිල්ල අධිකරණයක ස්වරූපයට පත් කිරීම සඳහා කාලයක් ගත වන අතර, එම කාලය සඳහා බදු කුලී ගෙවීම සිදුවන අතර ඉදිරියේදී සකසුරුවම්භාවයෙන් වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා කටයුතු කරමි | ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. |
| | **<u>2019</u>** | | | |
| 5 (අ) | කන්තලේ නව අධිකරණයක් පිහිටු වීමට හඳුනාගෙන ඒ සඳහා 2018 සිට 2020 දක්වා වසර තුනක් තුළ මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැති ලැබී තිබූ අතර 2018 වර්ෂය සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. නමුත් එම වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා වෙන්කල ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.<br>2019 වර්ෂයේදී ද මෙම අධිකරණ සංකීර්ණය ඇතුළුව තවත් ඉදිකිරීම් තුනක් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මගින් රු.273,740,000 ක්ද මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් 40,000,000 ක්ද ලබාදී තිබුණි.<br>2019 ජනවාරි 28 දිනැති ප්‍රසම්පාදන | ඇස්තමේන්තු සකස් කර ලබා ගත් ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා යෙදවිය යුතු වේ. | ඇස්තමේන්තු සකස් කර ලබා ගත් ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා යෙදවීම සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන ලෙස අංශයේ නිලධාරීන් දැනුවත් කරන ලදී. | 2021වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කමිටුවේඅනුමැතිය අනුව 2019 ජුනි 24 දිනැති ප්‍රතිග්‍රහණ ලිපිය කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කර තිබුණද 2020 ජුලි 15 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | | | |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) ප්‍රකාරව කන්තලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2019 ජනවාරි 28 දිනැති ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කර තිබුණේ මාස 05 ක ප්‍රමාදයක් සහිතව 2019 ජුනි 24 දින දීය. තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ ලංසු ඇපකරයේ වලංගු කාලය 2019 ජුනි 28 දිනෙන් අවසන් වී තිබූ අතර කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව පිළිනොගැනීම හේතුවෙන් ලංසු ඇපකරය මුදල් කර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. | ප්රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙවැනි තත්ත්වයන් ඇති නොවන පරිදි ලංසු ඇපකර වල වලංගු කාලය නිශ්චිතව හඳුනාගත හැකි ආකාරයේ ලේඛණයක් පවත්වාගෙන යන ලෙසත් ලංසු ඇපකරයන්හි වලංගු කාලයන් අවශ්‍ය පරිදි දීර්ඝ කර ගැනීමටත් කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | අමාත්‍යාංශයට සිදුවී තිබූ පාඩුව සම්බන්ධයෙන් කටයුතුකර නොතැබුණි. |
| 6.(අ) | නාවලපිටිය පැරණි මහේස්ත්‍රාත් නිල නිවස ඉවත් කර, නව නිල නිවසක් එම ස්ථානයේම ඉදිකිරීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව රු.18,156,471 ක මුදලකට කොන්ත්‍රාත්කරුවකුට ලබා දී තිබුණු අතර 2019 අගෝස්තු 02 දින ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කර තිබුණි. ඒ අනුව දින 14 ක් තුළ වැඩ ආරම්භ කළයුතු බවත්, කොන්ත්‍රාත් කාලය දින 270 ක් බවත් දක්වා තිබුණි. එහෙත් ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කර මාස 11 ක පමණ කාලයක් ගත වී ඇති නමුත් 2020 ජූලි 02 දින වන | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | 2019.09.17 දින ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වී ඇත. කොන්ත්‍රාත්කරු රු.5,716,483.25 ක අත්තිකාරම් ඇපකරයක් 2019.08.15 දිනැති ලිපිය මගින් ලබා දී ඇත. එය තහවුරු කරගැනීමෙන් පසු ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් මුදල් ගෙවා ඇත. නමුත් | මෙවැනි දෝෂයන් ඉදිරියේ දී නොවීමට සටහන් කර ගෙන ඇති අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණු අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2019 නොවැම්බර් 27 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ රු.5,474,984 ක ( Vat බදු සහිතව ) මුදල මාස 07 කට වැඩි කාලයක් කොන්ත්‍රාත්කරු වෙත රඳවා තබා තිබුණි. | | අපේක්ෂා කළ පරිදි විනිසුරුවරයාට කුලී පදනම මත වෙනත් නිල නිවසක් ලබා දීමට ප්‍රමාදවීම නිසා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද විය මෙවැනි දෝෂයන් ඉදිරියේ දී නොවීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත | |
| (ආ) | නාවලපිටිය මහේස්ත්‍රාත් විනිසුරු නිල නිවස ඉදිකිරීම 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත්ව ඇතත් එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලිකම පියවර වූ ඉදිකිරීමට අදාල භූමිය නිරවුල් කර නොගැනීම මත ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | ඉදිකිරීම් කිරීමට ප්‍රථම යෝජිත භූමිය නිරවුල් කර ගැනීම කළ යුතු වේ. | ඉඩමේ භෞතික භුක්තිය අධිකරණ අමාත්‍යාංශය වෙත භාර දී ඇති අතර පවරාදීම් කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම් පවරා දීම් කටයුතු කඩිනමින් සිදු කරන ලෙස නාවලපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇතත් එම කටයුතු නිම වී නොමැත. |
| 7. | ශ්‍රී ලංකාවේ අධිකරණ කලාප 33 කට අයත්ව අධිකරණ 221 ක් පිහිටි ඉඩම් අතුරින් ඉඩම් වල ප්‍රමාණය සඳහන් කර නොමැති අධිකරණ සංඛ්‍යාව 50 ක් ද,ඉඩමේ අයිතිය අධිකරණ අමාත්‍යාංශය සතු යැයි තහවුරු කර ගෙන නොමැති ඉඩම් සංඛ්‍යාව 47 ක් ද, ඉඩමේ නම සඳහන් කිරීමට නොහැකි අධිකරණ සංඛ්‍යාව 135 ක් ද, මිනින්දෝරු සැලැස්ම නොමැති ඉඩම් 70 ක් ද, පැවරුම් සහතික නොමැති ඉඩම් 188 ක් ද වී තිබූ අතර ඉඩමේ වටිනාකම තක්සේරු නොකළ ඉඩම් සංඛ්‍යාව 174 ක් විය. | අධිකරණ අමාත්‍යාංශය සතු ඉඩම් වල නම, ප්‍රමාණය, මිනින්දෝරු සැලැස්ම, පැවරුම් සහතික හා තක්සේරු වටිනාකම තහවුරු කර ගෙන ඒවා නිවැරදි තක්සේරු අගයන් මත ගිණුම්ගත කළ යුතු වේ. | ප්‍රමාණය හා මිනින්දෝරු සැලසුම් නොමැති ඉඩම් මැනුම් කිරීමට කටයුතු කරමින් පවතින අතර, ඉඩමේ අයිතිය තහවුරු කර ඉඩම් පවරා ගැනීමේ කටයුතු සඳහා මැනුම් කිරීමෙන් අනතුරුව පවරා ගැනීමේ අයදුම්පත් යොමු කිරීමේ කටයුතු කර ඇත. | මේ වන විට අධිකරණ හා නිල නිවාස පිහිටි ඉඩම් 64ක් අමාත්‍යාංශය වෙත පවරා ගෙන ඇත. තක්සේරු කර ගිණුම් ගත කිරීම් සිදුවී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 8. | මුදල් රෙගුලාසි 582(i) ට පටහැනිව නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ මුදල් පොතට අනුව 2019 සැප්තැම්බර් 04 දින දෛනික ලැබීම් වූ රු.223,916 ක මුදල 2020 ජනවාරි 20 වන විටත් බැංකුවේ තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2019 වර්ෂයේ දෛනික ලැබීම් බැංකුගත කිරීම් දින 2-5 අතර පමණ කාලයක් ප්‍රමාද වූ අවස්ථා විය. | මුදල් රෙගුලාසි 582 (i) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මුදල් රෙගුලාසි 582(i) ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | 2019 - සැප්තැම්බර් 04 දෛනික මුදල් පොත අස්ථානගතවීම සම්බන්ධව නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී. 4019/19 දරණ නඩුව පවත්නා අතර, මේ වන විට නීතිපති උපදෙස් සඳහා යොමුකර ඇත. |
| 9. | පූගොඩ දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ 2018 සහ 2019 වර්ෂ වලදී ව්‍යාජ ලිපි ලේඛන සකස්කර මුදල් අයකැමි තනතුරේ රාජකාරී කළ නිලධාරීයා විසින් රු.1,190,071 ක් අවභාවිත කර තිබුණි. | මෙවැනි අවභාවිතයන් නොවීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කළයුතුවේ. | මෙවැනි වංචා වලක්වා ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පූගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය වෙත දැනුම් දී ඇත. | අදාල නිලධාරියා වැඩ තහනමකට ලක් කර ඇති අතර එම මුදල් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පවතී. |

ශීර්ෂ 229 - නීතිපති දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>-------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>---------------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>---------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>------------------ |
|---|---|---|---|---|
| 01 | 2020<br>ඉකුත් වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල හිඟහිටි ආදායම වූ රු.223.535,446 න් සමාලෝචිත වර්ෂයේදී රු.37,279,838 ක් අයකර තිබුණද වර්ෂය අවසානයට සමස්ථ හිඟ ශේෂය රු.308,831,925 ක් විය. | රජයට අයවිය යුතු ආදායම් කාල පමාවකින් තොරව අයකර ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා අදාල ආයතන සමඟ සාකච්ඡා කර දිගින් දිගටම දැනුවත් කිරිම කරගෙන යනු ලබයි. | තවදුරටත් මිලියන 308.5 ක් අය විය යුතුව ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 02 | 2019 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාරයට වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක් 2021 වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වුවත්, භාණ්ඩාගාරයට වාර්තා නොකරන ලද රු.3.604295 ක බැරකම් සඳහා 2021 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | අත්‍යවශ්‍ය වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් සපයා ගැනීමට කටයුතු කරගෙන යනු ලබයි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. |
| 03 | 2020 වර්ෂයේදී මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 03 ක ප්‍රතිපාදන ඉක්මවා රු.3.404,730 ක බැරකම් වලට එළඹ තිබුණි. 2019 වර්ෂයේදී එක් වැය විෂයයකට අදාලව ප්‍රතිපාදන කර තිබූ මුදල ඉක්මවා රු.963,058 ක බැරකම් වලට එළඹ තිබුණි. 2018 වර්ෂයේදීද වැය විෂයයන් 04 කට අදාලව ප්‍රතිපාදනය කර තිබූ මුදල ඉක්මවා රු.මිලියන 3.35 ක බැරකම් වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | අත්‍යවශ්‍ය වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් සපයා ගැනීමට කටයුතු කරගෙන යනු ලබයි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත . |
| 04 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය අනුව සමාලෝචිත වර්ෂයට අදාල මෝටර් රථ අනතුරු 38 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් හෝ පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2022 වර්ෂයේ සිට සිදුවන සෑම මෝටර් රථ අනතුරක් සම්බන්ධයෙන්ම අදාල පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරනු ලබයි. | පෙර වසරවලදී සිදුවූ අනතුරු සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| | 2019 | | | |
| 05 | ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛ කිහිපයක් මඟින් රජයේ නිලධාරීන්ගේ විදේශ සංචාර නැවත දැනුම් දෙන තුරු අත්හිටුවන ලෙසත් විදේශ සංචාර වියදම් හැකිතාක් අවම කරන ලෙසත් සහ අමතර ප්‍රතිපාදන ඉල්ලීම් නොකරන | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් පෙනී සිටිය යුතු අත්‍යවශ්‍ය විදේශ සංචාර සඳහා පමණක් නිලධාරීන් සහභාගී කරවීමට පියවර ගෙන ඇති අතර ඉදිරියේදී මෙවැනි දෝෂ | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවීමට කටයුතු කරන බවට සටහන් කරගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලෙසත් දන්වා තිබුණි. විදේශීය ගමන් වියදම් සඳහා ප්‍රතිපාදන සලසා තිබූ රු.27,000,000 ක ශුද්ධ ප්‍රතිපාදන මුදලින් 2019 සැප්තැම්බර් මස වන විට රු.21,097 ක ශේෂයක් පමණක් ඉතිරිව තිබුණි. එහෙත් 2019 ඔක්තෝබර් සහ නොවැම්බර් මාස වලදී සිදුකර තිබූ විදේශ සංචාර සඳහා අවස්ථා 06 කදී වියදම් කර තිබූ රු.1,360,074 ක මුදල විදේශ ගමන් සඳහා සම්මත (229-1-1-0-1102) වැය විෂයට හර නොකර 229-1-1-3-1409 (වෙනත්) වැය විෂයට හර කර වියදම් දරා තිබුණි. | | නොවීමට කටයුතු කෙරේ. | |
| 06 | වැඩ තහනම් කිරීමකට ලක්ව ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.211,560 ක් සහ සේවය හැර ගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු.1,931,644 ක මුදලක් වසර 05 කට වැඩි කාලයක සිට අය නොවී හිඟහිටි ණය ශේෂ වශයෙන් පැවතුණි. | රජයේ නිලධාරීන්ට ලබා දී තිබෙන ණය අත්තිකාරම් මුදල් කාල ප්‍රමාදයකින් තොරව අයකර ගැනිමට කටයුතු කල යුතු වේ. | අදාල හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ලිපි ගොනු නැවත සකස් කර නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරගෙන යනු ලැබේ. | වසර තුලදී වැඩ තහනම් කල නිලධාරීන් ගෙන් රු.36,000 ක්ද, සේවය හර ගිය නිලධාරීන් ගෙන් රු. 182,700 ක් ද පමණක් අය කර ගෙන ඇත. |

ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

| | විගණන වාර්තාවට ඇතුළත් කර ඇති ප්‍රධාන අඩුපාඩු<br>--------------------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>-------------------------- | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ පියවර<br>------------------------------ | වර්තමාන තත්ත්වය<br>---------------- |
|---|---|---|---|---|
| | **2020**<br>------- | | | |
| **01** | 2014 ජූලි ආරම්භ කර වර්ෂ 04 කින් අවසන් කිරීමට සැලසුම් කල රු. මිලියන 185 ක් වටිනා නීති ප්‍රඥප්ති ඒකාබද්ධ කොට ප්‍රතිශෝධනය කිරීමේ ව්‍යාපෘතියේ කාලය 2018 මැයි 16 දිනැති අංක අමප/18/0427/ 731/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2020 දෙසැම්බර් 30 දක්වා පමණක් දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා සුදුසු නිලධාරීන් විටින් විට පත් කලද 2021 පෙබරවාරි වන විටත් ව්‍යාපෘතිය නිම කිරීමට අපොහොසත් වී තිබුණි. | සැලසුම්ගත ව්‍යාපෘති නිමකර අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘතියේ වැඩ කටයුතු සිදු කිරීම සඳහා පූර්ණ කාලීනව පත්කිරීමට සුදුසු නිලධාරීන් නොසිටි බැවින්, සේවයේ යෙදී සිටින නිලධාරීන් දෙදෙනෙකු ද අර්ධ කාලීනව ව්‍යාපෘතිය නිම කිරීමට එකග වුවද ඒ සඳහා දීර්ඝ කාලයක් අවශ්‍ය වන බව 2020 අගෝස්ත් 13 දිනැතිව අධිකරණ අමාත්‍යාංශ ලේකම් වෙත දැනුවත් කර ඇත. | මෙය නවතා දමා අධිකරණ අමාත්‍යාංශයේ වෙනත් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරිමට කටයුතු කරමින් පවතී. |
| **02** | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සිදුවූ වාහන අනතුරු 37 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන අනතුරු අලාභ හානි සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | මෙම අඩුපාඩු මින් ඉදිරියට සිදු නොවීම සඳහා උපදෙස් දෙන ලදී. | පෙර තත්ත්වය සැලකිල්ලට නොගෙන දැනට සිදුවන වාහන අනතුරු අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| **03** | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 148 ක් වුවද ජ්‍යෙෂ්ඨ මට්ටමේ16ක්, තෘතීයික මට්ටමේ 17 ක්, ද්විතියික මට්ටමේ 15 ක් හා ප්‍රාථමික මට්ටමේ 03 ක් වශයෙන් සේවකයින් 51 කගේ පුරප්පාඩු පැවතුණි. | අදාළ බඳවා ගැනීමේ පටිපාටිය හැකි ඉක්මණින් සංශෝධනය කර එම තනතුරු සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති තනතුරු ඇතුළු සියළු පුරප්පාඩු සඳහා අවශ්‍යතාවයන් අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළයුතු වීම. | අතිරේක නීති කෙටුම්පත් සම්පාදක සහ නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරු සඳහා පූර්ණ කාලීනව වැඩ බැලීම් පත්වීම් ලබා දී ඇත. අනෙකුත් තනතුරු වල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | සියලුම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කර නැත. |

ශීර්ෂ 231 - ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය**<br>------------------------ | **විගණකාධිපතිගේ නිර්දේශය**<br>------------------------- | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග**<br>--------------------------- | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය**<br>--------------------- |
|---|---|---|---|---|
| | **2020 වර්ෂය**<br>----------------- | | | |
| 01 | 2020 වර්ෂයේ ලියාපදිංචි නඩු 1301 න් 507 ක් නිම කිරීමට සැලසුම් කළද නඩු 222 ක් පමණක් විසඳා තිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කෝවිඩ් 19 වෛරසය හේතුවෙන් රට තුළ පැවති තත්වය නිසා ණය සහනදායක මණ්ඩලයේ විමසීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකිවීම හේතුවෙන් සැලසුම්ගත පරිදි ලියාපදිංචි නඩු විසඳා නිම කිරීමට නොහැකි වුවද, ඉදිරියේදී සැලසුම් පරිදි නඩු නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මේ වන විට කොළඹ පිහිටි ප්‍රධාන ණය සහනදායක මණ්ඩලයට අමතරව ගාල්ල, ගම්පහ සහ කුරුණෑගල යන නගර කේන්ද්‍ර කර ගනිමින් ණය සහනදායක මණ්ඩලයේ ශාඛා මණ්ඩල පිහිටුවා පවත්වාගෙන යනු ලබන අතර 2022 වර්ෂයේ සැලසුම්ගත පරිදි නඩු විසඳා නිම කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 02 | ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ රු.105,840 ක වටිනා ෆැක්ස් යන්ත්‍ර 04 ක් මිලදී ගෙන තිබුණි. | මිලදී ගැනීම් හැකිතාක් ප්‍රසම්පාදන සැලැස්මට අනුකූල විය යුතුවේ. | නැවත මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. | 2021 වර්ෂයේ සිදු වූ මිළදී ගැනීම් අනුව සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරමින් පවතී. |
| 03 | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ලැප්ටොප් පරිඝනක මිලට ගැනීමට රු.450,000 ක් ඇස්තමේන්තු කර තිබුණද ඒ සඳහා රු.900,188 ක් වැය කර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට නොහැකි වීම හේතුවෙන් මෙම දෝෂය අනාවරණය වී තිබුණි. නැවත මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. | ඉදිරි වර්ෂවලදී නිවැරදි කර ගැනීමට සටහන් කර ගෙන ඇත. |
| 04 | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාරය හා සම්බන්ධවන උනන්දුවක් දක්වන පර්ශවයන් හඳුනාගෙන තිබුණද, එම පර්ශවයන් වෙත දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දුවක් දක්වන පර්ශවයන්හඳුනාගෙන දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. | ණය සහනදායක මණ්ඩලයේ කොළඹ පවතින ප්‍රධාන මණ්ඩලයට අමතරව ගාල්ල, ගම්පහ සහ කුරුණෑගල ශාඛා මණ්ඩල 03ක් පිහිටුවමින් දෙපාර්තමේන්තුවෙන් සිදුවන සේවාව පුළුල් කරන ලදි. 2022 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශයට සමගාමීව දැනුවත් කිරීම් වැඩසටහන් සඳහා සහභාගී වීමට අපේක්ෂා කෙරේ. | අධිකරණ අමාත්‍යාංශය විසින් උතුරු පළාත තුළ සංවිධානය කරනු ලබන (2022.01.26 දින සිට 2022.01.30 දක්වා) ජංගම වැඩසටහන සඳහා සහභාගී වෙමින් අදාළ පාර්ශවය දැනුවත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |
| 05 | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සැලැස්මක් සමාලෝචිත වර්ෂයට මෙන්ම | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2022 වර්ෂය සඳහා විධිමත්ව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මේ වන විටත් පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉකුත් වර්ෂය සඳහාද සකස් කර නොතිබුණි. | | | |
| | **2019 වර්ෂය** **--------------** | | | |
| 06 | විෂය අංක 23101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ අවම ලැබීම් සීමාව රු.500,000 ක් වුවද තථ්‍ය ලැබීම් රු.449,978 ක් වීම නිසා රු.50,022 කින් අවම ලැබීම් සීමාවට ළඟා වී නොතිබුණි. ඉකුත් වර්ෂයේදීද අවම ලැබීම් සීමාව ළඟා කරගෙන නොතිබුණි. | රජයේ අත්තිකාරම් කටයුතු සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් පිළිපැදිය යුතුවේ. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ BD/AA/LR/2019/03/2020 හා 2020.10.30 දිනැති ලිපිය මඟින් අවම ලැබීම් සීමාව රු.499,000 ලෙස 2020.10.07 දින පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති බව දන්වා ඇත. නැවත එවැනි දෝෂ නොවන පරිදි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කර ඇත. | 2020 වර්ෂයේදී රජයේ නිලධාරීන්ට අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් අනුගමනය කර ඇත. |
| 07 | ආයතනයෙන් මහජනයාට ලබා දෙන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිව ලබාදීමට අවශ්‍ය පසුබිම සැකසීම සඳහා පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කළ යුතුවේ. | 2022 වර්ෂය සඳහා විධිමත්ව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | මේ දක්වා පිළියෙල කර නොතිබුණි. |

ශීර්ෂ 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| **2019 වර්ෂය** | | | |
| 1. 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව මීගමුව බන්ධනාගාරයේ වාට්ටු 16 ක වර්ග අඩි 18,853 ක් තුළ රැඳවිය හැකි රැඳවියන් සංඛ්‍යාව 350 ක් වුවත් 2019 වර්ෂයේ අවස්ථා 05 කදී රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 1,783 ක්, 1,843 ක්, 1,727 ක්, 1,773 ක් හා 1,695 ක් විය. තවද කළුතර බන්ධනාගාරයේ වාට්ටු 22 ක වර්ග අඩි 17,126 ක් තුළ රැඳවියහැකි රැඳවියන් සංඛ්‍යාව 317 ක් වුවද අවස්ථා 06 කදී රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 1,159 ක්, 1,294 ක්, 1,276 ක්, 1,415 ක්, 1,358 ක් හා 1,411 ක් විය. | බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන අනුගමනය කළ යුතු වේ. | අර්ධ තාවකාලික ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්වී ඇති බැවින් ඉදිරියේ දී එම කටයුතු කඩිනමින් සිදුකරනු ලබයි. ජනාධිපති රාජ්‍ය පොදු සමාව යටතේ අවස්ථා කිහිපයකදී රැඳවියන් වැඩි ප්‍රමාණයක් නිදහස් කිරීමට කටයුතු කිරීම. | දැනටද රජයේ විගණනය විසින් මහර, බෝගම්බර (දුම්බර) බන්ධනාගාරවල සිදුකළ පරීක්ෂාවන් හිදි බන්ධනාගාරවල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා රැඳවිය හැකි රැඳවියන් ප්‍රමාණයට වඩා රැඳවියන් ප්‍රමාණයක් රඳවා තිබීම වර්තමානයේ දී ද නිරීක්ෂණය විය. |
| 2. 1956 වර්ෂයේ දී බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට සිදු කළ සංශෝධනයන් හි 178 ඡේදය ප්‍රකාරව බන්ධනාගාරයේ ඉඩ පහසුකම් ඇති ආකාරයට එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වෙන වෙනම රඳවා තබාගත යුතු වුවද මීගමුව හා කළුතර බන්ධනාගාරයන් තුළ පවතින අධික තදබදය හේතුවෙන් එසේ වර්ග කර රැඳවීමට නොහැකිව තිබුණි. | බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන අනුගමනය කළ යුතු වේ. | අර්ධ තාවකාලික ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්වී ඇති බැවින් ඉදිරියේ දී එම කටයුතු කඩිනමින් සිදුකරනු ලබයි. ජනාධිපති රාජ්‍ය පොදු සමාව යටතේ අවස්ථා කිහිපයකදී රැඳවියන් වැඩි ප්‍රමාණයක් නිදහස් කිරීමට කටයුතු කිරීම. | දැනටද රජයේ විගණනය විසින් මහර, බෝගම්බර (දුම්බර) බන්ධනාගාරවල සිදුකළ පරීක්ෂාවන් හිදි බන්ධනාගාරවල පවතින අධික තදබදය හේතුවෙන් එසේ සිරකරුවන් වෙන වෙනම රඳවා නොතිබීම වර්තමානයේ දී ද නිරීක්ෂණය විය. |

| | | | |
|---|---|---|---|
| 3. 2020 මාර්තු මස වන විට එකතු විශාලත්වය හෙක්ටයාර් 2.6103 ක් වූ මීගමුව බන්ධනාගාරය පිහිටි ඉඩම, අධිකාරී නිල නිවස පිහිටි ඉඩම, හලාවත සිරමැදිරිය පිහිටි ඉඩම හා පුත්තලම සිරිමැදිරිය පිහිටි ඉඩම යන වත්කම් දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි. | වත්කම් පවරාගැනීම නිසි පරිදි සිදු කර ලේඛනගත කිරීම මෙතෙක් සිදු කර නැත. | කොටසක් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | වර්තමානයේ දී ද බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් තම අරමුණුගත කාර්යයන් වෙනුවෙන් බන්ධනාගාර, සිරමැදිරි, එළිමහන් සිරකඳවුරු, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ගොවිපොළවල් වශයෙන් භාවිතයට ගන්නා බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත හිමිකම පවරා දී නොමැති වටිනාකම තක්සේරු නොකළ හා ගිණුම්ගත නොකළ අක්කර 392 පර්චස් 132.8 කට අධික ඉඩම් ප්‍රමාණයක් පවතී. |
| **2020 වර්ෂය** | | | |
| 4. 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ඉක්ම වූ රු.7,424,112 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2021 වර්ෂය තුළ මෙම ණය ශේෂයෙන් තවදුරටත් රු.1,342,632 ක් අයකරගෙන ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් නිරවුල් නොවී පවතින ණය ශේෂය රු.6,081,480 ක් වේ. |
| 5.ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදයට පටහැනිව කටයුතුකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය නිලධාරීන් 40 දෙනෙකුගේ අයවිය යුතු ණය ශේෂ රු.437,913 ක් විය. | හිඟහිටි ශේෂ අයකර ගැනීමට පියවරගත යුතුවේ. | ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයෙන් රු.346,704 ක් නිරවුල් කර ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් නිරවුල් නොවී පවතින ශේෂය රු.91,209 ක් වේ. |

| | | | |
|---|---|---|---|
| 6. තැන්පත් ගිණුම් 03 ක වර්ෂ 02 ක් ඉක්මවූ රු.1,008,120 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වසර 02 ඉක්මවූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීම සඳහා බන්ධනාගාර අධිකාරීවරුන්ට දැනුම් දී ඇත. | වර්තමානයේ ද මෙම ශේෂ එසේම පවතී. |
| 7. සිරකරුවන්ගේ පුද්ගලික ගිණුම්වලට බැර කළ යුතු රු.4,554,557 ක ශේෂයක් තැන්පතු ගිණුමේ පැවතුන අතර ඉන් වර්ෂ 02 ක ඉක්මවූ ශේෂය රු.1,394,779 ක් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වසර 02 ඉක්මවූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීම සඳහා බන්ධනාගාර අධිකාරීවරුන්ට දැනුම් දී ඇත. | වර්තමානයේ ද මෙම ශේෂ එසේම පවතී. |
| 8. වසර 20 කට වඩා පැරණි රාජ්‍ය අංශයෙන් හා පෞද්ගලික අංශයේ විකුණුම් වෙනුවෙන් පිළිවෙලින් ලැබිය යුතු රු.1,481,622.18 ක් හා රු.17,461 ක් මුදල් රෙගුලාසි 502(ආ) (i) ප්‍රකාරව අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලැබිය යුතු මුදල් අයකර ගත යුතු වේ. | වසර 20 කට වඩා පැරණි රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ විකුණුම් සඳහා වන ලේඛන නොමැති වීම සහ පැරණි බිල්පත් අස්ථානගත වී තිබීම නිසා තොරතුරු සොයාගත නොහැකි වීම මත මෙම ණය ශේෂ අයකර ගැනීමට නොහැකි වී ඇති බව විගණනයට දන්වා ඇත. | වර්තමානයේ ද මෙම ශේෂ එසේම පවතී. |
| 9. බන්ධනාගාර 03 ක හා එළිමහන් සිරකඳවුරක හා තරුණ වරදකරුවන්ගේ මධ්‍යස්ථානයක වසර 01 ත් 10 ත් අතර කාලයක සිට බස් රථයක්, ලොරි රථ 03 ක්, බවුසරයක්, කාර් රථයක්, අත්ට්‍රැක්ටරයක්, යතුරුපැදියක්, ත්‍රීරෝද රථයක් හා ජෙනරේටරයක් ඌන උපයෝජිතව පැවතුණි. | ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළ යුතුය. | අපහරණය කළ යුතු වාහන තහවුරු කර ගැනීමෙන් පසු 2022 මාර්තු 31 දින වන විට ටෙන්ඩර් මගින් වාහන අපහරණය කර අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත. | මේ දක්වා අපහරණ කටයුතු අවසන් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 10. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් තොතිබුණු අතර වසර 10 කට වැඩි කාලයක සිට පැවත එන හා වර්ෂ 1 ත් 10 ත් අතර කාලයකට අදාළ වන වාහන අනතුරු 228 ක් ඇතුලු අලාභ සිද්ධීන් 252 කට අදාලව රු.57,835,664 ක අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වාහන අනතුරු ඇතුලු අලාභ සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. | හානි පාඩු සම්බන්ධයෙන් වූ කටයුතු විධිමත්ව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ඒ සම්බන්ධයෙන් පවතින ලිපිගොනු හා ලේඛන විධිමත්ව ගිණුම් අංශය වෙත භාර දෙන ලෙසත් එම කටයුතු පවත්වාගෙන යාම සඳහා නිලධාරියෙක් අනුයුක්ත කර දෙන ලෙසත් දන්වා බන්ධනාගාර කොමසාරිස් (පාලන) වෙත දැනුම් දී ඇත. | වර්තමානයේ ද මෙම තත්ත්වය එසේම පවති. |
| 11. | ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට විධායක මට්ටමේ පුරප්පාඩු 84 ක්, තෘතිය මට්ටමේ පුරප්පාඩු 36 ක්, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 2,147 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 96 ක් ඇතුළුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 2,363 ක් විය. මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම බන්ධනාගාරවල සමස්ථ කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා කාලීන සමාලෝචනයක් කර ඒ අනුව කටයුතු කළ යුතු වේ. | • ඒකාබද්ධ සේවා නිලධාරි හිඟය සම්බන්ධයෙන් නිලධාරීන් ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් සිදු කිරීම.<br>• සැරයන් තනතුරෙහි පැවති පුරප්පාඩු 122 ක් සම්පූර්ණ කිරීම.<br>• නියාමක නිලධාරී පුරප්පාඩු 788 ක් සම්පූර්ණ කිරීම<br>• බුද්ධි හා ආරක්ෂණ ඒකකය සඳහා ත්‍රිවිධ හමුදාවෙන් වසර 12 ක් සම්පූර්ණ වී නිත්‍යානුකූලව ඉවත් වූ නිලධාරීන් 200 ක් බඳවා ගැනීමට කටයුතු කිරීම. | 2021 දෙසැම්බර් 31දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 84 ක්, තෘතිය මට්ටමේ පුරප්පාඩු 35 ක්, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 1,341 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 111 ක් වශයෙන් මුළු පුරප්පාඩු සංඛ්‍යාව 1,571 ක් විය. |

ශීර්ෂ 233 - රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය ---------------------- | විගණකාධිපතිගේ නිර්දේශය -------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ---------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය -------------- |
|---|---|---|---|---|
| | **2020** | | | |
| 1 | සමාලෝචිත වර්ෂය අවසානයට අය වියයුතු ණය ශේෂයට අදාලව භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර පවතින රු.20,660 ක වෙනස වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබුණි. | ගිණුම් අතර පවතින වෙනස්කම් නිවැරදි කල යුතු වේ. | දෙපාර්තමේන්තු පාලන ගිණුම හා කේවල ශේෂ අනුව මෙවැනි වෙනසක් දක්නට නොලැබුනද 1996 වර්ෂයටත් පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින භාණ්ඩාගාර පොත්වල වැඩියෙන් පෙන්වන මෙම වෙනස භාණ්ඩාගාරයේ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කරන ලදි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වෙන් ඒ සඳහා අනුමැතිය ලබා දී නොමැත. |
| 2 | භාණ්ඩාගාරයට වාර්තා නොකල කිසිදු බැඳීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදම් ලෙස නිරවුල් නොකල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස වාර්තා නොකළ රු.333,809 ක් 2021 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස වාර්තා නොකළ රු.3,130,190 ක් 2019 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කල හැකි පරිදි මෙවැනි තත්වයන් වලක්වා ගැනීමට, බිල්පත් නිසි පරිදි ගිණුම් අංශ වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | බැරකම් නිවැරදිව වාර්තාකිරීමට සටහන් කරගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 3 | 2020 වර්ෂය ආරම්භයට නඩු කටයුතු සඳහා විශේෂඥ වාර්තා ලබාදීමට නොහැකි වූ ප්‍රමාණය14,171 ක් විය. වර්ෂයට අදාල කැඳවූ 35,191 ක් ද ඇතුළුව වාර්තා 34,689 ක් ලබාදී අවසන් කලද තවත් වාර්තා 14,673 ක් ලබාදීමට ඉතිරි වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලබාදීමට තිබූ වාර්තා වලින් සියයට 29 ක් ලබා දීමට නොහැකි වී තිබුණි. | වාර්ෂිකව නඩු වැඩිවීමේ ප්‍රවණතාවයට සාපේක්ෂව, වාර්තා නිකුත් කිරීම් සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කල යුතු වේ. | 2021.01.01 දින වන විට වාර්තා කිරීමට ඇති නඩු සංඛ්‍යාව 14,673 කි. 2021 වර්ෂය තුළ ලද නඩු සංඛ්‍යාව 29,273 ක් වන අතර වාර්තා කළ නඩු සංඛ්‍යාව 36,328 කි. | 2021.12.31 දිනට වාර්තා කිරීමට ඇති නඩු සංඛ්‍යාව 7,618 දක්වා අඩු වී ඇත. |
| | **2019**<br>**-------** | | | |
| 4. | මුදල් රෙගුලාසි 94 (1) ට පටහැනිව මුදල් වර්ෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා එක් වැය විෂයයකට අදාලව රු.848,488 ක බැරකම්වලට එළඹ තිබුණි. 2018 වර්ෂයේ දී වැය විෂයන් 03 කට අදාලව ප්‍රතිපාදනය කර තිබූ මුදල ඉක්මවා රු.මිලියන 3.36 ක බැරකම් වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94 (1) ට පටහැනිව කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වේ. | ඉදිරියේ දී මෙවැනි තත්වයන් ඇති නොවීමට අදාල අංශ වෙත උපදෙස් ලබා දී ඇත. | නිවැරදිව කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. |

ශීර්ෂ 234 - ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ටාර්

| | විගණන නිරීක්ෂණය<br>-------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>---------------------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>--------------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>---------------------- |
|---|---|---|---|---|
| | **2020** | | | |
| 1. | බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2017 වසරේ සිට ඉදිරියට ගෙන එන බැංකු ගත නොවූ රු.48,978 ක ශේෂයක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බැංකුගත නොවීමට හේතු හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියා මාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළයුතු වේ. | පැවැත්වෙන විනය පරීක්ෂණය අවසන් වූ විගස එහි තීරණය මත පියවීමට කටයුතු කරමි. | නිරවුල් කර නොමැත. |
| 2. | වර්ෂයකට පෙර අධිකරණ අමාත්‍යාංශයට ලබාදී තිබූ රු.3,000,000 ක් වටිනා වාහනයක් හා අධිකරණ අමාත්‍යාංශයෙන් ලැබුණු රු.4,000,000 ක් වටිනා වාහනයක් විධිමත්ව පවරා දීමට හා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතනය සතු වත්කම් විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | විධිමත්ව පවරා ගැනීම හෝ පවරා දීම සිදු කර නැත. |
| 3. | මූලධන වැය විෂයන් 02ක් සඳහා සලසා තිබූ පිළිවෙලින් රු.9,300,000ක හා රු.18,400,000ක අමතර ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.4,281,020ක් හා රු.9,212,286ක් ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස අමතර ප්‍රතිපාදන ලබාගත යුතු වේ. | අපේක්ෂා කල වියදම් ඇති නොවූ බැවින් ඉතිරි වීම් සිදුවිය. ඉදිරියේ දී ප්‍රතිපාදන සැලසුම් සහගතව ලබා ගැනීමට කටයුතු කරමි. | ඉදිරියේ දී නිවැරදිව කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. |
| 4. | 2011 වසරේ සිට ඉදිරියට ගෙන එන දෙපාර්තමේන්තු පොත්වල වැඩියෙන් දක්වා තිබූ රු.68,245 ක ණය ශේෂය නිරවුල් කර නොතිබුණි. | වසර ගණන් පැරණි නිරවුල් නොවූ ශේෂ නිරවුල් කළ යුතු වේ. | ලේඛන සොයා ගැනීමට නොහැකි වීම මත මෙම ශේෂය නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇත. | නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | **<u>2018</u>** | | | |
| 5. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාරයට වාර්තා නොකල කිසිදු බැඳීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස නිරවුල් නොකල යුතු වුවත්, එසේ භාණ්ඩාගාරයට වාර්තා නොකල එකතුව රු.1,115,587ක බැරකම් වටිනාකමක් 2019 ජනවාරි හා පෙබරවාරි මාසවල ගෙවා තිබුණි | දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (111) යටතේ එක් එක් වැය විෂය සඳහා වන බැරකම් සියල්ල නිවැරදිව හඳුනා ගැනීම මෙන්ම බැරකම් භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් විෂයවලට අදාලව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශ සමග සැසඳී තිබිය යුතුවේ. | ප්‍රතිපාදන සීමාව තුල බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කිරීමට කටයුතු කරමි. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට සටහන් කර ගෙන ඇත. |
| 6 | වියදමක් වෙනුවෙන් එකග වන බැරකම් ප්‍රමාණය කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්ම වියයුතු වුවද, වැය විෂයයන් 06ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා රු.මිලියන 1.06 ක බැඳීම් ඇති කරගෙන තිබුණි | මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වේ. | ප්‍රතිපාදන සීමාව තුල කළමනාකරණය කර ගැනීමට අවදානය යොමු කරමි. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට සටහන් කර ගෙන ඇත. |

ශීර්ෂ 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>-------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>--------------------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>---------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>--------------------- |
|---|---|---|---|---|
| | **2020** | | | |
| 1. | මුදල් රෙගුලාසි 880 (i) සහ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 සහ 2014 මැයි 07 දිනැති අංක 01/2011 (i) දරන අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් දෙදෙනෙකුගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 සහ අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සහකාර ලේකම් තනතුරු දරන නිළධාරීන් දෙදෙනෙකුගේ පමණක් ඇප තැන්පත් තබා නොමැත. නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත. | මේ දක්වාම එම අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි. |
| 2. | දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින ලේකම් තනතුර සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටද නිත්‍ය පත්වීමක් සිදු නොකර වැඩ බැලීමේ පදනමට නිලධාරිනියක් පත්කර තිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අපේක්ෂිත සුදුසුකම් නොසැපිරීම මත එම තනතුර පිරවිමට අපොහොසත් වී ඇත. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා සමග පැවති සාකච්ඡාවේ දී දැනට සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන් හරහා දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් ඉටු කිරිමට තීරණය විය. | ලේකම් තනතුර පිරවීම සඳහා අධිකරණ අමාත්‍යාංශයෙන් ඉදිරි පියවර ගෙන නොමැත. |
| | **2018** | | | |
| 3. | පුනරාවර්තන වැය විෂයන් 08 ක හා එක් මූලධන වැය විෂයක ඉතිරි ප්‍රතිපාදන එකතුව රු. මිලියන 1.67 ක් වෙනත් පුනරාවර්තන වැය විෂයකට හා මූලධන වැය විෂයන් 02 කට මාරු කර තිබූ අතර මාරු කිරීම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 81 සිට සියයට 131 ක් දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකි තරම් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරිමට කටයුතු කිරීම | සටහන් කර ගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 4. | වැය විෂයයන් 13 කට සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. මිලියන 18.97 කින් රු.මිලියන 6.43 ක ප්‍රතිපාදන ඉතිරි වීම් වාර්තා වී තිබුණු අතර එම ඉතිරිවීම්, ප්‍රතිශතයක් ලෙස සියයට 06 සිට සියයට 88 දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍යතාව නිසි පරිදි හඳුනාගෙන ප්‍රතිපාදන සලසා ගැනීමට ඉදිරියේදී කටයුතු කිරීම | සටහන් කර ගෙන ඇත. |

ශීර්ෂ 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>-------------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>------------------------- | ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග<br>---------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>-------------- |
|---|---|---|---|---|
| | | | | |
| **1.** | 2012 මැයි 21 දිනැති අංක EST/8/EXAMS/05/1007-1 ලිපිය ප්‍රකාරව කථන හා ලිඛිත පරීක්ෂණ සඳහා අර්ධකාලීන පදනම මත බඳවාගත් නිලධාරීන්ට හා සම්පත් දායකයන්ට දීමනා ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණද, එම කටයුතු සඳහා සහභාගිවන ආයතනයේ පූර්ණකාලීන සේවය කරන නිලධාරීන්ටද 2020 වර්ෂයේදී අනුමැතියකින් තොරව රු.793,170 ක දීමනාවක් ගෙවා තිබුණි. | කථන හා ලිඛිත පරීක්ෂණපැවැත්වීම හා පුහුණු පාඨමාලාවල රාජකාරි සඳහා සහභාගි වන පූර්ණකාලීන නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා ගෙවීම් ක්‍රමවේදය අනුමත කරගත යුතු වීම. | ගෙවීම් සිදු කිරීම සම්බන්ධව පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | මෙතෙක් එම නිලධාරීන්ට ගෙවීම් කිරීමට ගෙවීම් ක්‍රමවේදය සඳහා අනුමැතිය ලබාගෙන නොමැත. |
| 2. | 2015 හා 2016 වර්ෂවලදී සිංහල, දෙමළ පරිවර්තක මෘදුකාංගයක් සකස් කිරීම වෙනුවෙන් රු. 4,860,000 ක්ද 2017 හා 2018 වර්ෂවලදී දෙමළ,සිංහල පරිවර්තන මෘදුකාංගයක් සකස් කිරීම වෙනුවෙන් රු.5,950,000 ක් වැය කර තිබුණද, 2020 වර්ෂය දක්වා | සිංහල භාෂාව දෙමළ භාෂාවටද, දෙමළ භාෂාව සිංහල භාෂාවටද පරිවර්තනය කිරීමේ මෘදුකාංගය භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සකස් කළ යුතු වීම. | විශ්ව විද්‍යාලය වෙත මෙම මෘදුකාංගයේ නිරවද්‍යතාවය පිළිබඳ සහතිකය කඩිනමින් ලබාදෙන ලෙස සිහිකැඳවීම් කර ඇත. | මෘදුකාංගයේ නිරවද්‍යතාවය පිලිබඳ ලබාදෙන තහවුරුව මෙතෙක් ලබාගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | | | | |
| | | | | | |
| 3. | 1999 වර්ෂයේ සිට භාෂා පරිවර්තක සහකාර ලෙස සේවයට බඳවාගෙන ඇති නිලධාරින් 42 දෙනෙකු පලාත් පාලන ආයතන හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය සඳහා මුදාහැර තිබුණි. 2020 වර්ෂය සඳහා මෙම නිලධාරින්ට රු. 25,410,440 ක වැටුප් හා දීමනා ලබා දී තිබුණ ද, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් කාර්ය පැවරුම් සිදුකර දෙපාර්තමේන්තුවට සේවාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | | සේවයට බඳවාගෙන ඇති නිලධාරින් හට කාර්ය පැවරුම් සිදුකර දෙපාර්තමේන්තුවට සේවාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. | මෙම නිලධාරින්ට කාර්යය පැවරුමක් සිදු කර නොමැති අතර මෙම නිලධාරින්ගේ සේවය තවදුරටත් එම ආයතන වෙත අවශ්‍යද යන්න එම ආයතන ප්‍රධානීන්ගෙන් විමසා ඇත. | නිලධාරින් පිළිබඳව තවමත් ආයතන ප්‍රධානින් එකඟතාවයකට පැමිණ නොමැත. |

ශීර්ෂ 246 - දේශීය අදායම් දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| **ආදායම් ඇස්තමේන්තු කිරීම** | | | |
| 1.ආදායම් ඇස්තමේන්තු කිරීම විධිමත් පරිදි සිදු නොකිරීමෙන් සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. බිලියන 575.4ක් හා සත්‍ය ආදායම් රු. බිලියන 511.1ක් වූ අතර විචලතාවයේ ප්‍රතිශතය සියයට 11 ක් විය. | ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමට පියවර ගත යුතු බව. | වැලැක්වීමේ ක්‍රියා මාර්ග සඳහන් කර නොමැත. | 2021 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව රු.බි.685.5ක් හා සත්‍ය ආදායම රු.බි.619.7ක් වීමෙන් විචලතාවය සියයට 10ක් පවතී. |
| | | | |
| 2. 2020 දෙසැම්බර් 31 දිනට Legacy පද්ධතියේ මුළු හිඟ බදු හා දඩ ආදායම රු. බිලියන 291.2 කින්, අය කරගත හැකි බදු හා දඩ මුදල වූ රු. බිලියන 100.4ක් අය කර ගෙන නොතිබුණි. | අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීම සහ අදාළ බදු පනත්වල දැක්වෙන ක්‍රියාමාර්ග අනුව හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට/ නිරවුල් කිරීමට පියවර ගත යුතු බව. | වැළැක්වීමේ ක්‍රියා මාර්ග සඳහන් කර නොමැත. | 2021.06.30 දිනට Legacy පද්ධතියට අනුව මුළු හිඟ බදු හා දඩ ආදායම රු. බිලියන 286.1කින් අය කරගත හැකි බදු හා දඩ මුදල රු. බිලියන 89.9ක් අයකර ගෙන නොතිබුණි. තවද, 2021 අංක 10 දරන දේශීය ආදායම් සංශෝධන පනත හා 2021 අංක 18 දරන මුදල් පනත අනුව බදු කපා හැරීමට කටයුතු කෙරේ. |

| | | | |
|---|---|---|---|
| 3. 2020 දෙසැම්බර් 31 දිනට RAMIS පද්ධතියේ මුළු හිඟ බදු හා දඩ ආදායම රු. බිලියන 406.4ක් අතරින් අය කරගත හැකි බදු හා දඩ මුදල රු. බිලියන 167ක් අය කර ගෙන නොතිබුණි. | අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීම සහ අදාළ බදු පනත්වල දැක්වෙන ක්‍රියාමාර්ග අනුව සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට/ නිරවුල් කිරීමට පියවර ගත යුතු බව. | බදු මුදල් අය කර ගැනීම සඳහා දැනුම් දීමේ ලිපි හා සිහිකැඳවීමේ ලිපි යොමු කරමින් ද, බදු ගෙවන්නන් ඍජුව සාකච්ඡා වලට කැඳවමින් ද, හිඟ බදු අය කර ගැනීමට කටයුතු කරන බව විගණනයට දැනුම් දී ඇත. | 2021.06.30 දිනට RAMIS පද්ධතියට අනුව මුළු හිඟ බදු හා දඩ ආදායම රු. බිලියන 451.8 කින් අය කරගත හැකි බදු හා දඩ මුදල රු. බිලියන 107.5ක් අයකර ගෙන නොතිබුණි. බදු කපා හැරීමේ පනත අනුව කටයුතු කරන බව. |
| 4. 2020 දෙසැම්බර් 31 දිනට 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරින ලද බදු පියවීමේ විශේෂ විධිවිධාන පනත ප්‍රකාරව නිරවුල් කළ යුතු වූ රු.බිලියන 31.5ක හිඟ බදු හා දඩ මුදල් තවදුරටත් නිරවුල් කර නොතිබුණි. | පැහැර හරින ලද බදු අය කර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ විධිවිධාන ක්‍රියාත්මක කර පැහැර හරින ලද බදු අය කිරීමට හෝ නිරවුල් කිරීමට පියවර ගතයුතු බව. | පැහැර හරින ලද බදු කඩිනමින් අය කිරීමට/ නිරවුල් කිරීමට කටයුතු කර ඇති බව. | 2021.06.30 දිනට DTRU අංශයේ හිඟ බදු හා දඩ මුදල් රු.බිලියන 31.1ක් අය කර ගෙන නොතිබුණි. බදු කපා හැරීමේ පනත අනුව කපා හැරීමට කටයුතු කෙරේ. |
| 5. Legacy පද්ධතියේ වෙළුම් නිකුත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් TIN අංක 114155551 හා 409164030 ට අදාළ ආයතන 02හි අයකලහැකි හිඟබදු 2020 ජුනි 30 දිනට රු.327,646,996 කින් අධිතක්සේරු වී තිබුණි. | කාලීනව වෙළුම් (Versions) නිකුත් කළයුතු බව. | අදාළ හිඟ බදු කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | අදාළ වෙළුම් පද්ධතිය මඟින් නිරවුල් කර නොතිබුණි. |
| 6. RAMIS පද්ධතියෙහි බදු ගෙවන්නන්ගෙන් 09දෙනෙකු හට රු 5,822,238,326 ක තක්සේරු වාර්තා නිකුත් කර වර්ෂ 01 සිට 02 ක කාල පරිච්ඡේදයක් ඉක්මවුවද හිඟ බදු | පනත් ප්‍රකාරව හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළයුතු බව. | හිඟ බදු කඩිනමින් නිරවුල් කරමින් පවතින බව. | සම්පූර්ණයෙන් හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| හා දඩ මුදල් අයකර ගෙන නොතිබුණි. | | | |
| | | | |
| 7. RAMIS පද්ධතියෙහි නව පනත යටතේ වන කටයුතු සඳහා 2.0 හි අදියර B යටතේ සිංගප්පූරු ඩොලර් 15,534, 364ක් සහිතව ගිවිසුම්ගත වී කාර්යයන් ආරම්භ කර තිබුණ ද, සැලසුම් කළ පරිදි බදු වාර්තා සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාවලිය පද්ධතිය තුළ සිදු වී නොතිබුණි. | පනත් ප්‍රකාරව ඉදිරි ක්‍රියාවලිය සිදු කිරීම සඳහා RAMIS පද්ධතිය කඩිනමින් සංවර්ධනය කර ගත යුතු බව. | මෙම පද්ධතියේ නිර්මාණකරු වන සිංගප්පූරු සමාගම සමඟ සාකච්ඡා කොට 2020 වර්ෂයේ දී කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බව. | දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට අදාළ තාක්ෂණික නිලධාරීන්ගේ පුරප්පාඩුව හේතුවෙන්, පවරා ගැනිම් 2023 වර්ෂය දක්වා කල් දැමීමට සිදු වී ඇත. |
| 8. RAMIS 1.0 පද්ධතිය 2020 ඔක්තෝබර් මාසයේදී පවරා නොගැනීමත්, එදින දක්වා නඩත්තු හා සේවා ගාස්තු ලෙස රු. මිලියන 725 ක් ගෙවා තිබිමත්, පවරා ගැනීම සඳහා පූර්ව කටයුතු කාලීනව සිදු නොවීමත් හා යෝජිත නව්‍යතා හේතුවෙනුත් 2021 ජනවාරි 31 දින දක්වා දීර්ඝ කරනු ලැබූ නඩත්තු කිරීමේ සේවා ගිවිසුම නැවතත් වසර 03කින් දිර්ඝ කර තිබුණි. | RAMIS පද්ධතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම ගිවිසුම් ප්‍රකාරව කාලීනව සිදුවිය යුතු බව. | පද්ධතිය නඩත්තු කටයුතු දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට අදියර වශයෙන් පවරා ගැනීමට අදාළ සැළසුම් සකස් කර ඇති බව. | දෙවන අදියර පවරා ගැනීම 2023 වර්ෂය දක්වා ප්‍රමාද වීම හේතුවෙන් මොඩියුල නඩත්තු කොන්ත්‍රාත්තුව ද වසරකින් දීර්ඝ කිරීමට සිදු වී ඇත. |
| | | | |
| 9. 2008-2020 කාල පරිච්ඡේදයට අදාළව මත්පැන් බලපත්‍ර මත අයකළ යුතු මුද්දර ගාස්තු අයකර ප්‍රේශණය නොකිරීම, අවස්ථා කිහිපයක දී එකම ව්‍යාපාරයට හෝ එකම බලපත්‍ර හිමියාට බල පත්‍ර නිකුත් කිරීමේ දී ගාස්තු අය නොකිරීම හා අයකළ යුතු මුද්දර ගාස්තු අඩුවෙන් අය කිරීම මත පිළිවෙලින් රු.174,701,500, රු.6,482,000 හා රු.4,209,511ක් වශයෙන් එකතුව රු.185,393,011 | සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හිඟ බදු අයකර ගත යුතු බවට දැනුවත් කළ යුතු බව. | මේ සම්බන්ධයෙන් වූ චක්‍රලේඛ සියලුම දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරු වෙත නිකුත් කිරීම. | බදු ගෙවන්නන් විසින් අභියාචනාධිකරණ යේ නඩු පවරා ඇති අතර ඉදිරි නඩු දිනය 2022 මැයි 20 දිනට යොමු කර ඇති අතර නියැදි විගණන පරීක්ෂාවට අනුව දැනට |

| | | | |
|---|---|---|---|
| ක් අයකර ප්‍රේෂණය කර නොතිබුණි. | | | රු.255,795,500ක අයකළ යුතු මුද්දර ගාස්තු පැවතුණි. |
| 10.2020 ජුනි 30 දිනට දෙපාර්තමේන්තුව විසින් හිඟ බදු අය කර ගැනීම සඳහා පවරා ඇති නඩු සංඛ්‍යාව 1739ක් අතරින් හිඟ බදු රු. 2,050,972,192කට අදාළ නඩු 793ක් බහා තබා තිබුණි. | හිඟ බදු අයකර ගැනීම සඳහා පවරා ඇති නඩු ලිපිගොනු සම්බන්ධයෙන් කටයුතු කඩිනම් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගතයුතු බව. | නිවැරදි ලිපිනයන් පරීක්ෂා කොට නඩු පවරන ලෙසට අංශ දැනුවත් කොට ඇති බව. | මේ වන තෙක් බහා තබා ඇති නඩු සම්බන්ධ කටයුතු සම්පූර්ණයෙන්ම විසඳී නොතිබුණි. |
| 11.2011 සිට 2015 තක්සේරු වර්ෂය දක්වා Legacy පද්ධතියේ බදු ගෙවන්නන් 552 කුගේ රු.3,963,865,684 ක් වූ බදු ආපසු ඉල්ලීම් හා රු. 58,510,467,150 ක් වටිනා හිඟ බදු හා දඩ ශේෂයන් සම්බන්ධයෙන් දේශීය ආදායම් පනතේ 150 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර ගැනීම් සිදුවී නොතිබුණි. | පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතු බව. | බදු ආපසු ගෙවීම් වලින් හිඟ බදු හිලව් කරමින් පවතින බව. | 2021 අංක 10 දරන දේශීය ආදායම් සංශෝධන පනත හා 2021අංක 18 දරන මුදල් පනත අනුව, බදු ගෙවන්නාගේ එකඟතාවය මත බදු ආපසු ගෙවීම් වලින් හිඟ බදු හිලව් කිරීමට කටයුතු කරන බව දැනුම් දී ඇති නමුත් විගණන නිරීක්ෂනයෙන් පෙන්වා දී ඇති වටිනාකම සම්පූර්ණයෙන් නිරවුල් වී නොතිබුණි. |
| 12.2020 ජුනි 30 දිනට Legacy පද්ධතියට අදාල රු. 1000 ට වඩා වැඩි ප්‍රමාණයේ ආදායම් බදු, ආර්ථික සේවා ගාස්තු හා එකතු කළ අගය මත බදු සඳහා හිඟ බදු වටිනාකම වූ (Version -0) | පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු බව. | හිඟ බදු කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | 2021 අංක 18 දරන මුදල් පනතේ විධිවිධාන යටතේ සුදුසුකම් නොලබන හිඟ බදු අය කර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| රු.31,065,548,562ක් නිරවුල් කර නොතිබුණි. | | | කටයුතු කරනු ලබන බව දන්වා ඇති නමුත් විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති සියලුම හිඟ බදු නිරවුල් කොට නොතිබුණි. |
| 13.බදු ලිපිගොණු අංක 409066828 දරන ආයතනයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් ලැබිය යුතු හා ගෙවිය යුතු VAT බදු රු.837,509,421 ක් හා රු.558,997,052 ක් වුවත් Legacy හා RAMIS පද්ධතියට අදාළව බදු ආපසු ගෙවීම් එකතුව රු.99,410,994ක් ද, හිඟ බදු හා දඩ මුදල් රු.24,716,820 ක් ද වීමෙන් මුල්‍ය ප්‍රකාශන හා පද්ධතියෙහි තොරතුරු අතර රු.738,098,427 ක් හා රු.534,280,232ක නොගැලපීමක් නිරීක්ෂණය වු අතර මේ සම්බන්ධයෙන් RAMIS පද්ධතියේ VAT වලට අදාළව නිම නොවු වැඩ අයිතම 15 ක් පවතී. | හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු අතර ලිපිගොනුව පරිපාලනය කරන අංශය විසින් නිවැරදි තොරතුරු ලබා දීමට කටයුතු කළයුතු බව. | විස්තරාත්මක විගණනයක් ආරම්භ කර ඇති අතර වාර්තා වල නොගැලපීම් නිවැරදි කිරීමට බදුකරුට දැනුම් දී ඇති බව. | විගණනයෙන් නිරීක්ෂණය වු සියලු කරුණු විසඳී නොමැති අතර 2022.01.17 දිනට මේ සම්බන්ධයෙන් වු නිම නොවු වැඩ අයිතම 27ක් පැවතුණි. |
| 14. RAMIS, Legacy පද්ධතියට හා DTRU අංශයට අනුව බදු ලිපිගොණු අංක 409000053 දරන බදු කරුවකුට අදාළව 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ බදු හා දඩ ශේෂය රු.18,398,612,329 ක් වු අතර ඊට අදාළව පද්ධතියේ නිම නොවු වැඩ අයිතම 34ක් ද විය. | හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු අතර නිලධාරියා වෙත යොමු වී ඇති වැඩ අයිතම නියමිත පරිදි නිම කළ යුතු බව. | නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බවත්, උපලේඛන හා පද්ධතියෙහි දත්ත අතර නොගැලපීම් සම්බන්ධයෙන් බදුකරුවන් දැනුවත් කරන බව. | හිඟ බදු සම්පූර්ණයෙන්ම විසඳී නොමැති අතර දැනට නිම නොවු වැඩ අයිතම 54 ක් පවතී. |

| | | | |
|---|---|---|---|
| 15.RAMIS පද්ධතියෙන් වර්ෂ 2015 සිට 2019 වර්ෂය දක්වා නිලධාරීන්ට යොමු කර තිබූ බදු ලිපිගොනු 110,581කින් බදු ලිපි ගොනු 80,763ක් සඳහා ලබා දී ඇති කාල සීමාව අවසන්ව තිබූ නමුත්, ඒවා තවමත් නිම නොවූ වැඩ අයිතම් ලෙස පැවති අතර එය සියයට 73ක් ප්‍රතිශතයක් විය. | අදාළ වැඩ අයිතම නිම කිරීමට අවශ්‍ය කටයුතු කළයුතු බව. | වැඩ අයිතම නිම කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇති බව. | අදාළ වැඩ අයිතම සම්පූර්ණයෙන්ම නිම වී නොතිබුණි. |
| 16. (i) අභියාචනය ලැබී වසර 2 ඉක්මවූ විසඳමින් පවතින තත්ත්වයේ (Accepted) පවත්නා අභියාචනා 61හි මතභේදාත්මක බදු හා දඩ මුදල් රු.577,189,148ක් විය. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා වෙත යොමු කරන ලද එකතුව රු. 15,280,049,777 ක් මතභේදකාරී බදු හා දඩ මුදලක් ඇතුළත් අභියාචනා 79ක් ද විය. | 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 165 (14) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කලයුතු බව. | අභියාචනා විසඳීම සඳහා අදාළ අංශයේ නිලධාරීන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙනත් අංශ වල නිලධාරීන් ද තාවකාලිකව අනුයුක්ත කිරීමත්, තවත් අභියාචනා සංඛ්‍යාවක්, ලිපි ගොනුව භාර අංශයේ නිලධාරීන්ට යොමු කිරීමත් සිදු කර ඇති බව. | අභියාචනා අංශ වල පවතින 61න් 55ක් විසඳා අවසන්ව ඇති අතර කොමසාරිස් ජනරාල්වරයා යටතේ විභාග වන 79න් 71ක් විසඳා අවසන්ව තිබුණි. |
| (ii) බදු අභියාචනා හා බදු ගෙවන්නන් විසින් සිදු කරනු ලබන විමසීම් ලෙස වෙන්කර හඳුනා නොගත් ඉදිරි කටයුතු කළ බව තහවුරු නොවූ බදු ගෙවන්නන්ගේ යොමුකිරීම් 474ක් පැවති අතර ඒවායේ ඇතුළත් බදු හා දඩ මුදල් පිළිවෙලින් රු.1,316,489,719 ක් හා රු. 269,899,192ක් විය. එම යොමු කිරීම් තුළ බදු අභියාචනා ද ඇතුළත් විය හැකි බව නිරීක්ෂණය විය. | - එම - | - එම - | බදු ගෙවන්නන්ගේ යොමු කිරීම් 474න් 97ක් අභියාචනා ලෙස හඳුනා ගෙන ඉන් 28ක් පමණක් විසඳා අවසන් කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| 17.තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ තනතුරු 28 ක් මේ දක්වා බඳවා නොගැනීම, නව අදායම් බදු පරිපාලන පරිගණක පද්ධතිය (RAMIS) මෙහෙයවීම හා එහි නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම ප්‍රමාද වීම කෙරෙහි සෘජුවම බලපෑමක් ඇති කර තිබුණි. | අත්‍යාවශය තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කළයුතු බව. | මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ඒකාබද්ධ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත. | මෙම පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කරන බව ඒකාබද්ධ අධ්‍යක්ෂ ජනරාල් දන්වා ඇති අතර RAMIS 2.0 පවරා ගැනීමට නොහැකිව 2023 වර්ෂය දක්වා කල් දැමීමට සිදු වී තිබුණි. |
| | | | |
| 18. 2021 මාර්තු 29 දිනට RAMIS පද්ධතිය තුළ රු.මිලියන1,385 ක නිරවුල් නොවූ අවිනිශ්චිත ශේෂයක් පැවතීම හේතුවෙන් හිඟ බදු ශේෂය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි. | අවිනිශ්චිත ගිණුමට අදාළ ශේෂ නිවැරදිව හඳුනා ගෙන කඩිනමින් නිරවුල් කළ යුතු බව. | මාර්ගගත ක්‍රමයට බදු ගෙවීමේ (OTPP) ක්‍රමවේදය 2021 පෙබරවාරි 08 වන දින සිට වාණිජ බැංකු කිහිපයක් හරහා බදු ගෙවන්නන් වෙත හඳුන්වා දීම. | 2022 ජනවාරි 28 දිනට රු.මිලියන1,153ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් පැවතුණි. |
| | | | |
| 19. කැසිනෝ ව්‍යාපාර 04කින් රු.මිලියන2,670ක බදු මුදලක් අය කර ගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ක්‍රියාත්මක කර හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හිඟ බදු අයකර ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත. | නඩු විභාගය අවසන් කොට නියෝගය ලබා දීමට 2022 මාර්තු 07වන දිනට, දින නියම කර ඇති බව. |
| 20. අවලංගු කරන ලද බදු පනත්වලට අදාළව Legacy පද්ධතිය යටතේ රු.8,632,395,894ක් වූ අය විය යුතු බදු අයකර ගැනිමට පියවර ගෙන නොතිබුණි. | අවලංගු කරන ලද බදු පනත්වලට අදාළව හිඟ බදු ශේෂ කාලීනව අය කිරීමට විධිමත් පියවර ගත යුතු වීම. | අදාළ හිඟ බදු නිරවුල් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | Legacy පද්ධතියෙහි 2021.06.30 දිනට අවලංගු කරන ලද බදු වලට අදාළව රු.7,948,004,219 ක ශේෂයක් පැවති. |
| | | | |

| | | | |
|---|---|---|---|
| 21.2019 දෙසැම්බර් 31 දින වන විටත්, 2016 සිට 2019 කාලපරිච්ඡේදයට අදාළ බදු ලිපිගොණු 329,979 කින් බදු වාර්තා 764,251 ක් දෙපාර්තමේන්තුවට ආපසු ලැබී නොමැති වීමත්, ඉන් බදු වාර්තා 148,329ක් සඳහා පමණක් වැඩ අයිතම පැවරීම හා ඒවා නිම කර නොතිබුණි. ඉතිරි බදු වාර්තා 615,922ක් සඳහා වැඩ අයිතම නිකුත් නොකිරීම හේතුවෙන් අපේක්ෂිත බදු ආදායම රැස් කර ගැනීම, නිවැරදි හිඟ බදු ගණනය, බදු ලිපි ගොනු විගණනය හා අතිරේඛ බදු රැස් කිරීම යනාදීය යාවත්කාලීනව සිදුව නොතිබුණි. | පද්ධතිය හරහා නිලධාරීන් වෙත වැඩ විෂයයන් යොමු කර බදු වාර්තා කඩිනමින් ගෙන්වා ගැනීම හා වාර්තා ඉදිරිපත් නොකරන බදු ගෙවන්නන් සම්බන්ධයෙන් බදු පනත්වල විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාළ වැඩ අයිතම නිම කිරීමේ ඉලක්ක නිලධාරීන් වෙත ලබා දී ඇති බව. | 2021 වර්ෂයේ සිදු කරන ලද විගණන පරීක්ෂාවකට අනුව, 2016 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු බදු වාර්තා අතරින් බදු ලිපි ගොනු 339,011 කට අදාළව බදු වාර්තා 731,801ක් ලැබී නොතිබූ අතර ඉන් බදු ලිපි ගොනු 42,396කට අදාලව බදු වාර්තා 60,837ක් සම්බන්ධයෙන් පමණක් වැඩ අයිතම නිකුත් වී තිබුණි. |
| 22.RAMIS පද්ධතියට අනුව, 2016 සිට 2019 වර්ෂය දක්වා බදු ගෙවන්නන් 210,572 ගෙන් ලැබී ඇති බදු වාර්තා 283,055 ක් පද්ධතිය තුළ 2020 පෙබරවාරි 27 දින වන විටත්, ක්‍රියාවලියට භාජනය කර නොතිබීම හේතුවෙන් බදු පරිපාලන කටයුතු කාර්යක්ෂමව සිදු නොවන බව නිරීක්ෂණය විය. | ලැබෙන සියලුම බදු වාර්තා හැකි ඉක්මනින් පද්ධතියට ඇතුළත් කර ක්‍රියාවලියට භාජනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු වීම. | අදාළ වැඩ අයිතම නිම කිරීමේ ඉලක්ක නිලධාරීන් වෙත ලබා දී ඇති බව. | 2021 වර්ෂයේ සිදු කරන ලද විගණන පරීක්ෂාවකට අනුව, 2016 සිට 2021.11.03 දක්වා බදු වාර්තා 124,006ක් සඳහා ස්ථිර භාර ගැනීමේ ලිපි නිකුත් කර නොතිබුණි. |
| | | | |
| **23.**TIN අංක 114105198 දරන බදු ලිපි ගොනුව සම්බන්ධයෙන් 2018 වර්ෂයේ දී විමර්ශනයක් ආරම්භ කර තිබුණ ද 2020 මැයි 11 දින දක්වාත් විමර්ශනය නිම | බැංකු බැර වීම් තුලින් ආදායම නිවැරදිව හඳුනා ගෙන එය බද්දට යටත් කර නිවැරදි බදු බැඳියාව වෙනුවෙන් | බදු ගෙවන්නා සමඟ සාකච්ඡා කර බැංකු බැරවීම් සැසඳීම් කිරීමෙන් පසුව තක්සේරු වාර්තා නිකුත් කිරීමට කටයුතු | හිඟ බදු සම්පූර්ණයෙන්ම නිරවුල් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| කර තක්සේරු වාර්තා නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි. | තක්සේරු වාර්තා නිකුත් කර බදු හා දඩ මුදල් අය කර ගත යුතු වීම හා විමර්ශන අංශයේ විමර්ශන කටයුතු කඩිනම් කිරීම හා එය අධීක්ෂණය වන අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කළ යුතු වීම. | කරන බව. | |
| 24.ටින් අංක 580451985 දරන බදු ගෙවන්නා විසින් ප්‍රසම්පාදන කටයුතු වලදී ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ආදායමට වඩා අඩුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම මත පිලිවෙලින් 2016/17 හා 2017/18 තක්සේරු වර්ෂවලට අදාළව රු.587,339,848 ක් හා 593,244,082ක් අඩුවෙන් බදු ගණනය වී තිබූ අතර 2018 හා 2019 වර්ෂ වලදී මහ නගර සභාව වෙත සේවා සැපයීම මත රැස් කර තිබූ එකතු කළ අගය මත බදු රු.48,247,172ක් අඩුවෙන් වාර්තා කර තිබුණි. මේවා නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | නිවැරදි ආදායම මත අතිරේක බදු අය කිරීමටත්, නිවැරදි වාර්තා ඉදිරිපත් නොකිරීම මත බදු ගෙවන්නාට එරෙහිව බදු පනත්වල විධිවිධාන ප්‍රකාරව නීතිමය පියවර ගැනීමටත්, ක්‍රියා කළ යුතු වීම. | මහ නගර සභාවෙන් හා බදු ගෙවන්නාගෙන් තොරතුරු කැඳවා පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව. | අතිරේඛ තක්සේරු වාර්තා නිකුත් කර ඇති නමුත් හිඟ බදු සම්පූර්ණයෙන්ම අය කර ගෙන නොතිබුණි. |
| 25.බදු ලිපි ගොනු අංක 593120988 දරන බදු ගෙවන්නා විසින් 2010 ජුනි සිට 2019 දෙසැම්බර් දක්වා බදු ආදායම් රු.73,465,186 ක් අඩුවෙන් වාර්තා කර තිබූ අතර ඒ සඳහා රු.58,047,389ක් සඳහා පමණක් අතිරේඛ තක්සේරුවක් නිකුත් කර ඒ | විස්තරාත්මක තොරතුරු කැඳවා නිවැරදි බදු බැඳියාව මත අතිරේක බදු අය කිරීම හා එකතු කළ අගය මත බදු පනතට අනුව බදු ගෙවන්නා සම්බන්ධයෙන් නීතිමය | අතිරේක තක්සේරු නිකුත් කර මුදල් අය කරන බව. | අතිරේඛ තක්සේරු වාර්තා නිකුත් කර ඇති නමුත්,හිඟ බදු සම්පූර්නයෙන් අයකර ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| මත රු.11,000,000 ක් පමණක් අයකර ගෙන ඇති නමුත්, වැට් බදු පනතේ 66 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පියවර ගැනීමට කටයුතු කළයුතු වීම. | | |
| 26. දෙපාර්තමේන්තුව විසින් අංක 174008957 දරන බදු ලිපිගොනුවට අදාළ විගණනයක් සිදු කර තිබූ අතර එහි දී එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වාර්තා අනුව රු.1,029,007 ක පිරිවැටුම් වෙනසක් හඳුනා ගෙන ඒ සඳහා අතිරේක තක්සේරුවක් නිකුත් කර නොතිබුණි. | නිවැරදි බදු බැඳියාව මත තක්සේරු නිකුත් කර බදු අය කර ගත යුතු වීම. | නිවැරදි බදු මුදල සඳහා අතිරේක තක්සේරුවක් නිකුත් කරන බව. | අතිරේක පිරිවැටුම, වැට් වාර්තා වලට එක් කොට තක්සේරු නිකුත් කර ඇති නමුත් හිඟ බදු සම්පූර්ණයෙන් අයකර ගෙන නොතිබුණි. |
| | | | |
| 27. බදු ගෙවන්නන් 668 ක් විසින් රාජ්‍ය ආයතන 83 කින් රැස් කළ රු.1,031,172,093 ක VAT බදු මුදලක් බදු ගෙවන්නන් විසින් VAT බදු වාර්තා සමඟ ඉදිරිපත් කර ඇති නිමැවුම් උප ලේඛන තුළ ඇතුළත් වී නොතිබුණි. | පරිගණක පද්ධතිය තුළ මේ වන විට යාවත්කාලීන වී ඇති තොරතුරු මත නැවත පරීක්ෂා කිරීමෙන් හා අදාළ රාජ්‍ය ආයතනවලින් තවදුරටත් තොරතුරු ලබා ගෙන අය විය යුතු බදු මුදල්, පනතේ විධිවිධාන ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2021.04.19 දිනැති හා අංක CGIR/2021/04/09 දරන චක්‍ර ලේඛය නිකුත් කර ඇති අතර විගණනයක් ආරම්භ කිරිමට උපදෙස් දී ඇති බව. | හිඟ මුදල් අයකර ගැනීමට විගණනයක් ආරම්භ කර ඇති බව දන්වා ඒවා ඇති නමුත් නිරීක්ෂණයෙන් පෙන්වා දි ඇති බදු ගෙවන්නන් 668ක් සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය දන්වා නොතිබුණි. |
| 28.රාජ්‍ය ආයතන 14 ක් විසින් බදු ගෙවන්නන් 33 දෙනෙක් හට රු.18,123,901 ක වැට් බදු මුදලක් ගෙවා තිබුණ ද පරිගණක පද්ධතිය අනුව සිදු කළ පරික්ෂාවේ දී ඒවා නිවැරදි නොවන බදු ලිපි ගොනු අංක විය. | මෙම බදු මුදල එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන ප්‍රකාරව අය කිරීමට කටයුතු කළ යුතු බව. | 2019.07.09 දිනැති හා අංක CGIR/2019/03/ (Ins. & Cir.) දරන චක්‍රලේඛය නිකුත් කොට ඇති අතර නිරවුල් කිරීමට උපදෙස් දි ඇති බව. | නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති බදු ගෙවන්නන් 33 දෙනා පිළිබඳව ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| 29.නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ පරිදි බදු ගෙවන්නන් 05 දෙනෙකු විසින් රාජ්‍ය ආයතන 04 කින් රු.15,848,913 ක VAT මුදල් රැස් කර තිබුණ ද එම කාල පරිච්ඡේදයට අදාළව කිසිදු නිමැවුම් බද්දක් වාර්තා කර නොතිබුණ අතර හිස් බදු වාර්තා පමණක් ඉදිරිපත් කර තිබුණ බව නිරීක්ෂණය විය. | අදාළ රාජ්‍ය ආයතනවලින් තවදුරටත් තොරතුරු ලබා ගෙන අය විය යුතු බදු මුදල්, පනතේ විධිවිධාන ප්රකාරව අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2021.04.19 දිනැති හා අංක CGIR/2021/04/09 දරන චක්‍ර ලේඛය නිකුත් කොට ඇත. | බදු කරුවන් 03 දෙනෙකු සඳහා සම්පූර්ණ ලෙස තක්සේරු නිකුත් කර නොතිබුණි. |
| 30. බදු ගෙවන්නන් 21 දෙනෙකු විසින් රාජ්‍ය ආයතන 03කින් රු.28,769,492 ක වැට් බදු ලෙස රැස් කර තිබුණ ද අදාළ බදු කාල පරිච්ඡේද සඳහා බදු කරුවන්ගේ නිමැවුම් බද්ද ලෙස රු.8,514,732 ක් පමණක් එනම් රාජ්‍ය ආයතනවලින් රැස් කළ මුදලින් රු.20,254,760 ක් අඩුවෙන් බදු වාර්තාවල දක්වා තිබුණි. | අදාළ රාජ්‍ය ආයතනවලින් තවදුරටත් තොරතුරු ලබා ගෙන අය විය යුතු බදු මුදල්, පනතේ විධිවිධාන ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | -එම- | බදු වටිනාකම අඩුවෙන් පෙන්වා ඇති බදුකරුවන් සඳහා ඇස්තමේන්තු නිකුත් කර ඇති බව දන්වා තිබුණ ද නිරීක්ෂණයට අදාළ එක් එක් බදුකරුගේ වර්තමාන තත්ත්වය දක්වා නොතිබුණි. |
| 31.රාජ්‍ය ආයතන 36 ක් විසින් බදු ගෙවන්නන් 178 දෙනෙකු හට එකතුව රු.309,805,817 ක වැට් බදු ගෙවා තිබුණ ද නිමැවුම් උප ලේඛන ඉදිරිපත් කර නොතිබුණ අවස්ථා හා පරිගණක පද්ධතියේ වාර්තා ඇතුළත්ව නොතිබුණ අවස්ථා විය. | අදාළ රාජ්‍ය ආයතනවලින් තවදුරටත් තොරතුරු ලබා ගෙන අය විය යුතු බදු මුදල්, පනතේ විධිවිධාන ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | -එම- | නිරීක්ෂණයට අදාළ එක් එක් බදුකරුගේ වර්තමාන තත්ත්වය දක්වා නොතිබුණි. |
| 32. Legacy බදු පරිපාලන පද්ධතිය යටතේ ලැබී ඇති අගරු චෙක්පත් 5,558 ක් හා RAMIS බදු | අගරු චෙක්පත් සඳහා මුදල් අය කර ගැනීමට හෝ පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කඩිනම් | මාර්ගගත ක්‍රමයට බදු ගෙවීමේ (OTPP) ක්‍රමවේදය 2021 පෙබරවාරි 08 වන දින | 2021.09.30 දිනට අගරු චෙක්පත් ගණන 4,998ක් වූ අතර එහි |

| | | | |
|---|---|---|---|
| පරිපාලන පද්ධතිය යටතේ ලැබී ඇති අගරු චෙක්පත් 2,502 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,031.8 ක් වටිනා චෙක්පත් 8,060 ක් 2019 ජුනි 30 දිනටත් නිරවුල් කර ගෙන නොතිබුණි. | පියවර ගත යුතු වීම | සිට වාණිජ බැංකු කිහිපයක් හරහා හඳුන්වා දීම මත චෙක් පත් මඟින් බදු ගෙවීම අධෛර්යමත් කිරීම සිදු කරනු ලබන බව. | වටිනාකම රු.මිලියන 1,690.4ක් නිරවුල් කර නොතිබුණි. |
| 33.විගමන බද්ද ලෙස රු.16,682,442 ක් රැස් කර තිබුණ ද විදේශ විනිමය ප්‍රමාණය නිශ්චය කර බදු පැහැදම වැඩි කර ගැනීමේ යාන්ත්‍රණයක් හෝ ක්‍රමවේදයක් සකස් කර ගැනීමට දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි. | බදු පදනම නිවැරදිව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතු බව. | බදු පදනම හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරන බව. | ආගමන විගමන දෙපාර්තමේන්තුව හා විනිමය පාලන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා ඇති නමුත් බදු පදනම හඳුනා ගැනීමේ ක්‍රම වේදයක් මෙතෙක් සකස් කර නොතිබුණි. |
| 34. වාහන හිමිකම් බද්දට අදාළ විවෘත කළ ණයවර ලිපි සංඛ්‍යා අනුව සමාලෝචිත වර්ෂයේ වාහන හිමිකම් බද්ද රු.2,695,261,000 ක් වුව ද මූල්‍ය ප්‍රකාශන අනුව වාහන හිමිකම් බද්ද රු.2,191,685,363 ක් වූයෙන් රු.503,575,637 ක නොසැසඳීමක් විය. | රැස් කිරීමේ ගිණුමට බැරවන ආදායම, වාර්තා සමඟ සසඳා අනාවරණය වන නොසැසඳීම් අදාළ අංශ දැනුවත් කර කාලීනව විසඳා ගත යුතු බව. | මෙම බද්ද රැස් කිරීමේ වගකීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉවත් කර ඇති බැවින් වැළැක්වීමේ ක්‍රියා මාර්ග දක්වා නොතිබුණි. | වාහන හිමිකම් බද්ද එකතු කිරීමේ වගකීම 2019.05.01 දින සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙන් ඉවත් කර තිබුණි. |
| 35. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීමට හා මහල් 9 කින් යුත් රථගාලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 1,430.5 ක ගිවිසුම් ගත මුදලකට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා දී තිබුණ අතර 2018 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 1,399.7 ක මුදලක් සංස්ථාව | කොන්ත්‍රාත් කරු වෙතින් අදාළ නවීකරණ කටයුතු හා රථගාලේ ඉදි කිරීම් කටයුතු කඩිනමින් කරවා ගැනීම සඳහා පියවර ගත යුතු බව. | සිදු කරන ලද කාර්යයන්ට අදාළව ගෙවීම් සිදු කිරීමේ දී සකසන ලද බිල් පත් ඉංජිනේරුමය කාර්යයන් පිලිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ නිර්දේශයන්ට අනුව ගෙවීම් සිදු කරනු ලබන බව. | මෙතෙක් ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| වෙත ගෙවා තිබුණ ද නවීකරණ කටයුතු නිසි පරිදි ඉටු වී නොතිබුණ අතර රථවාහන අංගනය නිෂ්ක්‍රීය වත්කමක් ලෙස පැවතින. | | | |
| 36.ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නවීකරණයේ දී දෙපාර්තමේන්තුවට සපයා දී තිබුණ ට්‍රාන්ස්පෝමර් යන්ත්‍ර 02 ක් 2010 වර්ෂයේ සිට 2019 මැයි 15 දක්වාත් භාවිතයට ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යන් ඉටු කර ගැනීම සඳහා වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කළ යුතු බව. | වැළැක්වීමේ ක්‍රියා මාර්ග නිෂ්චිතව සඳහන් කර නොතිබුණි. | ට්‍රාන්ස්පෝමර් භාවිතයට ගැනීම සඳහා කටයුතු සිදු කර නොතිබුණි. |
| 37. 2010 වර්ෂයේ දී රු.7,985,992 ක පිරිවැය දරා දෙපාර්තමේන්තුව තුළ සවි කර ඇති CCTV කැමරා 70 ක් එදින සිට 2019 මැයි 15 දින දක්වාත් භාවිතයට ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යන් ඉටු කර ගැනීම සඳහා වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කළ යුතු බව. | වැළැක්වීමේ ක්‍රියා මාර්ග නිෂ්චිතව සඳහන් කර නොතිබුණි. | නිෂ්ක්‍රීය වත්කමක් වශයෙන් වර්තමානයේ ද පැවතේ. |

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව

| | විගණන වාර්තාවට ඇතුලත්කර ඇති ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිවරයාගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 1. | 2019 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම්වලට අදාලව ඉදිරිපත් කර තිබූ ඒසීඒ 4 ප්‍රකාශනය අනුව පැවති ශේෂයන් හා 2020 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඒසීඒ 4 ප්‍රකාශනයේ පැවති ආරම්භක ශේෂයන් අතර රු.101,917,351 ක වෙනසක් නිරීක්ෂණය විය. | දිගු කාලයක සිට ගිණුම්වල දැක්වෙන මෙම වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කල යුතු වීම. | මෙය වර්ෂ කිහිපයක සිටම ආරම්භක ශේෂයේ පැවත එන මෙම වෙනස තවදුරටත් නිවැරදි කර නොමැත. | මෙම වෙනස තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල පවතී. |
| 2. | 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2399 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් | (i) රජයේ පොදු විධාන හා රාජ්‍ය ගිණුම්කාරක සහා නියෝග පිළිපැදිම දැඩි ලෙස සැලකිල්ලට ගත යුතු වීම. | වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොමැත. ඇඟිලි සලකුණු තැබීම පිළිබඳ වාර්තාවක් | තවදුරටත් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කරනු නොලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.1,925,498,453 ක් ද රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.1,014,489,891 ක්ද වශයෙන් එකතුව රු.2,939,988,344 ක් ගෙවා තිබූ අතර එකී වියදම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ සාක්ෂිය වන සේවයට වාර්තා කල බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. | (ii) මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කිරීම.<br>(iii) සේවක කළමනාකරණය හා සම්බන්ධව පවතින සතුටුදායක නොවුණු අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම. | 2021 අප්‍රේල් 06 දින ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති බවට වාර්තා කර ඇත. | |
| 3. | 2005 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නියමිත බදුගෙවා බැංකු ඇපකර නිදහස් කර ගැනීමට කටයුතු නොකර රු.5,561,829 ක් පැවති අතර එම කාලපරිච්ඡේදය තුළ බැංකු ඇපකර මත භාණ්ඩ නිදහස් කර ගැනීමට ලියාපදිංචි වූ සංඛ්‍යාව හා නිදහස් කර ගැනීමට කටයුතු කළ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුනි. | බැංකු ඇපකර ලබා ගැනීමේදී හා නිදහස් කිරීමේදී නිසි සැලකිල්ලක් දැක්විය යුතු බව. | මෙම ඇපකර සඳහා උසාවිවල නඩු පවතින බැවින් නිදහස් කර නොමැත. | වර්තමාන තත්ත්වය වාර්තා කර නැත. |
| 4. | 2015 ජනවාරි 01 සිට 2019 ජුනි 30 දක්වා වූ වසර 04 ½ ක් වූ කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රේගුව විසින් රේගු විමර්ශන තුළින් රු.33,845,962,239 ක් වූ සමස්ත ආදායමක් රැස්කර තිබුණි. එහෙත් ඒවාට ඇතුළත් දණ්ඩන ආදායම, විකුණුම් ආදායම, රාජසන්තක කිරීමේ ආදායම හෝ තීරු බදු හා අනෙකුත් ආදායම් තීරණය කිරීමට පාදක කරගන්නා වූ භාණ්ඩවල වටිනාකම, එම වටිනාකම් තීරණය කළ ආකාරය හා අහිමි වූ තීරු බදු ආදායම | විධිමත් පරීක්ෂාවක් කල හැකි පරිදි වාර්තා ලේඛන නිසි පරිදි නඩත්තු කිරීම. | අදාල කරුණු මේ දක්වාත් විධිමත්ව පවත්වා නොතිබුණි. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | යනාදිය තහවුරු කර ගැනීමට අදාල සාක්ෂි ශ්‍රී ලංකා රේගුවේ කිසිදු අංශයකින් විගණනයට ඉදිරිපත් නොවුණි. | | | |
| 5. | 2011 වර්ෂයේදී අහෝසි කරන ලද ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද මගින් 2011 දෙසැම්බර් 31 දිනට රු.108,659,190 ක හිඟ බදු ආදායමක් අයවීමට තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකම අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම. | වැළැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| 6. | 2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ බදු ආදායමෙන් රු. 4,711,376,538 ක් හෙවත් සියයට 7 ක් නිරූපණය වන්නේ නිෂ්පාදන විශේෂ විධි විධාන මෝටර් රථවාහන බදු වටිනාකමෙන් වන අතර එයින් රු. 1,314,930,120 ක් 2017 වර්ෂයේ සිට හිඟව පැවතුණි. | මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කිරීම. | රේගු ප්‍රකාශන අංශය වෙතින් ආනයන භාණ්ඩ සම්බන්ධ තොරතුරු ලබාගෙන එම ආයතන වෙත දිගින් දිගටම දැනුම් දීමට කටයුතු කර ඇත.<br>2020 වර්ෂය තුලදී හිඟ රේගු බදු මුදල් රු.22,525,899,343 ක් අයකර ගැනීමට කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් ජාතික අයවැය, කළමනාකරණ විගණන හා ශ්‍රී ලංකා රේගුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කර ඇත. | පූර්ණ වශයෙන් නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 7. | රේගු විමර්ශනයකට අදාලව අනිවාර්ය නිවාඩු ගන්වා තිබූ නිලධාරියෙකු විදේශ ගතවීම වලක්වා තිබියදී විධිමත් අනුමැතියකින් තොරව විදේශ ගතව තිබූ බව නිරීක්ෂණය විය. | විදේශ ගතවීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම. | නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | වර්තමාන තත්ත්වය වාර්තා කර නැත. |
| 8. | රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදලින්, ත්‍යාග වශයෙන් මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් රේගු ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා නිකුත් කර තිබූ 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝග සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වර්ෂ 22 ක් තුළ ත්‍යාග මුදල් ලෙස රු. 19,748,129,578 ක් ගෙවා තිබුණි. | අමාත්‍යවරයාගේ අනුමැතිය දැක්වෙන ක්‍රමවේදය විගණනය වෙත ඉදිරිපත් කිරීම.<br>අනුමත ක්‍රියාපටිපාටියක් නොමැති නම් එසේ සිදු කල නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කිරීම. | 1988 වර්ෂයේ අංක 118 දරන දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කිරීමේ දී අවශ්‍ය අනුමැතිය ලබාගෙන එය නිකුත් කර ඇතැයි යන්න උපකල්පනය කර ඇති බවත් තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බැලිය යුතු බවත් වාර්තා කර ඇත.<br>ඉදිරි කටයුතු සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් කමිටුවක් පත් කර ඇත. | තවදුරටත් විධිමත් අනුමැතියක් ඉදිරිපත් කර නැත. |
| 9. | විධිමත් අවසරයකින් තොරව රටින් බැහැරව ගෙන යාමට උත්සාහ කළ ඇ.ඩොලර් 53,455 ක මුදල රේගුව විසින් රඳවා ගෙන තිබූ අතර මුදල් අමාත්‍යවරයාගේ ඉල්ලීම මත (රේගු ආඥා පනතේ 164 වගන්තිය යටතේ) සාධාරණ කරුණු දැක්වීමකින් තොරව මෙම මුදල නැවත ලබාදීමට කටයුතු කර තිබීම හේතුවෙන් සිදුව තිබූ රු.1,603,650 ක පාඩුවේ වටිනාකම මු.රෙ. 106 හා | රේගු ආඥා පනතේ 164 වගන්තිය අනුව රඳවාගත් භාණ්ඩ හා වෙනත් දේපල නිදහස් කිරීමට අමාත්‍යවරයාට බලය තිබුණද, අලාභ හෝ වෙනත් පිරිවැය දැරීම සඳහා බලය ලබා දී ඇති බවක් නිරීක්ෂණය නොවන හෙයින් ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු වීම. | වැළැක්වීමටගත් ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 113 යටතේ වන පාඩු ලෙස සටහන් කර තිබුණි. | | | |
| | | | | |
| 10 | ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය සිදුකළ රේගු විමර්ශනයකින් අනතුරුව විනාශ කිරීමට නිර්දේශ කර තිබූ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු ආනයනික පාම් ඔයිල් කිලෝග්‍රෑම් 105,570 ක් අඩංගු බහාළුම් 05 ක් විනාශ කළ බවට ව්‍යාජ තොරතුරු ලේඛනවල ඇතුළත් කරමින් ඒවා ගබඩා කර තැබීම හා එයින් කොටසක් වෙළඳපලට නිකුත් කිරීමට කටයුතු කිරීම සම්බන්ධ විමර්ශනයේදී එම විමර්ශනය මෙහෙය වූ මධ්‍යම අපහරණ අංශයේ නිලධාරීන් එම අංශය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණින් බැහැරව කටයුතු කර තිබුණු බව අනාවරණය වි තිබුණි. රේගු විමර්ශන සිදු කිරීම මෙන්ම එම විමර්ශනයන් සිදු කළ අංශය භාරයේ තිබූ භාණ්ඩ විනාශ කිරීම හෝ විකිණීම යන කාර්යයන්ද එම අංශය මඟින්ම සිදු කිරීමට ඉඩ සලසා දී තිබීම තුළින් සංවිධානාත්මකව අක්‍රමිකතාවයන් සිදු කිරීම සඳහා අවස්ථාව සැලසී ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම එකී අංශය විසින් ආනයනකරු පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි බව සඳහන් කරමින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර තිබුණු අතර විමර්ශන සම්බන්ධ අවසන් වාර්තාව මධ්‍යම අපහරණ අංශයේ රේගු අධ්‍යක්ෂවරයා වෙත යොමු කර නොතිබුණි. අදාල අංශයේ රේගු අධිකාරිවරයා | රේගු ආඥා පනත හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතු වීම. අදාල වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගැනීම. | එහි සඳහන් බහාලුම් 05 සම්බන්ධයෙන් මධ්‍යම විමර්ශන අංශය විසින් CIB/INV/230/2019 දරණ විමර්ශන ගොනුව යටතේ විමර්ශනයක් සිදු කරමින් පවති. එම බහාලුම් 05න් 04ක් දැනටමත් අත්අඩංගුවට ගෙන ඇත.<br><br>මෙම විමර්ශනය අවසානයේදී රේගු ආඥා පනතේ 8.1 වගන්තිය අනුව පැවැත්වීමට නියමිත රේගු පරීක්ෂණයේදී රජයට යම්කිසි පාඩුවක් සිදුවී ඇත්නම්, රේගු පරීක්ෂණය පවත්වනු ලබන පරීක්ෂණ නිලධාරියාගේ නියෝග මත එම පාඩුව වරදකරුවන්ගෙන් අයකර ගැනීමට තීරණය කර ඇති බව වාර්තා කර ඇත. | පරීක්ෂණ සිදුකරමින් පවති. වර්තමාන තත්ත්වය වාර්තා කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | හා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයා විසින් මෙම විමර්ශනයේ අවසන් තීරණය ගෙන තිබුණි. | | | |
| 11 | මහජන ඇමතුම් උපකරණ සවිකර ආනයනය කර තිබූ රු.මිලියන 9 කට ආසන්න වටිනාකමකින් යුතු සුඛෝපභෝගී Toyota Land Cruiser මාදිලියේ වාහනයක් විශේෂ කාර්යය වාහන කණ්ඩය යටතේ රු.මිලියන 1.5 ක බද්දක් පමණක් අයකරගෙන නිදහස් කිරීමට ශ්‍රී ලංකා රේගුවේ NC කමිටුව කටයුතු කර තිබුණි. මෙම මාදිලියේ වාහන මගී ප්‍රවාහන කණ්ඩය යටතේ නිශ්කාෂණය කලේ නම් රු.මිලියන 56 කට ආසන්න බද්දක් අයවිය යුතුව තිබුණි. ඒ හේතුවෙන් රජයට රු. 54,642,528 ක බදු ආදායමක් අහිමි වී තිබුණි. | අයවිය යුතු නියමිත ආදායම අයකර රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමට කටයුතු කල යුතු බව.<br>ශ්‍රී ලංකා රේගුවේ NC කමිටුව සඳහා රේගු ආඥා පනතින් ලබාදී ඇති බලය, කමිටුව සාමාජිකයින්ගේ තීරණවලට එරෙහිව අභියාචනා බලය හා NC කමිටු කාර්යභාරය විධිමත් හා විනිවිදභාවයකින් සකස් කල යුතු බව. | Toyota Land Cruiser වාහනය සම්බන්ධව මධ්‍යම විමර්ශන අංශය විසින් අංක CIB/INV/2019/0206 යටතේ රේගු විමර්ශනයක් ආරම්භ කර ඇති අතර, එම විමර්ශනයේදී නිවැරදි රේගු භාණ්ඩ සංයෝජිත අංක ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ NC කමිටුවේ (Nomenclature & Classification Committee) වෙත යොමු කර ඇත. එම කමිටුව විසින් වර්ගීකරණය අංකය ලෙස 87059091 වශයෙන් නිගමනය කර ඇත. එම තීරණය මත එම වාහනය ආනයන කරු වෙත මුදාහැර ඇත.<br>එහෙත් අහිමි වූ ආදායම අයකර ගැනීමක් වාර්තා වී නොමැත. | තවදුරටත් නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| 12 | රේගු ආඥා පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව පළමු අවස්ථාවේදී බදු නොගෙවා භාණ්ඩ ගුදම් ගත කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් පෞද්ගලික ආයතනයක් වෙත අවස්ථාව | රේගු ආඥා පනත උල්ලංඝනය කිරීම, දේශීය ඉන්වොයිසීන් පිළිගැනීම, ආනයනකරුවන්ට අයුතු ලාභ ලබා ගැනීමට අනුබල දීම, රේගු විමර්ශනයන් | මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කළ විශේෂ කමිටුවක් මගින් සිදුකරන ලද | මේ පිළිබඳව නීතිපතිතුමාගේ උපදෙස් ලබාගෙන ඇති වාර්තා කිරීම හැර වෙනත් |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාදී තිබූ අතර ඒ සඳහා රේගු සටහන්කර (Cusdec) 08 ක් නිකුත් කර තිබුණි. ඒ අනුව ඇ.ඩො. 5,139,621 ක භාණ්ඩ ගුදම් කර (To Bond) තිබුණි. රේගු ආඥා පනතේ 86 වන වගන්තිය අනුව භාණ්ඩ ගුදමෙන් නිදහස් කර ගැනීමේදී කලින් ප්‍රකාශ කරන ලද භාණ්ඩ තොගයේ ඉන්වොයිස් අගයම ප්‍රකාශ විය යුතු විය. එහෙත් දේශීයව සැකසූ ඉන්වොයිස් භාවිතා කර අදාල වටිනාකම මගින් ඇ.ඩො. 6,350,364 ක් ලෙස ව්‍යාජ තොරතුරු සහිත ආනයන සටහන්කර ඉදිරිපත් කර තිබුණි. එමගින් ඇ.ඩො. 1,210,743 ක වටිනාකමක් අදාල ආයතනයට වැඩිපුර ලබා ගැනීමට අවස්ථාව සලසා තිබුණි. | නිවැරදිව සිදු කිරීම රජයේ ආයතනයක් නොමඟ යවා අලාභ ඇති වන පරිදි කටයුතු කිරීම සම්බන්ධව නිසි පියවර ගැනීම. | විමර්ශනයේ වාර්තාවේ සඳහන් නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව වාර්තා කර ඇත. එම නිර්දේශ අනුව , රේගු ආඥා පනතේ 72 හා 86 වගන්ති අනුව ක්‍රියා කිරීම.<br>ගුදම් රාජකාරී සේවයේ නිරත නිලධාරින්ට අදාළ ක්‍රියාපටිපාටිය පිළිබඳ පැහැදිලි උපදෙස් ඇතුලත් නිශ්චිත දෙපාර්තමේන්තු නියෝග ලබා දීම, භාණ්ඩ සාමාන්‍ය ගුදම්ගත කිරීමට අවසර ලබා දීමේ ලිඛිත ක්‍රමවේදයක් සැකසීම, රාජ්‍ය ආයතන විසින් විවිධ ව්‍යාපෘති සඳහා භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීමේදී විදේශ විනිමය භාවිතා කොට ගෙවීමට එකඟ විය යුත්තේ සත්‍ය වශයෙන්ම එම භාණ්ඩ ආනයනය කිරීම සඳහා වැයවූ CIF වටිනාකම සමාන ලෙස සැලකීම වැනි පියවර ගැනීමට කටයුතු කර ඇති බවට වාර්තා කර ඇත. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 13 | ඉහත සිද්ධියට අදාලව ගුදමට භාණ්ඩ භාරගැනීමේදී ගෙවිය යුතුව තිබූ බදු ගණනය රු.263,301,203 ක් වුවද, ගුදමෙන් භාණ්ඩ නිදහස් කිරීමේදී බදු ගණනය රු.325,800,859 ක් ලෙස පෙන්වා තිබූ බැවින් ශ්‍රී ලංකා රජයට රු.62,499,656 ක බදු මුදලක් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි. | -එම- | -එම- | වර්තමාන තත්ත්වය වාර්තා කර නැත. |
| 14 | ඉහත සිද්ධියට අදාලව ව්‍යාජ ඉන්වොයිස් සැකසීම, ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර විදේශීය මෙන්ම දේශීය මුදල්ද ලබාගෙන තිබියදී මේ සම්බන්ධ විමර්ශන සිදු කරන ලද ශ්‍රී ලංකා රේගුව විසින් අදාල ආයතනය විසින් වරදක් කර නොමැති බව සලකා විමර්ශන අවසන් කිරීම විගණනයේදී ප්‍රශ්ණගත විය. | -එම- | -එම- | -එම- |
| 15. | 2015 ජනවාරි 01 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රේගුවේ විවිධ අංශයන් විසින් රේගු විමර්ශන 25,674 ක් ලියාපදිංචි කර තිබූ අතර මෙම විමර්ශනවලින් සියයට 26 ක් හෙවත් 6716 ක ප්‍රමාණයක් විගණිත දිනය වූ 2020 සැප්තැම්බර් 22 වන විටත් අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. ඉන් විමර්ශන 1090 ක් වර්ෂ 05 කට වැඩි කාලයක්ද, විමර්ශන 928 ක් වර්ෂ 04 ත් 05 ත් අතර කාලයක්ද, විමර්ශන 942 ක් වර්ෂ 03 ත් 04 ත් අතර කාලයක්ද, විමර්ශන 900 ක් වර්ෂ 02 කට වැඩි කාලයක්ද, විමර්ශන | රේගු විමර්ශන ආරම්භ කිරීමට ප්‍රමාදයන් සමාලෝචනය කිරීම හා විමර්ශන කටයුතු අවශ්‍ය කර රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම.<br>රේගු විමර්ශන දත්ත අතර වෙනස්කම් පෙන්වීම තුලින් මූලික දෝෂය නිවැරදි නොවන අතර විමර්ශන දිගු කලක සිට අවසන් නොකිරීම සොයා බලා ඒ සම්බන්ධව නිසි පියවර ගත යුතු වීම. | වැළැක්වීමටගත් ක්‍රියාමාර්ග වාර්තා නොවේ. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | 1285 ක් වර්ෂ 01 ට වැඩි කාලයක් ද ලියාපදිංචිය පමණක් සිදු කර පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි. 2020 වර්ෂය තුළදී ආරම්භ කර ලියාපදිංචිය පමණක් සිදු කර තිබූ විමර්ශන සංඛ්‍යාව 1571 ක් විය. | | | |
| 16 | රේගුවේ විවිධ අංශ විසින් විමර්ශන කටයුතු නිම කර රේගු මධ්‍යම විමර්ශන ලියාපදිංචි පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා මධ්‍යම විමර්ශන අංශය වෙත වාර්තා කර තිබූ විමර්ශන 1285 ක් වෙනුවෙන් විගණන දිනය වූ 2020 සැප්තැම්බර් 22 දින වන විටත් කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අතරින් සියයට 70 ක් හෙවත් විමර්ශන 903 ක් සඳහා ගත කර තිබූ කාලය වර්ෂ 03 සිට 05 දක්වා විය. විමර්ශන 17672 ක විමර්ශන කටයුතු අවසන් කර තිබුණ ද එයින් විමර්ශන 9573 ක් හෙවත් සියයට 54 ක්ම කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව අවසන් වී තිබුණි. | -එම- | -එම- | -එම- |
| | | | | |
| 17 | එක් වර්ෂයක් තුළ විදෙස් ගත ශ්‍රී ලාංකිකයන් 4059 දෙනෙකු විසින් ලක්සිරි සේවා ආයතනය හරහා මගීන් කැටුව නොඑන ගමන් මළු (UPB) සේවා පහසුකම ලබාගෙන තිබුණු අතර තවත් මගීන් 8240 දෙනෙකු ත්‍යාග (Gift) සේවා පහසුකම ද ලබාගෙන තිබුණි. එහිදී ශ්‍රී ලංකා රේගුව විසින් රැස්කර තිබූ ආදායම | දෙපාර්තමේන්තු නියෝග 790 ප්‍රකාරව කටයුතු කිරීම.<br>DOPL – 790 අනුකූලව කටයුතු කල බවට වාර්තා තබා ගැනීම හා ඒවා විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | වසර 25 ක් හෝ ඊට අධික සේවා අත්දැකීම් මෙන්ම තක්සේරු රාජකාරී අත්දැකීම් ඇති රේගු අධිකාරීවරුන්ගේ අධීක්ෂණය හා සුපරීක්ෂණය යටතේ එම කාර්යයන් සිදුකරන බවට වාර්තා | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිවෙලින් රු.17,625,020 ක් හා රු.31,840,355 ක් විය. එහෙත් මගීන් කැටුව නොඑන ගමන් මළු (UPB) හා ත්‍යාග (Gift) ලෙස එවනු ලබන මෙම භාණ්ඩවල වටිනාකම තහවුරු කිරීම සඳහා විකුණුම් ඉන්වොයිසි හෝ වෙනත් කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් වී තිබුණු බවට සාක්ෂි නොවීය. භාණ්ඩවල රේගු වටිනාකම නිර්ණය සඳහා දෙපාර්තමේන්තු නියෝග (DOPL) 790 ප්‍රකාරවද කටයුතු නොකර රේගු නිලධාරීන්ගේ අභිමතය පරිදි භාණ්ඩ තක්සේරු කිරීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් සත්‍ය වශයෙන් ලැබිය යුතු ආදායම් ලැබී ඇතිද යන්න තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | | කර ඇත. | |
| 18 | 2019 ජනවාරි සිට මැයි මාසය දක්වා රන්ක් බහාළුම් අංගනය (RCT) වෙත බහාලුම් 49,910 ක් ලැබී තිබෙන අතර ඉන් බහාලුම් 44,305 ක් අංගනයෙන් පිටතදී (Out Panel) පරීක්ෂා කර තිබුණි. බහාලුම් 5,605 ක් RCT අංගනය තුළදී ස්කෑන් පරීක්ෂාව සිදු කර තිබුණි. අංගනයෙන් පිටතදී පරීක්ෂා කර තිබූ බහාලුම් 44,305 ක් රේගු අඥා පනත හා දෙපාර්තමේන්තු නියෝග (DOPL) ප්‍රකාරව පරීක්ෂා කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි. | -එම- | සියලුම බහාලුම් පරීක්ෂා කිරීම සිදු කළ නොහැකි බවට වාර්තා කර ඇත. එසේම පහත පරිදි කටයුතු කරන බවට වාර්තා කර ඇත. (i) අදාල අංගනය වෙත බහාලුම් එක්වර නොපැමිණෙන අතර ඒවා වරින්වර අංගනයන් වෙත ගෙන එන බව, පිටත පරීක්ෂා කිරීම (Out Panel) සඳහා අවසරය ලබාදී ඇත්තේ ආනයනකරුගේ අතීත තොරතුරු, ආනයනය කරන භාණ්ඩවල | තවදුරටත් නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ස්වභාවය හා අවදානම් කළමනාකරණ ඒකකයේ (Risk Management Unit) අවදානම පාලනය කිරීමේ ක්‍රමවේදයට අනුකූලව බව, මෙම බහාලුම්වලින් කොටසක් RCT අංගනය ඇතුලේදී පරීක්ෂා කිරීමට යොමු කරන බව, එම පරීක්ෂණ සහතිකය මත ඉතිරි බහාලුම් ප්‍රමාණය පිටත පරීක්ෂාවට (Out Panel) මුදා හරින බව, විශේෂයෙන් අනෙකුත් ආයතනවල සහතික කිරීමට අවශ්‍ය විට පුද්ගලික ඇපකර මත මෙම බහාලුම් පිටත පරීක්ෂාවට නිදහස් කෙරෙන බව, බාහිර පරීක්ෂාවේදී සියලුම් බහාලුම් එකවර පරීක්ෂා නොකරන අතර තෝරාගත් අහඹු බහාලුම් ප්‍රමාණයක් පමණක් පරීක්ෂා කරනු ලබන බව. | |
| 19 | 2019 වර්ෂය තුළදී ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය විසින් ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට ඉදිරිපත් කර තිබූ භාණ්ඩවල වටිනාකම තක්සේරු කළ ආකාරය දැක්වෙන ලිඛිත සාක්ෂි කිසිවක් අදාල අංශය තුළ නොවිණි. ඒ අනුව අදාල බදු මුදල් | දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව කටයුතු කිරීම, නිසි කාර්යපරිපාටි අනුගමනය කල බව වාර්තා තබා ගැනීම හා ඒවා ඉල්ලූ විට ඉදිරිපත් කිරීම. | ටෙන්ඩර් මගින් විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල වටිනාකම තීරණය කිරීම එම කාලය තුළදී අදාල භාණ්ඩවල වෙළඳපල වටිනාකම සහ අන්තර්ජාලය | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නිවැරදිව ගණනය කර ඇති ද යන්න පරීක්ෂා කළ නොහැකි විය. | | පිරිස්සීමේදී එම භාණ්ඩවල වටිනාකම සැලකිල්ලට ගනිමින් සිදු කර ඇති බවට වාර්තා කර ඇත. තවද ඇතැම්විට අදාල භාණ්ඩ සඳහා ආසන්නම කාලයේ ඉදිරිපත් කර ඇති රේගු සටහන්කර ආසිකුඩා දත්ත ගබඩාවෙන් පරීක්ෂා කර අදාල අගයන් භාණ්ඩවල වටිනාකම තීරණය කිරීම සඳහා සැලකිල්ලට ගන්නා බවද වාර්තා කර ඇත. | |
| 20 | 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි (ඊ) උපලේඛනය ප්‍රකාරව ලක්සිරි හා ට්‍රයිකෝ සේවා මධ්‍යස්ථාන විසින් පවත්වාගෙන යන බන්ධිත ගුදම්වල රාජකාරියෙහි යෙදවීම පිණිස ශ්‍රී ලංකා රේගුව විසින් ස්ථිර කාර්යමණ්ඩලය නිලධාරීන් 31 ක් හා කෘත්‍යාගත කාර්යමණ්ඩලය නිලධාරීන් 12 ක් අනුයුක්ත කර තිබුණද, කෘත්‍යාගත නිලධාරීන් 12 දෙනෙකු සේවයේ යෙදවීම වෙනුවෙන් අයවිය යුතු අතිකාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත ගාස්තු අයකිරීම. | ලක්සිරි සේවා මධ්‍යස්ථානය මගින් පැලියගොඩ ශාඛාවට අමතරව නින්දවුර් පිහිටි ශාඛාව මගින්ද භාණ්ඩ නිෂ්කාශන කිරීම සිදුකරන බව වාර්තා කර ඇති අතර එම නිශ්කාශන කටයුතු සඳහා වූ අනුයුක්ත කරනු ලබන්නේ පැලියගොඩ ශාඛාවේ කාර්ය මණ්ඩලය බවත් සම්පූර්ණ නිත්‍ය කාර්ය මණ්ඩලය 16 ක් වුවද භාණ්ඩ පරීක්ෂා කිරීම සිදු කරනු ලබන්නේ එම කාර්ය මණ්ඩලයේ සිටින සහකාර ගාස්තු නිලධාරීන් 07 දෙනෙක් පමණක් බව වාර්තා කර ඇත. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 21 | මුදල් රෙගුලාසි 755 ප්‍රකාරව ලක්සිරි සේවා මධ්‍යස්ථානය, ට්‍රයිකෝ සේවා මධ්‍යස්ථානය (UPB Warehouses) හා කටුනායක ගුවන් බඩු නිෂ්කාශන මධ්‍යස්ථානය (Air Cargo) ට අනුයුක්ත කර ඇති රේගු නිලධාරීන් ලිත් වර්ෂයක් තුල කිහිපවරක් මාරුවීම් සිදු වී තිබුණද, භාණ්ඩ සුරක්ෂිතාගාර භාරව ඇති නිලධාරීන් එසේ මාරුවීම් සිදු වන අවස්ථාවලදී ලිඛිත භාණ්ඩ භාරදීම් හා භාරගැනීම් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 755 ප්‍රකාරව කටයුතු කිරීම | ඉදිරියේදී මුදල් රෙගුලාසි 755 ප්‍රකාරව කටයුතු කරන බවට වාර්තා කර ඇත. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| 22 | අංක 790 (DOPL) (02) ඡේදය ප්‍රකාරව 2019 ජනවාරි 01 සිට 2019 නොවැම්බර් 30 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ, කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපල පැමිණීමේ පර්යන්තය හරහා ගුවන් මගීන් රැගෙන විත් තිබූ රේගු තක්සේරු වටිනාකම රු.605,796,308 ක් වූ භාණ්ඩවලට අදාල සාක්ෂි කිසිවක් නොවීය. තවද වටිනාකම තහවුරු කිරීම සඳහා රේගු අභ්‍යන්තර චක්‍රලේඛ අංක 790 (02) වගන්තිය ප්‍රකාර අවම වශයෙන් ඉදිරිපත් කළ යුතුව පැවති එකී භාණ්ඩවලට අදාල මිලදී ගැනීමේ කුවිතාන්සි, විකුණුම් ඉන්වොයිස් භාණ්ඩ පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන හෝ විදේශ විනිමය ප්‍රේෂණය කිරීමට අදාල තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකරුණි. | අදාල තොරතුරු නිවැරදිව ලබා ගැනීම සහ පවත්වා ගැනීම සිදුකළ යුතු වීම. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. | තවදුරටත් මෙම අඩුපාඩු පවති. |

| | | | | |
|---|---|---|---|---|
| 23 | අංක 790 (DOPL) (04) ඡේදයට පටහැනිව කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි පැමිණීමේ පර්යන්තය හරහා මගීන් රැගෙන එන වාණිජ ස්වරූපයේ භාණ්ඩවල වටිනාකම තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ තක්සේරු අංශය විසින් නඩත්තු කරනු ලබන භාණ්ඩවල වටිනාකම පිළිබඳව දත්ත පද්ධතිය පදනම් කර නොගෙන රේගු නිලධාරීන් තම අභිමතය පරිදි වටිනාකම තීරණය කර තිබුණු අවස්ථා විය. | -එම- | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. | තවදුරටත් මෙම අඩුපාඩු පවතී. |
| 24 | ශ්‍රී ලංකා රේගු මූලස්ථාන ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කර ඇති Commins වර්ගයට අයත් විදුලි ජනන යන්ත්‍ර නඩත්තු කටයුතු සඳහා 2019 වර්ෂය තුළදී ලබාගත් සේවාවන් වෙනුවෙන් රු.3,512,574 ක් පෞද්ගලික සමාගමක් වෙත ගෙවීම් කර තිබුණි. උක්ත සේවාවන් ලබාගත් ආයතනය ශ්‍රී ලංකාව තුළ සිටින එකම නියෝජිතයා බැවින් එම ආයතනය තෝරාගත් බව සඳහන් කර තිබුණ ද, එම සමාගමට Commins සඳහා වූ ශ්‍රී ලංකා නියෝජිතයා ලෙස කටයුතු කිරීමට ලබාදී තිබූ බලය 2018 ජනවාරි 16 දිනෙන් අවසන් වී තිබුණි. එහෙත් ඒ බව නොසලකා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට අනුව මිල කැඳවීම් සිදු කර සුදුසු ආයතනයන් තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම තුළින් වඩාත් වාසිදායක සැපයුම්කරුවන් තෝරා ගැනීමට වගබලා ගත යුතු වීම.<br>ටෙන්ඩර් ඇගැයීම් මණ්ඩලයේ වගකීම නිවැරදිව සිදු කළ යුතු වීම. තාක්ෂණික කමිටුව මගින් ඉටුවිය යුතු කාර්යභාරය ඉටු කිරීම. | අදාළ ආයතනයට Cummins භාණ්ඩ සඳහා නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීමට, බලය පැවරීය හැකි අවසන් වන දිනය හෝ කල් ඉකුත් වීමෙන් අනතුරුව වසරක් හෝ දක්වා යන දෙකෙන් මුලින් එළඹෙන දිනය තෙක් හැකියාවක් ඇති බවට අදාළ ආයතනය විසින් ලිපියක් ලබා දී ඇති බව වාර්තා කර තිබුණද තරඟකාරි මිල කැඳවීම් මඟින් සුදුසු සේවා සැපයුම්කරුවෙකු තෝරා ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 25 | 2012 වසරේ සිට 2018 දක්වා වූ කාලපරිච්ඡේදය තුල එකම වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර ආනයනය කල ආයතන දෙකක් විසින් එකිනෙකට වෙනස් රේගු සංකේත වර්ගීකරණ අංක දෙකක් යටතේ ඒවා නිශ්කාෂණය කර තිබුණි. එහිදී එක් ආයතනයක් නිවැරදි භාණ්ඩ වටිනාකම ප්‍රකාශ කර VAT, PAL, NBT යන බදු වර්ග ගෙවා තිබුණු අතර අනෙක් ආයතනය භාණ්ඩ වටිනාකම අඩුවෙන් සඳහන් කර තිබීම නිසා ගෙවීමට නියමිත බදු මුදලින් සියයට 50 කට වඩා අඩුවෙන් ගෙවීමට කටයුතු කර තිබුණි. | මුද්‍රණ යන්ත්‍ර නිශ්කාෂණය කිරීම නිවැරදි ලෙස සිදුවී ඇති බවට විමර්ශනයක් සිදු කිරීම . | මුද්‍රණ යන්ත්‍ර සඳහා FAX, Scan වැනි (Multy Function) පහසුකම් අඩංගු වේ නම් රේගු සංයෝජිත අංකය 8443.32.90 භාවිතා වන බවත් මුද්‍රණ කටයුතු පමණක් සිදු කරයි නම් රේගු සංයෝජිත අංකය 8443.32.40 භාවිතා කරන බව වාර්තා කර ඇතත් වෙනත් පියවරක් ගෙන නොමැත. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| 26 | 2015 වර්ෂයේ සිට 2019 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රේගුවේ අංශ 35 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම විමර්ශන ලියාපදිංචි පද්ධතිය (ECCR) යටතේ ලියාපදිංචි රේගු වැරදි සම්බන්ධයෙන් සිදුකර තිබූ විමර්ශන කටයුතු තුළින් රු. 33,845,962,239 ක් වූ ආදායමක් රැස්කර තිබුණි. දණ්ඩන ආදායමෙන් හා විකුණුම් ආදායමෙන් සියයට 70 ක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට හා කළමනාකරණ වන්දි අරමුදලට බැරවන බැවින් සියයට 30 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර වේ. ඒ අනුව විමර්ශන කටයුතු මගින් ලබාගෙන තිබූ රු.33,845,962,239 ක් වූ සමස්ථ ආදායමෙන් රු.16,341,023,479 ක් පමණ ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් හා | රජයේ ආදායම සුරක්ෂිතභාවය සුරකෙන පරිදි කටයුතු කිරීම හා දැනට පවතින ක්‍රමවේදය නැවත සමාලෝචනය කිරීම. | වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නොමැත. | ත්‍යාග ගෙවීම් තවදුරටත් එසේම පවති. |

| | | | | |
|---|---|---|---|---|
| | ඔත්තුකාරයන් වෙනුවෙන් බෙදී ගොස් තිබුණි. රේගු නිලධාරීන්ට ත්‍යාග බෙදාහැරීම සඳහා සහ නිලධාරීන්ගේ සුභසාධන අරමුදල්වලට මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් අතීතයේදී පනවා ඇති නීතින් කාලීනව සංශෝධනයට ලක්වීම සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවිය. නිලධාරීන් විසින් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරී ස්වරූපයෙන් සිදු කරන ඇතැම් කාර්යයන් සඳහා ද දැනට ක්‍රියාත්මක වන ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ විශාල වශයෙන් ත්‍යාග මුදල් ගෙවීමට සිදුවී තිබීම නිසා භාණ්ඩාගාරයට හිමි විය යුතු විශාල මුදලක් රජයේ නිලධාරීන් සීමිත පිරිසක් අතර බෙදී යාමේ ප්‍රවණතාවයක් දිගින් දිගටම පවතින බව නිරීක්ෂණය විය. | | | |
| 27 | විදේශීය රටවල සේවයේ නියුතු ශ්‍රී ලංකිකයන් හට තම පෞද්ගලික පරිහරණය සඳහා අවශ්‍ය භාණ්ඩ රැගෙන ඒම පිණිස රජය විසින් හඳුන්වාදී ඇති කැටුව නොගෙනෙන ගමන් බඩු (UPB) හා ත්‍යාග (GIFT) යන යෝජනා ක්‍රමයන් උපයෝගී කරගෙන සිදු කරනු ලබන භාණ්ඩ ප්‍රවාහනය සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතන 11 ක් ස්ථාපිත කර තිබුණි. එහෙත් ත්‍යාග (GIFT) ක්‍රමයට මෙරටට එවනු ලබන භාණ්ඩවල වර්ගීකරණය, බර, ප්‍රමාණය හා වටිනාකම පිළිබඳ තොරතුරුවල නිවැරදිතාවය පසු අවස්ථාවකදී පරීක්ෂා කිරීම සඳහා කිසිදු ක්‍රමවේදයක් ශ්‍රී ලංකා | UPB/ GIFT ක්‍රමයන්හි කාර්යපරිපාටිය සමාලෝචනය කර රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම. | අදහස් දක්වා ඇතත් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා පියවර ගෙන නොමැත. | මෙම අඩුපාඩු තවදුරටත් එසේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | රේගුව සතු නොවීය. ඒ හේතුවෙන් එම භාණ්ඩ රැගෙන එන මගීන් හා රේගු නිලධාරීන් අතර දුස්සන්ධානයක් ගොඩනැගිය හැකි වීමත් ඒ තුලින් නිවැරදි තොරතුරු ප්‍රකාශ නොකළ හැකි වීමත් හා ඒ මත රජයේ බදු ආදායම සුරක්ෂිත විය නොහැකි වීමත් යනාදි අවධානම් රැසක් දීර්ඝ කාලයක සිට පැවති බව නිරීක්ෂණය විය. එමෙන්ම නීතිවිරෝධී ආනයනයන් හා රජය විසින් සීමා කර ඇති භාණ්ඩ රට තුලට පැමිණීමේ අවධානමක් පවතින බවත් සුරක්ෂිතාගාරයන්හි පවතින භෞණ්ඩ ආරක්ෂාකාරීබව, නිසි ලේඛන නඩත්තුව, ගබඩා පිළිවෙත් අනුගමනය නොකරන බවත් තහවුරු විය. | | | |
| 28 | ශ්‍රී ලංකා රේගුවේ "D" අංශය සඳහා රේගු අධ්‍යක්ෂ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර දක්වා වූ තනතුරු 06 කට අයත් නිලධාරීන් 15 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර මෙම එක් එක් නිලධාරීන්ගේ තනතුරුවලට අදාලව ලිඛිත කාර්යභාරයන් පැවරීමක් සිදු කර නොතිබුණි. | අදාල පාර්ශවයන් සඳහා කාර්ය පැවරුම් විධිමත් පරිදි පැවරීම. | නව රාජකාරී පැවරුම් ලේඛන සකස් කරමින් පවතින බව පමණක් වාර්තා කර ඇත. | ලිඛිත කාර්යභාරයන් පැවරීමේ දුර්වලතාවයන් තවදුරටත් පවති. |
| 29 | ලක්සිරි හා ට්‍රයිකෝ සේවා මධ්‍යස්ථාන විසින් පවත්වාගෙන යන බන්ධිත ගුදම් පරිශ්‍රවල ඇතැම් ස්ථානවල ආරක්ෂිත කැමරා සවිකර තිබුණ ද අත්‍යාවශ්‍යම ස්ථානය වන භාණ්ඩ හා ගමන් මළු ශ්‍රී ලංකා රේගු නිලධාරීන් විසින් පරීක්ෂා කරන ස්ථානය අදාල ආරක්ෂිත කැමරා මගින් ආවරණය වී නොතිබුණි. | ආරක්ෂිත කැමරා අධීක්ෂණය අඛණ්ඩව සිදු කිරීම හා අත්‍යාවශ්‍ය ස්ථාන ආවරණය වන ලෙස කැමරා පද්ධති වැඩි දියුණු කිරීම. | එම ආයතන පරිශ්‍රය තුළ අවශ්‍ය ස්ථානවල කැමරා සවිකර ඇති අතර භාණ්ඩ පරීක්ෂා කරන ස්ථානයේ කැමරා සවිකිරීමට අවශ්‍යතාවයක් නොමැති බව හා අදාළ භාණ්ඩ පරීක්ෂා කිරීමේ කටයුතු අධීක්ෂණය | තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වා පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයෙකුගේ හා රේගු අධිකාරිවරුන්ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙන බව වාර්තා කිරීම හැර නිරීක්ෂණ වලින් පෙන්වා දුන් අඩුපාඩු වැළැක්වීමට පියවර ගෙන නොමැත. | |
| 30 | ආනයනකරුවන් විසින් වරාය පරිශ්‍රයෙන් ඉවත් කර නොගන්නා ආනයනික භාණ්ඩ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ටෙන්ඩර් මගින් විකිණීමට කටයුතු කිරීමේදී ශ්‍රී ලංකා රේගුව විසින් එම භාණ්ඩවල වටිනාකම තීරණය කරන ලබයි. එසේ තීරණය කරනු වටිනාකම් හා භාණ්ඩ අලෙවි වන හෝ ඉදිරිපත් වන ලංසුවල වටිනාකම් අතර ඉහළ විචලතාවයක් පැවතුණි. භාණ්ඩවල වටිනාකම අඩුවෙන් තක්සේරු කිරීම නිසා රජයට අයවිය යුතු බදු ආදායම අහිමි වීම මෙන්ම භාණ්ඩ අධි තක්සේරු කිරීම හේතුවෙන් ඒවා අලෙවි නොවී පැවතිම නිසා වෙළඳපල අගය අඩු වීම, භාණ්ඩ විනාශ වීම, නැවත නැවත ටෙන්ඩර් සඳහා ඉදිරිපත් කිරීමට අමතර පිරිවැයක් හා පරිශ්‍රමයක් දැරීමට සිදුවීම වැනි අඩුපාඩු පැවති බව නිරීක්ෂණය විය. එමෙන්ම ටෙන්ඩර් මගින් අලෙවි කරන භාණ්ඩ වල වටිනාකම තීරණය කළ ආකාරය පිළිබඳ තොරතුරු හා යොදාගත් රේගු සංයෝජිත වර්ගීකරණ අංක | වරායේ අත්හල භාණ්ඩ විකිණීමේ ක්‍රියාවලිය සමාලෝචනය අඛණ්ඩව හා කාර්යක්ෂමව සිදු කිරීම. | භාණ්ඩයේ වෙළඳපොල වටිනාකම, භාණ්ඩය ශ්‍රී ලංකාවට ගොඩබාන විට එහි CIF වටිනාකම, භාණ්ඩ සඳහා අදාල වන තීරු බදු අගය, භාණ්ඩ නිපදවා ඇති රට, භාණ්ඩවල තත්ත්වය, භාණ්ඩ නිපදවා ඇති කාලය යන කාරණා සියල්ලක්ම සැලකිල්ලට ගනිමින් අදාල භාණ්ඩ ටෙන්ඩරයේදී විකිණිය යුතු වටිනාකම තීරණය කරනු ලබන බව වාර්තා කර ඇත. එහෙත් නිරීක්ෂණයන් පෙන්වා දී ඇති අඩුපාඩු වැළැක්වීමට පියවර ගෙන ඇති බවත් නිරීක්ෂණය නොවේ. | මෙම අඩුපාඩු තවදුරටත් පවති. |

| | | | | |
|---|---|---|---|---|
| | (HS CODE) මොනවාද යන්න පිළිබඳ තොරතුරු ගොනු තුළ ඇතුලත් නොකර තිබුණි. එම නිසා තීරණය කළ වටිනාකම හා අයකළ බදු වටිනාකමෙහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි වීම හා එක් ටෙන්ඩරයකදී අලෙවි නොවූ භාණ්ඩ ඊළඟ ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වන්නේද, එසේ නොවන්නේ නම් ඊට හේතු මොනවාද යන්න පිළිබඳව ශ්‍රී ලංකා රේගුව විසින් අනුක්‍රමික පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | | | |
| 31 | ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය (CDU) විසින් වෙන්දේසියේ විකුණනු ලබන භාණ්ඩ සඳහා නිවැරදි තක්සේරු වටිනාකමක් ලබා නොදීම නිසා රජයට විශාල වශයෙන් බදු මුදල් අහිමි වීමක් සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව ආනයනකරුවන් විසින් වරාය පරිශ්‍රයන් තුළින් ඉවත් කර නොගැනීම නිසා ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය (CDU) මගින් 2019 වර්ෂය තුළදී ටෙන්ඩර් කැඳවා විකුණා තිබූ වාහන පිළිබඳව සිදු කළ නියැදි පරීක්ෂාවට අනුව ටෙන්ඩර් 03 ක් මගින් විකුණා තිබූ වාහන 07 ක් සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ලබාදී තිබූ තක්සේරු වටිනාකම රු. 19,427,888 ක් වුවද වෙන්දේසි විකුණුම් වටිනාකම රු. 32,172,000 ක් වී තිබුණි. ඒ අනුව තක්සේරු වටිනාකම මත පමණක් බදු අයකිරීමට කටයුතු | මධ්‍යම අපහරණ අංශය (CDU) විසින් සිදු කරන වෙන්දේසියේ භාණ්ඩ විකිණීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම. | ශ්‍රී ලංකා රේගුවේ තක්සේරු මිලත්, භාණ්ඩ අලෙවිවන මිලත් අතර විශාල විචලතාවයක් පවතින්නේ ශ්‍රී ලංකා රේගුවේ භාණ්ඩවල මිල තක්සේරු කිරීමේ ක්‍රමවේදයෙහි දුර්වලතාවයක් නිසා නොව හුදෙක්ම ලංසුකරුවන්ගේ පෞද්ගලික තීරණ නිසා වන බව වාර්තා කර ඇතත් නිරීක්ෂණයෙන් පෙන්වා දී තිබූ අඩුපාඩු වැළැක්වීමට පියවර ගෙන නොමැත. | මෙම අභ්‍යන්තර පාලන අඩුපාඩු නිවැරදි කිරීමට තවදුරටත් පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම නිසා එහිදී රජයට ලැබී තිබූ බදු ආදායම රු. 3,174,824 ක් වුවද විකුණුම් වටිනාකම මත අයවිය යුතු බදු මුදල රු.5,345,789 ක් වූයෙන් මෙම විචලතාවය මත අහිමි වී තිබූ බදු ආදායම රු.2,170,965 ක් විය. | | | |
| 32 | බහාලුම් පරීක්ෂණ අංශය විසින් 2019 ජුලි 10 දින වනවිට රු. 112,841,773 ක් වටිනා බැංකු ඇපකර 60 ක් ලබාගෙන තිබූ අතර ඉන් ඇපකර 31 ක්ම දින 156 සිට දින 823 දක්වා කාලයක් ආනයනකරුවන් විසින් නිදහස් කර නොගත් රු.78,003,551 ක් වටිනා ඇපකර විය. උක්ත අවස්ථා 31 න් අවස්ථා 2 ක් හැර අනෙකුත් සියළු අවස්ථාවලදී භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ ගැටළු හේතුවෙන් මෙසේ බැංකු ඇපකර මත භාණ්ඩ නිදහස් කර තිබුණි. භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ ගැටළුවලට අදාල තීරණ ලබාදීම සඳහා NC (Nomenclature Classification) කමිටුව හා භාණ්ඩ වර්ගීකරණ අංශය (Clarification Unit) කඩිනමින් කටයුතු නොකිරීම හේතුවෙන් බැංකු ඇපකර දිගු කාලයක් රඳවා ගැනීමට සිදු වීමත් රජයට අයවිය යුතු බදු අයකර ගැනීම ප්‍රමාද වීමත් නිසා මුදලේ කාලීන වටිනාකම අවප්‍රමාණයට සාපේක්ෂව රජයට විශාල අලාභයක් සිදුවන බව නිරීක්ෂණය වී තිබුණි.<br>බහාලුම් පරීක්ෂණ අංශය විසින් සමාගම් ඇපකර හා පෞද්ගලික ඇපකර සම්බන්ධයෙන් | ඇපකර මත නිදහස් කර ඇති භාණ්ඩ සඳහා ඊට හේතු වූ කරුණු සම්බන්ධව සමාලෝචනයක් කිරීම හා රේගුවේ භාණ්ඩ වර්ගීකරණ ඒකකය (CCU) හා NC කමිටු තීරණ ලබාදීමේ ප්‍රමාදයන් ඇතිවීම වැලැක්වීමට පියවර ගැනීම. | NC කමිටුව හා වර්ගීකරණ අංශය විසින් භාණ්ඩ වර්ගීකරණ ගැටළු සම්බන්ධව අවසන් තීරණය නිකුත් කරන තෙක් බැංකු ඇපකරවල කාලය දීර්ඝ කිරීමට කටයුතු කරන බවත් , 2020.01.06 දින වන විට ලේඛන අනුව නිරවුල් නොවූ බැංකු ඇපකර සංඛ්‍යාව 40 ක් බවත් හා එහි වටිනාකම රු.125,098,810 ක් බවත් වාර්තා කර ඇත. මෙම ඇපකර විධිමත්ව හා කාලීනව නිරවුල් කිරීම සඳහා වෙනත් පියවරක් ගෙන නොමැත. | මෙම අඩුපාඩු තවදුරටත් එසේ පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | පවත්වාගෙන යනු ලබන ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර නඩත්තු කර නොතිබුණු අතර දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් නොකළ ඇපකර පැවතියද ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ ප්‍රමාණවත් අධීක්ෂණයක් ද සිදු වී නොතිබුණි.<br>කල්පිරෙන ඇපකර සම්බන්ධ තොරතුරු ස්වයංක්‍රීයව දැනුවත් කෙරෙන ක්‍රමවේදයක් සකසා නොතිබීම හේතුවෙන් නිරන්තර අධීක්ෂණයට ලක් කළ යුතුව තිබුණද එසේ සිදු වී නොතිබුණි. | | | |
| 33 | එකම ආයතනය විසින් නැවත නැවත රේගු වැරදි සම්බන්ධයෙන් වරදකරු වී තිබුණු අවස්ථා 50 කටත් වැඩි වාර ගණනක් එසේ වැරදිකරුවන් වූ ආයතන 18 ක් පැවතුණි. අඛණ්ඩව රේගු වැරදි සිදුකරන ආයතන/ පුද්ගලයින් හඳුනා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ශ්‍රී ලංකා රේගුව විසින් ගොඩනගා නොතිබුණි. | රේගු වැරදි සිදු කිරීම අධෛර්යට පත් කරන ක්‍රමවේදයකට එළඹීම. | මෙම ආයතනය විසින් සිදුකර ඇති රේගු වැරදි සංඛ්‍යාවේ එකතුව 3483 ක් බව වාර්තා කර ඇත. එලෙස දිගින් දිගටම රේගු වැරදි සිදුකරන ආයතන සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොමැත. | දිගින් දිගටම රේගු වැරදි සිදුකරන ආනයන තවදුරටත් පවති. |
| 34 | Carnet යෝජනා ක්‍රමය මගින් නියමිත බදු අයකිරීමකින් තොරව ප්‍රති අපනයනය හෝ ප්‍රති ආනයනය කිරීමේ තාවකාලික පදනම මත භාණ්ඩ ආනයනය හා අපනයනයට පහසුකම් සලසා දී තිබුණ ද මේ සම්බන්ධව පහත දක්වා ඇති පරිදි අඩුපාඩු ගණනාවක් පවතින බව විගණනය විසින් පෙන්වා දී තිබුණ ද ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br>• ආනයන හා අපනයන අංශවල | විධිමත් පසුවිපරම් ක්‍රමවේදයක් සැකසීම | ගුවන් බඩු අංශයට වඩා පුළුල් පරාසයකට මෙය අදාළ වන බැවින් මේ පිළිබඳ ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා අවධානය යොමු කර ඇති බව වාර්තා කර ඇත. | තවදුරටත් නිවැරදි වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙන වෙනම තබන සටහන් හා ලේඛනගත කිරීම් නැවත සැසඳීමක් සිදු නොකිරීම<br>• පසු විපරම් සිදුකර නියමිත කාලවකවානු තුළ ප්‍රතිඅපනයන හෝ ප්‍රති ආනයනය සිදු වී තිබුණ බව තහවුරු කර ගැනීමට කටයුතු නොකිරීම.<br>• නියමිත කාලවකවානු තුළ ප්‍රතිඅපනයන හා ප්‍රතිආනයනය සිදුකර නොතිබූ ආයතන/පුද්ගලයින් පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකිරීම.<br>• Carnet ක්‍රමය යටතේ ආනයනය කර මෙරටදී අපහරණය සිදුකර ඇති භාණ්ඩ හෝ මෙරට භාවිතය සඳහා යොදාගෙන ඇති භාණ්ඩ සම්බන්ධයෙන නියමිත බදු අය කර ගැනීමට කටයුතු නොකිරීම. | | | |
| 35 | කටුනායක අන්තර්ජාතික ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තය භාවිතා කර සංවිධානාත්මක අයුරින් වාණිජ ස්වරූපයේ භාණ්ඩ නිරන්තරයෙන් රැගෙන ඒම දීර්ඝ කාලයක් තිස්සේ සිදු වන අතර 2019 ජනවාරි 01 සිට 2019 නොවැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදය තුල එසේ ගෙන විත් තිබූ වාණිජ ස්වරූපයේ භාණ්ඩවල රේගු තක්සේරු වටිනාකම රු.605,796,308 ක් විය. උක්ත භාණ්ඩ පරීක්ෂා කිරීම, බදු අය කිරීම සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වා දී ඇති | දෙපාර්තමේන්තු නියෝග පිලිපැදීම හා අභ්‍යන්තර පාලන ක්‍රමවේද යාවත්කාලීනව ක්‍රියාත්මක කිරීම. | මෙම විධිවිධාන අනුව කටයුතු කිරීමට යළිත් අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව පමණක් වාර්තා කර ඇත. | මෙම අඩුපාඩු තවදුරටත් එසේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | පහත සඳහන් අභ්‍යන්තර පාලන පිළිවෙත් අනුගමනය කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.<br>(i) අභ්යන්තර චක්‍රලේඛවල (DOPL) සඳහන් නෛතික විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම.<br><br>(ii) කාලීන අවශ්‍යතාවයන්ට අනුකූලව අභ්‍යන්තර චක්‍රලේඛ යාවත්කාලීන කිරිම හා සරප් අංශයේ කටයුතු විධිමත් කිරිම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම. | -එම-<br><br>-එම- | -එම-<br><br>-එම- | -එම-<br><br>-එම- |
| | (iii) ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කැමරා (CCTV) සවි කිරිම හා එම කැමරා දර්ශන අඛණ්ඩව අධීක්ෂණය කිරීම. | -එම- | -එම- | -එම- |
| | (iv) රැගෙන එන භාණ්ඩවල බර මැනීමට අදාල දත්ත ස්වයංක්‍රීයව රේගු පරිගණක පද්ධතියට (Asycuda) ඇතුළත් වන අයුරින් පරිගණක පද්ධතිය සංවර්ධනය<br>රැගෙන එන භාණ්ඩවල වටිනාකම හා බර පිළිබඳ තොරතුරු සඳහා අදාල ගුවන් මගීන් පැමිණි ගුවන්තොටුපලවල් වෙතින් ලබා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරිම හා ඒ සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කිරිම. | -එම- | -එම- | මෙම නිරීක්ෂණය සමඟ එකඟ වී ඇති අතර වැඩිදුර අධ්‍යයනය කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට කටයුතු කරන බව වාර්තා කිරීම පමණක් සිදුකර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | (v) නිරන්තරයෙන් පැමිණීමේ පර්යන්තය භාවිතා කර වාණිජ ස්වරූපයේ භාණ්ඩ රැගෙන එන පුද්ගලයින් හඳුනාගැනීම හා ඔවුනට චේතනාන්විතව බදු වංචා කිරීමට හැකිවන සේ අදාල පාර්ශවයන්ට අයුතු ලෙස මුදල් ලබාදීම වැළැක්වීම සඳහා නීතිරීති සක්‍රීය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම. | -එම- | දෙපාර්තමේන්තු නියෝග අංක 700 හා 706 A මගින් පැනවූ නීති ප්‍රකාරව කටයුතු කරනු ලබන බවත්, නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් යලිත් ලබාදී ඇති බවත්, සහ අයථා ක්‍රියාවන්හි යෙදෙන නිලධාරීන් පිළිබඳව අදාළ විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන බවත් දන්වා ඇත. එහෙත් වැළැක්වීමට ගත් කිසිදු ක්‍රියාමාර්ගයන් වාර්තා කර නැත. | නිවැරදි කර නොමැත. |
| | (vi) වාණිජ ස්වරූපයේ භාණ්ඩ රැගෙන එන පුද්ගලයින් පිළිබඳ තොරතුරු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම. | -එම- | ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බව වාර්තා කර තිබුණද එවැනි තීරණයක් ගෙන නොමැත. | -එම- |
| | (vii) වාණිජ ස්වරූපයෙන් මගීන් සමඟ රැගෙන එන භාණ්ඩ පාලනය කිරීම සඳහා ගුවන් සේවා සමාගම සමඟ අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.<br>(viii) නිලධාරීන් රාජකාරි ආරම්භ කිරමට පෙර ඔවුන් සතුව පවතින පෞද්ගලික මුදල් හා වෙනත් ඉහළ වටිනාකම් ඇති දෑ පිළිබඳව අනාවරණය කළ යුතු වීම.<br>ඉහත සඳහන් පරිදි වූ බරපතල | -එම-<br>-එම- | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.<br>මෙවැනි ක්‍රියාමාර්ග වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග වාර්තා නොවේ. | -එම-<br>-එම- |

| | | | | |
|---|---|---|---|---|
| | අභ්‍යන්තර පාලන දුර්වලතා නිසා පවතින පහත සඳහන් අවධානම් පිළිබඳව දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ අවධානය යොමු කෙරේ.<br>• රජයේ බදු ආදායම නියමිත පරිදි අය නොවීම.<br>• නීති විරෝධි හා ආනයන සීමාකර ඇති භාණ්ඩ රට තුළට පැමිණීමේ අවධානමක් පැවතීම.<br>• මෙම භාණ්ඩ මිලදී ගැනීම සඳහා විදේශ රටවලට ප්‍රේෂණය වන විදේශ විනිමය වටිනාකම අනාවරණය නොවීම.<br>නියමිත බදු ගෙවා භාණ්ඩ ආනයනය කරන ආනයනකරුවන්ට වෙළඳපල අවාසිදායක තත්ත්වයක් උද්ගත වීම වැනි රටට අහිතකර තත්ත්වයන් ඇති විය හැකි ලෙසට පරිසරය නිර්මාණය වී තිබුණි. | | | |
| 36 | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාල ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | රාජ්‍ය ප්‍රතිපත්තිය සහ අදාල පනතට අනුකූලව කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව වගබලා ගත යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැති අතර වැළැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ගයක් වාර්තා කර නොතිබුණි. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 37 | ශ්‍රී ලංකා රේගුව සතුව කොම්පඤ්ඤ වීදියේ මෝගන් පාරේ පිහිටි රජයේ නිවාස 18 කින් සමන්විතව පැවති නිවාස සංකීර්ණයක වර්තමානය වනවිට නිවාස 08 ක් පමණක් ඉතිරිව පවතින බවත් අනෙකුත් නිවාස විනාශ වී ඇති බවත් නිරීක්ෂණය විය. එමෙන්ම ශ්‍රී ලංකා රේගුවට අයත් මෙම භූමි භාගයේ බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් නිවාස 02 ක් ඉදිකර ජලය හා විදුලි පහසුකම් ද ලබාගෙන තිබුණද එම අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | රාජ්‍ය දේපල අවභාවිතය, වැලැක්වීමට පියවර ගැනීම, දේපල සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම, දේපළ ඵලදායී කාර්යයන් සඳහා යොමු කිරීමට කටයුතු කළ යුතු වීම. | කොම්පඤ්ඤ වීදිය, මෝගන් පාරේ පිහිටි අංක 40/11 දරන නිවස නිලධාරීන් 12 දෙනෙකු සඳහා ලබාදීමට කටයුතු යොදා තිබුණද එම නිලධාරීන්ට ලැබුණු ස්ථානමාරුවීම් හේතුවෙන් එම නිවස අනවශ්‍ය බව දන්වා ඇති බවත් දැනට මෙම නිවාස රේගු පරීක්ෂකවරුන්ට ලබාදීමට කටයුතු කරමින් පවතින බවත් වාර්තා කර ඇත. මෝගන් පාරේ රේගු දෙපාර්තමේන්තුවට අයත් භූමිය තුළ සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කර දෙන ලෙස 2017 ජනවාරි 16 දින අංක CIB & 320/138 යටතේ කොම්පඤ්ඤ වීදියේ පොලීසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්, කොළඹ දැනුවත් කර ඇති බවත් වාර්තා කර ඇත. එසේම මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අංක LOG/S/04-2016 හා 2017 ජුනි 15 දිනැති ලිපියෙන් නියෝජ්‍ය | මෙම ඉඩම්වල භුක්තිය තවදුරටත් නිරවුල් වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පොලිස්පති (බස්නාහිර පළාත - දකුණ) වෙතින්ද ඉල්ලා ඇති බවත් වාර්තා කර ඇත. | |
| 38 | ආනයන හා අපනයන පාලක විසින් පනවනු ලබන රෙගුලාසි අනුව ආයු කාලය ඉක්ම වූ පැරණි වාහන ආනයනයේදී ආනයන හා අපනයන බලපත්‍රයක් ලබාගෙන ආනයනය කළ යුතු වුවද එසේ නිසි බලපත්‍රයක් ලබා නොගෙන අවස්ථා 11 කදී රේගුවෙන් වාහන නිදහස් කරගෙන තිබුණි. | පවත්නා විධිවිධාන අනුව කටයුතු කිරීම හා එසේ නොකරන නිලධාරීන් පිළිබඳව සොයා බලා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම. | නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නොමැත. | පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 39 | ආනයනකරුවෙකු වෙත ට්‍රක් රථ 02 ක් මිලදී ගැනීම සඳහා නිකුත් කළ අංක IM-2-150-2018-000397-0001 දරන බලපත්‍රය පදනම් කරගෙන ආනයනය කළ මාර්ග ඉදිකිරීම සඳහා භාවිතා කරනු ලබන ට්‍රක් රථයක් සඳහා වූ රේගු සංයෝජිත වර්ගීකරණ අංකය වෙනස් කර විශේෂ කාර්ය වාහන කාණ්ඩය (8705.90.94) යටතේ නිශ්කාෂණය කිරීම හේතුවෙන් අහිමි වී තිබූ බදු ආදායම රු.1,315,381 ක් බව නිරීක්ෂණය විය. | වාහන බදු අයකිරීමේ ප්‍රතිපත්තිය නිවැරදිව ක්‍රියාත්මක කළ යුතු වීම, එසේ නොකිරීම නිසා ඇති වී ඇති අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම. | -එම- | -එම- |
| 40 | වැසි අංක FKH17F2-720019 දරන Mitsubishi ගිනි නිවන රථය පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අතර මෙය 1988 වර්ෂයේදී නිෂ්පාදිත රථයක් වූ බැවින් ආනයන බලපත්‍රයක් සහිතව ආනයනය කළ යුතු විය. එහෙත් එසේ නොවීම හේතුවෙන් 2015 වර්ෂයේදී තහනම් කළ යුතුව තිබූ | පැරණි වාහන ආනයනයේදී ආනයන හා අපනයන පාලක විසින් නිකුත් කරන ආනයන බලපත්‍ර ලබාගත යුතුවීම හා එසේ නොකිරීම නිසා ඇති වූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම. | හේතු පැහැදිලි කිරීම ඉදිරිපත් කර ඇති අතර වැසි අංක KF417FZ – 720019 දරන Mitsubishi ගිනි නිවීමේ රථය නොපමාව රේගු භාරයට ගැනීම හා ඒ සම්බන්ධ රේගු | පරීක්ෂණයේ වර්තමාන ප්‍රගතිය විගණනයට වාර්තා කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මෙම රථය වර්ෂ 03 කට පසුව රාජසන්තක කිරීම සඳහා නියෝග ලබා දී තිබුණි. | | පරීක්ෂණයක් (Customs Inquiry) පැවැත්වීමට කටයුතු කරන බවට වාර්තා කර ඇත. | |
| 41 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශාක නිරෝධායන සේවයේ අනුමැතියකින් තොරව ආනයනය කර තිබූ මි.ර.ගැ. වටිනාකම රු.2,148,757 ක් වූ ඉඟුරු කි.ග්‍රෑ. 34,640 ක් අඩංගු බහාළුම් ආනයනය කර තිබූ ආනයනයකරුවන් තිදෙනෙකු සම්බන්ධයෙන් ආරම්භ කර තිබූ රේගු විමර්ශනයන් කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව අවසන් කර තිබූ බව නිරීක්ෂණය විය. අදාල ආනයනකරුවන් විසින් ආනයන අනුමැතීන්ට අදාලව විමර්ශන නිලධාරීන්ට ඉදිරිපත් කර තිබූ ලේඛන ව්‍යාජ ඒවා වුවද, එම ලේඛනවල නිරවද්‍යතාවය පිළිබඳ පරීක්ෂා කිරීමට රේගු නිලධාරීන් කටයුතු කර නොතිබුණි. | රේගු නීතිය හා ඊට අදාල ආනයන හා අපනයන නීතිරීති රෙගුලාසි හා වෙනත් නෛතික විධිවිධාන ගැන ගැඹුරු ලෙස අධ්‍යයනය කර රජයේ බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතු වීම හා ලිපිලේඛනවල නිවැරදිතාවය තහවුරු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි සොයා බලා පියවර ගත යුතු වීම හා සිදුවී ඇති අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශන හා රේගු විමර්ශන ආරම්භ කර ඇති බව වාර්තා කර ඇත. | පරීක්ෂණවල වර්තමාන ප්‍රගතිය වාර්තා කර නැත. |
| 42 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබානොගෙන මෙරටට ආනයනය කර තිබූ වසර 10 කට වඩා පැරණි වාහන 04 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ නිවාරණ අංශය රේගු විමර්ශනයක් ආරම්භ කර තිබුණද, ආනයනකරු විසින් ඉදිරිපත් කර තිබූ ව්‍යාජ ලේඛන මත එම වාහන නැවත ආනයනකරු වෙත නිදහස් කිරීමට රේගු නිලධාරීන් විසින් | ලේඛනවල නිවැරදිතාවය තහවුරු කර නොගැනීම නිසා රජයට සිදුව ඇති අලාභය විධිමත් පරිදි සොයා බලා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම, ව්‍යාජ ලේඛන ඉදිරිපත් කළ පාර්ශවය පිළිබඳ රටේ පවත්නා නීතිය අනුව කටයුතු කිරීම. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශන හා රේගු විමර්ශන ආරම්භ කර ඇති බව වාර්තා කර තිබුණද වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු කර තිබුණි. | | | |
| 43 | භාණ්ඩ ආනයන හා අපනයන ක්‍රියාවලියේදී, ලේඛන පරීක්ෂාව හා භාණ්ඩ භෞතික පරීක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව තුල ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් නිශ්කාෂණ නියෝජිතයන් ලෙස කටයුතු කරන වාප්පු ලිපිකරුවන් හා රේගු නිලධාරීන් අතර සමීප සම්බන්ධතාවයක් ගොඩනැගිය හැකිවීමේ අවධානමක් නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් භාණ්ඩ ඌණ තක්සේරු කිරීම, ආනයනික භාණ්ඩ නියමිත පරිදි ප්‍රකාශ නොකිරීම යනාදී අක්‍රමිකතාවයන් තුලින් රජයේ බදු ආදායම අහිමි වීම මෙන්ම නීති විරෝධී හා තහනම් භාණ්ඩ ආනයනයන් අනාවරණය නොවීමේ අවදානමක් පවතින බව පසුගිය විගණන විමසුම් හා වාර්තා මගින් දිගින් දිගටම අනාවරණය කර තිබුණි. එහෙත් එම තත්ත්වය නිවැරදි කිරීමට හා නව ක්‍රමවේදයක් හඳුන්වාදීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමට ශ්‍රී ලංකා රේගුව කටයුතු කර ඇති බවද නිරීක්ෂණය නොවීය. සමාලෝචිත වර්ෂයේදී මේ සම්බන්ධයෙන් සිදු කල විගණන පරීක්ෂාවේදී, නිරීක්ෂණය වූයේ ආනයනයකරුවකු විසින් අවස්ථා 6 කදී රු.39,335,091 ක් වටිනා සුවඳ විලවුන් අඩංගු බහාළුම් 06 ක් බටහිර ඖෂධ ලෙස ප්‍රකාශ කර නිදහස් කර ගෙන තිබීම හේතුවෙන් ශ්‍රී ලංකා | ආනයනකරුවන් විසින් සිදුකරන විවිධ ආකාරයේ රේගු බදු වංචා පිළිබඳව නිලධාරීන්ගේ දැඩි අවධානය යොමු කර රාජ්‍ය ආදායම සුරක්ෂිත කළ යුතුවීම.<br>වංචාව සඳහා අනුබල දී ඇති පාර්ශව පිළිබඳව ගැඹුරින් සොයා බලා අවශ්‍ය පියවර ගැනීම.<br>ආයතන සංග්‍රහයේ II ප්‍රකාරව විනය පියවර ගැනීම හා නීතිමය පියවර ගැනීම. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | රජයට රු.40,761,600 ක ආදායමක් අහිමි වී තිබුණු බවයි. ශ්‍රී ලංකා රේගුවේ ලේඛන හා භාණ්ඩ භෞතික පරීක්ෂාව සිදු කල රේගු නිලධාරීන්ගේ සම්බන්ධතාවයකින් තොරව මෙවැනි අක්‍රමිකතාවයක් සිදු කල හැකිද යන්න විගණනයේදී ප්‍රශ්ණගත කරුණක් විය. | | | |
| 44 | රේගු විමර්ශනයන්ට අදාලව රේගු භාරයට ගන්නා වාහන හා බහාළුම් මෙන්ම රාජසන්තක කල වාහන හා බහාළුම් රඳවා තබා ගැනීම සඳහා රු.මිලියන 1 ක මාසික කුලී පදනම මත මට්ටක්කුලිය ප්‍රදේශයේ පිහිටි ගබඩාවක් සහිත ඉඩමක් (Salt Yard) පෞද්ගලික අංශයෙන් ලබා ගෙන තිබුණි. මේ සඳහා 2016 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් මාසය දක්වා කාලපරිච්ඡේදය සඳහා එකතුව රු.මිලියන 29.6 ක මුදලක් මාසික කුලී මුදල් වශයෙන් ඒකාබද්ධ අරමුදලින් ගෙවා තිබුණි. මෙම අංගනයේ වසර 1 සිට 21 දක්වා කාලයක් රේගු භාරයේ රඳවා ඇති විවිධ මාදිලියේ වාහන 146 ක ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය වූ අතර බොහෝ වාහන ප්‍රමාණයක් භාවිතයට ගත නොහැකි අයුරින් දිරා ගොස්/ දිරා යමින් පවතින අතර එම වාහන අපහරණය කර කිසියම් හෝ ආදායමක් ලබා ගැනීමට ඇති හැකියාවද අවිනිශ්චිත බව තවදුරටත් නිරීක්ෂණය විය. මෙම වාහන අපහරණය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් | වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගත යුතුවීම.<br><br>විමර්ශන කටයුතු කඩිනම් කර වාහන අනවශ්‍ය ලෙස රඳවා ගැනීමෙන් සිදුවිය හැකි අලාභය අවම කරවා ගැනීම.<br><br>නෛතික කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම. | ඉදිරි මාස 03 ඇතුළත මෙම වාහන විකිණීම හෝ අපහරණය සිදු කරනු ලබන බව වාර්තා කර තිබුණද ඉන්පසු එසේ සිදුවන අඩුපාඩු මඟහරවා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි. | මෙම අඩුපාඩුව තවදුරටත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීමට විගණන පරීක්ෂාව සිදු කල දින වන විටත් ශ්‍රී ලංකා රේගුව විසින් කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | | |
| 45 | කටුනායක බණ්ඩාරණායක අන්තර්ජාතික ගුවන්තොටුපලේ පිටවීමේ පර්යන්තය හරහා 2015 ජුනි 28 දින ශ්‍රී ලංකා මුදලින් රු.මිලියන 16.8 ක් වටිනා විදේශ විනිමය නීති විරෝධීව රැගෙන යාමට උත්සාහ කල පුද්ගලයෙකු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගු මධ්‍යම විමර්ශන අංශය විසින් පරීක්ෂණයක් පවත්වා තිබුණි. විමර්ශනය අවසානයේ අදාල පාර්ශවයට පනවා තිබූ රු.මිලියන 3 ක දණ්ඩන මුදල පසුව රු.මිලියන 1.5 ක් දක්වා අඩු කිරීමට එවකට සිටි රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කර තිබුණු අතර මෙම ලිහිල් කිරීම රේගු ආඥා පනතට පටහැනි බව 2016 මාර්තු 02 දිනැති හා අංක PUR/A/CUS/2015/09 දරණ විගණන විමසුමෙන් පෙන්වා දෙන ලදී. එමෙන්ම එම තීරණය අභියෝගයට ලක් කරමින් පාර්ශව කිහිපයක් අභියාචනාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමට ද කටයුතු කර තිබුණි. එම පෙත්සම් විභාගය අවසානයේදී ද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කර තිබූ ලිහිල් කිරීම රේගු ආඥා පනතට පටහැනිබවට තීරණය කර තිබුණි. ඒ අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය හේතුවෙන් අහිමි වී ඇති | නීතියට පටහැනිව ක්‍රියාකර ඇතිද යන්න පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය පියවර ගැනීම. මෙවැනි නීත්‍යානුකූල නොවන ක්‍රියා වලක්වා ගැනීමට උපරිම අයුරින් ක්‍රියාකිරීම. | නැවත අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නොමැත. එවැනි අඩුපාඩු වළක්වා ගැනීමට ගන්නා පියවරද දක්වා නොමැත. | මෙම මුදල නැවත අයකර ගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 1.5 ක මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| 46 | පාම් ඔයිල් තොග වශයෙන් ආනයනය කරනු ලබන ප්‍රධාන පෙලේ ආයතන 02 ක් විසින් 2013 – 2016 කාලපරිච්ඡේදය තුල ආනයනය කර තිබූ පාම් ඕලේන් (Palm Olein) නැමැති තෙල් වර්ගය නිවැරදි භාණ්ඩ සංයෝජිත වර්ගීකරණයක් යටතේ නිශ්කාෂණය නොකිරීම හේතුවෙන් රු.මිලියන 6,130 කට ආසන්න බදු මුදලක් අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. මෙම ආනයනයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ බුද්ධි අංශය විසින් රේගු විමර්ශනයක් ආරම්භ කර තිබුණද, ශ්‍රී ලංකා රේගුවේ භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංශයේ හා NC කමිටු නිලධාරීන් විසින් ආනයනකරුවන් නිවැරදිය යන පදනමින් කටයුතු කර තිබීම හේතුවෙන් රේගු විමර්ශනය අවසන් කිරීම ප්‍රමාද වී තිබුණි. ලෝක රේගු සංවිධානය තහවුරු කිරීම අනුවද මෙම ආනයනයන් මගින් රජයේ බදු ආදායම අහිමි වී ඇති බව නිරීක්ෂණය වුවද, එම මුදල් අය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | භාණ්ඩ වර්ගීකරණ අංශය හෝ NC කමිටුව වෙත ලැබෙන විමසුම් සඳහා නිශ්චිත කාලයක් තුළදී විසඳුම් ලබා දීම.<br><br>ශ්‍රී ලංකා රේගුවේ සමස්ථ කාර්ය මණ්ඩලය අනොන්‍යා ලෙස රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීමේ අරමුණින් කටයුතු කළ යුතු බව අවධාරණය කිරීම.<br>රේගු විමර්ශනවලින් අනාවරණය කරගන්නා රේගු වැරදි සඳහා අනුබල දී ඇති නිලධාරීන්, වාප්පු ලිපිකරුවන් සහ වෙනත් පාර්ශවයන් වෙත දැඩිව නීතිය ක්‍රියාත්මක කර රජයට සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කිරීමේ හැකියාව සොයා බැලීම. | -එම- | මෙම මුදල තවදුරටත් අයකරගෙන නොමැත. |
| 47 | 1999 අංක 33 දරණ ශාක ආරක්ෂණ පනත හා 1981 නොවැම්බර් 02 දිනැති අංක 165/1 දරණ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව ජාතික ශාක නිරෝධායන සේවයේ ආනයන | - ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ශාක හා ශාකමය කොටස් සම්බන්ධයෙන් ආනයන අනුමැතිය, ලේඛන පරීක්ෂාව හා | මෙවැනි අඩුපාඩු වළක්වා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි. | තවදුරටත් නිවැරදි වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතියක් ලබා නොගෙන මෙරටට ආනයනය කර තිබූ මි.ර.ගැ වටිනාකම රු.මිලියන 52 ක් වටිනා ඉඟුරු කිලෝග්‍රෑම් 821,650 ක් නිදහස් කිරිමට රේගු නිලධාරීන් කටයුතු කර තිබුණි.<br>ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ශාක හා ශාකමය කොටස් සම්බන්ධයෙන් ආනයන අනුමැතිය, ලේඛන පරීක්ෂාව හා භෞතික පරීක්ෂාව යන කාර්යයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව හා ශාක නිරෝධායන සේවය අතර පරිගණකගත සම්බන්ධයක් නොතිබීම, පවත්නා නීතිරීති සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් වී නොතිබීම, ආනයනය කල ප්‍රමාණයන් සැසඳීමට ක්‍රමවේදයක් නොමැති වීම සහ කාර්ය පරිපාටි ප්‍රකාරව රේගු නිලධාරීන් තම රාජකාරි ඉටු නොකිරීම ඇතුලු අනෙකුත් අභ්‍යන්තර පාලන දූර්වලතා හේතුවෙන් මෙවැනි අක්‍රමිකතාවයන් සිදු වන බව නිරීක්ෂණය විය. | භෞතික පරීක්ෂාව යන කාර්යයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව හා ශාක නිරෝධායන සේවය අතර පරිගණකගත සම්බන්ධයක් පවත්වා ගත යුතුවීම.<br>- පවත්නා නීතිරීති සම්බන්ධයෙන් රේගු නිලධාරීන්ට ප්‍රමාණවත් දැනුමක් ලබාදිය යුතුවීම.<br>- ආනයනය කල ප්‍රමාණයන් සැසඳීමට ක්‍රමවේදයක් සැකසීම සහ කාර්ය පරිපාටි ප්‍රකාරව රේගු නිලධාරීන් තම රාජකාරි ඉටු නොකිරීම ඇතුලු අනෙකුත් අභ්‍යන්තර පාලන දූර්වලතා හේතුවෙන් සිදුවන මෙවැනි අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු වීම. | | |
| 48 | රේගු ආඥා පනතේ 103 වගන්තිය, 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට් පත්‍රය හා 2002 දෙසැම්බර් 31 දිනැති අංක 218 (F) දරන අභ්‍යන්තර චක්‍රලේඛය යනාදිය ප්‍රකාරව කොළඹ වරායට පැමිණෙන නෞකා සඳහා රේගු නිලධාරීන් ඉටු කරනු ලබන රේගු රාජකාරී සඳහා වූ අතිකාල ගාස්තුව එම නෞකාවල බහාළුම් ප්‍රමාණය මත ගණනය කර රේගු | පනතේ 103 වගන්තිය හා 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට් පත්‍රය හා 2002 දෙසැම්බර් 31 දිනැති අංක 218 (F) චක්‍රලේඛය ප්‍රකාරව ලබා දී ඇති උපදෙස් හා ක්‍රමවේද අනුගමනය කළ යුතු බව. | තැන්පතු ලෙස නෞකා නියෝජිත ආයතනය ලබා ගන්නා රු.100,000 ක මුදල් සම්බන්ධයෙන් අදාල ගැසට් නිවේදනයේ අවශ්‍ය සංශෝධන සිදු කරන බව වාර්තා කර ඇත. නෞකා නියෝජිත ආයතනවලින් අතිකාල අයකර | වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය වාර්තා කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අතිකාල හා නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලට බැර කරනු ලැබුවද ඒ සඳහා බලපාන නීති රීති හා රෙගුලාසි අනුව තබාගත යුතු වාර්තා හා ක්‍රමවේදය සම්බන්ධයෙන් අඩුපාඩු ගණනක් පවතින බව නිරීක්ෂණය විය. | | ගැනීම පරිගණක ගත වැඩසටහනක් යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බවද අංක DOPL 218 F දරන සහ දෙ. නියෝග අනුව හා විගණන නිරීක්ෂණවලින් පෙන්වා දී ඇති කරුණු අනුව එම ගැටළු අවම වන පරිදි නිවාරණ අංශයෙන් ඉවත්ව ඉදිරි පියවර වරාය පාලන ඒකකය වෙත පැවරෙන බවද, නැව් ලේඛන දෛනිකව රේ.වා.පා ඒකකය වෙත යැවීම නිසියාකාරව සිදු කිරීම අධීක්ෂණය කිරීම සිදු කරන බවද වාර්තා කර ඇත. | |
| 49 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රමිති සහතිකය ලබාදීම ප්‍රමාදවන ආනයනික භාණ්ඩ සඳහා පෞද්ගලික ඇපකර මත එම භාණ්ඩ තාවකාලිකව ආනයනකරුවන්ගේ ගබඩා වෙත නිදහස් කිරීමට අවස්ථාව ලබා දී තිබුණද ප්‍රමිති සහතික ලැබීමට පෙර එම භාණ්ඩ දේශීය වෙළඳපලට නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. තවද ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය ප්‍රමාණවත් නොවන බව පසුගිය විගණන විමසුම් හා වාර්තා මගින් අනාවරණය කර තිබුණද එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ප්‍රමාණවත් | ආනයන අපනයන ක්‍රියාවලිය සම්බන්ධයෙන් සක්‍රීය දායකත්වයක් රේගු නිලධාරීන් විසින් ලබාදිය යුතුවීම.<br>ප්‍රමිති සහතික ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව ඍජුව මැදිහත් විය යුතුවීම.<br>වරායෙන් නිදහස් කරන භාණ්ඩ සඳහා ප්‍රමිත සහතික ලැබෙන තෙක් රේගු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පවත්වා ගැනීම.<br>ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සම්බන්ධයෙන් විධිමත් | මෙම සිද්ධියට අදාල රේගු විමර්ශනය (ENSP/CPU/044/2017/CCR-2466) ශ්‍රී ලංකා රේගුවේ පාරිභෝගික ආරක්ෂණ අංශය විසින් ආරක්ෂා කර ඇති බවත්, ආනයනය කර තිබූ මෙම භාණ්ඩවල ප්‍රමිතිය තහවුරු වන තෙක් දේශීය වෙළඳපලට නිදහස් නොකරන බවට ආනයනකරු වගකීමට බැඳෙන පරිදි සමාගම් ඇපයක් GL | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. මෙවැනි අඩුපාඩු තවදුරටත් පවතින අතර ඉදිරිපත් කර ඇති අදහස් දැක්වීම් තුළ වර්තමාන තත්ත්වය වාර්තා කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා රේගුව කටයුතු කර නොතිබුණි. 2017 වර්ෂයේදී ද මෙවැනිම සිදුවීමක් නිරීක්ෂණය වූ අතර එහිදී ආනයනකරුවෙකු විසින් ආනයනය කර තිබූ රු.702,084 ක් වටිනා Cut Egde Salad Bowl ඒකක 913 ක් ප්‍රමිත සහතික ලබා ගැනීමට පෙර දේශීය වෙළඳපලට නිකුත් කර තිබුණ ද එම භාණ්ඩ ප්‍රමිතියට අනුකූල නොවන බව ප්‍රමිත ආයතනය විසින් තහවුරු කර තිබුණි. | පියවර ගැනීම. ප්‍රමිතියෙන් තොර භාණ්ඩ වෙළඳපලට නිදහස්කර ඇති පාර්ශව සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීම. | II/CG/261 අංකය යටතේ ලියාපදිංචි කර ඇති බවත්, මෙම භාණ්ඩ මුදාහැර ඇත්තේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්දේශ මත බවත් වාර්තා කර ඇත. තවද ප්‍රමිතියකින් තොර භාණ්ඩ ශ්‍රී ලංකාවේ වෙළඳපලට පැමිණීම හා එම භාණ්ඩ මගින් පාරිභෝගිකයාට සිදුවන අහිතකර බලපෑම පිළිබඳ මනා අවබෝධයක් රේගු දෙපාර්තමේන්තුවේ පාරිභෝගික ආරක්ෂණ අංශයට තිබෙන බවත් මේ ආකාරයේ වැරදි සම්බන්ධයෙන් දණ්ඩන මුදල් පැනවීම පමණක් ප්‍රමාණවත් නොවන බව අවබෝධ කරගෙන ඇති බවත් එබැවින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික කටයුතු අධිකාරිය, සෞඛ්‍යය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ ඒ සම්බන්ධව ගත හැකි පියවර පිළිබඳව දැනටමත් සාකච්ඡා කරමින් පවතින බවත් වාර්තා කර ඇත. | |

ශීර්ෂ 248 - සුරාබදු දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | | | | |
| 1. | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතු බව. | CIGAS පරිගණක වැඩසටහන යටතේ පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යයි. | ලේඛනයේ 2021 වර්ෂයේ තොරතුරු යාවත්කාලීන කර නොමැත. |
| 2. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | 2021 වර්ෂය සඳහා ලේඛනයක් පවත්වා ගෙන යයි | ලේඛනයේ නිලධාරීන් දෙදෙනෙකුගේ ඇප පමණක් සටහන් කර ඇත. |
| 3. | මිය ගිය නිලධාරින් 09 දෙනෙකුගෙන් අය විය යුතු හිඟ ණය ශේෂය රු. 1,636,743 ක් වූ අතර ඉන් එක් නිලධාරියෙකුගෙන් රු. 118,260 ක හිඟ ණය ශේෂයක් වසර 5 කට වඩා වැඩි කාලයක් හිඟව පැවතුණි. | හිඟ ණය ශේෂය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අය කර ගැනීම කළ යුතුවීම. | 2021 දෙසැම්බර් 31 දිනට රු.118,206 ක් අයකර ගෙන ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු. 795,437 ක ණය ශේෂයක් අය විය යුතුව ඇත. ඉන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් වසර 1ත් 3ත් අතර රු.446,470 ක ණය ශේෂයක් අයවි යුතුව පැවතිණි. |

| | | | | |
|---|---|---|---|---|
| 4. | සේවයෙන් පහකළ, ඉල්ලා අස් වූ හා සේවය අතහැර ගිය නිලධාරින් 11 දෙනෙකුගෙන් රු. 1,157,797 ක හිඟ ණය ශේෂයක් පැවති අතර ඉන් නිලධාරින් 7 දෙනෙකුගෙන් එකතුව රු. 543,723 ක හිඟ ණය ශේෂයක් වසර 5 කට වඩා වැඩි කාලයක් හිඟව පැවතුණි. | -එම- | 2021 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු 55,596 ක් අයකර ගෙන ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 10 දෙනෙකුගෙන් රු. 1,296,611.87ක ණය ශේෂයක් අය විය යුතුව ඇත. ඉන් නිලධාරීන් 05 දෙනෙකුගන් වසර 05 ට වැඩි කාලයක සිට අය විය යුතු ණය ශේෂය රු. 488,127 ක්ව පැවතිණි. |
| 5. | 2018 වර්ෂයේ රා සැපයුම්කරුවෙකුට පොල්ගස් 5000 ක රා ප්‍රමාණයක්, දෛනිකව දුම්මලසූරිය ඇක්මී ලංකා ස්කාගාරයට ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණ ද ඉඩම් 02ක් සඳහා අනුමත ගස් ප්‍රමාණය 4347ක් හා එහි මැදීම් සිදුකළ ගස් ගණන 800 ක් ව පැවතියදී ගස් 4,000 කට වැඩි සංඛ්‍යාවක් සඳහා රා මැදීමකින් තොරව රා රැස්කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | අනුමැතිය ලබා දීමට පෙර ක්ෂේත්‍ර පරික්ෂාවක් සහ වෙනත් තොරතුරු මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු වල නිවැරදිතාවය තහවුරු කර ගත යුතු වීම. | රා මැදිම සඳහා අනුමැතිය ලබා දී ඇති ගස් ගණන අනුව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කරනු ලබන බවත් විවිධ ප්‍රායෝගික හේතූන් මත අනුමත ගස් මැදීම මෙන්ම එම ගස් නොමැදීම සිදු කරනු ලබන බවත් දන්වා ඇත. කෙසේ වෙතත් රා මැදීමේ සිට රා ස්කාගාරයට ලැබෙන තෙක් සුරාබදු නිලධාරීන් විසින් අධීක්ෂණය කරනු ලබයි. | ශ්‍රී ලංකාවේ රා කර්මාන්තය නියාමනය සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ ක්‍රියාමාර්ග පිලිබඳ අධ්‍යයන වාර්තාවක් පිළියල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.<br>රා සම්බන්ධයෙන් ගැටළු හඳුනා ගෙන ඇත.<br>රා මැදීම, රා නිෂ්පාදනය අඩුවීම හා ගැටළු සම්බන්ධව පියවර ගනිමින් පවති. |

| | | | | |
|---|---|---|---|---|
| 6. | මුල්‍ය ප්‍රකාශන හා හිඟ ආදායම් පිලිබඳ වාර්තා අනුව 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මත්පැන්, රා හා ස්ප්‍රීතු නිෂ්පාදනයට අදාළව දෙපාර්තමේන්තුවට අය විය යුතු මුළු හිඟ බදු ආදායම හා ඊට අදාළ ප්‍රමාද ගාස්තුව ඇතුළුව අයවිය යුතු මුළු හිඟ ආදායම රු.මිලියන 3969.8 ක් විය. මු.රෙ 128 (1) (ඌ) සහ 128 (2) (ඉ) ප්‍රකාරව එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | මු.රෙ 128 (1) (ඌ), 128 (2) (ඇ) සහ (ඉ) ප්‍රකාරව එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | අය විය යුතු හිඟ සුරාබදු සහ ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට අදාලව ගෙවිය යුතු ආයතන සමග සාකච්ඡා කිරීමට සහ ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරමින් ගෙවිය යුතු හිඟ සුරාබදු සහ ප්‍රමාද ගාස්තු අයකරගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බවට වාර්තා කර ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාවට අනුව මත්පැන් නිෂ්පාදන ආයතන වෙතින් රු. මිලියන 4,537.36 ක්ද, රා නිෂ්පාදන ආයතන වෙතින් රු. මිලියන 0.85 ක්ද, ස්කාගාර වෙතින් රු. මිලියන 12.45 ක්ද වශයෙන් මුළු හිඟ බදු හා ප්‍රමාද ගාස්තුව එකතුව රු. මිලියන 4,550.66 ක් සුරාබදු දෙපාර්තමේන්තුව වෙත තව දුරටත් අයවිය යුතුව පැවතිණි. |

| | | | | |
|---|---|---|---|---|
| 7. | 2020 වර්ෂයේ අවසාන දිනට මත්පැන් නිෂ්පාදන සමාගම් 5 කට අදාළව වර්ෂ 5 ක් ඉක්ම වූ හිඟ බදු ආදායම රු.මිලියන 2,299.63 ක් විය. එහි ඇතුලත් මුලික බදු මුදල රු.මිලියන 360.61 ක් වූ අතර ප්‍රමාද ගාස්තු රු.මිලියන 1939.02 ක් විය. සමාගම් 2 කින් අයවිය යුතු හිඟ ආදායම එකතුව රු.මිලියන 1,217.12 සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර රු. මිලියන 204.97 හිඟ ආදායමක් අයවිය යුතුව තිබු සමාගමකට සහන සැලසීම සඳහා දෙපාර්ශවයේ එකඟතාවයෙන් ගිවිසුම් ගතවීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. අනෙකුත් සමාගම් දෙකෙන් එකතුව රු.මිලියන 877.54 ක හිඟ ආදායම අයවීම් පිළිබඳව ප්‍රගතියක් වාර්තා නොවුණි. | මු.රෙ 128 (1) (ඌ), 128 (2) (ඇ) සහ (ඉ) ප්‍රකාරව එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | - එම - | මත්පැන් නිෂ්පාදන ආයතන 5 කින් වසර 5 කට වැඩි කාලයක් තුල අයකරගත නොහැකි වූ හිඟ බදු මුදල හා ප්‍රමාද ගාස්තුවල එකතුව රු. මිලියන 2,085.14 ක් තවදුරටත් අයවිය යුතුව පැවතිණි. |

| | | | | |
|---|---|---|---|---|
| 8. | ආරක්ෂිත ස්ටිකර් කළමණාකරණ පද්ධතිය රජයේ ආදායම් වර්ධනය කිරීම සඳහා වූ මත්පැන් බෝතල් හා මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ආරක්ෂිත ස්ටිකර් සැපයීම හා ආරක්ෂිත ස්ටිකර් කළමණාකරණ පද්ධතියක් සැපයීම හා ස්ථාපිත කර පවත්වාගෙන යාම. 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා විදේශ මත්පැන් සඳහා ස්ටිකර් අලෙවිය තුලින් රු. මිලියන 10.87 ක ආදායමක් අය වී තිබූ අතර ස්ටිකර් මිළදී ගැනීම වෙනුවෙන් එම කාලයට අදාළව රු. මිලියන 5.98 ක වියදමක් දරා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම වූ රු. මිලියන 1,782 ක් වුවද මේ දක්වා දරන ලද වියදම රු. මිලියන 5.98 ක් හෙවත් සියයට 0.3 ක් පමණක් විය. මෙම ව්‍යාපෘතිය මේ වන විට විදේශිය මත්පැන්වලට පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | නියමිත කාල වකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කිරීම. | ඩිජිටල් සළකුණු ආයතන 08කද, ස්ටිකර් සහ ඩිජිටල් සළකුණු ආයතන 03කද, ස්ටිකර් පමණක් ආයතන 59කද වශයෙන් සැර මත්පැන්, ධාන්‍යය මත්පැන්, රා බෝතල් කිරීම ඇතුළු නිෂ්පාදනාගාර 70වක ආරක්ෂිත ස්ටිකරය යෙදීමට සැලසුම්කර ඇති බවට වාර්තා කර ඇත.<br><br>ස්ටිකර් තොග ලබා ගැනීම හා බෙදා හැරීම, නිෂ්පාදනාගාර කාර්යය මණ්ඩලය පුහුණු කිරීම සඳහා චක්‍රලේඛණ නිකුත් කිරීම හා ගිවිසුම් ගත පාර්ශව සමඟ ව්‍යාපෘති සැලසුම් ප්‍රකාරව කටයුතු කරමින් පවතී. | මේ දක්වාම සැලසුම් කර තිබූ කටයුතු සියල්ලම අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 9. | දෙපාර්තමේන්තුවේ සුරාබදු ආදායම් ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීමට අදාළව පරිගණක මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව සඳහා 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අයවැය ප්‍රතිපාදන හා පරිපූරක ප්‍රතිපාදන මඟින් රු. මිලියන 87.2 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. 2019 වර්ෂයේ ඒ සඳහා රු. මිලියන 0.745 ක් සහ සමාලෝචිත වර්ෂයේ රු මිලියන 3.4 ක වියදමක් දරා තිබුණු අතර බදු ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීම සඳහා වු යෝජිත පරිගණක මෘදුකාංග පද්ධතියේ අපේක්ෂිත අරමුණු මෙතෙක් ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | නියමිත කාල වකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කිරීම. | පරිගණක මෘදුකාංග පද්ධතියේ කටයුතු අවසන් අදියරයේ පවතින බව වාර්තා කර ඇත. | සුරාබදු ආදායම් ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීමට අදාළව පරිගණක මෘදුකාංග පද්ධතියක් මේ දක්වා ස්ථාපිත කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 10. | රේගු දෙපාර්තමේන්තුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකිනෙකට සම්බන්ධ වන පරිගණක දත්ත පද්ධතියක් සැකසීම සහ කඩිනමින් ක්‍රියාත්මක කිරීම හා එතෙක් ලිපි හුවමාරු කර ගැනීම මගින් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙස 2019 සහ 2020 ගිණුම්කාරක සභා රැස්වීම් වලදී කාරක සභාව විසින් උපදෙස් ලබාදී තිබුණි. එහෙත් ඒ සම්බන්ධ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ සුරාබදු දෙපාර්තමේන්තුව හා අදාළ ආයතන සමග ඒකාබද්ධ කර පරිගණක දත්ත පද්ධතියක් සැකසීමේ නව මුහුණුවර යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා ඉංජිනේරු උපදේශන සේවය ලබාගැනීමට අදාළ ගාස්තු ගෙවීමේ මූල්‍ය යෝජනාව ඇගයීම් අදියරේ පැවතුණු බවයි. | නියමිත කාල වකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කිරීම. | RASED පද්ධතියේ පිරිවිතර හඳුනාගැනීම සඳහා කමිටුවක් පත්කර ඇත. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන විශේෂඥයෙකුගේ සේවය ලබාගෙන ඇත. ICTA ආයතනය සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත. රේගු දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුම් ඇතිකරගෙන ඇත. | මේ දක්වා එම ඒකාබද්ධ පරිගණක දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 11. | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 2 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම සුරුට්ටුවක්, බීඩියක් හා සෑම පයිප්ප දුම්කොළ කිලෝග්‍රෑමයක් සඳහාම බද්දක් පනවා අය කළ යුතු වුවද, නිෂ්පාදනය කරනු ලබන සුරුට්ටු සහ බීඩි සම්බන්ධයෙන් කරනු ලැබූ නියදි විගණන පරීක්ෂාවේදී එවැනි බද්දක් අයකරනු නොලබන බව නිරීක්ෂණය විය. | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත අනුව කටයුතු කිරීම. | බද්දක් අය කිරීම සුදුසු බව නිර්දේශ කොට අංක ED/2019 හා 2019.08.26 දිනැතිව මුදල් අමාත්‍යාංශය වෙත දන්වා ඇත. නැවත 2020.10.15 දින ලිපියක් යොමු කොට ඇත. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා උපදෙස් ලබාදී නොමැති අතර පනතේ විධි විධාන ප්‍රකාරව යෝජිත බදු අය කිරීම මේ දක්වාත් සිදු නොවේ. |
| 12. | 1999 අංක 8 දරණ දුම්කොළ බදු පනතේ අවශ්‍යාය සංශෝධන සිදුකිරීම හා එම පනතේ 17/ආ/2 යටතේතෑගි අරමුදලක් පිහිටුවීමට අදාල රීතියක් හඳුන්වා දීම ඇතුළු අවශ්‍යාය කරන රෙගුලාසි සංශෝධනය කිරීමේ ප්‍රගතියක් නිරීක්ෂණය නොවීම. | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත අනුව කටයුතු කිරීම. | නීති කෙටුම්පත් සම්පාදන සමඟ මූලික සාකච්ඡා සිදුකර ඇත. | මෙතෙක් තෑගි අරමුදලක් පිහිටුවීමට අදාල රීතියක් හඳුන්වා දීම ඇතුළු අවශ්‍යාය කරන රෙගුලාසි සංශෝධනය කිරීම සිදුවී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 13. | පළාත් සහකාර සුරාබදු කොමසාරිස් සහ සුරාබදු අධිකාරීවරුන් විසින් ඔවුන්ගේ පළාතේ වෙළඳාම පිණිස තබා ඇති රා බෝතල්වලින් සාම්පලයක් තුන්මසකට වරක්වත් ලබාගෙන රස පරීක්ෂක වෙත යොමුකර වාර්තාවක් ලබාගතයුතු වුවත් රත්නපුර අංක 1 හා අංක 2 යන රා තැබෑරුම්වලින් 2017 ඔක්තෝබර් මාසයෙන් පසු 2020 වර්ෂය වනතෙක්ම සාම්පල් ලබාගෙන රස පරීක්ෂක වෙත යොමුකිරීමට කටයුතු කර නොතිබුණි. | 2014 අප්‍රේල් 30 දිනැති අංක සූකොප/පොදු/ 06/ 14 ලිපිය ප්‍රකාරව හා සුරා කර්මාන්තයට අදාල නියෝග මාලාවේ IV පරිච්ඡේදයේ 12.2 ඡේදය සෑම මාස තුනකට වරක් රා නිෂ්පාදනාගාරවලින් ලබා ගන්නා රා සාම්පල් රජයේ රස පරීක්ෂක වෙත යොමු කළ යුතු වීම. | රා නිදර්ශක ලබා ගැනීමේ ක්‍රමානුකූල බවක් නොමැති බව පිළිගෙන ඇත. නිවැරදි කිරීමට ප්‍රදේශීය කාර්යාල නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | 2022 වර්ෂයේ සිදු කල ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී රස පරීක්ෂක වාර්තා අනුව අම්ලිකතාවය අදාල සීමාවන් ඉක්ම වූ අවස්ථාවන් නිරීක්ෂණය වීම හා ඒ සඳහා කාර්මික අපරාධ වාර්තා මගින් දඩ අය කළ අවස්ථා නිරීක්ෂණය වීම.<br>චක්‍ර ලේඛන පරිදි කටයුතු නොකරන බව නිරීක්ෂණය වීම හා ඒ අනුව ප්‍රමිතියෙන් බැහැරව රා නිෂ්පාදනය වීමේ අවදානමක් තවදුරටත් පැවතීම. |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 14. | සුරාබද්දු දෙපාර්තමේන්තුවේ ඉටුකරගැනීම සඳහා පැවරී ඇති පරමාර්ථ හා කාර්යන්ට ආදලව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ තුනක සුරාබද්දු දෙපාර්තමේන්තුව විසින් ග්‍රහණය (වැටලීම්) කරන ලද අපරාධ සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විෂ වර්ග, අබිං හා අන්තරායකර ඖෂධ ආඥා පනත, දුම්කොළ බදු පනත, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ සිදු කර තිබූ අපරාධ ග්‍රහණ සංඛ්‍යාව පිළිවලින් 3227කින්, 1934කින් හා 654 කින් හෙවත් සියයට 39 කින්, සියයට 50 කින් හා සියයට 44 ක ප්‍රතිශතයකින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. | අදාල පනත් වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව මත්පැන්, දුම්කොළ හා මධ්‍යසාර සහ විෂ වර්ග අබිං හා අන්තරායකර ඖෂධ යනාදිය සම්බන්ධයෙන් නීති විරෝධී කටයුතු මැඩපැවැත්වීම සඳහා කටයුතු කළ යුතුවීම. | ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් වෙත චක්‍රලේඛන නිකුත් කර ඇත, මාසිකව ප්‍රගති වාර්තා කැඳවීම් කර ඇත. 2021 වර්ෂයේ ග්‍රහණ ඉලක්ක 857 කින් හෙවත් සියයට 25 කින් අඩු කර ඇත. | සේවක ගැටළු හේතුවෙන් තවදුරටත් නිසි ප්‍රගතියක් අත්පත් කර නොගත් සුරාබද්දු මධ්‍යස්ථාන ඇති අතර ඒ සම්බන්ධ පසුවිපරම් කටයුතු සිදු වී නොමැත. |

ශීර්ෂ 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 170 (2) (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) 2018 විශ්‍රාමික දිනය වෙනුවෙන් පැවැත්වෙන උත්සවය සඳහා පෞද්ගලික ආයතන 15 කින් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ මුදල් රු. 5,991,000 ක් 2019 ජූලි 08 වන විටත් | බාහිර ආයතන වලින් ලැබෙන ප්‍රදාන සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ අත්වැල් බැඳ සිටින පෞද්ගලික අංශයේ ආයතන විසින් ලබා දී තිබූ මුදල් අනුග්‍රහයන් මඟින් ජාතික උත්සව 9 ක් සඳහා රු. 2,365,000 ක මුදලක් | පළාත් මට්ටමින් පැවති ජාතික උත්සව 9 ක් සඳහා එම ප්‍රදානයන් වලින් රු. 2,365,000.00 ක මුදලක් ලබා ගත් අතර ඉතිරි මුදල් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදා ගැනීමට නියමිතය. |

| | | | | |
|---|---|---|---|---|
| | පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | | ලබාගත් අතර ඉතිරි මුදල් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදවා ගැනීමට නියමිතය. | |
| 2. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක් මගින් තාවකාලික හා ස්ථිර වශයෙන් විශ්‍රාම වැටුප් දෙකක් එක් නිලධාරියෙකුට 1991 ජනවාරි දක්වා වසර 20 ක කාලයක් තිස්සේ ගෙවා තිබුණි. මෙලෙස එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මගින් වැඩිපුර ලබාගත් මුදල රු. 1,872,387 ක් වී තිබුණු අතර 2016 පෙබරවාරි 10 සිට විශ්‍රාම වැටුප් ගෙවීම නවතා තිබූ නමුත් වැඩිපුර ගෙවා තිබූ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර වංචනික ලබා ගත් මුදල් ආපසු අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවීම. | මෙම විශ්‍රාම වැටුප් වංචාව සම්බන්ධයෙන් ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලය යටතේ කරන ලද පැමිණිල්ල අනුව නඩුව විභාග වෙමින් පවතී. කෙසේ. වුවද මෙම විශ්‍රාමිකයාගේ නීත්‍යානුකූල විශ්‍රාම වැටුප ගෙවීම මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නතර කර ඇත. | විශ්‍රාම වැටුප් අංක 01-600575 සහ 01-62195 යටතේ විශ්‍රාම වැටුප් දෙකක් ලබා ගත් විශ්‍රාමිකයා 2021.03.25 දින මිය ගොස් ඇත. 2016 මාර්තු මස සිට ඔහුගේ විශ්‍රාම වැටුප ගෙවීම නවතා තිබූ බැවින් වැඩිපුර ගෙවන ලද මුදල හිලව් වී ඇත. වැන්දඹු වැටුප සකස් කළ පසු ඉතිරි මුදල අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 3. | නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි මීගමුව, මීරිගම, ගම්පහ, අලව්ව, වරකාපොල, වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විශ්‍රාමිකයින් 512 දෙනෙකුගේද, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්රාමිකයින් 369 දෙනෙකුගේද විශ්‍රාම වැටුප් ලිපි ගොනු අස්ථානගත වී පැවතුණි. | විශ්‍රාම වැටුප් ගෙවන සෑම විශ්‍රාමිකයෙකුටම අදාල ලියවිලි ඇතුලත් විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වා ගෙන යා යුතු වීම. | ගොනු නොමැති විශ්‍රාමිකයන් සඳහා තොරතුරු ලබා ගෙන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2001 පරිදි තාවකාලික ගොනු සකස් කර අනුමැතියට එවීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් දන්වා ඇත | 2020.02.10 වන දින වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවන ලද විශ්‍රාම වැටුප් ලිපි ගොනු අතුරින් ගොනු 160 ක් අනුමත කර යවා ඇත. අනෙක් විශ්‍රාමිකයන්ගෙන් අඩු පාඩු ලේඛන ලද පසු ලිපිගොනු සකස් කර අනුමැතිය සඳහා එවීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 4. | විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය අනුව, 2014 දෙසැම්බර් සිට 2018 මැයි දක්වා එකම නමක් හා එකම බැංකු ගිණුම් අංකයක් සඳහා සිවිල් විශ්‍රාම වැටුප් දෙකක් ගෙවා තිබූ අතර එයින් එක් ලිපිගොනුවක අත්‍යාවශ්‍ය ලියවිලි කිසිවක් නොතිබුණි. තවද වැඩිපුර ගෙවීමක් සිදුව ඇත්නම් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | ගෙවීම් සිදු කරන විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක විශ්‍රාම වැටුප් ඉල්ලුම්පත්‍රය, විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය, චර්යා සටහන් වැනි ප්‍රදාන ලියවිලි අඩංගු විය යුතු වේ. වැඩිපුර ගෙවීම් සිදුව ඇත්නම් එය අයකර ගැනීමට කටයුතු කලයුතු වේ. | අදාල විශ්‍රාම වැටුප් ලිපිගොනුව තාවකාලික ගොනුවක් වශයෙන් හඳුනාගත හැකි අතර විශ්‍රාමිකයා හට දැනුම් දීමකින් අදාළ තොරතුරු ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | තොරතුරු ලබා ගැනීම සඳහා විද්‍යුත් තැපැලෙන් විශ්‍රාමිකයා වෙත ලිපියක් යවා තිබුණද මේ දක්වාත් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත. |
| 5. | 2018 ජුනි 19 දිනැති අංක 01/2018 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයෙහි 21 හා 29 ඡේද ප්‍රකාරව සෑම වසරකම දෙසැම්බර් මස 01 දින සිට ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 දක්වා කාලය තුල සියලුම විදේශගත විශ්‍රාමිකයින් සිය ජීවිත සහතික ලබා දිය යුතු අතර එසේ කටයුතු නොකරන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම එම වර්ෂයේ මැයි මස සිට තාවකාලිකව නතර කළ යුතු වේ. කෙසේ වුවද, 2019 වර්ෂය සඳහා ජීවිත සහතික ඉදිරිපත් නොකළ විදේශ විශ්‍රාමිකයින් 5156 ක් සඳහා 2019 නොවැම්බර් මස දක්වා ගෙවීම් නතර කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගෙවීම් නතර කිරීමට කටයුතු කල යුතු වේ. | ගෙවීම් ක්‍රමවේදයන්හි දුර්වලතා හේතුවෙන් බැංකු ක්‍රමය මඟින් පමණක් ගෙවීමට 2018 අගෝස්තු මාසයේ තීරණය කරන ලදී. එසේ නතර කල විශ්‍රාම වැටුප් බැංකු ක්‍රමයට මාරු කිරීමේදී විරෝධතා හා විමසීම් සඳහා නිලධාරීන් යෙදවීමට සිදු විය. 2019 වර්ෂයේ සිට නතර කිරීමට අපේක්ෂා කළද වංසගත තත්ත්වය නිසා නතර නොකරන ලදී. | 2019 වර්ෂයේ ජීවිත සහතික ලබා නොදුන් විදේශගත විශ්‍රාම වැටුප් 2020 වර්ෂයේ සිට නතර කිරීමට අපේක්ෂා කළද ලොවපුරා පැතිරුණු කොවිඩ් 19 වසංගත තත්ත්වය මත සෞඛ්‍ය ආරක්ෂක විධිවිධාන හේතුවෙන් නතර නොකරන ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| 6. | ඍජුවම චෙක්පත් මඟින් දායක මුදල් එවනු ලබන ආයතන 05 ක් විසින් ඉදිරිපත් කරන ලද රු. 756,996 ක් වූ චෙක්පත් 07 ක් විවිධ හේතු මත 2019 මැයි 24 සිට 2019 ඔක්තෝබර් 10 දක්වා කාලය තුල හරවා යවා තිබුණි. එහෙත් 2021 ජනවාරි 14 වන විට වසරක වැඩි කාලයක් ගතවී ඇතත් එම දායක මුදල් නැවත ලැබී නොතිබුණි. | ආපසු හරවා යවන ලද දායක මුදල් නැවත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. එම චෙක්පත් සම්බන්ධව අදාල ආයතන වෙතින් විමසීම් කළ ද පිළිතුරු ලැබී නොමැත. | එම චෙක්පත් සම්බන්ධව අදාල ආයතන වෙතින් විමසීම් කළ ද පිළිතුරු ලැබී නොමැත. |
| 7. | 2019 ජුනි 11 දිනැති අංක 01/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගනු ලැබූ සියලු විශ්‍රාමිකයින් සඳහා 2019 ජූලි 01 දින විශ්‍රාම වැටුප් ගැලපීමත් සමඟ මෙතෙක් අයවැය යෝජනා අනුව මාසිකව ගෙවනු ලැබූ රු. 3,500 ක අන්තර් දීමනාව ගෙවීම නතර කල යුතු විය. එහෙත් ඊට පටහැනිව විශ්‍රාමිකයින් 214 දෙනෙකු සඳහා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප සමඟ ගෙවන යැපීම් දීමනාව සමඟ අන්තර් දීමනාව ගෙවීම හේතුවෙන් 2019 ජූලි 01 දින සිට 2020 දෙසැම්බර් රු. 16,839,900 ක් වැඩිපුර ගෙවා තිබුණි. | විශ්‍රාම වැටුප් චක්‍රලේඛයට මගින් වැටුප් ගැලපීම කරන ලද විශ්‍රාමිකයන් සඳහා අන්තර් දීමනාව ගෙවීම් සිදු නොවන පරිදි දත්ත පද්ධතියේ අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කල යුතු අතර විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධව මුදල් රෙගුලාසි 1036 හා 104 පරිදි ක්‍රියාකර අයකර ගත යුතු වේ. | ත්‍රිවිධ හමුදාවන්ගේ වැටුප් හා දීමනා, විශ්‍රාම යාමේදී, දුබලතාවයට පත් වීමේදී, මිය යාමේදී ගෙවනු ලබන විශ්‍රාම වැටුප් හා දීමනා, ස්ථාවර මාසික දීමනා ආදිය නැවත සමාලෝචනය කර විසඳුමක් ලබා දීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදා හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නියෝජනයෙන් කමිටුවක් පත්කර නිර්දේශ ලබා දෙන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇත. | වැන්දඹු අනත්දරු / වැනදඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් සමඟ ගෙවන යැපීම් දීමනාව සංශෝධනය නොවන නිසා එම අවස්ථාවේදී යැපීම් දීමනාව සමඟ ගෙවන අන්තර් දීමනාව නතර කර නැත. ත්‍රිවිධ හමුදාවේ ආබාධිත හා මිය ගිය නිලධාරීන්ට දෙන වරප්‍රසාද සංශෝධනයට ලක්වීම තුල මෙවැනි ගැටළුකාරි තත්ත්වයන් වරින් වර නිර්මාණය වී ඇත. මේ නිසා ත්‍රිවිධ හමුදාවන්ගේ වැටුප් හා දීමනා, විශ්‍රාම යාමේදී, දුබලතාවයට පත් වීමේදී, මිය යාමේදී ගෙවනු ලබන විශ්‍රාම වැටුප් හා දීමනා, ස්ථාවර මාසික දීමනා ආදිය නැවත සමාලෝචනය කර විසඳුමක් ලබා දීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය, |

| | | | | |
|---|---|---|---|---|
| | | | | මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදා හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නියෝජනයෙන් කමිටුවක් පත්කර නිර්දේශ ලබා දෙන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇත. |
| 8. | නියැදි පරීක්ෂණවලදී හෙළිදරව් කරගත් පරිදි, වාර්ෂිකව ජීවත් වීමේ සහතිකය නොමැති වීම හේතුවෙන් කොළඹ ප්‍රාදේශීය ලේකම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 වර්ෂය වෙනුවෙන් විශ්‍රාමිකයින් 66 දෙනෙකුගේ හා 2019 වෙනුවෙන් විශ්‍රාමිකයින් 78 දෙනෙකුගේද ගෙවීම් නවතා තිබුණි. ඇතැම් විශ්‍රාමිකයින් මියගොස් තිබූ බව සහ වැඩිපුර ගෙවා ඇති වටිනාකම ගෙන්වා ගැනීමට බැංකු වෙත ලිපි යවා ඇති බවද දක්වා තිබුණද මියගිය විශ්‍රාමිකයන් සංඛ්‍යාව සහ වැඩිපුර ගෙවා ඇති වටිනාකම හඳුනාගෙන නොතිබුණි. | මියගොස් ඇති විශ්‍රාමිකයින් වෙත වැඩිපුර ගෙවීම් සිදුව තිබේ නම් අයකර ගත යුතුය. | මියගිය විශ්‍රාමිකයන්ගේ වැඩිපුර ගෙවීම් ගෙන්වා ගැනීමට බැංකු වෙත ලිපි යවා ඇති බවද, ඇතැම් විශ්‍රාමිකයන් විදේශගත වී ඇති බවද ග්‍රාම නිලධාරීන් විසින් වාර්තා කළ බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | නැවත ජීවිත සහතික ඉදිරිපත් කළ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කළ අතර මියගිය විශ්‍රාමිකයන්ගේ වැඩිපුර ගෙවීම් ගෙන්වා ගැනීමට බැංකු වෙත ලිපි යවා ඇති බවද, ඇතැම් විශ්‍රාමිකයන් විදේශගත වී ඇති බවද ග්‍රාම නිලධාරීන් විසින් වාර්තා කළ බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත.<br>මෙම තොරතුරු ග්‍රාම නිලධාරී මඟින් හා රෙජිස්ටාර් ජනරාල් මඟින් නියමිත දිනට ලැබෙන්නේ නම් අවම කර ගත හැක. |
| 9. | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය අනුව විශ්‍රාම වැටුප් ලද දිනය සඳහන් නොවන අවස්ථාවන් 5454 ක් පැවති බව නිරීක්ෂණය විය. තවද විශ්‍රාමිකයාගේ උපන් දිනය | විශ්‍රාම වැටුප් ලිපිගොනු පරීක්ෂා කර විශ්‍රාම වැටුප් ලද දිනය දත්ත පද්ධතිය තුළ නිවැරදි කල යුතු වේ. | විශ්‍රාමිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංක, විශ්‍රාම ගිය දිනය ඇතුළු තොරතුරු නිවැරදි කිරීම මගින් බහුතරයකගේ | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේදී විශ්‍රාමිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංක, විශ්‍රාම ගිය දිනය ඇතුළු |

| | | | | |
|---|---|---|---|---|
| | විශ්‍රාම වැටුප් ලද දිනය ලෙස සඳහන් වූ අවස්ථාවන් 130 ක් 2020 සැප්තැම්බර් මස වනවිට පැවති බවද නිරීක්ෂණය විය. | | තොරතුරු නිවැරදි වී ඇති අතර ඉදිරියේදී ඉතිරි තොරතුරු නිවැරදි කරනු ලැබේ. | තොරතුරු නිවැරදි කිරීම මඟින් බහුතරයකගේ තොරතුරු නිවැරදි වී ඇත. |
| 10. | දෙපාර්තමේන්තුව වෙත 2019 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද වටිනාකම රු. 17,637,547 ක් වූ විගණන විමසුම් 6 කට 2020 සැප්තැම්බර් 02 වන විටද 2020 මුදල් වර්ෂයට අදාලව නිකුත් කරන ලද වටිනාකම රු. 45,980,603 ක් වූ විගණන විමසුම් 17 කට 2020 දෙසැම්බර් 31 දින වන විටත් පිළිතුරු ලැබී නොතිබුණි. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452 (1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට කඩිනමින් පිළිතුරු ලබා දිය යුතු වේ. | විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු දෙපාර්තමේන්තුව සම්බන්ධිත ආයතනයන් වෙතින් නිවැරදි කිරීමෙන් පසුව පිළිතුරු ලබා දිය යුතු බැවින් කාල පමාවක් පවතින බව පිළිගනිමි. | විගණන විමසුම් වල සඳහන් කරුණු සම්බන්ධයෙන් අදාළ ආයතන වලින් පිළිතුරු ලබා ගැනීමට යම් කාලයක් ගතවේ. පිළිතුරු ලද පසුවද ඒවා තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂා කිරීමට සිදු වේ. ඒ සඳහා ලිපි ලේඛණ ගෙන්වා ගැනීමටද සිදු වේ. තවද විමසුම් තුළ සඳහන් වන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සහ ඒ සඳහා පිළියම් යෙදීමට කාලයක් ගත වේ. එබැවින් පිළිතුරු ලබා දීම සඳහා කාල පමාවක් සිදුවේ. |
| 11. | ආයතන සංග්‍රහය 11 පරිච්ඡේදය 13.3 ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත් කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. එහෙත් තනතුරක පූර්ණ කාලීන නිලධාරියකු සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම නොපමාව කලයුතු වේ. පූර්න කාලීන නිලධාරියෙකු අවශ්‍ය නොවේ නම් දෙපාර්තමේන්තුවේ අනෙකුත් | ආයතන සංග්‍රහය II පරිච්ඡේදය 13.3 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ස්ථිර පත් කිරීම් සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්තව කර නොමැති බැවින් දැනට අනුයුක්තව ඇති නිලධාරීන් පලපුරුද්ද හා ජ්‍යෙෂ්ඨතාවය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත වැඩ බැලීම සඳහා පත් කර ඇත. | ස්ථිර පත් කිරීම සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර නොමැති බැවින් දැනට අනුයුක්තව ඇති නිලධාරීන් පලපුරුද්ද හා ජ්‍යෙෂ්ඨතාවය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත වැඩ බැලීම සඳහා පත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරීන් අතර රාජකාරි බෙදා දිය යුතු වුවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහනට අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 4 ක් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරනු ලබන විශ්‍රාම වැටුප් නිලධාරීන් 7 ක් සඳහා 2020 ජූනි 24 වන විට වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි. එම තනතුරු වල වැඩ බැලීම් කාලය මාස 08 සිට මාස 65 දක්වා වී තිබුණි. | | | |
| 12. | ආදායම් සංකේත අංක 20:04:02:00 යටතේ පළාත් සභා වලින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් ආයතනය අනුව මෙන්ම දායකයන් අනුව, නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි සුදුසු දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි. පළාත් පාලන ආයතන විසින් හිඟ ආදායම ලෙස වාර්තා කර තිබූ වටිනාකම මූල්‍ය ප්‍රකාශ වල හිඟ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව 2020 වර්ෂය අවසානයට රු. 823,984,589 ක් වූ හිඟ ආදායමෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද වර්ෂය තුළදී රැස් කරන ලද රු. 11,021,652,894 ක් වූ දායක ලැබීම් දායක ගිණුම් අනුව | දායකයින් හා දායක ගෙවීම් පිළිබඳ දත්ත පද්ධතියක් සම්බන්ධිත ආයතන වල සහයෝගය ඇතිව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගැනීමට පියවර ගත යුතු බව. | සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ මූලික තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදයක් ඔස්සේ දත්ත ඇතුලත් කල හැකි වැඩසටහනක් 2017 ඔක්තෝබර් මස සිට හඳුන්වා දී ඇත. නමුත් රාජ්‍ය අංශයේ අනෙකුත් ආයතන වල සහයෝගය නොමැති වීමෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අකර්මණ්‍ය වී ඇත. | මේ වන විට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තර පෞද්ගලික ලිපි ගොනුව ඇතුලත් කිරීම සම්බන්ධයෙන් 2020/12/31 දිනැති 03/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා පැරණි සාමාජිකයින් මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම සම්බන්ධව 2021/02/10 දිනැති 26/2017(V) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙන්කර හඳුනා ගත නොහැකි විය. ඒ අනුව වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ගෙවීමේදී දායක මුදල් ඒ ඒ පුද්ගලයාගෙන් අඛණ්ඩව ලැබුණේද යන්න දෙපාර්තමේන්තුව තුළින් සනාථ කර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම හිඟ ආදායම් අප්‍රමාදව අය කර ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කිරීමටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. | | | |
| 13. | 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 විශ්‍රාම වැටුප් දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියළුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන විට සෑම මාසයකම අයකිරීම් ඊළඟ මාසයේ 15 දිනට පෙර ගැනීමට කටයුතු කල යුතු වුවත් 2020 වර්ෂයේදී පළාත් සභා 5 ක් විසින් අවස්ථා 29 කදී දින 15 සිට දින 96 දක්වා කාල ප්‍රමාදයක් සහිතව එවා තිබූ අතර, දකුණු පළාත් සභාව හා ඌව පළාත් සභාව එක් එක් මාසයන් සඳහා අදාළ දායක මුදල් එවීමේ දී, එකවර එවීමකින් තොරව කොටස් වශයෙන් එවීම නිසා නියමිත දිනට වඩා දින 16 ත් 132 ත් අතර කාල ප්‍රමාදයක් සහිතව එවා තිබූ අවස්ථා 20 | නියමිත දිනට දායක මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු බව. | දායක මුදල් වෙන් කරන්නේ වැටුප් ගෙවන අවස්ථාවේදී බැවින් ඊළඟ මාසයේ 20 වන දින දක්වා දකුණ හා ඌව පළාත් සභාවල රාජ්‍ය ආයතනයන්ගේ වැන්දඹු අනත්දරු දායක මුදල් මාසික ගිණුම් සාරාංශ ඔස්සේ එකතු කර තනි චෙක්පතක් ලෙස ප්‍රේෂණය කල යුතු වුවද මාසික ගිණුම් සාරාංශයන්හි දෝෂ නිවැරදි කරන තෙක් ඇස්තමේන්තු අගය ප්‍රේෂණය කර දෝෂ නිවැරදි කර ඉතිරි මුදල ප්‍රේෂණය කරනු ලැබේ. | දායක මුදල් වෙන් කරන්නේ වැටුප් ගෙවන අවස්ථාවේදී බැවින් ඊළඟ මාසයේ 20 වන දින දක්වා කල් ලබාදීමක් සිදු කර ඇත. දකුණ හා ඌව පළාත් සභාවල රාජ්‍ය ආයතනයන්ගේ වැන්දඹු අනත්දරු දායක මුදල් මාසික ගිණුම් සාරාංශ ඔස්සේ එකතු කර තනි චෙක්පතක් ලෙස ප්‍රේෂණය කල යුතු වුවද මාසික ගිණුම් සාරාංශයන්හි දෝෂ නිවැරදි කරන තෙක් ඇස්තමේන්තු අගය ප්‍රේෂණය කර දෝෂ නිවැරදි කර ඉතිරි මුදල ප්‍රේෂණය කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ක් ද නිරීක්ෂණය විය. | | | |
| 14. | 2020 දෙසැම්බර් 31 දිනට පරිශ්‍රෙය් කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන 7 ක් විසින් ගෙවිය යුතු හිඟ කුලී ආදායමේ එකතුව රු. 2,036,600 ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව හිඟ කාල පරිච්ඡේදය වසරකට වැඩි වටිනාකම රු. 299,000 ක් විය. | හිඟ ගොඩනැගිලි කුලිය අය කර ගැනීමට කටයුතු කල යුතු බව. | 2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාලය පිහිටි මාලිගාවත්ත ප්‍රදේශය මාස හතරකට අධික කාලයක් හුදකලා කර තිබූ නිසා කුලී පදනම මත පත්වාගෙන යන ආයතනයන්හි කාර්යාල කටයුතු සිදු නොවූ බැවින් කුලී මුදල් 2020 දෙසැම්බර් 31 දින වන විට ගෙවීමට නොහැකි විය. | 2021.12.31 වන විට අය වීමට ඇති මුළු මුදල රු. 474,387.42 කි. |
| 15. | වර්තමාන ලිපිනයන් පිළිබඳ තොරතුරු නොමැති වීම හා බාල වයස්කරුවා වෙත කිහිප වරක් ලිපි මඟින් දන්වා සිටිය ද පාස්පොත භාර ගැනීමට පැමිණ නොතිබීම යන කරුණු මත තිඹිරිගස්යාය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා යටිනුවර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක බාල වයස්කරුවන් 22 ක ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබියදීත් බාල වයස්කරුවන් පාස්පොත් අදාල පුද්ගලයන් වෙත භාර දී නොතිබුණි. එයින් පාස් පොත් 20 ක යාවත්කාලීන කරන ලද දිනයන්ට අදාලව එකතු වටිනාකම රු. 2,145,720 ක් වී තිබුණි. | වයස අවුරුදු 18 සම්පූර්ණ වී ඇති පුද්ගලයන්ගේ වර්තමාන ලිපිනයන් පිළිබඳ තොරතුරු ග්‍රාම නිලධාරීන් සහ බැංකු මගින් ලබා ගෙන අදාල ගිණුම් හිමියන්ට පාස්පොත් භාර දීමට කටයුතු කළ යුතුය. | මෙම බාලවයස්කරුවන්ගේ වර්තමාන ලිපිනයන් පිළිබඳ තොරතුරු ග්‍රාම නිලධාරීන් සහ බැංකු මගින් ලබාගෙන ගිණුම් හිමියන්ට පාස්පොත් භාර දීමට කටයුතු කරන බව ද, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන්ගේ පාස්පොත් භාරදීමට ලිපි මඟින් දන්වා ඇති බවද, පාස්පොත් භාර ගැනීමට පැමිණෙන ලෙස කිහිප වරක් ලිපි මඟින් දන්වා සිටිය ද මේ වන තෙක් පැමිණ නොමැති බවද, අදාල ප්‍රාදේශීය ලේකම් | (i) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවුරුදු 18 ඉක්ම වූ බාල වයස්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා අදාල ගිණුම් හිමි බැංකුව වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. එම තොරතුරු ලද පසු පාස් පොත් අදාළ අයිතිකරුවන් වෙත ලබා දීමට කටයුතු සිදු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත.<br>(ii) ශ්‍රී ජයවර්ධනපුර |

| | | | | |
|---|---|---|---|---|
| | | | වරුන් විසින් දන්වා ඇත. | කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බාලවයස්කරුවන්ගේ ලිපිනය සඳහන් වී නොමැති බැවින්, එම පාස්පොත් අදාල අයිතිකරුවන් වෙත භාර දීමට නොහැකි වී ඇති බවත්, එබැවින් ඒ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කර ඇත. |
| 16. | 2011 මැයි 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2011, 2012 දෙසැම්බර් 20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 5/2012 සහ 2014 නොවැම්බර් 03 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2014 යන චක්‍රලේඛ අනුව විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා විට ඒකාබද්ධ වැටුපට පමණක් අනතර් දීමනාව ගෙවිය යුතුය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරනය කරගත් කරුණු අනුව ඊට පටහැනිව කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි විශ්‍රාමිකයින් 03 දෙනෙකු සඳහා අන්තර් දීමනාව ලෙස වැඩිපුර ගෙවා තිබුණු වටිනාකමෙන් 2021 ජූනි 30 දිනට රු. 867,317 ක් හිඟ හිට තිබූ අතර වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය වැඩි දියුණු කළ යුතු අතර මුදල් රෙගුලාසි 103, 104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගත යුතු බව. | කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වැඩිපුර ගෙවන ලද අන්තර් දීමනාව අය කිරීමට කටයුතු කර ඇත. | කටාන ප්රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන් තිදෙනාගෙන් තවදුරටත් අයවිය යුතු මුදල රු. 685,235 ක්ද, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන් තිදෙනාගෙන් තවදුරටත් අයවිය යුතු මුදල රු. 569,750 ක් ද වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | විසින් විශ්‍රාමිකයන් 03 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු. 623,750 ක් වූ අන්තර් දීමනාව 2021 ජූනි මස වන තෙක් අය කර නොතිබුණි. | | | |
| 17. | විශ්‍රාමිකයා මිය ගිය පසු දැනුම් දීම ප්‍රමාදවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබූ නමුත් ඒටීඑම් කාඩ්පත මඟින් මුදල් ලබාගැනීම සහ බැංකු ගිණුම බද්ධ ගිණුමක් වීම නිසා වෙනත් පුද්ගලයින් විසින් අයථා ලෙස එම මුදල් ලබාගැනීම වැනි අවස්ථාවල බැංකු ගිණුමේ මුදල් නොමැති වීම නිසා වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවස්ථා 16 කදී වටිනාකම රු. 1,125,600 හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවස්ථා 13 කදී වටිනාකම රු. 1,779,112 ක් ලෙස එකතු වටිනාකම රු. 2,904,712 ක් 2020 දෙසැම්බර් 30 දිනට මෙසේ අයථා පරිදි මුදල් ලබාගත් පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට පැවති බව නියදි විගණන පරීක්ෂාවලදී අනාවරණය විය. | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය වැඩි දියුණු කළ යුතු අතර මුදල් රෙගුලාසි 103, 104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගත යුතු බව. | බැංකු විසින් විශ්‍රාමිකයන්ට ලබා දී ඇති ණය සඳහා ඉදිරි වාරිකද එම විශ්‍රාමිකයන්ගේ වැටුපෙන් අය කර ගැනීම විශ්‍රාමිකයන්ගෙන් අය විය යුතු මුදලින් 50% ක් පමණ අය කරගෙන ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම්කාර්යාලයෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට අදාල අදාල බැංකුව වෙත යවා ඇත. | වැඩිපුර ගෙවා ඇති මුදල් වලින් කොටසක් අය කර ගෙන ඇති අතර තවදුරටත් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. |
| 18. | විශ්‍රාමිකයා මිය ගිය පසු දැනුම් දීම ප්‍රමාදවීම හේතුවෙන් විශ්‍රාම වැටුප්/ වැන්දඹු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා ඇති | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය වැඩි දියුණු කළ යුතු | මියගිය විශ්‍රාමිකයන්ගෙන් අයවිය යුතු මුදලින් 50% ක් පමණ අය | වැඩිපුර ගෙවා ඇති මුදල් වලින් කොටසක් අය කර ගෙන ඇති අතර තවදුරටත් අයවිය යුතු |

| | | | | |
|---|---|---|---|---|
| | අවස්ථාවලදී ගිණුමේ මුදල් පවතී නම් නැවත එවන ලෙස අදාල බැංකුව වෙත දන්වා යවා තිබුණද බැංකුව විසින් පිළිතුරු එවා නොතිබුණු අවස්ථාවල මුදල් අය කර ගැනීමට ඉදිරි පියවර ගත යුතු වේ. කෙසේ වුවද නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ පරිදී තිඹිරිගස්යාය සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 94 කදී වැඩිපුර ගෙවා තිබූ නමුත් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබූ හිඟ මුදල රු. 8,643,512 ක් වී තිබුණි. මෙයින් ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩි පුර ගෙවීම් සිදුවී ගතව තිබූ කාලය වසර 1 ත් 4 ත් දක්වා වී තිබුණි. | අතර මුදල් රෙගුලාසි 103, 104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගත යුතු බව. | කරගෙන ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි මියගිය විශ්‍රාමිකයන්ගෙන් අයවිය යුතු මුදල් අය කර ගැනීම සඳහා බැංකු වෙත ලිපි යවා ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. |
| 19. | ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම නිසා 2018 ජූලි සහ 2019 ජූනි මාසවල විශ්‍රාම වැටුප් නතර කරන ලද විශ්‍රාමිකයින් පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවේදී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකු සහ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් තිදෙනෙකු මිය යාම හේතුවෙන් ජීවිත සහතික ඉදිරිපත් කර නොතිබුණි. විශ්‍රාමිකයා මියයාම ග්‍රාම නිලධාරී හෝ පවුල්වල ඥාතීන් විසින් වැටුප් අංශය | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය වැඩි දියුණු කළ යුතු අතර මුදල් රෙගුලාසි 103, 104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගත යුතු බව. | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 වර්ෂයේ ජීවිත සහතික ලබා නොදුන් විශ්‍රාමිකයින් 2020 වර්ෂය තුළ තවදුරටත් ජීවිත සහතික ලබා නොදුන්නේ නම් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් නතර කිරීමට අපේක්ෂා කළද පවතින COVID 19 වසංගත තත්ත්වය හමුවේ සංචරණ සීමා පැවති බැවින් ඒ හරහා ජීවිත සහතික ලබා ගැනීමේ ප්‍රායෝගික | විගණනයෙන් පෙන්වා දී ඇති 2019 වර්ෂයේ ජීවිත සහතික ලබා නොදුන් විශ්‍රාමිකයින් 2020 වර්ෂය තුළ තවදුරටත් ජීවිත සහතික ලබා නොදුන්නේ නම් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් නතර කිරීමට අපේක්ෂා කළද පවතිවන COVID 19 වසංගත තත්ත්වය හමුවේ සංචරණ සීමා පැවති බැවින් ඒ හරහා ජීවිත සහතික ලබා ගැනීමේ ප්‍රායෝගික ගැටළු මතු වූ බැවින් විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප අත්හිටුවීමට කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | වෙත දැනුම් නොදීම හේතුකොට ගෙන මියගිය දින සිට ප්‍රධාන කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් නතර කරන තෙක් එකතු වටිනාකම රු. 2,068,762 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. එසේ වැඩිපුර ගෙවූ මුදල් හඳුනාගෙන මුදල් රෙගුලාසි 103, 104 ප්‍රකාරව කටයුතු කර නැවත අයකර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | | ගැටළු මතු වූ බැවින් විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප අත්හිටුවීමට කටයුතු නොකරන ලදී. | නොකරන ලදී. |
| 20 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර විශ්‍රාමික ලිපිගොනුව මාරුකර තිබුණද දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ගඟවට කෝරලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් විශ්‍රාමිකයකු සඳහා 2004 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් අංක 01-603037 සහ 01-1603037 යටතේ විශ්‍රාම වැටුප් දෙකක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි. මු.රෙ. 104 පරීක්ෂණය මගින් 2008 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා වැඩිපුර ගෙවන ලද මුදල රු. 2,169,551 ලෙස තක්සේරු කර තිබුණ නමුත් 2008 වර්ෂයට පෙර වූ මාස 41 ක කාලයක් සඳහා වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම ගණනය කර නොතිබුණි. මෙම විශ්‍රාමිකයා 2021 මාර්තු 02 දින මිය | විශ්‍රාම වැටුප් ගොනුවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරු කරන සෑම අවස්ථාවකදීම දත්ත පද්ධතිය යාවත්කාලීන වේ දැයි නිරන්තර පරීක්ෂාවට ලක් වන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කල යුතුය. මු.රෙ 103, 104 ප්‍රකාරව වැඩිපුර ගෙවන ලද මුදල් තක්සේරු කර නැවත අය කර ගැනීමට කටයුතු කල යුතු බව. | ද්විත්ව විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් මු.රෙ 104 අනුව පරීක්ෂණයක් සිදු කර වැඩිපුර ගෙවන ලද මුදල රු. 2,169,551 ක් ලෙස තක්සේරු කර ඇත. 2019 දෙසැම්බර් මස සිට විශ්‍රාම වැටුප් ගෙවීම නවතා ඇති අතර විශ්‍රාමිකයා 2021 මාර්තු 02 දින මිය ගොස් ඇත. ඒ අනුව තවදුරටත් අය වීමට ඇති මුදල රු. 201,839,320 ක් වන අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීමේදී අය කිරීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | වැන්දඹු අනත්දරු වැටුප සකස් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සහතිකයේ සත්‍යතාවය පිළිබඳව අධිකරණය මඟින් විමසා දැනගන්නා ලෙසත් බදුල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් දැනුම් දී ඇත. මෙම ගැටළු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව වැන්දඹු අනත්දරු වැටුප සකස් කර ගැනීමට පියවර ගන්නා බවත් එහිදී උක්ත මුදල අයකර ගැනීමට කටයුතු කරනා බවටත් ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගොස් තිබූ අතර විශ්‍රාම වැටුප නතර කල දින සිට මියගිය දිනය දක්වා ඔහුගෙන් අයකරගත් මුදල් අඩු කල පසුව තවදුරටත් රු. 1,839,320 කට අධික මුදල අයකර ගැනීමට පැවතුණි. | | | |
| 21. | අංක1-603326 හා 21-500158 මගින් සිවිල් හා වැනදඹු ලෙස විශ්‍රාම වැටුප් 02 ක් ලබමින් සිට මිය ගිය විශ්‍රාමික නිලධාරිනියක් වෙත වැඩිපුර ගෙවා තිබුණු රු. 2,696,303 ක් වූ විශ්‍රාම වැටුපෙන් 2020 දෙසැම්බර් 18 වන විටත් අයකර ගෙන නොතිබුණු මුදල රු. 2,388,251 ක් වී තිබුණි. | වැඩිපුර ගෙවීම සිදුනොවන පරිදි මියයන විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු කඩිනමින් ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කරගත හැකිවන සේ වැඩපිළිවෙලක් සකස් කර ගත යුතු බව හා මුදල් රෙගුලාසි 103 හා 110 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් ගෙන් සිදු වූ අලාභය අයකර ගතයුතු බව. | නඩු පවරා ඇත. | ගම්පහ අධිකරණය විසින් 2022.03.03 දින නඩුව කැඳවා ඇත. |
| 22. | අංක 01-600772 යටතේ විශ්‍රාම වැටුප් ලබමින් සිට 2013 නොවැම්බර් 07 දින මියගිය නිලධාරිණියගේ බැංකු ගිණුමට මිය ගොස් මාස 29 ක කාලයක් දක්වා රු. 582,423 ක් විශ්‍රාම වැටුප් ප්‍රේෂණය කර තිබුණි. එයින් රු. 581,916 ක් ATM කාඩ්පතක් භාවිතා කරමින් ඉවත් කර ගෙන තිබූ නමුත් 2020 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවීම් සිදුනොවන පරිදි මියයන විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු කඩිනමින් ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කරගත හැකිවන සේ වැඩපිළිවෙලක් සකස් කරගත යුතු බව හා මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් ගෙන සිදු වූ අලාභය | මෙම වංචාව සිදු කළ පුද්ගලයාට එරෙහිව නීතිමය කටයුතු සිදු කිරීම සඳහා නඩු පවරා ඇත. | රජයේ මුදල් වංචා කිරීමක් සම්බන්ධ පැමිණිල්ලක් වන බැවින් උපදෙස් ලබා ගැනීම සඳහා ඩබ්.පී.3/43/2019 අංකය යටතේ ගරු නීතිපතිතුමා වෙත යොමු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | අයකර ගතයුතු බව. | | |
| 23. | දත්ත පද්ධතිය අනුව විශ්‍රාම වැටුප් අංක 21-0-105353 දරන විශ්‍රාමිකයා ගේ ජාතික හැඳුනුම්පත් අංකය වෙනුවට විශ්‍රාමිකයා ගේ දියණියගේ ජාතික හැඳුනුම්පත් අංකය යොදා විශ්‍රාමිකයා මිය ගොස් මාස 86 ක කාලයක් ගතවන තෙක් විශ්‍රාම වැටුප ලෙස රු. 1,562,470 ක් ගෙවා තිබුණි. එම මුදල් ඇයගේ දියණිය විසින් ලබාගෙන තිබුණු නමුත් මේ සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ග, හෝ විනය ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු විගණනයට වාර්තා නොවූ අතර මෙම වැඩිපුර ගෙවූ මුදලින් 2020 දෙසැම්බර් 31 දිනට රු. 1,166,336 ක මුදලක් තවදුරටත් අය කර ගැනීමට පැවතිණි. | වැඩිපුර ගෙවීම් සිදුනොවන පරිදි මියයන විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු කඩිනමින් ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කරගත හැකිවන සේ වැඩපිළිවෙලක් සකස් කරගත යුතු බව හා මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් ගෙන සිදු වූ අලාභය අයකර ගතයුතු බව. | වංචා කළ පුද්ගලයාට නීතිමය කටයුතු කිරීම සඳහා නඩු පවරා ඇත. | දියණිය මිය යාම හේතුවෙන් 2021 මාර්තු මස සිට කිසිදු ගෙවීමක් කර නොමැත. ඒ අනුව 2021 මාර්තු මස වන විට අයවීමට ඇති මුළු මුදල රු. 1,036,336 කි. ඒ පිළිබඳව මු.රෙ. 104 පරීක්ෂණයක් පවත්වන බව වත්තල ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති අතර එහි ප්‍රතිඵල මත වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 24. | ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරිනියක විසින් හිමිකම් නොමැති හමුදා වැන්දඹුවකගේ ගිණුමට රු. 1,596,640 ක් බැර කර එම මුදල් විශ්‍රාම වැටුප් නිලධාරිනිය විසින් ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර 2012 ඔක්තෝබර් 22 වන විට රු. 1,000,000 ක මුදලක් නිලධාරිනිය විසින් ගල්නෑව ප්‍රාදේශීය ලේකම් | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව විධිමත් විනය පියවර ගත යුතු බව සහ වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු බව. | එම නිලධාරිනියට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා 2020.09.30දින කටයුතු ආරම්භ කර ඇති අතර නිලධාරිනියගේ පදිංචි ස්ථානය හා දුරකතන අංක වෙනස් කර තිබූ බැවින් අදාල තොරතුරු සොයා ගැනීමෙන් අනතුරුව ඇයගේ ඨකවරණ නිලධාරියාගේ අවසර ඉල්ලුම්පත්‍රය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | එම විශ්‍රාම වැටුප් නිලධාරිනියගේ ඨකවරණ නිලධාරියාගේ අවසර ඉල්ලුම් පත්‍රය 2021.12.31 දින වන විටද භාර දී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාලයට ගෙවා තිබුණි. එම මුදලින් තවදුරටත් අය කර ගැනීමට තිබූ මුදල් 2020 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි. | | වෙත යොමු කරන ලෙස දැනුම් දී ඇතත් මේ වචන තෙක් එම අවසර පත්‍රය යොමු කර ඇත. | |
| 25. | කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ දත්ත වෙනස් කරමින් හිග විශ්‍රාම වැටුප් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටි ගණකාධිකාරීවරයා විසින් 2009 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු. 6,758,120 ක් ඔහුගේ ගිණුමට බැර කර ගෙන තිබුණි. මෙම මුදල් 2020 දෙසැම්බර් 31 වන විට අයකර නොතිබුණි. | වංචා සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග අනුගමනය කර මුදල් රෙගුලාසි 103, 104 ප්‍රකාරව වගකිවයුත්තන් ගෙන් සිදු වූ අලාභය අයකර ගත යුතු බව. | එම ගණකාධිකාරිවරයා සේවයෙන් පහ කළ බව රත්නපුර දිස්ත්‍රික් ලේකම් දන්වා ඇත. | විශ්‍රාම වැටුප් වංචාවට සම්බන්ධ ගණකාධිකාරිවරයා විසින් භාවිතා කරන ලද පරිගණකයන්හි දත්ත පරීක්ෂා කර විශ්ලේෂණ වාර්තාවක් ලබා ගැනීම සඳහා මේ වන විට එම පරිගණක 02 රජයේ රස පරීක්ෂක වෙත යොමු කර ඇත. එහි වාර්තාව ලද පසු ඉදිරි විමර්ශන කටයුතු සිදු කරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. මේ සම්බන්ධයෙන් රත්නපුර උසාවියේ ම/උ බ“ෟ 417/15 දරණ නඩුව පවත්වාගෙන යන බව තවදුරටත් දන්වා ඇත. |
| 26. | මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක එක අනුව 2020 වර්ෂය අවසාන වන විට වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප්වලින් තවදුරටත් අයකර ගත යුතු මුදල රු. මිලියන 521 ක් වී තිබුණි. මෙම ශේෂය, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.මිලියන 4.8 කින් ද, වර්ෂ 10 – 5 දක්වා කාල පරාසයක සිට පැවත එන රු. මිලියන 66 | අයකර ගත යුතු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අප්‍රමාදව අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බව. | වාරිකයන් ඔවුන් ලබන වෙනත් විශ්‍රාම වැටුප්, වයස වැඩියෙන් ගෙවා ඇති වටිනාකම සහ ඉල්ලීම් යන කරුණු මත තීරණය වන බැවින් වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට කාල පමාවක් පවතී. | 2021 වර්ෂයේ අය කර ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව 2021 වර්ෂයේ අය කර ඇති මුළු මුදල රු. මිලියන 288 ක් වේ.<br>තවද වසර 10 ට වැඩි කාලයක් ගත වී ඇති වැඩිපුර ගෙවීම් තුළ මියගිය විශ්‍රාමිකයන්ගේ වැඩිපුර ගෙවීම් ඇති බැවින් එම මුදල් අය කර |

| | | | | |
|---|---|---|---|---|
| | කින්ද, වර්ෂ 5 ක අඩු කාලයක් තුල අයකරගත යුතු රු. මිලියන 450 කින් ද සමන්විත විය. | | | ගැනීමට මු.රෙ. 104 ක්‍රියාත්මක කිරීම තුළින්කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. තවද තවදුරටත් අය කර ගැනීමට නොහැකි අයකර ගැනීම් මු.රෙ. 109 අනුව පොතෙන් කපා හැරීමටද කටයුතු කරමින් පවතී. |
| 27. | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ 2020 සැප්තැම්බර් මාසයේ ගෙවීම් දත්ත පද්ධතිය පරීක්ෂාවේදී 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගනු ලැබූ සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 සහ 14/2019 අනුව ගැලපීම, 2019 ජූනි 11 දිනැති අංක 01/2019 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් 2019 ජූලි 01 දින සිට සිදු කල යුතුව තිබුණද ජාතික හැඳුනුම්පත් අංක නොමැති වීම, යුද්ධය හා වෙනත් හේතු නිසා ලිපිගොනු අස්ථානගත වීම, වැටුප් සම්බන්ධ ගැටළු වැනි හේතු නිසා 2021 ජනවාරි 13 දින වන විට විශ්‍රාම වැටුප් සංශෝධනය නොකල ලිපිගොනු සංඛ්‍යාව 39,373 ක් වී තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | විශ්‍රාමිකයන් 479,415 කගේ විශ්‍රාම වැටුප් පරිවර්තනය කර ඇති අතර විශ්‍රාමිකයන් 39,373 පරිවර්තනය කර නොමැති ලිපිගොනු වල විවිධ අඩුපාඩු පැවතීම නිසා එම ගැලපීම ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය කරමි. | විශ්‍රාමිකයන් වයස්ගත වීම. නිසා හෝ වෙනත් හේතුවක් මත ජාතික හැඳුනුම්පත් අංකයක් ලබාගෙන නොමැති අවස්ථා වාර්තා වන අතර ඒ වෙනුවට වැඩිහිටි හැඳුනුම්පත හා විශ්‍රාමික හැඳුනුම්පත භාවිතා කරන අවස්ථා වාර්තා වී ඇත. එබැවින් විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය නිවැරදි කිරීමට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| | | | | i. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 14/2019 අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා විශ්‍රාම වැටුප් දත්ත |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පද්ධතියට විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කිරීම අනිවාර්ය කළ බැවින් ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි නොවූ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප සංශෝධනයට අවස්ථාව ලබා නොදීම.<br>ii. ආබාධිතව හෝ වයස්ගත වී දුර්වල වී සිටින විශ්‍රාමිකයන් හට ජාතික හැඳුනුම්පත් සකස් කිරීමට හැකියාවක් නොමැති බව ග්‍රාම නිලධාරීන් විසින් වාර්තා කර ඇත. |
| | | | | iii. මේ සියළු ක්‍රියාමාර්ග මගින් විශ්‍රාමිකයන් දැනට ජාතික හැඳුනුම්පත් භාවිතා නොකරන අතර ඇතැම් පිරිස් ශ්‍රී ලංකා පුරවැසියන් ද නොවේ. මේ සම්බන්ධයෙන් මේ වන විට අධ්‍යනයක් සිදු කර ඇති අතර නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් තුළ ජාතික හැඳුනුම්පත් අංකයට අමතරව විදේශීය අනන්‍යතා සහතික යොදා ගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පහසුකම් ඇති කර ඇත. මෙම සියළු ක්‍රියා මාර්ග මඟින් විශ්‍රාමිකයින් හඳුනාගැනීමට උත්සාහ කරනු ලබන අතර වැරදි තොරතුරු ඉදිරිපත් කරනු ලබන අවස්ථා වලක්වාලනු ලැබීමටත් කටයුතු කෙරේ. |

ශීර්ෂ 254 - රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය**<br>---------------------- | **විගණකාධිපතිගේ නිර්දේශය**<br>---------------------- | **ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග**<br>------------------ | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය**<br>-------------------- |
|---|---|---|---|---|
| | **2018** | | | |
| 1. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ රු.39,335,787ක බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැදීම් හා බැරකම් භාණ්ඩාගාර ප්‍රකාශය සමඟ එකඟ විය යුතු වීම. | බැරකම් ලේඛනයක් නඩත්තු කරමින් අත්හැරීම් මගහැරීම් අවම කිරීමට කටයුතු කර ඇත. | නිරීක්ෂණ එලෙසම පැවතුණි. |
| 2. | දෙපාර්තමේන්තුවේ වත්කම් සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබීමත්, වෙනත් අමාත්‍යාංශ 03ක ප්‍රතිපාදන යටතේ මිලදී ගෙන තිබූ වත්කම් ඇතුළත් කර නොතිබීමත්, මූල්‍ය ප්‍රකාශවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත්ව තිබූ වත්කම් වර්ග ගණනාවකම ආරම්භක | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මූල්‍ය නොවන වත්කම් වටිනාකම, වත්කම් සමීක්ෂණය මඟින්ද, ස්ථාවර වත්කම් ලේඛන මඟින්ද, ඒසීඒ-6 දරන මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය මඟින් ද සනාථ විය යුතු වීම. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු දැනට කරගෙන යනු ලැබේ. | ආරම්භක ශේෂයේ ඇති ගැටළුව මෙතෙක් නිරවුල් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ශේෂය, අත්පත් කර ගැනීම් හා අවසාන ශේෂයන්හි ප්‍රමාණාත්මක වෙනස්කම් පැවතීමත් හේතුවෙන් මූලා‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.2,182,960,444 ක දේපල පිරියත හා උපකරණ වටිනාකමෙහි නිවැරදිතාවය සනාථ නොවුණි. | | | |
| 3. | 1960 වර්ෂයෙන් පසුව සිදු වූ උපත්, විවාහ හා මරණ සහතිකපත් පරිලෝකනය කර, සහතිකපත් නිකුත් කිරීම ඉ - උපත්, විවාහ හා මරණ වැඩසටහන මඟින් අපේක්ෂා කර තිබූ නමුත්, 2014 වර්ෂයේ සිට 2018 මැයි මාසය දක්වා කාලයට අදාළ සහතිකපත් 3,423,590ක් පරිලෝකනය කර දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. මෙම වැඩසටහන සඳහා 2016 හා 2017 වර්ෂයන්හි ප්‍රතිපාදින රු. මිලියන 260කින් රු.මිලියන 250.56 ක් හෙවත් සියයට 96ක් උපයෝජනය කර නොතිබූ අතර, 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කරගෙන නොතිබුණි. | සංවර්ධනය කළ යුතු අංග හඳුනාගෙන විධිමත් සැලසුම් ප්‍රකාරව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගෙන වැඩසටහනින් අපේක්ෂිත අරමුණ කරා කාර්යක්ෂමව මෙහෙයවීමට කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘති කටයුතු සිදුවෙමින් පවතී. මේ වන විට පරිලෝකනය කරන ලද මිලියන 38කට ආසන්න උපත්, විවාහ, මරණ සහතික සංඛ්‍යාවක් E-BMD දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත. | එම කටයුතු මේ දක්වාම යාවත්කාලීන වී නොමැත. |
| 4. | ඉ-ලැන්ඩ් ව්‍යාපෘතිය යටතේ ඩිජිටල් ක්‍රමවේදයක් තුළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයන්හි සියළුම පත්ඉරු හා ඔප්පු පිටපත් පරිලෝකනය කිරීම හා ඒ ආශ්‍රයෙන් පිටපත් නිකුත් කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, ඔප්පු පිටපත් පරිලෝකනය නොකළ අතර පරිලෝකනය නොකළ පත්ඉරු ප්‍රමාණය මිලියන 25කට ආසන්න විය. | අපේක්ෂිත ඉලක්කයන්ට ලඟා නොවීම කෙරෙහි බලපා ඇති හේතු සොයාබලා අවශ්‍ය පිළියම් යෙදිය යුතු වීම. | පත්ඉරු ලියාපදිංචියට මුලදී ප්‍රතිපාදන වෙන් කලද මෙම ඉ-ලැන්ඩ් මෘදුකාංගයේ ඒ සඳහා අවස්ථා නොමැත. එබැවින් සිදු කර නැත. | මේ දක්වාම එම කටයුතු සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබූ ඉඩම් හා ගොඩනැඟිලි 15ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමටත්, දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැඟිලි දේපල 09ක වටිනාකම ගණනය කර ස්ථාවර වත්කම් ලේඛනයට හා ගිණුම්වලට ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැඟිලිවල අයිතිය පවරා ගැනීමට එම දේපල ස්ථාවර වත්කම් ලේඛනයට හා ගිණුම්වලට ඇතුළත් කිරීමටත් කටයුතු කළ යුතු වීම. | මෙම දේපළවලට අදාළව වටිනාකම් ගණනය කිරීම සිදු කරමින් පවතී. | 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි 15න් 12ක අයිතිය දෙපාර්තමේන්තුව විසින් අත්පත් කර ගැනීම අවසන් කර ඇත. මේ දක්වා වටිනාකම් ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | **2019** | | | |
| 6. | 2019 වර්ෂයේදී මුදල් රෙගුලාසි 206 (අ) විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 08ක රු.7,286,699ක් වූ ඉතිරි කිරීම් ඉක්මවා රු.10,531,218ක බැරකම් ඇති කර ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉතිරි කිරීම් නොඉක්මවා බැරකම් ඇති කරගත යුතු බව. | බැඳීම් ලේඛනය නඩත්තු කරමින් ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇති කර ගැනීම වැළැක්වීම සඳහා කටයුතු කරමින් පවතී. | 2020 හා 2021 වර්ෂවලදීද ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇති කරගෙන ඇත. |
| 7. | e-Land Registry ව්‍යාපෘතිය මඟින්, පියවර 09ක් හා දින 51ක් ගතවන දේපල ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය දින 05ක් හා පියවර 02ක් දක්වා අඩු කර ගැනීමට බලාපොරොත්තු විය. එමගින් ව්‍යාපාරකරණය පහසු කිරීමේ දර්ශකයේ (Ease of Doing Business Index) උප දර්ශකයක් වන දේපල ලියාපදිංචි කිරීමේ දර්ශකය ඉහල නංවා ගනිමින් රටේ ආර්ථික කාර්යසාධනය හා ආයෝජන වාතාවරණය වඩා යහපත් කිරීම අපේක්ෂා කරනු ලැබීය. එසේවුවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ඉඩම් රෙජිස්ට්‍රාර් | අදාළ ගැටළු හඳුනා ගනිමින් e-Land Registry ව්‍යාපෘතිය සංවර්ධනය කර ව්‍යාපාරකරණය පහසු කිරීමේ දර්ශකයේ ශ්‍රී ලංකාවේ තත්ත්වය ඉහල නංවා ගත යුතු බව. | මෘදුකාංගයේ දෝෂයන් දැනට පරීක්ෂා කරමින් පවතී. | මෘදුකාංගය දෝෂ සහිත බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාල 20ක තොරතුරු තාක්ෂණ වැඩසටහන් සඳහා නිසි සැලසුම්ගත වැඩපිළිවෙලක් නොතිබීම, තාක්ෂණික දැනුම ඇති නිලධාරීන් නොමැතිවීම, මෘදුකාංගය දෝෂ සහිත වීම ආදී හේතූන් නිසා සාර්ථකව ක්‍රියාත්මක නොවීය. තවද, ඉතිරි ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 25 හි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | | | |
| 8. | දෙපාර්තමේන්තුවකින් හා අමාත්‍යාංශයකින් වාහන 20ක් ලැබී තිබුණි. එසේ වුවද, රියදුරන් නොමැති වීම හා දෙපාර්තමේන්තුවට පවරා ගෙන නොමැති වීම හේතුවෙන් ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබා ගැනීමට නොහැකිව එම වාහන නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් කාර්යක්ෂමව පරිහරණය කළ යුතු බව. | ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබා ගැනීමට කටයුතු කර ඇත. | පවරා ගැනීමේ කටයුතු සිදුකර නොමැත. |
| 9. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 04ක 2016-2019 වර්ෂ අතර කාලය තුළ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ ඔප්පු 1,421ක් හා අඩුපාඩු හේතුවෙන් ලියාපදිංචි කළ නොහැකි වූ ඔප්පු 6,895ක් සම්බන්ධයෙන් නොතාරිස්වරුන්ට දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | නොතාරිස්වරුන්ට දැනුවත් කර සියළු කටයුතු නිසි පරිදි සිදු කළ යුතු බව. | හෝමාගම සහ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල 2016 සිට 2019 වර්ෂ දක්වා ප්‍රතික්ෂේපිත ඔප්පු හා ලියාපදිංචි කළ නොහැකි වූ ඔප්පු සම්බන්ධයෙන් කටයුතු අවසන් කර ඇත. | ඉඩම් රෙජිස්ටාර් කාර්යාල 2 ක කටයුතු නිම කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | **2020** | | | |
| 10. | 2020 වර්ෂයට අදාළව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 26ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 65ක මාසික ආදායම් සාරාංශ වාර්තා ලබා දී නොතිබුණු බැවින් රු.1,399,877,263ක් වූ ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම විගණනයේදී සනාථ කරගත නොහැකි විය. | ආදායම් වාර්තා ලබා ගැනීම හා සැසඳීම නිසි පරිදි සිදු කිරීම. | දෙපාර්තමේන්තු වේ ශාඛා කාර්යාල 403 ක් පැවතීමත් ඒ අනුව දෛනිකව, මාසිකව හා ත්‍රෛවාර්ෂිකව අදාළ වාර්තා ලැබීම අධීක්ෂණය කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් සමහර වාර්තා විද්‍යුත් තැපැල හරහා ගෙන්වා ගැනීමටත්, සමහර වාර්තා පද්ධතිය මඟින් ගෙන්වා ගැනීමටත් කටයුතු කරමින් පවතී. | මේ දක්වා පද්ධතිය ක්‍රියාත්මක නොවන අතර අදාල වාර්තා ලබා ගැනීම එමඟින් සිදුවී නොමැත. |
| 11. | සමාලෝචිත වර්ෂයේ නොතාරිස්වරුන්ට මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ආදායම භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන හා මූලා‍ය ප්‍රකාශන අනුව රු.4,813,77ක් වූ අතර, දෙපාර්තමේන්තුව මගින් රැස් කරන ලද රු.672,000කින් හා මහාධිකරණ වලින් රැස් කරනු ලැබූ රු.4,141,771කින් එම අගය සමන්විත වුවද මහාධිකරණ වලින් නිකුත් කරන සහතික පිළිබඳ තොරතුරු වාර්තා හඳුනා ගැනීමට නිසි ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණු බැවින් එම ආදායම විගණනයේදී | ආදායම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන යාම. | ශ්‍රේෂ්ඨාධිකරණ යෙන්, අධිකරණ අමාත්‍යාංශයෙන් ගිණුම් සාරාංශවලට ඇතුලත් කරන වාර්තා මාසිකව ගෙන අධිකරණ කලාපවල ආදායම් වාර්තා සමඟ සැසඳීම කරයි. | වර්තමානයේද එම වාර්තා නිවැරදිව නොසැසඳේ. |

| | | | | |
|---|---|---|---|---|
| | සනාථ කරගත නොහැකි විය. | | | |
| 12. | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ලියාපදිංචි ආදායම රු.858,103,568ක් වුවද ඒ තුළ ඇතුළත් හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම්, උධෘත පිටපත් ගාස්තු, ඇටෝර්නි බලපත්‍ර ගාස්තු ඇතුළු අනෙකුත් ලියාපදිංචි කිරීමේ ආදායම් වෙන වෙනම හඳුනා ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ආදායම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන යාම. | විද්‍යුත් තැපැල මඟින් දැනට වාර්තා ගෙන්වා ගනී. පරිගණක පද්ධතිය මඟින් වාර්තා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | පරිගණක පද්ධතිය මඟින් මේ දක්වා වාර්තා ලබා ගැනීමට හැකි වී නැත. |
| 13. | සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ ආදායම රු.24,896,693ක් හා වර්ෂය තුළ හිඟ හිටි රු.3,137,710 ක් වශයෙන් එකතුව රු.28,034,403 ක් වූ මුළු හිඟ ආදායමෙන් වර්ෂය තුළ අයකර ගැනීම් රු.1,311,326ක් හෙවත් සියයට 4.7 ක් පමණක් වීමෙන් වර්ෂය අවසානයට හිඟ ආදායම රු.26,723,078ක් විය. | හිඟ ආදායම් නිවැරදිව ගිණුම් ගත කිරීම. | හිඟ ආදායම් පරීක්ෂා කරමින් පවතී. | හිඟ ආදායම් වාර්තා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලයට එවා ඇතත් එහි නිවරදිතාවය සනාථ කරගෙන නොමැති බැවින් ගිණුම් ගත කර නැත. |
| 14. | 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව 2020 වර්ෂයේදී මිලදී ගත් එකතුව රු.29,893,331ක හා මාරු කිරීම් මඟින් ලැබුණු රු.65,645,139ක් වටිනා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරිම. | කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත අදාල වාර්තා යවමින් පවතී. | මේ දක්වා අදාල වාර්තා කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යවා නැත. 2018 වර්ෂයේද මෙම නිරීක්ෂණය යොමු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 15. | 2020 වර්ෂයේ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් 'බී' ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මියයාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම, සේවය අතහැර යාම හා සේවයෙන් පහ කිරීම යන කාරණා මත නිලධාරින් 51 දෙනෙකුගෙන් වසර 1 සිට වසර 29 දක්වා අයවීම් හිඟහිටි මුළු ශේෂය රු.3,239,780ක් විය. | ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව ණය අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | මේ දක්වා රු.767,899ක් අය කර ගෙන ඇත. එසේම තවත් කොටසක් කපා හැර ඇත. | තවදුරටත් රු.2,740,514ක ප්‍රමාණයක් අයකර ගැනීමට ඉතිරිව ඇත. |
| 16. | 2006 වර්ෂයේදී මිලදී ගත් අංක PB 4896 හා අංක PB 4888 දරන වාහන දෙක 2018 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොමැති අතර එම වාහන ධාවනය කල නොහැකි තත්ත්වයේ පවතින බව දෙපාර්තමේන්තු වාර්තා අනුව සඳහන් වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම වාහන අපහරණය සඳහා පියවර ගෙන නොතිබුණි. | වාහන පරිපාලනය විධිමත් කිරීම. | අළුත්වැඩියා කිරීම හෝ අපහරණය සිදුකර නැත. | අළුත්වැඩියා කිරීම හෝ අපහරණය සිදුකර නැත. |
| 17. | දෙපාර්තමේන්තුවේ තෘතියික, ද්විතීයික හා ප්‍රාථමික මට්ටම්වල තනතුරු 241ක් ද සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩු වී තිබුණි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයට සෘජුවම සම්බන්ධ වන ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්ගේ පුරප්පාඩු 30ක් ද මෙහි ඇතුලත් වී තිබුණි. | මානව සම්පත් කළමණාකරණය විධිමත් කිරීම. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඉල්ලීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අවස්ථා කිහිපයකදීම ඉදිරිපත් කර ඇත. | අදාල පුරප්පාඩු පිරවීම සිදුකර නැත. |

ශීර්ෂ 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | ගොවි බැංකු මගින් ගොවීන්ට ලබාදුන් ණය නොගෙවීම මත අධිකරණයේ නඩු පැවරීමෙන් රු.1,508,527 ක ණය මුදලක් අය කරගෙන තිබුණු අතර එම ණය මුදල අදාළ ගොවි බැංකුවලට ලබා නොදී අම්පාර හා ගාල්ල දිස්ත්‍රික් කාර්යාලවල පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | අය කළ බැංකු ණය අදාළ ගොවි බැංකුවලට ලබාදිය යුතුය. | ගොවි බැංකු වෙත දන්වා ඇති අතර මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් නොමැති බැවින් එම මුදල පොදු තැන්පත් ලේඛනයේ ශේෂව පවතින බව ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් දැනුම් දී ඇත. 2015 සිට 2017 වර්ෂය දක්වා වූ රු. 586,276 ක මුදල සම්බන්ධයෙන් අම්පාර දිස්ත්‍රික් කාර්යාලය විසින් පරීක්ෂා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | අදාල ණය මුදල ගොවි බැංකුවලට ලබාදීමේ කටයුතු මේ දක්වා සිදුවී නොමැත. |
| 2. | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක 118-2-3-37-2506 දරන වැය විෂය යටතේ 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් වැව් 80 ක් හා අමුණු 100 ක් අලුත්වැඩියා කිරීම සඳහා රු. 200,000,000 ක් වෙන් කර තිබුණු නමුත් වැව් හා අමුණු සංවර්ධනය සිදු නොකර එම ප්‍රතිපාදනයෙන් රු. 196,857,957 ක් 2018 වර්ෂයට අදාල කොන්ත්‍රාත් ගෙවීම් සඳහා යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන අදාළ කාර්යයට පමණක් උපයෝජනය කළ යුතුය. | දැනට මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු යොදා ඇත. | යෝජිත වැව් 80 සහ අමුණු 100 මේ දක්වා අලුත්වැඩියා කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 3. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වැව් දහසයි ගම් දහසයි වැඩසටහන යටතේ වැව් 100 ක් හා අමුණු 100 ක් අලුත්වැඩියා කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක 118-2-3-40-2506 දරන වැය විෂය යටතේ රු. 700,000,000 ක් වෙන් කර තිබුණු නමුත් එම වැව් හා අමුණු අලුත්වැඩියාව සිදු නොකර එම ප්‍රතිපාදනයෙන් රු. 609,642,901 ක් 2018 වර්ෂයට අදාල කොන්ත්‍රාත් ගෙවීම් සඳහා යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා පමණක් උපයෝජනය කළ යුතුය. | දැනට මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු යොදා ඇත. | යෝජිත වැව් හා අමුණු අලුත්වැඩියාව මේ දක්වා සිදුකර නොතිබුණි |
| 4. | මූලික විමර්ශන 62 ක් සඳහා වාර්තා කැඳවා ඇතත් ඒ සඳහා මාස 06 සිට වර්ෂ 09 ක කාලයක් ගත වී තිබුණද වාර්තා ලැබී නොතිබුණි. තවද විධිමත් විනය පරීක්ෂණ 97 ක් පවත්වා වාර්තා ලබාගැනීම හා විනය නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 02 සිට 08 දක්වා කාල පරාසයක් ගතකර තිබුණි. | අසාමාන්‍ය ප්‍රමාදයක් නිරීක්ෂණය වන හෙයින් නොපමාව සියලු පරීක්ෂණ අවසන් කිරීමට සැලසුම් කළ යුතුය. | මෙහි දක්වා ඇති මූලික විමර්ශන අතුරින් ලිපිගොනු 07 ක මූලික විමර්ශන වාර්තා මේ වන විට ලැබී ඉදිරි කටයුතු කරමින් පවතී. ප්‍රමාද වී ඇති අනෙකුත් වාර්තා කඩිනමින් ගෙන්වා ගැනීම සඳහා කටයුතු කරන බව දැනුම් දී ඇත. | මූලික විමර්ශන සිදුකිරීම සඳහා දෙපාර්තමේන්තුවෙන් පිටත නිලධාරීන් පත් කරගැනීම සඳහා සංචිතයක් ගොඩනගා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| 5. | 2018, 2019, හා 2020 වර්ෂ 03 හිම දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගිණුමක ලැබීම්වල රු. 652,148 ක වෙනසක් නිරීක්ෂණය විය | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව පොදු තැන්පත් ශේෂ සැසඳිය යුතුය. | වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වෙනස සොයා ගෙන නිරවුල් කර නොතිබුණි. |
| 6. | දෙපාර්තමේන්තුව යටතේ පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන 520 ක, යාන්ත්‍රික අංගන 05 ක සහ ප්‍රධාන කාර්යාලයේ ඉඩම්, මූල්‍ය නොවන වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවට අයත් සියලු ඉඩම් ගිණුම්ගත කළ යුතුය. | නිරීක්ෂණය පිළිබඳ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අවධානය යොමු වී ඇත. | ඉඩම් පිළිබඳව තොරතුරු රැස්කිරීම වත්කම් තක්සේරුව වත්කම් ලේඛනගත කිරීම හා ගිණුම් කිරීම මේ දක්වා සිදු කර |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නොතිබුණි. |
| 7. | දෙපාර්තමේන්තුව සතු ගොවිජන සේවා මධ්‍යස්ථාන 408 ක, යාන්ත්‍රික අංගන 03 ක හා ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 03 පොහොර ගබඩා 519 ක්, සංචාරක බංගලා 06 ක්, නිල නිවාස 152 ක්, බොජුන්හල් 20 ක් හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවට අයත් සියලු ගොඩනැගිලි ගිණුම්ගත කළ යුතුය. | නිරීක්ෂණය පිළිබඳ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අවධානය යොමු වී ඇත. | අදාල කටයුතු සිදුකිරීමේ ප්‍රගතිය ඉතා අඩු මට්ටමක පැවතුණි. |
| 8. | මු.රෙ. 94(1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තු මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් මූලධන වැය විෂයයන් 03 ක ඉතිරි වීම් ඉක්මවා රු. 1,390,244 ක බැරකම්වලට එළඹී තිබුණු බව නිරීක්ෂණය විය. | ඉතිරි වීම් ඉක්මවා වියදමකට හෝ බැඳීමකට නොඑළඹිය යුතුයි. | නැවත මෙවැනි වැරදීම් සිදුවීම වැළැක්වීමට පියවර ගෙන ඇත. | 2021 වර්ෂයේදී අදාළ බැරකම් පියවා තිබුණි. |
| 9. | **හෙළ සුවය නියමු ව්‍යාපෘතිය**<br>--------------------------------<br>2020 වර්ෂයේදී වස විසෙන් තොර පාරම්පරික වී ප්‍රභේද යොදා ගනිමින් අක්කර 10,000 ක් වගාකර වී කිලෝ ග්‍රෑම් 18,000,000 ක් අස්වැන්නක් ලබා ගැනීම අරමුණු ඇති මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය විසින් රු. 82,600,000 ක් රාජාංගනය වම් ඉවුර ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබා දී තිබුණි. එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන කුඹුරු අක්කර 3,152 ක් වගාකර වී කිලෝ ග්‍රෑම් 1,974,350 ක අස්වැන්නක් ලබාගෙන තිබුණු අතර එය අපේක්ෂිත අස්වැන්නෙන් සියයට 11 ක ප්‍රමාණයක් | ව්‍යාපෘති මනාව සැලසුම් කිරීම සහ අධීක්ෂණය සිදු කළ යුතුය. | කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් ප්‍රකාරව හෙළ සුවය ඖෂධය සම්බන්ධයෙන් පරීක්ෂණයන් පැවැත්වෙමින් පවතී. | මේ දක්වා තීරණයක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | බව නිරීක්ෂණය වූ අතර ඉහත වගාව සඳහා බිත්තර වී කිලෝ ග්‍රෑම් 181,641 ක් මිලදී ගෙන තිබුණු අතර එයින් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගත් බිත්තර වී කිලෝ ග්‍රෑම් 57,865 ක් පැවති බව නිරීක්ෂණය විය. දියර පොහොර මිලදී ගැනීම සඳහා "හෙළ සුවය" නම් පෞද්ගලික ආයතනයකින් ඖෂධ දියර පොහොර ලීටර් 18,056 ක් ලබාගැනීම වෙනුවෙන් රු. 15,500,000 ක් ගෙවිය යුතුව තිබුණි. | | | |
| 10. | වැඩ තහනම් කළ, සේවය හැර ගිය, මිය ගිය, විශ්‍රාම ගිය හා පලාත් සභා සඳහා මාරු වී ගිය නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ඉක්මවූ අයවිය යුතු ණය ශේෂය රු. 8,990,002 ක් විය. | ඇපකරුවන්ගෙන්, විශ්‍රාම වැටුපෙන්, විනය ක්‍රියාමාර්ග මගින් වගකීම පැහැර හැරි අයගෙන් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් අනුගමනය කර අයකර ගැනීම කළ යුතුය. | 2022 වර්ෂය තුළදී විධිමත් සැලැස්මක් යටතේ දීර්ඝකාලීනව පවතින ණය ශේෂ නිරවුල් කිරීමට වැඩ පිළිවෙලක් යෙදා ඇත. | මේ දක්වා ශේෂ නිරවුල් කළ බව වාර්තා කර නොමැත. |
| 11. | **තැන්පතු**<br>--------- | | | |
| (අ) | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සියයට 50 දායකයක් අයකර ගැනීමේ පදනම යටතේ ගොවීන් වෙත බෙදා දී තිබූ කෘෂි උපකරණ වෙනුවෙන් මොනරාගල ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් 2019 හා 2020 වර්ෂවලදී අය කළ රු. 1,132,000 ක මුදල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාළ මුදල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රේෂණය කළ යුතුය. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු යොදා ඇති අතර නැවත මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට කටයුතු කරමි. | මේ දක්වා නිරවුල් කර නොමැත. |
| (ආ) | අම්පාර දිස්ත්‍රික් කාර්යාලයට රබර් පැළ නැවත වගා කිරීම වෙනුවෙන් 2020 වර්ෂයේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු. 1,097,292 ක මුදල අදාළ කාර්යයට නොයොදවා පොදු තැන්පත් ගිණුමේ | වෙනත් ආයතන වලින් ලැබුණු මුදල් අදාළ කාර්යයට යෙදවිය යුතුය | අදාළ ව්‍යාපෘතියේ අවසාන බිල්පත මේ වන විට සකස් කරමින් පවතින අතර එය ලද වහාම බිල්පත ගෙවා | මේ දක්වා නිරවුල් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | රඳවාගෙන තිබුණි. | | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | |
| 12. | **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**<br>**-----------------------------------------** | | | |
| (අ) | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් (සංශෝධිත) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 51(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන සභා පිහිටුවා නොතිබුණි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දැනට නියෝග සකසා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. ලැබුණු විගස ගැසට්පත්‍රය නිකුත් කිරීමට නියමිතය. | මේ දක්වා ගොවිජන සංවර්ධන සභා පිහිටුවා නොමැත. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත ප්‍රකාරව එල්ලංගා ව්‍යාපෘතියට අනුයුක්ත තාවකාලික නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකරනු ලබන සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා වූ වාරික මුදල වන රු .1,585,415 ක මුදලක් පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ වාරික ගෙවීම සඳහා සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ මෙම තාවකාලික නිලධාරීන්ගේ ලියාපදිංචි අංක නොමැති බැවින් අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වී ඇත. | මේ දක්වා සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ වාරික නිරවුල් කර නොතිබුණි |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (i) අංක දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීමට අදාළ තොරතුරු එක්රැස් කරමින් පවතී. | මේ දක්වා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර නොමැත. |
| (ඈ) | 2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරි වර්ෂ 10 ක (2021-2031) සඳහා මානව සම්පත් සංවර්ධන | මේ දක්වා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සැලැස්මක් පිළියෙල කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී. | |
| 13. | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල 17 ක් විසින් දිස්ත්‍රික්කවලට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 339 කින් එකතුව රු. 76,350,549 ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබාගෙන තිබුණත් එම මුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර බැරකම්වලටද ඇතුළත් කර නොතිබුණි. | ගොවිජන සේවා කාරක සභා පනත යටතේ පිහිටවූ ස්වාධීන ආයතනයක් වන බැවින් දිස්ත්‍රික් කාර්යාල විසින් ලබාගත් රු. 76,350,549 ක මුදල ආපසු එම ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ප්‍රතිපූර්ණය කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | වර්තමානයේදීද එම ශේෂ එසේම පවතී. |
| 14. | සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප හා බිංදු ජල තාක්ෂණය යොදා ගැනීම සඳහා 2005 – 2008 වර්ෂවලදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත රු. 2,327,272,272 ක ප්‍රතිපාදන මඟින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 19 කට සූර්යබල ජල සූක්ෂම පද්ධති 7,231 ක් ලබා දී තිබුණි. 2018 වර්ෂය අවසන් වන විට මෙම සියලුම මුදල් අයකර අවසන් කළ යුතු වුවද රු. 2,264,753,696 ක් 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට ගෙවිය යුතුව පැවතුණි. පද්ධතිවලින් සියයට 90 ක් අස්ථානගතව, අභාවිතව, ගොවීන්ගේ තොරතුරු සොයාගත නොහැකිව සහ අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය. | ගිවිසුම් අනුව සියලුම මුදල් කඩිනමින් අයකර අවසන් කළ යුතුය | මෙම පද්ධති ස්ථාපනය කර ඇත්තේ ෆෝසයිට් ඉංජිනේරියන් සමාගමේ එවකට සිටි තාක්ෂණික නිලධාරීන් විසින් වන අතර ඔවුන්ගේ ජීව දත්ත පිළිබඳ නිවැරදි තොරතුරු දිස්ත්‍රික් කාර්යාලවට ලබා දී නොමැති බව දිස්ත්‍රික් කාර්යාල දන්වා ඇත. ගිවිසුම් පත්‍රය අනුව මුදල් ගෙවීම පැහැර හැරීමකදී සූර්ය බල ජල සූක්ෂම පද්ධති අත්පත් කරගන්නා බව දන්වා තිබුණද එහිදී අනුගමනය කළ යුතු කාර්යය | අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැත. අදාල හිඟ මුදල් අය කරගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පටිපාටිය පිළිබඳ පැහැදිලි උපදෙසක් ලබාදී නොතිබුණි. තවද ගිවිසුම් නොමැතිව සූර්ය බල ජල සූක්ෂම පද්ධති ලබා දී තිබීම. මූලික තැන්පත් මුදල පිළිබඳවද නිශ්චිත වටිනාකමක් සඳහන් නොවීම. ගිවිසුම් පත්‍රයේ පවතින අඩුපාඩු නිසා මුදල් නියමිත පරිදි අයකර ගැනීමේ ගැටළු මතු වී ඇත. තවද කෘෂිකර්ම අමාත්‍යාංශය හා ෆෝ සයිට් ඉංජිනේරු සමාගම සමග ආරම්භක අවස්ථාවේ සිට මනා සම්බන්ධිකරණයක් සිදුවී නොතිබීම නිසා මුදල් නියමිත පරිදි අයකර ගැනීමේ ගැටලු මතුවීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවී ඇත. | |
| 15. | **වත්කම් කළමනාකරණය**<br>**--------------------------** | | | |
| (අ) | ලෝක ආහාර ව්‍යාපෘතියෙන් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ CR– 0098 දරන ජීප් රථය 2015 | CR– 0098 දරන ජීප් රථය ලියාපදිංචි කර ධාවනයට ගත යුතුය. | අංක CR- 0098 දරන ජීප් රථය මෝටර් රථ ප්‍රවාහන | මේ දක්වා ලියාපදිංචිය කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේ ලියාපදිංචිය සිදුකර භාවිතයට ගත හැකිව තිබූ නමුත් එම වර්ෂයේ සිටම මාලඹේ රථවාහන අංගනයේ ගාල් කර තිබුණි. | | දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් මගින් තීරු බදු ගාස්තු නිදහස් කිරීමට ක්‍රියා කළද එය සාර්ථක නොවුණි. මෙය ඉතා පැරණි රථයක් බැවින් ගෙවිය යුතු මුළු රේගු ගාස්තු ගණනය කර දන්වන ලෙස රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් රේගු අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා විධිමත් පිළිතුරක් ලද පසු රථය ලියාපදිංචි කිරීමට කටයුතු කරමි. | |
| (ආ) | 1977 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූකාල සීමාව තුළ පොහොර ගබඩා 17 ක් අභාවිතව පැවතුණි. | පොහොර ගබඩා ක්‍රියාකාරී තත්ත්වයට ගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 වර්ෂයේ පෙබරවාරි මාසය වන විටත් පොහොර ගබඩා 17 අභාවිතව පැවතුණි. |
| (ඇ) | 2020 සැප්තැම්බර් 24 දින දක්වා මහව යන්ත්‍රාගාරයේ පැවති ක්‍රියාකාරී තත්ත්වයේ පවතින DAS 91, DAS 55, DAS 97 හා DAS 86 අංක දරන යන්ත්‍ර සේවයේ යොදවා නොතිබුණි. තවද 2018, 2019 වර්ෂවලද සේවයේ යෙදවීම අවම මට්ටමක පැවතුණි. 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබූ DAS 69 අංක දරන පස් තලන රෝලර් යන්ත්‍රය ගත් දින සිට සේවයේ යොදවා නොතිබුණි. | සියලුම වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි මාසය දක්වාම මෙම යන්ත්‍ර සේවයේ යෙදවීම අවම මට්ටමක පවතින අතර DAS – 69 යන්ත්‍රයද සේවයේ යොදවා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 16. | **කළමනාකරණ දූර්වලතා**<br>**-------------------------** | | | |
| (අ) | දෙපාර්තමේන්තුවේ පාඩු හා හානි ලේඛනයේ වර්ෂ 17 ක කාල සීමාවක සිට පැවත එන රු. 2,026,502 ක පරීක්ෂණ පවත්වා නිරවුල් නොකළ අලාභ ශේෂයක් පැවතුණි. | පාඩු හා හානි සම්බන්ධව පවත්නා අසාමාන්‍ය ප්‍රමාදය වළක්වා ගැනීම සහ සිදුව ඇති අලාභය වහාම අයකර ගත යුතුය. | අදාළ කටයුතු සිදු කරමින් පවතී. | පරීක්ෂණ පවත්වා අලාභ අයකර ගෙන නැත. |
| (ආ) | 2014 සිට 2019 දක්වා මු.රෙ. 104 යටතේ සිදුකරන ලද පරීක්ෂණවලට අනුව නිලධාරීන් 39 කගෙන් අයවිය යුතු රු. 11,228,726 ක මුදල 2020 දෙසැම්බර් 31 දින වන විටත් අය කරගෙන නොතිබුණි. | අසාමාන්‍ය ප්‍රමාදයක් නිරීක්ෂණය වන හෙයින් නොපමාව සියලු පරීක්ෂණ අවසන් කිරීමට සැලසුම් කළ යුතුය. | අදාළ මුදල මේ වන විට අයකර ගනිමින් පවතී. | මේ දක්වා මුළු මුදල අයකර ගෙන නැත. |
| (ඇ) | 2015/2016 වර්ෂවලදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සඳහා බඩඉරිඟු වගා කිරීම වෙනුවෙන් ගොවීන් 5,386 කට මාස 06 කින් අයකර ගැනීමේ පදනමින් රු. 80,790,000 ක් ලබා දී තිබුණු අතර වර්ෂ 04 ක් ගතවී තිබුණද තවදුරටත් අයවිය යුතු මුදල රු. 25,976,053 ක් විය. | කඩිනමින් ණය අයකර ගත යුතුය. | මේ වන විට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු. 22,988,604 ක් වන අතර මෙම ණය ශේෂය අයකර ගැනීම සඳහා ගොවිජන විනිශ්චය සභා වෙත යොමුකර ඇත. | මේ දක්වා මුදල් අයකර ගෙන නොමැත. |
| (ඇ) | 2019/2020 වර්ෂවලදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සඳහා බඩඉරිඟු වගා කිරීම වෙනුවෙන් ගොවීන් 4,200 කට මාස 06 කින් අයකර ගැනීමේ පදනමින් රු. 46,200,000 ක මුදලක් ලබා දී තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විට අය නොවූ මුදල රු. 1,801,000 ක් විය. | අඛණ්ඩව පසු විපරම් කර ණය අයකර ගත යුතුය. | තවදුරටත් රු. 1,026,000 ක මුදලක් අයවීමට ඇත. | මේ දක්වා සම්පූර්ණ මුදලම අයවී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික්ක 05 ක සාරලංකා ණය ව්‍යාපෘතිය යටතේ ගොවීන් 33 කට ලබා දී තිබූ රු. 14,800,000 ක ණය මුදලින් රු. 11,285,972 ක් තවදුරටත් අයවිය යුතු අතර මෙම ණය අයවීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. | අඛණ්ඩව පසු විපරම් කර ණය අයකර ගත යුතුය. | ණයගැති ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මේ දක්වා ණය ශේෂ අය කරගෙන නොමැත. |
| (ඊ) | දිස්ත්‍රික් කාර්යාල 16 ක ගොවි බැංකු මඟින් ලබා දී ඇති වර්ෂ 6 සිට 20 දක්වා කාලයක සිට පැවත එන රු. 286,664,393 ක අය නොවන ගොවි ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රමාද වූ ණය මුදල් කඩිනමින් අයකර ගත යුතුය. | ණයගැති ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මේ දක්වා ණය ශේෂ අය කරගෙන නොමැත. |
| (උ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 413 ක 2019 දෙසැම්බර් 31 දිනට සකස් කළ මූල්‍ය ප්‍රකාශන අනුව දීර්ඝ කාලයක සිට පැවත එන රු. 527,262,332 ක වටිනාකමැති අයවිය යුතු සේවක ණය, කෘෂිකාර්මික භාණ්ඩ ණය, ව්‍යාපෘති ණය යනාදී ශේෂ 4,366 ක් පැවතුණි. | ණයගැති ශේෂ නොපමාව අයකර ගත යුතුය. | ණයගැති ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මේ දක්වා ණය ශේෂ අය කරගෙන නොමැත. |

ශීර්ෂ 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

| විගණන නිරික්ෂණ<br>---------------------- | | විගණකාධිපතිගේ නිර්දේශය<br>---------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමර්ග<br>----------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>-------------------- |
|---|---|---|---|---|
| 1. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් පමණක් දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසියම් වියදමකට හෝ බැදීමකට හෝ එළඹිය හැකි වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත ප්‍රතිපාදන ඉක්මවා රු.1,028,428,600 ක බැදීම් ඇති කර ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 94(3) විලම්භීත බැරකම් සඳහා එළඹීමේදී මුදල් රෙගුලාසි 447(5) ප්‍රකාරව ගිණුම් හා වාර්තා සකස් කිරීම කළ යුතුය. | මධ්‍යකාලින අයවැය රාමුව තුල ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල වැඩ කටයුතු වාර්ෂික ප්‍රතිපාදන සීමාව තුල පමණක් කටයුතු කරමින් අත්හිටවිය නොහැකි බැවින් වැඩසටහන් 3 හා 4 යටතේ ක්‍රියාත්මක එබඳු ව්‍යාපෘති හැරුණු විට අනෙකුත් වැය විෂයන් සඳහා නිදහස්කර ඇති ප්‍රතිපාදන සීමාව තුල පමණක් කටයුතු කරන ලෙසට සියලුම වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරුන් දැනුවත් කර ඇත. | ප්‍රතිපාදන ඉක්මවා බැදීම් ඇතිකරගෙන තිබුණි. |
| 2. | දෙපාර්තමේන්තුවට අයත් වෙනත් පුද්ගලයින් විසින් අත්පත් කර ගෙන ඇති නිල නිවාස 11 ක අනවසර පදිංචිකරුවන් ඉවත්කර එම නිවාසවල සන්තකය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 9 වන වගන්තිය ප්‍රකාරව ආපසු ලබාගැනීමට කටයුතු කර | නිල නිවාසවවල පදිංචිව සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඒවායේ සන්නතකය දෙපාර්තමේන්තුවට පවරා ගත යුතුය. | කටයුතු කරමින් පවතී. | අනවසරයෙන් පදිංචි නිවාස 25ක් වන අතර මේ වන විට බොහෝමයක් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. | | | |
| 3. | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති ප්‍රකාරව ලබා ගත් ණය සම්පූර්ණයෙන් අය කර ගැනීමට පෙර නිලධාරියෙකු මිය ගියහොත් ඔහුගෙන් රජයට අය විය යුතුව තිබෙන සියළුම ණය මුදල් ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට තිබෙන ඕනෑම මුදලකින් අය කර ගන්නා ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වහාම ඉල්ලා සිටිය යුතු වුවත් රු.1,751,988 ක හිඟ හිටි ණය මුදලක් මිය ගිය නිලධාරින්ගෙන් අය කර ගෙන නොතිබුණි. | අයවිය යුතු ණය ශේෂ සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | විශ්‍රාම ගිය නිළධාරීන්ගේ අදාල ලිපිගොනු සකස් කිරිමේ කටයුතු කඩිනම් කිරිම. මරණ පාරිතෝෂික සැකසීම කඩිනම් කිරීමට කටයුතු කිරිම. | 2020/12/31 දිනට පවතින මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 1,751,988ක මුදලින් 2021/12/31 ට රු. 450301/-අයවී ඇත. |
| 4. | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති ප්‍රකාරව විශ්‍රාම ගොස් තිබු සේවකයන් 196 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.20,798,439 ක ණය ශේෂයක් අය විය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වැඩ තහනමට ලක් වූ නිලධාරීන්ගෙන්, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් හා සේවය අත්හිට වූ නිලධාරීන්ගෙන් අය විය යුතු රු.3,308,119 ක ණය මුදල් අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම ගිය අයගෙන් විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අනෙකුත් ණය, ඇපකරුවන්ගෙන් හෝ වෙනත් ක්‍රමවේදයකින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැඩතහනමට ලක් වූ, සේවය හැරගිය හා සේවය අත්හිටවු නිලධාරීන්ගේ ණය මුදල් ඇප කරුවන්ගෙන් අයකරමින් පවතී. ඇපකරුවන් නොමැති අයගේ ණය ශේෂ අයකර ගැනීම පිළබඳව නීතිමය උපදෙස් ඉල්ලා ඇත. | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු රු.20,798,439 ක ණය ශේෂයෙන් 2021/12/31 දිනට රු.14,393,658 අයවී ඇත. වැඩ තහනමට ලක්වූ/ සේවය හැර ගිය හා සේවය අත්හිටවූ අයගෙන් අයවිය යුතුව තිබූ රු.3,308,119 ක මුදලින් රු.432,987 ක මුදල් 2021/12.31 දිනට අයවී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | 1994 ජුනි 14 දිනැති අංක 23/94 දරන රාජ්‍ය පරිපාලන චක්රලේඛය ප්‍රකාරව වයස අවුරුදු 45 ඉක්මවා තිබියදී පත්වීම් ලබා දීම විධිමත් පත්වීමක් නොවන බව හා විශ්‍රාම වැටුප් හිමි නොවන බව දක්වා තිබියදී දෙපාර්තමේන්තුවේ වයස අවුරුදු 45 ඉක්මවූ සේවකයින් 302 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දී තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙබඳු බඳවා ගැනීම් සිදු කිරීම වලක්වා ගැනීමට පියවර ගෙන ඇත. | ව්‍යාජ බඳවාගැනීම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| 6. | කෙසෙල්ලන්ද වැවේ පිටවාන අළුත්වැඩියා කිරීම සඳහා 2017 වර්ෂයේ දී රු.4,000,000 ක ඇස්තමේන්තුවක් පිළියෙලකර ප්‍රතිපාදන ලබාගෙන තිබුණ ද විගණන දිනය වූ 2019 සැප්තැම්බර් 19 දින දක්වාම ඉදිකිරීම කටයුතු ආරම්භ කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතුය. | අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | මෙම සියළු කටයුතු නිවැරදි කිරීමට හා නිසි පරිදි සැළසුම් කටයුතු කිරීමට දැනුවත් කිරීම් හා අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත. නමුත් එම කටයුතු මේ දක්වා නිවැරදි වී නොතිබුණි. |
| 7. | මොනරාගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල කදවුරු භූමියට ඇතුල්වන ගේට්ටුව අසල කදවුරු භූමියේ කොටසක් භාහිර පුද්ගලයින් විසින් අත්පත් කරගෙන තිබුණු අතර ඉඩම අත්පත් කරගත් පුද්ගලයින් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග නොගෙන එම අත්පත් කරගත් ඉඩම් කොටස අතහැර දැල්වලින් ආවරණය වන වැටක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් | 1982 අංක 12 දරන පොදු දේපල විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිලිබඳ පනත අනුව කටයුතු කළ යුතුය. | ස්ථිර වැටක් ඉදිකිරීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | තවදුරටත් එම භූමිය ආක්‍රමණය කිරීම වැළැක්වීම සඳහා ස්ථිර වැටක් ඉදිකර ඇත. අනවසර පදිංචිකරුවන්ට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකර තිබුණි. | | | |
| 8. | වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් රු. 196,878,000 ක් වූ ව්‍යාපෘති 6 ක් අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රදේශයේ ගොවි ජනතාවට ලැබීම ප්‍රමාද වී තිබුණි. | ව්‍යාපෘතිය සැලසුම් කිරීම හා ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම නිසි කළමනාකරණයකින් යුතුව ඉටු කළ යුතුය. | අදාල අංශ දැනුවත් කිරීම හා උපදෙස් දීම. | මෙම සියළු කටයුතු නිවැරදි කිරීමට හා නිසි පරිදි සැළසුම් කටයුතු කිරීමට දැනුවත් කිරීම් හා අවශ්‍ය උපදෙස් ලබා දී ඇතත් ව්‍යාපෘති කටයුතු අවසන් කර නොතිබුණි. |
| 9. | වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය යටතේ උනගොල්ල ගෙවල්වල ඇළ ඉදිකිරීම් සඳහා රු.11,336,978 ක මුදල් නිදහස් කර දීර්ඝ කාලයක් ගත වී තිබුණ ද 2019 ජූලි දක්වා වැඩ නිමකර නොතිබුණි. | මනා සැලසුමකින් හා අධීක්ෂණයක් යටතේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය. | - එම - | - එම - |
| 10. | (අ) කෙසෙල්ලන්ද වැව් බැම්ම සකස් කිරීම සඳහා ප්‍රමාණ බිල්පත්‍ර අයිතම අංක 1.6 යටතේ රු.2,082,888 ක මුදලක් වෙන්කර ගෙන තිබුණි. වැව් බැම්මේ ආනතිය 1:3 අනුපාතයට සකස් කිරීම හා ප්‍රමිතියට පස් තැලීම (Compaction) කළයුතු වුවද ප්‍රමිතියෙන් තොරව පස් තැලීම (Compaction) සිදුකර තිබුණු අතර අදාළ Compaction වාර්තාවද ලබාගෙන නොතිබුණි. | - එම - | - එම - | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | (ආ)ඉහත ප්‍රතිසංස්කරණයට අදාල ප්‍රමාණ පත්‍රයේ අයිතම අංක 1.8 යටතේ වැව් බැම්මේ ඉහළ බැවුම් රළපනාව ඉදිකිරීම සඳහා රු.4,871,650 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. විගණන දිනය වූ 2019 සැප්තැම්බර් 19 දින දක්වාම එම රළපනාව ඉදිකර නොතිබුණි. | - එම - | - එම - | - එම - |
| | (ඇ)ඉහත වැව ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රමාණ බිල්පත්‍ර අයිතම 1.10 යටතේ වැව් බැම්ම නියමිත 1:3 ආනතියට සකස්කර නිසි පරිදි තණපිඩලි ඇල්ලීම සඳහා රු.854,762 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද එම කාර්ය ප්‍රමිතියට සිදු නොකිරීම නිසා වැව් බැම්ම විශාල ලෙස ඛාධනයට ලක් වී තිබුණි. | - එම - | 1. එම - | - එම - |
| 11. | ඇස්තමේන්තු පිරිවැය රු.39,999,000 ක් වූ නාච්චාදූව වැව් රක්ෂිතය තුළ වාරිමාර්ග කෞතුකාගාරයක් සහ පුහුණු ආයතන ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.30,811,025 ක් වැය කර තිබුණද, ඉදිකිරීම කටයුතු අවසන් කර නොතිබුණි. ගොඩනැගිල්ලේ මූලික සැලසුම් පලාත් පාලන ආයතන වෙතින් අනුමත කරවාගෙන නොතිබුණු අතර ගොඩනැගිල්ල ඉදිකිරීමේදී | ඇස්තමේන්තු අනුමත කර ගැනීමෙන් පසුව ඉදිකිරීම් ආරම්භ කළ යුතු අතර වත්කම් කාර්යක්ෂමව භාවිතා කළ යුතු වීම. | ව්‍යාපෘතියට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | නාච්චදූව රක්ෂිතය තුල ඉදිකරන කෞතුකාගාරය හා පුහුණු ආයතන ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පැවතුනද 2022 වර්ෂය සඳහා නව ගොඩනැගිලි යටතේ ප්‍රතිපාදන වෙන්කර නොමැති නිසා ඉදිකිරීම් කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | මූලික සැලස්මෙන් බැහැරව නිලධාරීන්ගේ අභිමතය පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. තවද අමතර පිරිවැය ඇස්තමේන්තු 02 ක් ඉදිරිපත් කර තිබුණ ද ඊට අනුමැතිය නොලැබීම හා ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නතර වී තිබුණි. එමෙන්ම මෙම ඉදිකිරීම වෙනුවෙන් 2014 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.3,962,121 ක් වූ අමුද්‍රව්‍ය හා සවි කිරීම් වර්ෂ 6 කට අධික කාලයක් භාවිත නොකිරීම නිසා විනාශ වෙමින් පැවතුණි. | | | ආරම්භ කර නොමැත. |
| | | | | |
| 12. | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ගම්පහ අත්තනගල්ල සහ මීනුවන්ගොඩ ඒක්බද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලෙස රු.මි.3,800 ක් බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 මාර්තු 21 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව වසර 03 කට වැඩි කාලයක් ගතව ඇතත් ව්‍යාපෘතිය ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 560 ක් වැයකර ව්‍යාපෘතියේ ජලනල එතීම හා අනෙකුත් කටයුතුවලින් සියයට 33 ක් පමණක් නිම | ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනවලට ව්‍යාපෘතිය නිම කිරීම සඳහා කටයුතු කළ යුතු අතර කාර්යය මණ්ඩලය පිළිබඳව සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම සහ ජලාශය ඉදිකිරීමේදී ප්‍රායෝගිකව ඇතිවන ගැටලු අවම වන පරිදි කටයුතු කිරීම. රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වින්දිතයන්ගේ ප්‍රතිලාභ ප්‍රමාණවත් නොවීමේ ගැටලුව නිසා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම | ඉඩම් අත්පත් කර ගැනීම් කටයුතු මෙම ව්‍යාපෘති කාර්යාලය මගින් සිදු කරන ලද අතර 2021 අප්‍රේල් මස ඉඩම් අත්පත් කිරීමේ කටයුතු නිමකර තිබූ අත්තනගල්ල කොටසේ වැඩ ආරම්භ කර ඇත. මේවන විට ජලාශයේ ඉදිකිරීම් කටයුතු මන්දගාමී ලෙස සිදු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කොට පැවතුණි. ජල මූලාශ්‍ර ඉදිකිරීම ප්‍රමාදවීම හේතුවෙන් එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට 2021 අප්‍රේල් දක්වාම නොහැකි වී තිබුණි. ව්‍යාපෘතියට කාර්ය මණ්ඩලය 27 ක් අනුමත කරගෙන තිබුණු අතර 18 දෙනෙකු බඳවාගෙන තිබුණි. 2019 ජූනි මස ජලාශයේ ඉදකිරීම් කටයුතු චීන සමාගමක් වෙත පවරා තිබුණද, කාර්ය මණ්ඩල අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනයකින් තොරව ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි. | | | |
| 13. | (අ) දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 1552 කින් නිල නිවාස 236 ක් භාවිතයට ගෙන නොතිබුණි. ඒ අතරින් නිවාස 109 ක් සම්පූර්ණයෙන් අබලන් තත්ත්වයේ පැවතුණි. අලුත්වැඩියා කර පදිංචියට සුදුසු ආකාරයට පත්කිරීමේ හැකියාව පවතින නිවාස 127 ක් විය. ඒවා භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස නිසි කළමනාකරණයකින් යුතුව නඩත්තු කළ යුතුය. | භාවිතයට නොගෙන ඇති නිවාස බොහෝමයක් අලුත්වැඩියා කර භාවිතයට ගෙන ඇති අතර, මේ වන විට ඉතිරිව ඇති, භාවිතයට ගෙන නොමැති නිවාස 75 කි. එයින් නිවාස 7 ක් කාලාන්තරයක් තිස්සේ සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති අතර, භෞතිකව ඒවා දක්නට නොමැත. එම නිවාස වල තත්වය පරික්ෂා කර බලා වාර්තාවක් කැඳවා ඒ අනුව නිවාස ලේඛනයෙන් කපා හැරීමට කටයුතු කිරීම. | ඉතිරි නිවාස 2022, 2023 වර්ෂවල ප්‍රතිපාදන යටතේ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | (ආ) දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාසවලින් වෙනත් භාහිර ආයතන හා පුද්ගලයින් වෙත ලබා දී තිබුණු නිල නිවාස 41 කින් බදු කුලී අයකරගෙන නොතිබුණි. වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දී තිබුණු නිල නිවාස 78 කින් ප්‍රවර්තන වර්ෂය තුළ බදු කුලී අයකරගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස වලින් කුලී අයවීම නිසි පරිදි කළමනාකරණය කළ යුතුය. | බදු කුලී අයකර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දීම. | මේ දක්වා අදාල කුලී අයකරගෙන නොතිබුණි. |
| 14. | වීරකැටිය ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ සේවය කළ සහකාර වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු 2003 වර්ෂයේ දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් පදවමින් සිටිය දී සිදු වූ රිය අනතුරක් හේතුවෙන් අගතියට පත් පාර්ශවයට දෙපාර්තමේන්තු බැංකු ගිණුමෙන් රු.3,708,100 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. අලාභයේ සම්පූර්ණ වගකීම නිලධාරියා දැරිය යුතු අතර අලාභය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි. එම අලාභය සමාලෝචිත වර්ෂය අවසාන දිනට අක්මුදල් ගිණුමේ නොපියවුනු ශේෂයක් ලෙස පැවතුණි. | අක්මුදල් ගිණුමේ ශේෂය නොපමාව පියවා ගත යුතුය. | අලාභය කපා හැරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම | 2021/12/31 මේ වන විට අදාල මුදලින් රු. 300,000/- ක මුදලක් අය වී ඇත. මෙම නිලධාරියා 2021/08/13 දින මිය ගොස් ඇති අතර හිග මුදල වන රු. 3,608,099.75 මුදල සම්බන්ධයෙන් කටයුතු කලයුතු ආකාරය පිළිබඳව 2021/11/08 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාරයෙන් උපදෙස් ඉල්ලා ඇත. |
| | | | | |
| 15. | (අ) අනුමත කොට්ඨාස සහකාර තනතුරු 63 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ සඳහා 2020 පෙබරවාරි 03 වැඩ බැලීම සඳහා ඉංජිනේරු සහකාර | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | මෙම තනතුරු සදහා විධිමත් අයුරින් බදවා ගැනීම පිළිබද රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග ලිපි හුවමාරු වෙමින් | මෙම ක්‍රියාවලිය අවසන් වනතෙක් වැඩ බැලීමේ පදනම මත අදාල නිලධාරීන් ලවා කොට්ඨාශ වල |

| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරීන් 59 දෙනෙකු පත් කර තිබුණි. අදාළ වැඩ බැලීමේ පත්වීම් ලබා දීම සඳහා නිලධාරීන් තෝරා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ඉංජිනේරු සහකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් 23 දෙනෙකු හා III ශ්‍රේණියේ එක් නිලධාරියෙකු පත්කිරීම සඳහා වූ නිර්ණායක පිළිබඳ පැහැදිලි නොවුණි. | | පවතී. | අත්‍යවශ්‍ය රාජකාරී ඉටුකරනු ලබයි. |
| | (ආ) දීපව්‍යාප්ත හා ඒකාබද්ධ සේවාවලට අයත් තනතුරු 20 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 53 ක් වූ අතර ඉන් 29 ක් දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | මෙම පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | මේ වන විට රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවාගැනීම අත්හිටුවා ඇති බැවින් නැවත බඳවා ගැනීම් කිරීමේදී අදාල පුරප්පාඩු පුරවන බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත. |

ශීර්ෂ 283 - වනසංරක්ෂණ දෙපාරත්මේන්තුව

| විගණන නිරීක්ෂණය | | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ / වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | විශේෂිත වර්ගයේ මායිම් කණු නිපදවීම සඳහා ෆයිබර් අච්චු අකුරුස්ස සිට ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලය වෙත නිෂ්පාදනය කර ප්‍රවාහනය කර දීමට එකක් රු. 14,000 බැගින් අච්චු 70 ක් සඳහා රු.980,000 ක් ප්‍රසම්පාදනයට අනුමැතිය ලබා දී තිබුණද එම අනුමැතියට පරිබාහිරව තවත් ෆයිබර් අච්චු 140 ක් සඳහා රු.1,960,000 ක් වැය කර තිබුණි. | දිසා වන කාර්යාල සඳහා අනුමත ප්‍රසම්පාදන සීමාව රු.1,000,000 ක් වන අතර එම සීමාව තුල ප්‍රසම්පාදන කටයුතු කල යුතුය. | ප්‍රසම්පාදන ක්‍රමවේදය උල්ලංඝනය වීමක් සිදු වී ඇති බවද මෙම තත්ත්වය ඉදිරියේදී වලක්වා ගැනීමට උපදෙස් දී ඇත. | මේ සඳහා පත්කරන ලද කමිටුවක් විසින් 2021 දෙසැම්බර් 17 දින විමර්ෂන වාර්තාවක් ඉදිරිපත් කර ඇතත් 2022 පෙබරවාරි වන විටත් පාලනාධිකාරිය විසින් ඒ අනුව කටයුතු කර නොමැත. |
| 2. | අනුරාධපුර දිසා වන කාර්යාලය විසින් විශේෂිත මායිම් කණුවක් රු.1,100 බැගින් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු අතර එම මිලටම ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලයට අවශ්‍ය මායිම් කණු 23,000 ක් රු.25,300,000 කට මිලදී ගත හැකිව තිබුණි. නමුත් රු.27,465,050 ක් වැය කර මායිම් කණු නිපදවා තිබීම හේතුවෙන් රු.2,165,050 ක මූල්‍යමය අවාසියක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී මූල්‍යමය අවාසියක් ඇති නොවන ආකාරයට කටයුතු කල යුතුය. | මූලික විමර්ශනයක් කිරීමට පියවර ගෙන ඇත. | - එම - |
| 3. | ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලයේ ප්‍රසම්පාදන අනුමැතිය අනුව සැපයුම්කරු වෙතින් විශේෂිත මායිම් කණු 23,000 ක් රු.1,299,750 කට | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව අනුමත සීමාවන් තුල කටයුතු කල යුතුය. | පිරිවැය අවම වන පරිදි කටයුතු කිරිමට උපදෙස් ලබා දී ඇත. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | දිස්ත්‍රික්ක 06 ක් වෙත ප්‍රවාහනය කිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණ ද, මායිම් කණු 17,390 ක් පමණක් ප්‍රවාහනය කර තිබුණු අතර ඒ සඳහා රු.1,525,025 ක් වැය කර තිබුණි. ඒ අනුව අනුමත වියදමට වඩා රු.225,275 ක් වැය කර තිබුණි. | | | |
| 4. | කන්තලේ අඩවි වන කාර්යාලයට යන පිවිසුම් මාර්ගයෙහි කාණු පද්ධතිය (මීටර් 90) හා පැති බැම්ම (මීටර් 70) සකස් කිරීම සඳහා රු.1,145,022 ක් දරා තිබුණද කාණු පද්ධතිය පිවිසුම් මාර්ගයට ඉහලින් පිහිටා ඇති නිසා වැසි ජලය ගලා යාමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | කාණු පද්ධතියට ජලය ගලා යාමට හැකි වන පරිදි සකස් කල යුතුය. | ප්‍රාදේශීය සභාව සම්බන්ධ කර ගෙන පාර පිළිසකර කිරීමට සැලසුම් කර ඇත. | 2022 පෙබරවාරි වන විටත් මාර්ගය සකස් කර නොමැත. |
| 5. | සමාලෝචිත වර්ෂයේදී අනුරාධපුර අඩවියෙහි කළුගල් බලපත්‍රලාභීන් 06 දෙනෙකුගෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ වාර්තාවලට අනුව වැඩිපුර කඩා ඉවත් කර ඇති කළුගල් කියුබ් 1,057 ක් වෙනුවෙන් තවදුරටත් අය කර නොගත් රු.618,630 ක් විය. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්තාව පදනම් කරගෙන හිඟ ගාස්තු අය කර ගත යුතුය. | මෙම බලපත්‍රලාභීන් හට නියමිත හිඟ ගාස්තු ගෙවන ලෙස දන්වා ඇත. | 2022 පෙබරවාරි වන විටත් මෙම මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නැත. |
| 6. | 2016, 2017 සහ 2018 වර්ෂවලදී බලපත්‍රකරුවන් 113 දෙනෙකුගෙන් වැලි බලපත්‍ර ගාස්තු අය කිරීමේදී රු.1,251,000 ක හිඟ මුද්දර ගාස්තු අය කරගෙන | අංක 1789/09 හා 2012 දෙසැම්බර් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි උපදෙස් අනුව මුද්දර ගාස්තු අය කල යුතුය. | මේ වන විට රු.187,000 ක හිඟ ගාස්තු අය කරගෙන ඇති අතර ඉතිරිය බලපත්‍රකරුවන්ගේ ඇප තැන්පතු වලින් අය කර | 2022 පෙබරවාරි වන විටත් මෙම මුද්දර ගාස්තු අයකර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. | | ගැනීමට උපදෙස් ලබා දී ඇත. | |
| 7. | අනුරාධපුර දිසා වන නිලධාරිගේ අනු/ දි.ව.නි/ විමර්ශණ/2018 හා 2018 ඔක්තෝබර් 29 දිනැති ලිපියට අනුව විවිධ පාර්ශවයන්ගේ සහාය ලබා ගනිමින් පුද්ගලයකු රජයේ ඉඩම් කූට ලේඛන උපයෝගි කරගෙන ඉඩම් වංචාවන් සිදු කර තිබූ අතර දළ වශයෙන් එහි මූල්‍ය වටිනාකම රු.මිලියන 2,000 ක් පමණ වී තිබුණි. | රජයේ ඉඩම් කළමනාකරණය පිළිබඳව විශේෂ අවධානය යොමු කල යුතුය. | නීති උපදෙස් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | 2022 පෙබරවාරි වන විටත් නිත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. |
| 8. | පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය මගින් 2018 මාර්තු 10 දින කහටගස්දිගිලිය අඩවියේ අංක 194 කුරුණෑගල කොලණිය ප්‍රජා මූල සංවිධානය සඳහා ලබා දී ඇති ජල පෙරණ යන්ත්‍රය (Ro Plant) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පරිහරණයට ගතහැකි තත්වයට පත්කර නොතිබුණි. | පරිහරණය කල හැකි තත්ත්වයට පත් කිරීමට කටයුතු කල යුතුය. | මෙම යන්ත්‍රය සවි කිරීමට අවශ්‍ය ආවරණ ගොඩනැගිල්ල ඉදිකරමින් පවතී. | 2022 පෙබරවාරි වන විටත් භාවිතය සඳහා සවිකර නොතිබුණි. |
| 9. | 1995 ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය යටතේ දැව නොවන වනජ නිෂ්පාදන මුල් කොටගත් කර්මාන්ත ඇතුළු වනජ කර්මාන්ත ආරම්භ කිරීම හා නවීකරණය, නගා සිටුවීම පිණිස මූල්‍ය ආයතන හා අමාත්‍යාංශ අතර සහයෝගීතාවය ඇති කිරීම මඟින් මූල්‍ය පහසුකම් වර්ධනය සඳහා පියවර ගෙන නොතිබුණි. | 1995 ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය හා මහා සැලැස්ම සංශෝධනය සිදු කල යුතුය. | මේ සම්බන්ධයෙන් පියවර ගෙන නොමැති අතර ඉදිරියේදී කාර්ය මණ්ඩල සංශෝධනයේදී මේ සඳහා වෙනම අංශයක් ඇති කර කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | 2022 පෙබරවාරි වන විටත් මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 10. | (අ) වීරක්කුලිචෝලේ මූලික විමර්ෂණ කමිටු වාර්තාව ඉදිරිපත් නොකිරිම තුල රක්ෂිතයෙන් අනවසරයෙන් හෙලීම් කර ඇති පලු, පානක්කා, වීර ආදි ගස් 1,443 ක් සම්බන්ධයෙන් 2020 ජුනි වන විටත් කිසිදු තොරතුරක් නොමැති අතර වන අපරාධය සම්බන්ධයෙන්ද නෛතික ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | මූලික විමර්.ෂණ කමිටු වාර්.තාව කඩිනමින් ඉදිරිපත් කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්.ග ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| | (ආ) රක්ෂිතයෙන් දැව හෙලීම් කර ඇති ගස් 139 ක දැව පරිමාව ඝණ මීටර් 263,977 ක වටිනාකම රු. මිලියන 6.93 ක් ලෙස හඳුනා ගෙන තිබුණද අනෙකුත් ගස් 1,304 දැව පරිමාව හා මූල්‍යමය වටිනාකම ගණනය කර නොතිබුණි. | දැව පරිමාව හා මූල්‍යමය වටිනාකම ගණනය කර එමගින් රජයට සිදු වී ඇති අලාභය අනාවරණය කර ගත යුතුය. | ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොමැත. | - එම - |
| 11. | පුත්තලම දිසාවේ විවිධ අවසරපත්‍ර අංක H7/911/2016 යටතේ බලපත්‍රකරුවකු කළුගල් ඇඹරුම් යන්ත්‍රයක් සඳහා අවසර ලබා ගෙන තිබුණ ද අනුමත භූමි ප්‍රමාණය ඉක්මවා පර්චස් 525 ක් පමණ 2013 වර්ෂයේ සිට භාවිතා කර තිබුණි. | බලපත්‍රකරු අනවසරයෙන් භාවිතා කර ඇති භූමි ප්‍රමාණය සඳහා හිඟ බලපත්‍ර ගාස්තු අයකල යුතුය. | අවශ්‍ය පියවර ගැනිමට උපදෙස් ලබා දී ඇත | 2022 පෙබරවාරි වන විටත් හිඟ ගාස්තු අයකර නොතිබුණි. |
| 12. | හම්බන්තොට දිසා වන කාර්යාලයට අයත් ගල් කොරි 04 ක, කැනිම් බලපත්‍ර මගින් අනුමැතිය ලබා දි ඇති ගල් ප්‍රමාණය ඉක්මවා කැනිම් කිරිම හේතුවෙන් | බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය ඉක්මවා කැණීම් කරන ලද ගල් සඳහා නියමිත ගාස්තු අයකළ යුතු අතර බලපත්‍ර සීමාව ඉක්මවා | හිඟ ආදායම් අයකිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. | රාජ්‍ය ආදායමට එකතුවිය යුතු මෙම මුදල් 2022 පෙබරවාරි වන විටත් අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.34,916,952 ක් හිඟ ආදායම් ගණනය කර නොතිබුණි. | කැනීම් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. | | |
| 13. | තිස්සමහාරාම සහ වලස්මුල්ල අඩවි වන කාර්යාල වලට අයත් රක්ෂිත කැළෑ වල පවත්වාගෙන යන සම්ප්‍රේක්ෂණ කුළුණු 02 ක් වෙනුවෙන් අයවිය යුතු එකතුව රු.3,018,160 ක් හිඟ ආදායම ලෙස ගණනය කර නොතිබුණි. | හිඟ ආදායම් නිවැරදිව හඳුනා ගෙන අය කිරීමට කටයුතු කල යුතුය. | අදාල හිග ආදායම් අයකර ගැනිමට පාලන අධිකාරිය විසින් උපදෙස් ලබා දී ඇත. | අයකර ගැනිමට කටයුතු කර නොමැත. |
| 14. | 2020 දෙසැම්බර් 31 දිනට මාස 03 සිට වසර 05 ඉක්මවා ගොස් තිබුණු එකතුව රු.11,247,901 ක ණය ශේෂයක් පැවති අතර ඒවා අය කර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය අනුව කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදය අනුව කටයුතු කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට පාලන අධිකාරිය විසින් උපදෙස් ලබා දි ඇත. | 2022 පෙබරවාරි වන විටත් අයකර ගැනිමට නිත්‍යානුකුල කටයුතු කර නොතිබුණි. |
| 15. | වසර 02 ක් ඉක්මවා තිබුණු එකතුව රු.352,036,248 ක් වූ තැන්පතු මුදල් මු.රෙ. 570(2) ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරිමට කටයුතු කර නොතිබුණි. මෙය මුළු තැන්පත් මුදලින් සියයට 48.57ක් විය. | ඇතැම් තැන්පතු වසර 15 කටත් වැඩි කාලයක සිට කිසිදු වියදමක් නොකර පැවත එන බැවින් අදාළ ව්‍යාපෘති තව දුරටත් ක්‍රියාත්මක ද**,** නැතහොත් අවසන් වි තිබේ ද යන්න පසු විපරම් කර**,** මු.රෙ. 571(2) ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරිමට කටයුතු කළ යුතුය. | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2022 පෙබරවාරි වන විටත් ආදායමට බැර කිරිමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 16. | (අ) තිස්සමහරාම අඩවි වන කාර්යාලය යටතේ පාලනයවන වනාන්තර හෙක්ටයාර ප්‍රමාණය 9,781 ක් වුවද ඉන් රක්ෂිත වනාන්තර ලෙස ගැසට් කර ඇති ප්‍රමාණය හෙක්ටයාර 3.336 ක් වුයෙන් වනාන්තර 06 ක හෙක්ටයාර 6.445 ක භූමි ප්‍රමාණයක, එනම් මුලු වනාන්තර භූමි ප්‍රමාණයෙන් සියයට 65 ක් ගැසට් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු සහ ඉලක්ක ලගා කර ගැනීම සඳහා ඇස්තමේන්තු ගත කාර්යයන් කාර්යක්ෂමව ඉටු කළ යතුය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට උපදෙස් ලබා දී ඇත. | 2022 පෙබරවාරි වන විටත් ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (ආ)හම්බන්තොට දිසාවන කාර්යාලය යටතේ පාලනයවන හෙක්ටයාර 1,361.55 ක් වූ වනාන්තර 03 ක් මැනීම් කර තිබුණ ද අවුරුදු 03 ක් ඉක්මවා ගිය ද ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | මැනීම් අවසන් කර ඇති වනාන්තර ගැසට් කිරීට කටයුතු කළ යුතුය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට උපදෙස් ලබා දී ඇත. | 2022 පෙබරවාරි වන විටත් ගැසට් කර නොතිබුණි. |
| | (ඇ)හම්බන්තොට දිසාවන කාර්යාලය යටතේ පාලනයවන හෙක්ටයාර 3,700.73 ක්වූ වනාන්තර 10 ක් රක්ෂිත වනාන්තර ලෙස නම් කිරීමට යෝජනා කර තිබුණ ද එම වනාන්තර මැන කඩිනමින් රක්ෂිතයන් බවට පත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් වනාන්තර අනවසර අල්ලාගැනීම, වනාන්තර එළිකොට හේන් | රක්ෂිත වනාන්තර ලෙස නම් කිරීමට යෝජිත වනාන්තර සම්බන්ධව අදාල කටයුතු නිම කිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි වන විටත් මේ සම්බන්ධව නිත්‍යානුකුල කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වගාව කිරීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් දෙපාර්තමේන්තු නිර්දේශයකින් තොරව බලපත්‍ර නිකුත් කිරීම ආදී විවිධ ගැටලුවලට මුහුණපෑමට අඩවි වන කාර්යාලවලට සිදුව තිබුණි. | | | |
| 17. | නිලධාරීන් සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ නිල නිවාස 14 ක් ස්ථාපිත කර ඇතත් ඉන් නිල නිවාස 11 ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව තිබුණි. තවද වලස්මුල්ල අඩවි වන කාර්යාලයට අයත් නිල නිවාස 03 ක් හානියට පත්වී තිබුණි. මේ අනුව නිල නිවාසවල පරිපාලනය ඉතා දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂනය විය. | රාජ්‍ය සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කිරීමට හැකිවන පරිදි සැලසුම් සකස් කළ යුතුය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට පාලන අධිකාරිය විසින් උපදෙස් ලබා දී ඇත. | 2022 පෙබරවාරි වන විටත් නිලනිවාස අළුත්වැඩියා කර අදාල නිලධාරින්ට පාවිච්චි කිරීමට භාරදී නොතිබුණි. |
| 18. | 2017 හා 2018 වර්ෂ වලදී තාවකාලික ජංගම කඳවුරු පවත්වා ගැනීම සඳහා අයදුම්පත් 22 ක් ලැබී තිබුන ද, ඒ සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. තිස්සමහාරාම අඩවියට අයත් නිමලව රජයේ වනය තුළ කඳවුරු 20 ක් අනවසරයෙන් පවත්වාගෙන යන බව අනාවරණය කර ගෙන තිබුණ ද, ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ අධිකරණ ක්‍රියාමාර්ග ගෙන එම කඳවුරු ඉවත් කිරීමට හෝ නව බලපත්‍ර ලබාදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ | ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ අධිකරණ ක්‍රියාමාර්ග ගෙන එම කඳවුරු ඉවත් කිරීමට හෝ නව බලපත්‍ර ලබාදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාමට අවසර දීමට හෝ යන දෙකින් වඩාත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පාලන අධිකාරීය විසින් උපදෙස් ලබා දී ඇත. | 2022 පෙබරවාරි වන විටත් මේ සම්බන්ධයෙන් නිත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාමට අවසර දීමට හෝ යන දෙකින් වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| 19. | හම්බන්තොට කොහොලංකල අවශේෂ වනයේ කැලිගම කෙමගම භූමියේ පවත්වාගෙන යන ගල් කොරියක් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ලබාදුන් කැණීම් බලපත්‍ර මත හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගාස්තු අය කර තිබූ බැවින් 2009 වර්ෂයේ සිට වාර්ෂිකව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට රු. 36,000,000 ක් බැගින් වූ ආදායමක් අහිමි වී තිබුණි. | ආදායම් රැස් කිරීමේදී කළුගල් කැඩීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතු වීම හා නිවැරදි ගණනය යටතේ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම් විසින් බලපත්‍ර නිකුත් කිරීම වැලැක් වීමට පියවර ගෙන නොතිබුණි. | නිත්‍යානුකූල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 20. | ජ්‍යෙෂ්ඨ මට්ටම, තෘතියික මට්ටම, ද්විතීක මට්ටම හා සුළු සේවක වශයෙන් පිළිවෙලින් 36 ක, 18 ක, 323 ක හා 288 ක් වශයෙන් තනතුරු 665 ක පුරප්පාඩු වූ අතර ඒවා පිරවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | පුරප්පාඩු පිළිබඳ තොරතුරු රැස්කරමින් පවතී. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

ශීර්ෂ 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>---------------- | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>-------------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>-------------- |
|---|---|---|---|---|
| 1. | දමනේයාය උසාවිය අසල ගිරිතලේ අභය භූමියට කැළිකසළ විශාල ප්‍රමාණයක් බැහැර කර තිබෙන අතර, වනඅලීන් හා අනෙකුත් සතුන් කසල ආහාරයට ගන්නා බව නිරීක්ෂණය විය. 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) ආඥා පනතෙහි 9(3)(ක),(ග) ඡේද ප්‍රකාරව දෙපාර්තමේන්තුව මේ සඳහා කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණි. | අභය භූමියට කැලිකසල බැහැර කිරීම වැලැක්වීම සඳහා පියවර ගත යුතුය. | i. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් වීමෙන් ගම් වාසීන්ගේ සහයෝගයද ඇතිව මේ වන විට මෙම ස්ථානයේ තිබෙන කුණු වල මත රුක් රෝපණය කර ඇත.<br>ii. පොළොන්නරුව කලාප කාර්යාලයේ නිලධාරීන් විසින් සිදු කරන ලද වැටලීමකදී අදාළ ප්‍රදේශයට කැළිකසල බැහැර කරමින් තිබූ වාහනයක් හා පුද්ගලයන් දෙදෙනෙකු අත් අඩංගුවට ගෙන බකමූණ අධිකරණයට ඉදිරිපත් කර නඩු අංක 68736 පවරා තිබුණි. | 2022 ජනවාරි වනවිටත් අභය භූමියට කැලිකසල බැහැර කරන බව නිරීක්ෂණය විය. |
| 2. | බකමූණ වනජීවී කාර්යාලයේ සහ කුමාර ඇල්ල බීට්ටුවේ නිලධාරීන් 02 දෙනෙකු අල්ලස් ගැනීම සම්බන්ධ වරදකරුවන් බවට අධිකරණය විසින් නියම කළද ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 28.3 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | i. දඩුවම් නියම වූ නිලධාරීන් විසින් නඩු තීන්දුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර තිබේද යන්න අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවෙන් විමසීම් කර ඇත. | 2022 ජනවාරි වනවිටත් එම නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | | ii. මේ සම්බන්ධයෙන් සිහිකැඳවීමක් යොමු කිරීමට කටයුතු කර ඇත. | |
| 3. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 1.2 ඡේදය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග 20 ක් සම්බන්ධයෙන් විමර්ශනය සඳහා කමිටු පත්කර වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශන අවසන් කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | මීට අදාලව සියළුම විමර්ශන නිලධාරීන්ට සිහිකැඳවීම් යොමුකර ඇත. | 2022 ජනවාරි වනවිටත් එම විමර්ශන අවසන් කර නොතිබුණි. |
| 4. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 101(3) ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අංශවල බඩු ලේඛන පොත් නඩත්තු කරනු ලබන නිලධාරීන් තමා භාරයේ පවතින භාණ්ඩ ශේෂය හා බඩු ලේඛන පොත් ශේෂය විශ්ලේෂණය කරමින් ඌණතා හා අතිරික්ත හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් ගබඩාව විසින් විවිධ අංශ වෙත නිකුත් කර තිබූ භාණ්ඩවලින් රු.3,019,132 ක් පමණ වටිනා අයිතම 46 ක ඌණතාවයක් පවතින බව විගණනය විසින් සිදුකළ භෞතික තොග සත්‍යාපනයේදී නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කල යුතුය. | නිකුත් කිරීමේ නියෝග හා බඩු වට්ටෝරු පොත් පරීක්ෂා කර ඇතුළත් නොවූ භාණ්ඩ හා ඌනතා ඇති භාණ්ඩ පිළිබඳව භෞතිකව සොයා බැලීමට කටයුතු කරමින් පවතී. | 2022 ජනවාරි දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 5. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කල දින සිට වර්ෂ දෙකක් ඉක්ම වූ රු.3,937,613 ක් වූ පොදු තැන්පතු ගිණුමේ ශේෂ | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | මෙම තැන්පතුවලට අදාලව ගෙවීම් සඳහා අවශ්‍ය වාර්තාවල ඇති අඩුපාඩු නිසා රැඳවුම් | 2022 ජනවාරි වනවිටත් පොදු තැන්පතු ගිණුමේ ශේෂ |

| | | | | |
|---|---|---|---|---|
| | සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති අතර අදාළ අංශවලින් විමසා අවශ්‍ය කටයුතු කරමින් පවතී. | නිරවුල් කර නොමැත. |
| 6. | 2016 වර්ෂයේදී යාල ජාතික උද්‍යානය සඳහා Ticket Vending machine 02 ක්, Mini PC 03 ක් හා 19” Mini PC Tray 2U 01 ක් රු.2,205,526 කට මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. | Mini PC 03 හා ඉලෙක්ට්‍රොනික් උපාංග හා යන්ත්‍ර යාවත්කාලීනව පවත්වාගෙන යාමට ඉදිරියේදී ක්‍රියා කරනු ලබයි. | 2022 ජනවාරි වන විටත් මෙම වත්කම් උපයෝජනයට ගෙන නොමැත. |
| 7. | නැගෙනහිර කලාපයේ ඉදිකරන ලද විදුලි වැටවල් 07 ක රු.1,546,000 ක් වූ විදුලි උපකරණ සොරා ගෙන තිබුණද මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කල යුතුය. | මෙම වකවානුව වනවිට එම කලාපයේ මඩකලපු අඩවියේ හානිපාඩු ලේඛනයක් නඩත්තු නොවීම හේතුවෙන් සොරාගත් භාණ්ඩ උපකරණ ලේඛනයකට ඇතුලත් කර නොමැත. | විදුලි කුටිය ආසන්නයේ මුරකුටියක් ඉදිකර ඇති අතර දිවා රාත්‍රී සිවිල් ආරක්ෂක භටයින් යොදවා ඇත. දැනට එකී විදුලි කුටි දෙකම සක්‍රිය මට්ටමේ පවතී. නමුත් මෙම විදුලි උපකරණ වංචාව සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වී ඇත. |
| 8. | වර්ෂ දෙකක් තුළ සේනානායක සමුද්‍රයේ බෝට්ටු ධාවනය සඳහා වැඩිපුර භූමිතෙල් ඉන්ධන ලීටර් 15,690 ක් භාවිත කර තිබූ අතර එහි වටිනාකම රු.1,035,540 ක් | සෑම මාස 06 කට වරක් මාණ්ඩලික නිලධාරියෙකු ඉදිරියේ ධාවනය සිදුකර ඉන්ධන පරිභෝජනය | සේනානායක සමුද්‍රයේ බෝට්ටු ධාවනයේදී ඉන්ධන පාලනය කිරීම සඳහා 2020 ජනවාරි 17 දින පවත් වන ලද කමිටු | 2022 ජනවාරි වන විට දෙපාර්තමේන් තුව දී ඇති උපදෙස් |

| | | | | |
|---|---|---|---|---|
| | විය. | පරික්ෂා කිරීමට කටයුතු කල යුතුය. | රූස්වීමේ තීරණ අනුව බෝට්ටුවකට පැය 01 ක් ධාවනය කිරීම සඳහා භූමිතෙල් ලීටර් 07 ක් තුලනය කිරීමටත්, ඉන්ධන පිරවීමේදී සහ බෝට්ටුව ධාවනය කිරීමේදී හෝරා සළකුණු කිරීම දෛනිකව ලේඛනයක් මගින් යාවත්කාලීන කිරීමටත් උද්‍යාන භාරකරු දැනුවත් කිරීම. | අනුගමනය කරමින් හෝරා සලකුණු කිරීම, ඉන්ධන තුලනය කිරීම සිදු කළ ද පෙර වර්ෂවල භූමිතෙල් සඳහා වැඩිපුර ගෙවීමට අදාළව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 9. | මුතුරාජවෙල පරිසර පද්ධතියේ හෙක්ටයාර 1285 ක බිම් කොටසක් 1996 අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභයභූමියක් ලෙස ගැසට් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අභයභූමියේ මායිම් ලකුණු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | අභයභූමියේ මායිම් නිශ්චිතව ලකුණු කිරීමට කටයුතු කල යුතුය. | මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත මුදල් ගෙවා අභය භූමියේ මායිම් සියල්ල නැවත විධිමත් කිරීමට කටයුතු කරමින් පවතී. | 2022 ජනවාරි වන විටත් මායිම් ලකුණු කර නොතිබුණි. |
| 10. | විධිමත් අධිකාරී බලයකින් තොරව හම්බන්තොට දිස්ත්‍රික්කයේ යෝජිත අලි කළමනාකරණ රක්ෂිතය තුළ පස් කැපීම නිසා අක්කර 18 ක භූමි ප්‍රදේශයක් මීටර් 15 ක් පමණ ගැඹුරට කැනීම් කර තිබුණු අතර ඒ හේතුවෙන් වන සතුන්ගේ ජීවිත අනාරක්ෂිත කර තිබුණි. | රක්ෂිත ප්‍රදේශ තුළ පස් කැපීම පාලනය කර වන සතුන්ගේ ජීවිත ආරක්ෂා කිරීමට කටයුතු කල යුතුය. | මෙම ව්‍යාපෘතිය සඳහා දෙපාර්තමේන්තුවේ නිර්දේශ නොමැතිව දින දීර්ඝ කිරීමක් කර ඇති බැවින් අදාළ දින දීර්ඝ කිරීම සිදු නොකරන ලෙස සහ මෙම කැණීම් කටයුතු අක්‍රමවත්ව සිදු කිරීම නිසා අදාළ භූමියෙහි තැනින් තැන වලවල් නිර්මාණය වී ඇති බැවින් සතුන්ට අනතුරුදායක වී ඇති බවත් නැවත එය | මේ සම්බන්ධ මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ අනුව අදාළ නිලධාරීන්ට විරුද්ධව චෝදනා පත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පුනරුත්ථාපනය කර දෙන ලෙසත් භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැන්වීම. | |
| 11. | වනජීවී භාරය විසින් හෝටන්තැන්න හා යාල වනෝද්‍යානවල පවත්වාගෙන ගිය ආපනශාලා සඳහා 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා හිඟ ගොඩනැගිලි කුලී ආදායම රු.9,300,000 ක් වූ අතර එම මුදල අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ ගොඩනැගිලි කුලී අය කර ගැනීමට කටයුතු කල යුතුය. | වනජීවී භාරයේ දැනට ඉතිරිව ඇති මුදල් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට මුදල් අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත. | 2022 ජනවාරි වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී ඇත. |
| 12. | උඩවලව ජාතික උද්‍යානය ඇතුලු උද්‍යානවල ආක්‍රමණික ශාක ඉවත් කිරීමට ස්ථිර වැඩපිළිවෙලක් හඳුනාගෙන නොතිබුණු අතර, මේ හේතුවෙන් වනසත්ව අවශ්‍යතාවයට ප්‍රමාණවත් ශාක වඳවීයාමේ තර්ජනයක් ඇති වී තිබුණි. | ආක්‍රමණික ශාක ඉවත් කිරීමට ස්ථිර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. | i. දෙපාර්තමේන්තුව විසින් උඩවලව හා අනෙකුත් වනජීවී රක්ෂිත තුළ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම වාර්ෂික සැලැස්මකට ඇතුළත්ව සිදු කරනු ලබන අතර, ඒ අනුව වාර්ෂිකව නඩත්තු කටයුතු සිදු කිරීම.<br>ii. පසුගිය වර්ෂ තුළ Escamp ව්‍යාපෘතිය මඟින් ආක්‍රමණශීලී ලන්ටානා ශාක හෙක්ටයාර 400 ක් ගලවා ඉවත් කිරීම. | තවදුරටත් ආක්‍රමණික ශාක පවතින ප්‍රදේශ නිරීක්ෂණය වීම හා ස්ථිරවම ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| 13. | 2019 සහ 2020 වර්ෂ තුළදී විදුලි වැට ඉදිකිරීම හා නඩත්තුව සඳහා දරන ලද වියදම පිළිවෙලින් රු.197,983,635 සහ රු.257,521,334 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විට | අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා විධිමත් උපක්‍රමයන් හඳුන්වා දීමට කටයුතු කල යුතුය. | අලි මිනිස් ගැටුම අවම කිරීමේ අරමුණින් අලි අගල් කැපීම, අලි රැඳවුම් මධ්‍යස්ථාන ඉදිකිරීම වැනි ක්‍රියාමාර්ග ගනිමින් | වර්තමානයේදී වනඅලි මිනිස් ගැටුම් පවතින ප්‍රදේශවල ආර්ථික ක්‍රියාකාරීත්වය |

| | | | | |
|---|---|---|---|---|
| | සම්පූර්ණ විදුලි වැටෙහි දිග ප්‍රමාණය කිලෝමීටර් 4,756 ක් විය. එසේ වුවද පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම අවම වීමක් නිරීක්ෂණය නොවීය. | | පවතී. | සීඝ්‍රයෙන් වර්ධනය වීම හේතුකොට ගෙන වන අලීන්ගේ සංචරණ මං පෙත්වලට බාධා ඇති වීම හා රක්ෂිතවලින් බැහැරව වන ගැටුම් මැඩලීම සඳහා යොදා ගන්නා උපක්‍රමයන් නිසි ප්‍රමිතියෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට ඇති, බාධා ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| 14. | කවුඩුල්ල ජාතික උද්‍යානයේ සිදු වූ ප්‍රවේශ පත්‍ර අක්‍රමිකතාවය සහ හම්බන්තොට අඩවියේ සිදුකරන ලද හදිසි වැටලීමකදී අත් අඩංගුවට ගත් සැකකරුවකු රැඳවුම් භාරයේ සිටියදී පලායාම සම්බන්ධ සිද්ධීන් දෙකට අදාල මූලික විමර්ශන වාර්තාවල සඳහන් නිර්දේශ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | මූලික විමර්ශන වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. | මෙම සිද්ධිය සම්බන්ධයෙන් සිදුකළ මූලික විමර්ශනයේ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස අදාළ නිලධාරීන් වෙත දැනුම් දීම. | 2022 ජනවාරි වන විටත් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 15. | 2012 ජනවාරි 06 දිනැති හා අංක අමප/11/2299/549/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අලින්ගෙන් සිදුවන හානි අවම කිරීම සඳහා ඉදි කරනු ලබන විදුලි වැට නඩත්තු කිරීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයන් යොදා ගෙන තිබුණි. මෙම සේවාව එලදායීව ලබා ගැනීම සඳහාත් විදුලි වැට නඩත්තුව සඳහා දරන වියදම් විධිමත් පරිදි කළමනාකරණය කර ගැනීම සඳහාත්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර නිශ්චිතව එකඟ වූ ගිවිසුමකට එළඹිය යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර ගිවිසුමකට එළඹීමට කටයුතු කල යුතුය. | 2012 වර්ෂයේ අවබෝධතා ගිවිසුමක් සකස් කර තිබූ අතර එයට අත්සන් තැබීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් එකගතාවය පලනොවුණි. නමුත් වනජීවී දෙපාර්තමේන්තුව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව එවැනි ගිවිසුමකට එළඹීමට මූලික තොරතුරු හුවමාරු කර ගෙන ඇති අතර ඒ අනුව නුදුරේම ගිවිසුමකට එළඹීමට කටයුතු කරමින් පවතී. | 2022 ජනවාරි වන විටත් ගිවිසුමකට එළඹ නොතිබුණි. |
| 16. | මාදුරුඔය ජාතික උද්‍යානයේ ඉද්දපොළ පදවලයාය ප්‍රදේශයේ තේක්ක ගස් 10,000 ක් ඉවත් කිරීම සඳහා 2013 වර්ෂයේ සිට වැඩ ආරම්භ කිරීමට තීරණය කර තිබුණද, විගණිත දින වන විටත් ව්‍යාපෘතියට අදාළව අවසන් පාරිසරික ඇගයීම් වාර්තාව සකස් කර නොතිබුණි. | පාරිසරික ඇගයීම් වාර්තාව සකස්කර තේක්ක ගස් ඉවත් කිරීම සඳහා කඩිනම් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. | මේ සඳහා පරිසර ඇගයුමට අදාළ නිර්ණේය පත්‍රිකාව 2014.08.29 රාජ්‍ය දැව සංස්ථාවට නිකුත් කර ඇත. | 2022 ජනවාරි වන විටත් නිර්ණේය පත්‍රිකාවට අනුව සකස් කළ පරිසර වාර්තාව භාර දී නොමැත. |
| 17. | මාදුරුඔය ජාතික උද්‍යානයේ උළුකැටන්ගොඩ වැව හා හැවැම්මේගල වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පිළිවෙලින් රු.2,955,970 ක හා රු.4,000,038 ක බදු රහිත මුදලකට 2017 ඔක්තෝම්බර් 31 දින පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. එහෙත් මෙහි වැඩ අවසන් | අදාළ පාර්ශවයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කල යුතුය. | කොන්ත්‍රාත්කරු විසින් මෙම ව්‍යාපෘතිය අතරමග නවතා දමා ඇත. | 2022 ජනවාරි වන විටත් මෙම කොන්ත්‍රාත්වල කටයුතු අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමකින් තොරව කොන්ත්‍රාත්තුව අතරමග නවතා දමා තිබූ බව නිරීක්ෂණය විය. | | | |

ශීර්ෂ 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

| | **විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| | **-------------------------------** | **-----------------------** | **----------------------** | **-----------------** |
| | **2018 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ඇතුලත් ඡේද** **---------------------------------** | | | |
| 1. | ජාතික බීජ අවශ්‍යතාවයට දෙපාර්තමේන්තුව විසින් සපයන ලද දායකත්වය සියයට 2 ත් සියයට 30 ත් අතර පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | රටේ අවශ්‍යතාවයට ගැලපෙන බීජ අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් නිපදවීමට දෙපාර්තමේන්තුවේ සම්පත් මෙහෙයවීම සිදු කළ යුතු වීම. | බීජ වෙනත් පාර්ශවයන්ට ලබාදීම මගින් ගුණනය වීම සිදු වේ. | එය වර්ධනය කිරීමට පියවර ගෙන නැත. |
| 2. | 1979 ආරම්භ කළ බිබිල දොඩම් පර්යේෂණ ආයතනය 1989 වර්ෂයෙන් පසුව පර්යේෂණ නිලධාරියෙකු නොමැතිව පර්යේෂණ සහකාර නිලධාරියෙකු යටතේ පවතින අතර ජාතික අවශ්‍යතාවයන් ඉටුවන පරිදි ආයතනය කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ මධ්‍යස්ථානය ගොවි ගැටළුවලට පිළියම් යෙදීම සඳහා ක්‍රියා කළ යුතු විම. | පර්යේෂණ නිලධාරි බඳවා ගැනීම සඳහා විභාග කොමසාරිස් වෙත අයදුම්පත් කැඳවීමේ නිවේදනය යැවීමට සකස් කෙරෙමින් පවතී. | අඩුපාඩුව නිවැරදි කර නැත. |
| 3. | හොරණ පලතුරු භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් රු.මිලියන 01 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන පැනමා රෝගයට ප්‍රතිරෝධීන් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය තුළින් කෙසෙල් වගාවේ යෙදෙන ගොවීන් මුහුණදෙන මූලික ගැටලුවට පිළියම් | ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය පර්යේෂණයන් සිදු කිරීමට ක්‍රියා කළ යුතු වීම. | ගැමා කිරණ ප්‍රතිකාරකය හරහා කෙසෙල් වගාවේ ඇති පැනමා රෝගයට ප්‍රතිරෝධීන් වර්ධනය කිරීමේ පර්යේෂණය සාර්ථක වුවද, එම කෙසෙල් වගාවන් හි | පැනමා රෝගයට ප්‍රතිකාරයක් මෙතෙක් සොයාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | යෙදීමට පර්යේෂණ නිලධාරින්ගේ අවධානය යොමු වී නොතිබුණි. | | ඵලදාව අනපේක්ෂිත ලෙස හීන විය. | |
| 4. | ඵලවළු පළිබෝධකයින් පාලනය සඳහා ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලකයින් යොදා ගැනීමේ ව්‍යාපෘතියක් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 17 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර පරිපාලන හා ක්ෂේත්‍ර පර්යේෂණ වියදම් වශයෙන් රු.1,145,000 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 6.74 ක් පමණක් උපයෝජනය කර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වන අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව යොදගත යුතුවීම. | ඵලවළු පළිබෝධකයින් පාලනය සඳහා වන ව්‍යාපෘතියට ලබා ගන්නා ලද රු. මිලියන 17.0 ක ප්‍රතිපාදනය නිසි පරිදි උපයෝජනය වී නොමැත. | ප්‍රතිපාදන ඵලදායි ලෙස උපයෝජනය කර නොමැත. |
| 5. | මිල අධික ඵලවළු දේශීය හා විදේශීය වෙළෙඳපළට සැපයීම යන මූලික අරමුණින් යුතුව ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය (2017 - 2020) වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ අර්ධ ස්වයංක්‍රීය ආරක්ෂිත ගෘහ 40 ක් ඉදිකිරීම හා සපයා සවි කිරීමේ ව්‍යාපෘතියක් මුදල් රෙගුලාසි 03(2) හි විධිවිධාන ද අනුගමනය නොකර, ආරම්භ කර තිබුණු අතර 2018 දෙසැම්බර් වනවිට ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වන අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | මෙම ආරක්ෂිත ගෘහ ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ කොන්ත්‍රාත්කරු, කොන්ත්‍රාත්තුව පැහැරහැරි හෙයින් මෙම කාර්යය බලාපොරොත්තු වූ ආකාරයෙන් සිදු කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වන අරමුණු හා ඉලක්ක ඉටුවී නොමැත. |
| | **2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ඇතුළත් ඡේද** | | | |
| | **---------------------------------** | | | |
| 6. | කරදියනාරු නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අයත් භූමි | අනවසර පදිංචිකරුවන් භුක්ති විඳින සියළුම ඉඩම් | 2020.10.27 වන දින මෙම ගොවිපල ඉඩම මැනුම් කර | මේ දක්වා නිරවුල් කර අයිතිය පවරා දි |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රමාණයෙන් හෙක්ටයාර් 74.4 කට ආසන්න ප්‍රදේශයක් එනම් මුළු භූමි භාගයෙන් සියයට 36.5 ක් අනවසර පදිංචිකරුවන් භුක්ති විඳිනු ලබන අතර අවස්ථා 02 කදී පලතුරු සංවර්ධන ආයතනයට අයත් භූමියෙහි අනවසර පදිංචිකරුවන් නිවාස 02 ක් ඉදිකර තිබුණි. | නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඇත. | නොමැත. |
| 7. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සඳහා කෘෂි කාලගුණ දත්ත රැස්කිරීම, විශ්ලේශණය හා සන්නිවේදනය කිරීමේ අරමුණින් එනම් වර්ෂාපතනය, පාංශු උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, සුළඟේ වේගය, සුළඟේ දිශාව ආදිය මැනීමට කෘෂි කාළගුණ කලාප 46 ක් හඳුනාගෙන ඇතත් ඉන් කලාප 18 ක කෘෂි කාලගුණ මිණුම් ස්ථාපිත කර නොතිබුණි. | කෘෂි කාලගුණික මිනුම් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම. | ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප 46 න්, ප්‍රධාන කෘෂිකර්මික භූමි වැඩි වශයෙන් පවතින කලාප බොහොමයක් (කලාප 28 ක්) සඳහා කාලගුණ ඒකක පිහිටුවා ඇත. | සෑම කලාපයක්ම ආවරණය වන පරිදි කාලගුණ ඒකක පිහිටුවා නැත. |
| 8. | වසරකට රු.මිලියන 06 ඉක්මවන විදුලි වියදමක් දරන පැළැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ විදුලිය ඇනහිටිමේදී දැරීමට සිදුවන අතිරේක ඉන්ධන වියදම අවම කර ගැනීමේ අරමුණින් සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපිත කිරීම කෙරෙහි 2017 වර්ෂයේදී අවධානය යොමුකර තිබුණ ද 2019 ඔක්තෝබර් 30 දින වන විටත් එම කාර්යය ඉටුකර නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේ දී මේ සඳහා මුදල රුපියල් මිලියන 22.75 ක ඇස්තමේන්තුවක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් ලබාගත් අතර, ඒ සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත ඉල්ලුම් කළ ද එම වර්ෂයේ රෝහල් සඳහා ප්‍රමුඛතාවය | සූර්ය බලශක්ති පද්ධතියක් මෙතෙක් ස්ථාපනය කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලබාදෙන බැවින් අදාල ප්‍රතිපාදන ලබාදිය නොහැකි බව දන්වන ලදී. | |
| 9. | (අ) විදේශ ශිෂ්‍යත්ව සඳහා විදේශගත වී ගිවිසුම් කඩ කරන ලද නිලධාරීන් 44 දෙනෙකු සම්බන්ධයෙන් රජයට අයවිය යුතු එකතුව රු.30,739,883 ක මුදල් 2020 ජුනි 06 වන දින වන විටද අය කරගෙන නොතිබුණි. | රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | විදේශ ශිෂ්‍යත්ව සඳහා විදේශගතවී ගිවිසුම් කඩ කරන ලද නිලධාරීන් 44 දෙනා සම්බන්ධයෙන් රජයට අයවිය යුතු මුදලේ එකතුව රු.22,689,459.48 ක් වන අතර, ගරු නීතිපති තුමා විසින් ඉදිරි නීති කටයුතු කළ නොහැකි බව දන්වන ලද නිලධාරීන් 11දෙනාගෙන් අයවිය යුතු රු.8,074,360.45 කි. | අය විය යුතු මුදල අය කරගෙන නොමැත. |
| | (ආ) ශිෂ්‍යත්ව මුදල් අයකරගැනීමට නොහැකිවී පවතින නිලධාරීන් 05 දෙනෙකුගේ ශිෂ්‍යත්වවල වටිනාකම රු.2,445,820 වන නමුත් කාලාවරෝධනය ලක් විම මත රජයට අයවිය යුතු මුදල් අය කර ගැනිමට නිතිමය පියවර ගත නොහැකි වී තිබුණි. | රජයට අයවිය යුතු මුදල් අය කර ගැනිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | කාලාවරෝධනයට ලක්වීම මත රජයට අයවිය යුතු ශිෂ්‍යත්ව මුදල් කර ගැනීමට නීතිමය පියවර ගත නොහැකිවී පවතින නිලධාරීන් 05 දෙනාගෙන් අයවිය යුතු මුදල රු.2,445,819.98 කි. | අදාළ මුදල් අය කරගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | **2020 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ඇතුලත් ඡේද** | | | |
| | **--------------------------------** | | | |
| 10. | මුදල් රෙගුලාසි 175(2) අනුව ගොවිපළ අත්තිකාරම් ගිණුමට අදාළව වර්ෂ 01 ට වැඩි ණයගැතියන් 67 කට අදාළව රු. 3,275,852ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මෙම අත්තිකාරම් ගිණුමේ බීජ හා රෝපණ ද්‍රව්‍ය ණයට ලබාදීම සිදු කරයි. එසේ නිකුත් කරන්නේ අදාළ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලවලින්, ගොවිපළවලින් හා අලෙවිසැල් මගින් රාජ්‍ය ආයතනවලට වේ. ඒවා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ වන විටත් කමිටුවක් මගින් අවශ්‍ය කටයුතු කරමින් පවතී. | මුදල් අය වී නොමැත. |
| 11. | ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4:2:2, 4:2:4, 4:2:5, 4:3, 4:4, 4:5, 4:6 හා 6:3 වගන්ති අනුව මියගිය, විශ්‍රාම ගිය, සේවා කාලය ප්‍රමාණවත් නොවීම නිසා විශ්‍රාම වැටුපක් රහිතව විශ්‍රාමගිය වැඩ තහනම් කර ඇති, විදේශගතව සේවය හැර ගිය හා මධ්‍යගත කිරීම යටතේ විවිධ අංශ මඟින් මාරු කර තිබූ නිලධාරීන් 92 කට අදාළව එකතුව රු.5,369,088 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය කර ගත යුතුව පැවතුණි. | ආයතන සංග්‍රහයේ XXIVවන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | නිලධරයන් විසින් ආපදා ණය අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී නිවැරදිව අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා උපදෙස් පත්‍රිකාවක් සකස් කර ඇත. මෙම උපදෙස් පත්‍රිකාව ණය අයදුම්පත් සමඟ නිලධාරීන් වෙත නිකුත් කරනු ලබයි. ණයකරුගේද ඇපකරුවන්ගේද ජාතික හැඳුනුම්පත්වල සහතික පිටපත්, | අදාළ මුදල අය කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පෞද්ගලික ලිපිනයත්, දුරකථන අංකයත් අනිවාර්යෙන්ම ලබා ගැනීමට කටයුතු කිරීම. | |
| 12. | රජයේ ඉඩම් පිළිබඳ කාර්යය සංග්‍රහයේ 224 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් මැනීම් සිදු කර විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන 10 කට අදාළ හෙක්ටයාර 3901.82 ක් වූ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2943.07 ක් පවරාගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව භුක්ති විඳින සියළුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුත කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් මැනීම් සිදු කර විධිමත්ව පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි. | මෙතෙක් අදාළ ඉඩම් පවරාගෙන නොමැත. |
| 13. | ශාක නිරෝධායන ඒකකය වෙත 2019 ඔක්තෝබර් 29 වන දින මිලදී ගන්නා ලද වටිනාකම රු. 3,594,672 ක් වූ ඉන්ක්‍යුබ්ලේටර් උපකරණය විගණන දින වූ 2020 නොවැම්බර් 10 දින වන විටත් තෙකලා විදුලිය ලබා නොගැනීම හේතුවෙන් මාස 11 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. | ඉන්ක්‍යුබ්ලේටර් උපකරණය උපයෝජනය සඳහා වන ක්‍රියාමාර්ග ගෙන ඇත. | අදාළ උපකරණ මෙතෙක් උපයෝජනය කර නොමැත. |
| 14. | තරුණ ගොවි සමාජ මූලස්ථානය මගින් 2009 වර්ෂයේ ලංකා බැංකුවේ තැන්පත් කරන ලද හා 2008 වර්ෂයේ මහජන බැංකුවේ තැන්පත් කරන ලද ස්ථාවර තැන්පතු 2019 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙළින් | සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. | අරමුදල් භාවිතා කිරීම සම්බන්ධව තීරණ ගැනීමේ බලය ජාතික බළ මණ්ඩලය සතුවන අතර ජාතික බල මණ්ඩලය කැඳවා, ඒ සම්බන්ධව අවසන් | මුදල් ඵලදායක කාර්යයක යොදවා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.1,212,500 ක සහ රු. 1,027,271 ක් දක්වා වර්ධනය වී තිබුණි. එම ස්ථාවර තැන්පතු මුදල් ප්‍රයෝජනවත් කටයුත්තක යෙදවීම කෙරෙහි අවධානය යොමු නොකර 2020 දෙසැම්බර් 31 දින වන විටද ඌන උපයෝජිතව පැවතුණි. | | තීරණයකට එළඹීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. | |
| 15. | දෙපාර්තමේන්තුවේ කටයුතු විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට සේවා අවශ්‍යතා සුදුසු අවස්ථාවේදී හඳුනා ගනිමින් අවශ්‍ය අවස්ථාවේ බඳවා ගැනීම් සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 2685 ක් පිරවීමට පැවතුණි. | කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | අදාළ පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | පුරප්පාඩු පුරවා නොමැත. |

ශීර්ෂ 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වයන් |
|---|---|---|---|---|
| 1. | ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අන්තර් පළාත් ගොවි ජනපද මඟින් ඉඩම් බදු ආදායම් රැස්කරන අතර 2020 වර්ෂය අවසන්වන විට රු. 57,991,589 ක හිඟ බදු ආදායමක් පැවතුණි. හිඟ බදු ආදායමෙන් සියයට 60 ක් හෙවත් රු.34,774,562 වසර 2 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | මුදල් රෙගුලාසි 175 (2) හා 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛනයේ 4(ආ) ඡේදය ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීම හා සමුච්චිත හිඟ ආදායම ඉහළ යාම පාලනය සඳහා ක්ෂණික පියවර ගත යුතුය. | බදු මුදල් අයකරගනිමින් පවතී | 2021.12.31 අවසන් වන විට අයකරගෙන තිබුණේ රු.10,323,642 ක මුදලක් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 2. | 2020 වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කළ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 2.1 පරිච්ඡේදයට අනුව හිඟ ආදායම් අයකර ගැනීමට අපේක්ෂිත නීත්‍යානුකූල පියවර ලෙස, බදු නොගෙවන බදුකරුවන් 235 ක් හඳුනා ගැනීම, බදුකරුවන් 167 ක් දැනුවත් කිරීම හා හිඟ අයකර ගැනීම, බදු කර 8 ක් අවලංගු කිරීම හා නඩු 04 ක් දැමීම සඳහන් වුවද, 2020 වර්ෂය අවසන් වන විට බදුකර 04 ක් අවලංගු කිරීම හැර අන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. ඒ අනුව හිඟ බදු අයකර ගැනීමේ ක්‍රියාවලිය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් ඉලක්ක සහ කාර්යයන් ඉටු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | සැලසුම් සහගත ලෙස හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කර නැත. |
| 3. | පොදු තැන්පතු ගිණුම් 03 කට අදාළව 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.67,673,837 ක ශේෂයෙහි ඇතුළත් වසර 2 ක් ඉක්මවූ රු.65,027,738 ක තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තැන්පතු ආපසු ගෙවීමට හෝ හිමිකම් නොපාන බව තහවුරු වන්නේ නම් ආදායමට ගැනීමට ක්‍රියාකළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.<br>පොදු තැන්පතු ගිණුම් 03 හි 2021/12/31 දිනට ශේෂය 68,489,901 ක් වූ අතර වසර 2 ඉක්ම වූ තැන්පතු වටිනාකම 65,777,522 කි. | මිහිකත මැදුර සිව්වන මහළ ඉදිකිරීම සඳහා 2021/05/04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් තැන්පතු මුදලින් රු.63,406,325 ක් යෙදවීමට අනුමැතිය ලැබී තිබුණද අදාළ ඉදිකිරීම් ආරම්භකර නොතිබුණි. ඉතිරි මුදල් 2022 වර්ෂයේදී ඉල්ලීම් ඉදිරිපත් නොවුනහොත් ආදායම් ගිණුමට බැරකරන බව |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වාර්තාකර ඇත. |
| 4. | ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 20 ක් පමණ වන රජයේ ඉඩම් සම්බන්ධ සෘජු වගකීම දෙපාර්තමේන්තුවට පැවරේ. එම ඉඩම් වලට අදාළව, 1931 වර්ෂයේ දෙපාර්තමේන්තුව පිහිට වූ දින සිට බැහැර කිරීම් සටහන් කරමින් යාවත්කාලීන කරන ලද ඉඩම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ පාලනයට යටත් ඉඩම් ප්‍රමාණය බැහැර කර ඇති ප්‍රමාණය හා අනවසර භාවිතයේ පවතින ඉඩම් පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. | රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පිළියෙලකර නොමැත. | මේ දක්වා ඉඩම් ලේඛණයක් සකස් කර නැත. |
| 5. | රජයේ ඉඩම් බදු දීම තුළින් ආදායම් රැස් කිරීම පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල 09 ක් හා නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 08 ක් මඟින් සිදු කරනු ලබන අතර 2020 වර්ෂයේ දී රැස් කරන ලද ආදායම හා 2020 වර්ෂය අවසන්වන විට හිඟ බදු වටිනාකම සම්බන්ධ තොරතුරු 2013 වර්ෂයේ ආරම්භ කළ තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | බදු දීම ඇතුළු ඉඩම් තොරතුරු ලබා ගැනීමට හැකි වන ලෙස පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගෙන යායුතුය. | තොරතුරු පද්ධතියට දත්ත ඇතුළත් කරමින් පවතී. | බදු දුන් ඉඩම් පිළිබඳ තොරතුරු මෙම පද්ධතිය තුළින් ලබා ගත නොහැකිය. |
| 6. | 2020 වර්ෂයේ දී e-slims පද්ධතිය මඟින් දීමනා පත්‍ර 10,000 ක් ලබාදීමට සැලසුම් කර තිබුන ද ලබා දී තිබූ ප්‍රමාණය 4,195 හෙවත් සියයට 42 ක් පමණක් විය. | සැලසුම් කළ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය | වැළැක්වීමේ ක්‍රියාමාරග ගෙන නොමැත. | 2021 වර්ෂයේ ලබාදීමට සැලසුම්කළ 10,000 න් ක් 7414 හෙවත් සියයට 74 ක් පමණක් ලබාදී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 7. | 2018 මාර්තු දිනැති අංක - 2018/01දරන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ වගන්ති අංක 1.2.3 හා 1.2.4 ප්‍රකාරව රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන අනෙකුත් ආයතනයන්ගෙන් ලබාගත් අනවසර අල්ලා ගැනීම් පිළිබඳ තොරතුරු ඇතුළත් මාසික වාර්තාවක් ප්‍රාදේශීය ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රදානත්වයෙන් පැවැත්වෙන මාසික රැස්වීමට යොමු කළ යුතු අතර එහි සමාලෝචන වාර්තාවක් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය. අනවසර අල්ලා ගැනීම් පිළිබඳ නෛතික හා අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉඩම් බලධරයා ලෙස ප්‍රාදේශිය ලේකම් දරන වියදම් සඳහා ප්‍රතිපාදන ලබාදීම ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් සිදු කළද, අනවසර අල්ලාගැනීම් පාලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය අවම මට්ටමක පැවතීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අනවසරයෙන් අල්ලා ගත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 13,167 ක් ලෙස දෙපාර්තමේන්තු කාර්යසාධන වාර්තා මගින් ඉදිරිපත්කර තිබුණි. | අනවසර අත්කර ගැනීම පිළිබඳ යාවත්කාලීන තොරතුරු රැස් කර ගැනීමට හා එම අත්පත් කර ගැනීම් අවම කිරීමට කටයුතු කළ යුතුය. | රජයේ ඉඩම් පිළිබඳව තොරතුරු රැස් කර ගැනීමේ වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක කර ඇති බව වාර්තාකර ඇත. | රජය සතු ඉඩම් හඳුනාගෙන අනවසර අල්ලා ගැනීම් පාලනය කිරීම සඳහා මේ දක්වා පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 8. | රජය සතු ඉඩම් 05 ක් පෞද්ගලික පාර්ශ්ව 03 කට හා රාජ්‍ය ආයතන 02 කට වාර්ෂික බදු පදනම මත ලබා දී තිබූ අතර එම බදු කරුවන්ගෙන් 2020 වර්ෂය අවසන්වන විට අය වීමට පැවති රු.106,357,656 ක් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | කාලීනව බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ගෙවිය යුතු මුදලින් රු.30,216,249 ක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගෙවා ඇති බව වාර්තාකර තිබුණි. | තවදුරටත් අයවිය යුතු බදු මුදල රු.76,141,401 කි |
| 9. | ඉඩම් හෙක්ටයාර් 0.020 ප්‍රමාණයක් නේවාසික කටයුත්තක් සඳහා අමරානන්ද රත්නායක යන අයට වර්ෂ 30 ක කාලයක් සඳහා බදු දී තිබුණ ද බදු ගිවිසුමේ 4 වන වගන්තිය ප්‍රකාරව බදු අරමුණ වෙනුවෙන් මෙම ඉඩම යොදාගෙන නොමැති බව ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවට දන්වා තිබුණි. එහෙත් අදාළ ඉඩම නැවත පවරා ගැනීමට හෝ විධිමත්ව බදු දීමට කටයුතු නොකර බදු හිමිකම බදුකරුගේ දියණියට පවරා දී තිබුණි. | බදු ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත | දැනට ඉඩම භුක්තිවිඳින බදුකරුගේ දියණිය එම ලිපිනයේ පදිංචි නොමැති බැවින් හිඟ බදු මුදල් අයකරගැනීමේ කටයුතු සිදුනොවන බව වාර්තාකර ඇත. |
| 10. | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි රූඩ්.01 පර්චස් 17.5 ක හා අක්කර 01 රූඩ් 01 පර්චස් 5.06 ක රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු පදනම යටතේ පිළිවෙලින් 1977 නොවැම්බර් 30 වන දින හා 1987 ජනවාරි 01 දින සිට වර්ෂ 30 ක කාලයක් සඳහා"80 සමාජය" නම් ක්‍රීඩා | ඉඩම්වල භුක්තිය භාර දෙන අවස්ථාවේදී නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීමට හා බදු කාලය ඉකුත් වූ වහාම ගිවිසුම දීර්ඝ කිරීමට හෝ නැවත බදු දීමට කටයුතු කළ යුතුය. | මෙම ඉඩම් කොටස සංවර්ධන කටයුත්තක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට "80 සමාජය" නැමැති ක්‍රීඩා සමාජය වෙතින් | රු.20,037,368 ක හිඟ බදු මුදල් ගෙවා නිදහස් දීමනාපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | සමාජය වෙත බදුකරයක් නොමැතිව බදු දී තිබුණි. කාලය අවසන් වීම හේතුවෙන් බදු කාලය දීර්ඝ කර තිබුණද ඒ සඳහාද බදුකරයක් නිකුත් කර නොතිබුණි. | | භුක්තිය භාරගැනීමට කටයුතු කර ඇති බව වාර්තාකර ඇත. | |
| 11. | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පර්චස් 29.88 ක රජයේ ඉඩමක් 1999 වර්ෂයේ දීර්ඝ කාලීන බදු පදනම යටතේ සීමා සහිත ස්වාධීන රූපවාහිනී සේවය වෙත ලබා දී තිබුණද ගෙවියයුතු බදු මුදල දැනුම් දීමට භුක්තිය බාරදුන් දින සිට කටයුතු කර නොමැති අතර වර්ෂ 10 ක කාලයක කිසිදු බදු මුදලක් අයකරගෙන නොතිබුණි. ඒ අනුව 2019 අවසානය වන විට අයවීමට ඇති හිඟ බදු මුදල රු.36,225,000 කි. එසේ වුවද ඉඩම් බදු දීමේ දී නීත්‍යානුකූලභාවය ආරක්ෂා වන පරිදි බදුකරයක් නිකුත්කර නොතිබීම හේතුවෙන් බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් බදුකරුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග වලට එළඹීමේ හැකියාවක් නොතිබුණි. | ඉඩම් වල භුක්තිය භාර දුන් වහාම ගෙවිය යුතු බදු මුදල බදුකරු වෙත දැනුම් දිය යුතු වන අතර අප්‍රමාදව අදාළ බදුකරු සමඟ නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීම තුළින් හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බදුකරු සමග ගිවිසුමකට එළඹීම හා හිඟ බදු මුදල් අයකිරීමට කටයුතුකර නොමැත. | ඉදිරියේදී හිඟ බදු ගෙවීම සම්බන්ධයෙන් බදුකරු සාකච්ඡා කිරීමට ප්‍රතිචාර නොදක්වන්නේ නම් බදු අනුමැතිය අවසන්කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 12. | සංචාරක නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා පුද්ගලික සමාගමකට 2006 වර්ෂයේදී වසර 30 ක කාලයක් සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ලබා දී ඇති මහනුවර ගඟවට | කාලීනව බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය | හිඟ බදු මුදල් අයකරගැනීමට කටයුතුකර නොමැත. | 2006 වර්ෂයේ මෙම ඉඩමේ වානිජ වටිනාකම රු. මිලියන 46 ක් ලෙස තක්සේරුකර ඇති බවත්, බදුකරු විසින් සහනයක් |

| | | | | |
|---|---|---|---|---|
| | කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර් 0.238 ක රජයේ ඉඩම එම බදුකරු විසින්ම 1995 වර්ෂයේ සිටම 2006 වර්ෂය දක්වා වසර 11 ක් අනවසරයෙන් භුක්ති විඳ ඇති අතර රජයේ තක්සේරුකරුගේ තක්සේරුව අනුව එම කාලයට අදාළව රජයට අහිමි වී ඇති බදු ආදායම රු.6,932,500 ක් බව නිරීක්ෂණය වේ. ඉඩමේ අයිතිය තහවුරු කර ගෙන නොමැති බව දක්වමින් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා මෙම අනවසර භුක්තිය පිළිබඳව නෛතික ක්‍රියාමාර්ගවලට අවතීර්ණව නොතිබීම මතභේදාත්මක කරුණක් බව නිරීක්ෂණය විය. | | | සලසන ලෙස කළ ඉල්ලීම සලකා බැලීමට අවශ්‍ය තොරතුරු ඉල්ලුම්කර ඇති බවත් වාර්තාකර ඇත. |

ශීර්ෂ 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වයන් |
|---|---|---|---|---|
| 1. | 2020 වර්ෂය සඳහා බිම්සවිය වැඩසටහන වෙනුවෙන් රු.87,930,359 ක ප්‍රතිපාදනයක් සලසා ගෙන ඉඩම් කැබලි 70,560 ක් සඳහා හිමිකම් සහතික නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද එම මුළු මුදලම වැයකර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉඩම් කැබලි 23,411 ක් සඳහා පමණක් හිමිකම් සහතික නිකුත් කර තිබුණි.ඒ අනුව හිමිකම් සහතිකයක් නිකුත් කිරීමට ඇස්තමේන්තුගත මුදල රු.1,246 ක් වුවත් රු.3,756 ක් වැයකර තිබුණි. | වියදම් දැරීමේදී ආර්ථිකවත්බව පිළිබඳ අවධානය යොමුකළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේදී හිමිකම් සහතික 60,000 ක් නිකුත් කිරීමට සැලසුම් කර රු. 124,000,000 ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, වර්ෂය තුළ දරන ලද වියදම රු. 94,405,621 කි. වර්ෂය තුළ නිකුත් කර තිබූ හිමිකම් සහතික සංඛ්‍යාව 13,907 ක් වීමෙන්, සහතිකය නිකුත් කිරීමට ඇස්තමේන්තු ගත මුදල රු. 2,067 ක් වුවත් රු. 6,788 ක් වැය කර තිබුණි. |
| 2. | බිම්සවිය වැඩසටහන යටතේ හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ක්ෂේත්‍ර විමර්ශන පැවැත්වීම,12 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයට කඩයිම් සිතියම් ලබාගැනීම, හිමිකම් අයදුම්පත් බෙදා දීම, ඉඩම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ පත්‍රිරු පරීක්ෂා කිරීම, 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම, 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සහ ඉඩම් | සැලසුම්ගත ඉලක්ක ළඟාකරගැනීමට මෙම වැඩසටහන යටතේ ආයතනයට පැවරී ඇති කාර්යයන් කාර්යක්ෂමව ඉටු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 වර්ෂ අවසානයේදී එම වැඩ කොටස්වල සැලකිය යුතු ප්‍රගතියක් නිරීක්ෂණය නොවිය |

| | | | | |
|---|---|---|---|---|
| | රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව වෙත ඉඩම් කැබලි පිළිබඳ තොරතුරු යැවීම යන සියලු අදියරයන් සම්පූර්ණ විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ සැලසුම්ගත ඉලක්ක අගෝස්තු 28 දින සංශෝධනය කිරීමෙන් පසුවද පළමු හා දෙවන අදියර හැර සෙසු අදියරයන්හි ප්‍රගතිය සියයට 52 සිට සියයට 67 අතර පහළ පරාසයක පැවතුණි. | | | |
| 3. | හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය අතරතුර සිදුවූ ගැටළු හේතුවෙන් 2015 සිට සමාලෝචිත වර්ෂය දක්වා ලිපිගොනු 505,959 ක් පසෙක තබා තිබූ අතර ඉන් ලිපි ගොනු 52,092 ක් පමණක් එනම් සියයට 10 ක් පමණ නිරවුල් කර තිබුණි .මෙම ක්‍රියාවලියේ අදියරයන් අතර විධිමත් සම්බන්ධතාවයක් නොමැති වීම හේතුවෙන් මේ ආකාරයට වැඩසටහනේ අරමුණ වූ හිමිකම් සහතික නිකුත් කිරීම ප්‍රමාද වී තිබුණි. | ගැටළු හා සම්බන්ධ අනෙකුත් ආයතන සහ පාර්ශව හඳුනාගෙන එම පාර්ශවයන්ගේ දායකත්වයද සහිතව ගැටළු කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට පසෙක තබන ලද මුළු ලිපිගොනු සංඛ්‍යාව 455,271ක් බව වාර්තා කර තිබුණු අතර වැලිගෙපොළ, රත්මලාන, දෙහිවල, නල්ලූර් ප්‍රාදේශීය කාර්යාලවලින් පසෙක තැබූ ලිපිගොනු පිළිබඳ තොරතුරු මෙතෙක් ඉදිරිපත් කර නොතිබුණි. |
| 4. | බිම්සවිය වැඩසටහන 2002 වර්ෂයේ ආරම්භ කර 2021 වර්ෂය අවසන් වන විට නිම කිරීමට මූලිකව සැලසුම් කර | සැලසුම් කළ පරිදි ඉලක්කයන් ළඟාකර ගැනීමට විධිමත් වැඩ පිළිවලක් සකස් කළ යුතු වීම. | මේ වන විට බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක නොවන ප්‍රදේශවල රජයේ ඉඩම් මැනුම් කර සකස් කරනු ලබන කැඩැස්තර සිතියම්වල ඉඩම් කොටස් වලට අදාළව හිමිකම් | 2022 වර්ෂය වන විටත් සැලසුම් කළ වැඩ සටහන අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 17 ක් ගත වී තිබුණත් එම වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 ට අයත් මුළු ග්‍රාම නිලධාරි කොට්ඨාශ 3,899 න් මිනුම් කටයුතු අවසන් කර තිබුණේ කොට්ඨාශ 1,359 ක එනම් සියයට 38 ක පමණි. | | ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව, ඉදිරියේදී දිවයිනේ පවතින ඉඩම් කොටස්වලින් බහුතරයක හිමිකම් ලියාපදිංචිය සිදු කිරීමට හැකියාව ලැබෙනු ඇති බව වාර්තා කර ඇත. | |
| 5. | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 05 ක් තුළ බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඉලක්ක පිහිටුවීම දිගින් දිගටම පහත හෙළා ඇති බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව විසින් ඉලක්ක පිහිටුවීමේදී පෙර වර්ෂයේ ප්‍රගතිය, ලැබී ඇති ප්‍රතිපාදන, සේවක සංඛ්‍යාව, ආයතනයේ ශක්‍යතාවය හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කඩයිම් සිතියම් ලබාදීමට සකසා ඇති ඉලක්ක සැලකිල්ලට ගත යුතු වීම. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි කෙසේ වුවද පසෙක තැබූ ගොනු යලි විමර්ශනය කර ගැටලු නිරවුල් කර හිමිකම් ලියාපදිංචි කිරීමේ අරමුණින් යලි විමර්ශනය කරනු ලබන පසෙක තැබූ ගොනු ප්‍රමාණය ද පදනම් කරගනිමින් ඉලක්ක සකස් කිරීම ආරම්භ වූ පසු ඉලක්ක පහත හෙළීමක් සිදු වී නොමැත. | පසුගිය වර්ෂවලට සාපේක්ෂව ඉලක්ක පිහිටුවීම 2021 වර්ෂයේ පහත හෙළා තිබුණි.<br><br>ක්ෂේත්‍ර විමර්ශන පැවැත්වීම, ඉඩම් රෙජිස්ටාර් පරීක්ෂණ පැවැත් වීම සියයට 30 කින්ද, 12 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයට ලැබුණු කඩයිම් සිතියම් සංඛ්‍යාව සියයට 22 කින්ද, 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා අනුමැතිය ලැබීම සියයට 17 කින්ද 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සියයට 18 කින්ද, ඉඩම් රෙජිස්ටාර්ට යවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව සියයට 15 කින්ද පහත හෙළා තිබුණි. |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 6. | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙළ කර ක්‍රියාත්මක කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙළ කළ යුතුය. | 1998 අංක 21 දරන නිරවුල් කිරීමේ පනතේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ විෂයය ක්ෂේත්‍රය තුළ පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තියේ නියමයට අනුකූලව මහජන සේවාවන් පවත්වාගෙන යාමේ අපහසුතාවයන් පවතින බව වාර්තා කර ඇත. | 2022 වර්ෂය වන විටත් පිළියෙළ කර නොමැත. |
| | | | | |
| 7. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සැලැස්ම පිළියෙළ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි මානව සම්පත් සැලැස්ම පිළියෙල කළ යුතුය. | මානව සම්පත් සැලැස්ම ඉදිරියේදී පිළියෙළ කර අවසන් කරන බව වාර්තා කර ඇත | 2021 වර්ෂය සඳහාද පිළියෙල කර නොමැත. |

ශීර්ෂ 288 - ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | **2018, 2019 හා 2020** | | | |
| 1. | දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි, ස්ථාන සියයක පිහිටි රු.මි. 5,689 ක් ලෙස අගයකර ගිණුම්ගත කර ඇති හෙක්ටයාර් 49.477 ක ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පු, පිඹුරු සහ ඉඩම් ලබාදීමේ සහතික සහ දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථාන 76 ක පිහිටි රු.මි. 1,009 ක් ලෙස අගය කර ඇති වර්ග අඩි 666,737 ක දෙපාර්තමේන්තු ගොඩනැගිලිවල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට එම ගොඩනැගිලි ඉදිකළ භූමිභාගවල ඔප්පු සමාලෝචිත වර්ෂයේදීද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | අදාළ දත්ත පද්ධතියට සනාථ කරන ලද තොරතුරු ඇතුළත් කිරීම. | දැනට ගිණුම්ගත කර ඇති ඉඩම් 99 ක හා ගොඩනැගිලි 94 ක පිඹුරු පිටපත් 84 ක හා ඔප්පු හෝ හිමිකම් සහතික 59 ක තොරතුරු අදාළ පද්ධතියට ඇතුළත් කර ඇත. තවදුරටත් තහවුරු කල යුතු ඉඩම් හා ගොඩනැගිලි පවතී. |
| 2. | දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් අටක 2020 වර්ෂයේ එකතුව රු.4,944,336 ක්වූ ඉතිරිවීම් තිබුණු නමුත්, එම වැය විෂයයන් යටතේ එළඹ තිබුණු බැරකම් ප්‍රමාණය රු.20,791,007 ක් වූ බැවින් ඉතිරිය ඉක්මවූ බැරකම්වල එකතුව රු.15,846,671 ක් විය. | ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට එළඹීමට කටයුතු නොකළ යුතු වීම. | 2021 වර්ෂයේදී එසේ බැරකම්වලට ඇතුළත් නොවන ලෙස පළාත් සර්වේයර් ජනරාල් දැනුවත් කිරීම. | 2021 වර්ෂයේදී ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 3. | පාඩු හා හානි ගිණුමේ 2020 වර්ෂය අවසානයට කපා නොහළ ඉදිරියට ගෙන ආ ශේෂවල වටිනාකම රු.7,580,614 ක් වූ අතර ඒ තුළ තිබූ වසර පහත් තිස් එකත් අතර පරාසයක වූ පාඩු හා හානිවල වටිනාකම රු.2,753,891 ක් විය. | පාඩු හා හානි නොපමාව පොත්වලින් කපා හළ යුතු වීම. | අදාළ ගොනු පිළිබඳ ගිණුම් කටයුතු සිදු කරන ලෙස දැනුම් දී ඇත. | 2020 වර්ෂයේ හානි හා පාඩු මුළු වටිනාකම රු. 8,828,705 කි. කපා හැර ඇති වටිනාකම රු.3,003,608 ක් වන අතර, තවදුරටත් ක්‍රියාකරමින් ඇති මුදල රු.5,825,097 කි. |
| 4. | 2020 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපොහොසත් වී තිබුණු මැනුම් නියෝග සංඛ්‍යාව 29,105 ක් වූ අතර, ඒ තුළ 2015 වර්ෂයට පෙර සිට 2019 වර්ෂය අවසානය දක්වා නිම කිරීමට නොහැකි වී තිබුණු මැනුම් නියෝග 27,932 ක්ද විය. | උසාවි මැනුම් නියෝග ඇතුළු හිඟ හිටව ඇති මැනුම් නියෝග ප්‍රමාණය නිම කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වීම. | නවක මිනින්දෝරුවරුන් බඳවා ගැනීමට කටයුතු කිරීම. | 2015 වර්ෂයට පෙර සිට මේ දක්වා නිම කිරීමට නොහැකි වී ඇති මැනුම් නියෝග 15,097 ක් තවදුරටත් ඉතිරිව ඇත. |
| 5. | 2020 වර්ෂය අවසානය වන විට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ හිඟහිටි ණය ශේෂවල එකතුව රු.10,635,305 ක් වූ අතර, ඒ තුළ එකතුව රු.3,710,891 ක්වූ වර්ෂ 05 ඉක්මවූ ශේෂයන් නිරීක්ෂණය විය. | කාලීනව ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදාළ ගොනු පිළිබඳ ගිණුම් කටයුතු සිදු කරන ලෙස දැනුම් දී ඇත. | 2020 වර්ෂය අවසානයේ නිරවුල් නොවූ ණය ශේෂය රු. 11,297,272 ක් වන අතර, එයින් මේ වන විට නිරවුල් වී ඇති මුළු ණය ශේෂය රු. 6,143,918 කි. නිරවුල් වීමට ඇති ණය ශේෂය රු. 5,153,354 කි. |

| | | | | |
|---|---|---|---|---|
| 6. | මධ්‍යම, උතුරුමැද, නැගෙනහිර හා වයඹ යන පළාත්වල දෙපාර්තමේන්තුවට අයිති හිස් ඉඩම් හෙක්ටයාර් 1.3139 ක්ද, අනුරාධපුරය සහ ගලේවෙල යන ස්ථානවල ගොඩනැගිලි ඉදිකළ ඉඩම් 02 ක්ද, බදුල්ල ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරි නිල නිවස සහ අනුරාධපුරය පෙරසවි කඳවුර ඇතුළු දකුණු පළාතේ තවත් ගොඩනැගිලි 02 ක්ද 2020 වර්ෂයේ අවසානය දක්වාම තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි. | ආයතනය සතු වත්කම් තක්සේරු කොට ගිණුම්ගත කළ යුතු වීම. | සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන් සහ දිස්ත්‍රික් ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් මේ පිළිබඳ දැනුවත් කර ඇත. | මේ දක්වා තක්සේරු කර ගිණුම්ගත කිරීම අවසන් කර නැත. |
| 7. | දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරයකුගේ මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව (Norms) 20 ක් ලෙස වර්ෂ 36 කටත් පෙර පිහිටුවාගත් සම්මතය මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමඟ වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර නොතිබුණි. | මැනුම් ශිල්ප ක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමඟ වර්තමානයට ගැලපෙන ආකාරයට මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව අප්‍රමාදව සමාලෝචනය කළ යුතුය. | විගණනයෙන් පෙන්වා දුන් පරිදි අදාළ සංශෝධන සිදු කළ නමුත් ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ දැනුම්දීම පරිදි එය තාවකාලිකව අත්හිටුවා ඇත. | මේ දක්වා එම තත්ත්වය වෙනස් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නැත. |

ශීර්ෂ 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

<table>
<tr><td></td><td>විගණන නිරීක්ෂණය</td><td>විගණකාධිපතිගේ නිර්දේශය</td><td>ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග</td><td>ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය</td></tr>
<tr><td></td><td>-----------------------</td><td>--------------------</td><td>-----------------</td><td>---------</td></tr>
<tr><td>1.</td><td><table><tr><td></td><td>රු.</td><td></td></tr><tr><td>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>----------------</td><td></td><td></td></tr><tr><td>xxiv පරිච්ඡේදයේ 04 වගන්තිය</td><td>899,725</td><td>විවිධ හේතූන් මත සේවයේ නොයෙදෙන නිලධාරීන්/සේවකයින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු ණය මුදල් සම්බන්ධයෙන් 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ කටයුතු සිදුකර නොතිබුණි.</td></tr></table></td><td>ණය ගිවිසුම් ප්‍රකාරව හිඟ ශේෂ අය කර ගැනීමට පියවර ගත යුතුය.</td><td>විවිධ හේතූන් මත සේවය අතහැර යාම්, වයස අවුරුදු 45 ට වැඩි සේවකයින් ස්ථිර කිරීම, ව්‍යාජ සහතික ඉදිරිපත් කර සේවයට බැඳුන සේවකයන් 10 දෙනෙකුගෙන් අය විය යුතු මුදල් වන අතර ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග අවසන් වූ වහාම අය කර ගැනීමට කටයුතු කරන බව.</td><td>2021 දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නැත.</td></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>2.</td><td>2016 සැප්තැම්බර් 19 දිනැති අංක 01/2016 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව</td><td>වැඩිපුර ගෙවීම් අඩිහාර විය යුතුය.</td><td>සංචිත වාහන ලෙස ලබා ගත් මෙම වාහන</td><td>වැඩිපුර ගෙවීම් සම්බන්</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබාගැනීමේදී අධ්‍යක්ෂවරු හා ඊට සමාන මට්ටමේ නිලධාරීන් සඳහා ලබාගන්නා වාහනයක වැට් රහිත උපරිම මාසික බදු කුලිය රු.135,000 ක් විය යුතු වුවද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු අධ්‍යක්ෂවරු 08 දෙනෙකු සඳහා අනුයුක්ත කර තිබුණු වාහනවලට වැට් රහිත මාසික කුලිය රු.163,500 ක් ගෙවීම නිසා වසරකට රු.2,736,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | කි.මී.3000 ධාවනයට ක්ෂේත්‍ර පරීක්ෂණ හා අනෙකුත් රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා අදාළ අධ්‍යක්ෂවරු භාවිතා කරයි. | ධයෙන් ඉදිරි කටයුතු කර නැත. |
| | | | | |
| 3. | 1978 වර්ෂයේ මිශ්‍ර වගා ආදර්ශකයක් ලෙස ආරම්භ කර තිබූ මැදරට පර්යේෂණ මධ්‍යස්ථානය සතු වපසරිය අක්කර 12.5 ක් වූ අතර විදේශීය හා දේශීය සංචාරකයින් ඉලක්ක කර ගත් කුළුබඩු උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම, කුළුබඩු ආශ්‍රිත සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ සැකසීම, කුළුබඩු ආශ්‍රිත ප්‍රජා පාදක කෘෂි සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවට හඳුන්වාදීම, ඒ සඳහා ගොවීන්, නිලධාරීන්, පාසල් ශිෂ්‍යයින් සහ විශ්වවිද්‍යාල සිසුන් පුහුණු කිරීම සහ කුළුබඩු බෝග පදනම් කරගත් නිෂ්පාදන හඳුන්වාදීම සහ අලෙවිය යන අරමුණු කරා ළඟා වී නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | කුළු බඩු උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘති වාර්තාවක් සකස් කරන බව. | පැවති තත්ත්වයේ වෙනසක් නැත. |
| | | | | |
| 4. | අපනයන කෘෂිකර්ම දත්ත පද්ධතියට අදාළ පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කර සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ රු.1,505,000 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර 2019 දෙසැම්බර් 24 දිනට එය නිමකර සැපයිය යුතුව තිබුණද 2020 දෙසැම්බර් 31 වන විටද සපයා නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෘදුකාංගය සම්පූර්ණයෙන් නිමවා ඇති නමුත් දෙපාර්තමේන්තුවට භාරදී නොමැති බව. | 2021 දෙසැම්බර් 31 වන විටද මෘදුකාංගය දෙපාර්තමේන්තුවට භාර දී නැත. |
| | | | | |
| 5. | පෞද්ගලික හා රජයට අයත් හෙක්ටයාර් 203.29 ක් වූ ඉඩම් කට්ටි 37 ක් නීත්‍යානුකූලව පවරා ගැනීමට ක්‍රියා නොකර දෙපාර්තමේන්තුව විසින් පරිහරණය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) | ඉඩම් කට්ටි 13 ක් පවරාගෙන | ඉඩම් කට්ටි 13 |

| | | | | |
|---|---|---|---|---|
| | කරමින් පැවතුණි. | මාර්ගෝපදේශය අනුව ඉදිකිරීම් ආදිය කිරීමට පෙර ඉඩම් පවරා ගත යුතු බව දක්වා ඇති අතර ඒ අනුව කටයුතු කළ යුතුය. | ඇති බව හා අනෙක් ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ක් පවරාගෙන ඇත. 24 ක් පවරාගෙන නැත. |
| 6. | නාරම්මල අන්තර් බෝග හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ ශෂ්‍ය විද්‍යා හා පාංශු පෝෂණ අංශයෙහි ශාක හා පස් නියැදි විශ්ලේෂණය කිරීම සඳහා 2017 වර්ෂයේදි රු.840,650 ක් වැයකර මිලදී ගෙන ස්ථාපිත කර තිබුණු ජෙල්ඩාල් නිස්සාරන යන්ත්‍රය (Kjeldahl Distillation unit) Digestion unit නම් උපාංගය නොමැති වීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි. | වත්කම් උපරිම භාවිතයට ගැනීමට පියවර ගත යුතුය. | උපයෝජන යන්ත්‍ර කොටස මිලට ගෙන ඇති බව. | යන්ත්‍රය භාවිතයෙන් තොරව පවතී. |
| 7. | පසුගිය වර්ෂවලදී සිදුව තිබුණු අලාභ හානි සිද්ධි 4 කට අයත් රු.4,076,808 ක අලාභ තවදුරටත් අයකර ගැනීමට හෝ අත්හැරීමට කටයුතු කර නොතිබුණි. | පාඩු හා හානි සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සිද්ධි 4 කට අයත් අලාභ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | රු.750,000 ක් පමණක් අයකර ඇත. |
| 8. | අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකර වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන සේවය හැරගිය පර්යේෂණ හා සංවර්ධන සහකාර නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.2,651,500 ක දණ්ඩන මුදල 2019 මැයි මස වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. | නීතිපති උපදෙස් අනුව මාසික වාරිකය රු.20,000 බැගින් ගෙවමින් පවතින බව. | 2021 දෙසැම්බර් 31 දිනට අය විය යුතු ශේෂය රු.2,231,000 ක් විය. |

ශීර්ෂ 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | | | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| | -------------------- | | | ---------------------- | ---------------------- | ---------------- |
| **1.** | **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය** | | | | | |
| | (අ) | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ කලපු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මත්ස්‍ය නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට කලපුවලට ඉස්සන් පැටවුන් මුදාහැරීමේ ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ප්‍රතිපාදන වලින් යාපනය කලපුවට ඉස්සන් පැටවුන් 21,470,000 ක් මුදාහැරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.17,176,000 ක් 2019 වර්ෂය තුළදී පුද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. | | | | |
| | | (i) | දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ සහ සියලුම පාර්ශව සමඟ සාකච්ඡා කර විධිමත් සැලැස්මක් ඇතිව එය සිදුකරන ලද බවට දන්වා තිබුණ ද අදාල සැලසුමෙහි පිටපතක් ඉදිරිපත් නොවීය. තව ද ගෙවූ මුදලට සාපේක්ෂව ඉස්සන් නිෂ්පාදනයේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී තිබේ ද යන්න පිළිබඳ පසුවිපරම් කිරීමක් ද සිදුකර නොතිබුණි. | සැලසුමක් අනුව අත්‍යවශ්‍ය ස්ථානවලට ඉස්සන් පැටවුන් මුදාහැරීම සිදුකළ යුතු අතර වැයකළ මුදලට සාපේක්ෂව ඉස්සන් නිෂ්පාදන ප්‍රමාණයේ වැඩිවීම පිළිබඳ පසුවිපරම් කටයුතු ද සිදුකළ යුතුය. | දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ සහ සියලුම පාර්ශව සමඟ සාකච්ඡා කර විධිමත් සැලැස්මක් ඇතිව සිදුකරන ලදී. කිලිනොච්චි දිස්ත්‍රික්කයට අයත් තොටුපලවල්වලට ද ඉස්සන් පැටවුන් මුදාහැරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | තත්ත්වය එසේම පවතියි. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | (ii) | පුත්තලම දිස්ත්‍රික් ධීවර කාර්යාලයට අයත් මුන්දලම කලපුවෙ රු.1,040,000 ක් වටිනා ඉස්සන් පැටවුන් ලක්ෂ 13 ක් 2018 නොවැම්බර් 24 දින තැන්පත් කර තිබුණ ද 2019 වර්ෂය සඳහා ඉස්සන් අස්වැන්න පිළිබඳ මාසික වාර්තා කිසිවක් දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන නොතිබූ හෙයින් එහි කාර්යසාධනය මැනීමට නොහැකි විය. | කාලපරිච්ඡේදවලට අදාලව ඉස්සන් අස්වැන්න පිළිබඳ වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතුය. | මුන්දලම කලපුවේ ඉස්සන් අස්වැන්න පිළිබඳ මාසික වාර්තා එවා ඇත. | එවා තිබූ මාසික වාර්තා 2018 වර්ෂයට අදාල විය. |
| | (ආ) | කලපු සංවර්ධන වැඩසටහන යටතේ වූ කලපු සීමා සලකුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් 2018 වර්ෂයේ කලපු 10 ක සංරක්ෂණය වෙනුවෙන් භෞතික සීමා සලකුණු කිරීමට මායිම් කණු 19,888 ක් රු.මිලියන 31.9 කට සැපයීමට සැලසුම් කර තිබුණ ද සපයා තිබූ කණු ප්‍රමාණය 14,748 ක්වූ අතර ගෙවා තිබුණු මුදල රු.21,339,345 ක් විය. | | | | |
| | | (i) | මෙම ප්‍රසම්පාදනයේ දී ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2,4.3 හා 8.9.1 මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නැත. | තත්ත්වය එසේම පවතියි. |
| | | (ii) | අනුමැතියක් රහිතව වැඩිපුර කණු 2,276 ක් පුත්තලම කලපුව සඳහා මිලදීගෙන තිබූ අතර මේ සඳහා රු.3,826,638 ක් වැයකර | මුදල් ගෙවීමට පෙර අදාල අනුමැතිය ඇත් ද යන්න හා සැලසුමට අනුකූල ද යන්න පරීක්ෂාකර | ක්‍රියාමාර්ග ගෙන නැත. | තත්ත්වය එසේම පවතියි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | තිබුණි. | ගෙවීම් කළ යුතුය. | | |
| | | | | | |
| **2.** | **අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම** | | | | |
| | රු.මිලියන 195.4 ක් වැය කරමින් මිලදීගෙන තිබුණු විද්‍යුත් ටැබ්ලට් 2,428 ක් ධීවරයින් හා වරාය නිලධාරීන් වෙත නොමිලේ ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එම විද්‍යුත් ටැබ්ලට් මිලදී ගැනීමේ අරමුණ වූ එතෙක් පැවති ලොග් පොත් ක්‍රමය වෙනුවට විද්‍යුත් ටැබ්ලට් භාවිතයට ගැනීම සාර්ථිකව සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. තව ද 2019 මැයි වනවිට දිස්ත්‍රික් ධීවර කාර්යාල ගබඩාවල විද්‍යුත් ටැබ්ලට් 374 ක් ඉතිරිව පැවතුණි. එසේම දෙපාර්තමේන්තු ගබඩාවේ පැවති තොගයෙන් විද්‍යුත් ටැබ්ලට් 256 ක් දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත බෙදා දී තිබුණ ද ඒවා කාර්යාලීය ප්‍රයෝජනය සඳහා යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | | වැය කළ මුදලින් උපරිම ඵලදායීතාවය ලබාගැනීමට කටයුතු කළ යුතු අතර අදාල උපකරණ අවභාවිතය පිළිබඳ අධ්‍යයනයක් සිදුකර ඒවා ලබාදීම සහ පසුවිපරම් කටයුතු සිදුකළ යුතු වීම. | ඉතා සුළු ප්‍රතිශතයකින් හෝ ඉලෙක්ට්‍රොනික ටැබ් ක්‍රමවේදය ක්‍රියාත්මක වන්නේනම් වාසි සහගත වනු ඇත. තව ද මිලදීගත් යන්ත්‍ර සියල්ලම උපරිමයෙන් භාවිතා කිරීමට සැලසුම් සකස් කර මේ වනවිට එම සැලසුම් සාර්ථකව ක්‍රියාවේ යෙදවමින් පවතී. | ධීවරයින් කිසිවෙක් විද්‍යුත් ටැබ් භාවිතා නොකරයි. ලොග් පොත් ක්‍රමය තවම භාවිතාවේ. එහි වගකීම් කාලය ද ඉක්මවා ගොස් ඇත. |
| **3.** | **ප්‍රසම්පාදනයන්**<br>**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දීර්ඝ කිරීමේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව - 2018 වර්ෂය** | | | | |
| | (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 100 ක් ඉක්මවන්නේ නම් එය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කළ යුතු බව දැක්වේ. එහෙත් රු.මිලියන 141.20 ක්වූ යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දීර්ඝ කිරීමේ කොන්ත්‍රාත්තුවේ රු.මිලියන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2(ආ) මාර්ගෝපදේශය පරිදි ඉංජිනේරු ඇස්තමේන්තුව සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නොවෙනස්ව පවතියි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 166.94 ක්වූ ඉංජිනේරු ඇස්තමේන්තුව සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | | |
| | (ආ) | ලංසු කැඳවීම සඳහා සකස් කර තිබූ ප්‍රමාණ පත්‍රය අනුව රු.මිලියන 166.94 ක්වූ ඉංජිනේරු ඇස්තමේන්තුගත වටිනාකම ලංසු ඇගයීම් කිරීමේ දී රු.මිලියන 168.13 ක් ලෙසට සංශෝධනය කර තිබුණ ද එකී සංශෝධිත ඇස්තමේන්තුව සඳහා ද උක්ත මාර්ගෝපදේශය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2(ආ) මාර්ගෝපදේශය පරිදි සංශෝධිත ඇස්තමේන්තුව සඳහා ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නොවෙනස්ව පවතියි. |
| | (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 ප්‍රකාරව ඍජු ඉදිකිරීම් පිරිවැය මත අසම්භාව්‍ය/භෞතික අවිනිශ්චිතතාව රු.මිලියන 8.97 ක් විය යුතු වුවත් එය රු.මිලියන 14.56 ක් ලෙස ගණනය කර දැක්වීම හේතුවෙන් රු.මිලියන 5.59 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර භෞතික අසම්භාවයන් ලෙස රු.මිලියන 43.8 ක් ගෙවා තිබුණි. තව ද මෙම කොන්ත්‍රාත්තුව සඳහා උපදේශන ආයතනය විසින් සේවාදායකගේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් මිලෙන් සියයට 31 හෙවත් රු.මිලියන 43.8 ක විචලනයක් වන ආකාරයට කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 මාර්ගෝපදේශය පරිදි ඍජු ඉදිකිරීම් පිරිවැය මත අසම්භාව්‍ය/භෞතික අවිනිශ්චිතතාව ගණනය කළ යුතු අතර අනුමැතිය ලබාගැනීමකින් තොරව කොන්ත්‍රාත් මිලගණන් ඉහළ යාමට හේතු පාදක වන විෂය පථය වෙනස්වීම විචලන නියෝග නොකළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නොවෙනස්ව පවතියි. |
| **4.** | **කළමනාකරණ දුර්වලතා** | | | | |
| | මීටර 13.5 ට වැඩි බහුදින ධීවර යාත්‍රා 17ක් මෙහෙයුම් කටයුතු සඳහා බලපත්‍ර | | මෙහෙයුම් කටයුතුවල යෙදෙන | ක්‍රියාමාර්ග ගෙන නැත. | මෙහෙයුම් බලපත්‍ර ලබා |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගෙන නොතිබුණ අතර එයින් එක යාත්‍රාවක් වර්ෂ කිහිපයක් සඳහා මෙහෙයුම් බලපත්‍ර ලබාගෙන නොතිබුණ ද ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයන් විගණනයට නිරීක්ෂණය නොවීය. එසේම මෙහෙයුම් බලපත්‍ර ලබාගෙන නොතිබුණු බහුදින ධීවර යාත්‍රා ධීවර මෙහෙයුම් කටයුතුවල යෙදෙන්නේ ද, මෙහෙයුම් බලපත්‍ර ලබා නොගැනීමට හේතු මොනවා ද යන්න පිළිබඳව දිස්ත්‍රික් ධීවර කාර්යාල හරහා පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ද නොවීය. | බහුදින ධීවර යාත්‍රා මෙහෙයුම් බලපත්‍ර ලබාගෙන ඇද්ද හා බලපත්‍ර ලබා නොගැනීමට හේතු හඳුනා ගැනීම සඳහා දිස්ත්‍රික් ධීවර කාර්යාල හරහා පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වේ. | | නොගන්නා යාත්‍රා පිළිබඳව පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් සකසා නැත. |

ශීර්ෂ 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 1. | ධීවර වරායන් අසල නිරන්තරයෙන් පිරෙන වැලි, කැණීම් සිදු කර ඉවත් කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව විසින් ධීවර වරාය නීතිගත සංස්ථාවට පවරා ඇති අතර සංස්ථාව විසින් එම කාර්යය වෙනත් පෞද්ගලික ආයතනවලට පවරා තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව පැරලිය ධීවර වරායේ වැලි කියුබ් 2750 ක කැණීම් සිදු කර තිබූ නමුත් වෙරළට වැලි කියුබ් 818 ක් පමණක් දමා තිබූ අතර පානදුර වරායේ වැලි කියුබ් 550 ක් කැණීම් සිදු කර වැලි කියුබ් 177 පමණක් වෙරළට දමා තිබූ බව නිරීක්ෂණය විය. ධීවර වරායන්වල නිරන්තරයෙන් මෙසේ පිරෙන වැලි ඉවත් කර වෙරළ ඛාදනය වන ස්ථානවලට දැමීම සඳහා වඩාත් ඵලදායී ක්‍රමවේදයක් සකස් කර කළමනාකරණය කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබුණි. | වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන් තුව විසින් අධීක්ෂණ කටයුතු සිදුකළ යුතු වේ. | අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් නිකුත් කර ඇති අංක 22/0046/311/001 හා 2022.02.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ සහිත ලිපියට අනුව අදාළ කොන්දේසි (ඉවත් කරන වැලි වලින් නැවත මුහුදට දැමිය යුතු ප්‍රමාණය) හා බලපත්‍ර සඳහා වූ හිඟ ගෙවීම් සිදු කර නොමැති අවස්ථා වල, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | වැලි ඉවත් කිරීම සඳහා දැනට බලපත්‍ර නිකුත් කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | හා අදාළ අනෙකුත් ආයතන සමග සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කර බලපත්‍ර ලබා දීම සිදු කරනු ලබයි. | |
| 2. | රු.මිලියන 889 ක් වැය කරමින් 2020 පෙබරවාරි 29 සිට අප්‍රේල් 21 දක්වා ක්‍රියාත්මක කර තිබූ දකුණු කොළඹ වැලි පෝෂණ ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවීමට පහත සඳහන් කරුණු හේතු වී තිබුණි.<br><br>(අ) වෙරළ වැලි පෝෂණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වැලි සම්බන්ධයෙන් පිළිගත් ආයතනයකින් ගවේෂණ කටයුතු සිදුකර එම වාර්තාව ඉදිරිපත් කර භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශයෙන් ගවේෂණ බලපත්‍රයක් ලබාගත යුතු වුවද වලංගු ගවේෂණ බලපත්‍රයක් සහ වලංගු කැණීම් බලපත්‍රයකින් තොරව මෙම ව්‍යාපෘතිය සඳහා වැලි ලබා ගෙන තිබුණි.<br><br>(ආ) දකුණු කොළඹ වැලි පෝෂණ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර හා පසු තත්ත්වය සම්බන්ධයෙන් නානමිතික පර්යේෂණ පරිගණක දත්ත පදනම් කරගෙන වෙරළ තීරයන් වෙත ප්‍රේෂණය කර ඇති වැලි ප්‍රමාණයේ නිරවද්‍යතාවය ප්‍රමාණාත්මකව | ආගාධමිතික සමීක්ෂණයක් සිදුකළ බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොමැත. ලබා ගත යුතු අනුමැතින් සහ පිළිගත හැකි ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමෙන් පසුව අදාල කාර්යය ඉටු කල යුතු වේ.<br>- එම - | භූ විද්‍යා හා පතල් කාර්යාංශය මඟින් ලබා දී ඇති කැණීම් බලපත්‍රය 2020.03.27 දින දක්වා වලංගු වේ. නමුත් ව්‍යාපෘති කාලය ඊට වඩා වැඩි නිසා එය යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය කටයුතු ව්‍යාපෘතිය ආරම්භයේ සිටම සිදු කරන ලදී. එසේම විද්‍යුත් තැපැල මඟින් මෙම කැණීම බලපත්‍රය 2020.03.22 දින සිට මාස දෙකක කාලයක් සඳහා යාවත්කාලීන කර ගැනීමට විද්‍යුත් තැපැල මඟින් අනුමැතිය ලැබී | භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශයෙන් ලබා ගත් ගවේෂණ බලපත්‍රය 2020.03.22 දින සිට මාස දෙකක කාලයක් සඳහා පමණක් දීර්ඝ කර තිබුණි.<br><br>දක්වා ඇති හානිවීම් යථා තත්ත්වයට පත්කර ගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | පරීක්ෂා කර බැලීමක් සිදු කර නොතිබුණි. ඉහත වැලි පෝෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු වර්තමානයේ පවතින තත්ත්වය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.<br>• ගල්කිස්ස හෝටලය අසල ස්වභාවික පිහිනුම් තටාකය විනාශවීම.<br>• වැලි පුරවා ඇති ප්‍රදේශවල විශාල ආනතියක් පැවතීමෙන් බෝට්ටු පෙරළීම හා මා දැල් ධීවර කටයුතුවලට බාධා පැමිණීම.<br>• වැලි පෝෂණය සිදුකළ ස්ථානවලින් වැලි විශාල වශයෙන් මුහුදට ගසාගෙන යාම.<br>• වෙනත් වෙරළ තීරයන් වල වැලි විශාල වශයෙන් ගොඩ ගැසී තිබීම හා නැවතත් එම ස්ථාන වෙරළ ඛාදනය වී පෙර පැවති තත්ත්වයට පත්වීම | | තිබුණි.<br><br>ආරම්භ කිරීමට ප්‍රථම හා පසුව ආගාධමිතික සමීක්ෂණයන් සිදු කරන ලදී. ඒ අනුව වැලි ප්‍රමාණයන් නිරවද්‍යතාවය පරීක්ෂා කර ඇත. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් නොහැකි වී තිබුණි. |
| 3. | 2012 සිට 2021 පෙබරවාරි 28 දින දක්වා අනවසර ඉදිකිරීම් 2,162 ක් හඳුනාගෙන ඇති අතර ඉන් 1967 ක් සඳහා කඩා ඉවත් කරන ලෙස නියෝග නිකුත් කර තිබුණ ද කඩා ඉවත් කර තිබුණේ 450 ක් පමණි. තවද අනවසර ඉදිකිරීම් ලෙස හඳුනාගෙන තිබුණත් නියෝග නිකුත් නොකළ ඉදිකිරීම් 195 ක් විය. එම ඉදිකිරීම් කඩා ඉවත් කිරීමේ බලතල දෙපාර්තමේන්තුවට තිබූ නමුත් පසුගිය කාලයේ සිදුකර තිබූ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ද සමාජීය, ආර්ථික හා දේශපාලන බලපෑම් හේතුවෙන් ප්‍රායෝගිකව දෙපාර්තමේන්තුවට ක්‍රියාත්මක වීමට නොහැකි තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවට ක්‍රියාත්මක වීමට නොහැකි අවස්ථාවන් හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාත්මක කළ හැකි විකල්ප ක්‍රම වේදයක් සකස් කර ගත යුතු වේ. | අදාළ කාලය තුළ වාර්තා වූ අනවසර ඉදිකිරීම් 2162 න් කඩා ඉවත් කිරීමේ නියෝග ලබා දුන් හා නොදුන් යම් ප්‍රමාණයක් මේ වන විට ඉවත් කර ඇත. වෙරළෙහි රක්ෂිත කලාපය තුල සිදු කරන අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය | 2012 සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා අනවසර ඉදිකිරීම් 2341 ක් හඳුනාගෙන තිබූ අතර ඉන් එදිනට අනවසර ඉදිකිරීම් 1721 ක් කඩා ඉවත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කාර්යාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. අනවසර ඉදිකිරීම් සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කර ඇත. ගාල්ල දිස්ත්‍රික්කයේ හඳුනා ගත් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ කටයුතු මහජන සහය හා පොලිස් දෙපාර්තමේන්තුවේ සහය ඇතිව සිදු කරමින් පවතී. | |
| 4. | දෙපාර්තමේන්තුවට අයත් ත්‍රිකුණාමලය, මඩකලපුව, හලාවත, යාපනය සහ අම්පාර යන ප්‍රාදේශීය කාර්යාලවලට අයත් එකතුව හෙක්ටයාර 1.0347 ක් වූ ඉඩම් සහ වර්ග අඩි 14060 ක් වූ ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | මේ වන විට තක්සේරු කරන ලද ගොඩනැඟිලි වටිනාකම් 2021.12.31 දිනට ගිණුම් ගත කර ඔබ වෙත ඉදිරිපත් කර ඇත. | ත්‍රිකුණාමලය හා මඩකලපුව ප්රාදේශිය කාර්යාලවලට අයත් එකතුව වර්ග අඩි 14060 ක් වූ ගොඩනැගිලි වටිනාකම 2021.12.31 දිනට ගිණුම්ගත කර නොතිබුණි. මඩකලපුව හලාවත, යාපනය සහ අම්පාර යන ප්‍රාදේශිය කාර්යාලවලට අයත් ඉඩම් පවරා ගෙන නොතිබුණි. |

<table>
<tr>
<td rowspan="2">5.</td>
<td>(අ) වැලි කැණීම සඳහා මිනරල් සැන්ඩ්ස් සමාගම වෙත 2017 පෙබරවාරි සිට 2019 අගෝස්තු දක්වා බලපත්‍ර නිකුත් කර තිබූ අතර එම බලපත්‍ර තුනෙහි කොන්දේසි උල්ලංඝනය කරමින් එම සමාගම විසින් වැඩි පුර වැලි කියුබ් 19,096ක් කැණීම් කර තිබුණි. වැඩිපුර වැලි කැණීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත අයකර ගත යුතු රු. 9,548,057ක අමතර ගාස්තුව මිනරල් සැන්ඩ්ස් වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
<table>
<tr><td>බලපත්‍ර අංකය<br>-----------</td><td>වැඩි පුර කැණීම් කරන ලද වැලි ප්‍රමාණය<br>---------------<br>කියුබ්</td><td>තවදුරටත් අය කර ගැනීමට ඇති මුදල<br>---------------<br>රු.</td></tr>
<tr><td>P/17/78</td><td>9321.80</td><td>4,660,900</td></tr>
<tr><td>P/18/86</td><td>3928.67</td><td>1,964,338</td></tr>
<tr><td>P/18/946</td><td>5,846</td><td>2,922,819</td></tr>
</table>
</td>
<td rowspan="2">දැනට කැණීම් කිරීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අදාල ගැසට් පත්‍රය අනුව මුදල් ගෙවීම සිදු කර ඇත. එහෙත් ශුද්ධ ඛණිජ වැලි ලබා ගැනීමෙන් පසු ඉතිරිය, නැවත වෙරළ තීරය සකස් කිරීමට මුදිහරින බැවින් එම වැලි සඳහා අය නොකිරීමටත්, මුදාහරින ප්‍රමාණයේ විචලතාවයක් ඇති වී තිබේ නම් ඒ සඳහා ගෙවීම් කිරීමටත් එකඟතාවය එල කරන ලදී. කෙසේ වුවත්, දැනට වෙරළට මුදාහල වැලි සහ කැණීම් කරන වැලි අතර විචලතාවයක් පවත්නා බව විගණනයේ දී හෙලි වී ඇති</td>
<td>අදාල සමාගම සමඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් විමසීම් සිදුකර තිබුණි.</td>
<td>වැඩිපුර අය කල යුතු මුදල මේ දක්වාත් අයකරගෙන නොතිබුණි.</td>
</tr>
<tr>
<td>(ආ) ඉහත බලපත්‍රයේ 06 වැනි කොන්දේසිය ප්‍රකාරව ඛණිජ වැලි කැණීම් සිදු කිරීමෙන් අනතුරුව නැවතත් එම වෙරළ තීරය මුහුදු වැලි යොදා යථා තත්ත්වයට පත් කිරීම ලංකා මිනරල් සමාගමේ වගකීම වන අතර එය දෙපාර්තමේන්තුවේ සහ සමාගමේ ඉංජිනේරුවරයකුගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු විය යුතුය. නමුත් සමාගම එවන ලද වාර්තාවලට අනුව මුහුදු වැලි මෙට්‍රික් ටොන් 277,944 ක් පිරවිය යුතු වුවත් පුරවා ඇත්තේ මෙට්‍රික් ටොන් 119,323 ක් වන අතර මෙට්‍රික් ටොන් 158,621ක ප්‍රමාණයක් තව දුරටත් පිර විය යුතුය.</td>
<td>ලංකා මිනරල් සැන්ඩ්ස් සමාගම සමඟ මේ සම්බන්ධයෙන් එකඟතාවයකට එළඹීමට නොහැකි වී තිබුණි.</td>
<td>තවදුරටත් තත්ත්වය නිවැරදි වී නොතිබුණි.</td>
</tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | | බැවින් අදාල ගැසට් පත්‍රය අනුව ගෙවීම් කටයුතු සිදු කළ යුතු බවට ලංකා මිනරල් සැන්ඩ් සමාගම වෙත දැනුවත් කල යුතුවේ. | | |

ශීර්ෂ 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | | | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| | ----------------------- | | | ----------------- | ------------- | ---------- |
| 1. | | රු. | | | | |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(4) | 361,089 | පහත සඳහන් අලාභ හානි සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 වන විටත් පරීක්ෂණ අවසන් කර නොතිබුණි. | අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පරීක්ෂණ වාර්තා කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන බව. | මෙම දක්වා පරීක්ෂණ කටයුතු අවසන් කර නැත. |

| | | අලාභය<br>---------<br>රු. |
|---|---|---|
| i. | පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරයේ එන්නත්සාර තත්ත්ව පරීක්ෂණ රසායනාගාරයේ 2017 දෙසැම්බර් 06 දින ඇති වූ | 50,000 |

| | | | | |
|---|---|---|---|---|
| | ගින්න<br>ii. අංක 6ජ6 රජයේ නිවාසයේ නීති විරෝධි ජලපරිභෝජනය - 2011 මැයි හා ජූනි — 61,089<br>iii චෙක්පතක් අයථා පරිහරණය කිරීම. 2018 ජූනි 22 — 250,000<br>----------<br>361,089<br>===== | | | |
| 2. | සිප්පුකුලම හා කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලවල ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා පසුගිය අධ්‍යයන වර්ෂ 4 කදී අයදුම්පත් 483 සිට 693 දක්වා වූ ප්‍රමාණයක් ලැබී තිබුණද විද්‍යාලවල පාඨමාලා සඳහා සිසුන් 90 සිට 144 දක්වා හෙවත් සියයට 36 සිට සියයට 76 දක්වා අඩු සිසුන් සංඛ්‍යාවක් තෝරාගෙන තිබුණි. ප්‍රමාණවත් පරිදි සිසුන් ඇතුළත් කිරීමට අවධානය යොමුකර ජාතික අවශ්‍යතාවය සඳහා ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමට කටයුතු නොකිරීම නිසා සත්ත්ව පාලන විද්‍යාල සතුව තිබෙන ඉඩම් සහ ගොඩනැගිලි ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. සිප්පුකුලම විද්‍යාලයේ පමණක් ඉඩම් අක්කර 129 ක්ද ගොඩනැගිලි වර්ග 21 ක්ද තිබුණු නමුත් ප්‍රමාණවත් ජල පහසුකම් හා මානව සම්පත් නොතිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. එමෙන්ම මෙම ඉඩම දෙපාර්තමේන්තුවට පවරාගෙනද නොතිබුණි. | මෙම සත්ත්ව පාලන විද්‍යාල ආශ්‍රිතව පවතින සම්පත් ඌන උපයෝජිතව පවතින බැවින් උපරිම භාවිතයට ගත හැකි පරිදි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1(ආ) මාර්ගෝපදේශය අනුව ඉදිකිරීම් ආදිය කිරීමට පෙර ඉඩම් පවරා ගත යුතු බව දක්වා ඇති අතර ඒ අනුව කටයුතු | සත්ත්ව පාලන පාඨමාලා පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් හා බාහිර දේශකයින් බඳවා ගැනීම් සිදු කරමින් පවතින බව සහ ඒ අනුව 2022/2023 පාඨමාලාව කරගෙන යාමට සැලසුම් කර ඇති බව. මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් වෙත මෙම ඉඩම පවරාගැනීම | සම්පත් ඌන උපයෝජිත තත්ත්වයේ පවතී. එමෙන්ම 2021 දෙසැම්බර් 31 දින වන විටද ඉඩම පවරා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | කළ යුතුය. | සඳහා ඉල්ලීම් කර ඇති අතර පවරා ගැනීමේ කටයුතු කෙරෙමින් පවතින බව. | |
| | | | | |
| 3. | පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරය ඇස්තමේන්තුගත වටිනාකම රු.3,273,873 ක් වූ වැඩ විෂයයන් 95 ක් යටතේ වැඩිදියුණු කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත් ආයතනයක් සමඟ 2018 අගෝස්තු 31 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර 2018 දෙසැම්බර් 29 දිනට කාර්යයන් නිමකර භාරදිය යුතු ව තිබුණි. එහෙත් එදින සිට 2020 අගෝස්තු 11 දින වන විට මාස 19 ක් ගතවී ඇතත් වැඩ නිම නොකිරීම නිසා ගිවිසුම අවලංගු කර තිබුණි. වැඩ විෂයයන් 95 න් 10 ක් සම්පූර්ණයෙන්මද 06 ක් අර්ධ වශයෙන්ද නිමකර තිබුණු නමුත් ඇස්තමේන්තුගත වටිනාකම රු.2,262,204 ක් වූ වැඩ විෂයයන් 78 ක කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. | අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන නිම නොකළ වැඩ විෂයයන් සම්පූර්ණ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම. | සත්ත්ව විෂාණු රසායනාගාරය වැඩි දියුණු කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු ගත වටිනාකම රු.3,273,873 ක් යටතේ කොන්ත්‍රාත් ආයතනයක් සමඟ ගිවිසුම්ගතව තිබුණද අදාළ ආයතනයට එම කාර්යය නියමිත කාල සීමාව තුළදී නිම කිරීමට නොහැකි වී ඇත. මේ පිළිබඳව අවස්ථා දෙකකදී ලිඛිතව දැනුවත් කර ඇති අතර අදාළ ලිපි මඟින් සිදු කරන ලද කරුණු | කොන්ත්‍රාත්කරු විසින් වැඩ නතර කිරීමෙන් පසු කිසිදු ඉදිකිරීමක් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පැහැදිලි කිරීම් මත පදනම්ව මෙම කොන්ත්‍රාත්තු ව පිරිනමා තිබූ පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් සමඟ ගිවිසගෙන තිබූ ගිවිසුම අවලංගු කිරීමට සිදුවිය. | |
| | | | | |
| 4. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1.(ඇ) මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැරව ප්‍රතිපාදන වෙන් කර ගැනීමකින් තොරව ඇස්තමේන්තුගත වටිනාකම රු.165,831,215 ක් වූ පශු පර්යේෂණ ආයතනයට එන්නත් නිවසක් ඉදිකිරීම, සත්ව පෝෂණ අංශයේ රසායනාගාරය පුළුල් කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ ස්ථානභාර නිලධාරි නිල නිවස ඉදිකිරීම යන ඉදිකිරීම් 3 ට අදාළ ව්‍යුහාත්මක හා වාස්තු විද්‍යාත්මක සැලැසුම් සකස් කිරීම සඳහා 2018 වර්ෂයේ දී ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයට (NERD) රු.762,993 ක් ගෙවා තිබුණු නමුත් 2020 දෙසැම්බර් 31 වන විටත් එයින් කිසිදු ඉදිකිරීමක් ආරම්භ කර නොතිබුණි. | අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන සැලසුම් කළ ඉදිකිරීම් ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. | ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතු සැලසුම් ඇඳීමේ ශාස්ත්‍ර සහ වාස්තු විද්‍යාත්මක ශාස්ත්‍ර වෙනුවෙන් 2018 වර්ෂයේදී ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය ට මෙම මුදල ගෙවා තිබෙන නමුත් ඉදිකිරීම් ආරම්භ කළ නොහැකි වූ බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | ගවයින්ගේ මුඛ හා කුර රෝග සඳහා භාවිතා කරන එන්නත් 100,000 ක් මිලදී ගැනීම සඳහා 2020 වර්ෂයේදී මිල ගණන් කැඳවීමේදී එක් සැපයුම් ආයතනයක් පමණක් එක් එන්නතක් රු.82 ක මිලකට සැපයීමට ඉදිරිපත් වී තිබුණු අතර එම සැපයුම්කරුට රු.8,200,000 ක් ගෙවා එන්නත් මිලදී ගෙන තිබුණි.<br><br>පසුගිය වර්ෂවලදී මෙම එන්නත් මිලදී ගෙන තිබුණේ රු.40 ක මිලකට වන අතර 2020 අගෝස්තු මාසයේදී නැවත මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේදී එක් එන්නතක් රු.42.05 කට සැපයීමට සැපයුම්කරුවෙකු ඉදිරිපත් වී තිබුණි.<br><br>ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 7.12 මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැරව ඵලදායි තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට ලැබුණු ලංසු ප්‍රතික්ෂේප කිරීම, ලැබී තිබුණු ලංසුව වෙළඳපොල මිල ගණන් සමඟ සැසඳීම, ලැබී ඇති එකම මිල අධික නම්, ලංසු මිල අඩු කර ගැනීම සඳහා ලංසු කරු සමඟ සාකච්ඡා කිරීම සිදු කර නොතිබුණි. ඒ අනුව 2020 ඔක්තෝබර් 12 දින මිල කැඳවීමේදී ලැබී තිබුණු රු. 42.05 ලංසුව සමඟ සැසඳීමේදී 2020 අගෝස්තු 17 දින එකක් රු.82 බැගින් ගෙවා මිලදි ගන්නා ලද එන්නත් වඩි 100,000 සඳහා රු.3,995,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතුය. | එන්නත් සාර වඩි 400000 ක් මිලදී ගැනීමට තීරණය කර තිබුණු නමුත් මිල ගණන් කැඳවූ විට ඉදිරිපත් වූයේ එක් සැපයුම්කරු වෙකු පමණක් බැවින් ඔහු විසින් ඉදිරිපත් කළ එක වඩියක් රු. 82 ක් වූ මිලට වඩි 100000 ක් පමණක් මිලට ගන්නා ලද බව. | නැවත මිල ගණන් කැඳවූ විට ලැබී තිබුණු එකක් රු.42.05 ක මිලට ඉතිරි වඩි 300000 ක් මිලට ගෙන තිබුණි. |
| 6. | මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ 2015 වර්ෂයේ එවකට පැවති තාරා කොටුව රු.1,562,000 ක් වැය කර ගව ගාලක් බවට පරිවර්තනය කර තිබුණු නමුත් එය 2020 ඔක්තෝබර් වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි. | සම්පත් උපරිම භාවිතයට ගැනීමට පියවර ගත යුතුය. | පුං ගව පැටවුන්ගේ භාවිතය සඳහා යොදවා ගැනීමට අවශ්‍ය සේවකයින් නොමැති බැවින් එය ක්‍රියාත්මක කළ නොහැකි වූ බව. | භාවිත යෙන් තොරව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 7. | කටුනායක සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානයට 2008 නොවැම්බර් මාසයේ ලබාදී ඇති රු.2,461,290 ක් වටිනා ඉන්සිනේටරය (අපද්‍රව්‍ය භෂ්මකය) 2019 මාර්තු මස සිට ක්‍රියාවිරහිතව පැවති අතර 2020 ජනවාරි මස වන විටත් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට හැකිවන පරිදි කටයුතු කළ යුතුය. | අලුත්වැඩියා කිරීම සඳහා සේවා සපයන ආයතනය රුපියල් ලක්ෂ 5 ක ඇස්තමේන්තු වක් ලබා දී ඇත. රජයේ යාන්ත්‍රික ඉංජිනේරුවර යෙකුගේ උපදෙස් මත කටයුතු කිරීමට අදහස් කරන බව. | ක්‍රියා විරහිතව පවතී. |
| 8. | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වුවද වාහන 08 ක් සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වීම. | අදාළ වාහන අපහරණය සඳහා මිල ගණන් කැඳවා ඇගයීම් කටයුතු කරමින් පවතින බව. | අපහර ණ කටයුතු සිදු කර නැත. |
| 9 | පොළොන්නරුව කෘත්‍රිම සංචන මධ්‍යස්ථානයේ වර්ග අඩි 6746 ක් වූ රජයේ නිවාස 06 ක්, සයිලේජ් සැකසුම් ගොඩනැගිලි 01 ක්, ජෙනරේටර් 02 ක් වර්ෂ 06 ක සිට වර්ෂ 19 ක් දක්වා කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම වත්කම් භාවිතයට ගැනීම. | ස්විස් ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 1982/83 වර්ෂවලදී මෙම නිවාස, සයිලේජ් සැකසුම් ගොඩනැගිල්ල, ජෙනරේටර් යන්ත්‍ර | මෙම වත්කම් අභාවිත ව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රසම්පාදනය කර භාවිතා කර ව්‍යාපෘතිය ඇවර කිරීමෙන් පසු 1989 දී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන් තුවට පවරා ඇත. නිවාස අලුත්වැඩියා කිරීම සඳහා සැලසුම් කර ඇති අතර අවශ්‍ය තරම් තණකොළ තිබෙන බැවින් සයිලේජ් සැකසීම නවතා ඇත. ජෙනරේටර් යන්ත්‍ර දෙක අපහරණය කිරීමට අදහස් කරන බව. | |

ශීර්ෂ 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

| | විගණන නිර්දේශය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xix පරිච්ඡේදය 6.2 වගන්තිය අනුව නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් විශ්‍රාම යාමේදී එම නිල නිවාසවලින් ඉවත්ව යා යුතු විය. එහෙත් රත්නපුර සහ කළුතර දිස්ත්‍රික්කවල නිල නිවාස දෙකක පදිංචි සිටි රබර් සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු පිළිවෙලින් 2017 ජුනි සහ 2015 දෙසැම්බර් 13 දින සිට විශ්‍රාම ගොස් සිටි නමුත් 2020 වර්ෂය වන විටත් එම නිල නිවාස වලින් ඉවත් වී ආපසු බාරදීමට කටයුතු කර නොතිබුණි. | නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් විශ්‍රාම ගැන්වීමට පෙර නිල නිවාස ආපසු භාර ගැනීමට අවශ්‍ය සියලු කටයුතු සලසා ගත යුතුය. | නිල නිවාස ආපසු දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීම සඳහා, නඩු පැවරීමට කටයුතු කිරීම ආරම්භ කර ඇත. | නිල නිවාස විශ්‍රාම යාමට පෙර භාරදීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. මේ සම්බන්ධයෙන් නඩු පැවරීමට නීතිපති වෙත යොමු කර ඇත. නිලධාරීන් නිවාස වලින් ඉවත්ව නැත. |
| 2. | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ රබර් වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය පිළිබඳව සංඛ්‍යා ලේඛන පවත්වා ගත යුතු වන අතර 2020 වර්ෂයේ එම සංගනන කටයුතු සඳහා රු.5,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද එම කාර්යය ඉටුකර නොතිබුණි. | රබර් වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය පිළිබඳව නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වා ගත යුතුය. | 2021 වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවල නියැදි සංගණනයක් සිදු කර ඇත. | දිවයිනම ආවරණය වන පරිදි රබර් ඉඩම් ලියාපදිංචිය සිදු කෙරෙමින් පවතී. කාර්යය අවසන් වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 3. | දෙපාර්තමේන්තුව සතු වාහන 08 කට අදාළව සිදුව තිබුණු අනතුරු හේතුවෙන් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අලාභ මුළු වටිනාකම රු.2,466,640 ක් වූ අතර මෙම අලාභයන් මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන සඳහා වූ අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කටයුතු කරමින් පවතී. | වාහන අනතුරු 05ක් සඳහා මු.රෙ.104(3) සහ (4) කටයුතු සිදු කර ඇති අතර, පොතෙන් කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතී.<br>අනෙක් වාහන අනතුරු 03 සඳහා අලාභ අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. කටයුතු අවසන් කර නොමැත. |
| 4. | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේ දී පර්චස් 75 ක රු.66,700,000 ක් වටිනා ඉඩමක් මිල දී ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු.59,304,347 ක් ගෙවා තිබුණි. තවද එම ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීමට සහ සැලසුම සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු.150,000 ක් ගෙවීම් කර එම වර්ෂයේදී රු.මිලියන 249 ක ඇස්තමේන්තුවක්ද සකස් කර ගෙන තිබුණි. මෙම මූලික කටයුතු අවසන් කර වර්ෂ 11 ක් පමණ ගත වී ඇතත් හිඟ මුදල ගෙවා | ඉඩම පවරා ගැනීමේ කටයුතු සහ ගොඩනැගිල්ල ඉදිකර ගැනීමේ කටයුතු අප්‍රමාදව ඉටුකර ගත යුතුය. | පවරා ගැනීමේ මූලික කටයුතු සඳහා යොමු කර ඇත. | පවරා ගැනීම අවසන් වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව වෙත ඉඩම පවරා ගැනීමේ කටයුතු සහ ඉඩමේ ඉදිකිරීම් කටයුතු ආරම්භකිරීම් මෙතෙක් සිදු කර නොතිබුණි. 2017 පෙබරවාරි මාසයේ සිට 2020 වර්ෂය අවසානය දක්වාම දෙපාර්තමේන්තුව කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යමින් තිබුණි. | | | |
| 5. | රබර් නැවත වගාව සහ නව වගාව සඳහා සහනාධාර ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක 9 ක රබර් වගා සහනාධාර ලබාදුන් වගාකරුවන් 9398 දෙනෙකුගෙන් වගාකරුවන් 603 දෙනෙකු වගාව අත්හැර දැමීම නිසා රු.21,702,451 ක් දෙපාර්තමේන්තුවට අය වීමට තිබුණි. | රබර් වගා සහනාධාර ලබාගත්, වගාව අත්හැර දැමූ වගා කරුවන් ගෙන් අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය කාර්යාල හරහා අදාළ වගාකරුවන් දැනුවත් කර නැවත වගාව සඳහා යොමු කරවා ගැනීමටත්, එසේ නොවන වගා කරුවන් ගෙන් සහනාධාර මුදල් අය කර ගැනීමටත් අවශ්‍ය කටයුතු කර ඇත. | එම වගාකරුවන් නැවත වගාවට යොමුකර ගෙන හෝ දෙන ලද ආධාර අයකර ගෙන නොමැත. |
| 6. | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 77 න් නිල නිවාස 11 ක් අලුත්වැඩියා කළ යුතු මට්ටමේ පැවති අතර, එම නිවාස වර්ෂ 13 ක කාලයක් අභාවිතව පැවතුණි. තවත් නිල නිවාස 23 ක් නිලධාරීන්ට ලබා නොදී කාර්යාල ලෙස පවත්වා තිබුණි. | නිල නිවාස අලුත් වැඩියාවන් සිදුකර නිලධාරීන්ගේ භාවිතයට ලබාදීමට කටයුතු කළ යුතුය. | අලුත්වැඩියා ප්‍රමුඛතාවය මත හා ප්‍රතිපාදන මත සිදු කරමින් පවති. ඉල්ලා සිටින ප්‍රතිපාදන නොලැබෙන බැවින් ප්‍රමුඛතාවය මත ලැබෙන ප්‍රතිපාදනවලින් නිල නිවාස අලුත්වැඩියා සිදු කර ඇත. | ලැබෙන ප්‍රතිපාදන සීමාව තුළ ප්‍රමුඛතා පදනම මත සෑම වසරකම අලුත්වැඩියාවන් සිදු කර ඇත. එහෙත් සියලු කටයුතු අවසන් වී නොමැත. |
| **7.** | දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලියට සෘජුවම දායක වන ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරීන් 10 ක් ද රබර් සංවර්ධන නිලධාරින් 50 ක් ද පුරප්පාඩු පැවතීම ව්‍යාපෘති කටයුතුවල | මෙම පුරප්පාඩු පිරවිය යුතුය. | පුරප්පාඩු සඳහා ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමේ මූලික කටයුතු සිදු කර ඇත. | දෙපාර්තමේන්තු ගත තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කටයුතු අවසන් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉලක්ක ලඟා කර ගැනීම දුෂ්කරවීමට බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | | | |
| 8. | රබර් තොරතුරු කළමනාකරණ පද්ධතිය සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කර නිම කිරීමට 2016 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වුවද, මූලික අදියර ආරම්භ කිරීම ප්‍රමාද වීම නිසා නිම කිරීමේ කාලය 2017 දක්වා දික්කර ගිවිසුම සංශෝධනය කර තිබුණි. එහෙත් එම මෘදුකාංගය 2020 මැයි වන විටත් සම්පූර්ණ වී නොතිබුණ අතර ඒ වෙනුවෙන් රු.17,453,971 ක වියදමක් දරා තිබුණි. | අදාළ මෘදුකාංගය කඩිනමින් සංවර්ධනය කර නිමකිරීම කළ යුතු වීම. | 2022 වර්ෂය සඳහා 2106 - මෘදුකාංග සංවර්ධන වැය ශීර්ෂය යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වී නොමැති බැවින් මෙම ප්‍රසම්පාදන කටයුතු තාවකාලිකව නවතා දැමීමට සිදුව ඇත. | මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමේදී වරින් වර පැන නගින ගැටලු නිරාකරණය සඳහා තාක්ෂණික නිපුණතාවයක් දැනට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සතුව නොමැති බැවින් ප්‍රායෝගිකව එය ක්‍රියාත්මක කළ නොහැකි වී ඇත. |
| 9 | දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වෙනත් ආයතන සතු නිල නිවාස 24 ක් සහිත ඉඩම් 2020 වර්ෂය වනවිටද දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කර නිල නිවාසවල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවීම. | ඉඩම් පවරා දෙන ලෙස අදාළ ආයතනවලින් ඉල්ලීම් කර ඇත. | එක් ඉඩමක් පමණක් පවරා ගෙන ඇත. |

ශීර්ෂ 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

| **විගණන නිරීක්ෂණය**<br>------------------------ | | **විගණකාධිපතිගේ නිර්දේශය**<br>-------------------- | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග**<br>----------------------- | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය**<br>---------------------- |
|---|---|---|---|---|
| 1. | 2018, 2019 වර්ෂවලදී නිම කිරීමට නියමිතව තිබූ ඇස්තමේන්තු ගත පිරිවැය රු.257,672,853 ක් වූ ව්‍යාපෘති 05 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදීද නිමකර නොතිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය | කඩිනමින් ඉදිකිරීම්වල වැඩ අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම කොන්ත්‍රාත්තු අවසන් කිරීමේ නිවේදනය දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත නිකුත් කර ඇත. එසේම දෙපාර්තමේන්තු | 2022 ජනවාරි වනවිටත් මෙම කොන්ත්‍රාත්වල වැඩ අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අවසන් වන විට රු.208,921,963 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | | ප්‍රසම්පාදන කමිටු තීරණය මත එම ආයතනය අසාධු ලේඛන ගත කිරීම හා දෙපාර්මේන්තුව වෙත අලාභයක් සිදුව ඇත්නම් එය තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. තවද එක් ව්‍යාපෘතියක ඉතිරි වැඩ දෙපාර්තමේන්තු සේවකයින් යොදවා අවසන් කර ඇති අතර අනෙක් ව්‍යාපෘති වලින් හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු මේ වන විට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් ඉටු කිරීමට එකඟ වී ඇති අතර ඒ සඳහා අවබෝධතා ගිවිසුම් සකස් කරමින් පවති. | |
| 2. | තැන්පත් කල දින සිට වර්ෂ දෙකක් ඉක්ම වූ රු.21,621,561 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරි වර්ෂයේදී හිමිකම් නොපාන තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට පියවර ගැනීම. | 2022 ජනවාරි වන විටත් පොදු තැන්පත් ගිණුමේ එම ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය. |
| 3. | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනතේ 37 වගන්තිය ප්‍රකාරව භාවිතා කරනු ලබන කිරුම් මිනුම් උපකරණ නිසි පරීක්ෂාවකින් තොරව හා මුද්‍රා තැබීමකින් තොරව භාවිතයට ගැනීම වරදක් වුවත් දෙහිවල | පනත පරිදි කටයුතු කළ යුතුය. | මේ වන තෙක් මෙම තරාදි මිණුම් නිවැරදි කිරීම සඳහා අදාළ ආයතනය කටයුතු කර නොමැත. | 2022 ජනවාරි වනතෙක් මෙම කිරුම් මිණුම් උපකරණ සඳහා විධිමත් පරීක්ෂාවක් සහ මුද්‍රා තැබීමක් සිදු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සත්වෝද්‍යානයේ ගබඩාවේ ඇති ධාරිතාවය කිලෝග්‍රෑම් 150 ක් වූ ඉලෙක්ට්‍රොනික් කිරුම් යන්ත්‍රය 2013 වර්ෂයෙන් පසු මුද්‍රා තබා නොතිබුණි. ඒ අනුව බර අඩුවෙන් සටහන් වන බව කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ පරීක්ෂාවේදී නිරීක්ෂණය වී තිබූ නමුත් මේ වන තෙක් එය නිවැරදි කර නොතිබුණි. | | | |
| 4. | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ ගෝනපළ ගොවිපල තුල වගා කිරීමේ කටයුතු නිසි සැලැස්මකට අනුව සිදු කර නොතිබුණි. එහි වගාව වැඩි කර බාහිර ආයතනයන්ගෙන් මිලදී ගන්නා සත්ව ආහාර ප්‍රමාණය අඩු කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගොවිපළ තුළ වැඩි ඵලදාවක් ලැබෙන ආකාරයට නිසි සැලසුමක් අනුව වගා කටයුතු කළ යුතුය. | සෞඛ්‍යාරක්ෂිතව තණකොළ සහ වෙනත් ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා වගා සැලැස්මක් සකස් කර ඇත. | වර්තමානයේද ගෝනපල ගොවිපල තුල වගා කටයුතු නිසි සැලසුමකට අනුව සිදු කර නොතිබුණු අතර බාහිර ආයතනවලින් මිලදී ගන්නා සත්ව ආහාර ප්‍රමාණය විශාල ලෙස වැඩි වී තිබුණි. |
| 5. | දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු 170 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 4 ක හා ද්වීතික මට්ටමේ තනතුරු 33 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | මේ පිළිබඳ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇති බවත් ඉදිරියේදී එම කටයුතු කඩිනමින් ඉටු කිරීමට බලාපොරොත්තු වන බවත් දන්වමි. | 2022 ජනවාරි වනවිටත් පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කර නොමැත. |

ශීර්ෂ 295 - වාණිජ දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය හා 40 (2)(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය දක්වාම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් කාලීනව ඉටු කළ යුතු වීම. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. |
| 2. | දෙපාර්තමේන්තුවේ වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2019 සැප්තැම්බර් 11 දින සිට පුරප්පාඩු විය. එදින සිට අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා, වාණිජ අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ වැඩ බැලීම සිදු කළ නමුත් 2020 මැයි මාසයේදී ඔහු විශ්‍රාම යාමෙන් පසුව දෙපාර්තමේන්තුවේ විධායක ඉහළ තනතුරු දෙකම පුරප්පාඩු වුණි. වාණිජ අධ්‍යක්ෂ ජනරාල් පත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට මේ දක්වාම අනුමැතිය ලැබී නොතිබුණි. | ඉහළ කළමනාකරණයේ පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කල යුතුය. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කර නොතිබුණි. |

ශීර්ෂ 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

| | විගණන වාර්තාවට ඇතුළත් කර ඇති ප්‍රධාන අඩුපාඩු<br>-------------------------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>------------------------ | විගණිත ආයතන විසින් ගනුලැබූ වැලැක්වීමේ පියවර<br>------------------------- | වර්තමාන තත්ත්වය<br>----------------- |
|---|---|---|---|---|
| 1. | 1978 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 E වගන්තිය - ප්‍රමිතියට පටහැනිව ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එසේ කර නොතිබුණි. | ප්‍රමිතියට පටහැනිව ආනයනයන් සිදු කරනු ලබන ආනයනකරුවන්ගේ විස්තර ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතුය. | ගැසට් පත්‍රය කෙටුම්පත් කර ඇති බව දන්වා ඇත. | මෙතෙක් ගැසට් කර නොමැත. |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 2. | වැඩ තහනම් කළ නිලධාරියෙකුට අදාල රු.335,753 ක ණය 2020 වර්ෂය අවසානය වන විට අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත. | අයකරගෙන නොමැත. |
| 3. | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය වේ. එහෙත් වර්ථමානයේදී එක් එක් විෂයයන්ට අදාල ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් මත පමණක් පදනම්ව දෙපාර්තමේන්තු කටයුතු කරනු ලබයි. ඒ අනුව දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියා පටිපාටියක් නොමැති බව විගණනයට නිරීක්ෂණය වන අතර බලපත්‍ර ගාස්තු අය කිරීම පමණක් ප්‍රධාන කාර්යය ලෙස ගෙන කටයුතු කරන බව නිරීක්ෂණය වුණි. | 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු, දැක්ම හා මෙහෙවර අනුව අහිතකර ආනයන හා අපනයනයන් පාලනය කිරීමට කටයුතු කළ යුතුයි. | ගැසට් නිවේදන 11 ක් ප්‍රකාශයට පත්කර තිබුණද, එයින් අපේක්ෂිත පාලනයන් නිසි පරිදි සිදු වී නොමැත. | ගැසට් මගින් අපේක්ෂිත පාලනයන් නිසි පරිදි සිදු වන බවට සමාලෝචනයක් සිදු කර අහිතකර ආනයනයන් පාලනය කිරීමට මේ වන තෙක් පියවර ගෙන නොමැත. |
| 4. | දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග සංවර්ධනය සඳහා ICTA ආයතය සමඟ 2017 පෙබරවාරි 03 දින අවබෝධතා ගිවිසුම අත්සන් කර රු.8,119,035 ක් වියදම් කර තිබුණද මෙම ව්‍යාපෘතිය | සැලසුම් කළ පරිදි නියමිත දිනට කාර්යය ඉටු කරවා ගැනීමට ක්‍රියාකාරීව මැදිහත් වී ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතුය. | ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කරමින් පවතී. | තවදුරටත් කටයුතු නිමකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| 5. | ආනයනයන් සීමා කළ යුතු හා තහනම් කළ යුතු භාණ්ඩ ආනයනයෙන් වැළැක්වීම සඳහා වූ විධිවිධාන ඇතුළත් අංක 2044/40 සහ 2017 නොවැම්බර් 09 දිනැති ගැසට් පත්‍රය මගින් හා පැරණි වාහන රට තුළට ඒම සීමා කිරීම සඳහා වූ 2016 ජුනි 14 දිනැති අංක 1971/10 දරන ගැසට් පත්‍රය මගින් නීති විරෝධී ආනයනයන් රටතුළට ඒම වළක්වා තිබුණි. එහෙත් රේගු දෙපාර්තමේන්තුව අතර අන්තර් සම්බන්ධතාවයක් නොපැවතීම හා දෙපාර්තමේන්තුවේ පාලන පද්ධතියේ පවතින දුර්වලතා හේතුවෙන් ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. | ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම කළ යුතුයි. | ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් මෙතෙක් ස්ථාපනය කර නොමැත. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| 6. | 2017 වර්ෂයේ පාවිච්චි කළ මෝටර් කාර් රථ 35 ක් වෙනස් රේගු සංයෝජිත වර්ගීකරණ අංක කිරීම හේතුවෙන් රු.මිලියන 114.6 ක රේගු බදු අහිමි වී තිබුණු අතර බලපත්‍ර ගාස්තු රු.20,404,375 ක් හා අතිරේක ගාස්තු රු.3,509,045 ක් ලෙස මුළු එකතුව රු.23,913,420 ක් අයකර නොතිබුණි. | වාහන ආනයනය කිරීමේදී ගැසට් නිවේදනවලට හා ආනයන අපනයන පාලකවරයා වෙත ලබාදෙන උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. | විමර්ෂණයක් කරන ලෙස අධ්‍යක්ෂ, අපරාධ විමර්ෂණ වෙත දන්වා ඇත. | මෙතෙක් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 7. | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත - ඖෂධ නියැදියක් පමණක් | නෛතික අවශ්‍යතා සොයා බලා කටයුතු කල යුතු අතර එසේ | මෙතෙක් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නෙමැත. | මෙතෙක් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ආනයනය කරන්නේ නම් ආනයන බලපත්‍රයක් ලබාගත යුතු වුවද, රු.11,753,264 ක් වටිනා ඖෂධ එසේ බලපත්‍ර ලබා ගැනිමකින් තොරව ආනයනය කර තිබුණි. තවද, ඖෂධ ආනයනය සඳහා ලබාදී තිබූ ලියාපදිංචි සහතිකයේ වලංගු කාලය ඉක්මවා ගොස් තිබියදී රු.964,897 ක් වටිනා ඖෂධ ආනයනය කිරීමට අවසර ලබාදී තිබුණි. | නොකළ නිලධාරීන් සම්බන්ධව අවශ්‍ය පියවර ගත යුතුය. | | |
| 8. | 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය - 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 04 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 26 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයන් සම්බන්ධව 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සඳහන් කර ඇති භාණ්ඩ ආනයනය කිරීමේදී ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍රයක් ලබාගත යුතුය. එහෙත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සමාගමක් විසින් 2017 හා 2018 වර්ෂවල ආනයනය කර තිබූ මි.ර.ගැ වටිනාකම රු.19,760,224 ක් වූ සන අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 2,131,325 ක් අඩංගු බහාළුම් 102 ක් සඳහා එලෙස බලපත්‍ර | දෙපාර්තමේන්තුවේ කාර්ය පරිපාටි හෝ වෙනත් ආකාරයෙන් ආනයනකරුවන් කටයුතු කර ඇති බව දැනුවත් වූ වහාම ක්‍රියාත්මක විය යුතුය. | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2022 ජනවාරි වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබා ගැනීමකින් තොරව කටයුතු කිරීම සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | | | |
| 9. | ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව විසින් පැරණි වාහන ගෙන්වීමට අදාලව නිකුත් කරන බලපත්‍ර සම්බන්ධව පසුවිපරමක් සිදු කිරීමේ ක්‍රමවේදයක් නොමැතිවීම. | බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ගැසට් නිවේදනවලට අනුකූලව විය යුතු වීම. | සුදුසු ක්‍රියාමාර්ගයක් මෙතෙක් සකස් කර නොමැත. | විධිමත් කිරීමට පියවර ගෙන නොමැත. |
| | | | | |
| 10. | බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු, පසුවිපරම් කාර්ය සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කල යුතු වුවද, එසේ කර නොතිබුණි. | ගිණුම්කාරක සභා නියෝග අනුව විමර්ශන ඒකකය ස්ථාපිත කිරීම. | විමර්ෂණ ඒකකයක් ස්ථාපිත කර නොමැත. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| | | | | |
| 11. | වාහන නැව්ගත කිරීමට පෙර පරීක්ෂණ සහතික නිකුත් කරන ලියාපදිංචි ආයතන වැඩි කර ගැනීම සඳහා යෝජනා වී තිබුණි. එහෙත් එසේ වාහන සඳහා ඒවා නැව්ගත කිරීමට පෙර පරීක්ෂණ සහතිකය නිකුත් කිරීම සඳහා ලියාපදිංචිය ඉල්ලුම්කළ ආයතන ඒ සඳහා සුදුසුද යන්න පිළිබඳව වූ අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ තහවුරුව 2019 මැයි 31 දින වන විටත් ලබා ගෙන නොතිබුණි. | සැළැසුම් කළ කාර්යයන් ඉටු කිරීම හෝ සංශෝධනය කිරීම සිදුකළ යුතු වීම. | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | විධිමත් කිරීමට පියවර ගෙන නොමැත. |
| | | | | |
| 12. | ගලිබවුසර් ආනයනයේදී සලකා බලනු ලබන උපරිම වයස් සීමාව වසර 15 ක් වුවද එසේ වසර 15 කට වඩා පැරණි ගලිබවුසර් 03 ක් සඳහා ආනයන බලපත්‍ර නිකුත් කර තිබුණු අතර එම බවුසර් සඳහා වර්ගීකරණ | පවත්නා රීතිවලට අනුගත වීම සහ එම රීති සංශෝධනය කරන්නේ නම් විධිමත් පරිදි අදාළ පාර්ශව දැනුවත් කළ යුතු වීම. | අඩුවෙන් අයකළ මුදල අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අංක 180 යටතේ ගාස්තු අයකළ යුතු වුවත් වර්ගීකරණ අංක 150 යටතේ ගාස්තු අය කිරීම හේතුවෙන් රු.647,929 ක බලපත්‍ර ගාස්තු අඩුවෙන් අයකර තිබුණි. | | | |
| 13. | ගම්මිරිස් මිල සීඝ්‍රයෙන් පහළ වැටීම කෙරෙහි ගම්මිරිස් ආනයනය ඍජුවම බලපා ඇති බව නිරීක්ෂණය වුවද, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ගම්මිරිස් ආනයන හා අපනයන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු කර නොතිබුණි. 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා විවිධ වූ බදු සහන යටතේ ශ්‍රී ලංකාවට ආනයනය කර තිබූ ගම්මිරිස් ප්‍රමාණය කිලෝග්‍රෑම් 5,741,230 ක් වූ අතර එහි සාමාන්‍ය ආනයනික මිල රු.600 ක සිට රු.700 ක් දක්වා වූ පරාසයක පිහිටා තිබුණි. | ආනයන හා අපනයන පාලන පනතේ පරමාර්ථ ඉටු කිරීම සඳහා ආනයන හා අපනයන පාලනය සඳහා දෙපාර්තමේන්තුවේ ඍජු මැදිහත්වීම සිදු කළ යුතු වීම. | විධිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විධිමත් කිරීම සඳහා මේ වන විටත් කටයුතු කර නොතිබුණි. |
| 14. | ආයතන 03 ක් විසින් අවස්ථා 04 කදී ආනයනය කර තිබූ රු.මිලියන 20 ක් වන ඖෂධවල ආයු කාලය නියමිත සීමාව ඉක්මවා තිබුණි. | ඖෂධ ආනයනය සඳහා පනවා ඇති කොන්දේසිවල ක්‍රියාත්මකභාවය පිළිබඳව විධිමත් පරිදි සොයාබලා කටයුතු කළ යුතු වීම. | විධිමත් පරිදි සොයා බලා කටයුතු කර නොමැත. | විධිමත් කිරීමට පියවර ගෙන නොමැත. |
| 15. | 2018 හා 2019 වර්ෂවල නිකුත් කර තිබූ ආනයන බලපත්‍ර හා හර නිවේදන සැසඳීමේදී සමහර කාණ්ඩවලට අදාළව නිකුත් කර තිබූ බලපත්‍රවලට වඩා අඩුවෙන් හර නිවේදන නිකුත් තිබුණි. එසේම බලපත්‍ර කාණ්ඩ 05 ක් යටතේ වූ හර නිවේදන | බලපත්‍ර නිකුත් කළ පසු ඒවා උපයෝගී කරගෙන සිදු කරන ආනයනයන් පිළිබඳව විධිමත් පරිදි පසුවිපරම් කටයුතු සිදු කල යුතු වීම. | විධිමත් පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොමැත. | මේ දක්වා විධිමත් කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 171 ක් යටතේ අදාළ ආනයනයන් සිදු කලේද යන්නත් හර නිවේදන ලබා නොගෙන එම භාණ්ඩ වරායෙන් නිදහස් කර ගෙන තිබුණේද යන්නත් පිළිබඳව තොරතුරු විගණනයට තහවුරු නොවීය. | | | |
| 16. | බඳවාගෙන තිබුණු අතිරික්ත නිලධාරීන් තිදෙනෙකු පිළිබඳව මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව අනුමැතිය ලබා ගත යුතු වීම. | අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මේ දක්වා නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

ශීර්ෂ 297 - සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>--------------- | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>----------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>------------------ |
|---|---|---|---|---|
| 1. | 2020 වර්ෂය තුලදී වාර්ෂික වාර්තා ගොනු කරන ලද සමාගම් සංඛ්‍යාව ආදායම් වර්ගීකරණ වාර්තාව අනුව 36,196 ක් වුවද, හිඟ ආදායම් ගණනය කිරීම්වලදී එය 20,973 ක් ලෙස සලකා තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ගණනය කරන ආදායම රු.91,338,000 ක් වී තිබුණි. ඉන් 1/3 ක් ඒකාබද්ධ අරමුදලට හිමි බැවින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ ගාස්තු යටතේ වන හිග හිටි ආදායම රු.30,446,000 කින් අධි ගණනය වී තිබුණි. | හිඟ ආදායම් ගණනය කිරීම් නිවැරදිව කළ යුතුය. | මාර්ගගත ක්‍රමය ඔස්සේ වාර්ෂික වාර්තා ගොනු කිරීම මඟ හැරී ඇති බැවින් එය ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත. | මේ දක්වා නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 2. | 1891 අංක 16 දරන සමිති ආඥා පනතේ (123 වෙනි අධිකාරිය) 8 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව සියළුම ලියාපදිංචි සමිති විසින් රු.1,000 ක් බැගින් ගාස්තු ගෙවා වාර්ෂික වාර්තා ගොනු කළ යුතුය. ඒ අනුව 2020 වර්ෂය අවසානයට වූ ලියාපදිංචි සමිති 15,851 කින් ක්‍රියාකාරි සමිති හඳුනාගෙන ඒකාබද්ධ අරමුදලට අයවිය යුතු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර සමිති 16 කින් පමණක් රු.16,000 ක ආදායමක් ලැබී තිබුණි. | ලියාපදිංචි සමිතිවලින් වාර්ෂික වාර්තා ගොනු කළ යුතු සමිති සංඛ්‍යාව හඳුනාගැනීම හා ඒ අනුව වාර්ෂික වාර්තා ගොනුකිරීමේ ආදායම එකතුකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාකාරී නොවන සමිති සම්බන්ධයෙන් නම කපා හැරීමට කටයුතු කරන අතර ක්‍රියාකාරී සමිති සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා ගොනු කරන ලෙස දන්වා e-Roc පද්ධතිය තුලින්ම සිහි කැඳවීම් ලිපි 3 ක් යොමු වන පරිදි පද්ධතිය සැකසීම. | ක්‍රියාකාරී නොවන සමිති හඳුනාගෙන නම් කපා හැරීමට පියවර ගනිමින් තිබේ. කටයුතු නිමකර නැත. |
| 3. | 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත සෑම සමාගමකින්ම (අක්වෙරළ හා ඇපයෙන් සීමිත සමාගම් හැර) 2016 වර්ෂය සඳහා පමණක් අයකළ වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ බදු, ලැයිස්තුගත පොදු සමාගම් 54 කින් රු.54,000,000 ක් හා වෙනත් සමාගම් 423 කින් රු.63,450,000 ක් වශයෙන් හිඟ කොටස් අයවිය යුතු වුවද එම ආදායම් අයකරගෙන නොතිබුණි.<br>(2020) | 2016 වර්ෂය සඳහා අයකරන වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ බදු නොගෙවූ සමාගම්වලින් එම මුදල් අයකරගැනීම කළ යුතුය. | භාෂාත්‍රයෙන් පුවත්පත් වල දැන්වීම් පල කිරීම, බදු අය කිරීමට සහන කාලයක් ලබා දීම, හා ලිපි මඟින් අයබද්ද ගෙවන ලෙස දැන්වීම. | මෙම අයබද්ද අයකර ගැනීමට දී තිබූ කාල සීමාව අවසන් බැවින් නැවත කාලය දීර්ග කර ගැනීමට මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කිරීමට සූදානමින් සිටී. ආදායම් අයවී නොමැත. |
| 4. | දෙපාර්තමේන්තු තොරතුරු අනුව 2016 වර්ෂයට පෙර ලියාපදිංචි කරන ලද සමාගම් 71,802 කින් මෙම වාර්ෂික | හිඟබදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සංශෝධනය කරන ලද වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අයබද්ද ගෙවන ලෙස | මෙම අයබද්ද අයකර ගැනීමේ කාල සීමාව අවසන් බැවින් |

| | | | | |
|---|---|---|---|---|
| | සමාගම් ලියාපදිංචි කිරීමේ බදු මුදල අයවිය යුතු වුවත්, ඉන් සමාගම් 18,631 ක් පමණක් 2020 වර්ෂය අවසානයට අදාළ මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් පමණක් හෝ ගෙවීම් කර තිබුණි. ඒ අනුව සමාගම් 53,171 කින් සම්පූර්ණ බදු මුදලම අය විය යුතුව ඇතත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. (2020) | | 2019.11.11 දින භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීමක් පල කර,ගෙවීමේ කාලය 2020.07.05 දින දක්වා දීර්ඝ කළ බව දැන්වීම. | නැවත කාලය දීර්ග කර ගැනීමට මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කිරීමට යෝජනා කර ඇත. |

ශීර්ෂ 298 - මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය**<br>---------------------- | **විගණකාධිපතිගේ නිර්දේශය**<br>--------------------- | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග**<br>------------------------------------ | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්වය**<br>------------------ |
|---|---|---|---|---|
| 1. | 2018 සහ 2019 වර්ෂවලදී මුලතිව් හා මන්නාරම් දිස්ත්‍රික්කවල ව්‍යාජ මිනුම් සම්බන්ධ වැටලීම් සිදුකර නොතිබුණි. | ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩුව පැවති කාර්ය භාර්ය නිලධාරි තනතුරු වැඩ බැලීමේ පදනමින් පිරවීම. | 2021 වර්ෂය සඳහා ද මෙම දිස්ත්‍රික්කවල ව්‍යාජ මිනුම් සම්බන්ධ වැටලීම් සිදුකර නොතිබුණි. |
| | | | | |

ශීර්ෂ 299 - ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | විගණකාධිපතිගේ නිර්දේශය<br>-------------------------- | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය<br>------------------ |
|---|---|---|---|---|
| 1. | මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශවීමට අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් 2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා රු.97,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඉන් රු.79,917,430 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.<br>ඉන් රු.32,500,000 ක්ම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන සර්වර් යන්ත්‍රය මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම, පද්ධතිය ස්ථාපිත කිරීමට හා නඩත්තු කිරීමේ කටයුතු ඉටු කිරීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 30 දින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට ගෙවා තිබුණි. මේ සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර අදාළ කාර්යය මාස 06 ක් වැනි කාලයක් තුල ඉටු කළ යුතුව තිබුණි.<br>එහෙත් අදාළ කාර්යය 2020 සැප්තැම්බර් මාසය අවසාන වන විටත් සිදු කර නොතිබුණි. | වැය කරනු ලබන මුදල් වලට උපරිම ප්‍රතිලාභ ලබා ගත යුතුය. | කටයුතු කරමින් පවතී. | 2020 පෙබරවාරි මස 20 දිනැති අංක: අමප/20/0139/215/009 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ICTA ආයතනය සමඟ නැවත ගිවිසුමකට එළඹීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ සහිතව නව ගිවිසුමක් කෙටුම්පත් කර එම කෙටුම්පත ICTA ආයතනය වෙත යැවීමට කටයුතු සිදු කරමින් පවතී. |
| 2. | වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම පිළිබඳ පරිපාටියට අදාළ නීතිමය අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි | සැලසුම් කරන ලද කාර්යයන් නියමිත කාලයේදී ප්‍රමාදයකින් තොරව ඉටුකිරීමට | නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. | උපදේශක සමාගම විසින් සකස් කරන ලද බුද්ධිමය දේපළ |

| | | | | |
|---|---|---|---|---|
| | බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන හා රෙගුලාසි සැකසීමේ ප්‍රධාන අරමුණ වශයෙන් හා ඊට අමතරව වෙළඳ ලකුණු ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා උපදේශක සමාගමක සේවය ලබා ගෙන තිබුණි. මේ සඳහා 2017 වර්ෂයේදී හා 2018 වර්ෂයේ පිළිවෙලින් රු.4,504,877 ක් හා රු.1,995,123 ක් වශයෙන් එකතුව රු.6,500,000 ක් ගෙවා තිබුණි. සමාගම විසින් සකස් කර තිබූ පනත් කෙටුම්පත 2017 ඔක්තෝබර් මාසය අවසන් වන විට කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බවට ගිවිසුම් ගත වී තිබුණද, එම කාර්යය ඉටු වී නොතිබූ අතර ගිවිසුම් ගත එකඟතාවයද 2018 අප්‍රේල් මාසයේදී අවසන් වී තිබුණි. | කටයුතු කල යුතු අතර වැය කරනු ලබන මුදල් වලට ප්‍රමාණවත් කාර්යයක් ඉටු කළ යුතු වීම. | | පනතේ සංශෝධන සහිත කෙටුම්පත මේ වනවිට නීතිපති දෙපාර්තමේන්තු වෙහි නිරීක්ෂණයට යොමු කර ඇත. අදාල කටයුතු අවසන් කර නොමැත. |
| 3. | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් කාර්යාලයේ 2015,2016 හා 2017 වර්ෂවල කාර්යසාධන වාර්තා 2019 මැයි අවසාන වන විටත් සභාගත කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මෙම දෙපාර්තමේන්තුව අයත් රේඛීය අමාත්‍යාංශය වරින් වර අවස්ථා පහක දී වෙනස් වීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට 2017 දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ප්‍රමාද වීමට මූලික වශයෙන් හේතුවන ලදී. | 2015 හා 2016 වාර්ෂික වාර්තා 2022.01.11 දින පාර්ලමේන්තුවේ සභාගත කර තිබුණි. 2017, 2018 හා 2019 වාර්ෂික වාර්තා 2022 පෙබරවාරි 15 දින වන විටත් සභාගත කර නොතිබුණි. |
| 4. | කළමනාකරණ සේවා | අත්‍යවශ්‍ය තනතුරු | ලිපි සහ සිහි කැඳවීම් | රාජ්‍ය පරිපාලන |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (පාලන), සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යන තනතුරු අනුමත කළ දින සිට පුරප්පාඩුව පැවති අතර මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සමඟ ලිපි හුවමාරු කරගෙන තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩු පැවතුණි. | සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කල යුතුය. | වෙළඳ අමාත්‍යාංශය මඟින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යවා ඇත. | අමාත්‍යාංශය මඟින් මෙතෙක් පත්කිරීම් සිදුකර නොතිබුණි. |

ශීර්ෂ 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2018 දෙපාර්තමේන්තුව සතු ගබඩා 09 ක් සමූපකාර තොග වෙළඳ සංස්ථාවට කුලියට ලබාදී තිබුණු අතර ගබඩා කුලියට ලබාදීමේදී තැන්පතු මුදලක් ලබාගෙන නොතිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට හිඟ කුලී ලෙස රු.22,716,858 ක්ද, ජලය හා විදුලිය සඳහා රු.3,486,060 ක්ද වශයෙන් එකතුව රු.26,202,918 ක් අයවිය යුතුව පැවතුනි. | හිඟ කුලී අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | වර්තමානය වන විටද රු.23,915,083ක හිඟ කුලියක් අයවීමට පැවතුණි. |
| 2. | 2008 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද මියන්මාර් සහල් අලෙවි කිරීමේ වැඩසටහන යටතේ පාරිභෝගික සමූපකාර සමිතියකින් | බාහිර පාර්ශවයන් වෙත ගබඩා ලබා දීමේදී කාලානුරූපීව බදු කුලිය අයකර ගැනීමේ ක්‍රමවත් | ඒ සඳහා කටයුතු කර නොමැත. | වර්තමානය වන විටද එම මුදල අය වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.1,442,300 ක් අයවිය යුතුව පැවතුණි. | වැඩපිළිවෙලක් තිබිය යුතු වීම. | | |
| 3. | පාරිභෝගික සමූපකාර සමිතියක් විසින් පරිහරණය කරන ලද ගබඩා 03 ක් සඳහා එකතුව රු.1,029,624 ක් අයකර ගැනීමට 2008 වර්ෂයේදී නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණද,2019 මැයි 31 දින වන විටත් අදාළ හිඟ කුලී ආදායම් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත ගබඩා ලබා දීමේදී පොදු නීති රීති මාලාවක් පිළියෙල කළ යුතු වීම. | ඒ සඳහා කටයුතු කර නොමැත. | හිඟ බදු මුදල් අය කරගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 2019 | | | |
| 4. | 2012 වර්ෂයේදී වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩාවේ ගබඩා කිරීම සඳහා සහල් ලබාදීමේ පදනම මත 2012 හා 2013 වර්ෂයන් හිදි සහල් මෝල්හිමියන් අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව ලබාදිය යුතු සහල් ප්‍රමාණය මෝල්කරුවන් ලබා නොදීම හේතුවෙන් මෝල්හිමියන්ගෙන් අයවිය යුතු මුදල රු.7,390,700 ක් විය. මේ සම්බන්ධයෙන් නිතිමය පියවර ගැනීම සඳහා 2017 වර්ෂයෙදී නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණද, වාර්තාවේ දින වන විටත් නඩු පවරා නොතිබුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | කොටසක් අයකර ගෙන ඇත. | මේ වන තෙක් නඩු පවරා නොමැති අතර වර්තමානය වන විට අය විය යුතු මුදල රු.6,102,932කි. |
| 5. | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සංගමය වෙත අර්තාපල් ගබඩා කිරීම සඳහා වේයන්ගොඩ අංක 08 විද්‍යාත්මක ගබඩාව 2018 වර්ෂයේදී ලබා දී තිබුණි. ගබඩා කරන ලද | අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම හා අලාභය අයකර අලුත්වැඩියා කිරීමෙන් පසුව | අයකර ගැනීමට ක්‍රියා කර නොමැත. | වර්තමානය වන විට ද අලාභය අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අර්තාපල් නරක් වී ජලය කාන්දු වී ගබඩාවේ යන්ත්‍ර හා උපාංග සියල්ලම හානි වී තිබුණි. ඒ හේතුවෙන් මෙම ගබඩාව ප්‍රයෝජනයකට ගැනීමට නොහැකි වී තිබුණ අතර මෙම වාර්තාවේ දින වන විටත් වසා දමා වර්ෂ 1 ½ ක් ගත වී තිබුණි. මෙම ගබඩාවට සිදු වූ අලාභය අදාල උපදේශක ආයතනය විසින් රු.3,315,000 කට තක්සේරු තර තිබුණද, මෙම වාර්තාවේ දින වන විටත් අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ගබඩාව ඉදිකිරීමේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | | |

| | | | | |
|---|---|---|---|---|
| 6. | 2020<br>2020 දෙසැම්බර් 31 දින වන විට වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය රු.365,547 ක් වූ අතර ඒ තුල නිලධාරීන් 06 දෙනෙකුගේ අවුරුදු 05 ක් ඉක්ම වූ රු.202,627 ක ණය ශේෂයක්ද පැවතුණි. සේවය අතහැර ගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය රු.826,656 ක් වූ අතර ඒ තුල නිලධාරීන් 08 දෙනෙකුගේ වසර 05 ඉක්ම වූ රු.643,076 ක ණය ශේෂයක් ද පැවතුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුය. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | වර්තමානය වන විට වැඩ තහනමට ලක් වූ නිළධාරීන් 07 දෙනෙකුගෙන් රු.365,547ක් ද සේවය අතහැර ගිය නිළධාරීන් 09 දෙනෙකුගෙන් රු.796,656ක් ද අය වීමට පැවතුණි. |
| 7. | 2020 දෙසැම්බර් 31 දින විට වසර 05 ඉක්ම වූ මියගිය නිලධාරීයෙකුගෙන් අයවිය යුතු රු.154,130 ක ණය ශේෂයකක්ද, විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.174,157 ක ණය ශේෂයක් පැවතුණි | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුයි. | - එම - | වර්තමානය වන විට ද එම ණය ශේෂ අය වී නොතිබුණි. |
| 8. | ආහාර කොමසාරිස් | ආයතනයේ දැක්ම | අදහස් දැක්වීමක් සිදුකර | වර්තමානය වන |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව "ආරක්ෂිතව අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම" යන දැක්ම අනුව ක්‍රියාත්මක වේ. ඒ යටතේ,<br>(අ) දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො.8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.<br>(ආ) 2008 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.<br>ප්‍රධාන කාර්යයන් ලෙස හඳුනාගෙන තිබුණ ද 2020 වර්ෂය තුල දෙපාර්තමේන්තුව සතුව කිසිදු සහල් සංචිතයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | සහ ප්‍රධාන අරමුණු ඉටු කරගැනීමට අදාල කෘත්‍යයන් නොපමාව ක්‍රියාත්මක කල යුතුය. | නැත. | විට ද ප්‍රධාන කාර්යයන් ඉටු කර ගැනීමට ක්‍රියා කර නොතිබුණි. |
| 9. | දඹුල්ල උෂ්ණත්ව පාලන ගබඩාව ඉදිකිරීම සඳහා 2019 ජූනි 26 දින රු.524,244,587 කට මාස 06 ක් සඳහා ගිවිසුම් ගතවී තිබුණු අතර ගිවිසුමට අනුව 2019 දෙසැම්බර් 26 දින වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් කල යුතුව තිබුණි. එසේ වුවද 2021 මාර්තු 31 දින වන විටත් එහි වැඩ අවසන්ව නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට රු.283,245,417 ක මුදලක් ඒ සඳහා වැයකර තිබුණි. | සැලසුම් කල පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි. | අදහස් දක්වා නොමැත. | මේ වන විට ද දඹුල්ල උෂ්ණත්ව පාලන ගබඩාව ඉදි කිරීම් වැඩ අවසන් කර නොතිබුණු අතර 2021 වර්ෂයේ දරන ලද රු.2,834,975ක මුදල සමඟ 2021 දෙසැම්බර් 31 දිනට රු.286,080,392ක මුදලක් වැයකර |

| | | | | |
|---|---|---|---|---|
| | | | | තිබුණි. |

ශීර්ෂ 301 - සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| | සමුපකාර ග්‍රාමීය බැංකු සහ අනෙකුත් මූල්‍ය සේවා සපයන සමුපකාර සමිති නියාමන කටයුතු විධිමත් කිරීම සම්බන්ධයෙන් පනතක් කෙටුම්පත් කිරීම 2019 වර්ෂයේ සිට ආරම්භ කර තිබූ අතර තවදුරටත් එය කෙටුම්පත් මට්ටමේම පැවතුන අතර ඒ සඳහා 2019 වර්ෂයේදී රු.1,344,871 ක වියදමක් දරා තිබුණි. | පනත සැකසීමේ කටයුතු කඩිනම් කිරීම. | පනතෙහි අවසන් කෙටුම්පත ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | 2021 වර්ෂය අවසන් වන විට රු.1,948,753ක වියදමක් දරා තිබුණි. පනත සම්මත කරගෙන නොතිබුණි. |

ශීර්ෂ 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 1. | 2017 වර්ෂයේදී ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් දීප ව්‍යාප්ත පේෂ කර්මාන්ත සංගණනය වෙනුවෙන් විස්තරාත්මක දත්ත රැස්කිරීම අදියර දෙකක් යටතේ ආරම්භ කරන ලදි. ජන ලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව හා පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා එක්ව සිදුකරනු ලැබූ මෙම සංගණනය සඳහා රු.මිලියන 16 ක | සංගණන කටයුතු ඇස්තමේන්තු කල පරිදි සිදුකර අවසන් කල යුතුය. | සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා ඉදිරිපත්කර ඇති වියදම් ඇස්තමේන්තුව අනුමත කරගැනීම සඳහා 2019-09-16 දිනැති පේෂ කර්මාන්ත අධ්‍යක්ෂගේ ලිපිය මගින් කොමසාරිස් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව | අනුමැතිය සඳහා ඉදිරිපත් කළ ඇස්තමේන්තුවට සංශෝධන ඉදිරිපත් කරන ලෙසත්, එම ඇස්තමේන්තුව නිර්දේශ සහිතව ආයතන අධ්‍යක්ෂ ජනරාල්වෙත ඉදිරිපත් කරන ලෙසත් දන්වා ඇත. සංගණන කටයුතු වල දෙවන අධියර |

| | | | | |
|---|---|---|---|---|
| | වියදමක් ඇස්තමේන්තු කර තිබූ අතර 2017 වර්ෂයේදී සංගණනය අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. 2019 වර්ෂයේදී මෙම සංගණනයේ පළමු අදියර අවසන් කර තිබූ අතර ඒ වෙනුවෙන් රු. 6,133,535ක වියදමක් දරා තිබුණි. නමුත් 2020 අගෝස්තු 31 දින වන විටත් දෙවන අදියරෙහි කටයුතු අවසන් කර නොතිබුණි. | | වෙත යවා ඇත. | ආරම්භ කර නැත. |
| 2. | දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන ගොඩනැගිලි 05 ක් ඉදිකර තිබූ ඉඩම්වල අයිතිය නිරවුල් කර ගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය නිරවුල් කරගෙන ගොඩනැගිලි ඉදිකිරීම කළ යුතුය. | නිරවුල් කිරීමට පියවර ගනිමින් පවතී. | එම කටයුතු නිමකර නොමැත. |
| 3. | අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වය ඉහල නැංවීම තුළින් කර්මාන්ත අංශයෙන් දළ ජාතික නිෂ්පාදනයට දක්වන දායකත්වය සියයට 10 ක් බවට පත්කිරීම තිරසර සංවර්ධන අරමුණක් වී තිබුණි. ඒ සඳහා ෂේපකර්මාන්ත ගම්මාන ආරම්භ කිරීමට කටයුතු කර ඇතත් මේ දක්වා පිහිටුවා ඇති ගම්මානවලින් ක්ෂේත්‍රයට වන දායකත්වය, ඒවායේ වර්තමාන තත්ත්වය සහ සමාලෝචිත වසරේ සැලැසුම් කළ ගම්මාන 10 ක් ආරම්භ නොකිරීම වැනි හේතු නිසා අපේක්ෂිත අරමුණට ලඟාවීමට ඇති හැකියාව සම්බන්ධයෙන් අවධානය යොමුවිය යුතුව පැවති බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත අරමුණු කරා ලඟාවීමට කටයුතු කළ යුතුය. | ව්‍යාපෘති යෝජනා 20 ක් හඳුනාගත් අතර එයින් යෝජනා 08 ක මූලිකව දැනුවත් කිරීමේ කාර්යය 2020 වර්ෂයේදී කළ අතර පුහුණු කටයුතු ආරම්භ කිරීමට සැලසුම්කළත් අත්යන්ත්‍ර හා උපාංග නොලැබීම මත හා කොවිඩ් වසංගත තත්ත්වය මත 2021 වර්ෂය දක්වා කල් දමා තිබුණි. | අපේක්ෂිත අරමුණු ලඟා කරගෙන නොතිබුණි. |

ශීර්ෂ 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | | | | |
| 1. | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයෙන් ජපන් යෙන් මිලියන 2,503 ක් සහ ශ්‍රී ලංකා රජයේ රු. මිලියන 487 ක් යොදාගනිමින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල ඩොප්ලර් රේඩාර් පද්ධතියක් පුත්තලම හා පොතුවිල් කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල පිහිටුවීම සඳහා ගිවිසුම් වලට එළඹී තිබුණද 2020 දෙසැම්බර් 31 දින දක්වා එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද එම කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය පිහිටි භූමිය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රේඩාර් පද්ධතිය ස්ථාපනය කළ යුතු අතර කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය පිහිටි භූමිය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | ආරම්භයේ දී ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබාගැනීමේ ප්‍රමාදයන් සිදු වී ඇති බව පෙනේ. ජපානයේ ඩොප්ලර් යන්ත්‍ර උපකරණ මිලදී ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට 2021 අගෝස්තු දක්වා කල්යන බව JICA ආයතනය විසින් දැනුවත් කර ඇත. | 2021 වසර වන විට විශේෂයෙන්ම වසංගත තත්ත්වය හමුවේ එම කාර්යය පෙර ඇස්තමේන්තුව ලට අනුව කළ නොහැකි බව මිල ගණන් ඉදිරිපත් කළ සමාගම් පවසා ඇත. මේ දක්වා අදාල කටයුතු නිමකර නැත. |
| 2. | 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ඩොප්ලර් රේඩාර් පද්ධතිය වෙනුවෙන් වියදම් කර තිබුණු රු. මිලියන 4,089 ක් වත්කම් වලට ඇතුළත් කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වේ. | 2016 වර්ෂයේ සිට වත්කම් මිලදී ගැනීමේ දී CIGAS පරිගණක මෘදුකාංගය හරහා ස්ථාවර වත්කම් ගිණුම්ගත වන නිසා මෙම වැරැද්ද නිවැරදි කිරීමට කටයුතු යෙදී ඇත. | එම කාලය තුල ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොමැති අතර, රේඩාර් පද්ධතියට අදාල වත්කම් ඉන්වෙන්ට්‍රිගත කිරීමට අදාල ලේඛන සොයාගැනීමට අපොහොසත් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වීම නිසා ගිණුම් ගත කර නැත. |
| 3. | දෙපාර්තමේන්තුව විසින් ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 37 ක් දිවයින පුරා පිහිටුවා තිබුණි. මෙම පද්ධතිය හා සම්බන්ධ චන්ද්‍රිකාව පෘථිවි කක්ෂයෙන් බැහැරව පවතින බැවින් වෙනත් සන්නිවේදන මාධ්‍යයක සම්බන්ධතාවය ලබාගැනීම සඳහා ප්‍රසම්පාදනය ප්‍රදානය කර තිබූ අතර එම ආයතනය 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යය සම්පූර්ණ කර නොතිබුණි. | ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන නිසියාකාරව නඩත්තු කර ක්‍රියාත්මක තත්වයට ගතයුතුය. | ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන නඩත්තුව උපකරණ අංශය හා ඉලෙක්ට්‍රොනික් අංශය වෙත පවරා ඇත. | ඉදිරියේ දී ප්‍රසම්පාදන පරිපාලන කටයුතු නිර්දේශයට අනුව විධිමත්ව පවත්වාගෙන යෑමට බලාපොරොත්තු වේ. මේ දක්වා කටයුතු විධිමත් වී නොමැත. |
| 4. | 2011 වර්ෂයේ මෙරටට ලැබී තිබුණු රේඩාර් පද්ධතිය 2014 වර්ෂයේ දී ස්ථාපිත කර තිබුණු නමුත් දිගු කලක් නිශ්කාර්යව පැවතීම හේතුවෙන් ක්‍රියාවිරහිත වී තිබුණි. 2018 අප්‍රේල් මාසයේ දී ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ භාරකාර අරමුදලේ තවදුරටත් ඉතිරිව පැවති ඇ.ඩොලර් 1.06 ක මුදල උපයෝජනය කර ගනිමින් රේඩාර් පද්ධතිය අළුත්වැඩියා කටයුතු සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ නිෂ්පාදන සමාගම වෙත 2017 අප්‍රේල් 21 දින වන විට නැව්ගතකර තිබුණු අතර, ඒ සඳහා රු. මිලියන 5.6 ක අමතර පිරිවැයක් දරා තිබුණි. කෙසේ වුවද 2020 දෙසැම්බර් 31 දක්වාම යන්ත්‍ර අළුත්වඩියා කර නැවත දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කළ යුතු වීම. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන විමර්ශනයක් සිදුකිරීම සඳහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. | එම විමර්ශනය සඳහා මෙම ව්‍යාපෘතියේ ලිපිගොනු 07 ක් මේ වන විට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත ලබා දී ඇති අතර විමර්ශනය අවසන් කර නොමැත. |
| 5. | ගොන්ගල රේඩාර් පද්ධතිය ස්ථාපිතකිරීම සඳහා ලෝක කාලගුණ විද්‍යා සංගමයේ භාරකාර අරමුදලේ තැන්පත් කර තිබූ රු.මිලියන 32 ක් නැවත දෙපාර්තමේන්තුවට ගෙන්වා ගෙන ඉන් රු. මිලියන 1 ක් වියදම් කර ඉතිරි මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම සහ රු.මිලියන 9 ක් වටිනා උපකරණ අස්ථානගත වීම සම්බන්ධයෙන් | මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත මෙම වත්කම් හා ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වේ. | මෙම ආයතන “A ශ්‍රේණියේ“ දෙපාර්තමේන්තුවක් වන බැවින් ලැබෙන ආදායමෙන් වියදම් දැරීමේ හැකියාව පවතී රු.මිලියන 9 ක් | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොමැති අතර ඩොප්ලර් රේඩාර් |

| | | | | |
|---|---|---|---|---|
| | ගිණුම් ගත කර නොතිබුණි. | | වටිනා උපකරණ අස්ථානගත වීම සම්බන්ධයෙන් පැවැත්වෙන විමර්ශනයෙන් පසු ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | පද්ධතියට අදාල වත්කම් ඉන්වෙන්ට්‍රිගත කිරීමට අදාල ලේඛන සොයා ගැනීමට අපොහොසත් වී තිබුණි. |

ශීර්ෂ 306 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

| | | විගණන නිරීක්ෂණය | | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| **1** | | 2019 වර්ෂයේදී ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාල 19 ක විවිධ වර්ගයන්ගෙන් විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉවත දමා ඇති රේල්පීළි වල මුළු බර කි.ග්‍රෑම් 3,502,674 ක් වූ අතර ඒවා කිලෝ ග්‍රෑම් 01 ක් පෙර අලෙවිකරන ලද මිළ වූ රු. 50 පදනම්ව අලෙවි කර උපයා ගත හැකිව තිබූ ආදායම රු. 175,133,700 ක් විය. ඉතිරි ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාල 26 හි මීට වඩා වැඩි අබලි යකඩ ප්‍රමාණයක් තිබිය හැකි බවද නිරීක්ෂණය කෙරේ. | | භාවිතයෙන් ඉවත් කළ දෑ විධිමත් පරිදි අපහරණය කිරීමට පියවර ගත යුතුවේ. | සියලුම ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාල වල පවත්නා අබලි යකඩ පිළිබඳව සොයා බලා තක්සේරු කර අලෙවි කිරීමට කටයුතු කිරීම. | මෙතෙක් ඉවත් කර නොමැත. |
| **2.** | | <u>පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවීම</u> | | | | |
| | | වර්ෂය අවසාන දිනට භෞතික ශේෂය පදනම් කරගෙන වර්ෂය අවසාන තොගය ගණනය කර ගිණුම්වල පෙන්විය යුතු වුවද පොත් ශේෂය පදනම් කරගෙන තොග වටිනාකම් ගණනය කර තිබුණි. | | වර්ෂ අවසාන තොග වටිනාකම භෞතික ශේෂය පදනම කරගන ගණනය කළ යුතුවේ. | කාර්ය මණ්ඩල ඌනතාවය මත නිවැරදි මූලාශ්‍ර තොරතුරු වෙත ප්‍රවේශවීමේ අපහසුතාවය. | 2021 වසරේදී ද නිවැරදි කර නැත. |
| **3.** | | <u>දේපල පිරියත හා උපකරණ</u> | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | (අ) | දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් දේපළ හඳුනාගෙන ඒවායේ අයිතිය තහවුරු කරමින් ඒවායේ නිවැරදි වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. 2019-2020 | | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේදී ප්‍රධාන කාර්යාලය හා උප දෙපාර්තමේන්තු 03 ක පමණක් වත්කම් ගිණුම්ගත කිරීම. | වත්කම් ගිණුම්ගත කිරීම සම්පූර්ණ කර නොමැත. |
| | (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2020 වර්ෂයේදී රු. 30,563,559,457 ක් වටිනා වත්කම් මිළදී ගෙන තිබුණද භාණ්ඩාගාර මුද්‍රිතවල (SA 82) මිළදී ගැනීම් කිසිවක් දක්වා නොතිබුණි. | | වත්කම් මිළදීගැනීම් භාණ්ඩාගාරයට වාර්තා කළ යුතු වේ. | කාලානුරූපව දත්ත යාවත්කාලීන කිරීම. | මේ දක්වා නිවැරදි කර නැත. |
| | (ඇ) | මූල්‍ය නොවන වත්කම්වලට අදාළව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල අගයන් හා භාණ්ඩාගාර මුද්‍රිතවල අගයන් අතර ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව පිළිවෙලින් ආරම්භක ශේෂ අතර රු. 417,717,025,337 ක, අවසාන ශේෂ අතර රු. 234,911,103,947 ක හා අපහරණ වටිනාකම් අතර රු. 152,213,895,645 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | | වෙනස්කම්වලට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිරන්තරව ශේෂ සන්සන්දනය කිරීම. | මෙතෙක් නිවැරදි කර නොමැත. |
| **4.** | | **<u>ගබඩා අත්තිකාරම් ගිණුම</u>** | | | | |
| | **(අ)** | පසුගිය වසර වලදී ගබඩා අත්තිකාරම් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සමාන කිරීම සඳහා අවිනිශ්චිත ශේෂයක් ඇතුලත් කර තිබුණි. | | අධි තක්සේරුවීම් ලෙස ගිණුමේ දක්වා ඇති ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | දිගු කලක සිට පැවත එන පැරණි ශේෂ නිරවුල් කිරීමේ දැඩි අසීරුතාවයක් පවතී. | මෙතෙක් නිරවුල් නොවූ ශේෂ පවතී. |
| | **(ආ)** | 1993 වර්ෂයේ සිට මේ දක්වා භාණ්ඩ ආනයනයේ දී රේගු ගාස්තු වශයෙන් දරන | | රේගු ගාස්තු වැනි සෘජු වියදම් | 2021 පෙබරවාරි | සම්පූර්ණ වටිනාකම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ලද රු. 94,559,163 ක වියදම මෙතෙක් තොගයට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | | තොගයට ගැලපීමට කටයුතු කළ යුතුවේ. | වන විට මින් රු. 27,440,938 ක් තොගයට ඇතුලත් කර ඇත. | තොගයට ඇතුලත් කර නොමැත. |
| **5.** | | **<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම</u>** | | | | |
| | **(අ)** | දේපළ ණය ලබාගෙන ඇති සේවයේ නොමැති නිලධාරීන් 91 දෙනෙකුගෙන් වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා වූ පරාසයක සිට අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 4.911 ක් හා වර්ෂ 05 ට වැඩි ණය ශේෂය රු.මිලියන 4.17 ක් 2020 දෙසැම්බර් 31 දිනට පැවතුණි. | | දේපළ ණය සඳහා ලබාගෙන ඇති ඇපය හෝ ඇටෝර්නි බලය පාවිච්චි කර හිඟ ණය අය කර ගැනීමට නීතිමය වශයෙන් කටයුතු කළ යුතු වේ. | අයකර ගැනීම සඳහා ලිපි යවා ඇත. | මෙතෙක් අයකරගෙන නොමැති අතර සාක්ෂිගත ලිපි ලේඛන ඌනතාවය මත නීතිමය පියවර ගත නොහැකි බව. |
| | **(ආ)** | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු. 4,177,805 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එය 2004 වර්ෂයේ සිට පැවත එන්නකි. | | වෙනසට හේතු පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිරවුල් කිරීම සඳහා නිලධාරීන්ට උපදෙස් දීම. | ප්‍රමාණවත් තොරතුරු නොමැති නිසා නිරවුල් කිරීමට නොහැකිය. |
| | (ඇ) | 2020 වර්ෂයට අදාලව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම් ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු. 1,110,101 ක වෙනසක් පැවතුණි. | | වෙනසට හේතු පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රමාණවත් සාක්ෂි නොතිබීම. | රු. 463,884 ක් නිරවුල් කර ඇති අතර ඉතිරි ශේෂය නිරවුල් කර නැත. |
| **6.** | | **<u>ආදායම් කළමනාකරණය</u>** | | | | |
| | **(අ)** | බදු ආදායම සම්බන්ධයෙන් නඩත්තු කරන ලිපිගොනු පරිගණක ගත කර බදු එකතු කර ගැනීමේ ක්‍රමවේදය | | බදු අය කර ගැනීම සඳහා පරිගණක | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන | ICT ආයතනයේ නිර්දේශය |

<table>
<tr>
<td></td>
<td></td>
<td>කාර්යක්ෂම කර ගැනීමේ අරමුණින් මෘදුකාංගයක් සකස් කිරීම සඳහා 2015 වර්ෂයේදී රු. 900,000 ක් ගෙවා තිබුණද, මේ දක්වාම එම කාර්යය සාර්ථක කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.</td>
<td></td>
<td>තාක්ෂණය උපයෝගී කර ගැනීමට පියවර ගත යුතුවේ.</td>
<td>නොමැත.</td>
<td>මත මුදල් ගෙවා ඇත. විකල්පයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුව මඟින් නව දත්ත පද්ධතියක් සැකසීමට යෝජිතය.</td>
</tr>
<tr>
<td></td>
<td></td>
<td></td>
<td></td>
<td></td>
<td></td>
<td></td>
</tr>
<tr>
<td></td>
<td>(ආ)</td>
<td>ඉඩම් බදුදීම සම්බන්ධව සිදුකරන ලද ඉඩම් ලිපිගොනු 12 ක නියැදි පරීක්ෂාවකදී එම බදු ඉඩම්වලින් හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.<br><br>• බදු ඉඩම් 10 ක් සඳහා 2017 වර්ෂයෙන් පසුව හිඟ ආදායම් ගණනය කර නොතිබුණු අතර හිඟ මුදල රු. 136,485,202 ක් විය. ඉතා දීර්ඝ කාලයක සිට පැවත එන මෙම හිඟ මුදල පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.<br>
<table>
<tr><th>වසර 05 ට වැඩි</th><th>වසර 10 ට වැඩි</th><th>වසර 20 ට වැඩි</th><th>වසර 25 ට වැඩි</th><th>වසර 30 ට වැඩි</th></tr>
<tr><td>23,430,450</td><td>9,030,585</td><td>-</td><td>74,274,658</td><td>29,749,510</td></tr>
</table>
<br>• දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් වෙනත් පාර්ශවයන් විසින් අත්පත් කරගෙන ආදායම් උපයන අවස්ථා නිරීක්ෂණය විය.</td>
<td></td>
<td>හිඟ ආදායම් අයකර ගැනීම කෙරේ අවධානය යොමුකළ යුතුවේ.<br><br>මේ සඳහා නිතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතුවේ.</td>
<td>බදු දීමේ ක්‍රමවේදය විධිමත් කිරීම හා අධීක්ෂණය විය හැකි පද්ධතියක් ස්ථාපනය කිරීම.<br><br>නීතිමය පියවර ගැනීමට කටයුතු කෙරේ.</td>
<td>හිඟ ආදායම් අයකර ගෙන නොමැත.<br><br>බාහිර පාර්ශවයන් ගෙන් දේපල නිරවුල් කරගෙන නොමැත.</td>
</tr>
</table>

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | (ඇ) | දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් බදුදීම්වලට අදාළව ගිවිසුම් කොන්දේසි කඩ කිරීම, උප බදුදීම, මූලික අරමුණට පටහැනිව ක්‍රියා කිරීම හා බදුකුලි සංශෝධනය කිරීමට කටයුතු නොකිරීම වැනි ක්‍රියා තුලින් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු බදු ආදායම් අහිමි වී තිබුණි. | | ඉඩම් බදුදීමට අදාළ පරිගණක මෘදුකාංගයක් කඩිනමින් භාවිතා කිරීම තුලින් මෙම තත්වය මගහරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | වගකිවයුතු ඉහළ නිලධාරියෙකු ගේ අධීක්ෂණයට යටත් විය හැකි පරිදි බලතල බෙදී යන පාලන පද්ධතියක් හඳුන්වා දීම. | නිරවුල් වී නොමැත. |
| | (ඈ) | 1998 සැප්තැම්බර් 10 දිනැති අංක 10/8/387 දරන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂගේ ලිපිය ප්‍රකාරව LA 34817 දරන බදු ගිවිසුමකින් ඉඩම් බදු අරගෙන තිබුණු අතර එම බදු ගිවිසුම දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. 2019 | | සියළු ලිපි ලේඛණ ආරක්ෂිතව තබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | බදු ලිපිගොනු ආරක්ෂිතව තැබීමේ ක්‍රමවේදයක් සකස් කිරීම. | නාගරික සංවර්ධන අධිකාරියෙන් මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැති බැවින් විසඳී නැත. |
| | (ඉ) | විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව දුම්රිය බලපත්‍ර හිඟ ආදායම රු. 848,334,880 ක් වූ අතර බලපත්‍ර 01 ආදායම යටතේ අවු. 23 ක ටත් පෙර සිට පැවත එන රු. 769,194 ක ශේෂයක් අයකර ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. බලපත්‍ර 02 හිඟ ආදායම යටතේ අයවිය යුතු රු. 847,565,686 ක මුදලින් සියයට 55ක්ම වර්ෂ 05 ඉක්ම වූ හිඟ ශේෂ විය. | | පැරණි හිඟ ආදායම් ශේෂ කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | විශේෂ ක්‍රියාමාර්ගයක් ගෙන හිඟ ආදායම් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොමැත. | බලපත්‍ර 01 හිඟ ආදායම් පිළිබඳ විස්තර දෙපාර්තමේන්තුව සතුව නැත. මේ වන විට රු. මිලියන 40 ක් පමණ අය කරගෙන ඇත. හිගය මිලියන 807 කි. |
| | (ඊ) | දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය වෙනුවෙන් ආයතන 31 කින් රු. මිලියන 119 ක මුදලක් අයවිය යුතු අතර ඉන් සියයට 25 ක් වසර 18 කට වැඩි වූ ශේෂයන් විය. | | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ආයතනය වෙත ලිපි යවා ඇතත් ආයතනය වසා දමා ඇති | සාක්ෂි හා තොරතුරු නොමැති නිසා අයකර ගෙන |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | බැවින් ලිපි හරවා එවා ඇති අතර වෙනත් ක්‍රියාමාර්ග ගෙන නොමැත. | නොමැත. |
| | (උ) | දුම්රිය ස්ථාන වලින් අයවිය යුතු හිඟ මගී ආදායම රු. 10,879,857 ක්ද, පාර්සල් හා භාණ්ඩ ප්‍රවාහන හිඟ ආදායම රු. 4,992,485 ක්ද, විවිධ හිඟ ආදායම රු. 920,487 ක්ද වශයෙන් මුළු හිඟ ආදායම රු. 16,792,829 ක් විය. හිඟව පවතින කාලපරිච්ඡේදය සැලකීමේදී මගී ආදායම නිරවුල් කර ගැනීමට මෙන්ම පාර්සල්වල හිඟ ආදායම් ඇතිවීම වළක්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි.<br>2019,2020 | | හිඟ ආදායම් නිරවුල් නොවීමට හේතු සොයාබලා කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට හා ඒවා අහිමි වීම වළක්වා ගැනීමට ක්‍රියාමර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගෙන නොමැත. |
| | (ඌ) | 2020 වර්ෂය අවසානයට වෙනත් හිඟ ආදායම් රු. 556,205,725 ක් වූ අතර එම හිඟ ආදායම අවම කර ගැනීමට අවශ්‍ය විධිමත් පාලන පද්ධතියක් සකස් කර ගෙන නොතිබුණි. බඩු ගබඩා ආදායම, ස්ථාවර භෝජනාගාර, වෙළඳ දැන්වීම්, ප්‍රචාරණ හා සුළු වෙළඳ අලෙවිසැල් සම්බන්ධයෙන් හිඟ ආදායම රු. 506,507,273 ක්වූ අතර එය වෙනත් හිඟ ණය වටිනාකමින් සියයට 90 කට වැඩි වී තිබුණි.<br>2020 | | හිඟ ආදායම් අවම කර ගැනීමට අදාළ විධිමත් පාලන පද්ධතියක් සකස් කරගත යුතුවේ. | හිඟ ආදායම් වළක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගෙන නොමැත. |
| **7.** | | **<u>වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය</u>** | | | | |
| | | සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් 2019 වර්ෂයට රු. 18,930,500 ක්ද, 2020 වර්ෂයට රු. 7,812,182 ක්ද වශයෙන් දුම්රිය ස්ථාන සංවර්ධනය සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන උපයෝගී කර | | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින්ලබාදුන් ප්‍රතිපාදන | වැළක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සංවර්ධන කටයුතු මුළුමනින්ම සම්පූර්ණ නොවී ඇති |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | නොතිබුණි. | | කඩිනමින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | | අතර මහනුවර සංවර්ධන කටයුතු නිම කර ඇත. |
| **8.** | | **අත්තිකාරම් ශේෂ** | | | | |
| | | සැපයුම්කරුවන්ට අත්තිකාරම් වශයෙන් රු. 7,957,438 ක් ගෙවා ඇතත් ඒවා නිරවුල් කර නොතිබුණි. | | අත්තිකාරම් ගෙවා ඇතත් ඒවාට අදාළ භාණ්ඩ ගෙන්වා ගැනීමට පියවර ගත යුතුවේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාණ්ඩ ගෙන්වා ගැනීමට උත්සහ කරන බව. |
| **9.** | | **බලය නොලත් කාරක පාඩු.** | | | | |
| | | ගබඩා අත්තිකාරම් ගිණුමේ රු. මිලියන 13 ක කාරක පාඩුවක් දක්වා තිබුණු අතර මේ දක්වා එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.<br>2019 | | මුදල් රෙගුලාසි පරිදි අදාළ කාරක පාඩු පියවා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කාරක පාඩු පිළිබඳව ගිණුම් කාරක සභාවට වාර්තා කිරීම. | කපා හැරීම සඳහා අනුමැතිය ලැබී නොමැත. |
| **10.** | | **නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම** | | | | |
| | **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 102 – 109 ප්‍රකාර 2014 අප්‍රේල් 30 දින S 11 – 902 දරන බලවේග එන්ජිම වෙනත් දුම්රියක ගැටීම නිසා සිදු වූ අනතුරෙන් වූ රු.මිලියන 48 ක අලාභය සම්බන්ධයෙන් වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම දුම්රිය එන්ජිම අපහරණය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.<br>2018 | | අදාළ වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | විනය ක්‍රියාමාර්ග ගෙන ඇතත් වගකිව යුත්තන් හඳුනාගෙන නොමැත. අපහරණය කර නොමැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | (ආ) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 අප්‍රේල් 25 දිනැති PED/RED/ 07/FR/GEN දරන ලිපිය පරිදි රජය සතු වත්කමක් මගින් උපයන ආදායම රාජ්‍ය ආදායමට බැර විය යුතු වුවත් ඊට පටහැනිව මවුන්ට්මේරි ක්‍රීඩාංගනය හා සමාජ ආයතනය කුලියට දීම මගින් 2012 සිට 2017 දක්වා අයකර ගත් රු. 10,308,233 ක මුදල රාජ්‍ය ආදායමට බැර නොකර විවිධ උත්සව වෙනුවෙන් දරා තිබුණි.<br>2018 | | රජය සතු වත්කම් වලින් උපයන ආදායම රාජ්‍ය ආදායමට බැර කිරීම සඳහා කටයුතු කළ යුතුවේ. | වැළක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | නිවැරදි කර නොමැත. |
| | (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII ඡේදය පරිදි අතිකාල සාමාන්‍යය වශයෙන් ගණන්ගත යුත්තේ එක් එක් දවසේ සාමාන්‍ය රාජකාරි වේලාවන්ට වැඩියෙන් වැඩ කරන ලද පැය ගණන පදනම් කරගෙනය. සති පදනම් කරගෙන රාජකාරි වේලාවන් නියම කර ඇති විට අතිකාල ගණන් බැලිය යුත්තේ සතියකට නියමිත පැය ගණනට වැඩියෙන් වැඩ කරන ලද පැය ගණන පදනම් කරගෙනය. එසේ වුවත් දිනකට පැය 07 බැගින් සතියකට පැය 42 ක් ඉක්මවා වැඩ කරන ලද කාලය සඳහා පමණක් අතිකාල දීමනා ලබාගත යුතු වුවත් සාමාන්‍ය රාජකාරි වේලාවද ඇතුලත්ව දුම්රිය නියාමකයින් අතිකාල ලබාගෙන තිබුණි.<br>2019 | | ආයතන සංග්‍රහයේ viii ජේදය පරිදි කටයුතු කළ යුතුවේ. | වැළක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | චක්‍රලේඛයක් නිකුත් කර ඇතත් මේ දක්වා එය ක්‍රියාවට නගා නැත. |
| | (ඈ) | 2015 අප්‍රේල් 24 දිනැති අංක 3/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 03 වන ඡේදයේ V වගන්තිය පරිදි වයස අවුරුදු 54 ඉක්ම වූ නිලධාරීන්ගේ දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගත | | විශ්‍රාම යාමට නියමිත සියළු නිලධාරීන්ගේ දත්ත පද්ධතියක් සකස්කර | ක්‍රමවත් වැඩපිළිවෙල ක් සැකසීම සඳහා උපදෙස් ලබා දී ඇති | මේ දක්වා නිවැරදි කර නොමැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | යුතු වුවත්, දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කිසිදු උප දෙපාර්තමේන්තුවක එවැනි දත්ත පද්ධතියක් ක්‍රියාත්මක නොවීය.<br>2020 | | යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. | බව දන්වා ඇත. | |
| **11.** | | <u>**අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**</u> | | | | |
| | | 2017 වර්ෂයේදී දුම්රිය ස්ථානවල ජල පෙරන සවි කිරීමට අදාල ව්‍යාපෘතිය යටතේ ජල පෙරන සවි කිරීමේ කාර්යය ප්‍රමාද වීම මත රු.1,636,640ක මුදලක් සැපයුම්කරුගෙන් අයකර ගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. තවද අනුරාධපුර කොට්ඨාශයේ දුම්රිය ස්ථාන 17ක සවිකර තිබූ ජල පෙරන 17ක් අක්‍රිය වී තිබුණු ඒවායේ වටිනාකම රු.10,211,000ක් විය. | | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සියල්ල අක්‍රිය වී ඇත. අනාර්ථික වියදමක් බවට නිරීක්ෂණය කෙරේ. |
| **12.** | | <u>**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**</u> | | | | |
| | (අ) | ප්‍රීමා සමාගම විසින් ඔවුන්ගේ නිෂ්පාදන වන පිටි ප්‍රවාහනය සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ණය පදනමට කන්ටේනර් ෆ්ලැට් බෙඩ් 15 ක් හා කන්ටේනර් 30 ක්ද සහිතව කන්ටේනර් හසුරුවන මැෂිමක් මිළදීගෙන තිබුණි. ඒවායේ පිරිවැය ප්‍රවාහන ගාස්තුවෙන් ආවරණය වන පරිදි ගිවිසුමකටද එළඹ තිබුණි. එකී ගිවිසුම අනුව දුම්රිය දෙපාර්තමේන්තුව විසින් එක් මසක් තුල ගමන් වාර 20 – 22 ක් අතර ප්‍රමාණයක් ත්‍රිකුණාමලය සිට සීදුව ගබඩාව වෙත සිදුකළ යුතු විය. එහෙත් 2021 ජනවාරි 06 දින සිට පෙබරවාරි 15 දක්වා සිදුකර ඇති ගමන්වාර ප්‍රමාණය 05 ක් පමණක් වන අතර උපයාගෙන ඇති මුදල රු. 2,654,750 කි. | | එම සමාගම සමඟ එකඟ වූ පරිදි භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සපයා දෙපාර්තමේන්තුවේ ආදායම වැඩිකර ගැනීම කෙරේ අවධානය යොමුකළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. | ගිවිසුම්ගත පරිදි කටයුතු කර නොමැත. |
| | (ආ) | ප්‍රීමා සමාගම විසින් ඒ ඒ දිස්ත්‍රික්කවල පිහිටි ගබඩාවලට මාසිකව ප්‍රවාහනය කරන පිටි ප්‍රමාණය | | දුම්රිය මගින් පිටි ප්‍රවාහනය සඳහා පහසුකම් සලසා | මේ සඳහා පිළිතුරු ලබා දී නොමැත. | ගිවිසුම අනුව කටයුතු කර නොමැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | මෙට්‍රික් ටොන් 18,100 ක් වන අතර එම ප්‍රමාණය දුම්රිය මගින් ප්‍රවාහනය කරනු ලබන්නේ නම් දෙපාර්තමේන්තුවට උපයාගත හැකි ආදායම මාසිකව රු. 19,349,687 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව පිටි ප්‍රවාහනයෙන් පමණක් වාර්ෂිකව උපයාගත හැකිව තිබූ ආදායම රු. 232,196,244 ක් වූ නමුත් දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳ නිසි අවධානයක් යොමුකර පිටි ප්‍රවාහන ආදායම වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>2020 | | දී දෙපාර්තමේන්තුවේ ආදායම වැඩිකර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | | |
| | **(ඇ)** | ගල් අඟුරු ප්‍රවාහනය සඳහා කලට වේලාවට වැගන් සැපයීමට අසමත්වීම හේතුවෙන් හොල්සිම් සමාගම ගිවිසුමෙන් ඉවත් වී තිබුණි. එම නිසා වාර්ෂිකව අයකර ගත හැකිව තිබූ රු.මිලියන 28 කට වැඩි ආදායමක් අහිමි වී තිබුණි. | | ගල් අඟුරු ප්‍රවාහනයෙන් ලැබෙන ආදායම වැඩිකර ගැනීමට පියවර ගත යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. | දැනට නැවතී ඇත. අදාල ආයතනය ඒක පාර්ශවිකව ගිවිසුමෙන් ඉවත් වී ඇත. |
| 13. | | **<u>මුදල් වෙන්කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති.</u>** | | | | |
| | | රත්මලාන යාන්ත්‍රික උප දෙපාර්තමේන්තුවේ නිල නිවාස පරිශ්‍රය සඳහා ජල මීටර් සවි කිරීම සඳහා රු. මිලියන 15 ක් ලබා දී තිබුණද, එම කාර්යය ඉටුකර නොතිබුණි. එම නිසා තවදුරටත් එම පරිශ්‍රයේ ජල පරිභෝජන වියදම දෙපාර්තමේන්තුව මගින් දැරීමට සිදු වී තිබුණි. | | නිල නිවාසවල ජල පරිභෝජනය වෙනුවෙන් සෑම වර්ෂයකම රු. මිලියන 25 කට ආසන්න මුදලක් දෙපාර්තමේන්තුවෙන් වැයකර තිබුණි. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා කඩිනමින් පියවර ගත යුතුවේ. | මෙවැනි පාඩු සිදු වීම වැළැක්වීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම. | වියදම අවම කිරීමට විසඳුමක් සපයා නොමැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 14. | | <u>කාර්ය සාධනය</u> | | | | |
| | | වේගසීමා පැනවීමට ප්‍රධාන හේතුව සිල්පරවල දුර්වලතාවය, රේල්පීලිවල දුර්වලතාවය, බැලස්ට් ප්‍රමාණවත් පරිදි නොයෙදීම බව හඳුනාගෙන තිබුණද ඒවායේ හිඟයක් පවතින බව නිරීක්ෂණය නොවුණු බැවින් දුම්රිය සේවයේ කාර්යක්ෂමතාවය නැතිවීමට බලපාන ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | | දුර්වල ස්ථාන හඳුනාගෙන ඇති නිසා කඩිනමින් පිළියම් යෙදිය යුතුවේ. | වේගසීමා ඉවත් කර දුම්රිය නියමිත වේලාවට ධාවනය කරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | වේග සීමා අඩු කිරීමට පියවර ගෙන නැත. |
| 15. | | <u>ඌන උපයෝජිත වත්කම්</u> | | | | |
| | | හදිසි මිළදී ගැනීමක් වශයෙන් 2014 වර්ෂයේදී රු. මිලියන 25.56 ක වටිනාකමකින් යුත් දුම්රිය හරස් මාර්ග සඳහා උපාංග මිළදී ගෙන තිබුණ ද ඉන් රු. මිලියන 6.31 ක් වටිනා උපකරණ භාවිතයට නොගෙන මේ වන විටද සංඥා උප දෙපාර්තමේන්තුවේ ගබඩා කර තිබුණි. එම උපාංග සඳහා ලබා දී තිබූ වසර 02 ක වගකීම් කාලයද මේ වන විට ඉකුත් වී තිබුණි. | | වගකිව යුත්තන්ට එරෙහිව විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන පිරිවිතර වලට අනුව භාණ්ඩ මිළදී ගැනීම. | වගකීම් කාලය ඉකුත් වූ භාණ්ඩ අවශ්‍යතාවය අනුව භාවිතයට ගනිමින් පවතී. |
| 16. | | <u>වාර්ෂික කාර්යසාධන වාර්තාව</u> | | | | |
| | | 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව 2020 වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021 සැප්තැම්බර් 30 දින වන විටද පිළියෙල කර නොතිබුණි. 2019 වර්ෂයේ කාර්යසාධන වාර්තාවද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | | චක්‍රලේඛ විධිවිදාන පරිදි නියමිත කාලයේදී වාර්තාව පිළියෙල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුවේ. | වැළක්වීම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ දක්වා ඉදිරිපත් කර නොමැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 17. | | **<u>ප්‍රසම්පාදනයන්</u>** | | | | |
| | (අ) | **<u>S 13 බලවේග කට්ටල මිළදී ගැනීම.</u>**<br><br>**(i)** බලවේග කට්ටල මිළදී ගැනීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුවට අනුව ඒකකයක නැව්ගත කිරීමේ මිළ රු. මිලියන 1,166.70 ක් වන අතර ලංසුකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද මිළ රුපියල් මිලියන 1,402.80 කි. මේ අනුව එක් බලවේග කට්ටලයක් සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා ගෙවිය යුතු වටිනාකම රු. මිලියන 236.10 කි. | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා පූර්ව අත්දැකීම් සැලකිල්ලට ගත යුතුවේ. | ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී දැනුමෙන් හා වගකීමෙන් යුතුව කටයුතු කිරීම. | ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සැමවිටම ඇස්තමේන්තුව අඩු වටිනාකමට පිළියෙල කරනු ලබන බව. |
| | | (ii) ලංසුකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් ඇමරිකන් ඩොලර් මිලියන 63 කි. එනම් රුපියල් මිලියන 9,135 කි. එම මිළ ඉංජිනේරු ඇස්තමේන්තුව වන රුපියල් මිලියන 7,317.60 කට වඩා වැඩි බැවින් අමාත්‍ය මණ්ඩල සාකච්ඡා සම්මුති කමිටුව සමඟ සාකච්ඡාවේදී එළඹී තීරණය ප්‍රකාර සංශෝධිත මිළ රුපියල් මිලියන 8,787 ක් විය. එම මිල සමඟ සන්සන්දනයේදී සංශෝධිත මිළද ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රුපියල් මිලියන 1,469.40 කින් වැඩිය. | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කළ යුතුවේ. | -එම- | ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සැමවිටම ඇස්තමේන්තුව අඩු වටිනාකමට පිළියෙල කර නොතිබුණි. |
| | | (iii) බලවේග කට්ටල මිළදී ගැනීම කඩිනම් කිරීම සඳහා පිරිමැසුම් පන්තියේ මැදිරි (EC) 01 ක් අඩුකර කලින් තීරණය කරගත් මිළෙන් කොටසක්ද අඩුකර අවසන් එකඟතාවයට පැමිණි මිළ රුපියල් | | අරපිරිමැසුම්දායක ලෙස ගනුදෙනුවලට එළඹිය යුතුවේ. | ආයතනයට වැඩි ප්‍රතිලාභ අත්වන පරිදි තාක්ෂණික පිරිවිතර ඇගයීමට | - එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | මිලියන 8,417.25 ක් විය. එම මිළද ඉංජිනේරු ඇස්තමේන්තුව වන රු. මිලියන 7,317.60 වඩා රු. මිලියන 1,099.65 කින් වැඩි විය. මේ හේතුවෙන් පිරිමැසුම් පන්තියේ මැදිරි 01 ක්ද අහිමි වී ඇත. | | | කටයුතු කිරීම. | |
| | | (iv) සැපයුම්කරු විසින් අත්තිකාරම් ගෙවූ දින හා ණයවර ලිපි ආරම්භ කළ දින හෝ සංකල්පිත සැලැසුම් යන දිනවලින් පසුව එළඹෙන දින සිට මාස 14 ක් ඇතුලත පළමු බලවේග කට්ටලය එවිය යුතු අතර මාස 22 ක් ඇතුලත අනෙක් බලවේග කට්ටල එවිය යුතු විය. එසේම එදිනට ප්‍රමාද වන දින 30 ට පසුව එළඹෙන සෑම සතියකටම සියයට 0.5 ක ප්‍රමාද ගාස්තුවක් අයකළ යුතුය. නියමිත කාලයට බලවේග කට්ටල ලබානොදීම හේතුවෙන් ගෙවිය යුතු වන ප්‍රමාද ගාස්තුව වන රු. 35,619,617 ක මුදල අයකර ගෙන නොතිබුණි. | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුව කටයුතු කළ යුතුවේ. | ප්‍රමාද ගාස්තු නිසි පරිදි තක්සේරු කර අයකර ගැනීම. | ඒ සඳහා මෙතෙක් ක්‍රියාත්මක වී නැත. |
| | | | | | | |
| | **(ආ)** | ඉන්දියානු ණය ආධාර යටතේ රු.මිලියන 850 ක් පමණ වැයකර M 11 එන්ජින් 10 ක් මිළදී ගෙන තිබුණි. ඉන්දියාව තුල විවෘත මිළ කැඳවීම් හරහා ප්‍රසම්පාදනය සිදුකළ යුතුව තිබූ නමුත් තනිමූල ප්‍රසම්පාදනයක් (Single Source Procurement) ලෙස මෙම ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. එසේම ලංසුකරුගේ පිරිවිතර, දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කරන ලද පිරිවිතර හා එකඟ නොවූ අවස්ථා 20 ක් නිරීක්ෂණය වූ අතර තාක්ෂණික පිරිවිතරයේ අඩංගු කොන්දේසි 46 න් කොන්දේසි 17 ක් නිසි පරිදි ඇගයීමට ලක්කර නොතිබියදී හා ඉදිරිපත් කරන ලද කොන්දේසිවලින් | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. | මෙම එන්ජින් 10 න් 03 ක් පමණක් ධාවනයේ යොදවා තිබුණි. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | කොන්දේසි 17 ක් එනම් සියයට 37 තාක්ෂණික පිරිවිතරයට අනනුකූලව තිබියදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 අනුව එය අවලංගු කිරීමට කටයුතු නොකර ඉදිරි කටයුතු කර තිබුණි. තවද ඉන්දීය එන්ජින් මිලදී ගැනීමේ ගිවිසුමේ කොන්දේසි අංක 3.2 අනුව ධාවන අඩුපාඩු පිළිබඳව සලකා පවතින තාක්ෂණික ගැටළු මාස 3න් නිවැරදි කර අනෙකුත් නැව්ගත කිරීම සිදුකල යුතුව තිබූ නමුත් එසේ නොකර නැව්ගත කර තිබුණි. ලංකාවේ දුම්රිය මාර්ගවල තත්ත්වය සැලකීමේදී මෙම එන්ජින් දිගින් වැඩි වීමේ තත්ත්වය තුල ධාවන ගැටළු මතුවිය හැකිව තිබූ අතර 2021 අප්‍රේල් අවසාන වන විට අදාල එන්ජින් 10න් 3ක් විවිධ දෝෂ නිසා ධාවනයේ යොදවා නොතිබුණි. තවද, ඇමරිකානු එන්ජින් ඉන්දීය එන්ජින්වලට වඩා ආර්ථික වශයෙන් වඩා ලාභදායී බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව තහවුරු කර තිබියදී ඉන්දීය එන්ජින් මිළදී ගැනීම නිසා සමස්ත ගණුදෙනුව හරහා රජයට දැරීමට සිදුවන පාඩුව ඇ.ඩො. මිලියන 10.5 ක් හෙවත් රුපියල් මිලියන 1,905.23 ක් බව නිරීක්ෂණය විය. | | | | |
| | **(ඇ)** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) අනුව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ 2016, 2017, 2018 හා 2019 වර්ෂයන්හි අදාළ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුල CNC Vertical Turret Lathe යන්ත්‍රය මිළදී ගැනීම ඇතුලත් කර නොතිබියදී 2019 ජනවාරි 07 දින රු.47,072,562ක වටිනාකමට එය මිළදී ගෙන තිබුණි. එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 අ, ආ | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර මිලදී ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. | Control Panel දෝෂයකි. රත්මලාන යාන්ත්‍රික උප දෙපාර්තමේන්තුවෙන් අලුත් වැඩියා කර ගත හැක. මේ දක්වා එම කටයුතු ආරම්භ කර |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රකාරව ප්‍රසම්පාදනය ආරම්භයේ සිට අවසානය දක්වා එක් එක් ක්‍රියාවන්හි පියවර, කාල ක්‍රමානුගතව විස්තර කර ප්‍රසම්පාදන කාල සටහන් සකස් කර නොතිබූ අතර පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම, ගිවිසුම්ගතවීම හා විශේෂයෙන් අදාල ගිවිසුම දෙපාර්තමේන්තුවේ නීති අංශය මගින් පරීක්ෂාවක් සිදු නොකිරීම යන කරුණුවලද ගැටළු මෙහිදී මතුව තිබුණි. තවද මෙම ගනුදෙනුවට අදාල ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු ලෙස යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු පත්කර තිබූ අතර ඔහු වෙනුවෙන් මෙම කාර්ය සඳහා රු.708,142ක මුදලක් ගෙවා තිබියදී ඔහු විශ්‍රාම ගැනීමට පෙර අදාල යන්ත්‍රය පරීක්ෂාව සිදුකරගතහැකිව තිබියදී ඔහු විශ්‍රාම යන තෙක් ඔහුගේ සේවය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | නැත. |
| | **(ඇ)** | කොටුව හා මරදාන අතර සංවෘත්ත පරිපථ රූපවාහිනී පද්ධතිය (CCTV) ස්ථාපනය කිරීම සඳහා රු. 35,579,668 ක් වැය කර එම පද්ධතිය ස්ථාපනය කිරීම 2013 නොවැම්බර් මස 17 වන දින නිමකර තිබූ අතර වගකීම් කාලය ඉක්මවීමටද පෙර එනම් 2014 ජූනි 12 දින අකුණු සැරයකින් පසු මෙම පද්ධතියේ කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ කැමරා 31 ක ප්‍රමාණයක් සහ මරදාන දුම්රිය ස්ථානයේ කැමරා 17 ක් ප්‍රමාණයක් අක්‍රිය වී තිබුණි. තාක්ෂණික ගිවිසුමේ කොන්දේසි අනුව වගකිව යුතු කාලය වසර දෙකක්වුවද එය මෙම වාර්තාවේ දිනය තෙක් සැපයුම්කරු මගින් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. මෙහිදී අකුණුවලින් වන හානිය පිළිබඳ පූර්ව සලකා බැලීමකින් තොරව මේවා ස්ථාපිත කර තිබීම නිසා මෙම උපද්‍රවය සිදුවී තිබුණි. එසේම මෙම සැපයුම් ආයතනය මොරටුව විශ්ව විද්‍යාලයට සම්බන්ධ ආයතනයක් බවට සාවද්‍ය ලෙස සඳහන් | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. | මේ දක්වා ගැටළුව නිරවුල් කර නොමැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | කර මෙම කොන්ත්‍රාත්තුව ඉටුකර තිබූ අතර එම සාවද්‍ය බව අනාවරණය කර ගැනීමට මුල් අවස්ථාවේ අපොහොසත් වී තිබූ අතර පසුව එම ආයතනයට විරුද්ධව නෛතිකමය කටයුතු කිරීමට මේ දක්වා අපොහොසත් වී තිබුණි. | | | | |
| | | | | | | |
| | (ඉ) | M පන්තියේ දුම්රිය වර්ග 6කට හා w-3 පන්තියේ දුම්රිය එන්ජින් සඳහා Event Recorder හා Vigilance පද්ධතීන් ස්ථාපිත කිරීම සඳහා රු.96,931,488 මුදලක් වැය කර තිබූ අතර මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිශ්චිත යෝජනාවක් ඉදිරිපත්වීම හෝ ඒ පිළිබඳ අධ්‍යනයක් සිදුකිරීම හෝ එවා සවිකරනුයේ කුමන එන්ජින් සඳහාද යන්න පූර්ව හඳුනා ගැනීම යන අවශ්‍යතා ඉටු නොකර මෙම මිලදී ගැනීම සිදුකර තිබුණි. එම උපාංග සවිකිරීම සඳහා යොදාගනු ලබන එන්ජින් වර්ග මොනවාද යන කරුණු විටින් විට වෙනස්කර තිබූ අතර මෙම ව්‍යාපෘතිය විධිමත් නොවීම නිසා ඇතිවූ ප්‍රමාදයන් හේතුවෙන් විනිමය අනුපාතය වෙනස්වීමේ බලපෑම මත 2020 මාර්තු 05 දිනට රු1,916,909 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | | ප්‍රසම්පාදන කටයුතු කිරීමට පෙර ඒ පිළිබඳ පූර්ව අධ්‍යයනයක් සිදු කළ යුතුවේ. | වැළක්වීම සඳහා පියවර ගෙන නොතිබුණි. | ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය කෙරේ. |
| | (ඊ) | ක්ෂේත්‍රයේ කටයුතුකරන අනෙකුත් ගණුදෙනු කරුවන් දැනුවත් වන පරිදි දුම්රියෙන් වැලි ප්‍රවාහනය කළ හැකි බවට ප්‍රසිද්ධ දැන්වීමක් නොකර එක් පෞද්ගලික ආයතනයකට දුම්රියෙන් වැලි ප්‍රවාහනය කිරීමට අවස්ථාව ලබාදීමට ගිවිසුමකින් තොරව එකඟතාවයකට පැමිණ අදාල ප්‍රවාහන කාර්යය සිදුකර තිබුණි. මෙහිදී ගාස්තු තීරණය කිරීමේදී එක් එක් ගමනක් සඳහා හිස් දුම්රිය ධාවනයක් සිදු කල යුතු වීම හා භාවිතාකරණු ලබන දුම්රිය ගබඩා යන කරුණු පිළිබඳව නොසලකා අදාල ගාස්තු | | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර දෙපාර්තමේන්තු වට ලාභයක් ලැබෙන පරිදි කටයුතු කළ යුතුවේ. | දුම්රියෙන් වැලි ප්‍රවාහනය කිරීම විධිමත් කිරීම. | දුම්රියෙන් වැලි ප්‍රවාහනය දැනට සිදු නොකෙරේ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | නියමකර තිබූ බැවින් දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබිය යුතු අදායම මෙමගින් අහිමි වී තිබුණි. | | | | |
| | (උ) | දුම්රිය දෙපාර්තමේන්තුවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය සඳහා අවශ්‍ය අඟල් 1 ½ ගල් (Ballast) කියුබ් 200 ක් මිලදී ගැනීම සඳහා රු.1,323,800 ක වටිනාකමක් වූ කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 හා 8.9.1 එනම් පිළිවෙලින් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගැනීම හා විධිමත් ගිවිසුමකට එළඹීම යන අවශ්‍යතා ඉටුකර නොතිබුණි. 2021 පෙබරවාරි 15 දිනට කොන්ත්‍රාත්තුව පිරිනමා මාස 15ක් ගතවී තිබුණද එම කාර්ය ඉටුකර නොතිබූ අතර මේ හේතුවෙන් මාර්ගයේ වේගසීමා ඉවත්කිරීමේ කාර්යක් මේ දක්වා ප්‍රමාද වෙමින් පැවතුණි. | | ප්‍රසම්පාසන මාර්ගෝපදේශන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. | තොරතුරු පරීක්ෂා කර වාර්තා කරන බව දන්වා ඇත. |
| 19. | | <u>**වත්කම් කළමනාකරණය**</u> | | | | |
| | (අ) | 2019 වසර තුලදී දුම්රිය ආරක්ෂක සේවය මගින් අංක RSS/MTL/01/2019 සිට අංක RSS/MTL/51/2019 දක්වා වූ ලිපිගොනු 51 ක් මගින් නීති අංශය වෙත දුම්රිය රක්ෂිතය තුල සිදුකර ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනුම් දී තිබුණු නමුත් ඒවා නැවත අත්පත් කරගෙන නොතිබුණි. | | අනවසර ඉදිකිරීම් සහ ක්‍රියාකාරකම් සම්බන්ධව නීති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කල යුතුවේ. | විශේෂ හා ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගැනීම. | විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොමැත. |
| | **(ආ)** | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරන චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව 2018 මිළදී ගත් වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කල යුතුවේ. | චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කිරීමට උපදෙස් දීම. | අදාල වාර්තා මෙතෙක් ඉදිරිපත් කර නැත. |
| | (ඇ) | රත්මලානේ අංක 22 කර්මාන්තශාලාවේ ස්ථාපිත කර තිබූ ටොන් 500 ක් බර රෝද ගැලවිය හැකි Wheel Press යන්ත්‍රය | | විශාල වටිනාකමින් යුත් යන්ත්‍රසූත්‍රවලින් | වැළක්වීමේ ක්‍රියාමාර්ග ගෙන | මේ දක්වා අළුත්වැඩියා කටයුතු සිදු |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | වසර 02 ක පමණ කාලයක සිට ක්‍රියා නොකරන බව නිරීක්ෂණය විය. | | උපරිම ප්‍රයෝජන ගැනීමට පියවර ගත යුතුවේ. | නොමැත. | කර නොමැත. |
| | (ඈ) | ත්‍රිකුණාමලය, මාතර,පොල්ගහවෙල සහ අනුරාධපුර යන ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාලවලට අයත් නිල නිවාසවලින් අළුත්වැඩියා කළ හැකි නිවාස 172 ක්ද, පදිංචි විය හැකි මට්ටමේ නිවාස 141 ක්ද වශයෙන් නිල නිවාස 313 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | | අළුත්වැඩියා කළ යුතු නිවාස හැකි ඉක්මනින් අළුත්වැඩියා කළ යුතු අතර නිශ්ක්‍රීයව පවතින නිවාස සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට ආදායමක් ලැබෙන පරිදි කටයුතු කිරීම. | වැළක්වීමේ ක්‍රියාමාර්ග මෙතෙක් ගෙන නොමැත. | ගැටළු නිරාකරණය වී නොමැත. |
| | (ඉ) | අනතුරට ලක් වී තිබුණු අංක 50 – 8777 දරන කැබ් රථය විගණිත දින වූ 2021 පෙබරවාරි 02 දින වන විට අනතුර සිදු වී වසර 04 ක කාලයක් ඉක්ම ගොස් ඇතත් එය අළුත්වැඩියා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වාහනය දිරාපත්වීමට ලක්ව තිබුණි. | | අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතු අතර කඩිනමින් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | වාහනය දිරාපත් වීමට පෙර අවශ්‍ය අළුත්වැඩියා කටයුතු කිරීම හෝ අපහරණය කිරීම. | අලුත්වැඩියා කිරීම පිළිබඳව මෙතෙක් තීරණය ගෙන නැත. |
| | (ඊ) | කර්මාන්තශාලා අංක 18 හි ගාල් කර ඇති වාහන 06 ක් අළුත්වැඩියා නොකර අත්හැර දමා ඇති බව නිරීක්ෂණය විය. | | වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | වාහන දිරාපත් වීමට ඉඩ නොදී කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| | (උ) | ඵලදායී ජීවිත කාලය ඉක්ම වූ හා ධාවනයේ නොයොදවන රූ. | | භාවිතා කළ නොහැකි | කඩිනමින් අවශ්‍ය | මේ දක්වා ක්‍රියාමාර්ග |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 358,940,567 ක් වටිනා දුම්රිය එන්ජින්, බොගි හා වීල් ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | | වත්කම් විධිමත් ආකාරයෙන් අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | ක්‍රියාමාර්ග ගැනීම. | ගෙන නොමැ ත. |
| | (ඌ) | ශ්‍රී ලංකා දුම්රිය සේවයට වසර 150 ක් පිරීම නිමිත්තෙන් 2014 වර්ෂයේ ආරම්භ කර ඇති කඩුගන්නාව දුම්රිය කෞතුකාගාරය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ශනය දිනා ගැනීමට හේතු වී තිබුණද එය ආරක්ෂා කර ගැනීමට සහ ආදායම වැඩිකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.<br>2019 | | රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වන බැවින් ඒ සඳහා නිසි පියවර ගත යුතුවේ. | කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා කෞතුක භාණ්ඩ ආරක්ෂා කර ගැනීම. | මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| | (එ) | අඹේපුස්ස ගල් වැඩපළ සතුව මිලියන ගණනක් වටිනා යන්ත්‍ර සූත්‍ර හා වාහන තිබුණද ඒවායේ ආරක්ෂාව සඳහා සුදුසු පියවර ගෙන නොතිබුණි.<br>2019 | | ආරක්ෂාව සඳහා පියවර ගත යුතුවේ. | ආරක්ෂිත පියවර ශක්තිමත් කිරීම. | ආරක්ෂිත පියවර ගෙන නොමැත. |
| | (ඒ) | අඹේපුස්ස ගල් වැඩපළ අයත් ඉඩමේ අනවසර පදිංචිකරුවන් 33 දෙනෙකු පදිංචි වී සිටීම නිසා වත්කම්වල ආරක්ෂාවට බලපෑමක් ඇති බව නිරීක්ෂණය කෙරේ. | | ඉඩම් අනිසි පරිහරණ වැළැක්වීමට පියවර ගත යුතුවේ. | අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත් කිරීම. | අවශ්‍ය පියවර ගෙන නොමැත. |
| **20.** | | <u>**කළමනාකරණ දුර්වලතා**</u> | | | | |
| | (අ) | තෙල් ටැංකි ප්‍රවාහනය කිරීම සඳහා රැගෙනවිත් තිබූ M 11 වර්ගයේ අංක 984 දරන දුම්රිය එන්ජිම 2020 ඔක්තෝබර් 16 වන දින සිට ගාල්ල ධාවනාගාරයේ නවතා තබා තිබූ අතර ගාල්ල දුම්රිය ස්ථානයේ ඇති පයින්ටු (Points) හා මාරු කිරීම් (Crossing) වල දිග ප්‍රමාණවත් නොවීම ඊට හේතු වී තිබුණි. | | අළුතින් දුම්රිය එන්ජින් මිළදී ගැනීමේදී පවත්නා සම්පත් උපයෝජනය කර ගැනීම කෙරේ අවධානය යොමුකළ යුතුවේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | විසඳීමට කටයුතු කර නැත. |
| | (ආ) | කොළඹ මහ නගර සහා සීමාවට අයත් | | නියමිත දිනට | වැළැක්වීමේ | 180 න් 140 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | දුම්රිය දේපළ 180 ක් සඳහා 2019 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු හිඟ වරිපනම් මුදල රු. 40,627,132 ක් විය. මෙම හිඟ මුදලට අදාළ වන දේපළවල පරිහරණය නිවැරදිව හඳුනාගෙන ගෙවීම් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.<br>2020 | | වරිපනම් නොගෙවීම නිසා දඩ මුදල් ගෙවීමට සිදුවන බැවින් දේපළවල අයිතිය හඳුනාගැනීමට පියවර ගත යුතුවේ. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ක් හඳුනා ගෙන ඇත. ඒ සඳහා වරිපනම් ගෙවා නොමැත. |
| | | | | | | |
| | (ඈ) | 1980 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සෑම වර්ෂයකම නොසැපයූ භාණ්ඩ සඳහා ගෙවීම් කර ඇති අතර මුළු ගෙවීම්වලින් සියයට 42 ක් වූ රු. 33,681,581 ක් 2010 වර්ෂයට පෙර ගෙවීම්ද ඉතිරි සියයට 58, 2010 වර්ෂයෙන් පසු ගෙවීම්ද වන අතර එයින්ද සියයට 40 ක් වූ රු. 31,900,907 ක් 2016 සිට 2020 දක්වා වූ වර්ෂ 05 තුළ කර ඇති ගෙවීම් වේ. | | සපයා නොමැති භාණ්ඩ ලබාගැනීම සඳහා පියවර ගත යුතු වේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2021 දී ශේෂය රු. මිලියන 19.7 කින් අඩු වී ඇත. |
| | (ඈ) | 2020 වර්ෂය අවසානයට නිරවුල් නොවූ ණයවර ලිපි වටිනාකම රු. 594,378,058 ක් වූ අතර එයින් සියයට 35 ක් වූ රු. 207,564,302 ක් වර්ෂ 03 ත් 22 ත් අතර පැරණි ශේෂයන් විය. මුදල් ගෙවා වර්ෂ 03 කට වැඩි කාලයක් ගත වී ඇති මෙම ශේෂයන් GRN මගින් නිරවුල් නොවීමට හේතු විගණනයට ඉදිරිපත් නොවූ අතර මිලියන 207 කට වැඩි මෙම ගෙවීම්, සපයා නොමැති භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වෙත ගෙවා ඇති මුදල්ද යන්න විගණනයේදී ප්‍රශ්නගත විය. | | මේ පිළිබඳව නිසි විමර්ශනය කර මෙම ණයවර ලිපි නිරවුල් කිරීමට පියවර ගත යුතුවේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | සම්පූර්ණ වටිනාකම නිරවුල් වී නොමැත. |
| | (ඉ) | S 10 – Class Power Coaches සඳහා අවශ්‍ය අමතර කොටස් සඳහා වර්ග 09 ක් යටතේ අමතර කොටස් 663 ක් මිළදීගැනීම සඳහා මිළ ගණන් කැඳවීම් සිදුකළද වර්ග 04 කට අදාළ අමතර කොටස් 540 ක් දැනට අවශ්‍ය නොවන | | මෙමගින් දෙපාර්තමේන්තු වේ අරමුදල් අනවශ්‍ය ලෙස අවුරා තැබීමක් සිදුවන බැවින් | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. නැවත |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | බව දන්වා ඇගයීමෙන් ඉවත්කර තිබුණි. එමෙන්ම මිළදී ගත් අමතර කොටස් වර්ග 04 හිද අවශ්‍ය ප්‍රමාණයට තොග තිබියදී මිළදීගෙන ඇති බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව ආයතනයේ අමතර කොටස් මිළදී ගැනීමේ අවශ්‍යතාවය තීරණය කිරීම නිසි ක්‍රමවේදයක් මත හා නිසි අධ්‍යයනයක් අනුව සිදුකර නොමැති බවත් අනවශ්‍ය තොග රැස්කිරීම සඳහා රු. 19,515,262 ක මුදලක් වැයකර ඇති බවත් නිරීක්ෂණය විය. 2020 | | එසේ නොවීමට වගබලා ගත යුතු වේ. | | පාවිච්චි කළ හැකි බව දැනුම් දී ඇත. |
| | (ඊ) | තොග අවශ්‍යතාවයන් හඳුනාගෙන ගබඩා අත්තිකාරම් ගිණුම සඳහා තොග මිළදී ගැනීම සිදුකළ යුතු වුවද අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව තොග මිළදී ගැනීම හේතුවෙන් අවසන් තොග ශේෂයෙන් විශාල ප්‍රමාණයක් භාවිතයට නොගන්නා තොග අයිතම බවට පත්ව තිබුණි. 2020 වර්ෂය අවසානයට ඇති තොග ශේෂයෙන් රු. 298,187,731 ක තොග අයිතම පසුගිය වර්ෂ 05 තුල කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. | | සීමිත අරමුදල් අනවශ්‍ය ලෙස රඳවා නොගැනීම කෙරේ අවධානය යොමුකළ යුතුවේ. | වැළක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | අඩුපාඩු සැකසීම සඳහා පියවර ගෙන නොමැත. |
| | (උ) | පසුගිය වර්ෂ 16 ක කාලය තුල ගබඩාවේ දුම්රිය අමතර කොටස් තොගය රු. මිලියන 1,905 සිට රු. මිලියන 6,392 දක්වා වූ පරාසයක් තුල පැවති අතර, එම වර්ෂ 16 න් වර්ෂ 14 දීම අදාල මිළදී ගැනීම් වලට වඩා අඩු ප්‍රමාණයක් පමණක් නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. එමෙන්ම අත ඉතිරි තොගය වර්ෂ 16 ක කාලය තුලදී තුන් ගුණයක් වී තිබුණි. | | ප්‍රමිත තොග මට්ටම පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | වැළක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | අඩුපාඩු සැකසීම සඳහා පියවර ගෙන නොමැත. |
| | (ඌ) | දුම්රිය එන්ජින් හා මැදිරිවල පවතින Shock Absorbers යන්ත්‍රානුසාරයෙන් අළුත්වැඩියාවන් සිදු කිරීම සඳහා යන්ත්‍රයක් මිළදී ගැනීම වෙනුවෙන් වසර 03 ක් ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් | | නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් දුම්රිය සේවය | වැළක්වීමේ විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. | මේ දක්වා යන්ත්‍රය මිළට ගෙන නොමැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | වැය කළද මේ දක්වාම එම යන්ත්‍රය මිළදී ගෙන නොතිබීම නිසා එම පරීක්ෂාවන් අතින් ක්‍රියාත්මක කරන යන්ත්‍රයකින් (Manual System) සිදු කෙරේ. 2019 | | කාර්යක්ෂම කිරීමට කටයුතු කළ යුතුවේ. | | |
| | (එ) | 2016 වර්ෂයේදී RLM 3507/14 යටතේ ආනයන කරන ලද රු. 1,080,340 ක් වටිනා භාණ්ඩ අයිතම දෙපාර්තමේන්තු පිරිවිතරයන් හා නොගැලපී තිබූ අතර ඒ සඳහා සුදුසු භාණ්ඩ ගෙන්වා ගැනීමට හෝ අදාළ මුදල් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම භාණ්ඩ වෙනුවෙන් ලබා දී තිබූ බැංකු ඇපකරයේ වලංගුතාවයද අවසන් වී ඇති බව නිරීක්ෂණය විය. | | බැංකු ඇපකරයේ කාලය දීර්ඝ කර සුදුසු භාණ්ඩ ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | භාවිතයට අවශ්‍ය සුදුසු භාණ්ඩ මිලදී ගැනීම. | මේ දක්වා නිරවුල් කර නොමැත. |
| **21.** | | **<u>පාඩු හා හානි.</u>** | | | | |
| | (අ) | රත්මලාන දුම්රිය ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු අංශය තුල 1990 සැප්තැම්බර් 20 දින සිට 2019 සැප්තැම්බර් 14 දින දක්වා වාර්තා වී ඇති මූල්‍ය අලාභ හානි සංඛ්‍යාව 37 ක් වන අතර එහි වටිනාකම රු. 30,187,729 කි. එම අලාභ හානි 37 න් 23 ක්ම සොරකම් නිසා සිදු වූ අලාභ හානි වන අතර එහි වටිනාකම රු. 28,089,368 ක් විය. මෙම අංගනයේ ආරක්ෂාව සඳහා දුම්රිය ආරක්ෂක සේවයේ නිලධාරීන් යොදවා තිබුණද සොරකම් වැඩිවීමේ ප්‍රවනතාවයක් විගණනයට නිරීක්ෂණය විය. | | දෙපාර්තමේන්තුව සතුව වෙනම ආරක්ෂක අංශයක් පැවතියද කර්මාන්තශාලා වල සිදුවන සොරකම් අඩු වී නැති බැවින් ඒ සඳහා නිසි පියවර ගත යුතුවේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම හා ආරක්ෂාව තර කිරීම. | ආරක්ෂක කාර්ය මණ්ඩලය වැඩි කර ඇතත් සොරකම් අඩු නොවීම. |
| | (ආ) | රු. මිලියන 40 ක් වටිනා ගල් විදින මැෂිම 2015 වර්ෂයේදී ගිනිගෙන විනාශවීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත්කර තිබුණද මේ දක්වාම එම වාර්තාව නිකුත් කර නොතිබුණි. ගිනිගත් යන්ත්‍රයේ ඉතිරි කොටස් විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | පාලන හා ආරක්ෂණ ක්‍රමවේද ඇති කිරීම. | පරීක්ෂණ වාර්තා මේ දක්වා ඉදිරිපත් කර නැත. අපහරණ කටයුතු ද අවසන් කර |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | නොමැත. |
| | (ඇ) | රත්මලාන යාන්ත්‍රික උප දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා 39 සඳහා 2017 වසරේදී Single Copper Cable 240 mm මීටර් 500 ක් මිළට ගෙන තිබූ අතර, එම කේබල්වලින් රු.මිලියන 1.55 ක් වටිනා කේබල් මීටර් 215 ක් 2017 වර්ෂයේ දී සොරකම් කර තිබූ අතර මෙම හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුලත දී මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.<br>2018 | | සොරකම සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ආරක්ෂාව තර කිරීම. | නීතිමය කටයුතු සිදු කර නොමැත. මු.රෙ. විධි විධාන අනුව පරික්ෂාවන් සිදුකර නැත. |
| | (ඈ) | අනුරාධපුර දුම්රිය වඩු කර්මාන්තශාලාවේ ගින්නක් ඇතිවීම පිළිබඳ පුළුල් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද ඒ තුලින් ගොඩනැගිල්ලට හා එහි තිබූ භාණ්ඩවලට සිදු වූ හානිය පිළිබඳ තක්සේරු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඊට අදාළ ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි. | | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | විදුලි පද්ධතීන්හි දෝශ යථාවත් කිරීම හා හානි තක්සේරු කිරීම. | වගකිව යුතු නිලධාරියෙකු හඳුනාගත නොහැකි අතර අලාභ හානි තක්සේරු කර නොමැත. |
| | (ඉ) | DOGSPIKES (පරණ සිල්පර ඇණ), Bearing Plates හා Fish plates (යුගල) යන යකඩ, වෙළඳපළ මිළ ගණන් අනුව වෙන්දේසි කිරීමෙන් හෝ ටෙන්ඩර් මගින් විකිණීම කෙරෙහි පරිපාලනයේ අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් යකඩ තොගය විකිණීම මගින් දුම්රිය දෙපාර්තමේන්තුවට ලබාගත හැකිව තිබූ රු. 27,645,400 ක ආදායමක් අහිමි වී තිබුණි. | | විකිණීම සඳහා කඩිනම් පියවර ගත යුතුවේ. | දිරාපත් වන ද්‍රව්‍ය වලින් උපරිම ප්‍රයෝජන ගැනීම. | ටෙන්ඩරය අවලංගු කරන ලදි. ලංසුකරුවෙක් නඩුවක් පවරා ඇත. |
| | (ඊ) | මල්වතු ඔය පාලම මත ඇති ලී කොට යටට දැමීම සඳහා (Bearing Plates වෙනුවට) Base Plate 500 ක් 2014 නොවැම්බර් 18 දින ලබාගෙන තිබුණු | | මිළදී ගෙන ඇති භාණ්ඩ අදාළ කාර්යයන් සඳහා යෙදවීම තුලින් | භාවිතයට ගනිමින් පවතී. | භාවිතයට නුසුදුසු විය හැකිය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | නමුත්, මේ වන තෙක් එම අමතර කොටස් අදාළ කාර්යයට යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.<br>2020 | | ප්‍රතිලාභ ලබා ගැනීම. | | |
| **22.** | | **මූල්‍ය අක්‍රමිකතා** | | | | |
| | | 2019 අගෝස්තු 15 දින සිට ඔක්තෝබර් 15 දින දක්වා සේවයට වාර්තා කර නොතිබූ නියෝජ්‍ය දුම්රිය ආරක්ෂක අධිකාරී (ආවරණ) වරයෙකුට එම කාලය වෙනුවෙන් නිවාඩු අනුමත කර නොතිබූ බැවින් 2019 අගෝස්තු 15 දින සිට ඔක්තෝබර් 15 දක්වා වැටුප් වශයෙන් රු. 160,924 ක මුදලක්ද, 2020 ජනවාරි 09 දින සිට විශ්‍රාමගන්වා තිබියදී 2020 ජනවාරි සිට ඔක්තෝබර් 31 දක්වා රු. 855,235 ක මුදලක් වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි. | | දෙපාර්තමේන්තු වේ අංශ අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගත යුතුවේ. | වැළක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | වැඩිපුර ගෙවූ මුදල් මෙතෙක් අයකර ගෙන නොමැත. |
| **23.** | | **අවිධිමත් ගනුදෙනු.** | | | | |
| | | මුදල් රෙගුලාසි 213 ප්‍රකාරව චෙක්රෝල් මගින් වැටුප් ලබන කම්කරුවන්ගේ දිනපතා පැමිණීම නිවැරදි බව ඒ පිළිබඳ බලය පවරන ලද නිලධාරියෙකු විසින් සනාථ කළ යුතු අතර අධීක්ෂණ නිලධාරියෙකු එය නැවත පරීක්ෂා කළ යුතුය. මීට අමතරව විවිධ බාහිර ස්ථානවල සේවයේ යෙදෙන කම්කරුවන් සිටීනම් ඔවුන්ගේ පැමිණීම නිවැරදිව සටහන් කර ඔවුන් සේවයේ යෙදෙන ස්ථානද නම් කළ යුතුය. එසේ වුවද 2019 සැප්තැම්බර් 10 දින වන විටත් ගොඩනැගිලි පරීක්ෂක කාර්යාලයේ චෙක්රෝල් මගින් වැටුප් ලබන සේවකයින්ගේ අධීක්ෂණ නිලධාරීන්ගේ ඉදිරි වැඩසටහන් අනුමත කර නොතිබීමත් මෙම කම්කරුවන්ගේ රාජකාරි අධීක්ෂණය කිරීම සඳහා කංකානම් කෙනෙකුද නොසිටීමත් නිසා 2019 සැප්තැම්බර් මස 01 දින සිට 09 වන දින | | මුදල් රෙගුලාසි 213 ප්‍රකාරව චෙක්රෝල් මගින් වැටුප් ලබන කම්කරුවන්ගේ දිනපතා පැමිණීම නිවැරදි බව ඒ පිළිබඳ බලය පවරන ලද නිලධාරියෙකු විසින් සිදුකළ යුතුවේ. | පහළ නිලධාරීන් නිසි පරිදි සුපරීක්ෂණය කිරීම. | විධිමත් පරිදි අධීක්ෂණ කටයුතු සිදුකරනු නොලබයි. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | දක්වා සේවකයින්ගේ නම් පමණක් චෙක්රෝල්වල සටහන් කර එමගින් රජයේ මුදල් සාවද්‍ය පරිහරණයක් සිදුවීමට ඉඩ ඇතැයි යන සැකය විගණනයේදී බැහැර කල නොහැකි විය. 2019 | | | | |
| **24.** | | <u>**මහජනයා වෙත සේවා ඉටු කිරිම**</u> | | | | |
| | | දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් මහජනයාගේ අවශ්‍යතාවයන්, ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රශංසා පළ කිරීමට පහසුකම් සලසා නොතිබුණි. | | වෙබ් අඩවිය මගින් මහජනයාගේ අවශ්‍යතාවයන් ආයතනය පිළිබඳ චෝදනා, ප්‍රශංසා පළකිරීමට පහසුකම් සැලසිය යුතු වේ. | වැලක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | යාවත්කාලීන ව පවත්වාගෙන ගොස් නොමැත. |
| **25.** | | <u>**මානව සම්පත් කළමනාකරණය**</u> | | | | |
| | **(අ)** | දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල දත්ත අනුව 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ත අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 7,335 ක් විය. එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 37 ක ප්‍රමාණයකි. දෙපාර්තමේන්තුව විසින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර කාර්ය මණ්ඩලය 335 ක් අනියම් හා කොන්ත්‍රාත් පදනම මත විධිමත් අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණි. 2018,2019,2020 | | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | වැලක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | මේ දක්වා බඳවාගැනීම් සිදුකර නැත. |
| | **(ආ)** | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර දෙපාර්තමේන්තු සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 234 ක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවාගෙන තිබුණි. 2018,2019,2020 | | පුරප්පාඩු තනතුරු සඳහා අළුතින් බඳවා ගැනීමට පියවර ගත යුතුවේ. | වැලක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | බඳවා ගැනීම් සීමා කර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 ජනවාරි 28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි 01 ඡේදය ප්‍රකාරව රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ කාර්යසාධන ඇගයීම් පත්‍රිකාවන්ට අමතරව කාර්යසාධන ගිවිසුමක් අත්සන් කිරීම මගින් නිලධාරීන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ඒ අනුව 2018 වර්ෂයේ සිට එකී ගිවිසුම අත්සන් කිරීම අනිවාර්ය වුවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කාර්යසාධනය සම්බන්ධයෙන් එවැනි ගිවිසුමක් සකස් කර නොතිබුණි. එම චක්‍රලේඛයේම 05 ඡේදය පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් එදින සිට ක්‍රියාත්මක වන පරිදි සකස් කළ යුතු අතර අවම වශයෙන් වර්ෂ 02 කට වරක් යාවත්කාලීන විය යුතු බවද පෙන්වා දී ඇත. දෙපාර්තමේන්තු විසින් එපරිදි සැලැස්මක් සකස් කර නොතිබුණි. 2019 | | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 ජනවාරි 28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි 01 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කාර්යසාධන ඇගයීම් යාවත්කාලීන ව සිදු කිරීම හා මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම. | අදාල සැලැස්ම සකස් කර නොමැත. |
| | (ඈ) | දෙපාර්තමේන්තුවේ තනතුරු 11 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රජයේ නිලධාරීන් පත්කිරීමේ කාර්ය පරිපාටික නීති සංග්‍රහයේ iv වන පරිච්ඡේදයේ 35 වගන්තිය ප්‍රකාර බඳවාගැනීමේ පරිපාටි සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රජයේ නිලධාරීන් පත්කිරීමේ කාර්ය පරිපාටික නීති සංග්‍රහයේ iv වන පරිච්ඡේදයේ 35 වගන්තිය ප්‍රකාර බඳවාගැනීමේ පරිපාටි සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | නීතිරීති රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම. | මේ දක්වා සමස්තය සඳහා අනුමැතිය ලැබී නොමැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | ලබාගත යුතුවේ. | | |

ශීර්ෂ 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

| | | විගණන නිරීක්ෂණය | | නිර්දේශ | | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| | | -------------------------- | | ----------------- | | ---------------------- | | ------------ |
| | | | | | | | | |
| 1. | | වේරහැර කාර්යාලයේ දෛනිකව එකතුවන මුදල් මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සේප්පුගත කර නොතිබුණි. එමෙන්ම, යහපත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ලෙස, සරප් අංශය භාර සහකාර කොමසාරිස්වරයා භාරයේ සේප්පුවේ එක් යතුරක් පැවතිය යුතු වුව ද, යතුරු සියල්ල සුළු මුදල් භාරකරු භාරයේ පැවතිණි. | | යතුරු සහ මුදල් භාරව සිටින නිලධාරීන් සම්බන්ධව විධිමත් අධීක්ෂණයක් පවත්වා ගත යුතු වීම | | විගණනය හා එකඟ වන බවත් මින් ඉදිරියට එවැනි අතපසුවීමක් සිදු නොවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ අංක DMT/WE/EST/48/ 2021/1 හා 2021 පෙබරවාරි 11 දිනැති ලිපියෙන් එක් යතුරක් මාණ්ඩලික නිලධාරියෙක් භාරයේ තබා සේප්පුවේ මුදල් තැන්පත් කිරීම හා බැංකුගත කිරීමේ දී මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කරන ලෙසට මුදල් භාරකරුට උපදෙස් ලබා දී ඇති බව ග.නි.විසින් දක්වා ඇත. | | මේ වන විට එක් යතුරක් මුදල් භාරකරු භාරයේ සහ අනික් යතුර කොමසාරිස් (රියදුරු බලපත්‍ර) භාරයේ තබා ඇති බව මෝ.ප්‍ර.කො.ජ විසින් දන්වා තිබුණද, 2021 ජනවාරි 11 දින සිට 18 දක්වා සිදු කරනු ලැබූ විගණන පරීක්ෂාවේ දී යතුරු 02 ම මුදල් භාරකරු සන්තකයේ පැවැති බව නිරීක්ෂණය විය. |
| | | | | | | | | |
| 2. | | සේවාලාභීන් වෙත වාහන පරීක්ෂණ වාර්තා කාර්යක්ෂමව ලබාදීම සඳහා ජර්මන් රජයේ | | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කිරීම හා වඩා | | මෙම උපකරණ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත්තේ | | දැනට එම උපකරණවල භාවිතා කළ |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | පරිත්‍යාගයක් ලෙස වේරහැර වාහන පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයට 2004 වර්ෂයේදී ලද පරීක්ෂණ උපකරණ 08 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. එම උපකරණ ජර්මනියේ නිෂ්පාදිත වුවත්, ලද තොරතුරුවලට අනුව, වර්තමානයේ ඊට වඩා නවීන තාක්ෂණයෙන් යුතු උපකරණ වෙළඳපොල භාවිතයට හඳුන්වා දී ඇති බැවින් සාපේක්ෂ ලෙස ඒවායේ තාක්ෂණික ගුණාත්මකභාවය ද පිරිහී තිබිණි | | වාසිදායක වන පරිදි කාලීනව තීරණ ගැනීම | | විදුලිය පිළිබඳ ගැටලුවක් පැවැති නිසා බවත්, එම උපකරණවල පරිගණක පද්ධතියේ වයර් සතුන් විසින් දැඩි ලෙස හානිකර තිබීම නිසා උපකරණ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් මවු සමාගමේ දේශීය නියෝජිත ආයතනය සමඟ එක් වී ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ ද එම දෝශය යථා තත්ත්වයට ගැනීමට නොහැකි වූ බව ග.නි. විසින් දක්වා ඇත. | | හැකි කොටස් වන වාහන එසවුම් උපකරණ, සුක්කානම් පරීක්ෂා කිරීමේ උපකරණ පමණක් භාවිතයට ගනු ලබන බව ග.නි. විසින් දක්වා ඇත. අනෙකුත් කොටස් භාවිතයට නොගැනේ. |
| 3. | | වේරහැර කාර්යාලයට කිලෝ වොට් 500ක ධාරිතාවයකින් යුතු විදුලිජනක යන්ත්‍රයක් භාවිතයට ගැනීමෙන් පසු වොට් 200 ක් වූ පෙර පැවැති යන්ත්‍රය අවශ්‍යතාව තීරණය කර වෙනත් අංශයක ස්ථාපිත කිරීමට හෝ එසේ නොමැති නම් අපහරණය කිරීමට හෝ පියවර ගැනීම වෙනුවට එය තවදුරටත් එම අංශයේම අභාවිතව පවතින හෙයින්, එහි සේවා ගිවිසුම හා අළුත්වැඩියා වෙනුවෙන් ගෙවූ රු. 451,720 ක් ද නිෂ්ඵල වී තිබුණි. | | රජයට වාසිදායක වන පරිදි තීරණ ගැනීමට කටයුතු කිරීම<br>විදුලි ජනක යන්ත්‍රය සුදුසු පරිදි භාවිතයට ගැනීම | | මෝ.ප්‍ර.කො.ජ.ගේ DMT/H/ACC/10/ AUDIT/24-2018 හා 2019 08.08 දිනැති ලිපියේ දක්වා ඇති පරිදි මෙම යන්ත්‍රය අපහරණය සඳහා යෝජනා වී ඇතත් මෙවැනි යන්ත්‍ර පිළිබඳ දැනුම ඇති තාක්ෂණික නිලධාරියෙකු විසින් පරීක්ෂා කර වාර්තාවක් ලබාදෙන ලෙස යුධ හමුදා තොරතුරු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ වෙත හා | | මේ දක්වා විදුලි ජනක යන්ත්‍රය අභාවිතව පවතී. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ලංකා විදුලිබල මණ්ඩලයේ ජනක යන්ත්‍ර ඒකකයේ ප්‍රධාන ඉංජිනේරු වෙත ද දන්වා ඇති බව ග.නි. තම පිළිතුරෙන් දක්වා ඇත. | | |
| | | | | | | | | |
| 4. | | ජාත්‍යන්තර රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව මගින් ලංකා ඔටෝමොබයිල් සංගමය වෙත පැවරීම නිසා අංක 1594/27 හා 2009 මාර්තු 26 ගැසට් නිවේදනයේ සඳහන් 2009 අංක 01 දරන රියදුරු බලපත්‍ර (අයභාර) නියෝගවල පරිදි දෙපාර්තමේන්තුව මගින් ආදායම් ඉපයීමක් සිදුකර නොතිබුණු අතර යම් කාල සීමාවක් තුළ නිකුත් කළ රියදුරු බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ විස්තර කිසිවක් දෙපාර්තමේන්තුව සතු ව නොතිබුණි. එමෙන්ම, මෙම කාර්ය වෙනුවෙන් ලංකා ඔටෝමොබයිල් සංගමය හා දෙපාර්තමේන්තුව අතර කිසිදු ලිඛිත එකඟතාවයකට එළැඹ තිබුණු බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. | | රජයට ආදායමක් ලබාගත හැකි පරිදි ජාත්‍යන්තර රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය සැලසුම් කිරීම | | ලංකා ඔටෝ මොබයිල් සංගමයේ ලේකම්ගේ 2021.11.04 දිනැති ලිපිය අනුව දෙපාර්තමේන්තු හා සංගමය අතර ගාස්තු සම්බන්ධ එකඟතාව තහවුරු වී ඇති බව දක්වා ඇත. | | 2009.03.26 දිනැති හා අංක 1594/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව සංශෝධිත ගාස්තුව පදනම් කර ගනිමින් 2021 සැප්තැම්බර් මස සිට සාමාන්‍ය බලපත්‍ර ගාස්තු යටතේ රු.400ක් හා ප්‍රමුඛතා බලපත්‍ර ගාස්තුව යටතේ රු.500ක්, මුද්‍රණය කරනු ලබන එක් රියදුරු බලපත්‍රයක් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට ගෙවනු ලබන බව ග.නි. දන්වා ඇත. |
| 5. | | වේරහැර කාර්යාල පරිශ්‍රයේ පවත්වාගෙන යන ජාතික | | රජයට වාසිදායක වන පරිදි තීරණ ගැනීමට | | විදුලි ගාස්තු අය කිරීමට කටයුතු | | මේ දක්වා ගාස්තු අය |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රවාහන වෛද්‍ය ආයතනය, කිරිහල ආදී ආයතන විසින් පරිභෝජනයට ගන්නා ජලය හා විදුලිය වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අයකර නොතිබුණි. එමෙන්ම, ආයතන පරිශ්‍රය භාවිතා කිරීම සඳහා දෙපාර්තමේන්තුව සමග එළැඹුණු ගිවිසුම් කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොවීය. | | කටයුතු කිරීම | | කරන බව දන්වා ඇත. | | කිරීමක් සිදු නොවේ. |
| | | | | | | | | |
| 6. | | සේවාලාභීන් විසින් දෙපාර්තමේන්තුවේ ගිණුමට කරන එක් එක් ගෙවීම් වෙනුවෙන් රු.30 ක මුදලක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ වූ මහජන බැංකු ශාඛාව මගින් අය කළද, දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිල්ල භාවිතා කිරීම වෙනුවෙන් එම බැංකුවෙන් කුලී අය කිරීමට පියවර ගෙන නොතිබුණි. එමෙන්ම, දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ පවතින කිරිහල, රක්ෂණ ආයතනය, ඡායා පිටපත් අලෙවිසැල වැනි අනෙකුත් ආයතනවලින් ද කුලී ආදායම් අයකර නොතිබුණි. | | රජයට වාසිදායක වන පරිදි තීරණ ගැනීමට කටයුතු කළ යුතු වීම සහ කුලී අයකළ හැකි ආයතනවලින් කුලී අයකර ගැනීම සොයා බැලීම | | දෙපාර්තමේන්තු භූමිය තුළ පිහිටි මහජන බැංකු ශාඛාව හා කිරිහල හැර අනෙකුත් ව්‍යාපාරික ආයතන වන ඡායා පිටපත් අංශය රු. 20,000 වේරහැර පශු සම්පත් මණ්ඩලය රු. 12,000 වේරහැර කොමර්ෂල් බැංකුව රු. 15000 වශයෙන් අයකිරීම් සිදු කරන බව ග.නි විසින් දක්වා ඇත. | | මහජන බැංකුවෙන් හා කිරිහලෙන් මේ දක්වා කුලී අය නොකෙරේ. |
| | | | | | | | | |
| 7. | | වේරහැර පරිශ්‍රයේ ලිපිගොනු ගබඩාකරණය සිදු කිරීමට පෙර තාවකාලිකව ලිපිගොනු තැන්පත් කිරීම සඳහා අනාරක්ෂිතව බහාලුම් 18 ක් භාවිතයට ගෙන තිබුණි. | | වාහන ලිපිගොනු සුරක්ෂිත කිරීම සඳහා ප්‍රමාදයකින් තොරව විධිමත් ක්‍රියාමාර්ග ගැනීම | | ලිපිගොනු විධිමත්ව ලේඛනාගාරය තුළ තැන්පතු කිරීමට කටයුතු කරන බව ග.නි.දක්වා ඇත. | | මෙම බහාලුම් 18 තුළ විධිමත් ක්‍රමවේදයකට අනුව ලිපිගොනු ගබඩා කර නොමැති බවත්, දිරාපත් වූ බහාලුම් 03ට වතුර කාන්දු වී එහි අඩංගු |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | ලිපිගොනු හඳුනාගත නොහැකි ලෙස විනාශ වී ඇති බවත් දක්නට ලැබුණි. |
| | | | | | | | | |
| 8. | | බහාලුම් 06 ක ලිපිගොනු පොහොර කවරවල බහා අවිධිමත් ලෙස ගොඩගසා තිබුණි. එමෙන්ම, නිසි නඩත්තුවක් නොමැතිවීම නිසා බහාලුම් 02 ක පැවැති වාහන ලිපිගොනු දිරාපත් වෙමින් පැවැතුණි. | | -එම- | | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කන්ටේනර් තුළ අක්‍රමවත් ලෙස වේරහැර කන්ටේනර් බහාලුම් තළ තැන්පත් කර තිබුණ ද 2016 වර්ෂයේ නව ලේඛනාගාරයේ ඉදි කළ බවත් එමඟින් ඉතා විධිමත්ව ලිපිගොනු ඇසිරීමේ කටයුතු දැනට සිදු කරන බවත් කන්ටේනර් බහාලුම් තුළ ලිපිගොනු මිලියන 08ක් පමණ තැන්පත් කර තිබීම හේතුවෙන් ඒ සියලු ලිපිගොනු විධිමත් අයුරින් නව ලේඛනාගාරයේ තැන්පත් කිරීමට තවත් කාලයක් ගත වන බවත් ග.නි. දක්වා ඇත. | | මේ දක්වා ලිපි ගොනු විධිමත් ලෙස අසුරා අවසන් කර නොමැත. |
| | | | | | | | | |
| 9. | | මු.රෙ. 177(1) පරිදි, එකතු කරගන්නා මුදල් හැකිතාක් ඉක්මනින් බැංකුගත කළ යුතු වුවද, වේරහැර කාර්යාලයේ දෛනිකව එකතුවන මුදල් ඊට | | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම<br><br>මෙම තත්ත්වය මඟහරවා ගැනීමට | | දෛනිකව එකතුවන ආදායම් පසු දින පෙරවරු 09.30ත් 10.30ත් අතර කාලය තුළ දී | | බැංකුවෙන් විමසීමක් කර ඇතත් මේ දක්වා ස්ථිර විසඳුමක් ලැබී |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | පසු දින බැංකුගත කිරීමේ පිළිවෙතක් අනුගමනය කර තිබුණි. ඒ අනුව, සිකුරාදා දින එකතුවන මුදල් ඊලඟ සඳුදා දින දක්වා ප්‍රධාන සරප්ගේ සේප්පුවේ රඳවා ගැනේ. මේ නිසා මුදල් අවභාවිතා වීමේ අවදානමක් පැවතිය හැකි අතර අවස්ථා 15ක දී එකතුව රු.මිලියන 39.6ක් වූ ප්‍රමාණයක් දින 04ත් 05ත් අතර කාල පරාසයක් තුළ එලෙස රඳවා තිබුණු බව මාස 03ක නියැදි පරීක්ෂායක දී නිරීක්ෂණය විය. ඒ අනුව, එක් දිනයක රඳවා තබාගන්නා සාමාන්‍ය මුදල රු. මිලියන 03ක් පමණ විය. | | සේවාලාභීනට සිය සේවා ගාස්තු ඍජුව බැංකුගත කළ හැකි වන පරිදි වෙරහැර කාර්යාල පරිශ්‍රය තුළ රජයේ බැංකු ශාඛාවක් ස්ථාපනය කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම | | බොරලැස්ගමුව මහජන බැංකු නිලධාරීන් පැමිණ රැගෙන යාම මේ වන විට සිදු වන ක්‍රියාදාමය වේ. මෙහි අවධානම් තතත්ත්වය අවබෝධ කර ගත් පසු දෛනික ආදායම පස්වරු 04.00ට භාරගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් මහජන බැංකු ආයතනික ශාඛාවේ ප්‍රධාන කළමනාකරු වෙත දන්වා ඇතත් මෙතෙක් බැංකුව වෙතින් කිසිඳු යහපත් ප්‍රතිචාරයක් නොලැබුණ බව. | | නොමැත. |
| 10. | | වාහන ලිපිගොනුවල භාරකාරත්වය නිලධාරීන් වෙත පවරා නොතිබුණි. මේ හේතුවෙන් වෙරහැර පරිශ්‍රයේ බහාලුම් තුළ විනාශ වෙමින් පවතින වාහන ලිපිගොනුවල තොරතුරු ලේඛනගත කිරීමේ අවශ්‍යතාවක් ද පැවතිණි. | | අදාළ නීතිරීති පරිදි කටයුතු කිරීම | | ලිපිගොනු ස්ථානගත කිරීම පරිපාලන නිලධාරිනියෙකුගේ අධීක්ෂණයක් යටතට පත් කර ඇති බවත්, අදාළ නිලධාරීන් ඇයගේ අධීක්ෂණය යටතේ රාජකාරියට යෙදවීමටත් කටයුතු කරන බන ග.නි. දක්වා ඇත. | | ඉටු කළ යුතු රාජකාරී පිළිබඳ මනා අවබෝධයක් පරිපාලන නිලධාරිනියට ලබා දී ඇති බව. |
| 11. | | මුදල් රෙගුලාසි 94 (2) පටහැනිව, රු.16,260,062ක මූලධන වියදම් වෙනුවෙන් වූ | | මුදල් රෙගුලාසි 94 (2) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | | ඉදිරියට නිවැරදි ආකෘතිය අනුව බැඳීම් හා බැරකම් | | එවැනි බැරකම්වලට එළඹීම |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | බැරකම් සඳහා බැඳී තිබුණි. | | | | ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | | තවදුරටත් පවතී. |
| | | | | | | | | |
| 12. | | 2019 වර්ෂයේදී වාහන අංක තහඩු මුද්‍රණය සඳහා එළඹුණු කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අංක 11.2(අ) පරිදි අංක තහඩුවල ගුණාත්මකභාවය පිළිබඳ සහතිකයක් ලබාගෙන නොතිබුණි. තවද, කොන්දේසි අංක 17.1 සහ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව රු. මිලියන 200ක් වූ කාර්යසාධන සුරක්ෂණය ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම කොන්දේසි අංක 23.1 පරිදි, අපේක්ෂිත හානි සඳහා සම්පූර්ණ රක්ෂණාවරණයක්ද ලබාගෙන නොතිබුණි. | | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම | | එවැනි රක්ෂණයක් ලබාගත යුතු බව සඳහන් වන බවත්, දෙපාර්තමේන්තුව වෙත එහි පිටපත් ලබාදිය යුතු බව සඳහන් නොවන බව. | | මේ දක්වා නියමයන් අනුව කටයුතු කර නොතිබුණි. |
| | | | | | | | | |
| 13. | | අංක 1704/09 හා 2011 මැයි 04 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රවාහන අමාත්‍යවරයා විසින් නිකුත් කළ 10(v) නියෝගය ප්‍රකාරව අවශ්‍ය විස්තර සහිතව අංක තහඩු මුද්‍රණය කර නොතිබිණි. | | නීතිරීති අනුව කටයුතු කිරීම | | ගැසට් පත්‍රයට අනුව පවතින වාහන කාණ්ඩය අවසන් වූ පසු නව කාණ්ඩය ආරම්භවීමේ දී නියෝග අංක 11 යටතේ කටයුතු කළ යුතු බව. | | මේ දක්වා ගැසට් නිවේදනයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු නොකෙරේ. |
| | | | | | | | | |
| 14. | | අවස්ථා 07ක දී මාස 48ක කාලයක් සඳහා අංක තහඩු මුද්‍රණ කොන්ත්‍රාත්තුවේ දින දීර්ඝ කිරීම් සිදුකර තිබුණද එක් අවස්ථාවක දී හෝ මිල ගණන් සංශෝධන සම්බන්ධයෙන් සාකච්ඡා කර නොතිබුණි. කෙසේ නමුත්, වර්ෂ 09ක කාලයක් තුළ තහඩු මුද්‍රණය කිරීමේ ප්‍රවීනතාව | | හැකි සෑම උත්සහයක් ගෙන රාජ්‍ය මුදල් සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම | | දැනට පවතින කොන්ත්‍රාත් කාලය නිම වූ පසු රජයේ කර්මාන්ත ශාලාව මගින් අංක තහඩු මුද්‍රණය සිදු කරවා ගැනීමට ඇති හැකියාව පිළිබඳ කරුණු සොයා | | කොන්ත්‍රාත් කාලය 2024 දක්වා පවතින බවත්, රජයේ කර්මාන්ත ශාලාව මගින් අංක තහඩු මුද්‍රණය කරවා ගැනීමට |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | හා හැකියාවත්, යන්ත්‍රසූත්‍ර හා යටිතල පහසුකම් සියල්ල සම්පූර්ණ වීමත් නිසා ගොඩ නැගී තිබුණු ඉතා වාසිසහගත තත්ත්වයක් නිසා සැපයුම්කරු විසින්ම අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව රජයට ලබාගත හැකි ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවයන් විසින් ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. 2015 මැයි 01 දින සිට වසර 04 ක් තුළ මුද්‍රණය කළ අංක තහඩු 5,173,526 ක් වෙනුවෙන් පෞද්ගලික අංශය වෙත ගලාගිය රාජ්‍ය මුදල් ප්‍රමාණය රු.1,102,929,374 ක් ලෙස නිරීක්ෂණය විය. | | | | බලන බව ග.නි. විසින් දක්වා ඇත. | | සාකච්ඡා වට 02 ක් පවත්වා ඇති බවත් ග.නි. දක්වා ඇත. |
| | | | | | | | | |
| 15. | | චීනයේ නිෂ්පාදිත CEYGRA වර්ගයේ ත්‍රිරෝද කාරයක ලියාපදිංචි අංකය හා දිනය හැර අනෙකුත් තොරතුරු පරිගණක පද්ධතියෙන් ඉවත් කර එම අංකයට බ්‍රිතාන්‍යයේ නිෂ්පාදිත MINI COOPER වර්ගයේ මෝටර් කාරයක් ලියාපදිංචි කර තිබුණු බව නිරීක්ෂණය විය. | | වාහන ලියාපදිංචි කිරීමේ නිර්වද්‍යතාව සඳහා විමර්ශනයක් කළ යුතු වීම හා අක්‍රමිකතාවයක් සිදු වී ඇතුනම් එා සඳහා විධිමත් පියවර ගත යුතු වීම | | පරිගනක පද්ධතියේ මෙවැනි අඩුපාඩු සිදුවිය නොහැකි ලෙස වැඩි දියුණු කර ඇති බව දක්වා ඇත. | | මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර නොමැත. |
| | | | | | | | | |
| 16. | | ආදායම් විෂයයන් 05 ක් යටතේ 2018 වර්ෂයේ සිට 2020 පෙබරවාරි මාසය දක්වා රු. 488,898,050 ක ආදායමක් උපයා තිබුණද ඒ සඳහා අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කර නොතිබුණි. | | ආදායම් එකතු කිරීම සඳහා අප්‍රමාදව නීති අනුමත කර ගැනීම | | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කිරීමට කටයුතු කරන බව ග.නි. දක්වා ඇත. | | මේ දක්වා එම උපදෙස් අනුව කටයුතු කර නොමැත. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| 17. | | වාහන ලියාපදිංචිය පිළිබඳ දුරකථන කෙටි පණිවුඩ සේවාව (SMS) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විවෘත මිල කැඳවීමක් නොමැතිව ලබාගෙන තිබුණි. එම ප්‍රසම්පාදනයට නිර්දේශය ලබාදුන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ සංයුතිය, ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු විසින්ම යෝජනා කර තිබුණු අතර එය කොමසාරිස් ජනරාල්වරයා අනුමත කර තිබුණි. කෙසේ නමුත්, මෙම මෘදුකාංගය අක්‍රිය වී තිබුණු අතර එය නැවත සක්‍රිය නොකරන්නේ නම්, ඒ වෙනුවෙන් දරන ලද රු. 2,160,000 ක මුදල නිෂ්ඵල බව නිරීක්ෂණය විය. | | නීතිරීති අනුව කටයුතු කිරීම හා නැවත සේවාව සක්‍රිය කළ යුතු වීම | | තොරතුරු තාක්ෂණ පද්ධතියේ වැඩිදියුණු කිරීම් සිදු කරන බව දක්වා ඇත. | | මෙතෙක් අළුත්වැඩියා කටයුතු සිදුකර නොමැත. |
| | | | | | | | | |
| 18. | | සුඛෝපභෝගී මෝටර් වාහන බදු සම්බන්ධයෙන් 1995 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා හිඟ ආදායම් ගණනය කිරීම 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද, එම හිඟ ආදායම් පිළිබඳ වාර්තා කිසිවක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි. මේ නිසා එම කාල පරිච්ඡේදයට අදාළ හිඟ ආදායම කොපමණ ද යන්න විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. කෙසේ නමුත්, 2009 වර්ෂයට පෙර වර්ෂ 13ක් වෙනුවෙන් එවකට අයකර | | හිඟ ආදායම අය කර ගැනීමට කඩිනම්ව කටයුතු කිරීම | | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2015 ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අදායම් සංකේත (1003.01.000 සුඛෝපභෝගී බදු) වාර්ෂික අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා සකස් කිරීම නියමිත පරිදි සිදු කරන බව දක්වා ඇත. | | මේ දක්වාම හිග බදු ආදායම නිශ්චය කිරීමට සුදුසු ක්‍රමයක් ස්ථාපිත කර නොමැත. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | තිබුණු හිඟ බදු ආදායම රු.34,898,108 කි. | | | | | | |
| | | | | | | | | |
| 19. | | අංක 01/2015 හා 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 ඡේදය පරිදි, හිඟ ආදායම් වෙනුවෙන් ක්‍රමවත් ව වාර්තා පැවැත්වීම හා හිඟ ආදායම් තවතවත් එකතුවීම වැළැක්වීමට පියවර ගෙන නොතිබුණි. සමස්ත හිඟ ආදායම වාර්ෂික ව දිගින් දිගටම වැඩිවීමේ ප්‍රවනතාවක් පැවැති අතර 2016 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ හිඟ ආදායම වැඩි වීම සියයට 318ක ප්‍රමාණාත්මක අගයක් ගෙන තිබුණි. | | චක්‍රලේඛවලින් දක්වා ඇති පරිදි වාර්තා පවත්වාගත යුතු වීම හා හිඟ ආදායම් අය කර ගැනීමට කඩිනමින් නටයුතු කිරීම | | හිඟ ආදායම් අඩු කර ගැනීම පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇති බව දන්වා ඇත<br>01. බදු ගෙවීමට ඇති වාහන හිමිකරුවන් කොටස් 02ක් ලෙස හඳුනාගෙන ලිපි යොමු කිරීමට කටයුතු කිරීම.<br>02. දීර්ඝ වශයෙන් බදු ගෙවීමට ඇති වාහන හිමිකරුවන් 4726ක් හඳුනාගෙන කඩිනමින් ලිපි යොමු කිරීමට කටයුතු කිරීම.<br>03. වාර්ශිකව බදු ගෙවීමට ඇති වාහන හිමියන් වෙත ගෙවිය යුතු දිනට ප්‍රථම සිහිකැඳවීම් ලිපි යැවීම. | | 2020.12.31 දින වන විට හිඟ බදු ආදායම රු.216,630,800 ක් වූ බවත් එය 2021.12.31 දින වන විට රු.214,323,900 ක් වූ බව එය පෙර වර්ෂයට සාපේක්ෂව රු.2,306,900ක අඩු වීමක් බවත් දන්වා සිටී. |
| | | | | | | | | |
| 20. | | අවසාන වාරිකය අයකර වර්ෂ 02කට වඩා කල්ගත වී තිබුණු වැඩ තහනම් කළ නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,330,463ක ණය ශේෂ ඔවුන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අය | | කල් ඉකුත් වී ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | | වැඩ තහනම් කළ නිලධාරීන්ගේ අය විය යුතු ණය ශේෂ අය කර ගැනීමට පියවර ගන්නා බව දන්වා ඇත. | | මේ දක්වා ණය අයකරගෙන නොමැත. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | කිරීමට 2020 දෙසැම්බර් 31 දින දක්වාම පියවර ගෙන නොතිබුණි. ඒ අතර වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු.1,170,753 ක ශේෂ 17ක් විය. | | | | | | |
| | | | | | | | | |
| 21. | | අවසාන වාරිකය අයකර වර්ෂ 05කට වඩා කල්ගත වී තිබුණු සේවය අත්හැර ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.234,042ක ණය ශේෂ ඔවුන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. | | -එම- | | සේවය අතහැර ගිය නිලධාරීන්ගේ අය විය යුතු ණය ශේෂ අය කර ගැනීමට පියවර ගන්නා බව දන්වා ඇත | | - එම - |
| 22. | | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට එකතුව හා එදිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර රු.2,359,113ක වෙනසක් විය. එය වසර ගණනාවක සිට පැවත එන ගිණුම්කරණ දෝෂ බව ගිණුම් වාර්තාවල සඳහන් කර තිබුණි. | | ගනුදෙනු අදාළ ලේඛන හා ප්‍රභව ලියවිලි සමඟ සසඳා ගිණුම්ගත කිරීම | | එම ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | | මේ දක්වා නිවැරදි කර නොමැත. |
| 23. | | එක් තැන්පත් ගිණුමකට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 04 ඉක්ම වූ රු.24,179,394ක තැන්පතු ශේෂ 12ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි. | | නීති, රීති හා රෙගුලාසි අනුව කටයුතු කිරීමට පියවර ගැනීම | | තැන්පතු ගිණුමකට අදාළව මු.රෙ. 571 පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා ඇත. | | මෙම තැන්පතු ශේෂ 04ට අදාළ රු.12,711,224 ක මුදලක් ගෙවීම් සිදු කර ඇති අතර ඉතිරි තැන්පත් මුදල් එසේම පවතී. |
| | | | | | | | | |
| 24. | | බර වාහන 02ක් හා බර එසවුම් උපකරණ 02ක් ශ්‍රී ලංකාවට ආනයනය කළ රේගු සටහන්කරයක් උපයෝගී | | නිසි විමර්ශනයක් සිදු කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | | සියලු ලේඛන පරික්ෂා කිරීමේ දී මෙම මෝටර් රථ ආනයනික නීති | | මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | කරගෙන TOYOTA LEXUS, MITSUBISHI MONTERO PEJERO හා TOYOTA LAND CRUISER PRADO වර්ගයේ අධි සුඛෝපභෝගී මෝටර් කාර් 03ක් ලියාපදිංචි කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගැනීම නිසා රජයට අහිමි වූ ආනයන තීරුබදු හා සුඛෝපභෝගී බදු ආදායම දල වශයෙන් රු.141,174,339ක් පමණ විය. මෙම වාහන රේගුව මගින් වෙන්දේසි කළ වාහන බවට පරිගණක පද්ධතියේ සටහන් කර තිබුණ ද, ඒ කිසිවක් රේගු වෙන්දේසියකට යොමු වී නොතිබුණි. | | | | උල්ලංඝනයක් සිදු වී ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගෙන පරික්ෂණ පවත්වා දණ්ඩන නියම කර මුදා හල රථ බවත්, අදාළ රථ භෞතිකව පරික්ෂා කොට බර සහතික සමඟ ලියාපදිංචියට ඉදිරිපත් වී ඇති බවත් මෙම දෙපාර්තමේන්තුව මඟින් රජයට අය කරන සියලු ගාස්තු අය කර ගැනීමෙන් අනතුරුව ලියාපදිංචිය සිදු කර ඇති බවත් දන්වා ඇත. | | නොතිබුණි. |
| | | | | | | | | |
| 25. | | වාහන 03ක් අවිධිමත් ලෙස ලියාපදිංචි කිරීම නිසා දළ වශයෙන් නිෂ්පාදන හා සුඛෝපභෝගී බදු ලෙස රු.114,597,000ක ආදායමක් රජයට අහිමි වී තිබුණි. එම වාහනවලට අදාළ රේගු සටහන්කර දත්ත කිසිවක් පරිගණක පද්ධතියේ නොමැති වීම, වැසි අංක සම්බන්ධයෙන් කිසිදු ආනයන වාර්තාවක් රේගු දත්ත තුළ නොමැති බව ශ්‍රී ලංකා රේගුව විසින් දන්වා තිබීම, පළමු ලියාපදිංචිය 2002 වර්ෂය ලෙස දැක්වුව ද, එ දින සිට සියලු වර්ෂ වෙනුවෙන් ආදායම් බලපත්‍රය ලබාගැනීම 2018 වර්ෂය තුළ සිදුකර තිබීම යනාදී කරුණු සියල්ල අතාත්වික විය. | | -එම- | | GI-8030 GY-1494 අංක දරන ත්‍රීරෝද රථ 02 හා GZ-8735 අංක දරන යතුරුපැදිය පර්ගණක දත්ත පද්ධතිය හඳුන්වා දීමට පෙර ලියාපදිංචි වී ඇති බැවින් එහි ලියාපදිංචිය පිළිබඳ තොරතුරු පද්ධතිය සටහන් වී නොමැති බව දන්වා ඇත. | | කරුණු පරික්ෂා කිරීමේ දී යම් අක්‍රමකතාවයක් සිදු වී ඇති බව නිරීක්ෂණය උවද මේ දක්වා විමර්ශන කටයුතු ආරම්භ කර නොමැත. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| 26. | | වර්ෂ 1992 සිට 2015 දක්වා කාල පරිච්ඡේදයට අදාළව මහ හැරුණු අංක භාවිතයෙන් පරිගණක පද්ධතියට නිවැරදි නොවන දත්ත ඇතුළත් කර නව වාහන 05ක් ලියාපදිංචි කර තිබුණි. ඉන් එක් වාහනයක් වෙනුවෙන් රු.4,249,600 ක පමණ නිෂ්පාදන බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි. වාහන 05ක් සඳහා රු.99,200ක නව ලියාපදිංචිය සඳහා ගාස්තු ද, අයකර නොතිබුණු අතර එක් වාහනයක් වෙනුවෙන් අයවිය යුතු සුඛෝපභෝගී බදු මුදල රු. 295,000ක් විය. | | -එම- | | වර්තමාන පරිගණක අංක නිකුත් වීම ස්වයංක්‍රීයව අනුපිළිවෙලට සිදු වන බවත්, වර්තමාන ක්‍රමවේදය අනුව අංක අතහැර ලියාපදිංචි කළ නොහැකි ලෙස පද්ධතිය සකසා ඇති බවත් පරිගණක තුළ අංක කාණ්ඩයන් හි අංකයන් අතර ඉදිරි වී ඇති හිස් අංක සියල්ල අවලංගු කිරීමෙන් (Freeze) අවශ්‍ය වැඩ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව දන්වා ඇත. | | අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදුකර නොමැත. |
| | | | | | | | | |
| 27. | | අවිධිමත් ලෙස ලියාපදිංචි කළ වාහන 17කින් වාහන 09ක් සඳහා පමණක් දළ වශයෙන් නිෂ්පාදන බදු, සුඛෝපභෝගී බදු සහ අනෙකුත් රජයේ ගාස්තු හා ආදායම් ලෙස රු. 297,057,788ක ආදායමක් රජයට අහිමි වී තිබුණි. ඒ හැර, අනුපිළිවෙලින් ලියාපදිංචි අංක නිකුත් නොකර යම් අංක ප්‍රමාණයක් හිස් ව තැබීම, පසුව එම හිස් අංක යොදා ගනිමින් වාහන ලියාපදිංචි කිරීම, පරිගණක පද්ධතියේ ආංශික දත්ත වාර්තා අසම්පූර්ණ වීම, රේගු සටහන්කර දත්ත | | -එම- | | 61 කාණ්ඩයේ මෝටර් රථ ලියාපදිංචි කරන ලද කාලයේ දී අතින් ලියන ලද පෙරලන පිටු සහිත ලියාපදිංචි සහතික නිකුත් කරන ලද බවත්, ඒවායේ දත්ත පරිගණකගත කිරීම පසුකාලයේ දී සිදුකළ බවත් එලෙස පරිගණකයට ඇතුළත් නොවූ අංක මෑතක දී දත්ත ඇතුළත් කිරීම සිදු | | මෝටර් රථයක් ලියාපදිංචි කර වසර ගණනාවක් ආදායම් බලපත්‍ර ලබානොගෙන පසුව ඒ සඳහා ගෙවීම් කිරීම වැළැක්වීම සඳහා DMT/H/E/01 හා 2020.10.14 දිනැති චක්‍රලේඛය මඟින් ආදායම් බලපත්‍ර නිකුත් |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | පරිගණක පද්ධතියේ නොමැති වීම, වාහන 14ක පළමු ලියාපදිංචිය 1992 සිට 1997 වර්ෂය දක්වා කාලය තුළ සිදු කර ඇතත්, දත්ත පරිගණකගත කිරීම ඊට වසර 08 සිට 25 දක්වා කාලයකට පසුව සිදු කිරීම, එම පරිගණකගත කිරීමෙන් පසු ඊට ආසන්නතම දිනක වාහන 10 ක් සඳහා පළමු ආදායම් බලපත්‍රය ලබාගැනීම සහ ඉන් වාහන 04ක් ද ඇතුළුව වාහන 05ක් සඳහා වසර 23 සිට 27 දක්වා දීර්ඝ කාලයකට එකවර ආදායම් බලපත්‍ර ලබා ගැනීම යනාදී වශයෙන් නිරීක්ෂණය වූ කරුණු සියල්ල අතාත්වික විය. | | | | කළ බවත් දන්වා ඇත. | කිරිම සම්බන්ධව සියලු කොමසාරිස්වරුන් වෙත උපදෙස් ලබා දී ඇති බව ග.නි. දන්වා ඇත. |
| | | | | | | | |
| 28. | | අතීත වර්ෂ 18ක් වෙනුවෙන් 2018 වර්ෂයේදී එක්වර ආදායම් බලපත්‍ර ලබාගත්, 302 කාණ්ඩයේ මෝටර් රථයක මුල් ලියාපදිංචිය 2006 වර්ෂය ලෙස පරිගණක පද්ධතියේ අවිධිමත්ව සටහන් තැබීම නිසා රු. 652,500ක සුඛෝපභෝගී බදු මුදලක් රජයට අහිමි වී තිබුණි. | | -එම- | | 302-2033 අංක දරන වාහනය බදු වැඩසටහන් පද්ධතියට අනුව අයවිය යුතු අර්ධ සුඛෝපභෝගී බදු සියල්ල අය වී ඇති බවත් දන්වා ඇත. | තොරතුරු රැස්කරගෙන විමර්ශන කටයුතු අවසන් කර නැත. |
| 29. | | රජය සතු කැබ් රථයක ලියාපදිංචි අයිතිය පසුකාලීනව පුද්ගලයෙකු වෙත පවරා තිබුණි. රජය වෙනුවෙන් ආනයනය කළ එම වාහනය සඳහා 2013 වර්ෂයේදී නිදහස් කළ රු.3,175,774 ක් වූ රේගු බදු මුදල අයකර නොතිබුණි. එමෙන්ම, 2013 වර්ෂයේ සිට මෙම වාහනයේ බලපත්‍ර අධිකාරිය වයඹ පළාත වුවද, 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය | | නිදහස් කළ රු.3,175,774ක් වූ රේගු බදු මුදල නිසි විමර්ශනයක් සිදු කර ඔහුගෙන් අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | | ලියාපදිංචියෙන් වසර 06 කට පසුව මෙම පැවරීම සිදු කරන අවස්ථාවේ දී කිසිදු නෛතික බාධාවක් නොමැති බව දන්වා ඇත. | බදු අයකර ගැනීම සඳහා විමර්ශන කටයුතු සිදුකර නොතිබුණි. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | දක්වා ආදායම් බලපත්‍ර ගාස්තු 2019 වර්ෂයේදී බස්නාහිර පළාත් බලපත්‍ර අධිකාරිය විසින් එක්වර අයකර තිබීම ද ගැටළු සහගත විය. | | | | | |
| | | | | | | | |
| 30. | | විශේෂ කොන්දේසි කිසිවක් ලියාපදිංචි සහතිකයේ ඇතුළත් නොකර ද්විත්ව කාර්ය වාහන සඳහා වන ලියාපදිංචි අංක යටතේ විශේෂ කාර්යයන් සඳහා ආනයනය කළ වාහන ලියාපදිංචි කිරීම හේතුවෙන් 2018 හා 2019 වර්ෂවල දී වාහන 09ක් සඳහා පමණක් රු.27,472,988ක රේගු බදු මුදලක් රජයට අහිමි වී තිබුණි. | | නිසි විමර්ශනයක් සිදු කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | | අයකරන ලද මුදල් මත පදනම්ව මෝටර් රථ ලියාපදිංචි නොකරන අතර ශ්‍රී ලංකා රේගුව විසින් ජාලගත කරන මෝටර් රථ පමණක් ලියාපදිංචි කරන බවත් මෙම වාහන 09 අතරින් PK-3175 මෝටර් රථය හැර අනිකුත් සියලු මෝටර් රථ මෝටර් වාහන පනතේ විධිවිධාන අනුව නියමිත වර්ගීකරණය අනුව සිදු කර ඇත. PK-3175 රේගු දෙපාර්තමේන්තුවේ ජාලගත කර ඇති Nissan Van රථයක් ලෙස ජාලගත වී ඇති බැවින් අතපසුවීමකින් ද්විත්ව කාර්යය වාහන ලෙස ලියාපදිංචි වී ඇති බව දන්වා ඇත. | | HS CODE මත පදනම්ව මෝටර් රථ ලියාපදිංචිය සිදු කිරීම සඳහා අංක DMT/H/E/1 අභ්‍යන්තර චක්‍රලේඛ/13/2020 (1) හා 2020.08.10 දිනැතිව හා 220.09.04 දිනැති චක්‍රලේඛ නිකුත් කර ඇති බවත් එවැනි සිදුවීම් නැවත ඇති නොවීම සඳහා නිලධාරීන් දැනුවත් කර ඇති බව වැඩිදුරටත් දන්වා ඇත. |
| 31. | | වාහන අංක තහඩුවල පළාත් අක්ෂර මුද්‍රණය කිරීම නිසා වාහනයක අයිතිය පළාත් අතර | | රාජ්‍ය මුදල් සුරක්ෂිත වන පරිදි කළමනාකරණ තීරණ ගත යුතු වීම | | රට තුල පවැති දිගුකාලීන යුධමය වාතාවරණය | | පළාත් අක්ෂරය ඉවත් කිරීමට මේ දක්වා |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | විතැන් වීමේ දී නව අංක තහඩු මිල දී ගත යුතු විය. මෙම අක්ෂර මුද්‍රණය කිරීමෙන්, එම මුද්‍රණකරු උපයන ලාභය හැර වෙනත් කවර පාර්ශවයකට හෝ ලබාගත හැකි උපයෝගීතාවක් නිරීක්ෂණය නොවීය. ඒ අනුව, පසුගිය වර්ෂ 03ක කාලය තුළ පමණක් මෙලෙස පළාත් අතර විතැන් වූ වාහන 376,233ක අංක තහඩු වෙනුවෙන් මුද්‍රණකරු වෙත ගෙවා තිබුණු රු.778,448,278 ක මුදලේ ඵලදායකත්වය විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. එමෙන්ම, මේ නිසා ආනයනික තහඩු වෙනුවෙන් දල වශයෙන් වාර්ෂිකව රු. මිලියන 260ක විදේශ විනිමයක් ද වැයකර තිබුණි. | | | | හේතුවෙන් හා ජාතික ආරක්ෂාව හා වාහන හඳුනාගැනීම සඳහා පළාත් අක්ෂරය ආරක්ෂක අංශවලට වැදගත් වූ බවත් දැනට රටේ පවතින සාමකාමී වාතාවරණය හමුවේ එම අවශ්‍යතාවය දැඩි නොමැති හෙයින් අදාළ කරුණ හඳුනාගැනීමෙන් අනතුරුව වාහන අංක තහඩුවල පළාත් අක්ෂරය ඉවත් කිරීමට තීරණය කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව, දන්වා ඇත. | | රෙගුලාසි සකස් කර නැත. |
| | | | | | | | | |
| 32. | | වාහනවල අනන්‍යතාව හඳුනාගැනීම වෙනුවෙන් හඳුන්වා දී තිබුණු රේඩියෝ සංඛ්‍යාත දත්ත හඳුනාගැනීමේ අක්ෂරය සහිත ස්ටිකරය ප්‍රායෝගිකව භාවිතයට නොගන්නා බැවින්, ඒවා මුද්‍රණය කරන පෞද්ගලික සමාගම ලබාගන්නා ලාභය හැර වෙනත් කවර පාර්ශවයකට හෝ ලබාගත හැකි උපයෝජනයක් නිරීක්ෂණය නොවීය. උපයෝගීතාවක් තිබුණද, වාහන අංකය, පළාත, වැසි අංකය වැනි සීමිත දත්ත පමණක් ලබාදීම නිසා 2019 දෙසැම්බර් මාසයේ සිට 2020 අගෝස්තු දක්වා නිකුත් කළ ස්ටිකර් 302192ක් | | වැය කරන මුදලට සරිලන උපයෝජනයක් ලැබෙන පරිදි රාජ්‍ය මුදල් භාවිතා කළ යුතු වීම | | මෙම ස්ටිකරය මඟින් ශ්‍රී ලංකා පොලීසිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත් පාලන ආයතන සඳහා භාවිතා කිරීමට ඇති හැකියාව සැලකිල්ලට ගෙන ඇති බව දන්වා ඇත. | | මේ දක්වා මෙම වියදම් ඵලදායි ලෙස යොදවා ගැනීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | වෙනුවෙන් එම පෞද්ගලික සමාගමට ගෙවූ රු.153,059,534ක මුදල නිෂ්ඵල වියදමක් ලෙස නිරීක්ෂණය විය. | | | | | | |
| | | | | | | | | |
| 33. | | රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා පවතින මිල ගණන් යටතේ ම අවස්ථා 05ක දී ගිවිසුම්ගත කාලය දීර්ඝ කරමින් 2020 ජූනි 30 දින දක්වාම එම සැපයුම්කරු වෙතම කොන්ත්‍රාත්තුව පවරා දී තිබුණි. එනම්, අවස්ථා 05ක දී මාස 51ක කාලයක් සඳහා දින දීර්ඝ කිරීම් කළ එක් අවස්ථාවක දී හෝ මිල ගණන් සංශෝධන සඳහා සාකච්ඡා කර නොතිබුණි. කෙසේ නමුත්, 2020 ජූනි 01 දින සිට මාස 06ක් සඳහා එම සැපයුම්කරු විසින් එක් රියැදුරු බලපත්‍රයක මිල රු. 1,000 ක් වන පරිදි රු. 340 කින් අඩු කිරීමට එකඟ වී තිබුණි. දිවයිනේ උද්ධමනකාරී තත්ත්වයක් දිගින් දිගටම පැවැතිය දී සහ ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය අගය අඛණ්ඩව පිරිහෙමින් පැවැතිය දී ඒකක මිල රු.340කින් එනම්, සියයට 25කින් අඩු කිරීම සඳහා එකඟ වීම තුලින් නිරීක්ෂණය වන්නේ, 2009 වර්ෂයේ සිට එක් රියැදුරු බලපත්‍රයක් සඳහා අයකළ රු.1,340ක ගැනුම් පිරිවැය තුළ අධික ලාභ ආන්තිකයක් අන්තර්ගතව පැවති බවය. මේ නිසා, විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය, පූර්ව ගිවිසුම් කාලය තුළ දී ම ක්‍රියාවට නැංවූයේ නම් හෝ සැපයුම්කරු සමග මිල ගණන් අඩු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කළේ | | වැය කරන මුදලට සරිලන උපයෝජනයක් ලැබෙන පරිදි රාජ්‍ය මුදල් භාවිතා කළ යුතු වීම | | 2009 දී පටන් එක් කාඩ්පතකට ගෙවූ රු.1340ක් වූ ගැණුම් පිරිවැය තුළ අධික ලාභයක් පැවැති බවත්, පසු රු.1000ක මුදල ප්‍රකාශයට පත් වීමෙන් පසු ප්‍රායෝගික හා සාධාරණ නොවන බව නිරීක්ෂණය වූ බවත් එම රු.340 ක මිල අඩු කිරීම සඳහා සාකච්ඡා පවත්වන ලද බවත්, මුල් ගැනුම් පිරිවැය රු.1,340 විවෘත හා තරඟකාරී මිල ගණන් යටතේ තීරණය වූ මිලක් බවද දන්වා ඇත. | | රජයට විශාල අලාභයක් සිදුවී ඇති බව නිරීක්ෂණය කෙරේ. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | නම්, එම සැපයුම්කරු වෙතින් හෝ නව සැපයුම්කරුවෙකු වෙතින් හෝ අවම මිල ගණන් ඉදිරිපත් කිරීමට පවතින සම්භාවිතාව පුළුල් ය යන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය. එහෙත්, රාජ්‍ය මුදල්වල යහපත් භාවිතයක් වෙනුවෙන් කාර්යක්ෂමතාවකින් යුතුව එවැනි තීරණ ගැනීමට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු කළමනාකාරීත්වය අපොහොසත් වීම නිසා 2016 මාර්තු මාසයේ සිට 2020 ජූනි මාසය දක්වා මාස 51ක කාලයක් තුළ මුද්‍රණය කළ රියැදුරු බලපත්‍ර 3,075,625 ක් වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත සකසුරුවම් නොවන ලෙස ගලාගිය රාජ්‍ය මුදල් ප්‍රමාණය දළ වශයෙන් රු.1,045,712,500 ක් බව නිරීක්ෂණය විය. | | | | | | |
| 34. | | මුද්‍රණය කළ යුතු CMT වැසි අංක 21ක් පිළිබඳ විස්තර 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලය ඇතුළත දී රජයේ කර්මාන්ත ශාලාව වෙත දන්වා තිබුණ ද, එම වැසි අංක සහිත වාහන 2021 ජනවාරි දක්වාම ලියාපදිංචි කර නොතිබුණි. එමෙන්ම, CMT වැසි අංක මුද්‍රණය කරන ලෙස රජයේ කර්මාන්ත ශාලාව වෙත දන්වා යවා තිබුණු වාහන 06ක් සාමාන්‍ය වාහන ලෙස ලියාපදිංචි කර තිබුණි. | | මනා අභ්‍යන්තර පාලනයක් සඳහා අවශ්‍ය පිළිවෙත නිශ්චය කිරීම | | නව ලියාපදිංචි අංශය වෙත CMT වැසි අංක මුද්‍රණය කර ලියාපදිංචියට යොමු කරන විට අදාළ අංශ දැනුවත් කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව ග.නි. දන්වා ඇත. | | CMT මුද්‍රණය කිරීමට රජයේ කර්මාන්ත ශාලාව වෙත යොමු කිරීමේ දී එම ලිපියේ පිටපතක් නව ලියාපදිංචි අංශය වෙත අදාළ ලියාපදිංචිය සිදු කර නැවත දැනුම් දීම සිදු කරන ලෙසට දන්වා ඇත. |
| 35. | | නව වැසි අංකය ලබාදුන් පසු පැවති වැසි අංකය අවලංගු කළ යුතු වුවද, පැරණි හා නව වැසි | | -එම- | | CMT වැසි අංකයක ලබා දීමට සිදු වන අවස්ථාවලදී අදාළ | | නව වැසි අංකය ලබාදෙනුයේ විමර්ශන |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | අංක දෙකටම වාහන ලියාපදිංචි වී ඇති අවස්ථා 03ක් පැවැති අතර මෝටර් සයිකල් 02ක් එකම වැසි අංකයක් යටතේ ලියාපදිංචි කර තිබුණි. | | | | ගොනුව විමර්ශන අංශයට යොමු කර විධිමත් පරීක්ෂණයකින් පසුව කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබීමෙන් පසු සිදු කිරීමට උපදෙස් ලබා දී අති බවත් CMT වැසි අංක ලබා දීම පවතින වැසි අංකය අවලංගු කිරීමෙන් හෝ අසාධු ලේඛනගත කිරීමෙන් පමණක් සිදු කරන බව දන්වා ඇත. | | අංශයට යොමු කර විධිමත් පරීක්ෂණයකින් පසුව එම අංශය විසින් ලබාදෙනු ලබන නිර්දේශයන්ට අනුව කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත පමණක් බවත්, ගොනුවේ මුල් පිටපත ලියාපදිංචි අංශය වෙත යොමු කර එම ගොනුවේ අවශ්‍ය ජායා පිටපත් CMT වැසි අංකය ලබාදීමේ ගොනුවට ගොනු කරන බවත් දන්වා ඇත. |
| 36. | | දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ නිකුත් කර තිබුණු CMT වැසි අංක ලියාපදිංචි කිරීමේදී රේගුව විසින් දඩ මුදල් ලෙස රේගු ගාස්තු අයකර නිදහස් කරනු ලැබූ මෝටර් වාහනවල ලියාපදිංචි සහතිකයේ “Brought From Auction” ලෙස දැක්වීම වෙනුවට “Recondition” යනුවෙන් සටහන් කර තිබුණු අවස්ථා 30 ක් නිරීක්ෂණය විය. | | -එම- | | CMT75 බර සහතිකයේ තත්ත්වය පිළිබඳ සටහන, අවසන් නිර්දේශය සමඟ සටහන් කිරීමට උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. | | CMT75 බර සහතිකයේ BRAND NEW, RECONDITIO N, BOUGHT FROM AUCTION ආදී වශයෙන් වාහනයේ තත්ත්වය පිළිබඳව සටහන, අවසන් නිර්දේශ සමඟ |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | සටහන් කරනු ලබනු ලැබේ. ඉන්පසු ලියාපදිංචි කිරීමේ අංශය මඟින් පරිගණකගත කිරීමේ දී අදාළ වාහනයේ තත්ත්වය, ලියාපදිංචි සහතිකයේ සටහන් කරනු ලබන බව දන්වා ඇත. |
| 37. | | CMT වැසි අංක වෙනුවෙන් රේගු සටහන්කර නොමැති විට දී නව රේගු සටහන්කර අංක නිර්මාණය කර පරිගණක පද්ධතිගත කළ අවස්ථා 08 ක් නිරීක්ෂණය විය. මේ සඳහා අනුමත කළ නෛතික ප්‍රතිපාදන කිසිවක් නොවිය. | | -එම- | | CMT වැසි අංක මුද්‍රණය කිරීමට රජයේ කර්මාන්ත ශාලාවට යොමු කිරීමේ දී එම ලිපියේ පිටපත් රේගු දෙපාර්තමේන්තුව වෙත ද, ලියාපදිංචිය සඳහා වැසි අංකය ජාලගත කිරීමේ දී පරිගණක අංශය වෙත ද යොමු කරන බව දන්වා ඇත. | | රේගු දෙපාර්තමේන්තුව මඟින් වාහන නිදහස් කරනු ලබන්නේ විධිමත් පරීක්ෂණයකින් පසුව වන අතර වාහන නියමිත බදු හෝ ගාස්තු ගෙවීමක් සිදු කර නොමැති නම් ජාලගත කිරීමක් සිදු නොවන බව දන්වා ඇත. |

ශීර්ෂ 308 - තැපැල් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණන ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | දිසා ගිණුම් කාර්යාල 02 ක කේවල ණය ශේෂ එකතුව සහ පාලන ගිණුමේ ශේෂය අතර රු.2,812,091 ක හඳුනා නොගත් අසමානතාවන් පවතින අතර එක් දිසා ගිණුම් කාර්යාලයක වර්ෂ 08 ක සිට පවතින රු.1,295,400 ක මූල්‍ය වංචාවක්ද මේ සඳහා හේතු වී තිබුණි. | කේවල ණය ශේෂය හා පාලන ගිණුමේ ශේෂ සමාන විය යුතුය. | නිවැරදි කිරීම සඳහා තවදුරටත් පරීක්ෂා කරමින් පවතී. | මෙතෙක් නිරවුල් කර නැත. |
| 2. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව රජයට අයවිය යුතු ණය මුදල් ණයකරුවන්ගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී ඔහු සම්බන්ධයෙන් නියම කර ඇති ක්‍රියාමාර්ග ඇපකරු සම්බන්ධයෙන් අනුගමනය කර මුදල් අයකර ගත යුතු නමුත් වටිනාකම රු.15,776,735 ක් වූ ණය ශේෂ වසර 05 කට වැඩි කාලයක සිට පැවතුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | අය කර ගැනීමට කටයුතු කිරීම. | මෙම මුදල අයකර ගෙන නොමැත. |
| 3. | සේවක වැටුප් හා අතිකාල පිරිවැය 2019 වර්ෂයේදී සියයට 12 කින්ද 2020 වර්ෂයේදී සියයට 4 කින්ද වැඩිවී තිබුණද ඊට අනුරූපව ආදායම ඉහල නැංවීමට අවශ්‍ය උපාය මාර්ගික ක්‍රම හඳුනාගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ වියදම ආවරණය කර ගැනීමට හා ආදායම ඉහළ නැංවීමට අවශ්‍ය වන උපාය මාර්ගික ක්‍රම හඳුන්වා දිය යුතුය. | පස් අවුරුදු සැලැස්මක් සකස් කර ඉදිරි වර්ෂ පහ තුළ ආදායම, වියදමට සමපාත කර ගැනීමට කටයුතු කිරීම. | උපාය මාර්ගික ක්‍රම සකස් කර නොතිබුණු අතර 2021 වර්ෂයේද මෙම තත්ත්වය මෙසේම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 4. | පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් අවුරුදු 05 සිට 10 දක්වා කාල පරාසයකට අයත් රු.14,171,700 ක වටිනාකමක් සහිත හානි හා පාඩු කපාහැරීමට හෝ අයකර ගැනීමට 2020 වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | හානි හා පාඩු සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කළ යුතුය. | අලාභය කපාහැරීම් සඳහා කටයුතු කිරීම. | අලාභ කපාහැරීම් කටයුතු නිමවී නොමැත. |
| 5. | 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාල චක්‍රලේඛ අංක 03/2017 ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම පැමිණීම හා පිටවීම සනාථ කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කළ යුතු බවට දක්වා තිබුනද මධ්‍යම තැපැල් හුවමාරුවේ මෙම යන්ත්‍ර සවිකර නොතිබුණි. | 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2017 ප්‍රකාරව කටයුතු කිරීම. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ දක්වා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොමැත. |
| 6. | 2020 වර්ෂයේ තැපැල් හා උප තැපැල් කාර්යාල 16 ක ඉඩම් පවරා ගැනීම් හා මැනීම් කටයුතු සඳහා රු.762,480 ක් වැයකර තිබූ නමුත් 2021 මාර්තු 15 දින වන විටත් එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි. | කඩිනමින් ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සමග සාකච්ඡා කොට මැනුම් කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට ප්‍රාදේශීය තැපැල් අධිකාරීවරුන්ට උපදෙස් ලබාදී ඇත. | ඉඩම පවරාගෙන නොතිබුණි. |
| 7. | තැපැල්පති නමින් ලියාපදිංචි කර ඇති වාහන සම්බන්ධයෙන් තැපැල් දෙපාර්තමේන්තුවෙන් හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු සැසඳීමේදී වාහන 87 ක් සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු අතර අංක 60 ශ්‍රී 7256 දරන බස් රථය භාවිතයෙන් ඉවත් කර තිබුණද ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි. | තැපැල් දෙපාර්තමේන්තුවේ නමට ලියාපදිංචි වී ඇති වාහන පිළිබඳව නිවැරදි තොරතුරු දෙපාර්තමේන්තුවේ පැවතිය යුතුය. | මේ සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් වාහනවල අයිතිය තහවුරු කර ගැනීමට පමණක් කටයුතු කර තිබුණි. | අයිතිය තහවුරු කර ගැනීමට අමතරව මේ දක්වා වෙනත් තොරතුරු ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 8. | 2019 දෙසැම්බර් 31 දිනට නාරාහේන්පිට ගිණුම් කාර්යාලයේ මුද්දර කාර්යාංශයේ භෞතික මුද්දර තොගය රු.132,943,642 ක් අඩුවෙන් වාර්තා කර තිබුණි. | මුද්දර තොග ගිණුම සමග භෞතික තොගය නොසැසඳෙන අවස්ථාවලදී ඊට හේතු සොයා බලා සැසඳීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර දෙසැම්බර් 31 දිනට නිවැරදි තොගය වාර්තා කළ යුතුය. | මෙම තොගය මු.රෙ. ප්‍රකාරව කටයුතු කිරීම සඳහා තැපැල්පති අනුමැතියෙන් අභ්‍යන්තර විගණන කමිටුවක් පත්කර ගණනය කර භාරගැනීමට කටයුතු කිරීම. | මෙම තොග සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නොමැත |
| 9. | 2020 වර්ෂය අවසානයට නාරාහේන්පිට මුද්දර අංශයේ මුද්දර පාලන ලෙජරය හා භෞතික ශේෂය අතර රු.2,476,800 ක් වටිනා මුද්දර තොගයක ඌනතාවයක් පැවතුණි. | ලේඛනවල තොගය භෞතික තොගය සමඟ සැසඳිය යුතුවේ. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඌනතා සම්බන්ධයෙන් අවශ්‍යය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |
| 10. | තැපැල් දෙපාර්තමේන්තුවේ අනෙකුත් ශ්‍රේණි හා සේවාවල 1,965 ක් පුරප්පාඩු පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 61 ක්ද ඇතුළත් වී තිබුණි. එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම ට හෝ කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම හා ඵලදායී කරගැනීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. | 2021 වර්ෂය වන විටද පුරප්පාඩු සම්පූර්ණ කර නැත. |
| 11. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක DMS/ 1139/ VI හා 2016 ජූලි 07 දිනැති ලිපියෙන් සහකාර තැපැල් අධිකාරී තනතුරු ප්‍රමාණය 106 කින් වැඩි කිරීමට අනුමැතිය ලබා දී තිබුණද එම පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අපොහොසත් වී තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් කඩිනමින් සිදුකළ යුතු වේ. | අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | පුරප්පාඩු සම්පූර්ණ කර නැත. |

ශීර්ෂ 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගෙන ඇති වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **අදාල ක්‍රියාමාර්ගයන්හි වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 1. | සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතනය යටතේ වන සියලුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වන අතර දෙපාර්තමේන්තුව විසින් ඉඩම් සහ වාහන පිළිබඳ තොරතුරු පමණක් ඉදිරිපත් කර තිබුණි. | ආයතනය යටතේ වන සියලුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කල යුතු බව. | තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. | මෙතෙක් ඉදිරිපත් කර නැත. |
| 2. | 2019 වර්ෂයේ උපදේශාත්මක සේවය (Consultancy Projects) පමණක් සපයන වාර්ෂික ප්‍රතිපාදන රු.මිලියන 413.52ක් වූ ව්‍යාපෘති 7 ක භෞතික කාර්යසාධනය සියයට 1ක සිට සියයට 36 ක් දක්වා පරාසයක වූ අතර, රු.මිලියන 3.8 ක වාර්ෂික ප්‍රතිපාදනයක් සහිත ව්‍යාපෘතියක කිසිදු කාර්යසාධනයක් සිදුවී නොතිබුණි. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා කාර්ය සාධනයක් අත්පත් කර ගැනිමට කටයුතු කළ යුතුය. | උපරිම ඵලදායිතාවයකින් කටයුතු කර නොමැත. | කාර්ය සාධනය පහල මට්ටමක පැවතුණි. අතරමග නවතා දැමූ ව්‍යාපෘතිද විය. |
| 3. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 613ක්වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 494ක් විය. ඒ අනුව 119 ක්වූ තනතුරු පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු වේ. | දීප ව්‍යාප්ත සේවාවන්වලට හා ඒකාබද්ධ සේවයට අයත් නිලධාරින් බඳවා ගැනීමට ක්‍රියාකර නොමැත. | මෙතෙක් ක්‍රියා කර නොමැත. |

ශීර්ෂ 310 - රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගෙන ඇති වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **අදාල ක්‍රියාමාර්ගයන්හි වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 1. | 2018 දෙසැම්බර් 31 දිනට රු.640,594,032 ක් වූ ණයගැති ශේෂවල එකතුව අවුරුදු 20 ට වැඩි කාලයක ශේෂයන් වේ. | ණයගැති ශේෂයන්ගේ කාලවිශ්ලේෂණය අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | 2010 වසරේ සිට 2021 දක්වා ණයගැති ශේෂය වූ රු. 640,594,032 සඳහා සිහි කැඳවීම් ලිපි 2022.01.31 දිනවන විට යවා අවසන් කර ඇතත් අයවී නැත. | මේ දක්වා අය කරගෙන නැත. |
| 2. | 1995 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් රු.32,550,371.85 ක මුදලක් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට අයවීමට ඇති බැව් විගණනයේ දී නිරීක්ෂණය විය. | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2010 සිට 2019 දක්වා නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් අයවිය යුතු ණයශේෂයන්ගෙන් තහවුරු කල හැකි රු.15,586,818.83 වටිනාකමකින් යුත් ණය ශේෂ ලැයිස්තුවක් සකසා වර්ථමාන රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී ඇත. | මේ දක්වා ණය අයකර ගෙන නැත. ඉතිරි ශේෂයන් තහවුරු කරගෙන නොමැත. |
| 3. | 2012 හා 2015 වර්ෂවලදී මිලදී ගත් Mag welding solid Wire කි. ග්‍රෑ. 225 නිශ්කාර්යව පැවතුනි. | මිලදී ගැනීමේදී අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි මිලදී ගැනීම් කළ යුතුය. | මෙතෙක් ඉතිරිවී ඇති ප්‍රමාණය අපහරණය (වෙන්දේසි) කිරීමට කටයුතු කර නැත. | වර්තමානයේ භාවිතයට නොගනී. අපහරණය කර නොමැත. |
| 4. | 2019.12.31 දිනට රු.55,087,507 ක් වූ ණයගැතියන් සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා සියලුම ණයගැතියන් සඳහා උපලේඛන ඉදිරිපත් කළ යුතුය. | 2015ට පෙර ණයගැති ශේෂය වූ රු.85,284,890න් රු.30,197,395ක් ඉවත් කිරීමෙන් පසු ඉතිරිවන ශේෂය මෙතෙක් උපලේඛන ඉදිරිපත් | මෙතෙක් පිළියෙල කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරීමට කටයුතු කර නැත. | |
| | | | | |
| 5. | 2020.12.31 දිනට විශ්‍රාම ගොස්/ මියගොස් වසර 04 ඉක්මවා තිබූ නිලධාරින් හත්දෙනෙකුගෙන් අයවිය යුතු රු.446,305 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. | අනිවාර්ය විශ්‍රාම ගැන්වූ නිලධාරීන් තිදෙනෙකුගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයේ 2025 වර්ෂයේ දී රු.304,600 ට අය කර ගැනීමටත් රු. 116,305 ක් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට සොයා බැලීමටත් කටයුතු කර ඇත. | මියගිය නිලධාරින්ගේ අයවිය යුතු රු.25,400 නිරවුල් වී ඇත. ඉතිරිය නිරවුල් වී නැත. |
| 6. | තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2020 මාර්තු 06 වන විට රු.22,199,572ක් අයකරගෙන තිබුණද ව්‍යාපෘතියෙහි කිසිඳු භෞතික ප්‍රගතියක් 2021 පෙබරවාරි 06 විගණිත දිනය දක්වාම සිදුවී නොතිබුණි. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්යයේ අදාල සැලසුම් හා ස්ථානය කිහිප විටක් වෙනස්කම් වලට ලක් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අත්හිටුවීමට කටයුතු කරන ලදී. | ව්‍යාපෘතිය අත්හිටුවා ඇත. අය කර ගත් මුදල් දෙපාර්තමේන්තුව සතුව ඇත. |
| 7. | සමාලෝචිත වර්ෂයේ නිමකිරීමට යෝජිත වූ ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 01 ක්වූ දෙපාර්තමේන්තුවේ අබලි යකඩ අංගනයෙහි II වන උපඅංගනය ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි දිනට භෞතික ප්‍රගතිය සියයට 10 ක් පමණ විය. | ව්‍යාපෘති නිසි කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. | අබලි අංගනයෙහි II වන උප අංගනය ඉදි කිරීමට අදාල සිවිල් ඉංජිනේරුමය කාර්යයන් මේ වන විට අවසන් කර ඇති අතර ඉතිරි වැඩ සඳහා අමුද්‍රව්‍ය මිලදී ගෙන ඇත. මෙම කාර්යය කඩිනමින් අවසන් | 2021.12.31 දිනට ද ව්‍යාපෘතිය නිමවා නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරීමට සැලසුම් කර ඇත. | |
| 8. | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 06ක් පවරා නොදී 2020.12.31 දිනට ඌන උපයෝජිතව පැවතුණි. | -එම- | නිල නිවාස ඉල්ලුම්කල නිලධාරීන් නොමැති වීම නිසා එම නිවාස ඌන උපයෝජිතව පවතී. | මේ වන විටද එසේම පවතී. |
| 9. | මායිම් තාප්ප හෝ ස්ථිර වැටක් යොදා දෙපාර්තමේන්තුව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රජයේ කර්මාන්තශාලා සේවක නිවාස පිහිටි ඉඩමේ ඉතිරි අක්කර 01 යි රූඩ් 03 යි පර්චස් 11ක භූමි භාගය අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණි. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම අනවසර පදිංචිකරුවන් 1986 වන විටද රජයට වරිපණම් බදු ගෙවමින් ස්ථිර ලෙස පදිංචි වී සිට ඇත.<br>මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස නාගරික සංවර්ධන අධිකාරියට හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. | මෙතෙක් මායිම් තාප්පයක් හෝ ස්ථිර වැටක් යොදා නොමැත. |
| 10. | දෙපාර්තමේන්තුව සතු පහත සඳහන් ඉඩම් 03 ක් වෙනුවෙන් ඔප්පු දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර මිනින්දෝරු සැලැස්ම පදනම්කරගෙන ප්‍රාදේශීය ලේකම් මගින් අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් 2013.06.03 දින සිට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br>මෙම කාර්යය සඳහා මිනින්දෝරු සැලැස්ම ඇඳීම මිනින්දෝරු දෙපාර්තමේන්තුවට පවරා ඇති අතර තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට පවරා ඇත. | මෙතෙක් අයිතිය තහවුරු කරගෙන නැත. |

ශීර්ෂ 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ගය** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 1. | බිංගිරිය දේවගිරි රජමහා විහාරයේ සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා බුද්ධ ශාසන අමාත්‍යාංශයෙන් රු.550,000 ක්, එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් රු.1,000,000 ක් හා මෙත්සිත් අරණ වැඩසටහන සඳහා මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.2,766,223 ක් වශයෙන් දෙපාර්තමේන්තුව වෙත 2018 වර්ෂයේදී ලැබී තිබුණු එකතුව රු.4,316,223 ක ප්‍රතිපාදන වලින් එම වර්ෂය අවසාන වන විට පිළිවෙලින් සියයට 81 ක්, සියයට 38 ක් හා සියයට 33 ක් ඉතිරිවී තිබුණි. | සැළසුම් සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව හා සම්පූර්ණව ඇස්තමේන්තු සකස් කළ යුතුවේ. | දොඩංගොඩ ව්‍යාපෘතිය භූමි අයිතිය පිළිබඳ ගැටළුවක් නිසා අත්හැර ඇත. ව්‍යාපෘති 03 ක් අමාත්‍යාංශ උපදෙස් මත රෙබෙකෝ ආයතනය විසින් සිදුකරයි. අවිස්සාවේල්ල යෝජිත ව්‍යාපෘතිය අවසන් කර ඇත. | මේ වන විට එම ව්‍යාපෘති වලින් අවසන් කර තිබුණේ එක් ව්‍යාපෘතියක් පමණි. එක් ව්‍යාපෘතියක් අතහැර දමා ඇත. |
| 2. | අනුරාධපුර පූජා භූමිය තුල ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම, පුරා විද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම සහතික කිරීම, බැතිමතුන් සඳහා විශ්‍රාම ශාලා සංචාරක නිවාස පහසුකම් සැලසීම සහ දැනට මෙම ප්‍රදේශයේ පදිංචිව සිටින ජනතාවට නාගරික පහසුකම් සහිතව ජීවත්වීමට අවස්ථාව ලබාදීම යන අරමුණු වෙනුවෙන් අනුරාධපුර ලෝලුගස්වැව නව නගර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට | ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම විය යුතුය. | ඉඩම පවරාදීම 2021 දී සිදුකර ඇත. | නවනගර ව්‍යාපෘතිය තවමත් සැලසුම් අධියරේ පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | 2016 වර්ෂයේ සිට අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබා ගෙන තිබුණි. ඒ අනුව 2016, 2017 හා 2018 වර්ෂයන්හි පිළිවෙලින් රු.මිලියන 100 ක්, රු.මිලියන 200 ක් හා රු.මිලියන 185 ක් වශයෙන් ප්‍රතිපාදන වෙන්කරවා ගෙන ව්‍යාපෘති කටයුතු සඳහා සැලසුම් සකස් කර තිබුණු නමුත් 2017 වර්ෂයේදී රු.මිලියන 05 ක් වියදම් කරමින් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කිරීම පමණක් සිදුකර තිබුණි. | | | |
| 3. | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙත්සිත් අරණ යටතේ ව්‍යාපෘති 05 ක් සඳහා රු.61,358,792 ක ප්‍රතිපාදන 2016 වර්ෂයේදී ලබාදී තිබුණද ඉන් රු. 26,756,471 ක් වෙන්වූ කඳුබොඩ බවුන් සෙත් මානසික සුව සෙවණ භාවනා මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු 2020 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භකර හෝ නොතිබුණි. | ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම විය යුතුවේ. | මෙත්සිත් අරණ ව්‍යාපෘතිය යටතේ කඳුබොඩ බවුන් සෙත් මධ්‍යස්ථානය සඳහා ප්‍රතිපාදන නොලැබුණු බැවින් මෙහි ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි විය. | 2022 පෙබරවාරි 28 දක්වාම ආරම්භ කර හෝ නොතිබුණි. |
| 4. | දෙපාර්තමේන්තුව සතු 2015 වර්ෂයේදී එකක් රු.5,160,000 බැගින් මිලදී ගත් අංක 103,104 දරන නිල නිවාස 2017 මැයි මස සිට භාවිතයට නොගැනීම නිසා දෙපාර්තමේන්තුව වෙත කිසිදු ආදායමක් ලැබී නොතිබුණු අතර අදාල නිවාස, පාරිසරික අවදානම් වලට ලක්වෙමින් පැවතුණි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් පාලනය විධිමත් විය යුතුවීම. | භාවිතයට සුදුසු තත්ත්වයේ පවතී. | 2022 පෙබරවාරි 28 දක්වාම භාවිතයට ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | 2019 හා 2020 වර්ෂ වල දී කතරගම විශ්‍රාම ශාලා දෙක සඳහා එකතුව රු.89,609,700 ක වියදම් දරා තිබුණු නමුත්, විශ්‍රාම ශාලා දෙකෙන් 2019 රු. 383,900 ක් හා 2020 වර්ෂයේ රු. 86,900 ක් ලෙස එකතුව රු. 470,806 ක් පමණක් ආදායම් ලෙස ලැබී තිබුණි. | දෙපාර්තමේන්තුවට අලාභයක් නොවන පරිදි සුහසාධන කටයුතු පවත්වා ගෙන යායුතු වීම. | කතරගම විශ්‍රාම ශාලා අළුත්වැඩියා කර ඇත. | 2021 වර්ෂයේදී රු.10,450 ක ආදායම් පමණක් ලැබී තිබුණි. |
| 6. | දෙපාර්තමේන්තුව විසින් මුතියංගනය, මහියංගනය හා මාතලේ අළුවිහාරය යන ස්ථානවල විශ්‍රාමශාලා 03 ක් සහ මාතලේ අළුවිහාරය පූජා භූමියේ රථගාලක් ඉදිකර තිබුණද, එම ඉදිකිරීම් සහිත ඉඩම්වල අයිතිය අත්පත් කරගෙන නොතිබුණි. තවද එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක්ද සිදුකර නොතිබුණි. | වත්කම් නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතු විම. | ඉදිකිරීම් වලට අදාල ඉඩම් දෙපාර්තමේන්තුව සතු නොවන අතර ඒවා අත්පත් කර ගැනිමට කටයුතු ආරම්භ කර ඇත. | අයිතිය නිරවුල් කර ගැනීම මේ දක්වා සිදුවී නොතිබුණි. |
| 7. | අවශ්‍යතා අනුව වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු වුවද ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂය සඳහා 2020 වර්ෂයේ දී රු. 650,000 ක් ව තිබූ වාර්ෂික අයවැයගත ප්‍රතිපාදනය ඉක්මවා රු. 2,515,200 ක් හෙවත් සියයට 287 ක ප්‍රතිපාදන මු.රෙ. 66 මාරු කිරීම් මගින් වෙන්කර ගෙන තිබුණි. | ඇස්තමේන්තු මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතුය. | ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්ම සංකල්පයට හා නව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලවන පරිදි ජාතික භෞතික සැලැස්ම යාවත්කාලීන කිරීමට සිදු වූ අතර, ඒ සඳහා ප්‍රමාණවත් හා සුදුසු වන පරිදි ශ්‍රවණාගාරය නවීකරණය කර ගැනීම වෙනුවෙන් මෙසේ ප්‍රතිපාදන මාරු කරන ලදී. | වරින් වර සැළසුම් සංශෝධනය කරන බැවින් ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබේ. |

| | | | | |
|---|---|---|---|---|
| 8. | දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ වලින් ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් 2020 වර්ෂයේදී ලද ප්‍රතිපාදන වලින් රු.2,135,588 ක් ඉතිරිව තිබුණි. ඉන් කතරගම පූජාභූමි සංවර්ධනය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයෙන් ලද රු. 2,431,056 න් රු. 2,050,294 ක් ඉතිරිව තිබුණු අතර එම ඉතිරිවීම් සියයට 85 ක් බව නිරීක්ෂණය විය. | භාර ගත් ව්‍යාපෘති අදාල කාලය තුල සම්පූර්ණ කළ යුතුය. | කතරගම පහසුකම් ගොඩනැගිලි සඳහා භූ දර්ශන කටයුතු කිරීමට කතරගම දේවාලයෙන් යෝජනා කර තිබූ බැවින්, ඒ සඳහා අමතර මුදල් ප්‍රතිපාදන ඉල්ලුම් කළද රටේ පැවති කොරෝනා වසංගත තත්වය සහ ව්‍යාපෘතිය නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ හෙයින් එම භූ දර්ශන කටයුතු කිරීම අත්හිටුවන ලදී. | මේ දක්වා එම ව්‍යාපෘති අවසන් කර නොමැත. |
| 9. | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 283 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 163 ක්ද පුරප්පාඩු 120 ක් ද විය. එයින් විධායක ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 51 ක් වූ අතර එයින් තනතුරු 39 ක් පුරප්පාඩුව පැවතුණි. මෙය සියයට 77 ක ප්‍රතිශතයක් විය. තවද තෘතීයික තනතුරු සංඛ්‍යාවෙන් සියයට 38 ක්ද ද්විතීයික හා ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු වලින් සියයට 48 ක් හා සියයට 22 ක් ලෙස පුරප්පාඩුව පැවතුණි. මේ අනුව අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩුව පවතින මුළු තනතුරු සංඛ්‍යාව සියයට 42 ක් විය. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීමට නොහැකිවීමේ අවධානමක් පවතින බවද නිරීක්ෂණය විය | පුරප්පාඩු නිසි ලෙස පිරවීමට කටයුතු කළ යුතුය. | බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට සිදුවීම, වත්මන් කොවිඩ් වසංගත තත්ත්වය තුල විවෘත තරඟ විභාග පැවැත්වීමට නොහැකිවීම, කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2020 අනුව බඳවා ගැනීම් අත්හිටුවා තිබීම, තනතුරු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත හා පළාත් සභා හා රාජ්‍ය සේවා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | 2022/02/15 දින වන විටත් පුරප්පාඩු 122ක් පැවති අතර එයට අධ්‍යක්ෂ තනතුරු 07 ක්ද නගර නිර්මාණ නියෝජ්‍ය සහකාර අධ්‍යක්ෂ තනතුරු 30 ක්ද ඇතුළත්ව තිබුණි. |

ශීර්ෂ 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය<br>------------------------ | විගණකාධිපතිගේ නිර්දේශය<br>---------------------- | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>---------------------------- | ඒ සම්බන්ධයෙන් වූ වර්ථමාන තත්ත්වය<br>--------------- |
|---|---|---|---|---|
| | **2018 වර්ෂය** | | | |
| 1. | (අ) දෙපාර්තමේන්තුව සඳහා මූලස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් පූජනීය ස්ථානයකට අයත් අක්කරයක ඉඩමක් වර්ෂ 30 කට බදු පදනමක් යටතේ ලබා ගෙන තිබුණු අතර බදු කාලය ඉක්ම ගිය පසු අදාල ගොඩනැගිලි ඇතුළු දේපල පූජනීය ස්ථානයට හිමි වන පරිදි ගිවිසුම්ගතව තිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීමට පෙර ඉඩමේ හිමිකාරීත්වය පවරා ගැනීම සම්බන්ධ යෙන් කටයුතු කල යුතු වීම. | ආයතනය පිහිටා ඇති ප්‍රදේශයේ ගොඩනැඟිලි බදු, කුලී ගාස්තු හා සලකා බැලීමේදී දෙපාර්තමේන්තුව මෙම කාරණය වෙනුවෙන් දරා ඇති පිරිවැය සාපේක්ෂව අඩුවීම, රජයට වාසිදායක බව හා වසර 30 පසු වත්කමේ ශුද්ධ අගය සැලකිල්ලට ගෙන මෙසේ ගිවිසුම්ගතව තිබුණි. | ඉඩමේ හිමිකාරිත්වය සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| | (ආ) මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම් 2015 සැප්තැම්බර් 15 දින ආරම්භ කර තිබුණු නමුත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණේ 2017 ජූලි 12 වන දින දීය. මේ සම්බන්ධයෙන් 2016 නොවැම්බර් 16 දින ඉඩම හිමි පාර්ශවය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අතර ලිඛිත ගිවිසුමකට එළඹ තිබුණි. තවද ගොඩනැගිල්ලේ මූලික සැලැස්ම සඳහා 2018 දෙසැම්බර් 31 දින වන | පූර්ව අනුමැතින් නියමිත පරිදි ලබා ගැනීමට ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. | වත්මන් මූලස්ථාන ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක සැලසුම්පත් (Structural Drawings) වරලත් ඉංජිනේරු අනුමැතීන් ද සහිතව අවශ්‍ය ආනුෂාංගික ලේඛන අදාල අධිකාරීන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | අදාල අනුමැතීන් මෙතෙක් ලබා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | විටත් නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | | | |
| 2. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය 2018 දෙසැම්බර් 31 දිනට 36,399 ක් විය. නව බඳවා ගැනීම් නොකෙරෙන බැවින් වර්තමානයේ සිටින සියලු දෙනා විශ්‍රාම යාමෙන් පසු 2058 වර්ෂයේදී දෙපාර්තමේන්තුව අහෝසිවී යාමට නියමිතය. බදු පදනමට ලබා ගත් ඉඩම තුළ ඉදිකරන ගොඩනැගිලි හා දේපල වර්ෂ 30 කට පසු බදුකරු වෙත නැවත හිමි වන බැවින් ඉදිරි අනාගතය තුළදී දෙපාර්තමේන්වේ කාර්යභාරයේ අවශ්‍යතාවය තව දුරටත් පැන නැගුණ හොත් එවැනි අවස්ථාවකදී මෙවැනි ගොඩනැගිලිවල අවශ්‍යතාවය සපුරා ගැනීමට යාම පිළිබඳව අවදානමක් නිරීක්ෂණය විය. | ආයතනයේ ඉදිරි පැවැත්ම පිළිබඳව සලකා බලා ක්‍රියා කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව දැනට පවත්නා ගිවිසුම ඉදිරි කාලයට අදාලව තවදුරටත් දීර්ඝ කිරීමට හෝ 1950 අංක 09 දරණ ඉඩම් අත්පත්කර ගැනීමේ පනත/ 1944 අංක 24 දරණ විහාරස්ථාන ඉඩම් සඳහා වන්දි ගෙවීමේ පනත අනුව කටයුතු කිරීමට නීති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. | නීති උපදෙස් ලබා ගැනීමට කටයුතු කළද, ආයතනයේ ඉදිරි පැවැත්ම පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| **2020 වර්ෂය** | | | | |
| 3. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයිති බිම් කැබලි 51 ක, ගොඩනැගිලි 113 ක සහ අක්කර 1,360 ක ස්ථිර භෝගයන්ට අදාල ගස් 48,470 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වත්කම් ලේඛනගත කර ගිණුම්ගත කළයුතු වීම සහ වටිනාකම් විගණනයට අනාවරණය කළයුතු වීම. | දෙපාර්තමේන්තුවට අයිති බිම් කැබලි 51 හා ගොඩනැගිලි 113 තක්සේරුකර, ගිණුම් ගත කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මේ වන විට ස්ථිර බෝග වගාවන් අංකනය කොට ව්‍යාපෘති වශයෙන් වාර්ථාවන් සකසා ඇත. ස්ථිර බෝග වගාවන් | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කර නොමැති අතර, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල හෝ මෙම වත්කම් නිරූපනය කරන බවට වාර්ථා කර |

| | | | | |
|---|---|---|---|---|
| | | | තක්සේරු කර, ගිණුම් ගත කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | නොතිබුණි. |
| 4. | දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ විවිධ ප්‍රදේශවල පරිහරණය කරනු ලබන වර්ග අඩි 91,349 ක සහ වර්ග මීටර් 2,380 ක ගොඩනැගිලි 85 ක් හා වගා කටයුතු, තාවකාලික ඉදිකිරීම් සහ වෙනත් අවශ්‍යතා සඳහා පරිහරණය කරන හෙක්ටයාර් 214 කට අදාල බිම් කැබලි 66 ක අයිතිය පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොකෙරුණි. | අදාල බිම් කැබලි සහ ගොඩනැගිලි වල අයිතිය තහවුරු කෙරෙන ලේඛන විගණනයට ඉදිරිපත් කළයුතු වීම. | දෙපාර්තමේන්තුවේ බලකා, පුහුණු පාසල්, උප/අනු බලකා, ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන ඉඩම් කට්ටි 363 ක තොරතුරු මේ වන විට හඳුනාගෙන මූලස්ථාන ලෙජරගත කර ඇති අතර, ඉන් ඉඩම්කට්ටි 87ක් විධිමත් ලෙස දෙපාර්තමේන්තුවට පවරා ගෙන, ඉතිරි බිම්කට්ටි විධිමත් ලෙස පවරා ගැනීමට අදාල රාජකාරීන් මේ වන විට සිදුකරමින් පවතී. | අදාල බිම් කැබලි සහ ගොඩනැගිලි වල අයිතිය තහවුරු කෙරෙන ලේඛන මෙතෙක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| 5. | මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස අනාවරණය කර ඇති රු. මිලියන 37 ක් වටිනා වත්කම් සනාථ කිරීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | ශේෂ අතර වෙනස්කම් හඳුනා ගැනීමටත්, ගිණුම්ගතකර ඇති වත්කම් වලට අදාල වටිනාකම් විගණනයට ලබා දීමටත් කටයුතු කළ යුතු විම. | මෙම නිරීක්ෂණය නිරවුල් කිරිම සඳහා වත්කම් කළමනාකරණ ඒකකය පිහිටුවා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය (CIGAS) භෞතිකව සත්‍යාපනය කිරිමට සැලසුම් සකස් කර ඇත. | ශේෂ අතර වෙනස්කම් හඳුනා ගැනීමටත්, ගිණුම්ගතකර ඇති වත්කම් වලට අදාල වටිනාකම් විගණනයට ලබා දීමටත් මේ දක්වා ක්‍රියාකර නොතිබුණි. |
| 6. | සේවය හැරගොස් ඇති නිලධාරින් 76 දෙනෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 10.5 ක අපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණු අතර, මෙම ණය ශේෂ වර්ෂ තුන ඉක්මවා තිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.3 වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව මෙම ණය ශේෂ කඩිනමින් අයකර ගතයුතු වීම. | 2022 පෙබරවාරි 11 වන විට රුපියල් මිලියන 10.5ක මුදලින් රු.3,572,954.52 ක් නිරවුල් කර ඇති අතර, ඉතිරි මුදල නිරවුල් කිරීමටද වැඩපිළිවෙලක් යොදා ඇත. | තව දුරටත් අයකර ගත යුතු ණය ශේෂයන් රු.මිලියන 6.9 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| 7. | බැංකු ගිණුමක මාස දෙකේ සිට මාස දොළහක කාල පරිච්ඡේදයක සිට පවතින හඳුනා නොගත් තැන්පත් කිරීම්වල සහ හඳුනා නොගත් ගෙවීම්වල වටිනාකම පිළිවෙලින් රු.මිලියන 15.79 ක් හා රු.145,979 ක් වූ අතර, මෙම ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම. | 2020 වර්ෂයේ රුපියල් මිලියන 15.79ක් හඳුනානොගත් ලැබීම් වලින් 2021 දෙසැම්බර් 31 වන දිනට අදාලව රු.5,044,947.17ක මුදලක් පවතී. එයද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. හඳුනා නොගත් ගෙවීම් රු.145,979 ක මුදල මේ වන විට නිරවුල් කර ඇත. | තව දුරටත් රු.මිලියන 5.04 ක හඳුනා නොගත් තැන්පත් කිරීම් පැවතුණි. |
| | | | | |
| 8. | මුදල් රෙගුලාසි 770(4) හා 770 (අ) (ආ)ප්‍රකාරව ධාවනයෙන් ඉවත් කර ඇති වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වුවද, 2020 වර්ෂයට පෙර ධාවනයෙන් ඉවත් කර ඇති වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ධාවනයට ආයෝග්‍යා බවට තීරණය කර ඇති වාහන සම්බන්ධයෙන් යථෝක්ත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම | විගණනය පෙන්වා දී ඇති පරිදි මු.රෙ. 770(4) හා 770 (අ) (ආ) ප්‍රකාරව 2020 වර්ෂයට පෙර ඉවත් කල වාහන 26 සම්බන්ධව තක්සේරු කමිටුවක් මගින් වාර්තා කැඳවා ඇත. (2020 පෙබරවාරි) ඒ අනුව ඉදිරියේ දී වාහන අපහරණයට කටයුතු කරමි. | මෙතෙක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | | | |
| 9. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වාහන 554 කට අදාලව සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | යථෝක්ත චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කර ඉන්ධන පරික්ෂාවන් සිදු කර ඒ මත ධාවන සටහන් තුළනය කිරීමට කටයුතු කළයුතු විම. | ඉන්ධන පරික්ෂාවක් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති අතර, එම කටයුත්ත 2022 මාර්තු 31 පෙර අවසන් කර වාර්තාවක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | යථෝක්ත චක්‍රලේඛ විධිවිධාන පරිදි මෙතෙක් ඒ සම්බන්ධව කටයුතු කර නොමැත. |
| 10. | දෙපාර්තමේන්තුව විසින් මන්නාරම කොණ්ඩච්චි ප්‍රදේශයේ අක්කර 1,200 ක පමණ (කජු ගස් 45,000 කට ආසන්න) කජු වගා ව්‍යාපෘතියක් | වගාව, අස්වනු නෙලීම හා ගබඩා කිරීම නිසි ලෙස කළමනාකරණය කරමින් වියදම් අවම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා | කජු වගාවට යොදවන හට පිරිස් විසින් වගාව නඩත්තුව, භූමියේ හා වගාවේ ආරක්ෂක කටයුතු සිදුකරනු ලබයි. මේවන විට කජු සංස්ථාව | වන අලි තර්ජනයෙන් ආරක්ෂා වීමට යෙදවූ හටයන් 186 |

| | | | | |
|---|---|---|---|---|
| | දීර්ඝ කාලයක සිට පවත්වාගෙන යනු ලබන අතර, පසුගිය වර්ෂ 4 ක ආදායම හා වියදම සැසඳීමේදී රු.මිලියන 12.6 ක ආදායම ඉක්මවූ වියදමක් පැවතුණි. තවද මේ සඳහා යොදවා ඇති සිවිල් ආරක්ෂක භටයින් 262 දෙනෙකුගේ වැටුප් වියදම සැලකිල්ලට ගත් විට ව්‍යාපෘතියේ අලාභය තව දුරටත් ඉහළ යන බව නිරීක්ෂණය විය. වන අලි තර්ජනය නිසා ආරක්ෂාවට පමණක් භටයින් 186 දෙනෙකු යොදවා තිබුණු අතර, කජු ගස් අංක කර ලේඛන ගතකර නොතිබුණි. තවද, කජු ඵලදාව නෙලීම හා ලේඛනගත කිරීම විධිමත් අධීක්ෂණයකින් තොරව සිදු කරන අතර, කජු අස්වැන්න ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් ද සපයා නොතිබුණි. | ගැනිමට කටයුතු කළයුතු වීම. | මගින් අලි වැටක් ඉදිකිරීමට කටයුතු කරමින් පවතී. 2022 පෙබරවාරි11 වන විට කජු ගස් අංකනය කිරිම ගස් 14,000ක් ඉක්මවා සිදුකරගෙන ගොස් ඇත. ඉතිරි කජු ගස්ද අංකනය කරමින් පවතී. කජු නෙලීම අධීක්‍ෂණ මණ්ඩලයක් යටතේ විධිමත් අයුරින් පවත්වාගෙන යනු ලබන අතර, අස්වැන්න ගබඩාකිරීම පහසුකම් සලසා ඇත. | දෙනෙකුගේ සේවය තවදුරටත් ලබා ගන්නා අතර, කජු ගස් 31,000 පමණ මේ වන විටත් අංක කර නොමැත. කෙසේ වෙතත් තාවකාලික ගබඩාවක් ඉදි කර තිබුණි. එම කටයුතු අවසන් කර නොමැත. |
| 11. | ආරක්ෂක අමාත්‍යාංශයට, ජනාධිපති කාර්යාලයට, අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සහ තවත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයකට අයිති වාහන 33 ක් හා යතුරුපැදි 19 ක් දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින අතර, මෙම වාහන වල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහනවවල නිත්‍යානුකූල අයිතිය කඩිනමින් පවරාගත යුතු වීම. | 2022 පෙබරවාරි 11 වන විට වාහන 10 ක ලියාපදිංචිය අවසන් කර ඇති අතර, ඉතිරි වාහන පවරා ගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛණ ඉදිරිපත් කර ඇත. | මේ වන විටත් වාහන 23 ක හා යතුරුපැදි 19 ක නිත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි. |
| 12. | පාපැදියකට, ඇම්ප්ලිෆයර් | වත්කම්වලට සිදු වූ | විගණනය පෙන්වා දී ඇති | මේ දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | කට්ටලයකට හා ත්‍රිකුණාමලය බලකා මූලස්ථානයේ ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල ගිනි ගැනීම හේතුවෙන් සිදු වූ රු.342,320 ක අලාභහානි සහ වාහන 26 කට රිය අනතුරු වලින් සිදු වූ අලාභහානි මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි. මෙයින් වාහන 10 කට සිදු වූ අලාභය රු.141,359 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණු අතර, ඉතිරි වාහන 16 සම්බන්ධයෙන් අලාභ ගණනය කර නොතිබුණි. | අලාභහානි මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කළයුතු වීම. | අලාභහානි 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. | කටයුතු අවසන් කර නැත. |
| 13. | මහඔය බලකායේ ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘතියේ ගඩොල් 782,326 ක ඌනතාවයක් නිසා සිදුවී තිබුණු අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් පියවා ගැනීමට විමර්ශන මණ්ඩලය විසින් 2018 ජූලි 03 වන දින නිර්දේශ කර තිබුණු නමුත් අලාභය අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | අලාභහානි අය කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතු වීම. | විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි මෙහි පරීක්‍ෂණ කටයුතු නැවත ආරම්භ කරන ලදී. 2022 මාර්තු 15 දිනට පෙර පරීක්ෂණ අවසන්කර අලාභය සම්බන්ධ පියවර ගැනීමට උපදෙස් ලබා දී ඇත. | මෙතෙක් අදාල අලාභ හානි අයකරගෙන නොතිබුණි. |
| 14. | සේවා වනිතා සංගමය විසින් දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ දරුවන්ට අභ්‍යාස පොත් නිෂ්පාදනය කර බෙදා හැරීම සඳහා කන්තලේ බලකායේ භටයින් 239 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 12 දින සිට දෙසැම්බර් 28 දින දක්වා යොදවා ගෙන තිබුණු අතර, මෙම කාල පරිච්ඡේදය තුළ අදාල භටයින් සඳහා රු.මිලියන 45.1 ක වැටුප් පිරිවැයක් දරා තිබුණුද, එම මුදල | අදාල වැටුප් පිරිවැය දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කර ගැනිමට කටයුතු කළයුතු වීම. | සේවා වනිතා සුභසාධක කටයුත්තකට සාමාන්‍ය රාජකාරි වලට බාධාවක් නොවන ලෙස භට/ භටවරියන්ගේ ශ්‍රමය ලබා ගෙන ඇති බැවින් මෙම වැටුප් පිරිවැය දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපූර්ණ කිරිම සිදු කල නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි. 2021 වර්ෂයේදී රාජ්‍ය මුද්‍රණ විවිධ නීතිගත සංස්ථාවෙන් අභ්‍යාස පොත් මිලදී ගැනීමට කටයුතු කර | ආදල වැටුප් පිරිවැය මෙතෙක් දෙපාර්තමේන්තු වට ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි. | | ඇත. ඒ අනුව ඉදිරියේදී සිවිල් ආරක්ෂක සාමාජිකයන්ගේ ශ්‍රමය ලබා ගෙන පොත් නිෂ්පාදනයක් සිදු නොවන බව දන්වා සිටිමි. | |
| 15. | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් හා තෘතියක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 54 ක් ඇතුළු සමස්ථ පුරප්පාඩු 4,786 ක් පැවතුණි. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු විම. | සිවිල් ආරක්ෂක සාමාජිකයන් සම්බන්ධව මේ වන විට නව බඳවාගැනීම් සිදු නොවේ. ජොෂ්ඨ මට්ටමේ එක් පුරප්පාඩුවක් සම්පූර්ණ කර ඇත. තෘතිය හා ද්විතීය මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරිමට අදාල ආයතන වෙතින් ඉල්ලීම් සිදු කර ඇත. එම පුරප්පාඩු සම්පූර්ණ වන තෙක් අත්‍යවශ්‍ය රාජකාරි ආවරණයට ත්‍රිවිධ හමුදාවේ නිලධාරින් අනුයුක්ත කර ඇත. | මේ වන විට බඳවා ගෙන ඇති ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩුව හැරුණු කොට තව දුරටත් ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු දෙකක් හා තෘතික හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 54 ක් සම්පූර්ණ කර ගත යුතුව ඇත. අනෙකුත් බඳවා ගැනීම් කටයුතු රජයෙන් නවතා දමා ඇත. |

ශීර්ෂ 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------- | --------------------------- | --------------------------- | ------------------ |
| | **2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ඇතුලත් ඡේද** | | | |
| | -------------------------------- | | | |
| 1 | ඉකුත් වර්ෂයේ මැයි මස ගම්පහ උද්භිද උද්‍යානයේ සෝලා විදුලි පද්ධතිය රු.2,475,200 ක පිරිවැයක් දරා ස්ථාපිත කර තිබූ අතර එමගින් මාසිකව කිලෝවොට් 2400 ක විදුලි බලයක් නිපදවන බව අදාළ ආයතන විසින් දන්වා තිබුණි. එහෙත් එමගින් මාසිකව කිලෝවොට් 677 ක් එනම් අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 28 ක් පමණක් සපයා තිබුණි. | ප්‍රමාණවත් පරිදි විදුලිය උත්පාදනය නොවීමට හේතු මොනවාද යන්න සොයා බලා ඊට අදාළ පිළිසකර කර ගැනීම් කළ යුතුවීම. | ස්ථානිය පරීක්ෂාව මගින් සිදු කරන ලද ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ව වාර්තාව ලැබුන විගස මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන බව. | නිර්දේශ තවමත් ඉටු කර නැත |
| 2. | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ වනය පිහිටි කොටසේ චේන් ලින්ක් වැටක් ඉදිකිරීම සඳහා අවම ලංසු ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුගෙන් කිසිදු කරුණු විමසීමකින් තොරව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැරව තාක්ෂණික ඇගැයීම් කමිටු නිර්දේශයන්ද නොසලකා රු.4,053,000 ක ලංසුවක් ඉදිරිපත් කළ 6 වෙනි ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එමගින් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතු වීම. | ආයතන 3 ක විස්තරාත්මක ලංසු ඇගයීමක් කර 6 වන ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර ඇත. | නිරීක්ෂණය එලෙසම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.1,158,400 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණු අතර 7.9.11(ඇ) මාර්ගෝපදේශය අනුව ඉහළ කාර්යසාධන සුරක්ෂණයක් වෙනුවට කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 5 ක එනම් රු.202,650 ක සුරක්ෂණයක් ලබාගෙන තිබුණි. | | | |
| 3. | 2006 මාර්තු 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2006 නොවැම්බර් 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් කාර්යයන් අනුව නව උද්භිද උද්‍යාන ශ්‍රී ලංකාවේ සුදුසු ප්‍රදේශයක පිහිටුවිය හැකි වුවද, උතුරු, උතුරු මැද හා නැඟෙනහිර පළාත් ආවරණය වන පරිදි ජාතික උද්භිද උද්‍යානයක් පිහිටුවීමට කළමනාකරණයේ අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. | නව උද්භිද උද්‍යාන ශ්‍රී ලංකාවේ සුදුසු ප්‍රදේශයන්හි ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. | අදාල කරුණු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත ලිපි යොමු කර ඇත. | නිර්දේශ පරිදි ඉදි කර නැත |
| | | | | |
| 4. | (අ) මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ 2016 අගෝස්තු 04 දින රු.6,677,573 ක කොන්ත්‍රාත් වටිනාකමට ආපනශාලාවක් ඉදිකිරීම සඳහා ගිවිසගෙන තිබූ ව්‍යාපෘතිය 2016 දෙසැම්බර් 21 දින නිමකර උද්‍යානයට බාරදී තිබුණි. නමුත් එදින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වසර 04 කට ආසන්න | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | තොරතුරු මධ්‍යස්ථානයක් හා සංචාරකයින්ට විවේක ගතහැකි ස්ථානයක් ලෙස පවත්වාගෙන යාමට කටයුතුකර ඇත. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාලයක් ගතවී තිබුණද, එම ඉදිකරන ලද ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදවා ගෙන නොතිබුණි. | | | |
| | (ආ)මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ රු.26,567,937 ක කොන්ත්‍රාත් වටිනාකමකට පර්යේෂණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ගිවිසගෙන තිබූ අතර, මෙම පර්යේෂණ මධ්‍යස්ථානය 2019 නොවැම්බර් 26 දින නිමකර භාර දී තිබුණි. නමුත් 2020 දෙසැම්බර් 31 දින වන තෙක් එම ඉදිකිරීම් අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට අදාළ වත්කම් භාවිතා කළ යුතු වීම | විදුලිය බලා ගැනීම සඳහා ගෙවීම් කර ඇති අතර 2022 වර්ෂයේ ඉදිරි කටයුතු කරනු ලැබේ. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට අදාළව වත්කම් තවමත් භාවිතා කර නැත |
| 5. | (අ) සීතාවක තෙත් කලාපිය උද්භිද උද්‍යානයේ කාර්යාල ගොඩනැගිල්ල රු. 30,357,738 (වැට් රහිත) කොන්ත්‍රාත් වටිනාකමකට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 2020 අගෝස්තු 20 දින අවසන් කර භාර දී තිබුණද 2021 පෙබරවාරි 03 වන දින වන විටත් අදාළ ගොඩනැගිල්ලට විදුලි සම්බන්ධතාවය | දෙපාර්තමේන්තුව සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ වන විට විදුලිය ලබා ගැනීම සඳහා මුදල් ගෙවා ඇත. | නිර්දේශ පරිදි භාවිතා නොකරයි |

| | | | | |
|---|---|---|---|---|
| | ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් භාවිතයට නොගෙන පැවතුණි. | | | |
| | (ආ) සීතාවක තෙත් කලාපිය උද්භිද උද්‍යානයට අයත් ඉඩමෙහි අක්කර ½ ක පමණ කුඹුරු ඉඩම අනවසර පදිංචිකරුවෙකු විසින් භුක්ති විදින අතර, මේ පිළිබඳව සීතාවක ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර තිබුණද ඒ සඳහා 2021 පෙබරවාරි 03 දින වන විටත් විසඳුමක් ලැබී නොතිබුණි. | දෙපාර්තමේන්තුව භුක්ති විදින සියලුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2021 අගෝස්තු මස නැවත ප්‍රදේශීය ලේකම් දැනුවත් කරන ලදි. | නිර්දේශ තවමත් ඉටු කර නැත |

ශීර්ෂ 325 - ශ්‍රීලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන්වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | දෙපාර්තමේන්තුව විසින් විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට අයත් එකතුව හෙක්ටයාර් 2.1374 ක් වූ ඉඩම් විධිමත් පවරා ගැනීමකින් තොරව පරිහරණය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එකතුව රු.52,327,020 ක්වූ වියදමක් දරා එම ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.<br>2018 | -එම- | ඉඩම්වල අයිතිය නිසි පරිදි පවරාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | පවරා ගැනීමේ කටයුතු මෙතෙක් අවසන් කර නැත. |
| 2. | දෙපාර්තමේන්තුවේ රෝහණ ආයතනය තුළ උසස් පුහුණු හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 30.09 ක මුදලක් වැය කර පසුව 2017 ජූලි 22 වන දින සිට ව්‍යාපෘතියේ | නිසි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවීම. | මේ වන විට ඉදිකිරීම් සිදුකරමින් පවතී. | මේ දක්වා ඉදිකිරීම් කටයුතු අවසන් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වැඩ කටයුතු අතහැර දමා තිබුණි. 2019 | | | |
| 3. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදනය ආරම්භක අවස්ථාවේ සිට අවසාන අවස්ථාව දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවන් සම්බන්ධයෙන් ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදාල කටයුතු ඉටු කල යුතුවේ. | එය පිළියෙල කිරීම අතපසු වී ඇත. | ලේඛණයක් පිළියෙල කර නොතිබුණි. |
| 4. | ජාතික වශයෙන් වැදගත් කාලීන අවශ්‍යතාවයන් වූ උසස් පුහුණු පරිපාලන හා නේවාසික ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 102.36 ක් හා රු.මිලියන 55.40 ක් ලෙස පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර 2016 වර්ෂයේදී කර මූලික කටයුතු සඳහා රු.මිලියන 14 ක් වියදම් කර තිබුණි. විෂයගත ඉදිකිරීම් ව්‍යාපෘති ද්විත්වය මේ වන විට අතරමග අත්හිටවනු ලැබ තිබුණි. | විෂයගත ඉදිකිරීම් කඩිනමින් ආරම්භ කර අවසාන කළ යුතුවීම. | ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කටයුතු කර ඇත. | මෙතෙක් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැත. |
| 5. | සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා ලද වටිනාකම රු.722,523,850 ක් වූ තහනම් මත්ද්‍රව්‍ය ශ්‍රී ලංකා පොලීසිය වෙත භාරදී තිබුණ ද එම භාරදීම් සම්බන්ධයෙන් පසු විපරම් කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | අත්අඩංගුවට ගන්නා ලද තහනම් මත්ද්‍රව්‍ය වෙනුවෙන් පසු විපරම් කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුවීම. | අත්අඩංගුවට ගන්නා ලද තහනම් මත්ද්‍රව්‍ය පිළිබඳ පසු විපරම් වාර්තා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා ඇත. | එම වාර්තා මේ දක්වා ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 6. | පුරප්පාඩු සංඛ්‍යාව වැඩිවීම ස්වාධීන ආයතනයක් ලෙස දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් ඉදිරියේදී කාර්යක්ෂමව ඉටු කිරීමට බාධා වී තිබුණි. 2020 | කාර්යභාරයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා පවතින පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතුවීම. | ආරක්ෂක අමාත්‍යාංශය මගින් නාවික හමුදා මූලස්ථානය දැනුවත් කර ඇත. | මේ දක්වාම පුරප්පාඩු සම්පූර්ණ කර නොමැත. |

ශීර්ෂ 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

| **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| **2018** | | | |
| 1. ආඥාලාභීන් විශෝධන ක්‍රියාවලියෙන් අනතුරුව නැවත ඇතුලත්වනුයේ තමා ජීවත්වූ සුපුරුදු පරිසරය තුළට වීම හේතුවෙන් ආඥාලාභීයා නැවත වරදට පෙළඹීම වලක්වා ගැනීම සඳහා ආඥාලාභීන් සඳහා ආගමික උපදේශන හා සමගාමීව පුද්ගලික උපදේශන ඔවුන්ගේ අවදානම් මට්ටම අනුව ලබා දිය යුතු වුවත් ඒ සඳහා ප්‍රජා විශෝධන කාර්යාල තුළ අවශ්‍ය පරිසරය හා ඉඩකඩ නොපැවතුණි. | අධිකරණ කලාප කිහිපයක් හෝ ආවරනය වන පරිදි මධ්‍යස්ථානයක් ඉදිකර ගැනීමට ඉහළ කළමනාකරණය පියවර ගැනීම උචිතය. | වර්තමානයේ අධිකරණ මගින් ලබාදී තිබෙන ඉඩකඩක ප්‍රාදේශිය ප්‍රජා විශෝධන කාර්යාල බොහොමයක් පිහිටුවා ඇත. මෙම කාර්යාලවල පවතින ඉඩකඩ ද ප්‍රමාණවත් නොවන බැවින් පොදු ස්ථාන යොදා ගැනීමට උපදෙස් ලැබී ඇත. | වර්තමානයේදී ද මෙම කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ඉඩකඩ හා කාර්යාල පහසුකම් ලැබී නොමැත. |
| 2. ප්‍රජා විශෝධන ආඥාලාභීන් බොහොමයක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වූ අතර එම ආඥාලාභීන් විශෝධනය කිරීමට අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම් සිදු කලද අදාල ප්‍රතිකාර මධ්‍යස්ථානවල ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් නොමැති වීම මත ආඥාලාභීන්ට | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම කළමණාකරණයේ වගකීමක් වන හෙයින් විශෝධන කාර්යය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවම වශයෙන් | ඊට අදාළව ක්‍රියාමාර්ග ගෙන නොමැත. | වර්තමානයේදී ද මෙම ගැටළුව එසේම පවති. |

| | | | |
|---|---|---|---|
| ප්‍රතිකාර ලබා ගැනීමට කාලයක් රැඳීසිටීමට සිදුව තිබුණි. මේ හේතුවෙන් විශෝධන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ ගැටළු මතු වී තිබූ අතර ආඝාලාභීන් නැවත මත්ද්‍රව්‍ය සඳහා යොමුවීම තුළින් ආඝා කඩවීම් සිදු වී තිබුණු අවස්ථා පැවතියද ඒ සඳහා පිළියම් යොදා නොතිබුණි. | දිස්ත්‍රික් මට්ටමින් හෝ එක් විශෝධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ හැකියාව සොයා බැලීම. | | |
| 3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණනවරයෙකු පත්කර නොතිබුණු අතර විගණන සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කටයුතු සැලසුම් කිරීම. | අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කරගෙන ඇත. | මේ දක්වාම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගෙන නොමැත. |

ශීර්ෂය 327 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | **2018, 2019 හා 2020** | | | |
| 1. | එක් වැය විෂයයක් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.2,650,000 කින් 2020 නොවැම්බර් 30 දිනට ඉතිරිය රු.418,720 ක් වී තිබුණි. එසේ තිබියදී හදිසි අවශ්‍යතා මත යයි කරුණු දක්වමින් වෙනත් වැය විෂයයකින් රු.1,500,000 ක් මාරු කර ගෙන තිබුණු නමුත්, ඉන් රු.336,663 ක් පමණක් වැය කර රු. 1,582,057 ක් ඉතිරි කර තිබුණි. | වෙනත් වැය විෂයයන්වලින් මාරු කර ගනු ලබන ප්‍රතිපාදන අදාළ අරමුණු ඉටු කර ගැනීම සඳහා සම්පූර්ණයෙන් යෙදවිය යුතුය. | වසංගත වැනි තත්ත්වයන්වලදී මෙවැනි ප්‍රතිපාදන මාරු කරගැනීම් සිදු කිරීමේදී නිලධාරීන්හට සැලකිලිමත්වන ලෙස දැන්වීම. | අයහපත් මූල්‍ය පාලන තත්ත්වයකි. |

| | | | | |
|---|---|---|---|---|
| 2. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වුවත් 2020 වර්ෂය අවසානය දක්වාද එය සංශෝධනය කර අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ මූලික ඉලක්කයන් ලඟා කරගැනීමට කටයුතු කළ යුතුය. | මේ වන විට ප්‍රතිපත්තිය සම්මත කර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කිරීමට නිලධාරීන් යොදවා ඇත. | අදාල කටයුතු මේ දක්වා අවසන් කර නොමැත. |
| 3. | ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත හා තිරසාර ලෙස පරිහරණය කිරීම දෙපාර්මේන්තුවේ දැක්ම වන අතර, පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර හා ප්‍රශස්ත ලෙස භූමි පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහාය වීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මෙහෙවර වේ. එම දැක්ම සහ මෙහෙවර ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ජාතික ඉඩම් පරිහරණ පනත සම්මත කර ගැනීමට දෙපාර්තමේන්තුව මේ වන තෙක් අපොහොසත් වී තිබුණි. | දැක්ම සහ මෙහෙවර ඉටුකර ගැනීම සඳහා ජාතික ඉඩම් පරිහරණ පනත සම්මත කර ගැනීමට කටයුතු කළ යුතුය. | දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි නීතිමය තත්ත්වයක් උද්ගත වී ඇත. | මේ දක්වා ඉඩම් පරිහරණ පනත සම්මත කර ගෙන නොමැත. |

328- මිනිස් බල හා රැකි රක්ෂා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 1. | 2018 ජනවාරි මස වන විට මානව සම්පත් හා සේවා නියුක්ත ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍යාංශ සම්බන්ධිකරණ වැඩපිළිවෙල අවසන් වී තිබුණි. එහෙත් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ඉදිරි ක්‍රියාමාර්ග පැහැදිලි කරවා ගැනීමට අවශ්‍ය බව දන්වමින් විවිධ අමාත්‍යාංශ වෙතින් ලිපි ඉදිරිපත්ව තිබුණද ඔවුන්ට එම පැහැදිලි කිරීම් සිදුකල බවට සනාථ නොවුනි. එම නිසා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට හඳුනාගත් අමාත්‍යාංශවලට ඒ පිළිබඳ පැහැදිලි දැනුවත්වීමක් නොමැති බව නිරීක්ෂණය විය. | ජාතික වශයෙන් වැදගත්වන මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මත කිරීමේ වගකීම රජය වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති නිසා එය ක්‍රියාවට නැංවීමට අදාල නිසි ක්‍රමවේදවලට අනුව කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශවල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් වෙත පැවරීම හා නිලධාරීන් වෙනස් වන විට අනුප්‍රාප්තිකයින් වෙත එම කාර්යය පවරා අප දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වේ. සම්බන්ධිත අමාත්‍යාංශ මඟින් එය සිදු නොවීමෙන් මෙම තත්ත්වය උදා වී ඇත. එම තොරතුරු යාවත්කාලීන කිරීම අදාල අමාත්‍යාංශ හා ආයතන මට්ටමින් සිදු කළ යුතු අතර ඒ පිළිබඳව කාර්යාල පටිපාටි අනුව අප දෙපාර්තමේන්තුව වෙත ඔවුන් දැන්විය යුතුය. | මේ දක්වා එම කටයුතු සම්පූර්ණ වී නොමැත. |
| 2. | කළමණාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු. මිලියන 5 ක් ප්‍රතිපාදන කර තිබුණද පද්ධතිය සංවර්ධනය කිරීමට පෙර, ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාවලි විශ්ලේෂණයක් සිදුකල යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා රු. 4,925,000 කට පරිගණක 47 ක් මිලට ගෙන බෙදාහැරීම සිදුකර තිබුණු | පද්ධතිය සකස් කිරීම සඳහා වන ප්‍රතිපාදන ඵලදායී වන ආකාරයට සැලසුම් සහගතව භාවිතා කළ යුතු වීම. | 2018 වසරේදී දෙපාර්තමේන්තු ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය අනුව සමස්ථ දෙපාර්තමේන්තුව සඳහා ක්‍රියාවලි විශ්ලේෂණයක් (BA Study) සිදු කිරීමට ආයතනයක් තෝරා ගැනීම සඳහා ICTA ආයතනයේද සම්පූර්ණ මාර්ගෝපදේශය යටතේ කටයුතු කරන ලදී. ඒ සඳහා ඉදිරිපත් වූ මිල ගණන්, වෙන් කල මුදල මෙන් කිහිප ගුණයක් වීම මත එම එම අවස්ථාවේ ක්‍රියාවලි විශ්ලේෂණය සිදු නොවිණි. තවද, 2018 වර්ෂයේ මැද | මේ දක්වාම පද්ධතිය භාවිතා කල හැකි මට්ටමට පැමිණ නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර 2017 වර්ෂයේදීද ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලැප්ටොප් පරිගණක 70 ක් රු. 6,971,300 ක වියදමක් දරා මිලදී ගෙන තිබුණි. | | භාගයේ සිට මේ දක්වා Google.doc මෘදුකාංග යෙදවුම භාවිතයෙන් පද්ධතියක් සංවර්ධනය කර නියමු මට්ටමින් දිස්ත්‍රික්ක 10 ක මාසික ප්‍රගති සාරාංශ ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගැනීම සිදු කරනු ලැබේ. මෙම සමස්ථ MIS ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 117.74 ක් ඇස්තමේන්තු කර ඇත. ඒ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා තොරතුරු තාක්ෂණ/ පරිගණක ආදී කාර්යාල උපකරණ ලබා දීම සඳහා රු. මිලියන 97.5 ක්ද වෙන් කර ඇත. මේ අනුව මහා භාණ්ඩාගාරය විසින් 2017 වසරේදී හා 2018 වසරේදී ලබා තිබූ රු. මිලියන 15 භාවිතා කරමින් මෙම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ට නියමු මට්ටමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලැප්ටොප් 70 ක් හා පරිගණක 47 ක් ලබා දී ඇත. | |
| 3. | 2018 වර්ෂය අවසානයේ අමාත්‍යාංශ වෙනස්වීම නිසා මානව සම්පත් හා සේවා නියුක්ත ප්‍රතිපත්තිය ක්‍රියාක්මක කිරීමට නොහැකි වූ බව විගණනය වෙත දන්වා තිබුණි. ඒ වෙනුවෙන් සැලසුම් කළ වටිනාකම රු. 1,750,000 ක් වූ තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම, ප්‍රතිපත්තියේ ප්‍රගතිය අධික්ෂණය පැවරී ඇති අංශයේ (Monitoring Unit) භෞතික සංවර්ධනය, ප්‍රතිපත්තියේ ප්‍රගතිය වාර්තා කිරීම (කාර්තුමය/ වාර්ෂික) සහ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක | මානව සම්පත් හා සේවා නියුක්ත ප්‍රතිපත්තියේ ජාතික වැදගත්කම සලකා එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධීකරණයට අදාළ පරිගණක පද්ධතිය සඳහා ප්‍රසම්පාදනය කර තිබූ පරිගණක සර්වර් (Sever) සුදුසු පරිදි ස්ථාපිත කිරීම සඳහා සුනිසි මෙහෙවර යටතේ ප්‍රතිපාදන වෙන් කරන ලදී. එම කාර්ය සඳහා ලෝක කම්කරු සංවිධානයේ මූල්‍ය අනුග්‍රහයද ලැබී තිබුණි. තවද විගණන විමසුම මඟින් ම දක්වා ඇති පුරෝකථනය කළ නොහැකි හේතු මත අදාල සමුළුව පැවැත්වීමට නොහැකි වූ අතර, එමඟින් ඉතිරි වූ ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳයා යොදවන ලදී. එම වසරේ අවසාන මාස වල | මේ දක්වා අපේක්ෂිත අරමුණු ලගා කරගත නොහැකි වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සමුළුවක් පැවැත්වීම යන ක්‍රියාකාරකම් ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | | රාජ්‍ය තන්ත්‍රයේ පැවති තත්වය මත අමාත්‍යාංශ වල ක්‍රියාකාරි වපසරිය හා රාජකාරි පැවරීම ගැටළු සහගත වූයෙන් සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට අපහසු විය. | |
| 4. | මානව සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට 2015 වර්ශයේදී මිලට ගෙන තිබූ රු.8,335,000 ක් වටිනා පරිගණක දෘඩාංග හා මෘදුකාංග භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් නිෂ්ක්‍රියව නොතබා උපයෝජනය කිරීමට කටයුතු කළයුතුය. | ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය විසින් මෙම දෙපාර්තමේන්තුවට පවරන ලද පරිගණක දෘඩාංග අදාල මෙහෙයුම් ඒකකයේ කාර්යන් සඳහා වෙන් කර තැබුවද, එම ඒකකයට අවශ්‍ය කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් නොලැබුණි. එම නිසා අදාළ උපකරණ ඌණ උපයෝජනයක් සිදුව පැවතුණි. එහෙත්, මේ වන විට අදාල උපකරණ වලින් මෙම ඒකකයට අවශ්‍ය පරිගණක උපකරණ ප්‍රමාණය රඳවාගෙන අතිරේක උපකරණ දෙපාර්තමේන්තුවේ වෙනත් ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාලයන්හි භාවිතය සඳහා යොදවා ඇත. | කොටසක් ඌන උපයෝජිතව පවතින අතර කොටසක් වෙනත් කාර්යයන් සඳහා යොදවා ගෙන ඇත. |
| 5. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 හා 3 ඡේද පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණ අතර එම චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව කාර්යය මණ්ඩල නිපුණතා අවශ්‍යතාවයන්ද හඳුනාගෙන නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතු වීම | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ට අදාල මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මෙම දෙපාර්තමේන්තුගතව සිට ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණය වන නිළධාරීන් පිරිස සම්බන්ධව යම් ගැටළුකාරී තත්වයක් අප හමුවේ පවතී. (මෙම නිලධාරින් සඳහා යෝජිත බඳවාගැනීම් පටිපාටිය තවම | මේ දක්වා සකස් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අනුමත වී නොමැති නිසා) එසේම අදාල තොරතුරු රැස් කිරීමේදී එක් එක් සේවා කාණ්ඩයට අදාලව මෙන්ම දෙපාර්තමේන්තුවේ අංශ අදාල කර ගනිමින් මෙම කාර්යය සිදු කිරීමට විය. අප දෙපාර්තමේන්තුවේ වැඩිම සේවක පිරිසක් ක්ෂේත්‍ර නිළධාරින් (මුළු සේවක පිරිසෙන් 548 ක් ක්ෂේත්‍ර නිළධාරීන් වේ) වන අතර ඔවුන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙන්වා ගත යුතු වේ.එම තොරතුරු රැස් කිරීම සඳහා යම් කාලයක් අපට අවශ්‍යව තිබුණි.<br><br>ඒ අනුව අදාල තොරතුරු අප විසින් රැස් කරමින් පවතින අතර අදාල මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | |
| 6. | සමාලෝචිත වර්ෂය තුල රැකියා අපේක්ෂකයින් 25,864 දෙනෙකු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ අතර ලියාපදිංචි කල රැකියා ඇබෑර්තු සංඛ්‍යාව 23,266 කි. කෙසේ වුවද රැකියා අපේක්ෂිතයින්ගෙන් 3,392 ක් පමණක් රැකියාගත කර තිබූ අතර ඒ අනුව 2019 වර්ෂයේදී අපේක්ෂිතයින් රැකියා ගත කිරීම් ප්‍රතිශතය සියයට 13 ක් තරම් පහළ අගයක් ගෙන තිබුණි. පසුගිය වර්ෂ 5ක කාලය තුළද රැකියා අපේක්ෂිතයින් රැකියා ගත කිරීම් ප්‍රතිශතය අවම මට්ටමක පැවති අතර එය වර්ධනය කර ගැනීමට අවශ්‍ය කාලීන පියවර, වගකිව යුතු නිලධාරීන් විසින් ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව පිහිටුවීමේ නිශ්චිත අරමුණු හා කාර්යභාරයන් ඉෂ්ඨ කර ගැනීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කල යුතුය. | දෙපාර්තමේන්තුවේ රැකියා සේවාවන් ලබා ගන්නා ආයතන, පුරප්පාඩු සපුරා ගත්තේද යන්න පිළිබඳ තොරතුරු ක්‍රමවත්ව සිදු නොකිරීම මෙයට හේතු වී ඇත. මෙම ප්‍රතිචාර දැක්වීම නිසි පරිදි සිදුකරවා ගැනීමට අවශ්‍ය පෙලඹවීම මේ වන විට සිදුකරමින් පවතී. | කාර්යය සාධනය වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 7. | 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 07 ක් තෘතිය මට්ටමේ පුරප්පාඩු 04 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 80 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 ක් ඇතුළු මුළු පුරප්පාඩු 95 ක් පැවතුණි. | අවශ්‍යතා පරිදි දෙපාර්තමේන්තුවේ සේවක ඌනතාවයන් සම්පූර්ණ කිරීම. | ජ්‍යෙෂ්ඨ හා තෘතික මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන ලේකම් සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. වෘත්තීය මාර්ගෝපදේශ තනතුරු 56 ක් සඳහා පුරප්පාඩු දක්වා තිබුණද අනුමැතිය සඳහා යවා ඇති ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වන උසස්වීම් පටිපාටියේ දැනට සිටින නිලධාරීන්ට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව අනුමත කර ඇති බැවින් නැවත බඳවා නොගැනේ. සංවර්ධන නිලධාරී පුරප්පාඩු පිළිබඳ ඒකාබද්ධ සේවා ජනරාල් දැනුවත් කර ඇති අතර දැනට 18 දෙනෙකු බඳවා ගෙන තිබේ. | සියලුම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. |

ශීර්ෂ 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

| | නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | වංචනික ස්වරූපයේ ගනුදෙනු | | | |
| | (අ) 2014-2018 කාලය තුළ වාර්තා වූ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු. 23,406,847 ක මූල්‍ය වංචාව, ප්‍රජාමූල බැංකු 06 ක රු. 4,136,984 ක සහනාධාර මුදල් වංචා කිරීම් හා සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හා සම්බන්ධව අවස්ථා 03 කදී වාර්තා වූ රු. 6,513,220 ක වංචාව වශයෙන් එකතුව රු. 34,057,051 ක් වූ මූල්‍ය වංචාවන්හි පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. වංචාවන් දෙකකින් අයකරගත් මුදල රු. 1,520,000 ක් හෙවත් සියයට 4.5 ක් පමණක් විය. | විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර සියළුම මූල්‍ය වංචාවන්හි පරීක්ෂණ කටයුතු හැකි ඉක්මනින් අවසන් කර රජයට සිදුකර ඇති පාඩු අයකර ගත යුතු බව හා වැරදි හා වංචා වලක්වා ගැනීම පිණිස විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතු වීම. | චෝදනා පත්‍ර කෙටුම්පත් කරමින් පවතී. | වංචා තුනකින් (03) අයකරගත් මුදල රු. 4,270,000 ක් හෙවත් සියයට 12.5 ක් පමණක් විය. පරීක්ෂණ කටයුතු අවසන් කර, සිදුකර ඇති පාඩු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර වැරදි හා වංචා වලක්වා ගැනීම පිණිස විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (ආ) චක්‍රලේඛ උපදෙස්වලින් බැහැරව බැංකු කලාප 6 ක සමෘද්ධි සහනාධාර හා ජීවනෝපාය ප්‍රතිලාභ ලබා දීම, ප්‍රතිලාභීන්ට බලපෑම් කරමින් 2017 ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධි කොඩි | විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර සියළුම මූල්‍ය වංචාවන්, විනය කඩකිරීම් හා අපරාධ වැරදි සම්භන්ධයෙන් පරීක්ෂණ කටයුතු | විනය කඩකිරීම් හා අපරාධ සම්බන්ධ වැරදි 107 න් 74 ක් අවසන් කර ඇත. අනෙකුත් බොහෝ චෝදනා සම්බන්ධව අවසන් අදියරේ පසුවේ. 2017 ජාත්‍යන්තර දුම්වැටි හා | ප්‍රතිලාභීන්ට ණය ලබාදීමේ ස්වරූපයේ ව්‍යාජ ලේඛන සකස්කර සමෘද්ධි බැංකුවකින් වංචා කළ රු. 3,082,999 න් රු. 1,408,133 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර අනාවරණය කරගත් විනය කඩකිරීම් හා අපරාධ වැරදි |

| | | | | |
|---|---|---|---|---|
| | දිනය සඳහා මුදල් රැස්කර ගැනීම, සමාජ ආරක්ෂණ භාර අරමුදලේ ප්‍රතිලාභ වැරදි ආකාරයට ලබා දීම, සමෘද්ධි බැංකු 2 ක් ගිනි තැබීම, ප්‍රතිලාභීන්ට ණය ලබාදීමේ ස්වරූපයේ ව්‍යාජ ලේඛන සකස්කර සමෘද්ධි බැංකුවකින් රු. 3,082,999 ක් වංචා කිරීම වශයෙන් අනාවරණය කරගත් අක්‍රමිකතා 12 ක හා 2002 වර්ෂයේ සිට 2018 වර්ෂය අතර කාලය තුළ නිලධාරීන් විසින් සිදුකර ඇති බවට අනාවරණය කරගත් විනය කඩකිරීම් හා අපරාධ සම්බන්ධ වැරදි 107 ක පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | හැකි ඉක්මනින් අවසන් කර රජයට සිදුකර ඇති පාඩු අයකර ගත යුතු බව හා වැරදි හා වංචා වලක්වා ගැනීම පිණිස විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතු වීම.විගණන විමසුම් හා විගණන වාර්තාවල ඇතුළත් කරුණු නිසි පරිදි අධ්‍යයනය කර ඒ සඳහා නිවැරදි පිළිතුරු ලබාදිය යුතු වීම. | මත් විරෝධි කොඩි දිනය සඳහා මුදල් රැස්කර ගැනීම සම්බන්ධව තිබූ අක්‍රමිකතා 03න් දෙකක් අවසන් කර ඇත. | 107 න් 39 ක පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර සියළුම මූල්‍ය වංචාවන්, විනය කඩකිරීම් හා අපරාධ වැරදි සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු හැකි ඉක්මනින් අවසන් කර රජයට සිදුකර ඇති පාඩු අයකර ගැනීම හා වැරදි හා වංචා වලක්වා ගැනීම පිණිස විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර නොතිබුණි. |
| 2. | බැංකු ගිණුම් මෙහෙයවීම | | | |
| | මුදල් රෙගුලාසි 381 (i) ප්‍රකාරව පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පුහුණු මධ්‍යස්ථාන 03 හි ජංගම ගිණුම් ආරම්භ කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. | මේ දක්වා අනුමැතිය ලබාගෙන නොමැත. |
| 3. | කාර්යභාරයන් ඉටු නොකිරීම | | | |
| | (අ) දිස්ත්‍රික්ක 21ක පොරොත්තු ලේඛනවල ඇතුළත් පවුල් 589,472 කින් පවුල් 135,106 | ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඒ අනුව සහනාධාර | සහනාධාර හිමිකම් පත්‍රවල නම් ඇතුලත් කිරීමේ කාර්යය සෘජුවම විෂයභාර | ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඒ අනුව සහනාධාර ප්‍රධානය සිදු කිරීමටත්, ප්‍රතිලාභීන්ගේ තොරතුරු |

| | | | | |
|---|---|---|---|---|
| | කට සමෘද්ධි සහනාධාර ලබා දී නොතිබුණි. එසේම ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛනවල ඇතුළත් පවුල් 43,853 කින් පොරොත්තු අනුපිළිවෙලින් බැහැරව තෝරාගත් පවුල් 33,398 කට සහනාධාර ප්‍රදානය කර තිබුණි. | ප්‍රදානයන් සිදු කළ යුතු බව හා ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කළ යුතු බව. | අමාත්‍යවරයාගේ අධීක්ෂණය යටතේ අමාත්‍ය කාර්යාල පරිශ්‍රයේදී සිදුකල අතර, පොරොත්තු අනුපිළිවෙලින් බැහැර පවුල් තෝරා ගැනීමද අමාත්‍යාංශ මට්ටමින් සිදු කර ඇත. | ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීමටත් කටයුතු කර නොතිබුණි. |
| | (ආ)සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන මඟින් මාතලේ පල්ලේපොල දෙමදඹය ගම්මානයේ කිරිගව පාලනය සඳහා ප්‍රතිලාභීන් 50 ක් මුල්කර ගෙන සමාලෝචිත වර්ෂයේදී ලබා ගත් ප්‍රතිපාදිත රු. 1,820,000 ක මුදලින් කොත්මලේ ආයතනයට ගවගාල් ඉදිකිරීම වෙනුවෙන් රු. 1,000,000 ක් ගෙවා තිබුණි. කිරි ගවයින් ලබාදීමට එකඟ වූ සැපයුම්කරු විසින් කිරිගවයින් ලබා නොදීම, උපකරණවල මිල වැඩිවීම මත ප්‍රතිලාභීන් එම උපකරණ ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය නතර වී තිබුණි. | සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ සංවර්ධන වැඩසටහන් සඳහා සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. | භාණ්ඩාගාරයෙන් අක්මුදල් ලබාදීමේ ප්‍රමාදයත්,රටෙහි පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ සටහන් සැලසුම්කල පරිදි කල නොහැකි විය. මේ වනවිට නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ සංවර්ධන වැඩසටහන් සඳහා සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ඇ) 2019 වර්ෂයේදී රු. 5,133,875 ක් වැයකර නිමකරන ලද සුවබොජුන්හල් 2 ක් සහ 2020 වර්ෂයේදී රු. 11,314,925 ක් වැය කර නිමකරන ලද සුවබොජුන්හල් 4 කින් සමාලෝචිත වර්ෂයේදී හම්බන්තොට සුවබොජුන්හල පමණක් විවෘත කර තිබුණි. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. | 2019 වර්ෂයේ ආරම්භ කරන ලද කළුතර මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ 2020 වර්ෂයේදී මොනරාගල මැදගම ප්‍රා දේශීය ලේකම් කොට්ඨාසයේ ඉදිකරන ලද සුව බොජුන්හල 2022 පළමු කාර්තුවේදී ජනතා අයිතියට පැවරීමට නියමිතය. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | (ඈ) අම්පාර මහඔය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අක්කර භාගයකින් යුතු භූමියක එකතුව වර්ග අඩි 5218 කින් යුත් මහල් 2 කින් යුත් සුව බොජුන් හල් සහ සමෘද්ධි ගිමන්හලක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළ පලමු අදියර 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණි. 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු. 43,457,347 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර 2020 වර්ෂය දක්වා රු. 35,042,514 ක් ප්‍රධාන කාර්යාලයෙන් දිස්ත්‍රික් කාර්යාලයට | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. | මෙම වසරේ පළමු කාර්තුව තුල සුව බොජුන් හල විවෘත කිරීමට සැලසුම් කර ඇත. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිපාදන වෙන් කර තිබුණි. පලමු හා දෙවන අදියර සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු. 13,812,142 ක් ගෙවා තිබූ නමුත් දෙවන අදියර නිමකර 2018 වර්ෂයේදී බාරදිය යුතු වුවත් 2021 වර්ෂය වනතෙක්ම එම කටයුතු අවසන් කර නොතිබුණි. | | | |
| 4. | කළමනාකරණ දුර්වලතා | | | |
| | (අ) 2015-2017 කාලය තුළ රු. 107,535,031 ක වියදමක් දරමින් සහනාධාරලාභින් නැවත හදුනා ගැනීමේ සමීක්ෂණ කර තිබුණි. එසේ වුවද, එම තොරතුරු සැලකිල්ලට නොගෙන මාතලේ හා පොලොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහි තෝරාගත් පවුල් 9250 ක් සඳහා 2018 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් මාසය දක්වා රු. 75,333,000 ක් වැය කරමින් සහනාධාර ලබා දී තිබුණි. | නියමිත ක්‍රමවේදයන් අනුව සමෘද්ධිලාභීන් තෝරාගෙන ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේදී බලයට පැමිණි නව රජය විසින් ගත් ප්‍රතිපත්ති තීරණයක් මත එම වසර සඳහා සහනාධාර ලබා දීමට වෙන් කර තිබූ මුදල් ප්‍රතිපාදන සීමාව තුල දිස්ත්‍රික් 25 ආවරණය වන පරිදි පවුල් එක් ලක්ෂ පනස් දහසක් (150,000) වෙනුවෙන් නව සමෘද්ධි සහනාධාර ලබා දීමේ වැඩසටහන කඩිනමින් සිදු කල යුතු විය. ඒ අනුව පොළොන්නරුව හා මාතලේ දිස්ත්‍රික් සඳහා පමණක් නව සහනාධාර නිකුත් කල අතර, අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා නව සහනාධාර ලබා දීම ක්‍රියාත්මක කිරීම පැවති රජය වෙනස් වීම | නියමිත ක්‍රමවේදයන් අනුව සමෘද්ධිලාභීන් තෝරාගෙන ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිසා අත්හිටුවන ලදී. | |
| | (ආ) 2016 ජුලි 14 දිනැති වෙළඳ ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි 1.1 ඡේදය ප්‍රකාරව මෝටර් රථ සහන බලපත්‍ර ලබාගැනීම සඳහා 2006 අප්‍රේල් 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි සඳහන් "ජ්‍යෙෂ්ඨ මට්ටමට" අයත් විධායක තනතුරක වසර 06 ක සක්‍රීය සේවාකාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති රාජ්‍ය නිලධාරීන් විය යුතුයි. එසේ වුවද එම චක්‍රලේඛයෙහි 2.3 ඡේදය ප්‍රකාරව සුදුසුකම් ලබන තනතුරකට පෞද්ගලික වන සේ හෝ අධි සේවක පදනම මත හෝ පත්කර ඇති නිලධාරීන් මේ සඳහා හිමිකම් නොලබන බව දක්වා තිබියදී ඒ පිළිබඳව අවධානය යොමු නොකොට පෞද්ගලික වන සේ තනතුරු ලැබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වී ස්ථිර පත්වීම් නොලැබූ සහකාර අධ්‍යක්ෂ තනතුර දරන නිලධාරීන් 20 දෙනෙකු සඳහා 2020 පෙබරවාරි | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | 2016.09.15 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය තුළ මෙම තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර තිබුණ ද 2019.07.05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩල සංයුතිය යටතේ දරන්නාට පෞද්ගලිකවන සේ යන්න ඉවත්කර ඇත. ඒ අනුව 1/2018 අංක දරන, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ ප්‍රකාරව මෙම නිලධාරින්ද සහනදායී නිදහස් වාහන බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 26 දින සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දී තිබුණි. | | | |
| | (ඇ) සමෘද්ධි අධිකාරිය පැවති කාලයේදී නිලධාරීන්ට ණය ලබා දුන් සේවක ණය චක්‍රීය අරමුදල අඛණ්ඩව පවත්වාගෙනයාම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමකින් තොරව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම යටතේ 2020 වර්ෂයේදී නිලධාරීන් 302 කු සඳහා රු. 66,257,360 ක ආපදා ණය ලබා දී තිබුණි. මේ ආකාරයට සේවක ණය චක්‍රීය අරමුදලින් අඛණ්ඩව ණය ලබා දෙනු ලැබුවද, අරමුදල සඳහා 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 8 ක මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩාගාරයේ උපදෙස් ලබා ගැනීමටත් අරමුදලේ ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීමටත් කටයුතු කළයුතු වීම. | සේවක ණය චක්‍රීය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරමින් පවතින අතර කඩිනමින් විගණනයට ඉදිරපත් කිරීමට කටයුතු කෙරේ. | භාණ්ඩාගාර උපදෙස් ලබාගෙන නොතිබූ අතර අරමුදලේ ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| 5. | වත්කම් කළමනාකරණය | | | |
| | (අ) සමාලෝචිත වර්ෂයේදී රු. 2,300,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ සමනල වැව පුහුණු මධ්‍යස්ථානය පිහිටි හෙක්ටයාර් 2.178 ක ඉඩම් කොටස අත්පත් | ඉඩම් හා ගොඩනැඟිලි දේපල අත්පත් කර ගැනීමේ හා පවරා ගැනීමේ කටයුතු අප්‍රමාදීව ඉටු කළ යුතු බව. | සමෘද්ධි අධිකාරිය විසින් මිලදී ගත් මෙම වත්කම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගතහැකි ආකාරය පිළිබඳව උපදෙස් 2022.01.04 | 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 44 (ආ) වගන්තිය ප්‍රකාරව අධිකාරිවලට අයත් වන්නා වූ සියළු චංචල හා නිශ්චල දේපල නියමිත දින සිට බලපැවැත්විය යුතු පරිදි රජයට පවරාගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර රු. 132,746,000 කට තක්සේරු කර තිබූ නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම හා ගොඩනැගිලි පවරා ගැනීමට හා එම ඉඩමේ අනවසර පදිංචිකරුවන්ගෙන් අයවීමට ඇති රු. 525,000 ක තක්සේරු වටිනාකම අය කරගෙන ඉඩම් කොටස් පවරා දීමට ද කටයුතු කර නොතිබුණි. | | ඉඩම් අමාත්‍යාංශයෙන් විමසා ඇත.එය ලද පසු අදාල පවරා ගැනීම් ආරම්භ කිරීමට නියමිතය. | කටයුතු කර නොතිබුණි. |
| | (ආ) බණ්ඩාරවෙල සංචාරක බංගලාව පිහිටි අක්කර 1 ක භූමිය සහ නුවර කාර්යාල පරිශ්‍රය පිහිටි රූඩ් 1 යි පර්චස් 3.82 ක ඉඩම් නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු නොකර, මෙම ඉඩම් කොටස් පිළිවෙලින් රු. 20,000,000 ක් සහ රු. 21,900,000 කට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. | අදාළ ඉඩම් හා ගොඩනැඟිලි දේපල අත්පත් කර ගැනීමේ හා පවරා ගැනීමේ කටයුතු අප්‍රමාදීව ඉටු කළ යුතු වීම. | මෙම ඉඩම පවරා ගැනීම සඳහා මැනුම් කටයුතු 2021.12.09 දින සිදු කර ඇති අතර බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් විසින් පැවරීමේ කටයුතු සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත. මෙම ඉඩම පේරාදෙනිය විශ්ව විද්‍යාලය සතුවන අතර උඩරට සංවර්ධන අධිකාරිය එය භුක්ති විද තිබෙනුයේ දිගුකාලීන බදු ගිවිසුමක් යටතේය. එම බදු ගිවිසුම 2012 වර්ෂයේදී අවසන්ව ඇත.මෙම ඉඩමේ අයිතිය අප සතු නොවන අතර ඒ අනුව පවරා ගත නොහැක. | ඉඩම් හා ගොඩනැඟිලි පවරා ගැනීම හා බදු ගිවිසුමකට එළඹීමකින් තොරව තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ඇ) 1996 – 2013 වර්ෂය දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුවට පවරාගත් ඉඩම් 10 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම. | ඉඩම් දෙපාර්තමේන්තුවට පවරා ගෙන තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වීම. | නිරික්ෂණයේ සඳහන් ඉඩම් 10 න් අකුරැස්ස - ගලගාව ඉඩම් හා ගල්කැවත්ත මඩවල ඉඩම තක්සේරු කර ගිණුම් ගත ඇත. | 1996 – 2013 වර්ෂය දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුවට පරවාගත් ඉඩම් 8 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 6. | මානව සම්පත් කළමනාකරණය | | | |
| | (අ) දෙපාර්තමේන්තුගත තනතුරු 4 ක් සඳහා සේවා ව්‍යවස්ථා හා බඳවාගැනීමේ පටිපාටි සහ තනතුරු 13 ක් සඳහා උසස් කිරීමේ පරිපාටි අනුමත කරගෙන නොතිබුණි. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගත යුතු බව. | සේවක අර්ථ සාධක අරමුදල යටතේ සේවය කරන කාර්යය මණ්ඩලයට අදාළව බඳවා ගැනිමේ හා උසස් කිරිමේ පටිපාටිය සංශෝධනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කිරිමට කටයුතු කර ඇත. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත කරගෙන නොතිබුණි. |
| | (ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ දිස්ත්‍රික් අධ්‍යක්ෂ තනතුරු 06 ක් හා ගණකාධිකාරී I ශ්‍රේණියේ තනතුරු 16 ක් වැඩ බැලීමේ හා වැඩ ආවරණය කිරීමේ පදනමින් අනුයුක්ත කිරීම් කර තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය තුළ නිසි පරිදි පත්කිරීම් කළ යුතු බව. | ඒකාබද්ධ සේවාවන්හි ඉහත දක්වා ඇති පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත කිහිපවරක්ම දන්වා ඇත. කෙසේ වුවද සෑම සේවාවකම විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරින්ගේ හිඟයක් පවතින බැවින්, ඒ සඳහා සුදුසුකම්ලත් ඊට පහළ ශ්‍රේණිවල නිලධාරින් රාජ්‍ය | අනුමත කාර්ය මණ්ඩලය පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව වැඩ බැලීම, රාජකාරි ඉටුකිරීම හා රාජකාරි ආවරණය කිරීම සඳහා පත්කිරීමට කටයුතු කර ඇත. | |
| 7. | ලැබිය යුතු ගිණුම් | | | |
| | (අ) සහනාධාර ප්‍රදානය කිරීමේ උත්සව පැවැත් වීම සඳහා සමාජ ආරක්ෂණ භාර අරමුදලෙන් රු. 218,493,601 ක් හා ප්‍රජාමූල බැංකු අංශයෙන් රු. 100,000,000 ක් වශයෙන් ලබාගත් මුදල් පියවීමට කටයුතු කර නොතිබුණි. | අයවැය ප්‍රතිපාදනවලින් බැහැරව දරන ලද වියදම් පියවීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. | මෙම වියදම් දැරීම සම්බන්ධයෙන් එම අරමුදල් භාර කළමනාකරණ මණ්ඩල විසින් අනුමැතිය ලබාදී තිබූ බැවින් මෙම වියදම් දැරීම අනුමත කර ඇත. | අයවැය ප්‍රතිපාදනවලින් බැහැරව දරන ලද වියදම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| | (ආ) 2020 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 220 දෙනෙකුගෙන් හිඟ හිට තිබූ අත්තිකාරම් ණය ශේෂය රු. 4,801,126 ක් විය. මෙම ණය ශේෂයේ, වර්ෂ 5 ක් ඉක්ම වූ ශේෂය රු. 751,999 ක් ද, වර්ෂ 4 ක සිට වර්ෂ 5 ක් අතර පැරණි ණය ශේෂය රු. 580,701 ක්ද, වර්ෂ 1 ක සිට වර්ෂ 3 ක් අතර හිඟ හිටි ණය ශේෂය රු. 3,434,065 ක් වශයෙන් අන්තර්ගතව පැවතුණි. | නිලධාරීන් සඳහා ණය නිකුත් කිරීම, ණය අයකර ගැනීම හා අයවිය යුතු ශේෂය ගණනය කිරීම යනාදිය නිවැරදිව සිදුකර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | ණය ශේෂ නිරවුල් කිරීම සඳහා පවතින ගැටළුකාරී තත්ත්වයන් හඳුනාගනිමින් මේ වනවිට වසර පහ ඉක්ම වූ ණය ශේෂ ද ඉන් පසු කාලයන්ට අයත් ණය ශේෂයන්ගෙන් කිහිපයක් ද වශයෙන් රු 370,042 ක ණය ශේෂයක් නිරවුල් කර ඇත. ඉතිරිය නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | නිලධාරීන් සඳහා ණය නිකුත් කිරීම, ණය අයකර ගැනීම හා අයවිය යුතු ශේෂය ගණනය කිරීම යනාදිය නිවැරදිව සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ඇ) 2013 අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හි සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා බැංකු මූල්‍ය අංශයෙන් ලබාගත් රු. මිලියන 2,374 ක මුදල පියවිය යුතු බැරකමක් වුවද, එය බැරකම් ලෙස හෙළිදරව් නොකොර එය දිගින් දිගටම පොදු තැන්පත් ගිණුමේ ශේෂයක් ලෙස පෙන්වා තිබුණි. | බැරකම පියවා ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගත යුතු බව හා ගිණුම්වලින් නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම ණය ලබාගත් වර්ෂයේදී සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරයේ එකගතාවය මත තැන්පත් ගිණුමෙහි ශේෂයක් ලෙස සටහන් කර ඇත.භාණ්ඩාගාරයෙන් මෙම මුදල පියවීම සඳහා නිරන්තර ඉල්ලීම් සිදු කළ ද අවශ්‍ය මුදල් ප්‍රතිපාදන නොලැබි බැවින් මෙම ශේෂය තැන්පතු ගිණුමේ තවදුරටත් පවතී. | ගිණුම්වල නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 8. | ප්‍රසම්පාදන | | | |
| | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් හා ගබඩා පටිපාටිය අනුගමනය නොකර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට පත්වීම් ලිපි බෙදා දීමේ හා උත්සවය පැවැත්වීමේ වියදම් රු. 14,681,351 ක් ද, ටයර් 72 ක් මිලදී ගැනීම සඳහා රු. 2,296,464 ක් හා සමෘද්ධි සහනාධාර ලබාදීමේදී ප්‍රසම්පාදනයන් 04 ක් සඳහා රු. 246,283,828 ක් ද වැය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල ඇතුළත් උපදෙස් අනුව කටයුතු සිදු කළ යුතු බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල ඇතුළත් උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 9. | කාර්යසාධනය | | | |
| | (අ) 2020 අගෝස්තු 18 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය ප්‍රකාරව අරමුදල් ලෙස ස්ථාපිත කර ඇති දිවිනැගුම අරමුදල, සමාජ ආරක්ෂණ භාර අරමුදල, නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල, බැංකු සංගම් ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල හා සේවක ණය චක්‍රීය අරමුදල පවත්වා ගෙනයාමේ අවශ්‍යතාවය සලකා බලා ඒවා ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | අරමුදල් පාර්ලිමේන්තු පනත් මගින් ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. | මේ වන විට සමස්ත කාර්යභාරය ඇතුලත් වන ලෙස දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. | අරමුදල් පාර්ලිමේන්තු පනත් මගින් ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (ආ) කොවිඩ් 19 සමාජ ප්‍රතිලාභ රු. 5,000 දීමනා ගෙවීම | | | |
| | ප්‍රතිලාභ හිමිවූ කාණ්ඩායම් 5 සඳහා අදියර I හා II යටතේ පවුල් 10,021,055 ක් සහ ආබාධිත, වකුගඩුරෝග වැඩිහිටි ප්‍රතිලාභීන් 71,383 ක් සඳහා රු. මිලියන 50,462.19 ක් ද, නිලධාරීන් වෙනුවෙන් වක්‍ර වියදම් සඳහා රු. මිලියන 34.63 ක් ද , බැංකු ණය පොලී ලෙස රු. මිලියන 542.10 ක් | | | |

| | | | | |
|---|---|---|---|---|
| | ද, ඇතුළුව එකතුව රු. මිලියන 51,038.92 ක් වැය දැරීමට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය. | | | |
| | i. ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ඉදිරිපත්කල තොරතුරු අනුව ඉහත සඳහන් සහනාධාර ගෙවීමට අවශ්‍ය මුදල් ලබා ගැනීමට බැංකු ණය (ස්ථාවර තැන්පත් ඇපයට තබා) මඟින්ද, ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයේ ආයෝජන උපලබ්ධි කිරීම, ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ඉතිරි කිරීම් සහ සමෘද්ධි බැංකු මඟින් ද එකතුව රු. මිලියන 53,588.96 ක් ලබාගෙන තිබුණි. මෙම ප්‍රතිපාදනවලින්, නිල බැංකු ගිණුම මඟින් රු. මිලියන 34,225.63 ක් ද සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම මඟින් රු. මිලියන 7,893.26 ක් ද සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු වලින් සෘජු ගෙවීම් රු. මිලියන 11,363.32 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 53,482.21 ක් ප්‍රජා මූල බැංකු වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් විධිමත්ව තොරතුරු | විධිමත්ව තොරතුරු නඩත්තු කර උපයෝජනය කරන ලද මුදල් හා ඉතිරි මුදල් සැසඳීම් කිරීමට කටයුතු කලයුතු වීම. | මෙම ගෙවීම් සම්බන්ධ විධිමත් වාර්තාවක් සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ මැදිහත්වීම මත සමෘද්ධි බැංකු වෙතින් ලබාගැනීම සිදු කරන ලදී. ඒ අනුව සවිස්තරාත්මක වාර්තාවක් කඩිනමින් විගණනයට ඉදිරිපත් කරනු ලබයි. ඉදිරියේදී මෙවැනි කාර්යයන් වලදී විධිමත්ව තොරතුරු නඩත්තු කිරීමට අදාල සියළු නිලධාරීන් දැනුවත් කර ඇත. | විධිමත්ව තොරතුරු නඩත්තු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නඩත්තු කර නොතිබූ අතර උපයෝජනය කරන ලද මුදලින් ප්‍රාදේශීය කාර්යාලවල වියදම හා ඉතිරි මුදල් සැසඳීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| | ii. ස්ථාවර තැන්පතු 31 ක ආයෝජනය කර තිබූ සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් රු. මිලියන 22,754 ක් ආයෝජන කල්පිරීමට පෙර උපලබ්ධි කර ගැනීම නිසා සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා ලැබිය යුතු රු. මිලියන 556.46 ක පොළි මුදල් අහිමි වී තිබුණි. | සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජන සඳහා අහිමි වූ පොළි මුදල් ලබාදීමට කටයුතු කලයුතු වීම. | ආයෝජන කල්පිරීමට පෙර උපලබ්ධි කර ගැනීමෙන් අහිමි වූ පොළියද සමඟ සමාජ ප්‍රතිලාභ ගෙවීම සඳහා දරන ලද මුදල්ද භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර දෙන ලෙස ඉල්ලා ඇත. | මේ දක්වා අදාළ මුදල් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. |
| | iii. විවිධ මූලාශ්‍රවලින් ලබාගත් මුදලින් වියදම්කල රු. මිලියන 51,038.92 ක මුදලින් බැංකු ණය මුදල රු මිලියන 16,000 ක් හා ඒ මත පොළිය රු. මිලියන 542.10 ක් පමණක් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය වී තිබුණු අතර ඉතිරි මුදල් පියවන ආකාරය පිළිබඳ තහවුරු කිරීම් ඉදිරිපත් නොවීය. | ඉතිරි මුදල් පියවීමට කටයුතු කලයුතු වීම. | ඉතිරි මුදල පියවා ගැනීම සඳහා භාණ්ඩාගාරය වෙත නිරන්තරයෙන් අක් මුදල් ඉල්ලීම් ඉදිරිපත් කළ ද මෙතෙක් එම මුදල පියවීම සඳහා අක් මුදල් ලැබී නොමැත. | අදාළ මුදල් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

ශීර්ෂ 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

| **නිරීක්ෂණය**<br>--------------- | | | **නිර්දේශය**<br>-------------- | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග**<br>---------------- | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය**<br>-------------- |
|---|---|---|---|---|---|
| 1. | **ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | මුදල් රෙගුලාසි 570 | දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම් වලට අදාල එකතුව රු.27,340,534 ක් වූ තැන්පතු 287 ක් වසර දෙකට වඩා වැඩි කාලයක් දක්වා රාජ්‍ය අදායමට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වීම. | මේ වන විට වර්ෂ දෙකකට වැඩි සියළුම රැදවුම් මුදල් නිදහස් කිරීමේ කටයුතු කරමින් පවතින අතර නිශ්චිත කාලය වන වසර 2 තුළ රැඳවුම් මුදල් නිදහස් කිරීමට පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් දුනි. | මේ දක්වා අදාල කටයුතු අවසන් කර නැත. |
| 2. | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ<br>- 3.1 ඡේදය | දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව ප්‍රජා මූල සංවිධාන වෙත ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පවරා නොතිබුණු බව නියැදි විගණන | ප්‍රජා මූල සංවිධාන වෙත ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පැවරීමේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | ව්‍යාපෘතිය අඛණ්ඩව ප්‍රජාව විසින් පවත්වා ගෙන යාමට නම් ඉදි කිරීම් පිළිබඳ අවබෝධය සමිති වෙත තිබිය යුතුය. එබැවින්, මෙම ව්‍යාපෘති සඳහා ප්‍රජා ජල සංකල්පය පිළිබඳ අවබෝධයක් ඇති ප්‍රජා ජල සමිති සඳහා කොන්ත්‍රාත් ලබා දීම සිදු කරයි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | | |
| 3. | 2020 වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුව පිහිටුවා වසර හයකට ආසන්න කාලයක් ගත වුවද දෙපාර්තමේන්තුවට අදාලව පනතක් සම්මත කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි. ඒ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ නෛතික වලංගුතාවය මෙන්ම ඒ යටතේ ලියාපදිංචි කොට ඇති ප්‍රජා මූල සංවිධාන පාලනය කිරීමට ඇති අධිකාරී බලය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව පිහිටුවීමට අදාල පනත සම්මත කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | කොවිඩ් වසංගත තත්ත්වය තුළ පනත සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වූ බැවින් පසුව මෙහි කටයුතු කඩිනමින් ඉටු කිරීම. | මේ දක්වා පනත අනුමත කර ගෙන නොමැත. |
| 4. | දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති දිස්ත්‍රික්ක 22 කට අයත් ප්‍රජා මූල සංවිධානයන්හි ජල ව්‍යාපෘති 329 ක් 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අක්‍රීයව පැවතුණි. කෙසේ වෙතත් මේ අතුරින් කෑගල්ල, මන්නාරම, ත්‍රිකුණාමලය හා මාතර යනාදී දිස්ත්‍රික්ක තුල මේ වන විට අක්‍රියව පවතින ව්‍යාපෘති නැවත සක්‍රිය තත්වයට පත් කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | අක්‍රිය තත්වයේ පවතින නැවත සක්‍රිය තත්වයට පත් කළ හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | දෙපාර්තමේන්තුව වෙත පුනරුත්තාපන හා වැඩි දියුණු කිරීම වෙනුවෙන් රු. මි. 200ක් පමණ වාර්ෂිකව වෙන් වන බැවින් සියළුම අක්‍රිය ව්‍යාපෘති පවතින ප්‍රතිපාදන තුළ ක්‍රියාවට නැංවීම අපහසුවේ. | සියලුම ව්‍යාපෘති නිමකර නැත. |
| 5. | ජාතික ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 25 තුළ ක්‍රියාත්මක කරන ලද හා 2019 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂා කොට තිබූ පිරිවැය රු.1,782,992,419 ක ව්‍යාපෘති 123 කින් පිරිවැය රු.16,187,182 ක් වූ ව්‍යාපෘති 03 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට නිම කර තිබුණි. දිස්ත්‍රික්ක 16 ක් තුළ ක්‍රියාත්මක කරනු ලැබූ මුළු පිරිවැය රු.785,058,909 ක් වූ ව්‍යාපෘති 46 ක ප්‍රගතිය සියයට 75 කට වඩා අඩු බව නිරීක්ෂණය විය. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | සම්පූර්ණ ජල ව්‍යාපෘතියක් එක් වසරක් තුළ 100% නිම කිරීමට පවතින ප්‍රතිපාදන තුළ හැකියාවක් නොමැති බැවින් එක් ව්‍යාපෘතියක සම්පූර්ණ වැඩ අවසන් වනුයේ වසර කිහිපයක් තුළයි. | තවදුරටත් නිම කළ යුතු ව්‍යාපෘති බොහෝමයක් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 6. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා වන පිරිවිතර අදාල ප්‍රසම්පාදන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට විස්තර කල යුතු විය. එහෙත් 2020 ජූනි 19 වන දින මිල කැඳවා තිබූ පොම්ප හා උපාංග සඳහා වන ටෙන්ඩරයේ පිරිවිතරයන්හි අඩුපාඩු පවතින බව ප්‍රසම්පාදන කමිටුව විසින් පසුව තීරණය කොට නැවත මිල කැඳවීම හේතුවෙන් පළමුවර මිල කැඳවීම වෙනුවෙන් දරා තිබූ රු. 177,660 ක වියදම නිෂ්කාර්යය වී තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු ආරම්භයට පෙර භාණ්ඩ පිරිවිතර නිශ්චිතව නිශ්චය කර ගත යුතු වීම. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | පළමුවර මිළ කැඳවුම් වෙනුවෙන් දරා තිබූ රු. 177,660 නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. |
| 7. | (අ) සමාලෝචිත වර්ෂය අවසානයට සෑම සේවක කාණ්ඩයක් යටතේම අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 44 සිට සියයට 100 ක පරාසයක් ගන්නා බව නිරීක්ෂණය විය. එය අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 51 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. | අඛණ්ඩවම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අදාළ ආයතන දැනුවත් කිරීමට අදාළ නිලධාරින් වෙත උපදෙස් ලබා දී ඇත. | මේ දක්වා බඳවා ගැනීම් සිදුකර නැත. |
| | (ආ) ඉංජිනේරු (සිවිල්) තනතුර සඳහා නිලධාරීන් 12 ක් අනුමත කර තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විට නිලධාරීන් හතක් පමණක් බඳවා ගෙන තිබූ අතර අතර ඉතිරි නිලධාරී පුරප්පාඩු පහ සම්පූර්ණ කර ගැනීමෙන් තොරව එක් නිලධාරියෙකුට දිස්ත්‍රික්ක කිහිපයක අධීක්ෂණ කටයුතු පවරා තිබුණි. | -එම- | අඛණ්ඩවම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අදාළ ආයතන දැනුවත් කිරීමට අදාළ නිලධාරින් වෙත උපදෙස් ලබා දී ඇත. | මේ වන විට අනුමත වී ඇති මුළු ඉංජිනේරු(සිවිල් ) තනතුරු සංඛ්‍යාව 15ක් වන අතර ඉන් 10 ක් බඳවාගෙන දිස්ත්‍රික්ක සඳහා කලාප මට්ටමින් බෙදා අනුයුක්ත කර සේවයේ යොදවා ඇත. |

ශීර්ෂ 334 - බහුකාර්ය සංවර්ධන කාර්යසාධන බලකා දෙපාර්තමේන්තුව

| | විගණනයේ නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2020 වර්ෂයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් බී ගිණුම 2021 මැයි 05 වන දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර අනුමත උපරිම හර ශේෂ සීමාව රු. 30,000,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අග තථ්‍ය ශේෂය රු. 38,930,765 ක් වූයෙන් රු.8,930,765 ක් අවසාන හර ශේෂ සීමාව ඉක්මවා තිබුණි. | අත්තිකාරම් “බී” ගිණුමේ සීමාවන් පිළිපැදිය යුතු වීම. | දෙපාර්තමේන්තු අතර නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමේදී ඇති වී ඇති සීමා ඉක්මවීමක් බැවින් මු.රෙ. 503 (1) සඳහා සිදුකර ඇති සංශෝධන අනුව සීමා ඉක්මවීමක් ලෙස නොසැලකිය යුතුය. | අනුමැතිය ලැබී නැත. උපරිම හර ශේෂය ඉක්මවීම මු.රෙ. 503 (1) සංශෝධනය මගින් ආවරණය නොවේ. |

ඇමුණුම 01

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 4 | 2018 | 149,700,000 | 63,400,000 | 213,100,000 | 218,600,000 | 63,400,000 | 282,000,000 |
| | 2019 | 260,330,000 | 67,900,000 | 328,230,000 | 260,330,000 | 67,900,000 | 328,230,000 |
| | 2020 | 224,360,000 | 18,910,000 | 243,270,000 | 233,973,000 | 40,234,000 | 274,207,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 4 | 2018 | 203,506,983 | 60,155,453 | 263,662,436 | 15,093,017 | 3,244,547 | 18,337,564 | තත්ත්වාගණනය කළ මතය |
| | 2019 | 212,307,573 | 39,247,692 | 251,555,265 | 48,022,427 | 28,652,308 | 76,674,735 | තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | 218,310,144 | 12,799,422 | 231,109,566 | 15,662,856 | 27,434,578 | 43,097,434 | තත්ත්වාගණනය කළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම |
| 5 | 2018 | 94,350,000 | 12,650,000 | 107,000,000 | 93,350,000 | 13,650,000 | 107,000,000 |
| | 2019 | 109,670,000 | 29,000,000 | 138,670,000 | 123,183,000 | 32,204,000 | 155,387,000 |
| | 2020 | 148,420,000 | 16,900,000 | 165,320,000 | 148,420,000 | 16,900,000 | 165,320,000 |

| ශීර්ෂය | වර්ෂය | සත්‍ය වියදම | | | ඉතිරිය | | | විගණන මතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | පුනරාවර්තන වියදම | මූලධන වියදම | මුළු වියදම | |
| 5 | 2018 | 85,786,364 | 6,497,536 | 92,283,900 | 7,563,636 | 7,152,464 | 14,716,100 | තත්ත්වාගණනය කළ මතය |
| | 2019 | 114,631,211 | 5,291,929 | 119,923,140 | 8,551,789 | 26,912,071 | 35,463,860 | තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | 116,640,236 | 10,812,564 | 127,452,800 | 31,779,764 | 6,087,436 | 37,867,200 | තත්ත්වාගණනය කළ මතය |

| ශීර්ෂය | වර්ෂය | මුල් ප්‍රතිපාදනය | | | ශුද්ධ ප්‍රතිපාදනය | | |
